තොරතුරු සන්නිවේදන සහ
වාස්තු විශේෂඥ සේවා
අයදුම්පත් ඇතුළත්
ගැසට් පත්‍රය
මෙවර
සිළුමිණ සමඟ

සිළුමිණ
சிழுமின
The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 38 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ කන්‍යා රවි 04 භාග පුර ජලවක ඉරිදා ■ වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 20 වැනි ඉරිදා මිල රු 80.00

ගමක් වනසන
නරි රජ දහනක්
පිටුව 16

සුනඛයකු
වෙනුවෙන්
දිවි දුන් මිනිසෙක්
පිටුව 03

වැනසෙන
හන්තානයට
සහන් එළියක්
පිටුව 11

මුහුණු පොත
කැලඹූ
වලල්ලාවිට අවනඩුව
පිටුව 13

මං තීරු
නීතිය
සාර්ථකද?
පිටුව 20

කෝටි ගණන් පිල්ලි ගැසූ ඉඩම් හොරු දැලට අසුවෙයි

(නිහාල් පී. අබේසිංහ)

කොළඹ ඇතුළු ප්‍රධාන නගරවල ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සාදා කෝටි ගණනින් මුදල් වංචා කළ සංවිධානාත්මක ජාවාරම්කරුවන් 21ක් ඊයේ වන විට අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් විය. අත්අඩංගුවට ගත් පිරිස අතර නීතිඥවරුන් නොතාරිස්වරුන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල නිලධාරීන් කිහිප දෙනකුද වේ.

රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක සංවිධානාත්මක ව්‍යාපාරයක් බවට පත් වී ඇතැයි කියන මෙම ජාවාරමට දෙමළ ඩයස් පෝරාවේ හා පාතාලයේ ඇති සම්බන්ධතාවයන් පිළිබඳව පරීක්ෂණ දැන් ක්‍රියාත්මක අතර ඒවාට සම්බන්ධ කිහිප දෙනෙක් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ. මෙසේ ව්‍යාජ ඔප්පු සැකසීම පිළිබඳ අවස්ථා වඩාත් වාර්තා වී ඇත්තේ විදේශගත වූ පුද්ගලයන්ගේ සහ පැරණි වලව්වලට අයත් පාරම්පරික ඉඩම් සඳහාය. මේ පිළිබඳව කළ විමසීමකදී රෙජිස්ට්‍රාර් ජනරාල් එම්. පී. විතානගේ මහතා කියා සිටියේ මෙයට විසඳුමක් ලෙස 'ඊ ලැන්ඩ්' නම් වැඩපිළිවෙළ යටතේ ඉදිරියේදී සෑම ඉඩම් හිමිකමක් සඳහාම වෙනස් කළ නොහැකි හෝ ඉවත් කළ නොහැකි ඉලෙක්ට්‍රොනික පත්ඉරු සකස් කරන බවය.

4 වැනි පිටුවට

පාතාලකරුවෝ කොළඹ වැඩබිම්වලට රිංගති

(අමිල මලවිසූරිය)

සංවිධානාත්මක අපරාධකරුවන් හෙවත් පාතාල සාමාජිකයන් සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කොටුකර ගැනීම සඳහා පොලිසිය ක්‍රියාත්මක කරන විශේෂ මෙහෙයුම්වලට බියෙන් එම අපරාධකරුවන් කොළඹ මහල් නිවාස සහ වැඩබිම් ආරක්ෂිත ස්ථාන ලෙසින් භාවිත කරන බවට පොලිසියට තොරතුරු ලැබී ඇති බව බස්නාහිර පළාත් බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සිළුමිණට කීය.

එම නිසා කොළඹ නගරයේ මහල් නිවාස සංකීර්ණ සහ වැඩබිම් හිමිකරුවන් 350කට අධික පිරිසක් පසුගිය සිකුරාදා (18) දැනුවත් කරමින් එවැනි වැඩබිම් සහ මහල් නිවාස ආරක්ෂිත ස්ථාන ලෙස භාවිත කළ හැකි බවට අනතුරු අඟවමින් ඒ සඳහා ඉඩ නොදෙන ලෙස දැනුවත් කළ බවත් එසේම නීතිවිරෝධී ක්‍රියා හා මත්ද්‍රව්‍ය ජාවාරම මඟින් උපයන මුදලින් සිදු කෙරෙන මහල් නිවාස සංකීර්ණ මිලදී ගැනීම හෝ විශාල ඉදිකිරීම් මුදල් විශුද්ධිකරණ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා අවධාරණය කළේය.

හකීම් යළිත් නායකත්ව මණ්ඩලයක් ඉල්ලයි

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

සජිත් ප්‍රේමදාස මහතාගේ නායකත්වයෙන් යුත් සමගි ජන බලවේගයට නායකත්ව මණ්ඩලයක් ඉල්ලා මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම් යළිත් සජිත් ප්‍රේමදාස මහතාට දන්වා ඇත. මීට පෙරද හකීම් මහතා විසින් සමගි ජන බලවේගයට නායකත්ව මණ්ඩලයක් පත් කරන්නැයි ඉල්ලීමක් කළ අතර මෙවර අනිවාර්යෙන්ම නායකත්ව මණ්ඩලයක් පත් කළ යුතු බව අවධාරණය කර තිබේ.

4 වැනි පිටුවට

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය අගයමින් නිල යතුරු පැදි සංකේතාත්මකව බෙදාදීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් අතින් ඉකුත් 18 වැනි සිකුරාදා කොළඹදී සිදුවිය. 'සැනටරි' සහායකයන් වශයෙන් 1913 ආරම්භ වූ තනතුරේ දිගුවක් ලෙස 1977 වසරේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් බවට පත් වූ ඔවුහු වර්තමානයේ දැඩි ජීවිත අවදානමක් සහිතව සේවය කිරීම ඉකුත් කොවිඩ් - 19 වසංගතය හමුවේ සැම දෙනාගේ අතිශය පැසසුමට ලක් විය. වර්තමානයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 2750ක් දිවයින පුරා සේවය කරන අතර සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශ 26ක් ආවරණය වන පරිදි ප්‍රමුඛතා පදනමින් මෙවර යතුරු පැදි බෙදා දෙනු ලැබුණි. ඔවුනට ඉකුත් 'යහපාලන' ආණ්ඩු සමයේ කිසිදු යතුරු පැදියක් ලැබී නොතිබුණි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට දැනට ඇති වසර දෙකක පුහුණු කාලය දීර්ඝකර උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමඟ සාකච්ඡා කර ඉදිරියේදී උදාකර දෙන බවද ජනාධිපතිවරයා එහිදී අවධාරණය කෙළේය. සෞඛ්‍ය ඇමැතිනී නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි, අමාත්‍යාංශ ලේකම් මේජර් ජනරාල් විශේෂඥ වෛද්‍ය සංජීව මුණසිංහ ඇතුළු කිහිප දෙනෙක්ම එම අවස්ථාවට එක්ව සිටියහ.

බාහිර උපාධියට නව විෂය මාලාවක්

(සුභාෂිණී ජයරත්න)

රැකියා ඉලක්ක කරගනිමින්, භාෂාමය හා තාක්ෂණ දැනුමින් පොහොසත් නව විෂය මාලාවක් කලා බාහිර උපාධි පාඨමාලා සඳහා හඳුන්වා දෙන බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා සිළුමිණට කීය.

බාහිර උපාධි ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටින 30,000ක් පමණ වන පිරිසක් උපාධි සඳහා තෝරා ගෙන ඇති විෂය ධාරා අනුව රැකියා ලබා ගැනීමේදී මතුවන ගැටලු ඉවත් කර රටට සංවර්ධනයට දායකත්වය ලබා දිය හැකි ආකාරයට විෂය මාලා සංවර්ධනය කර එම පිරිසට වඩාත් ඵලදායි උපාධියක් ලබා ගැනීමට මේ අනුව හැකි වන බවද මහාචාර්යවරයා කීය.

4 වැනි පිටුවට



ඉදිරි වසර පහ ඇතුළත නව නිවාස අසූ දාහක්

(නිහාල් පී. අබේසිංහ)

"ඔබට ගෙයක් - රටට හෙටක්" සංකල්පය තේමා කරගනිමින් ඉදිරි වසර 4 ඇතුළත ග්‍රාම නිලධාරි මට්ටමින් දීප ව්‍යාප්තව නව නිවාස 70,100 ක් ඉදිකරන බවත් ඉන් දැනටම නව නිවාස 14,022 ඉදිවෙමින් පවතින බවත් නිවාස සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතා පවසයි. ඊට අමතරව සපිරි මහල් නිවාස වැඩසටහන යටතේ වැරැල්ලවත්ත, මිහිඳුපුර, පරංගියාකුඹුර, දහයියාගම, මත්තේගොඩ, සොයිසපුර හා තංගල්ල නගර කේන්ද්‍ර කරගනිමින් නිවාස 1500 බැගින් ඉදිකිරීමට සැලසුම් කර ඇතැයි ද ඒ මහතා පවසයි.

4 වැනි පිටුවට

සිම්පල් මෑන්

"නෑ. !. නෑ..!!.. ඒ ජලහිතිකාව හැදිලා එක එකා කාගන්න විපක්ෂයේ කට්ටිය නෙවෙයි. කැලේ ඉන්න නරි වගයක්....".

සංචාරක ව්‍යාපෘති 7කට යුරෝපා සංගමයෙන් ආධාර

(තාරක වික්‍රමසේකර)

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම පිණිස අදාළ ව්‍යාපෘති 7ක් වෙනුවෙන් යුරෝ මිලියන 4.9ක ආධාර ලබා දීමට යුරෝපා සංගමය එකඟ වී ඇතැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

අදාළ මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේ සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් ලබා දෙන යෝජනා මාලාවන්ට බව පෙන්වා දුන් ඇමැතිවරයා ඒ අනුව සංචාරක මාර්ගෝපදේශ සැකසීම,

4 වැනි පිටුවට

හිස

● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

කප්පම්කාරයන්ගේ සහ මනුෂ්‍ය ඝාතකයන්ගේ ළතෝනිය

වර්තමානයේ වෙසෙන බොහෝ දෙනා ශරීර හොරුන්ය. ඔවුහු ඇඟපත වෙහෙසා වැඩක් පලක් කර යමක් උපයා ගැනීමට කිසිම කැමැත්තක් නොදක්වති. එහෙත් එවැනි රැකියා ඇත්තේ ඉතාමත් සුළු සංඛ්‍යාවක් නිසා එකී ශරීර හොරුන් දැන් අලුත්ම පන්නයේ ආදායම් මාර්ගයක් සොයා ගෙන තිබේ.

එනම් කප්පම් ගැනීමය. එහිදී සිදු කෙරෙන්නේ යමකුට තර්ජනය කර ඔහු තුළ මරණ බිය උපදවා තමන්ට අවශ්‍ය මිල මුදල් හෝ වෙනත් වටිනා යමක් ලබා ගැනීම ය. බොහෝ විට එය අදෘශ්‍යමානව සිදු කෙරේ. යම් කප්පමක් ලබා ගැනීම සඳහා අදාළ පුද්ගලයාට තර්ජනය කිරීම පමණක් නොව එමගින් ඉල්ලා සිටින මුදල පවා ලබා ගන්නේ ඉතාමත් රහසිගතවය.

කෙසේ වෙතත් යමකුගෙන් කප්පම් ඉල්ලීම පමණක් නොව එලෙස කප්පම් දීම ද මෙරට පවතින නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. කප්පම් ගැනීම වර්තමාන නීතියට අනුව බලවත් වරදක් වුවද කප්පම් ගැනීම නතර කිරීමට රටේ නීතියට නොහැකිවී තිබේ. මේ තත්ත්වය වඩාත් බරපතළ වී ඇත්තේ නීතිය ආරක්ෂා කිරීමට සිටින ඇතැම් නිලධාරීන් ද කප්පම් ගැනීමට පෙලඹී ඇති බැවිනි. එහෙත් ඒ හැම දෙනෙකුටම නොවේ. ඉතාමත් ගෞරවනීය සහ අපක්ෂපාතී ලෙස තම රාජකාරිය ඉටු කරන නිලධාරිහු ද අප අතර සිටිති.

කප්පම් ගැනීම අද කොතරම් උග්‍ර තත්ත්වයකට පත්වී ඇත්දැයි කිවහොත් මහ මග දුවන පෞද්ගලික බස්රථ වලින් මසකට රුපියල් කෝටි විස්සක් අතරමග සිටින කප්පම් කරුවන් විසින් ලබා ගන්නා බව මාධ්‍ය වාර්තා මගින් අසන්නට ලැබුණේය. එම මුදල් මෙලෙස පැහැරගනු ලබන්නේ නිල සහ නිල නොවන කප්පම් කරුවන් විසිනි. මෙහිදී නිල කප්පම් කරුවන් ලෙස ගැනෙන්නේ මහමග සිටින මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ඇතැම් නිලධාරීන්ය. මාර්ග පරීක්ෂක නිලධාරීන් සහ වේලා සටහන්කරුවන් වූ මෙම පිරිසට ඔවුන් විසින් ඉල්ලා සිටින කප්පම් මුදල නොදුනහොත් සිදුවිය හැකි අනර්ථ සුළුපටු නොවන බව බස් සේවකයන්ගේ පිළිගැනීමයි. ඒ එක් කොටසක් පමණි.

එම නිල කප්පම් කරුවන්ට අමතරව නිල නොවන කප්පම් කරුවන්ට ද දිනපතා කප්පම් ගෙවීමට බස් සේවකයන්ට සිදුවී තිබේ. ඔවුන් ඉල්ලා සිටින මුදල දීමට අදිමදි කරන බස් සේවකයන්ට සිදුවී ඇත්තේ අම්බානක ගුටි කෑමට ය. නැතහොත් කට කැපී යන පරිදි දැළි පිහි පාරක් කෑමටය.

එලෙස බස් සේවකයන්ගෙන් කප්පම් ගත් තවත් පිරිසක් වන්නේ පොලිසියේ මහත්වරුන්ය. කෙසේ වෙතත් පොලිසියේ මහත්වරුන්ගේ කප්පම් ගැනීම දැන් තරමක් අඩුවී තිබේ.

මේ අතර ඉකුත් සතියේ දී තවත් අලුත්ම මාදිලියේ කප්පම් ගැනිල්ලක් ගැන අසන්නට ලැබිණි. වාහනයක් කුලියට ගැනීමේ මුවාවෙන් සිදු කෙරුණු එම කප්පම් සිද්ධියේ මහ මොළකරු වූයේ සැප වාහන වලින් ගමන් බිමන් යන ඊනියා මහත්මයෙකි. වාහනයේ හිමිකරු කල්තියා පොලීසියට ඔත්තු දීම නිසා කප්පම් කාරයන් රොත්ත පිටින්ම පොලීසියට කොටුවී තිබුණේය.

මෙතෙක් සිදුවී ඇති අන්දමට එම කප්පම්කරුවන් ද ටික දිනක් රිමාන්ඩ් භාරයේ පසුවී ඇප පිට එළියට පැමිණ යළිත් සිදුකරනු ලබන්නේ ද එවැනිම මගෝඩකම් බවට සැක නැත. දැනට අධිකරණය හමුවේ පවතින නඩු විසඳීමේ ප්‍රමාදය නිසා මෙම මෙවැනි චූදිතයන් යළි යළිත් පෙර වැරදිම සිදු කිරීමට පෙලඹී සිටින බව කනගාටුවෙන් වුවද කිව යුතුය.

එවැනි කප්පම්කරුවන් ඇතුළු විවිධ හොර මැරකම් සිදු කරන මැරයන් ගැන වත්මන් ආණ්ඩුවේ ප්‍රබලයන් ද නොදැන සිටිනවා විය නොහැකිය. කෙසේ වෙතත් මේ දිනවල රජයේ බලධාරින්ගේ වැඩි අවධානයක් යොමුවී ඇත්තේ මත්කුඩු උවදුර ඇතුළු පාතාලයට සම්බන්ධ මැරයන් සහ මැර කල්ලි මර්දනය කිරීම ගැන නිසා ඒ සඳහාත් පොලීසිය ඇතුළු ආරක්ෂක බලධාරින්ට ඉඩ ප්‍රස්ථාවක් ලබාදිය යුතුය. අප එසේ කියන්නේ සීඝ්‍රයෙන් ලෝකය පුරා පැතිරෙමින් තිබෙන මත්කුඩු උවදුර නිසා රටේ තරුණ පෙළ වදපීදී යාමට ඉඩ ඇති බව සක් සුදක් සේ පෙනීයන බැවිනි. එහෙයින් මත්කුඩු උවදුර සහ පාතාලය මර්දනය කිරීමට ආරක්ෂක අංශ දක්වා උනන්දුවට අපේ ආචාරය හිමි විය යුතුය. ඒ ගැන කතා දෙකක් නැත.

එසේම ආරක්ෂක බලධාරින් ඉන් අනතුරුව ප්‍රමුඛත්වය දිය යුත්තේ රටපුරා වෙසෙන මෙවැනි කප්පම්කරුවන් හසුකර ගැනීම පිණිස ය. නැතහොත් අපේ රට කප්පම්කරුවන්ගේ පාරාදීසයක් බවට පත්වීමට ඉඩ තිබේ.

මෙරට ආරක්ෂක ලේකම් සහ විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න ඉකුත් දා අපූරු කතාවක් කීවේය. එනම් කඩුවෙලට නොදුරින් පිහිටි එක්තරා සති පොළක ගොටුකොළ විකුණන වයසක අම්මා කෙනකු ගෙන් එක්තරා කප්පම්කරුවකු මසකට රුපියල් 5000 ක කප්පම් මුදලක් ලබා ගන්නා බවයි. කප්පම්කරුවන් තුළ ඇති ක්‍රැර බවත් අනුකම්පා විරහිත ස්වභාවය නිසා ඔවුන් එසේ කරනවා විය හැකිය. ඒ ඔවුන්ට සිතා බැලීමට තරම් මොළයක් නැති බැවිනි. නැතහොත් ඔවුන් මොළය මත වාඩිවී සිටින බැවිනි.

අනෙක් අතට කප්පම් ගැනීමට පුරුදු වූ පුද්ගලයා තමන්ගේ මෑණියන් හෝ පියාගෙන් වුවද කප්පම් ගනී. ඒ ඔහු තමන් ගැන විනා අනුන්ගේ යහපත ගැන බිඳක්වත් නොසිතන නිසාය. මේ අතර මැරයන් විසින් තමන් පැහැරගෙන ඇතැයි පියාට දුරකතන ඇමතුමක් දුන් එක්තරා කොලු තාත්තෙකු තම පියාගෙන් කප්පම් ගැනීමට තැත් කළ සිද්ධියක් ගැන ද කලකට ඉහතදී අසන්නට ලැබුණේය. තවත් අවස්ථාවකදී මෙවැනි ක්‍රියාවක් සිදුකර තිබුණේ ළාබාල සුරූපී තරුණියකි. ඇයගේ අවශ්‍යතාවය වී තිබුණේ තම පෙම්වතා සමග විනෝද වීම සඳහා මවගෙන් මුදල් ලබා ගැනීමය.අන්තිමේ දී පෙම් යුවළ පොලීසියට කොටුවූහ. තමන් දැඩිලෙස ඇබ්බැහි වී සිටින කුඩු ගැසීම සඳහා ද ඇතැම් තරුණ පිරිස් මෙලෙස කප්පම් ගැනීමට පෙලඹී සිටිති. මීට වසර තිස් පහකට හෝ හතළිහකට පමණ ඉහත දී මතුගම ප්‍රදේශයේ විසූ සමන් කුමාර නැමැති කුඩා පාසල් සිසුවකු මැරයන් කීප දෙනෙකු විසින් රවටා ගෙන ගොස් අමානුෂික ලෙස ඝාතනය කර තිබුණේය. අනතුරුව දී ලොකු කප්පම් මුදලක් ඉල්ලා සිටීමය. තම පුත්‍රයා කෙරෙහි තිබූ ආදරය සහ සෙනෙහස නිසා දෙමාපියන් එම කප්පම ලබා දුන්න ද අවසානයේ ඔවුන්ට සොයා ගත හැකිවූයේ අමානුෂික ලෙස ඝාතනය කර තිබූ තම පුත්‍රයාගේ මළ සිරුරය. අන්තිමේ දී බලනවිට ඒ අමානුෂික ඝාතනයට සහ කප්පම් ඉල්ලීමට මුල්වී තිබුණේ පවුලේ හිතවතෙකි. සිසුවා සෙවීමට ද ඔහු බොහෝ සෙයින් වෙහෙසී තිබුණේය.

එකල අද මෙන් මත් කුඩු උවදුරක් නොතිබිණි. එහෙයින් සමන් කුමාර සිද්ධියට මුල් වන්නට ඇත්තේ පෞද්ගලික එදිරිවාදිකමක් හෝ මුදල් අවශ්‍යතාවක් විය හැකිය. නැතහොත් එම හේතු සාධක දෙකම විය හැකිය.

එදා එම චූදිතයන් අත්අඩංගුවට ගත් පොලීසිය ඔවුන්ට එරෙහිව අධිකරණය හමුවේ නඩු පවරා තිබුණේය. එහිදී එම චූදිතයන්ට ලැබුණු දඬුවම කුමක්දැයි මට අමතකය. එකල මරණ දඬුවම ක්‍රියාත්මක නොකෙරුණි. එහෙයින් මේ වන විට ඔවුන් යළි සමාජගතව සිටිය ද තමන් විසින් සිදු කළ ඒ සහගහන අපරාධය මතකයට නැගෙන මොහොතක් පාසා අදටත් ඔවුන් මැරි මැරී ඉපදෙනවා විය හැකිය. ඒ අනුව කිව හැක්කේ කප්පම් ගැනීම සඳහා මනුෂ්‍ය ඝාතන සිදු කරන පාපකාරී පුද්ගලයන් නීතියේ හිඩැස් වලින් බේරී ගිය ද ස්වභාව ධර්මයේ දඬුවමට යටත්වීමට ඔවුන්ට කෙදිනක හෝ සිදුවන බවය.

යුද හමුදාපති පනාගොඩ යුද හමුදා කඳවුරේ පුහුණුලාභීන්ගේ සුව දුක් විමසමින්

නායකත්ව පුහුණුවට අදාළ ක්‍රියාකාරකමක යෙදෙමින්

රාජ්‍ය සේවයට අලුතින් බඳවාගත් උපාධිධාරී 50000ක් පුහුණුවන හැටි

'අපි දෙන්නේ යුද පුහුණුවක් නෙමේ රටට වැඩදායි අලුත් නායකත්ව පුහුණුවක් '

යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා

'අලුත් උපාධිධාරීන්ට මෙරට ප්‍රථම වරට දවස් 105 ක පුහුණු වැඩසටහන් 5 ක්'

'ප්‍රවීණ විද්වතුන් ලවා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව'

● නිහාල් පී. අබේසිංහ

"මේ පුහුණුව යුද හමුදා කඳවුරුවල තිබෙන නිසා අපි හුඟක් බයෙන් ආවේ. ඒත් දැන් අපිට හිතෙන්නේ මේ පුහුණුව අපිට ලැබුණු ලොකු භාග්‍යයක් කියලා." අපේ අම්මලා තාත්තලා පවුලේ අය මේ ගැන බයෙන් හිටියේ. දැන් අපි ඇවිල්ලා දවසෙන් ම අපි ඒ අයගේ බිය නැති කළා. මේ මගින් අපිට දුකක් නොව සතුටක් කියලා අපි ඒ අයට දැන්වූවා. මේ පුහුණුව රටට ජනතාවට වාසි දායි මෙතෙක් මෙරට නොවූ විරූ නව රාජ්‍ය සේවක පරම්පරාවක් බිහි කරන අලුත්ම විදියේ සංවිධානාත්මක පුහුණුවක්."

මේ බව සතුටින් පැවසුවේ පනාගොඩ යුද හමුදා කඳවුරේ දී අපට හමුවූ රාජ්‍ය අංශය සඳහා තෝරා ගනු ලැබූ උපාධිධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන 'නායකත්ව හා අභිප්‍රේරණ' නායකත්ව පුහුණු වැඩමුළුවට එක්වූ යුවතියන් රැසකි.

ජනාධිපතිතුමාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයට සමගාමීව රාජ්‍ය අංශයට උපාධිධාරීන් 50000 ක් බඳවා ගෙන ඇත. ඒ අය සඳහා ජනාධිපති තුමන්ගේ උපදෙස් අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ අධීක්ෂණය ඇතිව යුද්ධ හමුදාව විසින් පවත්වනු ලබන නව 'නායකත්ව අභිප්‍රේරණ' පුහුණු වැඩසටහන දිවයින පුරා ආරක්ෂක සේනා මූලස්ථාන රෙජිමේන්තු මූලස්ථාන හා පුහුණු පාසල් ඇතුළු ස්ථාන 51 කදී දැන් ආරම්භ වී සාර්ථකව පවත්වාගෙන යයි.

මෙම උපාධිධාරී සම්පූර්ණ පුහුණු වැඩසටහන සඳහා ජනාධිපති කාර්යාලය, ශ්‍රී ලංකා යුද හමුදාව, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වැනි ආයතන ද පූර්ණ සහාය දක්වයි.

වත්මන් රජයේ උපාධිධාරීන් 50000 කට රැකියා ලබාදෙන වැඩපිළිවෙළ මෙහෙයවන රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ජේ.ජේ. රත්නසිරි මහතා පවසන්නේ මේ අලුත් උපාධිධාරි රැකියාලාභීන් සඳහා මෙරට නොවූ විරූ අලුත් නේවාසික පුහුණු වැඩසටහන් 5 ක් දින 105 ක් තුළ පැවැත්වෙන බවයි.

"මේ හැම පුහුණු වැඩසටහනකට දින 21 ක් පැවැත්වෙනවා. මුල්ම පුහුණු වැඩසටහන දැන් ක්‍රියාත්මකයි. එය කරන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ හා ත්‍රිවිධ හමුදාවල සහාය ඇතිව ය. ඒ අනුව තෝරාගත් 10000 බැගින් 50000 ට වට පහකදී පුහුණුව ලබාදෙනවා. මුලින් ම නායකත්වය පිළිබඳව සති 3 ක පුහුණුවක් දෙනවා.

ඉදිරියේදී ජනතා හිතකාමී රාජ්‍ය සේවකයෙක් බවට පත්වන මේ පිරිස තුළ නායකත්වය හා ආකල්ප කුසලතා වර්ධනය කරමින් සාමූහිකවත් වගකීම් සහගතවත් රාජකාරිය ඉටු කරන ආකාරය පිළිබඳ මනා පුහුණුවක් ලබාදීමට මෙම මුල් පුහුණුවේ අරමුණ බව ද රත්නසිරි මහතා පවසයි.

යුද්ධ හමුදා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් සිදුකරන ලබන මෙම වැඩසටහන මගින් පුහුණු, කාර්යක්ෂම ශ්‍රම බළකායක් ලෙස ජාතිය ගොඩනැගීම සඳහා දායකත්වය තීව්‍ර කිරීම වෙනුවෙන් රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලබයි. ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන මෙම වැඩසටහන යුද හමුදා මූලස්ථානයෙහි සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක කෙරේ.

මෙම ක්‍රමවේදය මගින් 'නායකත්වය හා සමූහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම', 'ව්‍යාපෘති කටයුතු සහ ක්ෂේත්‍ර අධ්‍යයනය', 'සහජීවනය සහ අවස්ථානුකූලව කටයුතු කිරීමේ හැකියාව' වැනි විෂයයන් ඔස්සේ රාජ්‍ය ඵලදායිතාවයට බලපෑ හැකි දුබලතා අවම කරමින් කාර්යක්ෂම රාජ්‍ය අංශයේ සේවකයකු බිහිකිරීමට අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන සාර්ථකව නිම කරනු ලබන පුහුණු උපාධිධාරියෙකු පුහුණු කළමනාකරණ කුසලතා, රාජ්‍ය අංශයේ අරමුණ පිළිබඳ පැහැදිලි අවබෝධය, උනන්දුව සහ කැපවීම, ආත්ම විශ්වාසය, නවෝත්පාදන බිහිකිරීමේ හැකියාව, නම්‍යශීලීභාවය, මනා දැක්ම වැනි ගුණාංග ප්‍රගුණ කර සමාජයේ ගෞරවයට හා පිළිගැනීමට භාජන වන කාර්යක්ෂම රාජ්‍ය අංශයේ නිලධාරියෙකු වශයෙන් සමාජගත වීම අපේක්ෂා කෙරේ.

මේ වැඩසටහන පිළිබඳව කටයුතු සොයා බැලීම පිණිස යුද්ධ හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පසුගියදා පනාගොඩ යුද හමුදා කඳවුර වෙත පැමිණියේය.

යාපනයේ නායකත්ව පුහුණුවට පැමිණ 2078 දෙනකු හරසරින් පිළිගත් අයුරු.

රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ. රත්නසිරි

'කාල සටහනකට සියල්ල සිදුවෙයි කුසලතා වර්ධනයට පූර්ණ පහසුකම්'

එහිදී ඔවුන් ඇමතූ හමුදාපතිවරයා පැවසුවේ මෙය කිසිසේත්ම හමුදා පුහුණුවක් නොවන බවයි. ශ්‍රී ලංකා යුද හමුදාවේ මේ පුහුණුව මගින් අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍ය තුමාට අවශ්‍යතාව වෙන්නේ මේ උපාධිධාරී අය රැකියාවක් කරන අයකු පමණක් නොවෙයි. රටටත් ඔබටත් ජනතාවටත් වැදගත් කාර්යක්ෂම රාජ්‍ය සේවකයකු හා පුරවැසියකු ලෙස මේ පුහුණුව මගින් රටට දායාද කරවීමයි."

"මෙතන කිසිම හමුදා පුහුණුවක් නැහැ. නමුත් යම් ඉලක්කයකට යන්න යම් අරමුණක් ඉෂ්ට කරගන්න අපි අනුගමනය කළයුතු දේ පිළිබඳව අපි ප්‍රවීණ විද්වතුන් ලවා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙනවා." ප්‍රථමාධාර, අලුත් දැනුම ලබාදීම හා කුසලතා වර්ධනය පිළිබඳ දෙසුම් මගින් නායකත්ව අභිප්‍රේරණ වැඩසටහනක් ලෙස අපි මේක පවත්වනවා."

"ඔබේ යුතුකම වන්නේ අපේ මේ සුවිශේෂී නායකත්ව පුහුණුව හොඳින් ලබාගෙන ඒ පුහුණුවේ අත්දැකීම් හා පන්නරය මගින් ජනතාවට හා ඔබටත් වැඩදායි කාර්යක්ෂම රාජ්‍ය සේවකයෙක් ලෙස රටට සේවය කිරීමයි.

අපේ නිලධාරීන් ඔබට සියලු පහසුකම් දෙනවා යැයි ද හමුදාපතිවරයා පැවසීය.

ගලේවෙල හංසි නවරත්න

අත්තනගල්ලේ සුභානි විජේසිංහ

ගම්පහ රෂ්මි වෛද්‍යතිලක

මහනුවර කාන්ති රණසිංහ

'එනකොට හිතුවේ බිල්ලෙක් කියලා නමුත් දැන් මේක අපට සතුටක්'

ගලේවෙල සිට පුහුණුවට පැමිණි හංසි නවරත්න

මෙහිදී හමුදාපතිවරයා මේ පුහුණු ලාභීන්ගේ ආහාර පාන හා නවාතැන් පිළිබඳව ද පෞද්ගලිකව සොයා බැලීය.

පනාගොඩ කඳවුරේ මෙම පුහුණු වැඩසටහන බාර ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු නිලධාරීන් පවසන පරිදි මේ අය සඳහා පුහුණුව දින 21 කි.

පුහුණුවන්නන් සියලුම දෙනා නියමිත කාල සටහනක අනුව සියලුම කටයුතු කළ යුතු ය. ඒ අනුව උදේ 6 ට පිබිදී උදේ 7.30 පමණ උදේ ආහාරය ලබාගත යුතුය.

පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා ඔවුන්ට විවිධ ක්ෂේත්‍ර දේශන පිළිබඳව විවිධ දේශන පවත්වනු ලැබේ. යුද හමුදා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් අනුව මෙහිදී විශේෂයෙන් නායකත්ව ප්‍රවර්ධනය කාල කළමනාකරණය, අභිප්‍රේරණය, ගැටුම් නිරාකරණය, ප්‍රථමාධාර, කුසලතා ප්‍රවර්ධනය, සාමූහිකව වැඩ කිරීම ආදිය පිළිබඳව රටේ ප්‍රවීණ විද්වතුන් විසින් මේ අයට දේශන පවත්වනු ලැබේ. එහිදී සාකච්ඡා හා ගැටලු විසඳීම ද සිදුකෙරේ. සවස 4.30 න් පසු ශාරීරික ක්‍රියාකාරකම් ක්‍රීඩා වැඩසටහන් යුද හමුදා කඳවුර පිළිබඳව දැනුම්වත් කිරීම් පවත්වනු ලැබේ.

පාබල හමුදාවේ කර්නල් සුජිත් කුලසේකර පවසන පරිදි පනාගොඩදී පුහුණුවන පිරිස 100 කි. රාත්‍රි 7.30 – 8.30 අතර කාලයේදී කුසලතා, නායකත්ව හා පෞරුෂත්ව ප්‍රවර්ධන ප්‍රායෝගික වැඩසටහන්වලට පිරිස එක්වී සහභාගි වෙති. රාත්‍රි 8.30 ට රාත්‍රි ආහාරය ලබාගෙන රාත්‍රි 10.00 මේ පිරිස නින්දට යාම සිදුකළ යුතු ය. මේ සියලු කටයුතු පනාගොඩ යුද හමුදා කඳවුරේ ශ්‍රී ලංකා පාබල හමුදාවේ කර්නල්වරු හා නිලධාරීහු පිරිසක් මෙහෙයවති. මීට අමතරව පාබල හමුදාව මගින් තවත් 400 ක් සඳහා වෙනත් කඳවුරුවල මේ පුහුණුව ලබාදෙයි.

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ යුද හමුදා මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් චන්දන වික්‍රමසිංහ මහතා පැවසුවේ මෙම පුහුණු වැඩසටහන සාර්ථක කර ගැනීමට යුද හමුදා මූලස්ථාන පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණතම සම්පත් දායකයන් මෙයට නිරන්තරයෙන් ම සම්බන්ධකර ගන්නා බවයි.

මෙම ප්‍රයත්නයේ කෙටිකාලීන ඉලක්කය වන්නේ නායකත්ව කුසලතා සහ ගති ලක්ෂණ, කණ්ඩායම් හැඟීම මත පදනම්ව රටේ සියලුම පුරවැසියන්ට උසස් තත්ත්වයේ රාජ්‍ය අංශයේ සේවාවක් සැපයිය හැකි ශක්තිමත්, ඉලක්කගත, විනයගරුක හා කාර්යක්ෂම සහ නිපුනතාවයන්වලින් පරිපූර්ණ ශ්‍රම බළකායක් බිහි කිරීමයි.

එසේම, වසර පහකට අඩු කාලයක් තුළ සපුරාගැනීමට අපේක්ෂිත දිගුකාලීන අරමුණු අතරට පිළිගත් රාජ්‍ය අංශයේ ශ්‍රම බළකායක් ලෙස සංවර්ධනය කිරීම, කාර්යක්ෂම යාන්ත්‍රණය, ආකල්ප හා ප්‍රවේශයන් පරිවර්තනය කිරීම, රාජ්‍ය අංශය, සමාජයේ 'වැඩ කරන සංස්කෘතියක්' ලෙස ප්‍රවර්ධනය කිරීම, පිළිගැනීමක් සහිත රාජ්‍ය අංශයේ සේවයක් බිහිකිරීම, අඛණ්ඩ සමාජ මෙහෙයුම් අංශ හඳුනා ගැනීම සහ ඇගයීම ආදි වර්ධනයන් අපේක්ෂා කෙරේ.

දේශන, සාකච්ඡා, එළිමහන් පුහුණු ක්‍රියාකාරකම්, සමූහ ක්‍රියාකාරකම්, අධ්‍යයන චාරිකා, ශක්‍යතා අධ්‍යයන සහ ක්ෂේත්‍ර අධ්‍යයන මගින් සිදුකරනු ලබන මෙම යුද්ධ හමුදා පුහුණු වැඩසටහන ස්වාධීන මෙන් ම අන්තර් සම්බන්ධීකරණ ක්‍රමෝපායන් 05 ක් යටතේ රාජ්‍ය අංශයේ ක්‍රියාශීලී දායකත්වය සහිතව ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම පුහුණු වැඩසටහන මැනවින් පවත්වා ගැනීම වෙනුවෙන් උපායමාර්ගික මග පෙන්වීම් ලබාගැනීම සඳහා පුහුණු වැඩසටහන ක්‍රියාවට නංවනු ලබන මාස 05 ක කාලය පුරා යුද්ධ හමුදා මූලස්ථානය, ජනාධිපති ලේකම් කාර්යාලය හා ආරක්ෂක අමාත්‍යාංශය සහ සම්බන්ධව කටයුතු කරනු ලැබේ.

පනාගොඩ යුද හමුදා නායකත්ව පුහුණුවට පැමිණි උපාධිධාරිනියන් කිහිප දෙනෙක් හමුවීමට ද අපට අවස්ථාව ලැබිණි.

මෙහිදී අපට මුලින් ම හමුවූ ගලේවෙල සිට පැමිණි හංසි නවරත්න පැවසුවේ මේ පුහුණුව ඒමට පෙර සිතුවාට වඩා හොඳ බවයි. මේ වගේ නායකත්ව වැඩමුළු අපිට විශ්ව විද්‍යාලයට යන කොටත් ලැබුණා.

'ඊළඟ අයටත් අපි කියන්නේ මේ පුහුණුවට බය නැතිව එන්න කියලයි'

ගම්පහ සිට පැමිණි රෂ්මි වෛද්‍යතිලක

හැබැයි මේක නම් ඊට වඩා ඉහළම මට්ටමේ නායකත්ව පුහුණු වැඩසටහනක් බව කිවයුතුයි. රාජ්‍ය සේවයේ ගුණාත්මක ප්‍රවර්ධනය කරන හැටි කියා දෙනවා. අපි දැන් කාල සටහනක් අනුව වැඩ කරනවා. රටට වැඩදායි නායකයෙක් අප තුළින් බිහි කරන්න අවශ්‍ය පුහුණුව අපට නොඅඩුව ලබාදෙන්නට ඊට අදාළ සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙනවා" යැයි හංසි නවරත්න පැවසීය.

අත්තනගල්ලේ සිට පැමිණි සුභාණි විජේසිංහ පැවසුවේ මුලදී මේකට බියක් අකමැත්තක් තිබුණත් දැන් ඒ වෙනුවට ඇත්තේ සතුටක් බවයි.

"යුද හමුදා කඳවුරක් තුළ පුහුණුව තිබෙනවා. කීවාම පවුලේ අයත් බයවුණා. නමුත් දැන් අපි ඒ අයටත් දැන්වූවා මේක හරිම සුහද හා සහෘදශීලී නායකත්ව පුහුණුවක් පමණක් බව. ඒ අනුව දැන් ගෙවල්වල තිබෙන බිය නැතිවෙලා. අපට පුහුණුවට අමතරව ඕනෑම පෞද්ගලික ගැටලුවක් වුවත් මේ යුද හමුදා නිලධාරිනියන් ළඟට ගිහින් කියන්න පුළුවන්. මේ වැඩසටහන අපට අපේ ජීවිතයට හුඟක් ඵලදායි. මේකට සහභාගිවෙන්න ලැබීම භාග්‍යයක් කියලා මම සලකනවා" සුභානි විජේසිංහ පවසයි.

ඊළඟට අපට හමුවූයේ ගම්පහ සිට පැමිණි රෂ්මි වෛද්‍යතිලක පැවසුවේ මේ නායකත්ව පුහුණුවට එක්වුණු හැමට උපරිම පහසුකම් ලබාදීමට යුද හමුදාව කටයුතු කරන බවයි.

"සියයට 200 ක් අපට පහසුකම් තිබෙනවා. අපි පළමු වැනි කණ්ඩායම ඊළඟ කණ්ඩායමේ අයට අපි කියන්නේ බයක් නැතිව මේ පුහුණුවට එන්න කියලා" ඇය පැවැසුවාට මේ පුහුණුවට මේ රැකියාවට අපිව යොමු කළ ජනාධිපතිතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා යැයි ද ඇය කීවාය.

මහනුවර ප්‍රදේශයෙන් ද මේ පුහුණුවට උපාධිධාරිනියෝ පැමිණ සිටියහ. මහනුවරින් පැමිණි කාන්ති රණසිංහ පැවසුවේ මේ මනා පුහුණු වැඩසටහන මගින් කාර්යක්ෂම රාජ්‍ය සේවකයෙක් රටට ජනතාවට ලැබෙන බවයි. මුලින් නම් ටිකක් බය හිතුණා. දැන් නම් ඇත්තේ ලොකු සතුටක්. ඇය තවදුරටත් කීවාය.

මෙම නායකත්ව පුහුණු වැඩසටහනින් පසු ඊළඟ සති තුනේදී මේ පිරිසට විශ්වවිද්‍යාලවල සහාය ඇතිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ පූර්ණ සහාය ඇතිව තවත් සති 3 ක පුහුණුවක් ලබාදෙනු ලැබේ.

ඒ පිළිබඳව අපට අදහස් දැක්වූ රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ජේ.ජේ. රත්නසිරි මහතා පවසන පරිදි එහිදී කළමනාකරණ පීඨවල ආචාර්යවරුන් විසින් මේ පිරිසට කළමනාකරණය සහ කළමනාකරුවකුගේ ගුණාංග පිළිබඳව මනා අවබෝධයක් ලබාදීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙහිදී කාර්යාල පරිපාලනය, පිරිස් පාලනය, සාමාන්‍ය කළමනාකරණය පිළිබඳව සති 3 ක පුහුණුවක් ලබාදෙයි.

මේ පුහුණු වාර දෙක සාර්ථකව අවසන් වීමෙන් පසු ඊළඟට මේ පුහුණුලාභීන් රජයේ කාර්යාලවල පුහුණුවට අනුයුක්ත කරනු ලැබේ. විශේෂයෙන් මෙහිදී ඔවුන් යොමු කරනු ලබන්නේ ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය ආයතනවලටයි." මෙහිදී විශේෂයෙන් අපේ උපදෙස් ඇතිව ලිපිගොනු පවත්වාගෙන යාම, සාමාන්‍ය කාර්යාල කටයුතු, මුදල් රෙගුලාසි විනය පවත්වාගෙන යාම වැනි කාරණා පිළිබඳව අවබෝධයක් ලබාදෙනවා. ඊට පසු මේ අයට හැකි අයුරින් පෞද්ගලික අංශයේ පුහුණුවක් ද ලබාදීමට ද අපි අපේක්ෂා කරනවා" යැයි ද ජේ.ජේ. රත්නසිරි මහතා පවසයි.

ඊළඟට මේ උපාධිධාරීහු කළ යුත්තේ ඒ රට සංවර්ධනය කරන ව්‍යාපෘතිවලින් එකක් තෝරාගෙන ඒ ගැන පුළුල් අධ්‍යයනයක් සිදුකර එහි ඇති ගැටලු ද ඊට සුදුසු විසඳුම් දෙන ආකාරය පිළිබඳව පුළුල් ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමයි.

මෙම පුහුණුව අවසානයේදී සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන උපාධිධාරීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කෙරේ. ඊට පසු සුදුසු උපාධිධාරීන් ස්ථිර රාජ්‍ය සේවයට අනුයුක්ත කරගැනීමට නියමිත බවත් ඒ අයට රාජ්‍ය සේවයේ විශ්‍රාමික වැටුප ආදී සියලු වරප්‍රසාද ලැබෙන බව

සුනබයකු වෙනුවෙන් දිවි දුන් මිනිසෙක්

● අසේල කුරුළුවංශ හා එස්.ඩී රාජනායක
ගම්පොළ සමූහ

ගලහ දෙල්තොට වත්තේ පදිංචි දෙදරු පියෙකු වන සින්නවේළු සෙල්වරාසු සුපුරුදු පරිදි පසුගිය 10 වැනිදා පස්වරුවේ ගලහ නගරයට ගියේ අතොරක් නොමැතිව වැටුණු වැසි මැද්දේය. බිලොක් ගල් වැඩපොළක කම්කරුවකු ලෙස සේවය කරන ඔහු සේවය නිම කිරීමෙන් පසු පුරුද්දක් ලෙස ගලහ නගරයට ගියේ නිවසට අවශ්‍යය අඩුම කුඩුමද රැගෙන මත්පැන් පොදක්ද තොල ගෑමටය. වැස්ස තරමක් තුරල් වූ පසු නිවෙසට යමින් සිටියදී සීතලේ ගැහෙමින් කුඩා බලු පැටවකු තමන් පසුපසින් එන බව සෙල්වරාසු දුටුවේය. ගමන නවතා මඳක් නැවතුණු සෙල්වරාසු බල්ලා එළවා දැමීමට උත්සහ කළේය. ඔහු වෙතින් මඳක් ඈතට ගොස් නැවතුණු බලු පැටවා සෙල්වරාජ් ගමන් ආරම්භ කළ පසු යළිත් ඔහු පසුපසින් එන්නට පටන් ගත්තේය.මේ සුනඛ පැටවා පසුපසින් තමන්ගේ මාරයා පැමිණෙතැයි මොහොතකට හෝ නොසිතූ සෙල්වරාසු දෙවරක් නොසිතා ඌ වඩා ගත්තේ නිවසට රැගෙන යෑමේ අදහසිනි.

පසුදින හිරු නැඟ එද්දීම නිවස ඉදිරිපිටට පැමිණි අයකු මහ හයියෙන් කතා කරනු ඇසී සෙල්වරාසු නිවසින් පිටතට පැමිණියේ ඒ කවුදැයි බලන්නට ය. බලු පැටවාගේ හිමිකරු යැයි පැවසූ ඔහු දිගින් දිගටම සෙල්වරාසුට බැණ වදින්නට පටන් ගත්තේය. ඉන් අනතුරුව සිදුවූයේ කිසිවකුත් අපේක්ෂා නොකළ දෙයකි. බලු පැටවාගේ හිමිකරු යැයි කියාගත් පුද්ගලයා වෙතින් පහර පිට පහර කෑ සෙල්වරාසු බිම ඇද වැටිණි. බල්ලා ද රැගෙන උගේ හිමිකරු පැමිණි යතුරු පැදියේ නැගී නිවස බලා යද්දී සෙල්වරාසුට සිදුවූයේ දැඩි අසාධ්‍ය තත්ත්වයෙන් රෝහල කරා යෑමටය. ගලහ රෝහලට රැගෙන ගිය ඔහුගේ තත්ත්වය බරපතළ වූයෙන් මහනුවර ජාතික රෝහලට මාරුකර යැවුවේය. එහි ප්‍රතිකාර ලබමින් සිටි සෙල්වරාජ් 12 දින පෙරවරුවේ සඳහටම දෙනෙත් පියා ගත්තේය. බලු පැටවකු නිසා මිනිස් ජීවිතයක් අහිමි වූ මෙම සිදුවීම පිළිබඳ ගලහ ප්‍රදේශයේ පමණක් නොව රටේම අවධානය යොමුවීම නිසා අපි එහි වැඩි විස්තර සොයා එම ප්‍රදේශයට ගියෙමු.

මාස දෙකක් පමණ වයස වූ සිද්ධියට මුල් වූ සුනඛයා ගමේ භාෂාවෙන් කියන්නේ නම් වල් බල්ලෙකි. සත්ත්වයකුට ආදරය කරුණාව දැක්වීමට උගේ වර්ගය කුමක්ද යන්න ප්‍රශ්නයක් කර ගැනීම යහපත් ගුණයක් නොවූවද ගම්වාසීන් පැවසුවේ රට බල්ලෙක් නම් හොරකම් කළා හරි කියන්න තිබුණා යනුවෙනි. දඩාවතේ යන සුනඛයින් එකවර පැටව් හය හත්දෙනා දැමූ පසු මහ මඟ ගමන් ගන්නා වාහන වලට අසුවී පැටවුන් මියයන අවස්ථා අපි කොතෙකුත් දැක ඇත්තෙමු. එවැනි සතුන්ට වසදී මරා දැමූ අවස්ථාද පසුගිය කාලයේ මාධ්‍ය මගින් වාර්තා විය. එසේ වුවත් මේ ආකාරයට වල් බල්ලකු වෙනුවෙන් පුද්ලගයකු ඝාතනය කළ සිද්ධියක් පිළිබඳ මෑත කාලයේ අප මතකයේ නැත. ලයින් කාමරයක දිවිගෙවන සෙල්වරාසු දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවූවෙකි. ඔහුගේ දරු දෙදෙනාද විවාහවී පදිංචිව සිටින්නේ එම නිවසේමය.

'අපේ අම්මා නැතිවෙලා. තාත්තා තමයි හැමදේම කරන්නේ. එදා හවස 7.00 ට විතර තාත්තා වැස්සෙම ගෙදර අවා. මගේ පස්සෙන් බලු පැටියෙක් ආවා. එළෙව්වාට ගියේ නෑ. අයිතිකාරයෙක් නැති නිසා මම බල්ලව ගෙනාවා. පව් ඌ හොඳටම තෙමිලා කියලා තාත්තා කිව්වා. මම ගිහින් ඌව ගේ ඇතුළට ගෙනල්ලා රෙදි කෑල්ලකින් පිහලා පාන් කන්න දුන්නා. පනුවෙනිදා උදේ කවුදෝ ගේ ඉස්සරහා කෑගහනවා ඇහුණා. තාත්තා එළියට ගිහින් ඇයි කියලා ඇහුවම තමසේ මගේ බල්ලා අරන් ආවද කියලා එයා ඇහුවා. වැස්සේ තෙමී තෙමී බල්ලෙක් පාරේ හිටියා, ඌ මගේ පස්සෙන් ආවා, ඒ නිසා මම ඌව අරන් ආවා කියලා බල්ලා ඉන්නවා අරන් යන්න මහත්තයා කියලා තාත්තා කිව්වා. ළමයි රෑ තිස්සේ බල්ලා නැතුව අඬනවා, තමුසේ මොකටද බල්ලා ගෙනාවේ කියලා එයා තාත්තගේ කම්මුලට පාරක් ගැහුවා. ඒත් එක්කම එයා කකුලෙන් තාත්තගේ යටිබඩ පැත්තට ගැහුවා. එතකොට තාත්තා බිම ඇදගෙන වැටුණා'

සෙල්වරාසුගේ දියණිය සත්‍යප්‍රියා (23) සිද්ධිය විස්තර කළේ එසේය.

මියගිය සෙල්වරාසුගේ පුතා වන ගනේෂ් (20) ද සිද්ධිය වූ අවස්ථාවේ නිවසේ සිටියේය. ඔහු සිද්ධිය මෙසේ විස්තර කළේය.

'අපි ඉන්නේ ලයින් කාමරයක. අපේ අම්මා අවුරුදු පහකට විතර කලින් මැරුණා. තාත්තා තමයි එදා ඉඳන් අපි බලා ගත්තේ. එදා උදේ කවුදෝ කෙනෙක් අපේ ගේ ඉස්සරහා කෑ ගහනවා ඇහුණා. ටික වෙලාවකින් එළියේ කලබලයක් වගේ ඇහුණා. මම යනකොට තාත්තට කෙනෙක් හොඳටම ගහනවා. තාත්තා බිම වැටුණට පස්සේ එයා බල්ලව අරන් බයිසිකලේ නැගලා ගියා. අපි තාත්තව උස්සගෙන ගේ ඇතුළට ආවා'

පහර කෑමෙන් අසාධ්‍ය තත්ත්වයට පත් සෙල්වරාසු කඩිනමින් රෝහල්ගත කරන්නට කටයුතු කළේ අසල්වැසියකු වූ පී. සංජීව ය. 'සද්දේ ඇහිලා මම එනකොට සෙල්වා අයියට හොඳටම ගහනවා. මම ගිහින් පහර දෙන කෙනාව අල්ලගන්න ගියාම එයා මටත් ගහන්න ආවා. සෙල්වා අයියා බිම වැටුණට පස්සේ එයා අපිටත් බැණලා බල්ලා අරන් ගියා. මම 1990 කතා කරලා ඇම්බියුලන්ස් එක ගෙන්න ගෙන ඒකෙන් සෙල්වා අයියව ගලහ රෝහලට අරන් ගියා. එතනින් මහනුවරට මාරු කළා. ගොඩක් ආමාරුවෙන් හිටපු එයා පනුවදා මැරුණා'

මෙම පහරදීමට සම්බන්ධ සැකකරු ගලහ පොලීසිය මගින් සිද්ධිය වූ දිනයේම අත්අඩංගුවට ගනු ලැබීය. තිදරු පියකු වන ඔහු 43 න් හැවිරිදි වියේ පසුවෙයි. කොන්ත්‍රාත්කරුවකු වන සැකකරු පොලීසියට පවසා ඇත්තේ බලු පැටියා නොමැති වීම නිසා තම ළමුන් රෑය පුරා නිදිවර්ජිතව අඬමින් සිටි බවයි. සෙල්වරාසු නැමැත්තා බලු පැටවා රැගෙන ගිය බවට තොරතුරක් ලැබුණ නිසා තමන් ඌ රැගෙන ඒමට උදෑසනම ඔහුගේ නිවසට ගිය බවද ඔහු පවසා ඇත. මේ සියල්ලට හේතුව වූ සුනඛ පැටවා සිදුවූ කිසිවක් ගැන වගක් නොමැතිව වල්ගය වනමින් සතුටින් සිටින්නේය. දරුවන් පස් දෙනෙකුට පිය සෙනෙහස දැන් අහිමිව තිබේ. ඌ ඉල්ලා පෙරදින හඬා වැළපුණු දරුවෝ තිදෙනාගේ හැඬුම තවත් නතර වී නැත. ඒ බලු පැටවා පැමිණියත් පියා ගෙදර නොපැමිණි නිසාය.

සින්නවේළු සෙල්වරාසුගේ මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය මහනුවර ජාතික රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී ශිව සුබ්‍රමනියම් විසින් සිදුකරනු ලැබීය. මොට බලයක් යෙදීමෙන් බඩවැල් පිපිරීම නිසා විෂබීජ රුධිරයට එක්වීමෙන් මරණය සිදුව තිබෙන බව ඒ මහතා වෛද්‍ය වාර්තාව මගින් දක්වා තිබණි.

සිද්ධිය සම්බන්ධයෙන් ගම්පොළ කොට්ඨාසභාර පොලිස් අධිකාරී ශ්‍රියන්ත පීරිස් හා සහකාර පොලිස් අධිකාරී ඕ.පී අමරබන්දු යන මහත්වරුන්ගේ උපදෙස් මත ගලහ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත් මහගෙදර, අපරාධ අංශ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රත්නායක, තල්වත්ත ස්ථානීය අපරාධ අංශයේ පොලිස් පරීක්ෂක ප්‍රියන්ත බණ්ඩාර, උප පොලිස් පරීක්ෂක අබේරත්න,පොලිස් සැරයන්වරුන් වන අලහකෝන්(7393),රත්නායක (12642),කුමාර (161220) යන නිලධාරීන් සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පැවැත්වූහ. සැකකරු ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මෙම මස 21 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර තිබේ.

ඡායාරූප- ගම්පොළ සමූහ සහ ගලහ සමූහ

ඝාතනයට ලක්වූ සෙල්වරාසු

උදේ පාන්දර අයිතිකාරයා ඇවිත් සෙල්වරාසුට හොඳටම ගහලා

ගලහ රෝහලෙන් මහනුවරට මාරු කළත් ජීවිතය අහිමි වෙලා

ඝාතනය සිදුවූ ස්ථානය

සිද්ධියට මුල්වූ සුනඛයා

සෙල්වරාසුගේ නිවස

සෙල්වරාසුගේ දරු දෙදෙනා හා ඔවුන් විවාහ වී සිටින අය

සෙල්වරාසුගේ දියණිය සත්‍යප්‍රියා

අඩු මිලට බෙඩ් ෂීට් ලස්සන ඩිසයින් වලින් ඩබල් බෙඩ් ෂීට් අපේ මිල රු.290/-යි වෙළඳපළේ මිල රු.600/-යි, ඩබල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.390/-යි වෙළඳපළේ මිල රු.800/-යි, ට්‍රිපල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.490/-යි වෙළඳපළ මිල රු.950/-යි, තවත් බෙඩ් ෂීට් වර්ග 70ක්, තුවා, ලේන්සු, සරොන්, නයිට්ඩ්‍රස්, පාසල් ළමුන්ගේ මේස් රු.40/-, Cotton මේස් රු.90/-, සර්ට්යට් රු.30/- සිට, කොට්ට රු.350/- සිට, මෙට්ට කවර 3x6- රු.490/-, 4x6-රු.590/-, 5x6-රු.690/-, 6x6-රු.790/-, තොග මිලට ලබා ගත හැක
සැමිරිච්චා ක්ලෝතින් අවුට්ලට් ගුරුගේ ගේට්වර් පාර්ක් අසල, ජා-ඇල.
0771 964 341 / 0117 902 278

සමගි ජන බලවේගය සමඟ එක්වන්න ලෑස්තියි

එක්සත් ජාතික පක්ෂයේ නව නියෝජ්‍ය නායක
රුවන් විජේවර්ධන

● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

■ කාලයකට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ වෙනසක් සිදු කර ඔබ පක්ෂයේ නියෝජ්‍ය නායක ධුරයට පත් කර තිබෙනවා. මෙය අභියෝගයක් නේද?

ඔබ නිවැරැදියි. ඇත්තටම මෙය විශාල අභියෝගයක් තමයි. දැවැන්ත පරාජයකට ලක්වෙලා පක්ෂය වැටිලා තිබෙන අවස්ථාවක තමයි මට මේ අභියෝගය එල්ලවෙලා තිබෙන්නේ. ඒ නිසා මෙම තනතුරම ලොකු අභියෝගයක් ලෙස මම භාරගෙන තිබෙනවා.

ඒ වගේම මම හිතනවා මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට ලැබුණු ප්‍රතිඵලය අපි සියලු දෙනාට විශාල පණිවිඩයක් ලබා දෙනවා කියලා. මේ පක්ෂය ප්‍රතිසංවිධානය කළ යුතු බවත් මැතිවරණ ප්‍රතිඵල වලින් අපිට පසක් කර සිටියා.

පක්ෂයක් හැටියට අපට කොතැනද වැරදුණේ. අපි මොනවද සිදු කළේ. පාක්ෂිකයන් ඇයි අපිව ඈත් කළේ කියන කාරණා පිළිබඳවත් අපි සිතිය යුතුයි. මෙන්න මේ කරුණු වලට හොඳ පිළිතුරක් සෙවීම මගේ ප්‍රථම අරමුණ වෙලා තිබෙනවා.

අගමැතිවරු, ජනාධිපතිවරු මෙන්ම මැති ඇමතිවරු රාශියක් බිහි කරපු දේශපාලන පක්ෂයක් හැටියට මේ දැවැන්ත පක්ෂය නැවත ගොඩ නැගීමත් අනිවාර්යෙන්ම සිදු කළ යුතුව තිබෙනවා. මේ දැවැන්ත කර්තව්‍යය තරුණ නායකත්වයක් සමඟ අපිට සිදු කළ හැකි බව මගේ විශ්වාසයයි.

■ සමගි ජනබලවේගය බිහි වන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයන් පිරිසකගෙන්. විශේෂයෙන්ම පක්ෂයේ හිටපු නියෝජ්‍ය නායකයකු වන සජිත් ප්‍රේමදාස මහතා ප්‍රමුඛ නායකයන් රැසක් එම පක්ෂයට එක්ව සිටිනවා. ඔවුන්ව නැවත එක්සත් ජාතික පක්ෂ සමඟ සම්බන්ධ කර ගන්නේ කෙසේද?

ප්‍රථමයෙන් අප සිදු කළ යුත්තේ පාක්ෂිකයන්ගේ විශ්වාසය දිනා ගනිමින් ඔවුන් නැවත අපේ පක්ෂය වෙත එක්රැස් කර වීමයි. එලෙසම දැවැන්ත ප්‍රතිසංවිධානයක් කළ යුතුයි.

ඒ වගේම ඉදිරියේදි සමගි ජනබලවේගය සමඟ අපි සාකච්ඡා පවත්වන්නට බලාපොරොත්තු වෙනවා. මේ සඳහා අපිට කිසිදු ගැටලුවක් නොමැති බව මා අවධාරණය කරන්න කැමතියි.

රටේ දැන් තිබෙන දේශපාලන වාතාවරණය දිහා බැලුවත් අපිට සමගි ජනබලවේගය පමණක් නොවෙයි තවත් පක්ෂ රැසක් සමඟ එකට වැඩ කටයුතු කරන්න සිදුවේවි. විපක්ෂයේ සියලු පක්ෂ ඉතා ඉක්මණින් එක මේසයක් මතට පැමිණිය යුතු කාලය එළඹ තිබෙනවා.

සමගි ජනබලවේගයත් සමඟ එක්ව වැඩකටයුතු කිරීමේ වැඩපිළිවෙළක් අපි ඉතා ඉක්මණින් ක්‍රියාවට නැංවිය යුතු බව මා අවධාරණයෙන් කියනවා. එපමණක් නොවෙයි ඒ සඳහා ගැටලුවක් නොමැති බවද මා නැවත නැවත සඳහන් කරන්න කැමතියි.

■ ඔබ ඉන් අදහස් කරන්නේ සමගි ජනබලවේගය සහ එක්සත් ජාතික පක්ෂය එක කණ්ඩායමක් බවට පත් වනවා කියලද?

ඔව්. අපි එක කඳවුරක් තමයි. මොකද සමගි ජනබලවේගය තුළ වැඩිපුරම සිටින්නේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ නායකයන් සහ පිරිස්. ඔවුන් සහ අපි එකට එකමුතු වෙලා වැඩ කරපු අය. අපි පාර්ලිමේන්තුවේ සහෝදර මන්ත්‍රීවරුන් හැටියට හිටිය අය. මේ නිසා අපිට එකට වැඩ කළ හැකියි.

■ එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකයා ලෙස තේරීපත් වූ ඔබට පළාත් සභා ජයග්‍රහණය කිරීමේ සටනට මුලින්ම මුහුණ දීමට සිදු වෙනවා. මේ පිළිබඳව ඔබ සතු සැලැස්මක් තිබෙනවාද?

මට ප්‍රථමයෙන්ම එල්ලවන මැතිවරණ අභියෝගය ලෙස මා මෙය නම් කිරීමට කැමැතියි. එය ලෙහෙසි පහසු එකක් නොවෙයි. ඔබ සඳහන් කර පරිදි මේ සඳහා දැවැන්ත සැලැස්මක් අපි පක්ෂයක් හැටියට ක්‍රියාත්මක කළ යුතුයි. අපිට විශාල ජයග්‍රහණයක් ලබා ගන්නවා කියන එක මට කියන්නට බැහැ. හැබැයි ඒ වෙනුවෙන් අපි ක්‍රියාත්මක විය යුතුයි. පක්ෂය ගොඩනැගීම මගින් මෙම මැතිවරණයට මුහුණ දිය යුතුයි යන සැලසුම අප ක්‍රියාත්මක කළ යුතුයි.

ජනපති ගත් වැදගත් ක්‍රියාමාර්ගවලට මම සතුටුයි

■ පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු මේ වන විට ආරම්භ කර තිබෙනවාද?

ඒ සඳහා දැන් අපි සැලසුම් සකස් කරමින් යනවා. විශේෂයෙන්ම ග්‍රාමසේවා කොට්ඨාස, ප්‍රාදේශීය බල ප්‍රදේශ, නාගරික බල ප්‍රදේශවල සිට ජාතික තලය දක්වා වූ ප්‍රතිසංවිධාන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

අපගේ වෙනස්කම් රාශියක් සිදු කරමින් සිටින මේ අවස්ථාවේ ජනතාව අප කෙරෙහි විශ්වාසය තබා අප සමඟ සම්බන්ධ වන බව මට විශ්වාසයි.

පළාත් සභා අපේක්ෂකයන් තෝරන අවස්ථාවේදී ඒ සඳහා ජනතාව ඉල්ලන සුදුසුකම් ලත් නායකයන්ට අපේක්ෂකත්වය ලබාදීමට අප කටයුතු කරනවා. එහිදී උගත් බුද්ධිමත් මෙන්ම ක්‍රියාශීලී කණ්ඩායම් හැඟීම සහිත තරුණ පිරිසකට වැඩි අවස්ථාවක් ලබාදීමට බලාපොරොත්තු වෙනවා.

මේ ආකාරයට ජනතාවට ගැළපෙන ජනතාව ඉල්ලන නායකයන් සමඟ ගමන් ආරම්භ කළහොත් පළාත් සභා මැතිවරණයේදී අපිට සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි බවට මා විශ්වාස කරනවා.

තනතුරුවලට තරග නොකර අපි එකට එක්විය යුතුයි

■ ඔබ නියෝජ්‍ය නායකයා වශයෙන් තේරීපත් වීමෙන් පසුව සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරය වූවා එක්සත් ජාතික පක්ෂයේ නායක අර්බුදය දිග් ගැස්සෙන බව. මෙම ප්‍රවෘත්තිය සත්‍යයක් ද?

ඇත්තටම අර්බුදකාරී තත්වයක් දැන් නම් නැහැ. එවැනි තත්වයක් මීට පෙර පැවතියා කියල යමෙකුට කියන්න පුළුවන්. එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්.

අර්බුදයක් තිබූ නිසා තමයි පාක්ෂිකයන් අපව හැර දාලා ගියේ. නායකයන් විවේචය කර ගන්න අවස්ථා රැසක් තිබුණා. වර්තමානයේ එවැනි තත්වයක් නැහැ. අනාගතයේදී ද අර්බුදකාරීත්වයක් ඇති නොවන්නට අප සියලු දෙනා වග බලා ගත යුතුයි.

අපි තනතුරුවලට නිතර නිතර සටන් කරලා කිසිඳු ඵලක් නැහැ. ඉදිරියේදි අපගේ නායකයන් සියලු දෙනා එක්ව සාමූහිකව ක්‍රියාත්මක විය යුතුයි කියලා මම අවධාරණය කරනවා. ඒ මගින් එක්සත් ජාතික පක්ෂය අපට යළි ගොඩනැංවිය හැකියි. එක පුද්ගලයෙකුට මේ පක්ෂය ජයග්‍රහණය කරගෙන යන්න බැහැ. ඒක අපි කණ්ඩායමක් හැටියට එක්ව සිදු කළ යුතු ක්‍රියාවලියක්.

■ ලක්ෂ දහසයක ජනතාව තමන්ගේ ඡන්දය එක්සත් ජාතික පක්ෂයට ලබා නොදී ස්වාධීනව සිටි බව පැවසෙනවා. ඔය කියන ලක්ෂ දහසයක ජනතාවට ඔබට යමක් ප්‍රකාශ කිරීමට තිබෙනවාද?

ඔය කියන ප්‍රමාණයට වැඩි පිරිසක් අපෙන් ඈත් වෙලා කියන එක අපි පිළිගන්න ඕන කාරණාවක්. ප්‍රථමයෙන්ම සිදු කළ යුත්තේ මොවුන්ගේ විශ්වාසය දිනා ගැනීමයි. ඒ සඳහා අප නිවැරැදි දැක්මකින් නිවැරැදිව ක්‍රියාත්මක විය යුතුයි. ජනතාව අප විශ්වාස කර අප වෙත පැමිණීම අනිවාර්යෙන්ම ඉන් පසුව සිදු වේවි.

ජනතාවට ලබා දුන් පොරොන්දු ඉටු කර ගැනීමට නොහැකි වීම, පක්ෂයේ නායකත්වයට ගැටුම් ඇති කර ගැනීම, පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු නිසි ආකාරයෙන් සිදු නොකිරීම නිසා ජනතාව අපෙන් ඈත් වුණා. නමුත් මේ තත්වය මඟහරවා ගැනීමට අප ක්‍රියා කළහොත් ජනතාව නැවත අප වෙත පැමිණෙනවාමයි කියන සිතිවිල්ල මා සතුව තිබෙනවා.

■ 19 වැනි සංශෝධනය සිදු කරද්දී ඔබ එහි කොටස්කරුවෙක්. ඒ කියන්නේ එවකට ඇමතිවරයෙකුව සිටියා. එම සංශෝධනය ඉවත් කර 20 වැනි සංශෝධනය ගෙන ඒමට වර්තමාන රජය ක්‍රියාත්මකයි. ඔබ විස්සට එකඟද?

නැහැ මම විසිවන සංශෝධනයට සම්පූර්ණ විරුද්ධයි. එක්සත් ජාතික පක්ෂය හැටියට අප සියලු දෙනා මෙයට විරුද්ධව ක්‍රියාත්මකයි.

■ ඇයි ඔබ සහ එක්සත් ජාතික පක්ෂය 20 වැනි සංශෝධනයට විරුද්ධ?

මෙම සංශෝධනය මගින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට විශාල හානියක් සිදු වෙනවා.

අපි 19 වැනි සංශෝධනය ගෙන ආවේ ඊට පෙර ප්‍රජාතන්ත්‍රවාදය නොතිබූ නිසායි. විශේෂයෙන්ම මාදුළුවාවේ සෝභිත හිමියන් මැදිහත්වෙලා තමයි මෙම සංශෝධනය සිදු කළේ.

එහිදී ප්‍රධාන වශයෙන් අපි සිදුකළේ ඒකාධිපති පාලනය ඉවත් කරමින් ජනාධිපතිවරයාගේ විධායක බලතල ඉවත් කරන්නයි. අපි ජනාධිපතිවරයාගේ බලතල පාර්ලිමේන්තුවට ලබා දුන්නා. නිදහසේ ක්‍රියාත්මක වීම සඳහා කොමිෂන් සභාවලට බලතල ලබා දුන්නා. දේශපාලනීකරණය වී තිබූ රාජ්‍ය අංශයේ බොහෝ ආයතනවලට දේශපාලන බලපෑමකින් තොරවක ක්‍රියාත්මක වීම සඳහා අපි අවස්ථාව ලබා දුන්නා. ඒ තුළින් මේ රටට යහපාලනයක් ඇති කිරීමට අපට හැකි වුණා. මෙන්න මේ චේතනාවෙන් තමයි අපි 19 වැනි සංශෝධනය ගෙන ආවේ.

20 ගෙන ඒම මගින් සිදුවන්නේ යූ ටර්න් එකක් දාලා පරණ ඒකාධිපති පාලනයක් කරා ගමන් කිරීමක්. අනික් කාරණාව තමයි මීට පෙර කිසිදිනක ජනාධිපතිවරයෙකුට නොතිබූ බලතල ප්‍රමාණයක් විසිවන සංශෝධනය හරහා ගෙන ඒමට වර්තමාන රජය කටයුතු කරමින් සිටිනවා. මේක රටේ ජනතාවට ලොකු ගැටලුවක් වේවි. මෙහිදී ස්වාධීන කොමිෂන් ඉවත් කිරීම ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන දැඩි බලපෑමක් වගේම විශාල හානියක්. පොලිසිය, අධිකරණය ඇතුළු අනෙකුත් ආයතන සඳහා ක්‍රියාත්මක වන කොමිසම් ඉවත් කළහොත් රටේ අනාගතය පිළිබඳව ගැටලුවක් ඇති වෙනවා. එයින් පසුව ඇති වන්නේ ඒකාධිපති ස්වරූපයක්.

විපක්ෂයේ සියලු පක්ෂ එක මේසයකට ආ යුතුයි

■ ඔබ මින් අදහස් කරන්නේ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඒකාධිපති පාලකයකු කියන එකද?

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් මෙම සංශෝධනය යහපත් සිතින් ගෙන එන්නට පුළුවන්. ඒ රටේ යහපත උදෙසා. නමුත් ඔහුගෙන් පසුව එන නායකයා කුමන විදියේ කෙනෙක්ද ඔහු මේ බලතල කුමන ආකාරයට භාවිතා කරයිද කියන බය ජනතාවට ඇති වෙනවා.

ජේ.ආර්. ජයවර්ධන මෙම ව්‍යවස්ථාව ඇති කරලා රටේ සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළා. ඒ යහපත් සිතින්. නමුත් මේ බලතල වැරදි විදිහට භාවිතා කරන නායකයෙකු බිහි වුණොත් මොකද වෙන්නේ කියන ගැටලුව ඇති වෙනවා.

■ වර්තමාන ජනාධිපතිවරයා රටට සේවයක් සිදු කරනවා කියලා ඔබ පිළිගන්නේ නැද්ද?

වර්තමාන ජනාධිපතිවරයා මේ රටට ඉතා හොඳ තීන්දු තීරණ රැසක්ම ලබා දුන්නා. අපි ඒවා අගය කරනවා. ඒ වගේම විසිවෙනි සංශෝධනය වැනි වැරදි තීරණ ලබා දෙන්නේ නම් අපි ඒවාට විරුද්ධව කටයුතු කරනවා.

අපනයන ක්‍රියාවලිය පිළිබඳව දෙදිනක වැඩමුළුවක්

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ ඉදිරි දැක්ම සංකල්පය සාක්ෂාත් කරගැනීම සඳහා පළාතේ කර්මාන්තකරුවන්ගේ අපනයන දිරිගැන්වීමේ අරමුණින් අපනයන ක්‍රියාවලිය පිළිබඳව විධිමත් වැඩමුළුවක් ඔක්තෝබර් මස 03 සහ 04 යන දින 02 ක තුළ (පෙ.ව. 8.30 සිට 4.00 දක්වා) කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ශ්‍රවණාගාරයේ පැවැත්වේ. එහිදී **Basic Introduction to Export Procedures, Export Marketing, Method of Settlement of payment and export finance, freight forwarding and Transportation, Custom xport process, Guidelines for CUSDEC, port procedures, Export Costing, INCORTEM, Certificate and other document required for Export, How to fill a CUSDEC and Shipping Note, Export of Forest Procedure, Export and potential Export from Sri Lanka** යන කරුණු සාකච්ඡා කෙරේ. මේ සඳහා උනන්දුවක් දක්වන අයට වැඩි විස්තර කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප), නො. 04 ඒ, 1/1, සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයෙන් හෝ දුරකථන අංක - 0112804511, ෆැක්ස් අංක - 0112804505 මඟින් හා idawp@sltnet.lk යන ඊමේල් ලිපිනයෙන් දැනගත හැකිය.

පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට සැලසුම්

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නව මහජන කතිකාවක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇතැයි එහි සභාපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ පවසයි. සමස්ත මාධ්‍ය ක්ෂේත්‍රයම ආවරණය වන පරිදි අධීක්ෂණ සහ සමාජ පෙරටුගාමී ආයතනයක් ලෙස ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පුළුල් කළ යුතු ද යන්න පිළිබඳව සොයා බැලීම එහි අරමුණ වී ඇත. ජනමාධ්‍ය නිදහස ආරක්ෂා කරමින් ජනතා අයිතිවාසිකම් තහවුරු කරමින් දේශීය හා විදේශීය පුවත්පත් කලාව සම්බන්ධයෙන් ද ප්‍රවණතා රැසක් ගොඩනැගී තිබීම අනුව මෙම ක්‍රියාවන්ට අනුගතවීමට උත්සාහ කරන බව මණ්ඩලය පවසයි.

නව ප්‍රකාශන මිලදී ගැනීම පුස්තකාල මණ්ඩලය අරඹයි

මුද්‍රිත ග්‍රන්ථ සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ක්‍රියාත්මක කරන "නව ප්‍රකාශන මිලදී ගැනීමේ ව්‍යාපෘතිය" යටතේ 2019/2020 වර්ෂයන්හි මුද්‍රණයෙන් නිකුත් කෙරුණු කෘති බාර ගැනීම මේ වන විට ආරම්භ කර තිබේ. මේ යටතේ 2019/2020 වර්ෂවල මුද්‍රිත නවකතා, කෙටි කතා, පද්‍ය වැනි නිර්මාණාත්මක කෘතිද, ශාස්ත්‍රීය සහ පර්යේෂණාත්මක කෘතිද භාර ගැනීම ඔක්තෝබර් 10 දින දක්වා සිදුකරන අතර අදාළ අයදුම්පත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයෙන් ලබා ගත හැකිය. ප්‍රකාශයට පත්කරන ලද ග්‍රන්ථ අලෙවිකර ගැනීමේදී කතුවරුන් මුහුණ පාන ගැටලු සඳහා සහනයක් ලබා දීම, ගුණාත්මක මට්ටමේ කෘති මිලදී ගැනීම, පුස්තකාල සංවර්ධනය, කියවීම ප්‍රවර්ධනය මේ ව්‍යාපෘතියේ මූලික අරමුණු අතර වේ.

සිද්ධමුල්ලේ මංගල නාහිමි ජන්ම දිනට පින්කම්

මධ්‍යම පළාතේ උප ප්‍රධාන සංඝනායක සිද්ධමුල්ලේ මංගල නාහිමියන්ගේ ජන්ම දින සමරා පින්කම් මාලාවක් ඊයේ (19) තිහෝගම තිස්ස සම්බුද්ධ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී ඇරඹුණ අතර අද (20) පස්වරුවේ ධර්මදේශනාව ශාස්ත්‍රපති රඹපොතානේ සුමනසිරි හිමි විසින් පවත්වන අතර 23 වැනිදා දක්වා ධර්ම දේශනා පැවැත්වේ.

එමෙන් ම 24 දින සර්ව රාත්‍රික ධර්ම දේශනයක් පැවැත්වේ. 25 දින දහවල් දානමය පින්කමක් පැවැත්වේ.

වත්තල ශාන්ත ආනා දෙවිමැදුරේ අභිනවයෙන් ඉදිකරන ලද නව දිව්‍ය සත්ප්‍රසාද දෙවිමැඳුර හා දේවමාතාවන්ගේ ලූර්දු ගුහාව ආසිරි ගන්වා මිසමි ජනතාවට බාර දීම පසුගියදා කොළඹ අගරදගුරු පදවියේ සහායක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. වත්තල ශාන්ත ආනා දෙවිමැදුරේ හිටපු මිසමි පාලක සංජීව මෙන්ඩිස් පියතුමාගේ සංකල්පයකට අනුව එතුමන්ගේ පූර්ණ අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ නව දිව්‍ය සත්ප්‍රසාද දෙවිමැඳුර හා ලූර්දු ගුහාව ඉදිකිරීම් කටයුතු සිදුකෙරිණි. මිසමි පාලක ජූලියස් ක්‍රිස්ටෝපර් පියතුමාද මෙහි සිටී.

භාෂා පරිවර්තකයන්ගේ නාමාවලියක්

ශ්‍රී ලංකාවේ දිවුරුම් දුන් භාෂා පරිවර්තකයන්ගේ නාමාවලියක් ප්‍රකාශයට පත් කිරීමට භාෂා පරිවර්තන ක්ෂේත්‍රයේ පුරෝගාමී සමාගමක් කටයුතු යොදා ඇත. භාෂා පරිවර්තකයන්ගේ නාමාවලියක් සම්පාදනය කෙරෙන පළමු අවස්ථාව මෙය වේ. මෙම නාමාවලිය සඳහා භාෂා පරිවර්තන ක්ෂේත්‍රයේ නිරතවන්නන්ගේ තොරතුරු ඇතුළත් කරගැනීමට පරිවර්තකයන් වෙත අවස්ථාවක් ලබාදීමට ප්‍රකාශන සමාගම තීරණය කර ඇත. දිවයින පුරා විසිරී සිටින විවිධ භාෂාවන් පරිවර්තනයේ නියුතු භාෂා පරිවර්තකයන්ට ඔවුන්ගේ තොරතුරු අදාළ දිවුරුම් දීමේ ලිපියේ පිටපතක් සමඟ, ප්‍රධාන සංස්කාරක, භාෂා පරිවර්තක නාමාවලිය, ජේ.කේ. භාෂා පරිවර්තන සමාගම, 218, පහළ මහල, අලුත් කඩේ වීදිය, කොළඹ 12. ලිපිනයට යොමු කළ හැකිය.

ධර්මපාල සමරුවක් අද මාතරදී

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 156 වැනි ජන්ම සංවත්සර උලෙළක් අද (20) පෙ.ව. 8.00 ට මාතර හිත්තැටිය රජමහා විහාරස්ථානයේදී පැවැත්වේ. අනුශාසකත්වය දරන්නේ මාතර හම්බන්තොට දෙදිසාවේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති අග්‍රහැරේ කස්සප හිමියන් විසිනි. ගුණ සමරු දේශනයක් සහිත උපහාර වැඩසටහනක් මෙහිදී පැවැත්වෙන අතර භික්ෂූන් වහන්සේත් දහම් පාසල් දරුවන් මෙන් ම ප්‍රදේශවාසී ජනතාවද ඊට සහභාගි වෙති.

රබර් ආශ්‍රිත වාහන අමතර කොටස් මෙරටදීම නිපදවීමට පියවර

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

රබර් ආශ්‍රිත වාහන අමතර කොටස් විදෙස් රටවලින් ආනයනය සම්පූර්ණයෙන්ම නවතා දැමීමේ අරමුණින් යුක්තව රබර් කර්මාන්තයේ නියැළීමට නව ව්‍යවසායකයන් යොමු කිරීමට කටයුතු සලසා ඇතැයි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රීමාල් ජයතිලක මහතා සිළුමිණට කීය. ඒ සඳහා මූලික දැනුම පවා නොමැති අය වෙනුවෙන් වැඩමුළු සංවිධානය කර ඇති අතර එම වැඩමුළුවලදී වාහන අමතර කොටස් නිෂ්පාදනයට අමතරව, රබර් සීල්, රබර් බිම් ඇතිරිලිද, රබර් මිශ්‍රිත මල්පෝච්චි, මෙට්‍රස්, ඇසුරුම් ද්‍රව්‍ය යනාදිය හා ලේටෙක්ස් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ දැනුම ලබා දීමට නියමිත බව ඔහු පෙන්වා දෙයි. ශ්‍රී ලංකා රබර් ලේකම් කාර්යාලය හා රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය මේ සඳහා දායකත්වය සපයන බව ඒ මහතා පෙන්වා දෙයි. මෙහි පළමු වැඩමුළුව 22 වැනිදා පැවැත්වෙන බවත් එය වැඩමුළුවෙන් පසුව ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ සංවර්ධනය දක්වා වූ අනෙකුත් සේවාවන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නොකඩවා සැපයීමට කටයුතු කරන බවද ඔහු පෙන්වා දුන්නේය.

සමාජ මාධ්‍යට යළිත් හොරු ඇවිත්!

අමිල මලවිසූරිය

සමාජ මාධ්‍ය ඔස්සේ දැන්වීම් පළ කරමින් පුද්ගලයන්ගෙන් මුදල් වංචා කරනු ලබන අපරාධකාරයන් සහ සංවිධානාත්මක පිරිස් බහුල ලෙස සැරිසරන බවත් එවැනි අය පිළිබඳව පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන ඒකකයට පැමිණිලි රැසක් ලැබී ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය සඳහන් කරයි.

එලෙස සමාජ මාධ්‍ය භාවිත කරමින් මහජනයාගේ මුදල් කොල්ලකන දැන්වීම් අතර විදෙස් රටවල්හි රැකියා ලබාදෙන බව, මෝටර් රථ දිනුම් ඇදීමක් ලැබී ඇති බව හෝ ලොතරැයි දිනුම් ඇදීමක් සිදුව ඇති බවට සඳහන්කොට සමාජ මාධ්‍ය පණිවිඩ හෝ විදුත් තැපැල් පණිවිඩ මගින් ජනයා දැනුවත්කොට බැංකු ගිණුම්වලට මුදල් බැර කරවා ගැනීම් මෙන්ම රේගුවෙන් භාණ්ඩ නිදහස් කරගැනීම් ආදි බොහොමයක් කුට උපක්‍රම යොදමින් වංචාකාරයන් ක්‍රියාත්මක වන බවත් එවැනි වංචනික ක්‍රියාවන්ට හසු නොවන ලෙසත් පොලිස් දෙපාර්තමේන්තුව ජනතාවගෙන් ඉල්ලා සිටී.

20 වැනි සංශෝධනය 22 වැනිදා පාර්ලිමේන්තුවට

20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී පළමුවරට කියවීම ලබන 22 වැනිදා උදෑසන 10.30 ට සිදු කෙරේ. මේ සම්බන්ධයෙන් සභානායක කාර්යාලය විසින් පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා වෙත දන්වා ඇත.

1වැනි පිටුවෙන්...

බාහිර උපාධියට...

ඒ සඳහා කෙටි කලක් ගත වනු ඇතැයිද එයින් පසුව අදාළ උපාධි අපේක්ෂකයන්ට තම අධ්‍යයන කටයුතු කර ගත හැකි වන බවද ඔහු පෙන්වා දුන්නේය. අදාළ උපාධි පාඨමාලාවන්හි කළ යුතු වෙනස්නම් සඳහා මේ වන විට විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇතැයිද ඔහු කීය.

සංචාරක ව්‍යාපෘති 7කට...

ශරීර සුවතා ක්‍රියාකාරකම් සංචරණය, සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යාපාරිකයන්ට සහන සැලසීම, සමාජ හා ආරක්ෂණ වැඩසටහන් හා ප්‍රජා සංචාරක කර්මාන්තය නංවාලීම ඇතුළු කරුණු අඩංගු වන බව පෙන්වා දුන්නේය.

අදාළ ප්‍රදානයන් හැකි ඉක්මනින් ලබා දීමට යුරෝපා සංගමය එකඟ වී ඇතැයිද කී ඇමැතිවරයා ශ්‍රී ලංකාව හැකි ඉක්මනින් සංචාරකයන් සඳහා විවර කිරීම කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කර ඇති බවද පෙන්වා දෙයි.

කෝටි ගණන්...

වර්තමානයේ රටේ ඉඩම් පත්ඉරු ලක්ෂ 1500ක් පමණ ඇති අතර ඉන් දැනටමත් පත්ඉරු ලක්ෂ 520ක් ස්කෑන් කර 'ඊ ලෑන්ඩ්' වැඩසටහන සඳහා ඉලෙක්ට්‍රොනිකව දත්ත ගබඩා කර ඇති බව හෙතෙම පෙන්වා දුන්නේය.

හකීම් යළිත්...

සමගි ජනබලවේගය සමඟ පක්ෂ කිහිපයක් සන්ධානගත වී සිටින නිසා එම පක්ෂයේ ව්‍යවස්ථාව වෙනස් කරන ලෙසත් සන්ධානයක් ලෙස ඉදිරි කටයුතු කළ යුතු බවත් හකීම් මහතා අවධාරණය කර තිබේ. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර පවා ලබා නොගත්තේ නායකත්ව මණ්ඩලයක් පිහිටුවීමට පොරොන්දුවීම නිසා බව හකීම් මහතා විසින් සජිත් ප්‍රේමදාස මහතාට මතක් කර තිබේ. නායකත්ව මණ්ඩලයක් යටතේ කටයුතු කිරීමේදී එක් එක් පක්ෂයේ අවශ්‍යතා තේරුම් ගැනීමට හැකිවන බවත් එයින් ප්‍රබල විපක්ෂයක් නිර්මාණය කර ගත හැකි බවද හකීම් විසින් සජිත් ප්‍රේමදාස මහතාට පවසා තිබේ.

ඉදිරි වසර පහ...

ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මධ්‍යම පාන්තිකයන්ගේ ආදායමට ගැළපෙන නව මහල් නිවාස ඉදිකිරීමට නිවාස අමාත්‍යාංශයට අවශ්‍ය ඉඩම් නොමිලේ ලබාදීමට ද රජය පියවර ගෙන ඇත. ඊට අමතරව නිවාස මිලදී ගැනීමට 6.25% අනුපාතය යටතේ තිස් වසරකින් ගෙවී අවසන් වන පරිදි ණය ක්‍රමයක් රාජ්‍ය බැංකු මගින් ක්‍රියාත්මක කිරීමට ද කටයුතු යොදා ඇත.

කංසා තහනම පය බරවායට පිටිකර බෙහෙත් බැඳීමක්ද?

● රසික කොටුදුරගේ

බෙංගමුවේ නාලක හිමියන් විසින් පසුගියදා රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මහතාගෙන් කරන ලද ඉල්ලීමකට අනුව 'කංසා' නීතිගත කිරීම පිළිබඳ කතාව නැවතත් කරළියට ආවේය. මීට ප්‍රථමද ඒ පිළිබඳව කතිකාවන් ඇති වුවද මෙතරම් ධනාත්මක මැදිහත් වීමක් දක්නට නොලැබුණි. පක්ෂ විපක්ෂ බොහෝ දෙනා ඒ පිළිබඳ අදහස් දක්වන්නට වූයෙන් ඒ පිළිබඳ කිසියම් අධ්‍යයනයක් කිරීම කාලෝචිත යැයි අදහස් කළෙමු.

මෙරටේ 'කංසා' භාවිතය ආරම්භ වූයේ කවර කලක ද යන්න නිශ්චිතව කිව නොහැකි නමුත් එය ඖෂධයක් ලෙස භාවිතයට ගත් බවට කිසියම් ඉඟියක් ලැබේ. මෙරට වෛද්‍ය සාහිත්‍යය දෙස අවධානය යොමු කිරීමේදී ලංකාධිපති ශ්‍රී රාවණයන් ගේ කෘති ලෙස සැලකෙන අර්ක ප්‍රකාශය, කුමාර තන්ත්‍රය, උඩ්ඩීස තන්ත්‍රය, දඹදෙනි යුගයට අයත් පූජාවලිය කර්තෘ මයුරපාද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ යෝගාර්ණවය, ප්‍රයෝගරත්නාවලිය, පඤ්ච මූල පරිවේණාධිපතීන් වහන්සේ ගේ හේසජ්ජ මංජුසාව, මෝරගම්මන හිමිපාණන්ගේ සිංහල යෝගරත්නාකරය, යෝගපිටකය, අඥාත කර්තෘක අලි වෙද පොත, අඥාත කර්තෘක වෛද්‍ය චින්තාමනීය, ශ්‍රී රත්නසේකරයන් විසින් ලියන ලද චිකිත්සා පොත, මිදෙල්ලව කෝරාළයන්ගේ රජගෙයි ඇස් වෙද පොත, අඥාත කර්තෘක කැඩුම් බිඳුම් වෙද පොත, අඥාත කර්තෘක වරයෝග සිතුමිණ, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාගේ රාජ වෛද්‍යවරයාගේ වෛද්‍ය චින්තාමනීය, වැලිවිට ශ්‍රී අසරණ සරණ සසරණංකර සංඝරාජ හිමිපාණන්ගේ හේසජ්ජ මංජුසා සන්නය ඇතුළු දේශීය වෛද්‍ය ග්‍රන්ථ රාශියක් තුළින් කංසා හා මෙරට වෙදකම අතර වූ සම්බන්ධය මනාව පැහැදිලි වේ.

බෙංගමුවේ නාලක නාහිමි

රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි

කංසා නැතිනම් ගංජා පාවිච්චිය මෙරට තහනම් කරනු ලැබූයේ ඉංග්‍රීසි පාලන යුගයේදී ය. දුම්කොළ වගාව හා දුම්පානය ප්‍රචලිත කිරීම සඳහා එසේ කළ බව නොරහසකි. එසේ ම ශරීරයට ගුණදායි තෙලිජජ හා රා වෙනුවට මත්වතුරද මෙරටට හඳුන්වා දී ඒවා නීතිගත පානයන් බවට පත් කළේද ඔවුන් විසිනි. බටහිර තාක්ෂණික සමාජය සහ බටහිර වෙදකම අතර ඇති සම්බන්ධය ජීවමය වූ එකකි. මෙම සම්බන්ධය නිසා පාරිභෝගික වූ බහුජාතික වෙළෙඳ ආධිපත්‍යයට අනුබල දෙන ආකාරයෙන් බටහිර වෙදකම ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයට ඇතුළු වී ඇත. අද ලොව ප්‍රබලතම ධන උල්පතක් බවට පත්ව ඇත්තේ ඖෂධ වෙළෙඳාමය. ඉනුත් ස්වභාවික ඖෂධ වර්ග සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. එනිසා බටහිර වෙදකම හදාළ අය විසින් කංසා පිළිබඳ නගන විරෝධය එකී ඖෂධ හා බැඳුණු බටහිර දේශපාලනය සංකේතාමකව දක්වන්නකි.

ලෙස්ටර් ග්‍රීන්ස්පූන් සඳහන් කරන ආකාරයට මිනිසා විසින් කංසා භාවිත කිරීම පිළිබඳ මුල්ම වාර්තාව හමු වන්නේ ක්‍රිස්තු පූර්ව 2737දී ෂෙන් නුං නම් ශාඛ ඖෂධ අධිරාජයාගේ ඖෂධ සංග්‍රහයකය. කංසා යන්න ඇත අතීතයේදී පවා සමාජය තුළ මතභේදයන්ට පාත්‍ර වූවකි. කංසා පැළයෙන් අපායට යන මග සදන බව සමහරු කියා සිටි අතර, සමහරු කීවේ එයින් සුර ලොව යන මග සලසන බවය. මත්ද්‍රව්‍යයක් වශයෙන් එය භාවිතය චීනයේ සිට ඉන්දියාවට පැතිර ගිය අතර, පසුව දකුණු අප්‍රිකාවටද ගොස් තිබේ. ක්‍රිස්තු වර්ෂ 1800දී පමණ ඊජිප්තුවේ සටන් කර ආපසු පැමිණෙමින් සිටි නැපෝලියන්ගේ හමුදාවේ යුද භටයන් මගින් යුරෝපය කරා පැතිර ගිය බව ඇතැමුන්ගේ විශ්වාසයයි. යුරෝපය සහ ආසියාව පුරා මධ්‍ය නිරක්ෂ ප්‍රදේශවල සිටි ජනයා මුල් ඉන්දු- යුරෝපීයයන් ද ක්‍රි.පූ.5000 සිට කංසා ගැන දැන සිටි අතර ඒවා භාවිත කළහ.

1897 මැයි 15 වැනිදා මානව විද්‍යාව, මානව වංශ ශාස්ත්‍රය සහ ප්‍රාග් ඉතිහාසය පිළිබඳ බර්ලින් සංගමයේ සැසි වාරයකදී ජර්මන් පුරාවිද්‍යාඥ හර්මන් බුසේ විසින් තම සොයාගැනීම් ඉදිරිපත් කරමින් කියා සිටියේ ජාත්‍යන්තර වශයෙන් කංසා පැතිර තිබීමත් සමාජය උස් පහත් කොටස් මගින් ඒවා භාවිත කර තිබීමත් ගැන ඉතා පැරණි කල සිට බහුලව වාර්තා වී ඇති බවය. ජෝර්ජ වොෂින්ටන්ගේ දින පොත්වල තබා ඇති සටහන්වලින් පැහැදිලි වන්නේ කංසා වවන සංකීර්ණ ක්‍රමය හොඳින් හදාරා ඔහු විසින් කංසා වගා කිරීමට පියවර ගත් බවයි. ඇමරිකාවේ සිටි ජනාධිපතිවරයකු වූ බිල් ක්ලින්ටන්ද තමා විසින් කංසා දුම් බී ඇති බව පිළිගත්තේය. 1883 වනතුරු කැනබිස් සැටිවා cannabis sativa හෙවත් කංසා ලොව වගා කළ විශාලතම කෘෂිකාර්මික බෝගය විය.

2016 වසරේ THINKSTOCK සමුළුව සංවිධානය කරන කැනාටෙක් සංවිධානය පවසා සිටියේ ගංජා වගාව වර්තමානයේ ලොව වේගයෙන් ම වර්ධනය වන කෘෂි ආර්ථික වගාව බවයි. වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් කංසා දැනට වඩා භාවිත කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස විශේෂඥයෝ පිරිසක් ඊශ්‍රායලයේ ටෙල් අවීව් නුවරට රැස් විය. ඒ අනුව වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් ගංජා ශාකය යොදා ගැනීම ඩොලර් කෝටි ගණනක ගෝලීය ව්‍යාපාරයක් බවට පත්වෙමින් ඇත. ආයෝජකයන්, අවසර ලත් කංසා වගාකරුවන් සහ වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් බෙදාහරින්නන් එම සමුළුවට එක්වීම විශේෂත්වයකි. ඇමෙරිකාවේ ප්‍රාන්ත ගණනාවක මෙන්ම ලොව පුරා රටවල් ගණනාවක ද වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් කංසා වගාව නීතිගත කිරීමෙන් අනතුරුව ව්‍යාපාරයේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන බව නිව්යෝක් ටයිම්ස් වැනි ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කරයි. ඊශ්‍රායලය නීත්‍යානුකූල ගංජා වගාව පුළුල්ව ක්‍රියාත්මක කරන රට වන අතර කංසා වගාවේ නව ප්‍රවණතා පිළිබඳ පර්යේෂණවලටද ඔවුන්ට ප්‍රමුඛත්වයක් හිමිව ඇත. 2017 වසරේදී නෙදර්ලන්ත පාර්ලිමේන්තුව ගංජා වගා කිරීම සඳහා අවසර ලබා දීමේ යෝජනාවක් අනුමත කළේය. ඒ ගංජා සඳහා නෙදර්ලන්තය දීර්ඝ කාලයක් තිස්සේ දැක්වූ ලිහිල් ප්‍රතිපත්තියට නීතිමය පසුබිමක් අවශ්‍ය වූ නිසාය. මෙගින් 'ගංජා කර්මාන්තය' නෙදර්ලන්තයේ ප්‍රධාන ආර්ථික ප්‍රවාහයට එක්වනු ඇති බව ඔවුන් පවසයි.නෙදර්ලන්තයේ නීති සංග්‍රහයට අනුව ගංජා තහනම් මත්ද්‍රව්‍යයක් වන නමුත් එරට අවන්හල් තුළ ගංජා අලෙවිය ප්‍රසිද්ධියේ සිදුවේ. ඇමෙරිකාවේ නෙවාඩා පාලන අධිකාරිය බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා අති විශාල ඉල්ලුමකට ගංජා කර්මාන්තය මුහුණ දී ඇතැයි නෙවාඩා ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිකා ස්ටෙෆනි ක්ලැප්ස්ටීන් පසු ජූලි 01වැනිදා පැවසූ බව 'රෙනෝ ගැසට්' සඟරාව සඳහන් කරයි. ගංජා අලෙවිය නීතිගත කිරීමෙන් අනතුරුව නෙවාඩා ඖෂධ ශාලා සංගමය ඇස්තමේන්තු කර තිබුණ ආකාරයට පළමු දින හතර ඇතුළත ඩොලර් මිලියන 3ක අලෙවියක් සහ ඩොලර් මිලියනයක බදු ආදායමක් උපයා තිබුණි. ඇමරිකාවේ තවත් ප්‍රාන්ත කිහිපයක ම ගංජා අලෙවිය නීතිගත කර ඇති අතර නෙවාඩා ප්‍රාන්තය එම තීරණයට එළැඹියේ පසුගිය නොවැම්බර් මාසයේදී ය. නමුත් එය ක්‍රියාවට නැංවූයේ පසුගිය ජූලි මස පළමුවැනිදා ය. එසේ වුවත් වසර 2001 සිට ඇමරිකාවේ ඖෂධයක් වශයෙන් ගංජා භාවිතයට අවසර ලබාදී තිබුණි. 2018 ජූලි මාසයේ සිට නිවෙස්වල ගංජා වගා කිරීමට උරුගුවේ රාජ්‍යය අවසර දීමත් සමඟ, එම වගාවන් සෘජුවම ඖෂධ අලෙවි සැල් වෙත ලබාදී තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට එරට වැසියන්ට අවස්ථාව හිමිව ඇත. මීට අමතරව නිවෙස්වල ගංජා වැවීමට හෝ ගංජා වගා කිරීමේ නියුතු පිරිසට සමූපකාර සමාජ හා සම්බන්ධ වීමේ හැකියාවද නීතිය මගින් ඉඩ ප්‍රස්ථාව විවර කර දී ඇත. 2016 වසරේ පටන් ඔස්ට්‍රේලියාව ඖෂධයක් මට්ටමින් ගංජා පාවිච්චිය නීතිගත කර ලැබ තිබූ අතර, 2018 වසරේ සිට කැනඩාව සහ නෙදර්ලන්තය අනුව යමින් දේශීය වෙළෙඳපොළෙන් ඔබ්බට ගොස් ජාත්‍යන්තර වෙළෙඳපොළට ගංජා විකිණීමේ පරිසරය නිර්මාණය කර ගැනීමට කටයුතු කළේය. මෙම ක්‍රියාමාර්ගයෙන් විදේශිකයන්ට පමණක් නොව දේශීය රෝගීන්ටත් ඵලදායී වනු ඇතැයි ඔස්ට්‍රේලියානු සෞඛ්‍ය ඇමති ග්‍රෙග් හන්ට් පවසා තිබුණි.

> කංසා මෙරට වෙදකම හා සාකල්‍යයෙන්ම බද්ධ වූවක්

කංසා කෙඳි ලනු, රෙදි, පහන් දල්වන තෙල් සහ ඖෂධ සඳහා මෙන්ම කඩදාසි සඳහාද භාවිත කරයි. නාවුක ගමන් මාර්ග සිතියම් සහ බයිබල් මෙන්ම ටොම් පේන්ගේ Common Sense, Huckleberry Finn, Alice in Wonderland වැනි ග්‍රන්ථ ද ඇමරිකානු නිදහස් ප්‍රකාශනය මුල් පිටපත් කිහිපයක් ම මුද්‍රණය කරන ඇත්තේ කංසා පැළයෙන් තනන ලද කඩදාසිවලින්ය. කංසා වගාව සඳහා පොහොර සහ කෘමිනාශක අවශ්‍ය නොවේ. අද ලොව කඩදාසි කර්මාන්තය විශාල ගැටලුවකට මුහුණ පා ඇත්තේ ඊට අවශ්‍ය ශාක ලබාගැනීමට වනාන්තර කැපීමට සිදු වීම නිසාය. ගස් අක්කරයකින් සකස් කරගන්නා කඩදාසි ප්‍රමාණය මෙන් හතර ගුණයක් කඩදාසි කංසා අක්කරයකින් නිෂ්පාදනය කරගත හැකි ය.

ලෙස්ටර් ග්‍රීන්ස්පූන් සඳහන් කරන පරිදි කෙඳි ලබා ගැනීම සඳහා මූලද්‍රව්‍යයක්, ආගමික උත්සවවලට අවශ්‍ය උත්තේජකයක් සහ රෝගවලට ඖෂධයක් වශයෙන් විශේෂයෙන්ම ඉන්දියාවේ කැනබිස් සටිවා (cannabis sativa) භාවිතයට සම්බන්ධ දීර්ඝ ඉතිහාසයක් ඇත. කැස්ස, තෙහෙට්ටුව, වාතාබාධ ඇවුම ඔල්මාදය, මිග්‍රේන් හිසරදය සහ වේදනාශීලී ඔසප් වීම් වැනි විවිධ පීඩාවන් සහ අපහසුකම් සඳහා මෙම ඖෂධය ඉතා බහුල වශයෙන් 19 වැනි ශතවර්ෂය තුළදී බටහිර රටවල නිර්දේශ කරන ලදී. බටහිර වෛද්‍ය ග්‍රන්ථවල පැහැදිලිව ම සඳහන් කර ඇති කාරණය නම් එය මානසික වශයෙන් ඇබ්බැහි විය හැකි වුවත් එය කිසි ලෙසකින්වත් ශාරීරික වශයෙන් ඇබ්බැහි නොවන බවයි. මේ පිළිබඳව අධ්‍යයනය කළ අයි. සී. චොප්රා සහ ආර්.එන් චොප්රා පවසන්නේ," අප විසින් සොයාගත් කරුණ නම් අනෙකුත් වේදනා නාශක ඖෂධවලට වෙනස් වූ ආකාරයෙන් කංසා ඖෂධ පුරුද්දක් වශයෙන් ගත් අය තුළ එක හා සමාන ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පසුව මාත්‍රාව වැඩි කිරීමේ අවශ්‍යතාවක් දක්නට නොලැබුණු තරම් වන බවයි. එසේ වූවා නම් ඒ ඉතාම කලාතුරකිනි. සතුන් තුළ මෙන්ම මිනිසුන් තුළ ද කංසාවලට ඔරොත්තු දෙන ගතියක් වර්ධනය වූවා නම්, එසේ වැඩි වූයේ සාමාන්‍යයෙන් ඉතා අල්ප වශයෙනි. අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධව වර්ධනය වූ ඔරොත්තු දීමේ ස්වරූපයට ඒ කිසිසේත්ම සමාන වූයේ නැත. බලා සිටින්නන්ට සහ පිටස්තරයන්ට ද එයින් කිසිම හානියක් හෝ හිංසාවක් සිදුවූයේ නැත."

> කංසා භාවිත කිරීම පිළිබඳ මුල්ම වාර්තාව හමු වන්නේ ක්‍රිස්තු පූර්ව 2737දී ෂෙන් නුං නම් ශාක ඖෂධ අධිරාජයාගේ ඖෂධ සංග්‍රහයක

ඊ.ජේ.චෝරිං (MD) විසින් 1868 දී පළ කරන ලද ඉන්දියානු ඖෂධ සංග්‍රහයේ කංසාවල ඇති ඖෂධ ගුණ ගැන සඳහන් ආකාරයට පිටගැස්ම, පිස්සු බලු රෝගය, ඔල්මාදය, වලිප්පුව, නහර රුදාව සහ විවිධාකාරයේ අනෙකුත් ස්නායුගත රෝග, කොලරාව, ප්‍රදරය, ගර්භාෂගත ලේ ගැලීම්, හන්දිපත් රුදාව, පීනස් රෝග, ඇවුම, අර්ධ හෘද ක්‍රියාකාරිත්වය, ව්‍යාකූලත්වය වේදනාවෙන් සහ කණ්ඩුතියෙන් යුක්ත වූ චර්ම රෝග යනාදියට එය හොඳ ප්‍රතිඵල දක්වා ඇත. එමෙන්ම දරු ප්‍රසූති අවස්ථාවන්හිදී ගර්භ සංකෝචනය නැති කිරීම සඳහාද භාවිත කර ඇත.

ඉතා අන්තරායකාරී මත්ද්‍රව්‍යයක් වශයෙන් වර්ග කර කංසා නිගරුවට ලක්කිරීමට බටහිර වෙදකම සහ බටහිර සාම්ප්‍රදායික සමාජය මගින් කෙතරම් උත්සාහ කළද එය හිංසාකාරී දෙයක් බව ඔප්පු කිරීම සඳහා කිසිදු පැහැදිලි සාධකයක් මෙතෙක් සොයාගෙන නැත. ඕනෑම දෙයක් වැරදි ආකාරයෙන් භාවිත කිරීම අයහපත් ප්‍රතිඵල ඇති කරවීමට හේතු විය හැකිය. කංසාවලින් සිදු විය හැකි සත්‍යය වූ අනතුරක් ඇත. ඒ කංසා මගින් තියුණු බඩගින්නක් ඇති කිරීමයි. එනිසා වැඩිපුර ආහාර ගැනීම නිසා කෙනෙකු මරණයට පත්විය හැකිය. එහෙත් මෙතෙක් සෘජුව කංසාවලට සම්බන්ධව කෙනෙකු මරණයට පත් වූ බවට වාර්තා වී නැත.

අපේ පැරණි දේශීය වෙදකම තුළ කංසා ඉතා කේන්ද්‍රීය වූ කාර්යභාරයක් ඉටු කරයි. ළදරුවන්ට දෙන බොහොමයක් ඖෂධ පදනම්ව ඇත්තේ කංසා මතය. සමහර ඖෂධවල සියයට 400ක් පමණ කංසා අඩංගු වේ. දේශීය වෛද්‍යවරුන් පවසන්නේ කංසා පදනම අපේ ඖෂධවල නොමැති වුවහොත් එම ඖෂධය වේගයෙන් ක්‍රියාත්මක වී සාර්ථක ප්‍රතිඵල ගෙනදීමට අපොහොසත් වන බවය. බොහෝ රෝග සඳහා විශ්මයජනක සුවයක් ඇති කරන්නාවූ ඖෂධයක් ලෙස කංසා සැලකේ. මෙහිදී සිදුවන මූලික ක්‍රියාවලිය නම් කංසා මගින් මනස විවේකී තත්ත්වයට පත්වන නිසා එමගින් ශරීරය විවේකී සහගත ශාන්ත තත්ත්වයට පත් වීමය. රෝග ඇතිවීමට සහ පවත්වාගෙන යෑමට හේතු වන ප්‍රධාන කාරණය නම් මානසික පීඩනයයි. කංසාවල ආධාරය ලබා ගනිමින් ඖෂධ ශරීරයට ඇතුළු කළ විට එම ඖෂධ ඉතා වේගයෙන් ක්‍රියාකාරී වේ. කංසා අපේ වෙදකමේ පදනම බවට පත් වන්නේ ඒ ආකාරයෙනි.

> අපේ පැරණි දේශීය වෙදකම තුළ කංසා ඉතා කේන්ද්‍රීය වූ කාර්යභාරයක් ඉටු කරයි. දරුවන්ට දෙන බොහෝ ඖෂධ පදනම්ව ඇත්තේ කංසා මතය.

කොරෝනා බිය තිබුණත් පොත් වසන්තය මෙවරත්...

● ඉනෝකා සමරවික්‍රම

කොරෝනා වයිරසයට බියෙන් ගෙවුණ, දැනටත් ඒ බිය සිත්හි රඳවාගෙන දවස ගෙවන අපට යළිත් වසන්තය උදා වී ඇත. ඒ පොත් වසන්තයයි. සැප්තැම්බරයේ කඩින් කඩ වැටෙන වැස්ස ද මඟ හරිමින් කොරෝනා බිය ද යටපත් කරගනිමින් පොත් වසන්තයට ගෙවුණ දින දෙක තුළදී බොහෝ පිරිසක් පැමිණියහ. ඒ සෞඛ්‍ය බලධාරීන් විසින් කියා දුන් ආරක්ෂාකාරී පිළිවෙත් අනුගමනය කරමිනි.

කැප්පෙට්පොළ සාරානන්ද හිමි

සමන්ත ඉන්දීවර

සරත් ලාල් කුමාර

තුෂාරි ඉනිමංකඩ

මහින්ද සෙනරත්

ප්‍රකාශකයෝ ලේඛකයෝ පමණක් නොව පාඨකයෝ වසරකට වරක් එකම ස්ථානයකදි හමුවන පොත් ප්‍රදර්ශනය වසන්තයක් වන්නේම පොත් වලට ආදරය කරන්නන් මෙන්ම කාලෙකින් නොදුටු දුර බැහැර හිඳින මිතුරු මිතුරියන් ද සල්පිල එකට හමුවන්නේ මේ ස්ථානයේදීය. මොනවා හෝ කමින් බොමින් තැන් තැන් වල කල්ලි ගැසෙමින් පොත පත සාහිත්‍ය ගැන කතා කරමින් වෙනදාට කල් ගත කළද මෙවර පොත් සල්පිලේදී ඒ මිතුරු සමාගම් වලට වැට බැඳ ඇතැයි සිතෙන්නේ සල්පිල් භූමිය දෙස බලන විටය.

මුඛ ආවරණ පැලැඳ, අත් සෝදාගෙන පෝලිමේ පැමිණෙන අය අතර දන්න හඳුනන්නෝ හිටියද හඳුනා ගැනීම අසීරුය. ඒ අසීරුකම නිසාම ඇතැමුත් කෙනෙක් දුටු පමණින් යළි යළිත් බලමින් ඒ ඇඳුරුම්කම් තහවුරු කර ගන්නට උත්සාහ දරති. එවන් විටෙක කෙනකු මුඛ ආවරණය පහත් කර මුහුණ පෙන්නා නැවත වසා ගනු දක්නට ලැබිණි.

මෙවන් වාතාවරණයක් යටතේ අප එහි ගියේ පොත් සල්පිල ආරම්භ කළ දිනයේමය.

පොත් ප්‍රකාශකයන්ගේ සංගමය විසින් ආරම්භ කරන ලද පොත්සල්පිල ආරම්භ කරනු ලැබුවේ සංස්කෘතික කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමති විදුර වික්‍රමනායකගේ ප්‍රධානත්වයෙනි.

ආරම්භයේ සිටම අප එහි ගොස් ඇත්තෙමු. එදාට වඩා අද මෙම ප්‍රදර්ශනය දියුණුය. 1999 දී පොත් ප්‍රදර්ශන අලෙවි කුටි 34 කින් ආරම්භ වූ පොත් ප්‍රදර්ශනයේ මෙවර අලෙවි කුටි ගණන 420 කි.

ගියවර ලක්ෂ පහකට ආසන්න ජනතාවක් පොත් සල්පිල සඳහා සහභාගි වූ අතර මෙවර ද එවැනිම ප්‍රමාණයක් සහභාගි වේයැයි යන්න එම ප්‍රදර්ශනයේ සංවිධායකයන්ගේ අදහස වේ. ප්‍රදර්ශනයට ඇතුළුවීමේ ටිකට්පත් වලින් ගියවර ලක්ෂ තිහක පමණක අදායමක් තිබුණ ද මෙවර කොරෝනා වයිරස බිය හේතුවෙන් ජනතාවගේ පැමිණීමේ යම් අඩුවක් වියහැකි බව සංවිධායකයන්ගේ අදහස වේ.

පොත් ප්‍රකාශකයන්ගේ සංගමයේ මහ ලේකම් සමන්ත ඉන්දීවර මෙවර පොත් ප්‍රදර්ශනය පිළිබඳ සිළුමිණට අදහස් දැක්වීය.

"කොරෝනා වයිරස තත්ත්වය සම්පූර්ණයෙන්ම අපේ රටෙන් ඉවත්ව නැහැ. පොත් ප්‍රකාශකයින්ගේ සංගමය ප්‍රදර්ශනය පැවැත්වීම ගැන රජය , සෞඛ්‍ය බලධාරීන් සමග කිහිවරක්ම සාකච්ඡා කළා. අපට මේ සඳහා අනුමැතිය ලැබුණා. සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ බලධාරීන් ලබා දුන්න උපදෙස් අනුව තමයි මෙය පැවැත්වෙන්නේ. හොඳින් අත්සේදීම, මුඛ ආවරණ පැළඳීම, විෂබීජ නාශක දියර නිතර අත් ගැල්වීම වගේම පුද්ගල දුරස්ථභාවය රැක ගනිමින් මේ ප්‍රදර්ශනය පවත්වන්නේ. අපි ප්‍රදර්ශනයට පැමිණෙන අයගෙනුත් ඉල්ලන්නේ ඒ උපදෙස් පිළිපදින්න කියලා. ඒ වගේම අප සෞඛ්‍ය අමාත්‍යාංශයට, සෞඛ්‍ය වෛද්‍ය නිධාරිවරුන්ට, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට කොළඹ නගර සභාවට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, උපදෙස් ලබාදෙමින් අපට දක්වන සහායට."

බොහෝ දුර බැහැරින් පැමිණි පොත් වලට ආදරය කරන්නන්, පාඨකයන් ප්‍රදර්ශන භූමියට ඇතුළු වීමට වරුගණන් පෝලිමේ රැඳී සිටිනු දක්නට ලැබිණි.

'වෙනදා වගේ නෙමෙයි මෙදා පාර පෝලිම් වල දිගු වෙලාවක් බලන් ඉන්න වුණා. අත් සෝදන්න, ඇගේ උෂ්ණත්වය බලන්න, අපි ගැන තොරතුරු ඇතුළත් පෝරමය පුරවන්න මේ හැම එකටම පෝලිම. මම ආවේ කෝච්චියෙන් කෑගල්ලේ ඉදලා. දැන් කෝච්චි බස්වල නම් දුරස්ථභාවයක් නැහැ. කොරෝනා ගැන සමහර අයට නම් ගානක්වත් නැහැ. ඒ වුණත් මම නම් සතුටු වෙන්නේ මේ වගේ කාලයක ප්‍රදර්ශනය පැවැත්වීම ගැනයි." පොත් ප්‍රදර්ශනයට පැමිණ සිටි අයකු යමින් එමින් ගමන් පවසන්නට විය.

"වෙනදාට නම් මේ හෝල් එක පිරෙන්න සෙනඟ ඉන්නවා. එත් පසු ගිය වසර වල වගේ එකපාරට හැමෝටම ඇතුළට එන්න බැහැ. ආරංචියක් ආවා එළියේ ගොඩක් අය ඉන්නවා කියලා. ප්‍රදර්ශනය තාමත් පටන් ගෙන දවසයිනේ ඉදිරියේදි මීට වඩා පිරිසක් පැමිණෙයි කියලා අපි විශ්වාස කරනවා."

විදර්ශන ප්‍රකාශකයන් වෙනුවෙන් තුෂාරි ඉනිමංකඩ පැවැසුවාය.

කල්ලි ගැසෙමින් එක පොකුරට වෙනදා ප්‍රදර්ශන භූමිය තුළ මෙන්ම වෙළෙඳ කුටි අතර ද බොහෝ පිරිස් දැකිය හැකි වුවද, මෙවර එසේ නැත. සෞඛ්‍ය බලධාරින් උපදෙස් දී ඇත්තේ ප්‍රධාන ශාලාවල එක්වර තුන්සියක පිරිසකට ද එළිමහනේ ඇති ඇනෙක් කුටිවල එකසිය පනහක පිරිසකට ද රැස්විය හැකි බවය. එනිසා මෙවර කෙනෙකුට බැලු බැල්මට පෙනෙන්නේ සෙනඟ අඩු බවකි.

පොත් කුටි අතරින් ඇවිද යද්දි අපට හමු වූයේ රුසියාව ප්‍රකාශකයෝය. රුසියන් පොත් වල පරිවර්තන පොත් රැසක් එහි තිබිණි.

"මම අවුරුදු 12 ක් තිස්සේ ප්‍රදර්ශනයට එනවා. රුසියානු පරිවර්තන පොත් හොයන්නම මෙතනට එන පිරිසක් ඉන්නවා. මම හිතනවා මෙය සාර්ථකයි කියලා. නමුත් වෙනදා තරම්ම ඒවිද කියා පොඩි සැකයකුත් තියෙනවා."

එසේ පැවැසුවේ රුසියාව ප්‍රකාශන හි හිමිකරු ලේඛක සරත් ලාල් ලාල් කුමාරයි.

සයුරි පොත් ප්‍රකාශක මහින්ද සෙනරත් අපට මෙහිදි හමුවිය.

වෙනදාට නම් මේ වෙනකොට විශාල පිරිසක් ඇවිල්ලා. ඒත් වෙනදා වගේ එකපාරටම ඒ අයට එන්න බැනේ. ප්‍රදර්ශනය සාර්ථකයි කියලා මට හිතෙනවා. වෙනදා වගේ නිකරුනේ ගැවසෙන අය නෙමයි පොත් ගන්නම එන අය මෙයට පැමිණේවි කියන විශ්වාසය තියෙනවා.

විවිධ පළාත් වලින් පැමිණි පොත් වලට ආදරය කරන්නන් අතර සිටි භික්ෂූන් වහන්සේ නමකද අපට හමු විය.

" පහුගිය කාලේ පන්සල් වලටම වෙලා හිටිය කාලේ අපේ දවස ගෙවුණේ පෙර වසර වල ගෙන ආ පොත් කියවමින්. ධර්මය පිළිබඳ ලියැවුණ පොත් වගේම නිර්මාණශීලි පොත් ආදියත් ගත්තා. අපි ආවේ වැලිමඩ ඉඳලා. බොරලන්දේ සමාධිරතන හිමි පැවැසූහ.

වැසි වැටුණ ද , අව්ව දැඩි වුද අව්වැසි බාධාවක් නොකර ගනිමින් වෙනදාට පොත් සල්පිලට පැමිණි ඇත්තෝ මෙවර පැමිණියේ කොරෝනා අවධානම ද සිතේ දරාගෙනය. මේ අවදානමත් සමඟ පැමිණි පිරිසගේ ආරක්ෂාව සැලසීමේ වගකීම මේ මොහොතේත් ඔවුහු තම කර පිට පටවාගෙන ඇත ඒ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුය.

මෙහිදි අපට හමුවූ කොළඹ නගර සභාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි විශේෂඥ වෛද්‍ය රුවන් විජයමුනි පැවැසුවේ මෙවැනි කතාවකි.

අපි මේ ප්‍රදර්ශනය පැවත්වීමේදි අනුගමනය කළ යුතු ආකාරය ගැන සැවොම දැනුවත් කර තිබෙන්නේ. අනිවාර්යයෙන්ම හැමෝම මුඛ ආවරණ පැලඳ සිටිය යුතුයි. සමාජ දුරස්ථභාවය තබා ගත යුතුයි. අත් සේදිය යුතුයි. ලොකු හෝල් වල රැස්වෙන්න පුළුවන් තුන්සියක වගේ පිරිසකට. පොඩි හෝල්වල එකසිය පණහක් පිරිසකට රැස්වෙන්න පුළුවන්. සමහර වෙලාවට අපිට පෙනෙනවා මේ පැමිණෙන අය ආරක්ෂාකාරි නොවන විදිහට ඉන්න බව. තවමත් කොරෝනා වයිරස් අවදානම මෙරටින් තුරන් වී නැහැ. මේ පැමිණෙන අය පරිස්සම් වෙන්නේ නැත්නම් අපට සිදුවෙනවා පොත් ප්‍රදර්ශනය නතර කරන්නට. සෞඛ්‍ය ක්ෂේත්‍රය, ත්‍රිවිධ හමුදාව, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මේ හැමදෙනාට පමණක් නොවේ, ප්‍රදර්ශනෙයට පැමිණෙන අයට වාගේම මෙය පවත්වන අයටත් මේ ස්ථානයට යන එන හැමෝමට වගකීමක් තියෙනවා වයිරසයයෙන් බේරීමට, ආරක්ෂාවීමට නිසි පරිදි කටයුතු කිරීමට."

කවුරුත් සිටින්නේ සතුටිනි. ඒ තියෙයිදෝ නොතියෙයිදෝ කියා දෙපැත්තට වැනෙමින් තිබූ ප්‍රදර්ශනය පැවැත්වීම ගැනය. වෙනදාට නම් සෙල්ෆි කණ්ඩායම්, මිතුරු මිතුරියන්ගේ කණ්ඩායම් ඕනෑ තරම්ය. ලේඛකයන්ගේ පාඨකයන්ගේ සුහඳ හමු විම් මඟ දිගටය. නමුදු මෙවර ඒ සබඳතා දැකිය හැක්කේ අඩුවෙනි. ඒ මුඛ ආවරණ නිසා එකිනෙකා අඳුනාගැනීමට ඇති අසීරුතාවය නිසාය. මේ කොහොම වුණත් මෙවර ද පොත් ප්‍රදර්ශනය පැවැත්වීම නම් සතුටක් බව එහි යන එන කාගේත් කතාවය.

ඡායාරූප - රංජිත් අසංක

● අමිල මලවිසූරිය

ෆේස්බුක් සාදයක් වූ උපන්දින සාදයට වැට බැඳේ

ෆේස්බුක් ඇතුළු සමාජ මාධ්‍ය ඔස්සේ එක්රැස් වන නන්විධ තරුණ තරුණියන්ගේ මිතුරු සමාජ වෙනුවෙන් පවත්වන සාද හෙවත් ෆේස්බුක් සාද මෑතක සිට 'රැල්ල'ක් බවට පත්වෙමින් තිබේ. නගරවල පමණක් නොව ඈත ගම්දනව් කරාද මෙකී ෆේස්බුක් සාද දැන් දැන් ව්‍යාප්ත වී හමාරය. මීට වසර පහ-හයකට පමණ පෙරදී තරුණ තරුණියන් අතරට ආ ෆේස්බුක් සාද මේ වන විට මුළු සමාජයටම පිළිලයක්ව ඇති බව ගම්‍ය වන්නේ එකී සාදවල සිදු වන නොයෙක් අකටයුතුකම් නිසාවෙනි. මත්ද්‍රව්‍ය, මත්පෙති, මත්පැන් පමණක් නොව තරුණ තරුණියන් අතර ලිංගික හැසිරීම්ද පසුගිය කාලයේ ෆේස්බුක් සාදවලදී වාර්තා විය.

මීගමුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරා

කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපති ශ්‍රිනික ජයකොඩි

මීට වසර දෙකකට පමණ පෙරදී වේයන්ගොඩ පැරණි වලව්වක පැවැති ෆේස්බුක් සාදයක් පිළිබඳ අප පුවත්පතද තැබූ සටහනකදී වැටලීම සිදු කළ වේයන්ගොඩ පොලිස් නිලධාරින් පැවසුවේ අලුයම් කාලයේ සාදය වටලන විටදී අධික ලෙස මත් ගතියෙන් සිටි ඇතැම් තරුණ තරුණියන් අඩනිරුවත්ව තැන තැන වැටී සිටියේ ලිංගික හැසිරීම්හි සාක්ෂිද සටහන් කරමින් බවයි.

ෆේස්බුක් ඇතුළු සමාජ මාධ්‍ය ඔස්සේ බෙදාගන්නා (Share) හෝ සමාජ මාධ්‍ය කණ්ඩායම් (Group) ඔස්සේ බෙදා ගන්නා දැන්වීමක් හරහා මෙකී සාදවලට තරුණ තරුණියන් එක්වන්නේ එවැනි සාදවල සිදුවන්නෙ කුමක්ද යන්න ගැන නිසි අවබෝධයක්ද නොමැතිවය.

මෙසේ ෆේස්බුක් ඔස්සේ එක්තරා තරුණයකුගේ උපන් දින සැමරුමක් වෙනුවෙන් පළ කළ දැන්වීමක් (පෝස්ට්ටුවක්) හරහා නීති විරෝධී මත්පැන් සහ මත්ද්‍රව්‍ය සමඟ තරුණයන් පිරිසක් පැවැත් වූ ෆේස්බුක් සාදයක් පසුගිය 12 වැනිදා මධ්‍යම රාත්‍රියේදී වටලනු ලැබීය. ඒ, මීගමුව කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරා මහතාට ලැබුණු තොරතුරක් අනුවයි.

පසුගිය 12 වැනිදා පෙරවරුවේ කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ශ්‍රිනික ජයකොඩි හමුවීමට වයස අවුරුදු පනහක් පමණ වන පුද්ගලයකු පැමිණියේ හිරිමල් වියේ පසුවන තරුණයකුද සමගිනි. කොච්චිකඩේ, කම්මල්තොට ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු වන නිහාල් නමැති එකී පුද්ගලයා පොලිස් ස්ථානාධිපතිවරයාට පවසන්නට වූයේ,

"සර්... මගේ පුතාගේ 18 වැනි උපන් දිනය යෙදෙන්නෙ මේ 13 වැනිදාට. දරුවට යාළුවෝ ටික ගෙනල්ලා හෝටලේක අද රෑට උපන් දිනය සමරන්න අවශ්‍යයි කියනවා..."

ඊට පොලිස් ස්ථානාධිපතිවරයා ප්‍රතිචාර දක්වා තිබුණේ, "ප්‍රශ්නයක් නෑ... හැබැයි කොරෝනා නීති රෙගුලාසිවලට යටත්ව සිදුවිය යුතුයි... පී.එච්.අයි මහත්තයට දැනුම් දිය යුතුයි... ඒ වගේම අසල්වැසියන්ට බාධා වෙන්නත් බෑ..."

එලෙස පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් ලැබුණු අනුමැතිය සමඟ කොච්චිකඩේ පොලිසියෙන් නික්මෙන්නට සූදානම් වෙද්දී නිහාල්, යළි පොලිස් ස්ථානාධිපතිවරයාට කීවේ, "සර්ටත් පුළුවන්නම් එන්න... අපි සාදරයෙන් පිළිගන්නවා..." කියාය.

ලැබුණු ආරාධනය එසැණින් ප්‍රතික්ෂේප කළ පොලිස් ස්ථානාධිපතිවරයා අපට කීවේ, එම ප්‍රකාශයේ සැඟවුණු අර්ථය හෙළි වන්නේ පොලිසිය විසින් සාදය වැටලීමත් සමඟ බවයි.

ඒ අතරේ නිහාල් එදින රාත්‍රියේ උපන් දින සාදය පැවැත්වීමට අවසර ගත් කොච්චිකඩේ, කම්මල්තොට හොයෝ හෝටලයට වැල නොකැඩී තරුණයන් ඇදී එන බවට මීගමුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට තොරතුරක් ලැබිණි. ඒ සැණින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා ඒ ගැන සොයා බැලීමට කොච්චිකඩේ පොලිසිය දැනුවත් කළේය.

ඒ වන විට තරුණයන් නවීන පන්නයේ මෝටර් රථ මෙන්ම යතුරුපැදි, ත්‍රිරෝද රථ ඇතුළු විවිධ රථවාහනවලින් එම හෝටලයට ඇදී එමින් සිටියහ. එසේ එම හෝටලයට තරුණයන් රැස් වන්නේ කුමක් අරබයාද යන්න සෙවීමට පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පොලිස් නිලධාරියකු සහ නිලධාරිනියක උපාය දූතයන් සේ වෙස් ගන්වා යතුරුපැදියකින් මධ්‍යම රාත්‍රිය එළැඹෙද්දී සාදය පැවැති හෝටලයට යැව්වේය. ඒ වන විටත් සාදයට එක්ව සිටි තරුණයෝ මහත් ඝෝෂාකාරී ඩීජේ සංගීතයට අනඟ රැඟුම් පාමින් සිට ඇත්තේ මත්පැන්, මත්කුඩු, සහ මත්පෙතිවලින්ද සප්පායම් වෙමින් බව උපාය දූතයන් දැනගන්නට ලැබිණි. තරුණ පිරිස් රැස්ව සිටි ශාලාවට ඇතුළුවීමට තැත් කළ උපාය දූතයන්ට එහි දොරටුව අසල සිටි අයෙක් කීවේ, "ඇතුළට යන්න නම් රුපියල් 1200ක ටිකට් පතක් ගන්න ඕනෙ..."කියාය.

ඒ සැණින් උපාය දූතයන්ට වැටහුණේ එම ස්ථානයේ උපන් දින සාදයක් නොව කිසියම් අකටයුත්තක් සිදුවන බවයි. උපාය දූතයන් දෙදෙනා පොලිස් ස්ථානාධිපතිවරයා අමතා කීවේ, "සර්... මෙතන තියෙන්නෙ උපන්දින සාදයක් නෙවෙයි. විවිධාකාරයේ වාහනවලින් කොල්ලො එනවා. ඇතුළට යන්න ටිකට් කඩනවා..."

ලැබුණු තොරතුර පිළිබඳව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේද උපදෙස් මත කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපති ශ්‍රිනික ප්‍රමුඛ නිලධාරින් විස්සකට අධික කණ්ඩායමක් අලුයම 1.40ට පමණ හෝටලය වටලනු ලැබීය. ඊට අවට පොලිස් ස්ථානවල නිලධාරිහුද එක්ව සිටියහ.

"ඒ වෙලාවෙ තරුණයෝ 153 දෙනෙක් පමණ හිටියා. සියලු දෙනාම අවුරුදු 18ත් 25ත් අතර. අපි වටලන වෙලාව වෙනකොට තමයි මේ සාදයේ උපරිම තත්ත්වය ආරම්භ වුණේ... ඒ වෙලාවෙත් කපල්ස් වාහනවලින් එමින් හිටියේ. පස්සෙ හැඳුනුම්පත් තිබුණ අය අවවාද කරලා මුදාහැරියා. තිස්දෙනෙක් හිටියා අනන්‍යතාව තහවුරු කිරීමට නොහැකිව. ඔවුන් අතර මත්පැන්, මත්ද්‍රව්‍ය සහ මත්පෙති ගත් පිරිස හිටියා. ඒ අය අත්අඩංගුවට ගත්තා."

ඒ අතර සිටි සාදය සංවිධානය කළ 18 හැවිරිදි තරුණයා සහ ඔහුගේ පියා වන නිහාල් නීතිවිරෝධී මත්කුඩු, මත්පෙති, මත්පැන් සහිතව සාදයක් සංවිධානය කිරීමට ආධාර අනුබල දීම නිසා අත්අඩංගුවට ගැණින. මෙකී නීතිවිරෝධී සාදය පැවැත්වීමට අවසර ගැනීමට සිය පුත්‍රයා සමඟ නිහාල්ද පොලිසියට පැමිණියත් සාදය ජංගම දුරකථනය ඔස්සෙ සමාජ මාධ්‍ය උපයෝගීකොට සංවිධානය කර තිබුණේ ඔහු සමඟ පොලිසියට පැමිණි පුත්‍රයා විසිනි.

පොලිස් අත්අඩංගුවට පත් තරුණයන් 31 දෙනා අතර මාරවිල, දංකොටුව, කොච්චිකඩේ, පමුණුගම, මීගමුව, සීදුව, හලාවත ආදි පෙදෙස්හි විවිධ තරාතිරමේ පිරිස් වූහ. ඒ අතර සිටි ඇතැම් දෙනා ඉහළ පවුල් පසුබිම් සහිත අධ්‍යාපනයෙන්ද ඉහළටම ගිය තරුණයන්ය. පොලිස් බාරයට පත් තරුණයන් පාපෝච්චාරණය කළේ,

"සර්... අපි මුකුත්ම දන්නෙ නෑ... ෆේස්බුක් එකේ තිබුණේ අසවල් හෝටලයේ උපන්දින සාදයක් තියෙනවා, එන්න කියලා..."

පොලිස් බාරයට පත් වූ පිරිස

එහෙත් වර්තමානය වන විට රටේ බොහෝ තරුණ තරුණියන් ෆේස්බුක් සාද යනු කුමනාකාරයේ සාදයක්ද යන්න හොඳින් දනී. පොලිස් බාරයට පත් තරුණයන් 30 දෙනාගේ මවුපියන්ද කොච්චිකඩේ පොලිසියට කැඳවිණි. එකී තරුණයන්ගේ ඇතැම් මවුපියෝ පොලිසිය තුළදීම දරුවන්ට දඬුවම් කර තිබුණේ තැන නොතැනද නොතකමින් ඔවුනට පැමිණි ආවේගය නිසාවෙනි.

මෙකී නීති විරෝධි සාදය පැවැති හෝටල් බලධාරින්ගෙන්ද පොලිසිය ප්‍රශ්න කෙරිණි. ඔවුහු පවසා ඇත්තේ ශාලාව වෙන්කර ගත්තේ උපන්දින සාදයකට බවත් එහෙත් එතුළ සිදු වන්නේ කුමක්ද යන්න සොයා බැලීමක් නොකළ බවත්ය.

කොරෝනා නිසා හෝටල්වලටද සිදුව තිබෙන ලාබපාඩු පියවා ගැනීමට කිසිදු සොයා බැලීමකින් තොරව හෝටල් බලධාරින්ද හෝටල් ශාලා ලබාදෙන බැවින් මේ දිනවල මෙවැනි සාද ඇතුළු බොහෝ නීතිවිරෝධි කටයුතු සිදු වන බව පොලිසිය පවසයි. කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපතිවරයාද මෙකී සාදය පැවැති හෝටලයේ බලධාරින්ට දැඩිව අවවාද කළේ නිසි සොයා බැලීමකින් තොරව දිගින් දිගටම මෙවැනි දෑ සඳහා හෝටලය ලබාදුනහොත් නීතිමය පියවර ගන්නා බවටයි.

මෙකී සාදය වැටලීමට මීගමුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරාගේ උපදෙස් මත කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපති ශ්‍රිනික ජයකොඩි, පොලිස් පරීක්ෂක දේවප්‍රිය, උපපොලිස් පරීක්ෂකවරුන් වන ජයකොඩි, ලක්ෂ්මන්, පොලිස් සැරයන්වරුන් වන 51833 තෙන්නකෝන්, 51750 නිහාල්, 12780 නිලුක යන නිලධාරින් සමඟ මීගමුව අවට පොලිස් ස්ථාන කීපයකම නිලධාරිහු එක්වූහ.

කොච්චිකඩේ පැවැති මෙකී සාදය සේම ෆේස්බුක් සාදයක් ගෙවී ගිය සතියේ දිනෙක පිළියන්දල ප්‍රදේශයේ ස්ථානයකද පවත්වා ඇති අතර එයද පොලිසිය විසින් වටලා තරුණයන් පිරිසක් අත්අඩංගුවට ගෙන තිබිණි.

සමාජයට පිළිලයක් වන මෙවැනි ෆේස්බුක් ඇතුළු සමාජ මාධ්‍යයන්ගෙන් තරුණ තරුණියන් එක්ව මත්පෙති, මත්ද්‍රව්‍ය, මත්පැන් භාවිත කරමින් දින ගණන් එක දිගට අනඟ රැඟුම් පානා සාදවල මෑතකාලීන ඉතිහාසය පිරික්සීමේදී 2018 වසරේ වාද්දුවේ සැප්රෝන් හෝටලයේ පැවැති සාදය මෙතෙක් මෙවැනි සාදයකදී බේදනීයම සිදුවීම වූ සාදය වේ. ඒ, එම සාදයේදී අධික ලෙස මත්පෙති පානය නිසාවෙන් තරුණ ජීවිත හතරක්ම මෙලොව හැර යෑම නිසාවෙනි. නීති විරෝධි මත්ද්‍රව්‍ය භාවිත කරමින් පැවැත්වූ මෙවැනි ෆේස්බුක් සාදයක් ගැන මුලින්ම වාර්තා වන්නෙ 2013 වසරේදීය. ඒ, රාජගිරිය ප්‍රදේශයෙනි. සමාජ මාධ්‍ය ඔස්සෙ රටේ විවිධ පෙදෙස්වල තරුණ තරුණියන් එක්රැස්ව විශේෂයෙන්ම වෙරළබඩ පෙදෙස් ආශ්‍රිතව සිදු වන මෙවැනි සාද 148ක් පමණ මේ වන විට වටලා ඇති බව පොලිසිය සඳහන් කරයි. එය තවත් ඉහළ යන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවද පසුගිය කාලයේ ෆේස්බුක් සාද රැසක්ම රටේ විවිධ පෙදෙස්වලදී වටලනු ලැබ ඇති හෙයිනි. එසේම ගිය වසරේ ජූලි මාසයේදීද මිරිස්සෙන් දියඹට ගිය අධි සුඛෝපභෝගී නෞකාවක පැවැති මෙවැනිම ෆේස්බුක් සාදයක් වැටලීමට මාතර කොට්ඨාස දූෂණ මර්දන ඒකකය සමත් වූයේය. එදිනද තරුණ තරුණියන් 74 දෙනෙක් පොලිස් බාරයට පත් විය.

කෙතරම් වැටලීම් සිදුකළද මෙවැනි සාද රටපුරා විශේෂයෙන්ම සති අන්තයේ නගර ගම්දනව් සිසාරා කෙතරම් පැවැත්වෙනවාද යන්න දන්නේ ඊට සහභාගි වන තරුණ පිරිස් ය. ඇතැම් තරුණ තරුණියන් මෙවැනි සාදවලට එක්වීමට කිලෝමීටර් සිය ගණන් දුර ගෙවා එති. එම නිසා මෙවැනි සාදවලට එක්වන දරුවන්ගේ මවුපියන් සිය දූපුතුන් පිළිබඳව බොහෝ සේ අවධානයෙන් සිටිය යුතුමය.

රුසියානු වෛද්‍ය විද්‍යාල තහනම් වීමේ ඇත්ත නැත්ත

රුසියාවේ Tver විශ්වවිද්‍යාලය

වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය නීතිගත විය යුතුයි

විදෙස් විශ්වවිද්‍යාල ලියාපදිංචි කරන්නේ වෛද්‍ය සභාවේ විශේෂඥ කමිටුවකින්

2012- 2017 දක්වා Tver- සිසුන් 257 ක්, Pirogov- සිසුන් 12 ක් හා PFU- සිසුන් 16 ක් ඇතුළත්

ලෝක ප්‍රසිද්ධ සමහරක් වෛද්‍ය විශ්වවිද්‍යාල වෛද්‍ය සභාවේ ලියාපදිංචි නැහැ

● **සුභාෂිණී ජයරත්න**

ලෝක ශ්‍රේණිගත කිරීමේ ලේඛනයේ 369 ස්ථානයේ පසු වූ රුසියාවේ සුප්‍රකට 'පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව සරසවිය' (Peoples Friendship University- RUDN) ඇතුළු රුසියාවේ විදේශ වෛද්‍ය විශ්වවිද්‍යාල තුනක් අනුමත විශ්වවිද්‍යාල ලේඛනයෙන් ඉවත්කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ගෙන තිබෙන තීරණය සම්බන්ධ මතවාදය පසුගිය දින පුරාවටම මහත් ආන්දෝලනයට තුඩු දුන් කරුණක් විය.

මේ පිළිබඳ අදහස් මතු කරන අය පවසන්නේ මේ හේතුවෙන් වසර කිහිපයක් පුරාවටම දෙරට අතර පැවැති දැඩි මිත්‍රත්වයට අතුල් පහරක් ගෙන දීමට මෙම කරුණ ඉවහල් වූ බවකි. නමුත් ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ නිල දත්තයන්ට අනුව රුසියානු විශ්වවිද්‍යාල තුන පමණක් නොව අනුමත ප්‍රමිතියකින් තොර වූ තවත් විදේශ වෛද්‍ය විශ්වවිද්‍යාල හතරක්ද මේ ලේඛනයෙන් ඉවත් වී ඇත. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් එසේ ලියාපදිංචියෙන් ඉවත් කළ විශ්වවිද්‍යාල හත පිළිවෙළින් මෙසේය.

1) School Of Medicine,Taylor's University
2) Tver State Medical University, Russia
3) Melka-Manipal University, Malaysia
4) Facuity of Medicine,Riga Stradins University, Latvia
5) Pirogov Russian National Research University
6) Peoples Friendship University (RUDN University), Russia
7) Grants Government Medical college and J.J Group of Hospitals, India ය.

මේ සම්බන්ධයෙන් අදාළ අනිකුත් රටවල් සිය මුනිවත රකිද්දි රුසියානු තානාතිපති කාර්යාලය සිය විශ්විද්‍යාල තුන සම්බන්ධයෙන් දැඩි කණස්සල්ල ප්‍රකාශ කර තිබුණේ හැට වසරකට අධික රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා මේ හේතුවෙන් කඩා වැටෙන බව පවසමිනි. හැටේ දශකයේ මුල් භාගයේ සිට මේ දක්වාම ශ්‍රී ලාංකික සිසුන් විශාල පිරිසකට මේ විශ්වවිද්‍යාල හරහා වෛද්‍ය හා අනිකුත් පීඨ සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරුණි. රුසියාව පමණක් නොව චීන සමූහාණ්ඩුව, ඉන්දියාව, මැලේසියාව, බංගලාදේශය, පකිස්තානය ඇතුළු රටවල්ද මේ ආකාරයෙන් විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සමඟ සම්බන්ධ ශිෂ්‍යත්ව ප්‍රදානයන් සිදු කළද අනිකුත් බහුතරය සිදුවන්නේ මුදලටය.

මහජන යුතුකම් කේන්ද්‍රයේ කැඳවුම්කරු වසන්ත අල්විස්

නමුත් මේ සම්බන්ධ විවේචන ඉදිරිපත් කරන අයගේ දැඩි විවේචන එල්ල වන්නේ උසස් පෙළ අවම සුදුසුකම් වත් නැති සිසුන් මුදල් මත බඳවා ගනිමින් වෛද්‍ය අධ්‍යාපනය හැල්ලු කිරීම සම්බන්ධවය. විවිධ ඒජන්සි රුපියල් ලක්ෂ 10 සිට 20 දක්වා එක් ශිෂ්‍යයකුගෙන් කොමිස් ලබා ගෙන පිටරට වෛද්‍ය විද්‍යාල වලට යවන අතර සිසුන්ගේ යථා තත්ත්වය හෙළි වන්නේ ERPM විභාගයට ඉල්ලුම් කිරීමට යාමේදිය. රජයේ වෛද්‍ය පීඨ 10 ටම වසරකට ඇතුළත් කර ගනු ලබන්නේ සිසුන් 1500 ක් පමණ වුවත් මෙවැනි විදෙස් විශ්වවිද්‍යාලවලට වසරකට 1000 කට වැඩි සිසුන් සංඛ්‍යාවක් යවති.

වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවියට අනුව 2020 වසර යාවත්කාලීන වීම් අනුව රුසියානු සමූහාණ්ඩුවේ වෛද්‍ය පීඨවලින් වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගෙන ඇත්තේ එක් වෛද්‍ය පීඨයක් පමණි. චීනයේ 4 ක්ද, ඉන්දියාවේ ජවහල්ලාල් නේරු වෛද්‍ය පීඨය ඇතුළු 7 ක්ද, ලියාපදිංචිව ඇති අතර ඔස්ට්‍රේලියාවේ, බංගලාදේශයේ, ඇෆ්ගනිස්තානය ඇතුළු රටවල් ගණනාවක් එකදු වෛද්‍ය පීඨයක් හෝ ලියාපදිංචිව නැත. එවැනි තැනකින් උපාධිය ලබා පැමිණෙන සිසුන්ට වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගත නොහැකි අතර ERPM විභාගයට ඉල්ලුම් කිරීමටද නොහැකි අතර රෝගියෙකුට ප්‍රතිකාර කිරීම දණ්ඩ නීති සංග්‍රහයේ දඬුවම් ලැබිය හැකි වරදකි.

විදෙස් විශ්වවිද්‍යාල ලියාපදිංචි කිරීම වෛද්‍ය සභාවේ අනුමත විශේෂඥ කමිටුවකින් සිදු වන්නේ ගුණාත්මකභාවයෙන් යුතු වෛද්‍යවරයෙකු බිහි කිරීමටය. මෙම ප්‍රමිතීන් අතර එවැනි වෛද්‍ය පීඨයක සිසුන් 100 කට අවම වශයෙන් ඇඳන් 1000 ක රෝහලක් තිබිය යුතුය. විෂය අපේ රටට සරිලන පරිදි විය යුතුය. වෝහාරික වෛද්‍ය විද්‍යාව, මානසික සෞඛ්‍ය මෙන්ම ප්‍රජා සෞඛ්‍ය විෂයන් ඉගැන්වීම අනිවාර්යය ප්‍රමිතියකි.

යම් යම් හේතුමත Tver,Pirogov හා PFU හි රුසියානු වෛද්‍ය පීඨ සඳහා 2012 සිට 2017 දක්වා සිසුන් ඇතුළත් වී ඇත්තේ මේ ආකාරයෙනි.

Tver විශ්වවිද්‍යාලයට සිසුන් 257 ක්, Pirogov විශ්වවිද්‍යාලයට සිසුන් 12 ක් හා PFU විශ්වවිද්‍යාලයට සිසුන් 16 ක් වශයෙනි. මේ අනුව මේවාට ලාංකික සිසුන් ඇතුළු වී ඇත්තේ මඳ වශයෙනි. ඒ මේ විශ්වවිද්‍යාලවල ළමා රෝග, ප්‍රසව, නාරිවේද, මනෝ වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් අඩු සාධනිය මට්ටමක් පෙන්නුම් කර ඇති නිසා බව සැලය. මේ ලේඛනයෙන් ඉවත් වන විශ්වවිද්‍යාල වසර දෙකක් තුළ ඇපැලක් ඉදිරිපත් කර තම අඩුපාඩු සකසා ගත හැකිවෙයි. මෙම ලැයිස්තුවෙන් ඉවත් කිරීමට දිනකට පෙර ආදාළ විශ්වවිද්‍යාලයට අධ්‍යාපනය සඳහා බැඳුණු සිසුවෙකුට එයින් කිසිදු අසාධාරණයක් සිදු නොවන අතර ERPM විභාගය කිරීමටද හැකිවෙයි. එසේම යම් හෙයකින් වසර දෙකක් තුළ අදාල විශ්වවිද්‍යාලය යළි ලේඛන ගත වුවහොත් ලේඛණයෙන් ඉවත්ව සිටින කාලය තුළ බැඳුණු සිසුන්ටද ERPM විභාගය කිරීමට හැකියාව ලැබෙන බව වාර්තා වෙයි.

ජාතික වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි වෛද්‍ය ආනන්ද හපුගොඩ මේ පිළිබඳව අදහස් දක්වමින් පැවැසූයේ මෙවන් අදහසකි.

" යම් විදෙස් විශ්වවිද්‍යාලයකින් අපිට අයැදුම් පත්‍රයක් පැමිණි විට, ඒ විශ්වවිද්‍යාලය අවම සුදුසුකම් පසුරා තිබේද යන්න විශේෂඥ කමිටුවකින් පරීක්ෂා කරනවා. ඒ සඳහා යම් ගාස්තුවක්ද අය කෙරෙනවා. යම් අවස්ථාවක මේ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්න ඇති වුණොත් මේ කමිටුවට සිදු වෙනවා, අදාළ තීරණ ගැනීමට. මෙහි අවසන් නිගමනය වෛද්‍ය සභාවට ඉදිරිපත් කරනවා. අපේ ප්‍රමිතීන්ට යටත් නම් අපි ඒ විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට බැඳෙනවා. අපි මෙවන් ක්‍රියාදාමයකට පිවිසෙන්නේ එවැනි විශ්වවිද්‍යාල වලට ගොස් උපාධි ලබා ගෙන සේවාවක් නොකරන සිසුන් අපි අතර ඉන්න නිසා. " ඒ ජාතික වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරිවරයාය.

එසේම විදෙස් වෛද්‍ය අධ්‍යාපනය ලැබීමට විදේශත වන සිසුන්ටත් සැපිරිය යුතු සුදුසුකම් වෛද්‍ය සභාව විසින් අනුමත් කර තිබුණද සිසුන් පිරිසක් විසින් ඊට විරුද්ධව උපරිමාධිකරණයේ ගොනුකළ නඩුවේ තීන්දුවෙන් පසු උසස් පෙළ අවම සුදුසුකම් සෙවීම වෛද්‍ය සභාවට නෛතික බලයක් නොමැති විය.

මහජන යුතුකම් කේන්ද්‍රයේ කැඳවුම්කරු වසන්ත අල්විස් මේ පිළිබඳව අදහස් දක්වමින් ප්‍රකාශ කළේ මෙවන් අදහසකි.

" අපි ඉල්ලා සිටින්නේ වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය නීතිගත කරන්න කියා. මේ වන විට වෛද්‍ය අධ්‍යාපනය සඳහා විදෙස් ගත වූ බොහෝ සිසුන්ට උසස් පෙළ අවම සුදුසුකම් වත් නැහැ. එසේම වෛද්‍ය සභාවට බලය තියෙනවා, නිර්ණායක සපුරන්නැති වෛද්‍ය පීඨ ලියාපදිංචියෙන් අවලංගු කරන්න. පසුගිය වසරේ රුසියානු වෛද්‍ය විශ්වවිද්‍යාලවලට ගිය සිසුන් 19 දෙනෙක් උසස් පෙළ අසමත්. මේ වන විට 2019 වසරට පෙර ලෝකයේ වෛද්‍ය විශ්වවිද්‍යාලවලට ගිය 83 දෙනෙක්ගේ ලේඛනයක් අපි ළඟ තියෙනවා. එහි අවම සුදුසුකම් වන උසස් පෙළ C -2 ක් හා S- 1 ක් නැති ළමයි පමණක් 71ක් ඉන්නවා. මෙය විශාල ප්‍රශ්නයක් . . "

කෙසේ වෙතත් මේ පිළිබඳව සොයා බැලීමට සෞඛ්‍ය ඇමැතිතුමිය විසින් පංච පුද්ගල කමිටුවක් පත් කර ඇත. විදෙස් විශ්වවිද්‍යාල ලියාපදිංචිය, අවම අධ්‍යාපන සුදුසුකම්වත් සපුරා නැති වෛද්‍යවරු මෙන්ම විදෙස් වෛද්‍ය උපාධිය ලබාගත් ශිෂ්‍යයන්ගේ වෛද්‍ය උපාධිය ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලබන ERPM විභාගය වැනි කරුණු පිළිබඳව මෙම කමිටුව සොයා බලනු ඇත.

කෙසේ වෙතත් මෙහි තවත් පැතතක් ඇත්තේය. මෙයින් අසාධාරණයට ලක්වූ සිසුන් වෙනුවෙන්ද බොහෝ දෙනෙක් හඬ නඟති. මේ ඒ පිළිබඳව අදහස් දැක්වූ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අදහසකි.

" වෛද්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වලට අනුව අපේ රටේ විශ්වවිද්‍යාලවලට වඩා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල 400 ක් ඉහළින් සිටිනවා. එහෙම නම් කොහොමද ඒවා යෝග්‍ය නැහැ කියන්නේ. ඒත් මෙවැනි ලෝක ප්‍රසිද්ධ සමහරක් වෛද්‍ය විශ්වවිද්‍යාල අපේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි නැහැ. වෛද්‍ය සභාව එසේ ලියාපදිංචියට විශාල මුදලක් අය කරනවා. ඔවුන්ට අවශ්‍ය නැහැ අපේ ඉල්ලීම්වලට එකඟ වෙන්නට. ඔවුන්ට සිසුන් විශාල පිරිසක් සිටිනවා. මෙවැනි ඉහළ තලයක සිටින විශ්වවිද්‍යාලයක් අපේ ලියාපදිංචිය නැහැ කියලා ඉවත් කරන්නේ කොහොමද? මේවායේ අපේ දරුවන් විශාල මුදලක් ගෙවා ඉගෙන ගන්නේ ඒවා අපේ විශ්වවිද්‍යාලවලට වඩා ජාත්‍යන්තර ඉහළ පිළිගැනීමක් ඇති නිසයි. ඇත්තෙන්ම විදෙස් වෛද්‍ය පීඨවලට යන සිසුන්ට අවම සුදුසුකම් තීරණය කිරීමේ ගැටලුවක් නැහැ. නමුත් ඉහළ ශ්‍රේණිගත කිරීම් වල ඇති වෛද්‍ය විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා පැමිණෙන දරුවෙකුට ERPM විභාගය කිරීමට අවසර දිය යුතුයි. එසේම වෛද්‍ය සභාවේ මේ ලියාපදිංචිය ස්ථර කිහිපයකට සිදුවිය යුතුය. එවැනි විශ්වවිද්‍යාල ස්වයංක්‍රිය ලියාපදිංචියකට නතු කළ යුතුයි....." ඔහු පවසන්නේ නොසලකා හැරෙන දරුවන් වෙනුවෙන් යම් සාධාරණයක් ඉටු කළ යුතු බවයි.

රුසියාවේ RUDN විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූලස්ථානය

රුසියාවේ Pirogov විශ්වවිද්‍යාලය

රැකියාවට හැකියාවක් දිවි මගට හෙටක්

අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන "සෞභාග්‍යයේ දැක්ම"
නිපුණතාවයෙන් සපිරි ශ්‍රම බලකායක්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය හා
නාගරික සංවර්ධන හා නිවාස
ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ අනුශාසකත්වයෙන්,
ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන
ගරු රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මැතිතුමන්ගේ උපදෙස් මත

නිපුණතා සපිරි
ඉදිකිරීම් ශිල්පීන් පුහුණුකිරීමේ
ජාතික වැඩසටහන - 2020

8 ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලබා ඇති
අඩු ආදායම්ලාභී පවුල් වල වයස අවු. 18-45 දක්වා
තරුණ තරුණියන් සඳහා මහඟු අවස්ථාවක්

වඩු කාර්මික ශිල්පය, පෙදරේරු ශිල්පය
කම්බි නැමුම් ශිල්පය, ටයිල් ඇතිරීම,
ජලනල කාර්මික ශිල්පය යන
ක්ෂේත්‍ර සඳහා පුහුණුව

මාස 3ක පුහුණුව අතරතුර නිල ඇඳුම් සමඟ රු. 30,000/=ක දීමනාවක්
පුහුණුව නිමකිරීමෙන් පසුව ඉදිරි වෘත්තීය දියුණුව සඳහා රු. 5,000.00 ක වවුචර් පතක්
දෙස් විදෙස් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් (NVQ)

2020 සැප්තැම්බර් 30 පෙර අයදුම්කිරීම සඳහා
අයදුම්පත් පහත වෙබ් ලිපිනයෙන් හෝ දිස්ත්‍රික් සම්බන්ධීකාරක වෙතින් ලබාගත හැකිය

"සවිසිරිපාය", විජේරාම මාවත, කොළඹ 07. දු.අ. : 011-2695965 / 2699801 / 2686092
ෆැක්ස් : 011 2699737 cidatraining@gmail.com www.cida.gov.lk

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 20 වැනිදා ඉරිදා

රටට ගැළපෙන රථවාහන කළමනාකරණයක්

රටක සාක්ෂරතාව මනින මිනුම්දඬු කිහිපයක් වේ. ඒ මිනුම් දඬු අදාළ වන්නේ අකුරු යන සංකේතයට පමණක් නොව හැදියාව, අචාරශීලීත්වය, අනෙකාට ගරු කිරීම ආදී වශයෙන් වන තවත් බොහෝ කාරණා මත්තෙනි. පාරට බසින කල බොහෝ හොඳ වාහනවල ගමන් කරන හැදියාව බින්දුවටම බැස ඇති ටයි කෝට් දමා ගත් නමට මහත්වරු නෝනලා බොහොමයක් මුණ ගැසෙති. ඒ සමහර අය ප්‍රසන්න පෙනුමැති ය; වැදගත් බව පෙන්වන ලක්ෂණ සහිත ය; බොහෝ වටිනා වාහන පාවිච්චි කරන බව පෙනෙති. එහෙත් මාර්ගයට බැසි කල වාහනය ධාවනය කරන්නේ නම් ඒ කිසිවකට ගැළපෙන පරිද්දෙන් නොවේ ය. එක් තීරුවක ධාවනය කරන වාහනය ඊළඟ තීරුවේ කුඩා හිදෙසක් දුටු කල්හි රිංගවා ගැනීමට දෙවරක් නොසිතති. පැති කණ්ණාඩි තිබුණ ද ඒවා ඇත්තේ අලංකාරයට පමණකි. සමහර යතුරුපැදිවල පැති කණ්ණාඩිවලින් පෙනෙන්නේ අහස්තලය ය. සමහරුන්ට පැති කණ්ණාඩි ඇත්තේ ම නැත. පොලිසියට ද පැති කණ්ණාඩි රහිත වීම බරපතළ වැරැද්දක් සේ නොපෙන්නේ ඇයි දැයි අපට ගැටලුවක් තිබේ. හරිහමන් මාර්ග හා රියැදුරු සාක්ෂරතාවක් ඇත්තකුට පැති කණ්ණාඩියක් නැතිව ධාවනය කළ නොහැකි බව අපේ විශ්වාසයයි.

මේ සියල්ලම හේතු කාරණා සේ ගොඩනැඟී; මාර්ග නීති කඩන්නන් සේම ඒවා විවිධ මට්ටමින් බලපෑම් කර මාර්ග තදබදයක් නිර්මාණය වීම ද කලක් තිස්සේ ම සිදු වූවකි.

'නැවත අරඹමු මහමඟ විනය' යන මං තීරු නීතිය වැදගත් වන්නේ මේ සියල්ල පසුබිමේ ලා සලකද්දී ය. මං තීරු නීතිය ක්‍රියාත්මක කෙරුණේ උදය වරුවේ දැඩි ව පවතින මහාමාර්ග තදබදය අවම කිරීමේ පියවරක් වශයෙනි. පාසල් පද්ධතිය නැවත තිබූ පරිද්දෙන් සක්‍රිය වීම නිසාත්; කොරෝනා නිසා අඩාළ වී තිබුණු ජනජීවිතය යථා තත්ත්වයට පත් වෙමින් සිටින නිසාත් මාර්ග තදබදය දැන් දැන් පැවැති ලෙසට ම වර්ධනය වී ඇත. මේ නිසා උදය වරුව පුරාත් සවස් වරුවත් අධික මාර්ග තදබදයකට ලක් වෙන්නට ජනතාවට සිදු ව තිබේ. මාර්ග නීති අමුඅමුවේ උල්ලංඝනය කරන රියැදුරන් නිසා මේ අර්බුදය තවදුරටත් වර්ධනය වී ඇත. 'නැවත අරඹමු මහමඟ විනය' යන හේතු පාඨය ම මෙහිදී අවධානයට ලක්විය යුතුය. බස් සඳහා බස් මං තීරුවක් හඳුන්වා දී ඇතත් පුද්ගලික බස් රියැදුරෝ බහුතරයක් මේ නීති රකින්නෝ නොවෙති; පොලිසිය දකිද්දී පමණක් නිවැරදි මං තීරුවට එන ඔවුහු තැන නොතැන බලා පදිකයන් නංවා ගැනීම නිසා ඇතිවී ඇති ගැටලු අප්‍රමාණ වෙති. පොදු ප්‍රවාහන සේවා භාවිත කරන මඟීන්ට ද බොහෝ දුරට විනයක් නැත; බස් නැවතුම් පොළක් තිබුණ ද නොතිබුණ ද ඔවුහු බස් රථයක් දුටු විට එයට අත දමති. එසේ තැන තැන නවතන බස් නිසා මහමඟ ඇතිවන වාහන තදබදය අනන්තය. පොලිසිය නැති තැන්වල කරන මෙවැනි වැරදි අල්ලා ගැනීමට තාක්ෂණය භාවිත කිරීමේ වරදක් නැතැයි අපි ද සිතන්නෙමු. උදෑසන ඩ්‍රෝන තාක්ෂණය යොදා ගෙන මෙකී වරද අල්ලන්නට උත්සාහ කරන පොලිස් නිලධාරීන් දුටු විට බොහෝ වාහන හිමියෝ සමච්චලයට මෙන් සිනහ වෙති. එහෙත් මේ සියලු අත්හදා බැලීම් කරන්නේ මඟීන් වන අප වෙනුවෙන් බැව් ඔවුහු අමතක කරති. රියදුරන් කරන වැරදි අවම වන්නේ නම් එය බොහෝ දුරට මාර්ග තදබදය වළක්වා ගැනීමට හේතු වනු ඇත.

බොහෝ දෙනකුට තිබෙන ප්‍රශ්නයක් වන්නේ මං තීරු නීතිය පිළිබඳ නීතියක් ඇත්තට ම සඳහන් වන්නේ ද යන්න ය. 1951 දරන මෝටර් රථ වාහන පනතේ 148 වැනි වගන්තියේ මේ මං තීරු නීතිය ගැන සවිස්තරාත්මක ව සඳහන් ය. මෙතෙක් කල් පොතට නීතියක් ව තිබී, වරින් වර ක්‍රියාත්මක කරන්නට උත්සාහ ගත්ත ද ලොප් වූ දෙයක් ක්‍රියාත්මක කිරීමට රජය දරන උත්සාහයට අප කෘතඥ වන්නේ ඒ නිසා ය. මං තීරු නීතිය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම නීත්‍යානුකූල දැ යි අසන අයට කියන්නට තිබෙන්නේ මේ පනත කියවා ගන්නා ලෙස ය. මහාමාර්ග දියුණු කරන්න යැයි කියන උදවිය නොදන්නා කරුණ වන්නේ කියන ඉක්මනට ඒවා කළ නොහැකි බව ය. කඩිනමින් කළ හැකි දෙය වන්නේ විනය පවත්වා ගැනීමයි.

දැනට ලංකාවේ දිගින් කිලෝමීටර් 123,000ක් වූ මාර්ග පද්ධතිය, පරිහරණය කිරීමට හැත්තෑ හත් ලක්ෂයක් පමණ වූ වාහන සඳහා ප්‍රමාණවත් වුවත්; ඒ වාහන ප්‍රධාන නගරය වෙත කේන්ද්‍රණය වී තිබීම හේතුවෙන් වාහන තදබදය වැඩි වී ඇත. උදෑසන කොළඹ නගරයට එන වාහනයක සාමාන්‍ය ධාවන වේගය පැයට කිලෝමීටර් 12 දක්වා අඩු වී තිබීම මේ සඳහා උදාහරණයකි. මේ නිසා නඩත්තු වියදම් හා ඉන්ධන වියදම් වැය වන්නේ විදේශ විනිමය ලෙසිනි. ලංකාවේ ඉන්ධන වියදම සඳහා වැයවන මුදල රටේ සමස්ත ආනයන වියදමෙන් 12%ක් වන අතර වාහන ඉන්ධන සඳහා 10%ක් වැය වේ. ලංකාවේ වාහන වැඩිවීමේ සීඝ්‍රතාව අනුව තව වසර 8කින් දක්ෂිණ අධිවේගී මාර්ගය ද තදබද වනු ඇති බවට විශ්ලේෂකයෝ අනතුරු අඟවති. එබැවින් තාවකාලික පැලැස්තර දමා පලක් නැත.

දැනට ලංකාවේ මගී ප්‍රවාහනයෙන් 80%ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් 98%ක් මාර්ග ප්‍රවාහනය මඟින් සිදු කරයි. මාර්ගගත මගී ප්‍රවාහනයෙන් 60% ක් බස් රථවලින් සිය අවශ්‍යතා ඉටු කරගනී. ඉතිරි 40%ක් පමණ වූ ප්‍රමාණය තනි පුද්ගලයන් හෝ දෙදෙනකු පමණක් පැමිණෙන වාහන වේ. එය මාර්ග තදබදයට සක්‍රිය දායකත්වයක් ලබා දෙන්නකි.

ආකල්ප දියුණු කිරීම තරම් ජාතියක් නංවාලීමේ වෙනත් ක්‍රියාමාර්ගයක් නැත. දියුණු ආකල්ප යනු දියුණු ජාතියක සමාරම්භයයි. 'සෞභාග්‍යයේ දැක්ම' නිර්මාණය වන්නේ ම ආකල්ප දියුණුව උදෙසා ය. එහි දිගුවක් ලෙසින් ක්‍රියාත්මක 'නැවත අරඹමු මහමඟ විනය' අපගේ සුබ සිද්ධිය සඳහා මිස අන් යමක් වෙනුවෙන් නොවේ. රියැදුරන්, පදිකයන්, මඟීන් විනයවත් වීම නිසා රටට වන ප්‍රතිලාභය ගණනය වන්නේ භෞතික පදනමෙන් පමණක් නොවේ; මානව සම්පත ද සුරැකීමෙනි. දිනකට පුද්ගලයන් අටකට අධික ප්‍රමාණයක් මහමග මිය යන්නේ නොසැලකිලිමත් විනය විරෝධී රියදුරන් නිසා ය. ශ්‍රම බළකායෙන් වැඩි පිරිසක් මහමඟ නිකරුණේ කාලය ගෙවා දමන්නේ ආතතියට ලක් වෙමිනි. එයින් ගිලිහෙන මානව ශ්‍රමය සේ ම, නිකරුණේ දහනය වන ඉන්ධනත්, ඒ නිසාම වන පරිසර හානියත් පිළිබඳ විශ්ලේෂකයෝ බොහෝ කලෙක සිට අනතුරු අඟවති. එනිසාම මේ වනාහි විනයවත් පරිසරයක්, මාර්ග පද්ධතියක් ඇති කිරීමට ගන්නා ලද ස්වර්ණමය ක්‍රියාදාමයකි. පොලිසිය හිටියත් නැතත් විනය ගරුක මාර්ග භාවිතයක් ගොඩනැගිය හැකි නම් එය මේ අර්බුදයට පිළියමකි; මානව සම්පතට සුවසෙතට හේතුවකි. හැකි පමණින් එයට අනුගත වීම සැමගේ යුතුකම වන්නේ ඒ නිසා ය.

ආදායම් ඉපැයීමේ විෂමතාව නිවැරදි කරගත යුතුයි

ආචාර්ය අජිත් දිසානායක ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය

● **සුහද්‍රා දේශප්‍රිය**

නව සහස්‍රය ආරම්භයේදීම ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල්වල එනම් මන්දගාමී සංවර්ධිත රටවල බලාපොරොත්තු වූ සංවර්ධන ඉලක්කයන් සපුරාලීමට නොහැකි වීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර වැඩමුළු හා ජාත්‍යන්තර කතිකාවන් ගණනාවක්ම ඇති විය. කෙසේ හෝ වේවා 80 දශකයේ අගභාගය වන විට ලෝකයේ සංවර්ධනය සම්බන්ධයෙන් කතා කළ විද්‍යාඥයන් බොහෝ දෙනෙක් මතුකරනු ලබන කාරණාවක් නම් ලෝකයේ දියුණු වෙමින් පවත්නා රටවල් සහ තුන්වැනි ලෝකයේ මේ කුලකයන්ට අයත් රටවල් අතරට ලංකාවද අයත් වීමයි. එයට මූලික හේතුව වූයේ ලංකාව යටත් විජිතකරණයට ලක්වූ රටක් වීමයි. සංවර්ධනය පිළිබඳ කතා කරන ලද බොහෝ ආර්ථික විදයන් අතර මූලිකත්වය ගත් විද්‍යාඥයන් වන ඒ.කේ. කුමාර් සෙන් (1998 නොබෙල් ත්‍යාග ලාභියෙක් වෙයි), පාර්තා දාස් ගුප්තා, කල්ගෝනාරාන් මේයිල, කෙනත් ඇරෝ, තෝමස් ස්ටේනර් සහ ඩේවිඩ් ක්ෂරෙඩ් මයිකල් හැමන්ඩ් සහ ක්ෂු මාකර් වැනි ආර්ථික විද්‍යාඥයන් මේ සම්බන්ධයෙන් කතිකාවන් ගොඩනඟන්නට විය.

ඒ ආර්ථික විද්‍යාඥයන් මේ පිළිබඳ බලපෑ හේතු සාධක කිහිපයක් ඉදිරිපත් කළහ. ඒ අනුව තුන්වැනි ලෝකයේ රටවල් සංවර්ධනය නොවන්නට හේතුව එම රටවල් බටහිර ආකෘතින් අනුගමනය කිරීම ප්‍රධාන හේතු සාධකයක් ලෙස පෙන්වා දෙයි. වෙනත් දියුණු රටවල ආකෘතින් යටත් විජිතකරණයට ලක්වූ රටවලට එතරම් නොගැළපෙන බව පෙන්වා දෙති. එමෙන්ම ඒ රටවල් අරමුණු කරගත් දේ ඉටු කර ගැනීමට නොහැකි වීමට හේතුව ලෙස මේ විද්‍යාඥයන් සඳහන් කරනු ලබන්නේ කාලයක් යටත් විජිතකරණයට ලක්වී සිටි හෙයින් නව යටත් විජිතකරණය එනම් ජාත්‍යන්තර ණය උගුලකට එම රටවල් හසුවී කාලයක් ගතවීම අවශේෂ හේතු සාධක බවය. මේ සඳහා විකල්ප සංවර්ධන මාවතක් අවශ්‍ය බව ඔවුන් සඳහන් කර ඇත.

ඒ අනුව ලංකාව වැනි දියුණු සංවර්ධිත රටවලට අතීතයේදී යටත් විජිතකරණයට ලක්වූ රටක් ලෙස ඇති අත්දැකීම් ගැන සොයා බැලීමක් කළ යුතුය. එසේ ම මේ සම්බන්ධයෙන් නැවත කියවීමක් අවශ්‍ය බව සඳහන් කරයි. 1948 නිදහසින් පසුව 1977 කාල පරාසය තුළ අප ආවෘත ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. මේ කාල පරාසයේ ආණ්ඩු වෙනස් වුණත් අපේ ආර්ථිකය තිබුණේ ආවෘත ආර්ථික ප්‍රතිපත්ති මතයි. එනම් සාපේක්ෂ වශයෙන් අභ්‍යන්තරාවලෝකන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. නමුත් සංවර්ධන අරමුණු ඒ ඔස්සේ ඉටු කර ගැනීමට නොහැකි වූ නිසා ම 1977දී බලයට පත් වූ රජය 1978 සිට විවෘත ආර්ථික ප්‍රතිපත්තියකට මාරු විය. 1978 සිට 2008 අද දක්වාම සාපේක්ෂ වශයෙන් අඩු වැඩි වශයෙන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. පරම්පරා දෙකක යුග දෙකක මේ අත්දැකීම් ගත් විට අපි අපේක්ෂා කරන ලද සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අපිට නොහැකි විය. එයට හේතු වූ කාරණා සම්බන්ධයෙන් නැවත කියවා බැලිය යුතු බව ඒ ආර්ථික විද්‍යාඥයන් පැහැදිලි කරන තවත් කරුණකි. මෙවැනි ඌන සංවර්ධිත රටවල් පිළිබඳ ආර්ථික විද්‍යාඥයන් සඳහන් කරන්නේ මේ සියලු දේ පිළිබඳව නැවත කියවීමක් අවශ්‍ය වන බවයි. මෙවැනි රටවලට ගෝචර වනුයේ තුලිත ආර්ථික ප්‍රවේශයකි. අපි ඉතා ඉක්මනින් තුලිත ආර්ථික ප්‍රවේශයකට යෑමට අවශ්‍යයි. රටක් ලෙස ගොඩ නැගීමට මාර්ගයක් අප විසින් ම ගොඩ නගා ගත යුතුයි. පසුගිය කාල වකවානුව තුළ මෙරට ගොඩනැගීම සම්බන්ධයෙන් කතිකාවන් ගොඩ නගමින් පැවැති කාලපරාසය අතරතුර ලෝක වසංගතයක් ලෙස මේ කෝවිඩ් 19 වසංගතය මතු විය. මේ වසංගතය රටක් ලෙස අපිට දැඩි බලපෑමක් එල්ල කළ අතර ලෝකය යථා තත්ත්වයට පත්වීමට කල් පමාවක් ඇතිවනු ඇත.



මේ රටේ ආර්ථිකය ගොඩ නගන්නේ කෙසේද යන්න නව මානයකින් ගොඩනැගීමට මෙය හොඳම සන්දිස්ථානයක් ලෙස හැඳින්විය හැකිය. නව මුහුණුවරකින් නව මානයකින් මේ ඔස්සේ බැලීමේදී අපට ම ගැළපෙන සංවර්ධන මානයක් තෝරා නොගැනීම සහ අපට ආවේණික අයිතීන් හඳුනා නොගැනීම යන කාරණා පිළිබඳ අප නැවත සලකා බැලිය යුතුය. අපිට අනන්‍ය වූ දේ නිවැරදිව හඳුනා ගැනීමේදී අපේ ඉලක්ක සපුරා ගැනීමට නම් තුලිතයන් තුනක් අත්පත් කර ගත යුතු බව පැහැදිලි වනු ඇත. එහි පළමු වැන්න අභ්‍යන්තර තුලිතයක් ඇති කර ගැනීම, බාහිර තුලනයක් ඇති කර ගැනීම, පාරිසරික තුලනයක් ඇති කර ගැනීම යන කාරණා මේ තුලිත ආර්ථිකයක ගොඩනැගීමේ නව මුහුණුවර වෙයි.

මෙහි පළමුවැන්න පිළිබඳව සැලකිලිමත් වුවහොත් රටක ආදායම් වියදමට සමාන කර ගැනීමේ ක්‍රමවේදය කුඩාම ඒකකය වන කුටුම්බයේ ආදායම කුටුම්බයේ වියදමට තුලිත කරගත යුතුය. එවැනි තුලිත කුටුම්බවලින් සැදුණු ගමක් තුලිත ගමක් වෙයි. එවැනි ගම්මානවලින් සැදුණු රටක් තුලිත රටක් වෙයි. කුඩාම ඒකකයේ සිට රට දක්වා තුලනය කරමින් පැවැතියහොත් ගෝලීය ප්‍රවාහයක් දක්වා ගමන් කිරීමට හැකි වෙයි. කුඩාම ඒකකය තුලනය කර ගැනීම මෙහි මූලික සංකල්පය මෙන්ම ආරම්භයද වෙයි. එහිදී මුහුණ දෙන ගැටලු දෙකක් වෙයි. එනම්, කුඩාම ඒකකය ආදයමට වියදමට ප්‍රමාණවත් නොවන්නේද, ඒ අනුව අනවශ්‍ය වියදම් කපා හැරීම තුළින් ආදයම් වියදම් තුලිත කර ගැනීමට අපට හැකි වෙයි. නමුත් අපි දුටු කරුණක් නම් අඩු ආදායම්ලාභීන් පිරිසක් වන අතර ඒ පිරිසට ආදායම වියදමට ප්‍රමාණවත් නොවෙයි. ඒ ජන කොටස්වල වියදම ස්ථාවරව තබා ගැනීමට ආදායම වැඩි කර ගැනීමේ ක්‍රියාමාර්ගවලට යා යුතුයි. මේ සඳහා ජනතා ආරක්ෂණ දැලක් (peopls safetynet) එළිය යුතුයි. මේ ආකාරයට කුටුම්බය ශක්තිමත් රටක ආදායම වියදම සීමා කිරීමට සහ අයවැය තුලනය කර ගැනීමට ආර්ථික ප්‍රතිපත්ති මෙහෙය විය යුතුයි.

දේශීය වශයෙන් නිෂ්පාදනය කරන්නට නොහැකි දේ අපි පිටරටින් අපනයනය කරයි. දේශීය වශයෙන් පරිභෝජනය කර අතිරික්තය අපි අපනයනය කරයි. ඉහළ යන ආනයන වියදම ඉතා කුඩා අපනයන වියදමකින් පියවා ගැනීමට හැකි නොවෙයි. ජාත්‍යන්තර ගෙවුම් ශේෂය තුළ බරපතළ අර්බුදයකට මුහුණ පා ඇත. මේ මඟින් තුළින් මතු වී ඇති විදේශ විනිමය අර්බුදය විසඳා ගත යුතුයි. කෝවිඩ් වසංගතයත් සමඟ විදෙස් ආදායම් ලැබෙන මාර්ග ඇහිරී ඇත. මේ අර්බුදය හමුවේ බාහිර තුලනයක් අත් පත් කරගන්නේ කෙසේ ද ? යන්න සම්බන්ධයෙන් අප අවධානය යොමු කළ යුතුය. කෝවිඩ් 19 වසංගත තත්ත්වයත් සමඟ වර්තමානයේ ආනයන පාලනය කිරීම්, සීමා කිරීම් ඉතා වැදගත් වෙයි. පියවර දෙකකින් මේ පියවර ගත යුතුයි. දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි නමුත් විදේශයන්ගෙන් ආනයනය කරන භාණ්ඩ සීමා කළ යුතුයි. විදේශීය වශයෙන් ගෙන්වන භාණ්ඩ පාලනය කිරීමට නම් නීතිරීති සම්බාධක යොමු කර මේවා නතර කළ යුතුයි. මේ පාලනය තුළ දේශීය පාරිභෝගිකයාට යම් අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙයි. එසේ නම් කළ යුතු වන්නේ කඩිනමින් ඒ භාණ්ඩ නිෂ්පාදනය රට තුළ සිදු කිරීමයි.

දේශීය වශයෙන් නිෂ්පාදනය කරන්නට නොහැකි දේ සඳහා ආනයන මත ආනයන ආදේශ ඇති කරගත යුතුයි. මේ අනුව පළමු පියවර තුළ ස්වයං පෝෂිත වීමද දෙවැනි පියවරේදී ආනයන ආදේශනයන් රට තුළ ඇති කිරීමද කළ යුතුයි. එවිට ජාතික ආර්ථිකයක් ගොඩනැගීමෙන් ස්වයං පෝෂණය විය හැකියි. ඉන්පසු දෙවැනි පියවරේදී ස්යංප්‍රබූධ විය හැකියි. විදේශීය වශයෙන් ආනයනය කරමින් සිටි, දේශීය වශයෙන් නිෂ්පාදනය කළ නොහැකි දෑ දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි තත්ත්වයක් ඇති කළ යුතුයි. මේ ක්‍රියාමාර්ග දෙකට බාහිර තුලන අවශ්‍යයි. ආනයන සීමාවන් ආනයන තුලනයන් කළ යුතු වන්නේ රටට අවශ්‍ය කරන දෑ පමණක් ආනයනය කළ යුතු නිසාය. විදේශ විනමය ගලනය වීමක් එමඟින් සිදු වන නිසාය. අප ව්‍යවස්ථා සංශෝධනය හරහා ඇති කළ යුතු වන්නේද මේ සංකල්පයයි. රට කෙරෙහි ආදරයක්, සිත් ඇද ගන්නාසුලු දේශහිතෛෂී වැඩපිළිවෙළක් ඇති කළ යුතුයි. ඒ සඳහා ආකල්පමය වර්ධනයක් අවශ්‍ය වේ. ආකල්පමය වර්ධනයක් ඇති කරගත හැක්කේ කෙසේදැයි අප සාකච්ඡා කළ යුතුය. දේශීය අය වැය සමතයට පත් කර බාහිර තුලනයක් ඇති කර ගත හැකිවෙනු ඇත.

ආනයන අපනයන වියදම තුලනය මඟින් පාරිසරික තුලනය පාලනය කළ නොහැකියි. එය ගෝලීය අවශ්‍යතාවයක් වෙයි. උදාහරණයක් ලෙස ඉන්දියාවේ බලාගාරයකින් වායුගෝලයට මුදා හරින කාබන් මොනොක්සයිඩ් ඊසාන දිග මෝසම හරහා ලංකාවට පැමිණිය හැකියි. නිරිත දිග මෝසම හරහා මැඩගැස්කරය දෙසින් රට තුළට පැමිණිය හැකියි. අපි ඒ පාරිසරික හානිය නොකළත් ගෝලීය හානිවලට මුහුණ පෑමට සිදුවෙයි. ගෝලීය වශයෙන් සම්බන්ධ වී තිරසර අනාගත පරම්පරාවන්හි සංවර්ධනය ඇති කළ යුතුයි. පාරිසරික තුලනයක් අපි ඒ හරහා ඇති කරගත යුතුයි. අපේ භූමියට, අපේ සම්පත්වලට අපි ආදරය කළ යුතුයි. එසේ ආදරය කරන පිරිසක් ඇති කළ යුතුයි. ලෝකයේ දියුණු රටවල පරිසරයෙන් ලබාගන්නා යහපත් අයහපත් දෑ සම්බන්ධයෙන් ගිණුම් ගත කර යහපත් දෑ ධන ගිණුම් ලෙසත් අයහපත් දෑ ඍණ ගිණුම්වලටත් ඇතුළත් කරමින් ඒවා සමතුලිතයට පත් කරගැනීම සිදු කරයි. මේවා හරිත ගිණුම් ලෙස හඳුන්වයි. මෙවැනි මූලධර්මයකට අප පැමිණිය යුතුයි.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු වන්නේ ආකල්පමය වශයෙන් වෙනසක් ඇති කර ගැනීමයි. විවිධ ආගම් නියෝජනය කරන අපේ රටේ දහම් පාසල් දරුවෝ සිටිති. දහම් පාසල හරහා අපේ රටේ ආකල්පමය වෙනස් වීම් කළ හැකි ක්‍රමවේදයන්ට අප යා යුතුය. දහම් පාසලක උගන් වන්නේ අදාළ ආගමේ නායකයකු වන අතර දහම් පාසල සම්බන්ධයෙන් තවමත් මේ සමාජයේ පිළිගැනීමක් ඇත. මවුපියන්ටද ඒ සම්බන්ධයෙන් කිසියම් විශ්වාසයක් ගොඩ නැඟී ඇත. ඒ අය හරහා මේ ආකල්පමය වෙනස නව පරම්පරාවට ගලනය කිරීමට අපට හැකිය.

රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් මේ පාලන යාන්ත්‍රණයකට සුදානම් වේ නම් අපි ඒ සඳහා දායකත්වය දැක්විය යුතුයි. අපි රටක් ලෙස ගත් විට අපේ රටේ විශාල වශයෙන් රටේ අවශ්‍යතා වෙනුවෙන් කැපකිරීම් කරන පිරිසක් බිහි වී ඇත. දිළිඳු ජනකොටස් මේ රටේ අනාගතය වෙනුවෙන් දරුවන් වෙනුවෙන් කැප කිරීම් කරයි. අඩු අදායම් ලාභීන්, බොහෝ අපේක්ෂා නොමැති බලාපොරොත්තු නැති, සරල ජීවිත ගත කරන පිරිසක් මේ රටේ වෙති. ඒ අයගේ කැපවීමේ වටිනාකමක් නොදැනෙයි. ඒ පිරිසට සමාජයේ හඬක් හෝ බලයක් නැත. රටේ සම්පත් භුක්ති විඳින අතළොස්සක් තම සුඛෝපභෝගී ජීවිත ගත කිරීම වෙනුවෙන් තීන්දු තීරණ ගැනීම නිසා අපේ රටේ සංවර්ධනයට බාධා පැමිණ ඇත. ආදායම් ඉපැයීමේ විෂමතාව රටක් ලෙස අපි නිවැරදි කරගත යුතුයි. ආදායම් ඉපැයීම ක්‍රමවේදය වෙනස් කළ හැකි නම් එය තුලිත ආර්ථික ප්‍රවේශයේ සාධනීය මාර්ගය මෙන්ම නිවැරදි දිශානතිය තීන්දු කරනු ඇත.



එජාපයේ කැරලි 12ක්

එක්සත් ජාතික පක්ෂය මෙරට දේශපාලන ඉතිහාසය තුළ දැවැන්ත ඉතිහාසයක් ඇති පක්ෂයකි. නොයෙක් දේශපාලන ගැටුම් මැද ඉකුත් මහ මැතිවරණයට ඉදිරිපත් වූ එම පක්ෂයට අත්වූයේ නොසිතූ අන්දමේ පරාජයකි. ජනාධිපතිවරුන්, අගමැතිවරුන් මෙන්ම රටේ ඉහළ නමක් දිනා ගැනීමට සමත් වූ මැති ඇමතිවරුන් රැසක් බිහි කළ මෙම පක්ෂයට මෙවර හිමිවූයේ එක් අසුනක් පමණි. එයද ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයක් වීම විශේෂත්වයකි. එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය අදටත් ගැටලු රාශියක් මතු කර ඇත. එම පක්ෂයට ඉදිරියට යම් බලාපොරොත්තුවක් තැබිය හැකි සුවිශේෂී සිද්ධියක් ඉකුත් 14 වැනිදා සිදුවිය. එහිදී පක්ෂයට නව නියෝජ්‍ය නායකයෙකු තෝරාපත් කර ගැනීමය.

වජිර ගෙන් අලුත් පොතක්

එ.ජා.ප නායකත්වය පිළිබඳව අභ්‍යන්තර අර්බුදය නිමා කිරීමට පසුගිය සඳුදා කෘත්‍යාධිකාරී මණ්ඩලය සිරිකොත දී එ.ජා.ප නායක රනිල් වික්‍රමසිංහගේ ප්‍රධානත්වයෙන් රැස්වූහ. එහිදී වජිර අබේවර්ධන තමන් ගැන ලියූ පොතක් නායකතුමා ඇතුළු සමාජිකයන්ට බෙදා දුන්නේය. එදින කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන් 39 දෙනෙක් රැස්ව සිටි අතර විජයකලා මහේෂ්වරන් පැමිණ සිටියේ නැත.

"වජිර නියෝජ්‍ය නායකකමට තරග කරනවාද? සාමාජිකයෝ විමසූහ.

"නෑ නෑ මම නායකකමට මිසක් නියෝජ්‍ය නායකකම්වලට තරග කරන්නේ නෑ. මොකද එ.ජා.ප යේ හිටපු නියෝජ්‍ය නායකවරුන් හැමෝම එක්කෝ දාලා ගියා නැතිනම් පක්ෂය කැඩුවා."වජිර කීවේ සිනාසෙමිනි.

අනතුරුව නායකයා ප්‍රකාශ කළේ පක්ෂයේ නියෝජ්‍ය නායක හා සෙසු තනතුරු ඉක්මනින් පිරවිය යුතු බවය.

"මම වසර විසි ගණනක් නායකතුමා එක්ක වැඩ කළා. ඒ නිසා දැන් නියෝජ්‍ය නායකයෙක් නෙවෙයි නායකකමයි වෙනස් විය යුත්තේ. ඒ තනතුරට මාව ඒකමතිකව පත් කරයි කියලා හිතනවා."රවි කරුණානායක කීවේය.

" මේ පක්ෂයේ කැරලි 12 ක් ආවා. ඒ බොහෝ දේවල් බේරන්න මම මැදිහත් වුණා. නායකතුමාට සුදුසු තීන්දුවක් ගන්න ඉඩ දෙමු. ඡන්ද තියලා පක්ෂය බේද කරන්න නරකයි."වජිර අබේවර්ධන දැරුවේ එවැනි අදහසකි.

එහෙත් රවි කරුණානායක, නවීන් දිසානායක, ලක්ෂ්මන් විජේමාන්න, අනෝමා ගමගේ ඇතුළු පිරිස් විවිධ ප්‍රතිවිරෝධතා එල්ල කළ අතර දැන් නායකයා ඉවත් විය යුතු බව ඔවුන් බොහෝ දෙනෙකුගේ අදහස විය. අනතුරුව නැගි සිටි රවි කීවේ තමා වජිරගේ යෝජනාවට එකඟ නැති බවය.

"එකගතාවයකින් නොහැකි නම් ඡන්දයකින් හෝ අද ප්‍රශ්නය ඉවර කරමු."රවි කීවේය.

රුවන් විජයවර්ධන ජය කෙහෙළි නංවයි

"වජිරගේ ස්ථාවරය තමයි හොඳම එක. අනිත් අයත් තරගයකට ඉදිරිපත් නොවී නායකයාගේ තීන්දුවට ඉඩ දෙනවා නම් මමත් ඊට එකඟයි."රුවන් විජයවර්ධන කීවේ එවැන්නකි.

එහෙත් ඡන්දයකින් ප්‍රශ්නය කෙළවර කර ගත යුතු බවට දිගටම හඬ නැගුණු හෙයින් මහලේකම් අකිල ඡන්ද පෙට්ටියක් රැගෙන විත් අවශ්‍ය පසුබිම සම්පාදනය කළේය. රහස් ඡන්දයක් පැවැතියේ එකී පසුබිමකය. ඡන්දය ගණන් කරන ස්ථානයේ රවි, රුවන්,අකිල හා වජිර ද සිටි අතර අවසානයේ නායකයා නිවේදනය කළේ රුවන්ට ඡන්ද 28 ක් සහ රවී ට 10 ක් ලැබී තිබෙන හෙයින් නියෝජ්‍ය නායකයා ලෙස රුවන් විජයවර්ධන පත් වන බවය.

අනතුරුව රවි, නවීන්, විජයමාන්න, අනෝමා ඇතුළු කණ්ඩායමක් පිටව ගිය අතර සිරිකොත සිටි අය විවිධ ප්‍රශ්න යොමු කරමින් නායකයාගෙන් කරුණු විමසන්නට විය. එහිදී නායකයා මෙන්ම සෙසු පිරිස තුළින් මතුවූයේ විවිධ මතවාදයන්ය. රුවන් විජයවර්ධනට ඡන්ද 18 ක් පැහැදිලි ලෙස තිබුණු බවත් රවි ට එරෙහි කණ්ඩායමක් අවසානයේ රුවන් වෙනුවෙන් ඡන්දය පාවිච්චි කොට ඇති බවට එහිදී විග්‍රහ විය.

එළියට පැමිණි වජිර එහි සිටි මාධ්‍යකරුවන් ඇතුළු පිරිසට ද තම ග්‍රන්ථයේ පිටපත් ප්‍රදානය කළේය.

"මාස තුනකින් නායකත්වය ගැන යම් තීන්දුවක් ගන්නවා. ආණ්ඩුව 20 සම්මත කරලා අලුත් මැතිවරණ කොමිසමක් යටතේ ලබන වසරේ මාර්තු අප්‍රේල්වල පළාත් සභා තියාවි කියලා අනුමාන කරනවා. අපි සූදානම් වෙන්න ඕනෑ."එ.ජා.ප නායකයා කීවේය.

"වජිර අද ගේම් එක ප්ලේ කළේ නායකතුමා වෙනුවෙන් ද?"ඇතැමුන් විමසුවේ මද උපහාසයක් ද සමඟිනි.

රනිලුත් පොත් ලියන්න සූදානමක්

"මම දන්නේ නෑ. එයාගෙන් අහන්න. හැබැයි ඔහු පක්ෂය බේද නොකර සූක්ෂම ගේම් එකක් ප්ලේ කළා. මට දිගටම ඉන්න අවශ්‍ය නෑ. මට පෞද්ගලික ජීවිතයකුත් බලන්න තියෙනවා. පොත් දෙක තුනකුත් ලියන්න සූදානම් කරලා තියෙන නිසා දැන් රෙස්ට් එකක් අවශ්‍යයි."නායකයා කීවේද සිනාසෙමිනි.

"ආණ්ඩුව ඒකාධිපති ප්‍රජාතන්ත්‍ර විරෝධී 18 ගෙනල්ලා මට්ටු වුණා මදිවට ඊටත් එහා යන 20 ගෙනල්ලා තවත් අනාථ වෙන්න හදනවා. 20 ට පියෙක් නෑ. කැබිනට් එක අනුමත කරපු, ජනාධිපති සම්පූර්ණ වගකීම බාරගත්ත 20, සංශෝධනය කරන්නත් අගමැති කමිටුවක් දාලා."එ.ජා.ප නීති නිලධාරියෙකු කීවේ සිනාසෙමිනි.

"මම ඒකයි මුලින්ම කිව්වේ 19 ට අතගහපු ඕන කෙනෙක් ඉවරයි කියලා."එ.ජා.ප නායකයා කීවේ බැරෑරුම්වය.



පොහොට්ටුවේ 4 වැනි සංවත්සරයට බැසිල් බරටම වැඩ

සිය පක්ෂයේ මෙන්ම විපක්ෂ නායක ධුරයේද කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යන සජිත් පසුගිය සති අන්තයේ අවමඟුලකට සහභාගීවීමට හිනිදුම බලා ගියේය. ඒ පියසේන ගමගේ ගේ සහෝදරයාට අවසන් ගෞරව දැක්වීමටය. අනතුරුව ඔහු හිනිදුම එ.ජා.ප සංවිධායක හා පසුගිය මහ මැතිවරණයට ගාල්ලෙන් තරග කළ සුනිල් සේනානායකගේ නිවසට ද ගොඩවිය.

"ඔබතුමා දිගටම එ.ජා.ප යේ හිටියොත් පළාත් සභාවටත් යන්න බැරිවේවි. ඒ නිසා අපිත් එක්ක එකතු වෙන්න."විපක්ෂ නායක සජිත් සුනිල්ට ආරාධනා කළේය.

ඊට දින දෙකකට පසුව කෝට්ටේ ස.ජ.බ කාර්යාලයට පැමිණි සුනිල් සේනානායක ස.ජ.බ සාමාජිකත්වය ඉල්ලා සජිත්ට ලිපියක් බාර දුන්නේ එකී පසුබිමකය. ජාතික සංවිධායක තිස්ස ද එම අවස්ථාවට එක්විය.

එදින දහවල් එ.ජා.බ ට අනුබද්ධ වෘත්තීය සමිති 3 ක නායකයන් කෝට්ටේ කාර්යාලයේදි විපක්ෂ නායක සජිත් හමුවිය. එහිදි සිදුකළ සාකච්ඡාවකින් අනතුරුව විකල්ප වෘත්තීය සමිති 3 ක් ස.ජ.බ වෙනුවෙන් නිර්මාණය කිරීමේ තීන්දුව ගැණිනි. ඒවා මෙහෙයවීම තිස්සට පැවරුණු අතර අදාළ වෘත්තිය සමිති 3 අශෝක අබේසිංහ, මුජිබර්, තුෂාර ඉඳුනිල් පත් කළහ.

සඳුදා සවස 4 ට සජිත්ගේ ප්‍රධානත්වයෙන් නව නගර ශාලාවේදි සිවිල් සංවිධාන විසින් සූදානම් කළ 20 ට එරෙහි සමුළුවක් පැවැත්විනි. "20 ට එරෙහි වෙමු 19 යේ සාධනීය දේ රැක ගනිමු". එහි තේමාව විය. සජිත්, රාජිත, පාක්‍යශෝති ඇතුළු බොහෝ දෙනෙකු එහිදි පළ කළේ 19 න් රට තුළ ඇති කළ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා තනි පුද්ගලයෙකු ඒකාධිපතියෙකු බවට පත් නොකිරීමේ පදනම රටේ අනාගතය වෙනුවෙන් රැකගත යුතු බවය.

ලක්ෂ්මන් කිරිඇල්ල හන්තාන රක්ෂිතයේ වගා කටයුත්තක් සිදුකිරීම සම්බන්ධයෙන් එල්ල වන චෝදනාව ඔහුගෙන් යළිත් ප්‍රශ්න කළේ ස.ජ.බ කණ්ඩායමයි.

කිරිඇල්ල හන්තාන ගැන දුක කියයි

"ඔය ඉඩම වසර 30 කට කලින් මම මිලදී ගත්ත එකක්. අපි ඉඩමේ තණකොළ සුද්ද කළා විතරයි. ගස් කපලා, ගිනි තියලා නෑ. ඒත් අපිට විරුද්ධව පරිසර අධිකාරිය නඩු දාන්න යනවලු. ඒකට උසාවියේදී උත්තර බදිනවා. අපේ අල්ලපු ඉඩමේ ආරණ්‍යයක් මුවාවෙන් හෝටලයකට විශාල බිල්ඩින් වගයක් ඉදි කරලා තියෙනවා. පරිසර අධිකාරිය තණකොල කපපු මට නඩු දාලා රක්ෂිතයේ බිල්ඩින් හදපු මිනිසුන්ට අනුකම්පා කිරීම පුදුමයි. එක රටයි එක නීතියයි කියලා ජනාධිපතිතුමා කිව්වට. මට එක නීතියකුයි. අල්ලපු වත්තට තවත් නී ක්‍රියා කිරීම විහිළුවක්. අනික ද්විත්ව පුරවැසියන්ට මේ රටේ තනතුරු දරන්නත් 20 න් ඉඩ දෙනවාලු. එතකොට එක රටයි එක නීතියක් ද නැත්නම් රටවල් දෙකයි නීති දෙකයි නෙවෙයි ද කියලත් මම අහනවා."ලක්ෂ්මන් කිරිඇල්ල කරුණු පැහැදිලි කළේ එසේය.

එජාපය මාස තුනකින් නායකත්වය ගැන තීන්දුවක් ගනියි

චම්පිකගෙන් 20ගැන අදහස් උදහස්

පසුගිය දා චම්පික රණවක 20 ට අදාළ පාර්ලිමේන්තු විවාදයේදි පළ කළ අදහස් ස.ජ.බ කාගේත් පැසසුමට ලක්විය.

"2010 ඉදලා 2015 දක්වා ශීඝ්‍ර ආර්ථිකයක් තිබුණා යැයි මේ ආණ්ඩුව පුරසාරම් දොඩනවා. යුද්දෙන් පස්සේ උ / නැ අපේ ආර්ථිකයට එකතුවීම හා ගිනි පොලියට ලබාගත් ණය බුබුළත් හා ඉදිකිරීම් බුබුළත් නිසයි ඒ විකෘති ආර්ථික වර්ධනය පෙන්නුම් කළේ. ඒත් 2013 දී ඒ බුබුළු පුපුරලා 3% ආර්ථික වර්ධනය වැටුණා. වසර දෙකකට කලින් ජනාධිපතිවරණයට ගියෙත් ඒකයි. 2015 දි අපි පත් වෙලා අඩු ආර්ථික වර්ධනයක් පවත්වා ගනිමින්, ණයත් ගෙවමින් ආර්ථිකය බංකොලොත් නොකර ස්ථාවර කළා. ඒත් මේ රජය පත් වූ ගමන් හිතවත් ව්‍යාපාරිකයින්ට රුපියල් කෝටි 70,000 ක් එනම් බිලියන 700 ක බදු සහන දීලා රටේ ආදායම 50% කින් විනාශ කළා. 2014 දි රජයේ ආදායම බිලියන 1000 යි තිබුණේ. 2019 වන විට අපි ඒක 2000 ට වැඩි කළා. ඒත් දැන් රටේ ආදායම ණය වාරිකවල පොලී ගෙවන්නත් මදි. ජනතාව හා රට ආර්ථික ලෙස හොම්බෙන් යන දිනය අතළගයි. ආර්ථිකය දැනටත් සෘණ වෙලා මියයමින් තියෙන්නේ."චම්පික රණවකගේ විග්‍රහය එය විය.

"20 වගකීම ජනාධිපති භාර අරන්. ඒත් 20 හැදුවේ කව්ද කියලා කිසි කෙනෙක් දන්නේ නෑ. මේකේ පුදුම වැඩේ වෙන්නේ 20 සංශෝධනය කරන්න අගමැති කමිටුවක් පත් කරපු එකයි. තිස්ස අත්තනායක ස.ජ.බ කාර්යාලයේදී කීවේ එවැන්නකි.

"මේ ආණ්ඩුව යටතේ ස්ථාන 15 ක කැලෑ අක්කර සිය ගණනක් විනාශ කළා. රජය කිසිම පියවරක් නොගැනීම නිසා දිගින් දිගටම ඒක වෙනවා. කැලයට පරිසරයට සතා සිවුපාවාට මම ඉතා ආදරෙයි. එසේ නොවන කිසිම කෙනෙකුට රට ගැන හැඟීමක් තියෙන්න විදියක් නෑ."සජිත් සිය කාර්යාලයේදි ප්‍රකාශ කළේ එවැන්නකි.

මෙම සති අන්තයේ ස.ජ.බ බිම් මට්ටම සැකසීමේ මෙහෙයුම ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල සිදු කිරීමට නියමිතය. ඒ සඳහා සියලු මන්ත්‍රීවරුන් හා හිටපු පළාත් සභා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මෙන්ම නිලධාරින් හා ස.ජ.බ හිතවතුන් දහස් ගණනක් එක් වීමට නියමිතය. සෙනසුරාදා ගාල්ල දිස්ත්‍රික්කයේත් ඉරිදා මාතරත් අදාළ මෙහෙයුම් සඳහා විපක්ෂ නායක සජිත් එක් වීමට නියමිතව තිබිණ.

විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන ඉකුත් සතියේ මහරගම ජය මාවතේ ජනතාව හමුවුණේ මැතිවරණයෙන් පසුව පළමු වතාවටය. ඇමතිවරයා එගමට ගියේ ඔහුගේ විමධ්‍යගත අරමුදලෙන් ඉදිකරන ලද ප්‍රජා ශාලාවක් ජනතා අයිතියට පත් කිරීමටය. එනිසාම ගමේ බොහෝ දෙනෙකු ඇමතිවරයා තම ගමට එන තුරු බලා සිටියේ ළෙන්ගතුවය. එදින සවස 4.00 ට පමණ ඇමතිවරයා ගමට පැමිණ ගම්මුන් සමඟ සුහද කතා බහක නිරත විය."ඇමතිතුමා අපිත් එක්ක හැමදාම එකට ඉන්නවා.ඒ වුණාට ඡන්දයට ගියාම ඔබතුමාලා පෙරළා ගෙන අලුත් අය මතුවෙලානේ." ගමේ සිරිපාල කියද්දී ගම්මුන් කටඅයා බලා සිටියේය."ඉතින් අපිව පෙරළ ගෙන යන්න ඒ අයට ඡන්දය දුන්නේ ඔයාලාමනේ"ඇමතිවරයා සිනාසෙමින් කීවේය."දැන් අපේ ගම්වල මිනිස්සුන්ට වැඩ කරල ඡන්දය ගන්න බෑ. රූපවාහිනියෙන් හරි වෙන කොහේ හර කතා කරන්න ඕනෑ. කතාකාරයන්ට තමයි දැන් ගම්වල අය ඡන්දෙ දෙන්නෙ"ජය මාවතේ මැගි නෝනා අක්කා කීවේ හැමෝටම ඇහෙන උස් හඬින්ය.

දිනේෂ් ජිනීවා දේශනයට සූදානමින්

ඉකුත් අඟහරුවාදා දිනේෂ් ගුණවර්ධන ඇමතිවරයාට කාර්ය බහුල දිනයක් විය.එදින ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ 45 වන සැසියේ ශ්‍රී ලංකාව වෙනුවෙන් කතා කරන්නට ජිනිවා හි ශ්‍රී ලංකාව වෙනුවෙන් කතා කරන්නට එහි සිටින ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත දයානි මෙන්ඩිස් සූදානම්ව සිටියේය.ඒ කතාවට ඇතුළත් විය කරුණු ඇයට දන්වා යැවීමට දිනේෂ් කටයුතු කළේය.අමාත්‍යාංශයට පැමිණි අමාත්‍යවරයා අදාළ නිලධාරින් දෙදෙනෙකු තමන් ළඟට කැඳවා ගෙන වෙනත් කිසිවෙකුටත් එතැනට එන එක වළක්වා එක දිගට පැයකට ආසන්න කාලයක් ගත කර ජිනීවා මානව හිමිකම් සමුළුවේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් කරන කතාවට අන්තර්ගත විය යුතු කරුණු සකස් කර එවෙලේම ජිනීවා හි සිටින ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතවරිය වෙත යැවුවේය. එම කරුණු යැවූ දිනේෂ් ඇයට දුරකථනයෙන් සම්බන්ධ කර ගනිමින් " මෙවර හරියටම කියන්න අපි 20 ගෙනල්ලා අපේ රටේ මානව හිමිකම් මෙන්ම ජාතික ආරක්ෂාව ගැනත් මුල් තැන දීල කටයුතු කරනවා කියල"යැයි දිනේෂ් කීවේය.

නොවැම්බර් 02 වැනිදා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී පැවැත්වෙන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ 04 වන සංවත්සර සමුළුව පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් මහජන නියෝජිතයන් දැනුම්වත් කිරීමේ රැස්වීම් මාලාව නෙළුම් මාවත කාර්යාලයේදී පහුගිය සතියේ පැවැත්වුණේ එහි නිර්මාතෘ බැසිල් රාජපක්ෂගේ ප්‍රධානත්වයෙනි. මේ සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන ප්‍රධානීන් කැඳවූ බැසිල් ඔවුන්ට කළ යුතු දේ පැහැදිලි කළේය. මේ සියලු රැස්වීම් වලට ප්‍රසන්න රණතුංග හා රෝහිත අබේගුණවර්ධන යන ඇමතිවරුන් දෙදෙනා සහභාගි කර ගැනීම අත්‍යාවශ්‍ය බව බැසිල් සිය කාර්යය මණ්ඩලයට දැනුම් දී තිබුණේ සමුළුව හා ඊට අදාළ අනුබද්ධ සංවිධාන සමුළු සංවිධානය කිරීමේ වගකීම පවරා තිබුණේ ඔවුන්ට නිසාය.

ගම්පහ දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයන්ට අදාළ මෙම දැනුම්වත් කිරීමේ රැස්වීම සංවිධාන කර තිබුණේ පහුගිය ඉරිදාය. ඉරිදා සවස 4.00ට පැවති මේ රැස්වීමට දිස්ත්‍රික් නායක ප්‍රසන්න රණතුංග සහභාගි වුණේ නැත. මෙවැනි රැස්වීම් කිසිසේත් මග නොහරින ප්‍රසන්න එදින රැස්වීමට සහභාගි නොවන බව බැසිල්ට කලින්ම දන්වා තිබුණි.

රැස්වීමේදී බැසිල් සමුළුව ගැන පැහැදිලි කළේය.

"වයස අඩු වුණත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තමයි මේ වෙනකොට ලංකාවේ ප්‍රබලම පක්ෂය. වසර 04ක් තුළ අපි මේ රටේ ප්‍රධානතම මැතිවරණ 03කින් ජයග්‍රහණය කළා. ඒ හැමදේටම කැප වුණ හැමෝටම ස්තුතියි. මේ නිසා මේ පාර සමුළුව අපි වෙනදා වගේම උත්කර්ෂවත් ලෙස පැවැත්විය යුතුයි. ඒකට හැමෝම සහාය දෙන්න." බැසිල් කීවේය.

රැස්වීම අවසානයේදී නැගී සිටියේ මන්ත්‍රී මිලාන් ජයතිලකය.

"බැසිල් ඇමතිතුමා තමයි අපිට පක්ෂයක් නැති වෙලාවේ මේ ජයග්‍රහණ ලබන්න පක්ෂයක් හදලා දුන්නේ. ඒ වෙනුවෙන් ගම්පහ අපි හැමෝම ඔබතුමාට විශේෂ ස්තුතියක් කරනවා. ඒ වගේම අද මේ රැස්වීම මනමාලයා නැති මඟුල් ගෙදර වගේ. මැතිවරණයෙන් පස්සේ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් තියෙන පළමු රැස්වීම මේක. අපේ දිස්ත්‍රික් නායකතුමා මෙතන නැති වුණත් එතුමා තමයි ගම්පහ මේ ජයග්‍රහණයේ පිටුපස හිටියේ." මිලාන් කීවේය.

"ඔව් ඔව් ප්‍රසන්න හැමෝම එකතු කරගෙන ගම්පහින් අපිට ලොකු ජයග්‍රහණයක් අරන් දුන්නා. 2010 යුද්ධෙ දිනපු වෙලාවේ මම දිස්ත්‍රික්කයට නායකත්වය දෙන වෙලාවෙත් ගම්පහින් යන්න පුළුවන් වුණේ මන්ත්‍රීධුර 12යි. මේ පාර 13ක් ගන්න පුළුවන් වුණා. ඒක ගැනනම් මටත් පොඩි ඊර්ෂ්‍යාවක් තියෙනවා." බැසිල් කීවේ සියලු දෙනා සිනාගන්වමිනි. පහුගිය අඟහරුවාදා ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වුණේ ඇමති ප්‍රසන්නගේ ද සහභාගිත්වයෙනි. පහුගිය දිනවල පැවති පොඩි වැස්සකටත් ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාන රැසක් යටවීම ගැන මෙහිදී කථාබහක් ඇතිවිය.

ජනපතිගේ අනුරපුර ගමන ගැන සංඝරත්නයේ ප්‍රසාදය

ජනපතිගෙන් මහාධිකරණ විනිසුරුවරු 12 කට පත්වීම්

"මේකට හේතුව අනවසර ගොඩකිරීම්. ගම්පහ වතුරෙන් යටවුණාම මිනිස්සු බණින්නේ අපිට. මිනුවන්ගොඩ අඹගහවත්ත පන්සල ළඟ ඉඳන් දිගටම වෙල ගොඩ කරලා. ඒකට මිනිස්සු බණින්නේ මට. හැබැයි අපි ඒවාට සම්බන්ධ නෑ, කවුද මේවාට අවසර දුන්නේ?" ප්‍රසන්න ඇසුවේය. එහෙත් කිසිවෙකු ඊට උත්තර දුන්නේ නැත.

"අපි එපා කියද්දිත් මේවාට අවසර දීලා මිනිස්සු අපිට බණින්නේ. පාතාළයයි, සල්ලිකාරයොයි සමහර නිලධාරින්ව අල්ලගෙන මේවා කරපුවාම මිනිස්සු බණින්නේ අපිට. වහාම මේ අනවසර ගොඩ කිරීම් ඉවත් කරන්න." ප්‍රසන්න කීවේය.

සිකුරාදා සවස අනුරාධපුරයට ගිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සෙනසුරාදා පෙරවරුව අනුරාධපුරයේම ගත කළේය. පසුව ජනාධිපතිතුමා ලංකාරාමය, මිරිසවැටිය, ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරස්ථානය යන සිද්ධස්ථාන වැඳ පුදා ගත්තේය. ජනාධිපතිතුමාට සෙත් ප්‍රාර්ථනා කළ විහාරාධිකාරි හිමිපාණන් වහන්සේ ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගීමට ජනාධිපතිතුමා ගන්නා උත්සහයට ප්‍රසාදය පළ කළහ. රටට යෝග්‍ය නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට බහුතර ජනතාව ජනාධිපතිතුමාට ජනවරමක් දී ඇති බව උන්වහන්සේ සඳහන් කළහ.

ජනාධිපතිතුමා ධුරයට පත්වීමෙන් පසු මුල්වරට ඉරිදා සවස ඇතුල්කෝට්ටේ කාර්යාලයේදී "වියත්මඟ" සාමාජිකයන් හමුවිය. "වියත්මඟ" වපසරිය සහ දේශපාලන අධිකාරිය සතු භූමිකාව වෙන් කරන රේඛාව එතුමා ලුහුඬින් පැහැදිලි කළේය. ඔවුන් කළ යුත්තේ රටේ ඉදිරි ගමන සඳහා සැලසුම් සහ ප්‍රතිපත්ති සම්පාදනයයි" ජනාධිපතිතුමා පෙන්වා දුන්නේය.

ජනාධිපතිතුමා පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේදී නව මහාධිකරණ විනිසුරුවන් 12 දෙනෙකුට පත්වීම් ලිපි ප්‍රදානය කළේය.

අඟහරුවාදා ජනාධිපතිතුමා තවත් රාජ්‍ය අමාත්‍යාංශ දෙකක විෂය ක්ෂේත්‍රය පැහැදිලි කිරීම සහ අනාගත සැලසුම් විමර්ශනය සිදුවිය. උදේ වරුවේ සාකච්ඡාවට ගත්තේ ගුදම් පහසුකම්, බහාලුම් අංගණ, වරාය සැපයුම් හා බෝට්ටු සහ නැව් කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳවයි.

"සෞභාග්‍යයේ දැක්ම" ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන කුලුනක් වන්නේ ශ්‍රී ලංකාව නාවික සහ වාණිජ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමයි. "දිවයිනේ පිහිටීම ප්‍රයෝජනයට ගෙන ලොව ප්‍රධානතම නාවික කේන්ද්‍රයක් බවට අපේ රට පත්කරන්න පුළුවන්" ජනාධිපතිතුමා සාකච්ඡාව ආරම්භයේදීම ප්‍රකාශ කළේය. රටට සමීපයෙන් යාත්‍රා කරන විදේශ නෞකාවලට සේවා සැපයීමෙන් විශාල ආර්ථික ප්‍රතිලාභ අත්කර ගත හැකි බව එතුමා පෙන්වා දුන්නේය. ඒ සඳහා කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ සහ ඔලුවිල් වරාය සංවර්ධනය කළ යුතු බවත් කියා සිටියේය.

ටොන්රෙන්ටාන් ඔසුහල

බෙහෙත් ඇසුරුම්



කටු චිකිත්සාව

චීන අධිරාජ්‍යයට බෙහෙත් සැපයූ
බෙයිජිං ඖෂධ මාලිගය

● මෝතිලාල් හිස්සැල්ල

වසර 3,500 කට වඩා පැරණි චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව (Traditional Chinese Medicine) අදටත් ඉතා සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන පෙරදිග වෛද්‍ය ශාස්ත්‍රයකි. ඊට අදාළ ඇතැම් ග්‍රන්ථ ලියැවී ඇත්තේ ඉපැරණි චීන ශිෂ්ටාචාරයට අයත් කහ අධිරාජයා (Yellow Emperor ක්‍රි. පූ.2704-ක්‍රි.පූ.2597) සමයේ ය. "චින් යුරෙන්" ,"හ්වා ටූ"හා "සුන් සිමියාවෝ" ශ්‍රේෂ්ඨ චීන වෛද්‍යවරුන් ය. සම්ප්‍රදාය තුළ රැඳෙමින් නව පර්යේෂණ හා අත්හදා බැලීම් ඔස්සේ ඉදිරියට යෑම නිසා චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව වර්තමානයේ ජනතාව අතර වඩාත් ජනප්‍රිය වී ඇත.

බටහිර වෛද්‍ය විද්‍යාව බොහෝ විට යොමු වී ඇත්තේ රෝග ප්‍රතිකාර සඳහා වුවත් චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව සිරුරේ සමස්ත නිරෝගීභාවය ඉලක්ක කර ගැනීම විශේෂත්වයකි. එය පදනම් වී ඇත්තේ සිරුරේ සමබරතාවය, අනුවර්තිය සහ ශක්තිය මත ය. කටු චිකිත්සාව,කප් කිරීම හෙවත් සම මත චූෂණ ඇති කිරීම, සම පිළිස්සීම, ශාකසාර ඖෂධ සැපයීම, ආහාර චිකිත්සාව, භාවනාව සහ තායි චි යන ව්‍යායාම එහිදී යොදා ගන්නා ප්‍රතිකාර ක්‍රම කිහිපයකි.

චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ සඳහන් වන්නේ මිනිස් සිරුරේ, "යින්"(yin) සහ "යැං" (yang) යනුවෙන් අනුපූරක බලවේග දෙකක් පවතින බවයි.

මෙම බලවේග දෙක අතර ගැටුමක් නොපවතින තාක් පුද්ගලයකු නිරෝගී ය. අසනීපයක් යනු "යින්" සහ "යැං" සමතුලිතතාවය බිඳ වැටීමේ ප්‍රතිඵලයකි. චීන සාම්ප්‍රදායික වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම මඟින් උත්සාහ කෙරෙන්නේ ඒවා අතර ගතික සමතුලිතාවයක් ඇති කිරීමට ය.

චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ වැදගත් අංගයක් වන්නේ ශරීරයේ "චී" (qi) හෙවත් ජීව බලය (වචනාර්ථයෙන් "වැදගත් හුස්ම") පිළිබඳ අවබෝධයයි."චී" ශරීරයේ අදෘශ්‍යමාන නාළිකා හරහා ගලා යයි.

මෙම ශක්ති ජාලය, අවයව, පටක, නහර, ස්නායු, සෛල, පරමාණු සහ විඥානය එකිනෙකට සම්බන්ධ කරයි. ශරීරයෙහි ප්‍රධාන නාළිකා 12 ක් ඇති අතර ඒ සෑම එකක්ම සාම්ප්‍රදායික වෛද්‍ය න්‍යායේ ප්‍රධාන අවයව 12 න් එකකට සම්බන්ධ වේ.

චීන සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව ගැන පර්යේෂණ සිදු කළ විද්වතකු වූ "ලී ෂීසෙන්" (Li Shizhen) 1578 දී "Compendium of Materia Medica" නමැති ඔහුගේ සුප්‍රසිද්ධ ග්‍රන්ථය තුළ, ඖෂධ 1,892 ක් සහ නිශ්චිත රෝග සඳහා විධිමත් බෙහෙත් වට්ටෝරු 11,000 ක් ලැයිස්තුගත කර තිබිණ. ඖෂධ ලෙස යොදා ගෙන ඇත්තේ ශාක හා සත්ත්ව කොටස් සහ ඛනිජ ද්‍රව්‍යයන්ය.

Covid-19 වසංගතය පාලනය කිරීම සඳහා චීන වෛද්‍යවරු සාම්ප්‍රදායික ඖෂධ බහුල ලෙස යොදා ගත්හ. එම ඖෂධ ලබා ගත් රෝගීන් ප්‍රමාණය, තහවුරු කරන ලද සමස්ථ රෝගීන්ගෙන් සියයට 85කි. චීන සාම්ප්‍රදායික ඖෂධ පිළිබඳ ජාතික පරිපාලන ආයතනය පවසන්නේ එම ප්‍රතිකාර සාර්ථක ප්‍රතිඵල අත්කර දුන් බවයි.

ස්වසන පද්ධතියේ හා ආහාර ජීරණ පද්ධතියේ සංකූලතා මඟහරවා ගැනීම සඳහා ලබාදී ඇත්තේ "හුෂැං" (Huzhang) සහ "මාබියන්කෝ" (Mabiancao) යන චීන සාම්ප්‍රදායික ඖෂධ දෙකයි.

Covid-19 වෛරස් රෝගීන්ගේ පෙනහළු පිරිසුදු කිරීම සඳහා චීන ජාතික සෞඛ්‍ය කමිටුව සහ සාම්ප්‍රදායික ඖෂධ ජාතික පරිපාලන එක්ව "චිංෆෙයි පයිඩු" (Qingfei Paidu) නමැති සුප් වර්ගය නිර්දේශ කර තිබේ. එය ලබා ගත් රෝගීන්ගෙන් සියයට 60කගේ පමණ බරපතළ රෝග ලක්ෂණ පහව ගිය බව රෝහල් වාර්තා පෙන්වා දෙයි. චීනයේ Covid-19 වසංගතය සාර්ථකව පාලනය කිරීමට මෙම සාම්ප්‍රදායික ඖෂධ ප්‍රතිකාර බෙහෙවින් ඉවහල් වී ඇත.

> **"චීනයේ නවීන තාක්ෂණය සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව හා මුසු කිරීම "ටොංරෙන්ටාං" ඔසුසලේ ඇති විශේෂත්වයයි. ඖෂධ අලෙවියට අමතරව විශේෂඥ වෛද්‍ය සේවා, රෝග පරීක්ෂණ, චිකිත්සක සේවා,රූපලාවණ්‍ය සේවා හා සෞඛ්‍යාරක්ෂිත ආහාර පානද එහිදී ලබා ගත හැකිය."**

සාම්ප්‍රදායික චීන ඔසුසලකට යෑම කුඩා ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරයක් නැරඹීමට යෑම හා සමානය.

සාමාන්‍ය ඔසුසලක ඇති කැබිනට් ලාච්චු, වීදුරු පෙට්ටි සහ භාජන සිය ගණනක වියළන ලද ශාක හා සත්ව ද්‍රව්‍ය අතිවිශාල ප්‍රමාණයක් අඩංගු වේ.

බෙයිජිං අගනුවර පිහිටි "ටොංරෙන්ටාං" (Tongrentang) ඔසුසල, 1723 වසරේ සිට චීන අධිරාජයන්ට සහ රාජකීය පවුලේ අයට ඖෂධ සැපයීම සිදු කළ පෞරාණික ආයතනයකි. "යූ ෂියාන්යැං" (Yue Xianyang) නැමැත්තා විසින් කුඩා ඖෂධ ගබඩාවක් ලෙස එය ආරම්භ කර ඇත්තේ 1669 වසරේදීය. 1723 දී "ටොංරෙන්ටාං" ඔසුසලෙන් බෙහෙත් ලබා ගත් මුල්ම චීන අධිරාජයා "චිං රජ පෙළපතට"(Qing Dynasty) අයත් "කංසි අධිරාජයා "(Emperor Kangxi) ය.

තරුණ වියේ සිටියදී වරෙක අමුතු රෝගයකින් පෙළෙමින් සිටි කංසි අධිරාජයාගේ ශරීරය කුෂ්ඨවලින් පිරුණු අතර දරුණු ලෙස කැසීම් ඇති විය. රාජකීය වෛද්‍යවරයා දැඩි උත්සාහයක නිරත වුවද අධිරාජයා සුවපත් කිරීමට ඔහු අසමත් විය.

දැඩි මානසික පීඩනයෙන් පසු වූ කංසි අධිරාජයා දිනක් විවේක ගැනීම සඳහා මාළිගාවෙන් පිටතට ගොස් ඖෂධ ගබඩාවක ඇවිද ගියේය. එහි සිටි වෛද්‍යවරයකු ඔහුට ස්නානය කිරීමේදී වතුරට දැමීම සඳහා ඖෂධ වර්ගයක් ලබා දුන්නේය.

වෛද්‍ය නියමය අනුගමනය කළ අධිරාජයා දින තුනකට පසු සම්පූර්ණ සුවය ලැබීය. වෛද්‍යවරයාට ස්තුති කිරීම සඳහා කංසි අධිරාජයා ඔහුට ඔසුසලක් ලබා දුන් අතර එය "ටොංරෙන්ටාං" නම් විය. ඖෂධ ගබඩාවක් ලෙස පැවති "ටොංරෙන්ටාං" ඔසුසලක් බවට පත් වූයේ එලෙසය. 1723 දී "යොන්ෂෙන් අධිරාජයා" (Emperor Yongzheng) විසින් "ටොංරෙන්ටාං" රාජකීය ඔසුසලක් බවට ප්‍රකාශයට පත් කළේය. වසර 188ක කාලයක් තිස්සේ අධිරාජයන් 8දෙනෙකුට එම ඔසුසලෙන් ඖෂධ සපයා තිබේ.

දශක හතරකට ආසන්න ඉතිහාසය තුළ "ටොංරෙන්ටාං" ඔසුසල දැවැන්ත නවීකරණයකට ලක් වී ඇත.

රාජකීය පවුලට වෛද්‍ය සේවා සැපයූ මෙම ආයතනයෙන් දෙස් විදෙස් සාමාන්‍ය ජනතාවටද දැන් චීන සාම්ප්‍රදායික වෛද්‍ය සේවා ලබා ගත හැකිය. එහි ශාඛා කිහිපයක් චීනයේ විවිධ නගරවල පිහිටුවා ඇත.

චීනයේ නවීන තාක්ෂණය සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව හා මුසු කිරීම "ටොංරෙන්ටාං" ඔසුසලේ ඇති විශේෂත්වයයි. ඖෂධ අලෙවියට අමතරව විශේෂඥ වෛද්‍ය සේවා, රෝග පරීක්ෂණ, චිකිත්සක සේවා, රූපලාවණ්‍ය සේවා හා සෞඛ්‍යාරක්ෂිත ආහාර පානද එහිදී ලබා ගත හැකිය.

බෙහෙත් වට්ටෝරු සකස් කර ගැනීමෙන් අනතුරුව "ටොංරෙන්ටාං" ඔසුසලෙන් ඖෂධ නිකුත් කරනු ලබන්නේ සවයංක්‍රීය රොබෝවරයකු විසිනි.

පරිගණක කේතයක් ස්කෑන් කිරීමෙන් වට්ටෝරුව හඳුනා ගැනීමේ හැකියාව එම රොබෝවරයා සතුය.

ශරීරයේ විවිධ ආබාධ හඳුනාගැනීම සඳහා "ටොංරෙන්ටාං" ඔසුසල භාවිත කරන්නේ අධෝරක්ත තාප සංවේදක (Thermal infrared detector) උපකරණයි. මහල් තුනකින් සමන්විත "ටොංරෙන්ටාං" ඔසුසලේ ඖෂධ තැම්බීම හා උණුකිරීම සිදු කරන්නේ පැරණි තාක්ෂණය යොදා ගැනෙන නවීන උපකරණ මඟිනි.

ඖෂධ කිරීම සඳහා නූල් යොදා සකස් කළ බෙහෙත් තරාදි යොදා ගැනීම තවමත් එහිදී දැකිය හැකිය.

1954 සිට "ටොංරෙන්ටාං" ඔසුසල රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ කළමනාකරණ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වෙයි.

දාම වෙළඳසැල් 600 කට අධික ප්‍රමාණයක් සහ දේශීය විදේශීය හවුල් ව්‍යාපාර 20ක් පමණ ඊට සම්බන්ධ වී ඇත. 2006 දී "ටොංරෙන්ටාං" ඔසුසල චීනයේ ජාතික අස්පෘශ්‍ය සංස්කෘතික උරුම ලැයිස්තුවට (National Intangible Cultural Heritage) ඇතුළත් කරන ලදී.

හතර වටේ GOසිIP

● භක්ති මෙන්ඩිස් විසිනි
bakthid@gmail.com

තරගයට බියේ විහිළුවෙන් ම ඉවත් වෙලා

කොළ පාටියේ අවුලක් වෙලා තිබූ නායකත්වය තව සති දෙක තුනකින් හරි යනවා කියලයි කියන්නේ.

කොළ පාටියේ දෙවන නායකයා එසේත් නැත්නම් උප නායකයා තෝරගන්නට ඉකුත් සඳුදා පුළුවන් වුණාලු.

මෙම තෝරා ගැනීම සිදුවූ අවස්ථාවේ හරි හරි රස කතා ඇති වුණා කියලයි ආරංචිය.

මේ සටනට මුලදී සිවුදෙනකු ඉදිරිපත් වුණාලු. ඉන් එක් අයෙකු බදුල්ලේ නායකයකු වන අතර ඔහු සටනට කලින් ම ඉවත්ව ගියා කියලයි පැවසෙන්නේ.

අනෙක් තිදෙනා අතර සිටි ගාලු දිස්ත්‍රික්කයේ නායකයා දිගින් දිගටම විහිළු තහළු කරමින් තමන් ද මෙම සටනින් ඉවත් වන බව ප්‍රකාශ කරාලු.

මේ සඳහා ඡන්ද විමසන අවස්ථාවේ විහිළුවට ඉවත් වනවා කීව 'නායකයා' ඇත්තටම ඉවත් වෙලා කියලයි ආරංචිය.

පුතාණෝ සහ තිදෙනෙක් අලුත් කතාබහක

පුතාණෝගේ පාටිය සමගි කම අතහැර අසමගිකම් රැසකින් පිරිලා කියලයි ආරංචිය.

පුතාණෝ මේ බැව් දැන දැනත් නොදන්නා සේ ඉන්නවා කියලයි කියන්නේ.

රජ ගෙදරට විරුද්ධව නොයෙක් ප්‍රචාර සිදු කරන්නට පුතාණෝගේ පාටියේ අය අලුත් වැඩක් ආරම්භ කර ඇති බව පැවසෙනවා.

මේ සඳහා මුහුණු පොත සහ සමාජ මාධ්‍ය භාවිත කරනව කියලයි කියන්නේ.

දියවන්නා සාමාජිකයන් මුදලට ගන්න ආණ්ඩුව කටයුතු කරනවා කියන ප්‍රවෘත්තිය වැඩිපුර ප්‍රචාරය කරන්නට පුතාණෝගේ පාටියේ කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන දියවන්නා සාමාජිකයන් තිදෙනෙකු කටයුතු කරනවලු.

මුහුණු පොතෙන් සතුටු වන දියවන්නා සාමාජිකයා

නිල් පාටියේ සිට කොළ පාටියට පැන මේ වනවිට පුතාණෝගේ පාටියේ නායකයා වෙන්න සිහින දකින කොළඹින් දියවන්නාව නියෝජනය කරන උස මහත්මයා ලොකු අවුලක ඉන්නවා කියලයි ආරංචිය.

ජනමාධ්‍යවලට බොහොම ආස කරන මොහුට මේ දිනවල ප්‍රචාරයක් නැතැයි කියලා පුතාණෝගේ පාටියේ ප්‍රබලයන් කිහිප දෙනකු සමඟ අවුලක් ඇති කර ගෙනයි කියලයි කියන්නේ.

මේ තත්ත්වය සමනයකට පත් කරන්න ඉදිරිපත්වූ බදුල්ල පැත්තේ නායකයකු මොහුගෙන් හොඳටම අහගත්තා කියලත් ආරංචියි.

තමන්ට ප්‍රචාරය නොලැබුණාට සමාජ මාධ්‍ය සහ මුහුණු පොත හොඳටම ඇති කියලා මොහු සතුට ප්‍රකාශ කරා කියලයි කියන්නේ.

ගම්පහ සහ බදුල්ලේ ඇමැතිවරු හතර දෙනෙක් අමුතුම සටනක

මැති ඇමැතිවරුන් අතර නොයෙක් නොයෙක් හැල හැප්පිලි ටික ටික ඇතිවෙලා කියලයි ආරංචිය.

බදුල්ල පැත්තේ මැති ඇමැතිවරු දෙදෙනකු නිතර නිතර ප්‍රසිද්ධ වේදිකාවේ විවේචනය කර ගන්නවා කියලයි කියන්නේ.

එක් අයෙක් දිගටම කැබිනට් ඇමැතිවරයකුව දියවන්නාවේ සාමාජිකත්වය දරන අතර අනික් ඇමැතිවරයා නව ඇමැතිවරයකු බවයි පැවසෙන්නේ.

මේ ආකාරයටම ගම්පහ දිස්ත්‍රික්කයේ ඇමැතිවරු දෙදෙනකු අතරත් ගැටුම් ඇතිවෙලාලු.

පොහොට්ටු පාටියෙන් මහ මැතිවරණයට ඉදිරිපත්වූ මේ දෙදෙනා එක් කාලයකදී ගජ මිතුරන් කියලයි කියන්නේ.

ඒත් දැන් දැන් මේ පිළිබඳව ජනාධිපති මන්දිරයට තොරතුරු ලැබිලා කියලත් කියනවා.

හිටපු රජු බියවද්දන කොළඹ හාදයා

යහපාලන රජය පැවැති සමයේ පුලතිසිපුර නායකතුමන්ගේ පානෙන් එළිය බලාගෙන දියවන්නාවට පැන ගත්ත නිල් පාටියේ ඇත්තෙක් දැන් දැන් අලුත් පත්වීම් පස්සේ යනවලු.

නිල් පාටියෙන් දියවන්නාවට තරග කරලා අන්ත පරාජයක් ලබපු මෙයාට යහපාලන රජය විසින් ජාතික ලැයිස්තු මන්ත්‍රීකමක් මෙන්ම ඇමතිකමක් ද ලබාදුන්න කියලයි කියන්නේ.

වර්තමාන යුව රජතුමාට අවස්ථා කිහිපයකදීම විරුද්ධව කටයුතු කරා කියන මොහු මෙවර දියවන්නා සටනට පොහොට්ටු පාටියෙන් කොළඹින් සටන් කරාලු.

යුව රජුට ආලය පෙන්නලා රතු පාටිය අවුල් වෙලා

රතු පාටියේ නායකයන් සුපුරුදු පරිදි රජයට එරෙහිව නොයෙක් නොයෙක් කටකතා පතුරවනවා කියලයි කියන්නේ.

යුව රජුට නොයෙක් චෝදනා එල්ල කළ මෙම නායකයන් යුව රජුගේ බලය අඩු වෙතැයි බිය වෙලාලු.

රජතුමාට වැඩි බලයක් ලබාදෙන්න යනව කියල රතුපාටිය හරියට කලබල වෙලා කියලයි කියන්නේ.

රතු පාටියෙන් දියවන්නාවට පැන ගත්ත නායකයෙකු දිගින් දිගටම මේ කතාව කියනවා කියලා රතු පාටියේ තවත් නායකයෙකු හොඳටම දෙහි කැපුවා කියලයි ආරංචිය.



වෘත්තීය සගයන්ට නායකත්වය දෙන මොහු රතු පාටියේ සිටින කලබල කාරයකු ලෙසත් ප්‍රසිද්ධයි කියන්නේ.

රජ ගෙදරට බැට දෙන්න ගිහින් රතු පාටියේ නායකයන් බැට කනවා කියලයි ආරංචිය.

වැනසෙන හන්තානට සහන් එළියක්

● **තාරක වික්‍රමසේකර**

අපේ රටේ නීතිය අනුව තම වත්තේ ඇති කොස් ගසක් කපා ගන්නට පවා අවසර ගත යුතුය. පාරිසරික වශයෙන් මෙන්ම ස්වභාවිකත්වය ඉහළින්ම අගය කරන විදේශිකයන්ගේ පවා ඇගැයීමට ලක් වුණු තුරුලතා ගහන රටක් වන ශ්‍රී ලංකාවේ එවන් නීතියක් පනවා ඇත්තේ ශාක රැක ගැනීමට මෙන්ම එම ශාකයන්ගේ පැවැත්මෙන් මිනිසාට සිදුවන යහපැවැත්ම ගැන දන්නා නිසාය.

හන්තානේ ගස් කපා දමා ඇති අයුරු

අපේ රටේ පරිසර පද්ධතිය අනුව පැය කිහිපයක් ඇතුළත කර්කශ දැඩි වියළි කාලගුණය පවතින ශුෂ්ක කලාපයේ සිට තෙත් බිම් කලාපයටත් තවත් පැය කිහිපයකින් අධික සිසිලසක් ගෙන දෙන උඩරට කලාපයටත් ළඟා විය හැකිය. මුහුදින් වට වූ දිවයිනක් වන රටේ පරිසර පද්ධති තුළ සංවේදී පරිසර කලාප රැසක් තිබේ. රක්ෂිත වනාන්තර මෙන්ම වනෝද්‍යානද වෙන් කර ඇත්තේ ඒ නිසාය. මීට අමතරව පරිසර සංවේදී කලාපයන්හි පවත්නා පෞද්ගලික ඉඩම්ද රටේ පවත්නා විවිධ පාරිසරික පනත් හා නීති රීති අනුව එම භූමිය හා සම්බන්ධිතව සිදු කළ හැකි හා කළ නොහැකි කාර්යයන් පැහැදිලිව දක්වා තිබේ.

උදාහරණයක් ලෙස දිය ඇලි ආශ්‍රිතව ඇති පෞද්ගලික වතු සමාගම්වලට අයත් ඉඩම්වල තේ වගාවට අදාළ බිම් සකස් කිරීම් හැරෙන්නට වෙනත් මහා පරිමාණ භූමි සකස් කිරීම් කළ නොහැකිය. එමෙන්ම කන්ද උඩරට බොහෝ දෙනාගේ සිත් ගත් ස්ථානයක් වූ හන්තාන කඳුවැටිය ආශ්‍රිතවද රක්ෂිත කලාපයක් ලෙස නම් කර තිබේ. හන්තාන යනු බහුතර පෞද්ගලික ඉඩම් රැසක් ඇති සංවේදී පරිසර කලාපයකි. එහි විවිධ භූමි මට්ටම් අනුව පෞද්ගලික වශයෙන් භූමිය හා සම්බන්ධව කළ හැකි හා කළ නොහැකි කාර්යයන් දක්වා ඇත. විශේෂයෙන්ම පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් වන හෙයින් එහි යම් ඉදි කිරීමක් හෝ භූමියේ යම් හෝ වෙනසක් කරන්නේ නම් අනිවාර්යෙන්ම මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ගත යුතුමය. ඒ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුවය. මේ කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ශාඛා කාර්යාලයක් මහනුවර ස්ථාපිත කර තිබේ.

හන්තාන යනු අනෙක් පළාත්වල මෙන්ම පෞද්ගලික වැඩි භූමි ප්‍රමාණයක් ඉඩම්වලින් පිරි අක්කර 2,933ක ප්‍රදේශයකි. ඒ අනුව එහි පෞද්ගලික ඉඩම් කට්ටි කර විකිණීම පවා කළ හැකිය. යම් යම් වගාවන් ද කළ හැකිය. නිවාස හෝ වෙනයම් ඉදි කිරීම්ද කළ හැකිය. එහෙත් සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභාවකින් ගන්නා අනුමැතියට අමතරව මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන්ද අවසර ගත යුතුය. වෙනසකට ඇත්තේ එයයි.

මේ වන විට හන්තාන වැටි වශයෙන් පිරි ඇත්තේ මානා හා තණකොළවලින් වන අතර බොහෝ දෙනා සිදු කරන්නේ මේ මානා හා තණකොළ කැපීමය. එහෙත් ඒ සඳහා වුවද මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය හෝ අවසරය ලබා ගත යුතුය.

හන්තාන යනු පාරිසරික ආරක්ෂක ප්‍රදේශයකි. ඒ බව ගැසට් පත්‍රයකින්ම ප්‍රකාශ කර තිබේ. එම නිසා කුමන ආකාරයේ පෞද්ගලික භූමියක් වුවද එය අනිවාර්යෙන්ම පනතට යටත් වනු ඇත.

හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස 2010. 02. 17 වන දින අංක 1641/28 දරන අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශ කර තිබේ. එහි ඇති විශේෂ පරිසර සාධක මත එය රක්ෂිතයක් ලෙස ද නම් කෙරිණි. විශේෂයෙන්ම මුහුදු මට්ටමින් අඩි 3000ට ඉහළ හා ඉන් පහළ බාණ්ඩ 3 ක් යටතේ හන්තාන භූමිය තුළ යම් යම් කාර්යයන් සඳහා සීමා පනවා ඇත.

එසේ වුවත් 2011 වසරේ එහි ඉදි කිරීමක් අවභාවිත කරමින් එක්තරා දේශපාලඥයෙක් නාන තටාක සහිත ගොඩනැගිල්ලක් ඉදි කර ඇත. හන්තාන විනාශය වේගවත් වූයේ එතැන් සිට බව පෙනේ.

2014 වසරේදී ආරක්ෂාව සම්බන්ධව සිටි නීතිඥවරයකු වූ තවත් දේශපාලඥයකු තමන් සතු කරගෙන සිටි ඉඩමක් නැගෙනහිර පළාතේ දේශපාලන කණ්ඩායමක නායකයකුට අලෙවි කර ඇත. ඔහුද ඉඩම් අවභාවිත කර ඇති අතර පාරිසරික පනත් උල්ලංඝණය කරමින් සංවර්ධන කටයුතු සිදු කර තිබේ.

ඒ අතර ඉඩම් සම්බන්ධව සිටි තවත් දේශපාලඥයකු විසින් දකුණු පළාතේ කාරියවසම් නැමැත්තකුට තවත් භූමි කොටසක් පවරා දී තිබේ.

හන්තාන වතුයායේ සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත ලබා දීමට සූදානම් වන අක්කර 7 - 8 පමණ භූමිය කිසියම් පිරිසක් විසින් ගිනි තබා විනාශ කොට ඇත. මෙම ක්‍රියාව හේතුවෙන් අදාළ ප්‍රදේශය තුළ වූ පාරිසරික වටිනාකම විනාශයට පත් ව ඇත.

> **හන්තාන යනු පාරිසරික ආරක්ෂක ප්‍රදේශයකි. ඒ බව ගැසට් පත්‍රයකින්ම ප්‍රකාශ කර තිබේ. එම නිසා කුමන ආකාරයේ පෞද්ගලික භූමියක් වුවද එය අනිවාර්යෙන්ම පනතට යටත් වනු ඇත.**

අධි සංවේදී පරිසර පද්ධතියක් තුළ අද සිදුව ඇත්තේ එවන් කනගාටුදායක තත්ත්වයකි. හන්තානේ ජෛව විවිධත්වය පමණක් නොව ඉදිරියේදී 'හන්තාන' යන්න නමට සීමා වන ලකුණුත් ජල මූලාශ්‍ර පවා සිඳී යාමේ තත්ත්වයක ලකුණුද මේ වන විට පහළව ඇත. විවිධ පාරිසරික සංවිධාන ගණනාවක් තිබුණද හන්තාන ගැන විශේෂයෙන්ම අවධානය යොමු කරන පාරිසරික සංවිධානයක්ද ඇත. ඒ හන්තාන සුරැකීමේ සංවිධානයයි. ඔවුන් නිරතුරුවම මේ සම්බන්ධව අවධානයෙන් සිටින අතර මධ්‍යම පරිසර අධිකාරියද මේ සම්බන්ධව නිරතුරුවම දැඩි සෝදිසියෙන් හා අවධානයෙන් සිටින්නේ එහි ඇති විශේෂ වැදගත්කම දන්නා නිසාය.

හන්තානේ විනාශය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත ජයරත්න

අපි පසුගිය සතියේ සිළුමිණ ප්‍රධාන සිරස්තලයෙන් වාර්තා කෙළේ 'හන්තාන ඉඩම් වැනසුවාට ප්‍රබල මන්ත්‍රී දියණියට නඩු' යන්නයි. එය පසුදිනම එනම් 14 වැනි සඳුදාම සත්‍යයක් බවට පත්විණි.

ඒ අනුව හන්තාන ඉඩම් එළි පෙහෙළි කළ චමින්දනී බණ්ඩාර කිරිඇල්ල හේරත් යන අයට විරුද්ධව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ 14 වැනි සඳුදා නඩු පවරා ඇත. ඒ අංක 29014/20 දරන නඩු අංකය ඔස්සේය. අදාළ සැකකරුවන්ට ඔක්තෝබර් 8 වැනිදා අධිකරණයේ පෙනී සිටින ලෙස නොතීසි නිකුත් කර තිබේ.

ඇය විසින් එළි පෙහෙළි කර ඇත්තේ ස්ප්‍රිංහිල් එස්ටේට් නැමැති ඉඩමේ කොටසකි. අක්කර 19ක භූමි භාගයකින් ඇය විසින් ඉඩම් කොටසක් අනවසරයෙන් එළි කිරීම පිළිබඳව පසුගිය අගෝස්තු මස 30 වන දින මධ්‍යම පරිසර අධිකාරියට වාර්තා වී ඇති අතර එම අවස්ථාවේම ක්‍රියාත්මක වූ අධිකාරිය විසින් එම ක්‍රියාව නවත්වා තිබේ.

මීට අමතරව හන්තාන උඩවෙල එළි කිරීමක්ද සිදුව ඇති අතර ඒ පිළිබඳව පසුගිය 10 වැනිදා අධිකාරියට වාර්තා වී ඇති අතර එදිනම අධිකාරිය විසින් එම එළි පෙහෙළි කිරීම නවත්වා ඇත.

ඒ අක්කර 30ක පමණ වූ භූමි භාගයකින් කොටසකි. එය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට අයත් නොවන නිසා හිමිකරු වන කාරියවසම් නැමැත්තාට දන්වා ඇත්තේ මින් ඉදිරියට යම් සංවර්ධන කටයුත්තක් කරන්නේ නම් අධිකාරියෙන් පූර්ව අනුමැතියක් ලබා ගතයුතු බවයි.

එසේම හන්තාන හුළං පිට්ටනිය ප්‍රදේශයට ඉහළින් ඇති ප්‍රදේශ එළි කිරීම හා ගිනි තැබීමට විරුද්ධව ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබේ. අක්කර 18ක භූමි ප්‍රමාණයකින් යුක් එම ප්‍රදේශයේ අයිතිය භික්ෂූන් වහන්සේ දෙනමකට වන අතර එම ප්‍රදේශය එළි කර ගිනි තබා ඇත. ස්වාමීන් වහන්සේ දෙනමක් සිටින හෙයින් කුමන හිමිනම විසින් එය සිද කළාද යන්න මේ වන විට පරීක්ෂණ පවත්වන බව අධිකාරියේ සභාපති එස්. අමරසිංහ මහතා සිළුමිණට කීවේය. කෙසේ වෙතත් හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ යම් අකටයුත්තක් ගැන වාර්තා වී පැය කිහිපයක් ඇතුළත ඒ වෙනුවෙන් පියවර ගැනීමට අධිකාරිය කටයුතු යොදා ඇතැයිද සභාපතිවරයා පවසයි. හන්තානට අයත් භූමි රජයේ හෝ පෞද්ගලික හෝ වේවා එය විශේෂ පාරිසරික ආරක්ෂාවක් යටතේ පවතින බැවින් එම පරිසර සාධක පවත්වා ගැනීම පිණිස කටයුතු කළ යුතු බව සභාපතිවරයා අවධාරණය කෙළේය.

එමෙන්ම හන්තානට සම්බන්ව විවිධ ආයතන හන්තානට ඇතුළු වන්නන්ගෙන් මුදල් අය කරන බව හන්තාන සුරැකීමේ සංවිධානයේ ප්‍රධාන ලේකම් අමිත් සේනානායක අපට පැවසීය. එය නීති විරෝධී කටයුත්තක් බවද ඔහු පවසයි. එම මුදල් ගිණුම් ගත වන්නේ කුමන ගිණුම්වලටද යන්න විමසා බැලිය යුතු බවද ඔහු පෙන්වා දෙයි.

ඊට අමතරව විවිධ අංශ මඟින් හන්තාන පරිසරය ගැන නොතකා විවිධ කාර්යයන්හි නියැළෙන බවද එම සංවිධානය චෝදනා කර සිටී.

කෙසේ වෙතත් මේ සමබන්ධව අපට අදහස් දක්වන මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී.බී. හේමන්ත ජයසිංහ පැවසුවේ හන්තාන පරිසර කලාපය ගැන මේ වන විට වැඩි අවධානයක් යොමු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් පැවරී ඇති බලතල අනුව නීත්‍යානුකූලව කටයුතු කිරීම අනිවාර්යෙන්ම සිදු කරන බවයි. හන්තාන එළි කිරීමට කිසිදු ලෙසින් කළ නොහැකි බවත් ඒ සඳහා අනිවාර්යෙන්ම අනුමැතියක් ලබා ගත යුතු බවද ඔහු පෙන්වා දෙයි. හන්තාන යනු සංවේදී පාරිසරික ආරක්ෂක ප්‍රදේශයකි. එහි භූමිය අයත් වන්නේ රජයටද පෞද්ගලික අයවළුන්ටද යන්න මෙහිදී වැදගත් නොවන අතර අවශ්‍ය වන්නේ එහි ඇති ජල මූලාශ්‍ර ඇතුළු පාරිසරිකත්වය ආරක්ෂා කර ගැනීමය.

හන්තාන අභයන්තරයේ හුනුගල් තට්ටුවක්ද ඇති බව මේ වන විට සොයා ගෙන ඇත.

හන්තාන සුරැකීම වෙනුවෙන් මහනුවර දිසාපතිවරයා ඇතුළු පිරිසකගෙන් සමන්විත 'හන්තාන පාරිසරික ආරක්ෂක කළමනාකරණ කමිටුව' පිහිටුවා ඇත්තේද එහි වැදගත්කම නිසාමය. එම නිසා හන්තානේ පෞද්ගලික හිමිකරුවන් පවා හොඳින් දන්නා එහි පාරිසරිකත්වයට හානි නොකර ආරක්ෂා කර ගැනීම රටේ මෙන්ම තමන්ගේ පෞද්ගලිකත්වයටද හිතකර බව පෙන්වා දිය යුතුමය.

පාරට දියැවෙන සපතේරු ජීවිත

කේ.එම්. ජයසිරි

එස්. සුරේන්ද්‍ර

මොහොමඩ් රිෂාන්

ඒ. විජය

● **නිශානී හේරත් බන්නැහැක**

දෙපා තියන ලොකු කුඩා කොයි කාගෙත් පා යුග සරසන්නේ මිරිවැඩි සඟලින්. මිරිවැඩි සඟල් නැතිනම් සපත්තු සෙරෙප්පුවල මුල් ඇරඹුම දුර අතීතයට දිවයයි. සෙරෙප්පුවල උපත ගැන 1719දී ඩැනියෙල් ඩෙෆෝ ලියූ රොබින්සන් කෘසෝ පොතේ සඳහන් වෙන්නෙ මෙහෙමයි.

"රොබින්සන් කෘසෝ ගිය නැව කුණාටුවකට අහුවෙලා සුන්නද්දූවිලි වුණා. හැමෝම පරලොව ගියත්, රොබින්සන් කෘසෝ පාළු දූපතකට සේන්දු වුණා. ආහාර සඳහා මරන ලද සතුන්ගේ හම්වලින් තොප්පියක්, උඩ ඇඳුම්, යට ඇඳුම් හදාගත්තා. ලී දණ්ඩක සවි කරපු සම්කැබලි අව්වට වැස්සට සෙවණ දුන්නා. හම්වලින් පතුල් දෙක ඔතලා ලණුවලින් ගැටගහගත්තා. රොබින්සන් කෘසෝ සපත්තු ලෙස පැලඳුවේ ඒවා තමයි. ඒ කාලේ රජ්ජුරුවෝ පයට දැමූ සපත්තුවලට කීවෙ මිරිවැඩි සඟල් කියලා. "කට්ට සපත්තු" කියලා ජාතියකුත් ඒ කාලේ තිබුණා. අඟල් 1/2 ඝනකම ලෑල්ලක් කකුලේ හැඩයට කපලා ඒක ඉස්සරහට කකුලේ ඇඟලිවලට හරියන සමක් සවිකළා. ලී කොටස රතු හෝ කොළ පාටින් පාට කළා. ඇවිදිනකොට කට කට ශබ්දයක් ඇහෙන නිසා වෙන්නැති ඒවාට කට්ටා සපත්තු කීවෙ. පස්සෙ කාලෙක රබර් සෙරෙප්පු ආවා."

පාදයේ ප්‍රමාණයට අනුව සපත්තු සාදවා ගැනීමට පසුකාලීනව මිනිසුන් පුරුදු විය. මුල්ම සපත්තු ලේස්පටි ගැට ගසන ඒවා වූ අතර පසුව ලේස් නොමැති පම්ස් සත්තු ප්‍රචලිත විය. සපත්තු අඩි වැඩි හරියක් ලෙදර් වලින් සැකසූ අතර ලෙදර් අඩිවලට පුංචි ලාඩම් කැලිද තිබුණි. ඉන්පසු ජෝන් වයිට් නමින් ඉම්පෝටඩ් (පිටරටින් ගෙන්වනු ලබන) සපත්තු මුල් තැන වැජඹුණු අතර සපත්තු ජෝඩුවක මිල රුපියල් 3.90 පමණ විය. සුදු හෝ දුඹුරු කැන්වස්වලින් මසා තිබුණි. කාලයක් යද්දි රෙඩිමේඩ් සපත්තු වැසි වැස්සේය.

යුද්ධ කාලෙදි ඉංග්‍රීසි හමුදාවට තොග ගණන් බූට්ස් නිෂ්පාදනය කරන්න මුල්ම මැෂිම නිර්මාණය කළේ මාක් බෘනල් කියන සුදු ජාතිකයයි. මහා පරිමාණ සපත්තු කර්මාන්තය උපන්නේ යුද්ධෙ හින්දා වෙන්නැති. ලංකාවෙ සපත්තු මහන්න එහෙම නැත්නම් කැඩෙන සපත්තු අලුත්වැඩියා කරන්න මහරු අත්පොත් තැබුවෙ කොළඹ මරදානෙ තැබෑරුම් වත්තෙදි. ඒක සපත්තු කලාවෙ වැදුං ගේ වගෙයි. රෙපෙයාර් කරපු අප්පුහාමිලා තුන්දෙනෙක් ඒ යුගයේ මරදානෙ මරියකඩේ තැබෑරුම් වත්තෙ හිටි අතර තැබෑරුම් වත්තේ සපත්තු කර්මාන්තෙ කළ අයෙක් මේ වනවිට විශාල සපත්තු කර්මාන්තයක හිමිකරුවෙකි. තැබෑරුම් වත්ත ඇතුළේ පූජ්‍ය ලුණුගම්වෙහෙර විමලානන්ද හිමියන් හැදූ පන්සල නිසා අද එම ප්‍රදේශය පන්සල් වත්ත නමින් හැඳින්වේ.

සපත්තු අලුත්වැඩියාකරන සාස්තරේ ද්‍රවිඩ ජාතිකයින්ද ඉගෙනගත් අතර ඉන් ඉහළ ආදායම් ලබමින් ශාස්ත්‍රය ගුරු මුෂ්ටි නොමැතිව දරු මුනුපුරන්ටද ලබාදුනි.

එදා පටන් සපත්තු, සෙරෙප්පු අලුත්වැඩියා කරන අය ලංකාවෙ හැම ප්‍රදේශයකම වගේම අගනුවරත් සිටින අතර මරදාන ප්‍රදේශයේ නම් සිටින්නේ අතළොස්සකි. කොටුවේත් ඇත්තේ ටික දෙනෙකි.

ලේක්හවුස් ඉදිරිපිට නිවාස සංවර්ධන අධිකාරිය අසල පාවහන් අලුත්වැඩියා කරන කේ.එම්. ජයසිරි පීරිස් (52) මහතා අවුරුදු 35 පමණ පළපුරුද්දක් ඇත්තෙකි. ඔහු මෙසේ හඬ අවදි කළේය.

"මම 1980 ගණන්වල ලේක්හවුස් එක ළඟ තමයි හිටියේ. කොටි කලබලවලින් පස්සෙ 2000 පොලිසිය අපිව එතනින් ඉවත් කළා. ඒ කාලේ සපත්තු ජෝඩුවක් රු. 500 - 100 වෙනවා. වට රවුමක් මහන්න රු. 30 - 40 ගත්තා. දැන් රු. 200 - 500 දක්වා ගන්නවා. ඉස්සර මේ හරියෙම සපත්තු මහන අය 9 - 10 විතර හිටියා. දෙමළ අයත් හිටියා. සමහරු වයසට ගිහින්. සමහරු මැරිලා. දැන් ඉන්නෙ මම විතරයි. ඉස්සර දවසකට 15 විතර එනවා සපත්තු මහගන්න. දවසකට රු. 300 සිට 500 දක්වා හොයනවා. ඒත් දැන් එතරම් හොයනවා තියා අතේ සතේ නැති දවසුත් තියනවා. සමහරු සල්ලි නොදී මාරුවෙනවා. වහින දවස්වලටත් සල්ලි හොයාගන්න අමාරුයි. සමහර පොලිසියේ හමුදාවෙ අය ගිහින් එන්නම් පස්සේ දෙන්නම් කියලා වැඩ කරගෙන සල්ලි නොදී මාරුවෙනවා. සපත්තු මහන්න, අලවන්න නූල්, ගම්, ඉඳිකටු ගත්තාම ලාබය රු. 100 - 200 විතර වෙනවා. සතියේ දවස් 5ම උදේ 8.00 සවස 4.30 ඉන්නවා. ඉරිදා සෙනසුරාදා නිවාඩු. මම ඉගෙනගෙන තියෙන්නේ 5 වසරට විතරයි. දෙමටගොඩ පදිංචි. දුව පාසල් යනවා. පවුල මාස 6ට කලින් මැරුණා. මාත් ඉතිං මැරෙනකම්ම මේ රස්සාව තමයි කරන්නේ."

ඒ. පියල්

කොටුව කාගිල්ස්, හේමාස් ගොඩනැගිලි සමීපය අසල සපත්තු අලුත්වැඩියා කරන ඒ විජය මහතා (60) මේ ක්ෂේත්‍රයේ වසර 30 පමණ පළපුරුද්දක් ඇත්තෙකි. මේ ඔහුගේ කතාවයි.

"මම කලින් පියුං වැඩ කළේ. මගේ බිරිඳගේ මාමා කරපු රස්සාව තමයි මේක. මාමා අසනීප වෙද්දි මම අත්උදව්වට ආවා. මට ශාස්ත්‍රය ඉගැන්නුවා. දැන් මාමා නැහැ. මම කරගෙන යනවා. ඒ කාලේ සපත්තුවේ කැඩුණු කොටස මහන්න රු. 10යි. වටේම මහන්න රු. 50යි. දැන් වටේ මහන්න රු. 250යි. සපත්තුවක් අලුතින් රු. 150, 200 දැන් ගන්න පුළුවන්.

කොටුව වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල අසල එස්. ප්‍රනාන්දු කුමාර (43) සපත්තු රස්සාව ගැන කීවෙ මෙවැන්නක්.

"මම ඉගෙන ගත්තේ 3 පන්තියට විතරයි. 1970 ගණන්වල තාත්තලට සල්ලි නැහැ අපිට උගන්වන්න. ඒ නිසා සපත්තු හදන්න ඉගෙන ගත්තා. පදිංචිය වත්තල. මම රු. 80 මුලින් සපත්තු මැහුවේ. දැන් දවසකට රුපියල් 1000 විතර හොයන්න පුළුවන්. සමහර වැහිදාට ශත 5ක් නැහැ. ඉන්න තැනකුත් නැහැ. ළමයි තුන්දෙනාට උගන්වන්න ඕනේ. අනික මම හාට් පේෂන්ට් කෙනෙක්. අපේ ළමයි අපිට වඩා ඉදිරියට යනවට කැමතියි."

ඊළඟට අපි ගියේ කොටුව මල්වත්ත පාරට. අවු:39 පසුවන මොහොමඩ් රිෂාන් ලොකු කුඩයක් යටට වෙලා සපත්තුවක් මසමින් සිටියේය. මේ ඔහුගේ හඬ.

"මගේ ගම මාබෝල. අවු: 16ක් මේ රස්සාව කරනවා. 9 පන්තියට යනකම් ඉගෙන ගත්තත් මට ලියන්න කියන්න දන්නෙ නැහැ. මල්වත්ත පාරේ රස්සාවකට ඇවිත් සපත්තු, මහන්න ඉගෙනගත්තා. ලොකු ආදායමක් නැතත් දෙවියෝ අපිව බඩගින්නෙ නම් තිබ්බෙ නැහැ."

වැඩිපුරම සපත්තු අලුත්වැඩියා කරන පිරිසක් ඉන්නේ මල්වත්ත පාරේය.

අපි සපත්තු මහන හා අලුත්වැඩියාකරන ඒ.පියල්ගේ අදහස් විමසුවෙමු.

"කලින් මම කඩයක වැඩ කළේ. සපත්තු මහන්න පුරුදු වුණා. ඒක ලාභයි කඩේ වැඩට වඩා. ඒ කාලේ සපත්තුවක් මහන්න රු. 75, 100, 150 ගත්තා. දැන් රු. 250 - 300 සමහරු සපත්තු තියලා යනවා පසුව ගෙනියන්න. මොරටුව, පානදුර පුරුදු කස්ටර්මස්ලා ගෙදර ගියාට පස්සේ එන්නේ සති දෙක තුනකින්. මල්වත්ත පාරේ කෙළවර දක්වාම සපත්තු මහන අය 22 ඉන්නවා. වරායේ ගේට්ටුව දක්වාම. මෙතන සපත්තු කඩ තියන නිසා තමයි වැඩි පිරිසක් ඉන්නේ. උදේ 8 1/2 ඇවිත් සවස 7.00 යනවා. මම නම් සෙනසුරාදා, ඉරිදා, පෝයටත් එනවා.

මල්වත්ත පාරේ මැලිබන් වීදිය අසල 53 හැවිරිදි ඒ.බී. නිමල්සිරි මහතා අවු. 40 විතර සිට සපත්තු අලුත්වැඩියා කරයි.

"මම ඉගෙන ගත්තේ තාත්තගෙන්. සපත්තුව රු. 100 - 150 මැහුවා. දැන් 250 - 350 වෙනවා. කොළඹ විතරක් නෙමෙයි ඇතත් පුරුදු වූ කස්ටමස්ලා එනවා. පෝය, සෙනසුරාදා, ඉරිදත් එනවා. ළමයිට වියදම් ඉතුරුවක් නම් නෑ. කොටි කලබල කාලේ හුඟාක් අය කඩ විකුණලා ගියා."

බොරැල්ල එලියට පෙදෙස කුඩයක් ඉහළගෙන සපත්තු මහන 53 හැවිරිදි ආරුමුගම් මෙසේ කීය. "මම කලින් හිටියේ බොරැල්ලේ මැද බෝධිය බලාගනිමින්. බොරැල්ලේ අතුල හාමුදුරුවන්ට බෝධිය භාරදීලා 2005 මෙතනට ආවා. උදේ 9.00 සිට හවස 6.30 ඉන්නවා. ප්‍රේමදාස ආණ්ඩු කාලේ සපත්තුවක් වටේ මහද්දි රු. 150යි. දැන් 300යි."

කොළඹ නගරයේ මෙන්ම තදාසන්න ප්‍රදේශවලත් සපතේරුවන් ඇත්තේ අතළොස්සකි. දෙමටගොඩ නගරයේ මට හමුවූ එකම සපතේරුවා ඔහුය. ඩබ්.ඊ.ඒ. සරත් (53) සපත්තු, කුඩ, බෑග් අලුත්වැඩියා කරන වසර 15 අත්දැකීම් ඇත්තෙකි.

"මම සපත්තු මහන්න පටන්ගත්ත කාලේ තව කීපදෙනෙක් හිටියා. දැන් මම විතරයි ඉතුරු වුණේ. රු. 10 - 15 විතරයි එතකොට ගත්තේ. දැන් රු. 100 - 200. දවසකට රු. 1000 - 1500 හොයන්න පුළුවන්. බැඳලා ළමයිනුත් ඉන්නවා වුණාට දැන් මම තනියම ඉන්නේ. සෙනසුරාදා, ඉරිදත් වැඩ. සත පහ අතේ ඉතුරුත් නැහැ. මොනා කරන්නද? මේක අපේ දෛවය. බෑග්, කුඩ මහනවා. මට ගුරෙක් නැහැ. තනියම ඉගෙනගත්තේ. පින් පඩියක් නෑ. රජයෙන් ලුණු ඇටයක්, ඇල් වතුරවත් ඉල්ලලා නෑ. මගේ මහන්සියෙන් ජීවිතේ ගැටගහගන්නවා. මාර ජීවිතයක් මේක."

කොතරම් කාලයක් සපතේරු රස්සාව කළද කොතරම් මුදල් ඉපයුවද ඔවුන් තාමත් වැස්සට තෙමෙයි. අව්වට වේළෙයි. ජීවිතේ එකම තැන. කිමද මේ අරුමය?

සේයාරූ - සරත් පීරිස්

නිෂ්ක්‍රාන්තය කෘතියේ කර්තෘ සුනේත්‍රා රාජකරුණානායක සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ තරණී අනෝජා ගමගේ අතින් සම්මානය ලබාගත් අයුරු

රතු ඉර අඳින අත කෘතියේ කර්තෘ ලියනගේ අමරකීර්ති සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්. ඩී. එස්. මල්කාන්ති අතින් සම්මානය ලබාගත් අයුරු

කුමර කොබෙයි කෘතියේ කර්තෘ ශමෙල් ජයකොඩි වෙනුවට ඇගේ මව සංස්කෘතික කටයුතු දෙපාර්තමේතුවේ හිටපු අධ්‍යක්ෂිකා අනුෂා ගෝකුල ප්‍රනාන්දු අතින් සම්මානය ලබාගත් අයුරු

තී හා තා කෘතියේ කර්තෘ තිළිණ සුරත් ද මැල් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ අධ්‍යක්ෂ ජනරාල් සුනිල් දිසානායක අතින් සම්මානය ලබාගත් අයුරු

ස්වර්ණ පුස්තක සම්මානය දිනූ පේත නවකතාවේ කර්තෘ එරික් ඉලයප්පආරච්චි වෙනුවට සම්මානය ලබාගත් බුද්ධදාස ගලප්පත්ති ප්‍රකාශක සිරිසුමන ගොඩගේ උලෙළේ ආරාධිත අමුත්තා සහ විනිශ්චය මණ්ඩලය සමඟ

දහසක් අඩුපාඩු මත දහසක් මත ගැටුණාවේ; දහසක් මල් පිපුණාවේ

ස්වර්ණ පුස්තක සම්මාන උලෙළ

ස්වර්ණ පුස්තක සම්මානය

● මොහාන් ශ්‍රියන්ත ආරියවංශ

ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය විසින් පවත්වනු ලබන ස්වර්ණ පුස්තක සම්මාන උළෙල පසුගියදා අවසන් වූයේ එරික් ඉලියප්ආරච්චි විසින් ලියන්නට යෙදුණ "පේත" නවකතාව මෙවර ස්වර්ණ පුස්තකය ලෙසින් සම්මානයට පත් කරමිනි. කවරදාටත් වඩා සංවිධානයේ ගැටලු ඉස්මතු වූ මෙකී සම්මාන ප්‍රදානය නිර්දේශිත කතුවරුන් සමහරකට ඇරයුම් කිරීමට අමතක කිරීමට තරම් වගකීම් විරහිත විය. එනිසාම මෙතරම් වටිනා සම්මානය වේදිකාව මතින් පිළිගැනීමට කතුවරයා පැමිණ සිටියේ නැත. කෙසේ වුවත් මෙකී සම්මාන උලෙළ මෙසේ පැවැත්වීම ගැන අපි සොම්නස පළ කරන්නෙමු.

2007 වර්ෂයේ මුල් වරට ආරම්භ කෙරුණ හොඳම සිංහල නවකතාව සඳහා රුපියල් ලක්ෂ 5 ක (අද එය හත් ලක්ෂ පනස් දහසනි.) මුදල් ත්‍යාගයක් සහිත ස්වර්ණ පුස්තක සම්මාන උළෙල මෙවර පැවැත්වුණේ 14 වන වතාවට ය.

මුල් අවස්ථාවේ දී එනම් 2007 වර්ෂයේ දී ස්වර්ණ පුස්තක සම්මානය වෙනුවෙන් සුදුසු කෘතියක් නැතැයි යන පදනමින් අවසාන වටයට තේරුණු කෘතී පහටම එකල නියමිත මුදල වූ ලක්ෂ පහ බෙදා හැරීමෙන් කටයුතු අවසන් වුණත්, පසුව කොයි ආකාරයෙන් හෝ ස්වර්ණ පුස්තකයක් තෝරා ගැනීමේ තැනට කටයුතු යෙදුණි.

එසේම අවසන් වටයට තේරෙන සෙසු කෘති සඳහා රු. 50 000 බැගින් මුලදීත් රු. ලක්ෂය බැගින් අද දවසේත් ප්‍රදානය කරන්නට යෙදෙයි.

සම්මාන උළෙලේ හැඩ ගැසීමට අනුව වට තුනකින් කෘති තෝරා ගැනීම් සිදුවන අතර එය තෝරන්නා වූ විනිශ්චය මණ්ඩල හඳුනා ගන්නේ මෙසේ ය. ඒ අනුව මුල් වටයේ දී පාදක විනිශ්චය මණ්ඩලය ලෙසින් ද, දෙවැන්න මධ්‍ය විනිශ්චය මණ්ඩලය ලෙසින් ද, අවසානයේ දී උත්තරීතර විනිශ්චය මණ්ඩලය ලෙසින් ද ඒවා හඳුනා ගැනෙයි. මෙවර ස්වර්ණ පුස්තකය වෙනුවෙන් ඉදිරිපත් ව තිබූ මුළු කෘති සංඛ්‍යාව 108 ක් වූ අතර එයින් අවසාන වටයට තේරුණ පොත් පහ පිළිවෙලින් මෙසේ ය.

රතු ඉරි අඳින අත - ලියනගේ අමරකීර්ති
කුමර කොබෙයි - ෂමෙල් ජයකොඩි
තී සහ තා - සුරත් ද මැල්
නිෂ්ක්‍රාන්තය - සුනේත්‍රා රාජකරුණානායක
පේත -එරික් ඉලියප්ආරච්චි

අවසාන වටයේ ස්වර්ණ පුස්තකය තෝරාගැනීම වෙනුවෙන් පත් වූ විනිශ්චය මණ්ඩලය සැදුණේ ආචාර්ය සරත් අමුණුගම, මහාචාර්ය උපුල් රංජිත්, මහාචාර්ය රෝහිණි පරණවිතාන, ආචාර්ය ලතා ගුරුසිංහ, මහාචාර්ය ජයන්ත අමරසිංහ යන අයගෙනි.

2007 වර්ෂයේ දී මහාචාර්ය ඒ. වී. සුරවීර, මහාචාර්ය තිස්ස කාරියවම් හා ආචාර්ය කේ. ජයතිලක යන විද්වතුන්ගේ සහභාගීත්වයෙන් ආරම්භ වුණ ස්වර්ණ පුස්තක සම්මානය 2020 දී දිනූ එරික් ඉලියප්ආරච්චිගේ කෘතියේ අන්තර්ගතයට අනුව එය ගත හැක්කේ 1972 සිට 2010 අතර යැයි සැලකිය හැකි කාල පරාසයකට අයත් වූ වාමවාදී දේශපාලන පරම්පරා තුනක සමාජීය මෙන්ම දේශපාලනික වූ හැසිරීම් ප්‍රකාශනයක් හැටියට ය. ඒ අතරට පිළිකා රෝගයෙන් දුක් විඳිමින් සිටිමින් හඳුනා නොගත් ආකාරයකින් සයනයිඩ් කා මිය යන හිටපු එල්. ටී. ටී. ඊ ස්ත්‍රී චරිතයක් ද ඇතුළත් වෙයි. ඇයව සිය පරිශ්‍රයේ තබාගෙන රැක බලා ගන්නේ 71 වාමවාදී කැරැල්ලෙන් මතුවන වයස්ගත චරිතයයි.

එරික් වෙනුවෙන් සම්මානය ලබා ගැනීමට ඇරියුම් ලද බුද්ධදාස ගලප්පත්ති කියුයේ තමා එරික්ට කතා කළ බවත් ඇරියුම්පතක් නොලැබීම නිසා උත්සවයට නොපැමිනි බව පැවසූ බවත්ය.

ස්වර්ණ පුස්තක සම්මානලාභි පේත නවකතාවේ ලා නිරූපිත විශේෂයෙන්ම 72 සිට 89 න් පසු දක්වා දකුණේ මෙන්ම උතුරේ දේශපාලන මතවාද මෙන්ම ක්‍රියාකරකම්හි ප්‍රචණ්ඩත්වය පිළිබඳ කෘතියේ විවරණය, එක් පාර්ශ්වයක් විසින් ජාතිවාදය පිටු දැකීමේ ප්‍රබල නිර්මාණාත්මක විවරණයක් යැයි කිව හැකි තරමටම ඊට ප්‍රතිවිරුද්ධව ඒ වනාහි ජනප්‍රිය මතුපිටවාදී ජාතිවාදය නම් ඒ සුලබ ආස්ථානයම පාදක කරගනිමින් ලියුවක් යැයි විවේචනයට ලක් වීමේ ඉඩකඩක් ද පවතී.

> **සම්මාන උළෙලේ හැඩ ගැසීමට අනුව වට තුනකින් කෘති තෝරා ගැනීම් සිදුවන අතර එය තෝරන්නා වූ විනිශ්චය මණ්ඩල හඳුනා ගන්නේ මෙසේ ය. ඒ අනුව මුල් වටයේ දී පාදක විනිශ්චය මණ්ඩලය ලෙසින් ද, දෙවැන්න මධ්‍ය විනිශ්චය මණ්ඩලය ලෙසින් ද, අවසානයේ දී උත්තරීතර විනිශ්චය මණ්ඩලය ලෙසින් ද ඒවා හඳුනා ගැනෙයි.**

ඒ අනුව ලෝක දේශපාලනය තුළ වාමවාදී විප්ලවීය ජයග්‍රහණ ලද රුසියාව, වියට්නාමය, චීනය මතු නොව කියුබාව පවා සිය වාමාංශික රැඩිකල් විප්ලවයන්හි ජයග්‍රාහී පෙරමුණු නිර්මාණය කරගත්තේ තමන්ගේ රටවල ජාතිකත්වය එසේ නැත්නම් දේශප්‍රේමී බලවේගත් සමග ද ගනුදෙනු වල පසුබිමකය යන්න ප්‍රතික්ෂේප කළ හැක්කක් නොවේ.

ඒ වනාහි වඩාත් පුළුල් දේශපාලන කියවීමක් සඳහා අපව නොකැඳවන්නේ දැයි විමසා බැලීම වටී.

කෙසේ වෙතත් කතුවරයා සිය දේශපාලන චරිත හැසිරවීම වෙනුවෙන් යොදාගෙන ඇති පේත (ප්‍රේත) නම් සංකල්පීය තත්ත්වය ප්‍රබල උත්ප්‍රාසයක් යැයි සිතමි. ඒ දේශපාලන හැසිරීම්හි පැවතියා වූ අතරමැදි බව කදිමට නිරූපණය කරන්නක්ම වේ.

ඇත්ත වශයෙන්ම එය ප්‍රස්තුථය හා මැනවින් ගැළපෙන රූපකයක් හා සම වෙතැයි ද සිතමි.

ඒත් සමගම කතාවේ ආකෘතිය ද වෙනස්ම තැනක පිහිටන්නේය යන්න ද පිළිගැනීම වැරදි නොවේ.

කෘතියට අදාළව සැඟවුණ ඒ දේශපාලන හැසිරීම් පොලිසියට ලබා දෙන කට උත්තර හරහා උත්ප්‍රාසාත්මකව මතු කිරීමට ගන්නා තැත ද වෙසෙස් තත්ත්වයක් වේ.

ඉතික්බිතිව නාටකීය ආකාරයෙන්, වඩාත් නිවැරැදිව කියනවා නම් ඒ දේශපාලන ක්‍රියාකාරකම් ඉදිරියට යන ආකාරය කතුවරයාගේ උවමනාවටත් වඩා කෘතියේ වුවමනාව විසින් ඉල්ලා සිටින තත්ත්වයක් වැන්න.

ඊට අදාළව කතුවරයාම පෙන්වා දෙන අන්දමට විවාදාත්මක ආඛ්‍යානයක් විවාදාත්මක ශෛලියකින් නිරූපණය වන පේත නවකතාවේ චරිත මෙරට දේශපාලනයේ ඓතිහාසික වුත්, සම්පූර්ණ වූත් ජීවිතයකින් පසු එහි කටුක ඉතිහාසය අග්ගිස්සේ ප්‍රේත ස්වරූපයක රැඳී සිටියි.

තවද සනාතනික මෙන්ම සාම්ප්‍රදායික ධර්මතාවක් බඳු පිය පුතු ගැටුම ද මෙහි එන දේශපාලන හැසිරීම්හි ගැටුම් නිර්මාණය කරන ආකාරය මෙන්ම ඊට ලබා දෙන සමෝධානික පිළිතුරක් ලෙසින් ගත හැකි කුලසිරිගේ ප්‍රකාශයෙන් පැවසෙන තමන් සැබෑවටම පුනරුත්ථාපනය වූ අවධිය එනම් අම්මාගේ අවදියෙන් තාත්තාගේ අවදියට පැමිණීම අවසානයේ දී සම්පූර්ණයෙන්ම ස්වාධීනත්වයට පත් වීම යනු අම්මෙකුත් නැහැ තාත්තෙකත් නැහැ නම් ඒ කියවීම උගත් විචාරකයන්ගේ අවධානයට ලක්වනු ඇතැයි සිතමි. මක්නිසාද යත් මෙවැනි මතු කිරීම් (විශේෂයෙන්ම සමාජ දේශපාලන විෂයයිකව) හි පවත්නා සියුම් සංකීර්ණතා නොතකා හැරීම් මෙන්ම හරිහැටි අරුත් නොදැන විලාසිතා න්‍යායිකව අලංකාරයෙන් යුතුව අගය කිරීම් හිතකර ප්‍රතිඵල ලබා නොදෙන හෙයිනි.

පේත නවකතාව අවසන් වන්නේ විවෘත අවසානයක් නිර්මාණය කරමින් යැයි ඒ පිළිබඳව කළ විමසීමක දී කතුවරයා අප හා පැවසීය. ඒ සම්බනධයෙන් අපගේ මතය වන්නේ ද එය එසේ විය හැක්කක් බව ය.

එළඹෙන කාලය වෙනුවෙන් නිර්මාණය වූ සංවාදයත් විසංවාදයත් එහි ඇතුළත්ව ඇති බවත්, උගත් විචාරකයන් වෙතින් මතු විය යුතු බවත් ඒත් සමගම කිව යුතුව තිබේ.

මක්නිසාද යත් පසුගිය ඒ දේශපාලන කාල වකවානු තුළ නිර්මාණය වූ දේශපාලන හැසිරීම් විසින් ඉස්මතු කොට ඇති තාත්වික වුත් අතාත්වික වුත් සමාජ දේශපාලන නිගමන කෘතිය විසින් මතු කරන ආකාරය හමුවේ මා ඕ සේතුං කීවාක් මෙන් දහසක් මත ගැටෙන බිමක්, දහසක් මල් පිපෙන බිමක් දැකිය හැකි හෙයිනි.

ඡායාරූප - රංජිත් අසංක



නඩු විසඳන්න ස්කයිප් තාක්ෂණය

● නිශානී හේරත් බන්නැහැක

අධිකරණවලට බන්ධනාගාර රැඳවියන් ඉදිරිපත් කිරීමේදී පවතින ප්‍රායෝගික දුෂ්කරතා සඳහා විකල්පයක් වශයෙන්, මෙන්ම පසුගිය කොරෝනා සමයේ අධිකරණය තුළ බන්ධනාගාර රැඳවියන් සම්බන්ධ නඩු ඇසීමේ ක්‍රමවේදය පහසු වනු පිණිස, අලුතින් අත්හදා බැලුණු වීඩියෝ තාක්ෂණික ක්‍රමය මඟින් නඩු ඇසීම සිදුකෙරුණු අතර එය සාර්ථක ක්‍රමයක් ලෙස ඔප්පු වී ඇත. ශ්‍රී ලංකාව තුළ මෙම වීඩියෝ තාක්ෂණය අත්හදා බැලුවේ මුල්වරට වන අතර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ කිහිප දෙනෙකුගෙන්ම විමසා බැලුවෙමි.

අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මාධ්‍ය, පාලන, රෝහන හපුගස්තැන්න මේ සම්බන්ධයෙන් සිළුමිණට මෙසේ කීය.

"අධිකරණ කටයුතු සඳහා බන්ධනාගාරයෙන් අධිකරණවලට රැඳවියන් ගෙනයන විට, පවතින හා පැනනැගුණු දුෂ්කරතාව නිසායි, මෙම නියමු ව්‍යාපෘතිය ගොඩනැගුවේ. මෙයට අපට සම්පූර්ණ සහාය දුන්නේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයයි.

එවකට අධිකරණ ඇමති නිමල් සිරිපාල ද සිල්වාගේ ඉල්ලීමකට අනුව, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ නියමු ව්‍යාපෘතියක් ලෙසින් මෙම වැඩසටහන සැකසුවෙ. මෙහි එක් කැමරා පද්ධතියක්, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ උසාවියේත්, තවත් කැමරා පද්ධතියක් කොළඹ වැලිකඩ බන්ධනාගාරයේත් ස්ථාපිත කළා.

මෙම ටෙලිකොම් නියමු ව්‍යාපෘතිය දින 7ක් ක්‍රියාත්මක කළා. උසාවිය තුළ විනිසුරුවරු කැමති වුණා. සාමාන්‍යයෙන් මාසයක් ගතවෙනවා නඩු 100 අහන්න. නමුත් පැය 2කින් අහලා ඉවරකරන්න හැකිවුණා.

මේ ක්‍රමයට ඉදිරියේදී නඩු අහන්න පහසු වෙන්න නම්, නඩු අංක අනුව විත්තිකරුවන් පිළිවෙළකට සකසා පිළිවෙළින් ඉදිරිපත් කළ යුතුයි.

මෙහිදී මාකඳුරේ මධුෂ් වැනි පාතාල සාමාජිකයන් ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතුයි. මෙය කිසියම් සංවිධානාත්මක ක්‍රමවේදයකට අනුව සකස් වූවක්.

විදේශ රටවල නම් මෙම ක්‍රමවේදය බොහොම හොඳින් ක්‍රියාත්මකයි. මේ ගැන හොඳින් අධ්‍යයනය කරලා තමයි මෙවැනි අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට මෙවැනි ක්‍රමවේද සකසා ඇත්තේ. කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලබා දුන්නා."

මේ සම්බන්ධයෙන් ගරු අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්, නීතිඥ අනිල් ගයාන් කෞෂ්‍ය මෙසේ කීය.සාමාන්‍යයෙන් මේ ක්‍රමය ඇමෙරිකාවේ රටවල් බොහොමයක් භාවිත කරනවා. නමුත් අපි යාවත්කාලීන වෙලා නැහැ. ඒ නිසා නඩු ගොඩගැහෙනවා. මෙම ක්‍රමයේ වාසි වැඩියි. පරණ ක්‍රමය නාස්තිය වැඩියි. කාලය ගතවීම වැඩියි. නඩු ගොඩගැසීම වැඩියි. එක් නඩුවක් සඳහා උසාවිය අවට එක්රැස්වන පිරිස වැඩියි.

මේ සියල්ලක්ම අවම කරගතහැකියි. නව ක්‍රමවේදය මඟින්. නියමු ව්‍යාපෘතියේදී අප සම්බන්ධ කර ගත්තේ එක් උසාවියක් පමණක් වුවත්, අනික් උසාවිත් මේ සඳහා යොදාගන්න පුළුවන්.

වීඩියෝ තාක්ෂණය මඟින් නඩු ඇසීමේ ක්‍රමවේදයේ වාසි හා යහප්‍රවණතා සම්බන්ධයෙන් නීතිඥ සංගමයේ ලේකම් රජිව් අමරසූරිය ද මෙසේ අදහස් දැක්වීය.

"අපේ නීති පද්ධතිය නවීකරණය කළ යුතුයි. අනිත් රටවල් ගැන බලනවිට අපේ තාක්ෂණය පහළ මට්ටමක පවතින්නේ. ඒ නිසා කොවිඩ් කාලේ අපේ වීඩියෝ තාක්ෂණය භාවිත කළා.

මෙහිදී අදාළ නඩුව විභාගයට ගැනීමට පෙර Vidio conference සඳහා නඩුවේ ලේඛන ගොනුකර තියෙනවා. අදාළ නඩුව කැඳවන විට එම නඩුවේ තොරතුරු තමයි ඉදිරිපත් කෙරෙන්නේ.

විදේශ රටවල නම් මේ පරිගණක පද්ධතියෙන් පසු ක්‍රියාත්මක කරන නඩු ඇසීමේ ක්‍රමවේදය අවු: 10 - 15 කාලපරාසයකට පිරියම් යෙදුණා.

නඩු කල්යාම සම්බන්ධයෙන් හැම රජයක්ම සාකච්ඡා කරලා තියනවා. මොනහරි විසඳුමක් ඉදිරිපත් කරලා තියෙනවා. දැනට මේ ක්‍රමය මඟින් කොළඹ උසාවිය පමණක් සම්බන්ධ වුවත්, අනිකුත් පිට පළාත්වල උසාවිත් මෙයට ඒකරාශි කර ගන්නවා.

මෙමඟින් ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ කල්දැමූ නඩු යම්තාක් දුරට ඉක්මන් වෙනවා.

නඩු කල්යාම ගැන ඇමතිතුමා නිතරම සාකච්ඡා කරලා තියෙන්නේ. නඩු කල්යාමේදී ළඟ දින දෙන්න බෑ කීවාම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් ළඟ දින දෙනවා. ඇතැමුන්ගේ මරණය සිදුවුණ පසුවත් නඩු අහනවා.

ලංකාවෙ, සමහරු මැරිලත් නඩු අහන ක්‍රමය අනාදිමත් කාලයක සිට පවතින දෙයක්. නඩු අසා ඉක්මණින් නිම කිරීමේ වගකීම රජයට විතරක් ගන්න බැහැ. සියලුම පාර්ශ්වවලට වගකීමක් තියෙන්න ඕනෑ.

සමහරු නඩු පැමිණිලිකරුවන් විසින්ම කල්දමා ගන්නවා. නඩුවට විවිධ වාසි ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්. නමුත් හැම දෙනාම එකතුවී නඩුව අවසන් කර ගැනීමේ අරමුණින් නඩුවට එකතුවිය යුතුයි.

අධිකරණ වෛද්‍ය වාර්තාව ඊළඟ දිනයට ලැබිය යුතුයි. රස පරීක්ෂණ වාර්තාව කඩිනමින් ලැබිය යුතුයි.

මේ ආදී වශයෙන් නඩු කඩිනම් කිරීම තනි පක්ෂයකට නොහැකි අතර හවුල් කීපයක් එකතු විය යුතුයි.

අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කල්යාම සම්බන්ධයෙන් අමාත්‍යවරයා දිගින් දිගටම අධිකරණ විනිසුරු කොමිසම දැනුවත් කළා. නඩු කල්යාම ගැන දිගු දින ලබාදීමට නොහැකි බව කී විට කෙටි දින ලබාදී නඩු ඉක්මන් කිරීමට උපදෙස් ලබාදී ඇත.

ඇතැම් නඩුවල පාර්ශ්වයන් පවා නොමැතිව නඩු අසන අවස්ථා ඇති අතර ඇතැම් පාර්ශ්වයන් මියගොස් සිටියදී පවා නඩු අසනු ලැබේ.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිසන් සභාවේ ජනාධිපති නීතිඥ රොහාන් සහබන්දු මහතා මෙසේ කීය. "කොවිඩ් යුගයේ සිරකරුවන් එහෙට මෙහෙට කරන්න බැහැනේ. ඒ නිසා වීඩියෝ තාක්ෂණය මඟින් නඩු ඇසීමේ ක්‍රමවේදයක් සිදුකළා.

එය අප කාටත් හරිම පහසුවක් වුණා. පිටරටවල නම් එසේ තාක්ෂණය භාවිතා කරනවා. අපට වඩා දියුණුයි.

ඉන්දියාවේ කොවිඩ් කාලේ නීතිඥවරු අනුගමනය කළෙත් ඔවැනි ක්‍රමයක්. මේ ක්‍රමය නිසා මිනිස්සු එකට එක ගැටෙන්නෙ යොමු වෙන්නෙත් නෑ. සිරකරුවන් උසාවියට ගෙනියන්න අවශ්‍ය වන්නේ නැහැ.

නඩුකාරතුමා ලිස්ට් එකේ පිළිවෙළට නඩු අහන්නේ. උසාවියේ ඉඳලා විනිසුරුට පුළුවන් ඇප දෙන්න. තවදුරටත් රිමාන්ඩ් කරන්න පුළුවන්. දුරස්ථභාවය රැගෙන නඩු අහන්නත් පුළුවන්.

කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් තුමිය මේක දිගටම කරගෙන ගියා. ඒ දිනවල උසාවියට මිනිසුන් ඒම අඩු වුණා. සාර්ථක ක්‍රමයක් ලෙස ස්කයිප් තාක්ෂණය මඟින් නඩු ඇසීමේ ක්‍රමවේදය ගත හැකියි.

මේ අනුව බලවිට දිනෙන් දින ගොඩගැහෙන දහසක් නඩු දිගින් දිගටම කල් නොයවා මෙවැනි අති නවීන ක්‍රම මඟින් කඩිනමින් නඩු ඇසීම සිදු කළහොත් දිගින් දිගටම පවතින මේ තදබදය අවම කරගත හැකිය.

සිළුමිණ 'ඩේන්ටි ප්‍රහේළිකාව - 115' දිනුම් ඇදීම

සිළුමිණ 'ඩේන්ටි ප්‍රහේළිකාව - 115' දිනුම් ඇදීම ලේක්හවුස් ආයතනයේදී ඉකුත්දා සිදු කෙරිණි. දහස් ගණනක් වූ ජයග්‍රාහී ප්‍රහේළිකා අතුරින් ජයග්‍රාහකයන් තෝරා ගැනීම සිත්මිණ කර්තෘ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී මනෝලි සුබසිංහ අතින් සිදු විය. එම අවස්ථාවට සිළුමිණ ප්‍රවෘත්ති කර්තෘ තාරක වික්‍රමසේකර හා සිළුමිණ නියෝජ්‍ය ව්‍යාපාරික කර්තෘ චන්දිමා එදිරිමාන්න යන අයද එක් වූහ. ජයග්‍රාහකයන්ට තිළිණ ඉදිරි මාස දෙක ඇතුළතදී ලැබෙනු ඇත. සේයාරූව - මාලන් කරුණාරත්න

මුහුණුපොත කැළඹූ වලල්ලාවිට අවනඩුව

● **නන්දන කෝට්ටේගොඩ** - කළුතර

විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලට අමතරව මුහුණුපොත ද දැන් කදිම සන්නිවේදන මාධ්‍යයක් බවට පත්වී අවසන්ය. හොඳ මෙන්ම නරක පුවත් ද මුහුණුපොත තුළින් ලොව පුරා සැරි සරයි. පසුගියදා වලල්ලාවිට තරුණයකු මුහුණුපොතේ තැබූ සටහනක් දැන් ආන්දෝලනාත්මක පුවතක් බවට පත්වී තිබේ.

දසුන් මුහුණුපොතේ පළකළ සටහන

දසුන් විසින් මුහුණුපොතේ පළකළ දිරාපත් වෙමින් තිබෙන වාහන

දසුන් කාවින්ද මධුවන්ත නම් ඔහු තම මුහුණුපොතේ සැප්තැම්බර් 1 වැනිදා සටහනක් තබා තිබුණේ "අතිගරු ජනාධිපති තුමනි, ඔබේ අවධානය පිණිසයි "යන උද්ධෘත පාඨයද සමගිනි. ඒ යටතේ ඔහු වැඩිදුරටත් සඳහන් කර තිබුණේ "වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ අද වන විට වටිනා වාහන ප්‍රමාණයක්, යන්ත්‍රසූත්‍ර විශාල ප්‍රමාණකයක් දිරාපත් වෙමින් පවතී. කාර්මික දෝෂ නිසා පැත්තකට විසික් කරලා තිබෙන මෙම වටිනා යන්ත්‍රසූත්‍ර, යානවාහන යථා තත්ත්වයට ගෙන මහජනතාවට සේවය කිරීම සඳහා වැඩපිළිවෙළක් ආරම්භ කරන මෙන් ඉල්ලා සිටිමි" යනුවෙනි. එම සටහන සමඟ ඔහු දිරාපත් වන වාහනවල ඡායාරූප කිහිපයක්ද එක්කර තිබිණ. දසුන් මධුවන්තගේ එම ෆේස්බුක් සටහන අන්තර්ජාලය ඔස්සේ සංසරණය වීමත් සමඟ ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර රැසක්ද ලැබෙන්නට විය. බොහෝ දෙනකු දසුන් හෙළිකළ පුවත පිළිබඳ ඔහුට ප්‍රසාදය පළකරමින් කරන්නට වූහ.

එවැනි පසුබිමක් තුළ එම පුවත පිළිබඳ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලධාරීන්ගේ අවධානයද යොමු වූයේ එම පුවත සෘජුවම එම ප්‍රාදේශීය සභාව ඉලක්ක කරගත්තක් වූ නිසාය. අවසානයේ සිදු වූයේ දසුන් මධුවන්ත තරුණයාට විරුද්ධව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් මීගහතැන්න පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමයි. අනවසරයෙන් වලල්ලාවිට ප්‍රාදේශීය සභා භූමියට ඇතුළු වීම, ප්‍රාදේශීය සභා භූමියේ පැවති දේපළක් වීඩියෝගත කිරීම සහ ඡායාරූප ගැනීම, සමාජ මාධ්‍ය හරහා ඒ පිළිබඳ හෙළිදරව් කිරීම ආදී කරුණු හේතුවෙන් එම ප්‍රාදේශීය සභාවට විශාල අපකීර්තියක් සිදුවෙමින් පවතින බව එම පැමිණිල්ල තුළින් දසුන්ට චෝදනා කර තිබිණ.

දසුන් මුහුණුපොතේ තැබූ සටහන මඟින් කළ හෙළිදරව්ව නිසා ඔහුට විරුද්ධව ප්‍රාදේශීය සභාව පොලිසියට පැමිණිලි කිරීම ගැන සමාජ මාධ්‍යවලින් පමණක් නොව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය වීමත් සමඟ එය මේ වන විට ආන්දෝලනාත්මක සිදුවීමක් බවට පත්ව තිබේ. ඒ පිළිබඳ අදහස් දක්වන බොහෝ දෙනකු පවසන්නේ දසුන් සිදු කර ඇත්තේ සමාජයට අහිතකර කටයුත්තක් නොවන බවයි. ඒ සමඟම දසුන් කවුද යන්න පිළිබඳ බොහෝ දෙනාගේ අවධානය යොමු වන්නට පටන් ගත්තේය.

දසුන් කාවින්ද මධුවන්ත නොහොත් හිරිය මුල්ල විතානගේ දසුන් කාවින්ද මධුවන්ත ගේ වයස අවුරුදු 22කි. ඔහුගේ පියා හිරිය මුල්ල විතානගේ චන්ද්‍රසේන ය. මව නාකන්දලගේ දෝන කාන්ති ය. දසුන් පවුලේ එකම දරුවා ය. දසුන් කුඩා වියේදීම ඔහුගේ පියා හදිසියේ මෙලොවින් සමුගෙන ගොස් ඇති අතර මව කාන්ති වසර 16ක් තිස්සේ වලල්ලාවිට කර්මාන්තශාලාවක සේවය කරමින් දසුන් හදාවඩා ගත්තාය. වලල්ලාවිට මහා විද්‍යාලයේ ඉගෙනුම ලැබූ දසුන් 2015 වසරේදී අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියද වැඩිදුර ඉගෙනීමට ඔහුට අවකාශ සැලසී නැත.

" වැඩිදුර ඉගෙන ගන්න මට ආශාවක් තිබුණත් උගන්වන්න වියදම් කරන්න අම්මට තවදුරටත් දුකක් දෙන්න බැරි නිසාම මම පාසල් අධ්‍යාපනයට ආයුබෝවන් කිව්වා. මහින්ද රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ සහ ගෝඨාභය රාජපක්ෂ ඇතුළු රාජපක්ෂවරුන්ට මම හරිම ආදරෙයි. මගේ එකම හීනය රැකියාවක් කරලා මගේ ආදරණීය අම්මව ඇස් දෙක වගේ බලාගන්න එකයි. සුරාසූදුවෙන් තොර මම පුංචි කාලේ ඉඳලම ගලපිටගල විහාරස්ථානයේ දහම් පාසලේ දහම් අධ්‍යාපනය ලැබුවා. ප්‍රදේශයේ යෞවන සමාජයේ සංවිධායක වරයෙක් විදිහට ගමේ සුභසාධක වැඩ කටයුතුවලට දායක වෙනවා. මම යොවුන් පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් වුණා. මත්ද්‍රව්‍ය නිවාරණය, තොරතුරු තාක්ෂණ වගේ ක්ෂේත්‍රයක රැකියාවක් කරන්න මම කැමතියි. පහුගිය කාලයේ කොරියාවේ රැකියාවකට යෑමේ බලාපොරොත්තුවෙන් මම කොරියානු භාෂාවත් හැදෑරුවා. නමුත් කොරෝනා වසංගතය එක්ක ඒකත් සිහිනයක් වුණා. රටට බරක් නැති ආදර්ශවත් ජීවිතයක් ගත කරන එකයි මගේ බලාපොරොත්තුව "

දසුන් ඔහු ගැන එසේ කීවේය. මුහුණුපොතට එක් කළ සටහන ගැනද අප දසුන්ගෙන් විමසුවෙමු.

වමේ සිට දසුන් කාවින්ද මධුවන්ත, වල්ලාවිට ප්‍රාදේශීය ලේකම් ජාලිත සිසිර කුමාර, වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපති උදේනි අතුකෝරළ සහ උප සභාපති නිලන්ත ප්‍රදීප් කුමාර

"මහේන්ද්‍රා මොනාරෝ ලොරියක්, ජේ.සී.බී රථයක් ලොකු ට්‍රැක්ටර් දෙකක්, ලැන්ඩ්මාස්ටර් ට්‍රේලර් දෙකක්, ජෙනරේටර් එකක් ප්‍රාදේශීය සභාවේ දිරාපත් වෙමින් තිබෙන බව දැක්කා. ඒවායින් වැඩක් ගන්නෙ නැද්ද කියලා විමසුවා. ඒත් ඵලක් වුණේ නැහැ. ඒ නිසයි අන්තිමේදී මුහුණුපොත හරහා දූෂණ විරෝධී ජනාධිපතිතුමාගේ අවධානය සඳහා මේ සිද්ධිය යොමු කළේ. දැන් ප්‍රාදේශීය සභාව කලබල වෙලා. යෝජනාවක් සම්මත කරගෙන තියෙනවා ඒ වාහන වෙන්දේසි කරන්න කියලා. සැප්තැම්බර් 15 වැනිදා ප්‍රාදේශීය සභාවේ තිබුණු රැස්වීමකදී තමයි ඒ බව තීරණය කරලා තියෙන්නේ. සැප්තැම්බර් 8, 11 දවස් දෙකේම මාව මීගහතැන්න පොලිසියට කැඳෙව්වා. ඒ දවස් දෙකේම පැමිණිල්ල දාලා තිබුණු අය ඇවිත් හිටියෙ නැහැ. පොලිස් කොස්තාපල් සරත් රාලාහාමි මට කිව්වා ෆේස්බුක් එකෙන් ඒ පෝස්ට් එක අයින් නොකළොත් මට විරුද්ධව නඩු පවරන්න වෙනවා කියලා. ඒ වෙලාවේ මම කිව්වා නඩු පවරන්න මම අපරාධයක් කරලා නැහැ. ඒ නිසා මම බය නැහැ. මම වෙනුවෙන් විශාල පිරිසක් ඉන්නවා. මම ඒ සිද්ධිය හෙළි කළේ ගමට, රටට, ජනාධිපතිතුමාට තියෙන ආදරය නිසයි. මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්නේ මෙහෙම නාස්තිවෙන දේවල් පිළිබඳ හොයලා බලලා විසඳුම් ලබා දෙන්න කියලයි"

දසුන් විසින් මුහුණුපොතේ පළ කළ දිරාපත් වෙමින් තිබෙන වාහන

වල්ලාවිට ප්‍රාදේශීය ලේකම් ජාලිත සිසිර කුමාර මහතාගෙන්ද අප එම සිදුවීම ගැන විමසුවෙමු.

"එතැන කෝටියක් වටිනා වාහන නැහැ. අපිට අයිති නැති වාහනත් තියෙනවා. පසුගිය 15වැනිදා සභාවේ යෝජනාවක් සම්මත කරගත්තා වාහන 2ක් සභාවට පවරාගෙන වෙන්දේසි කළ යුතුයි කියා. රජයේ දේපළ ආවාටගියාට හිතු හැටියට පාවිච්චි කරන්නට බැහැ. අපි ඔය වාහන අයිති කාටද කියලා සොයනවා. අපි කියන්නේ ඔය මුහුණුපොතේ තියෙන කතාව නිසා අපේ සභාවට අපකීර්තියක් වෙනවා කියලයි. ෆේස්බුක් සටහන් සහ ඡායාරූප අයින් කරලා අපේ ප්‍රකාශ සමඟ පළ කරන්න කියලත් කිව්වා. ඔය වාහන ජනතාවගේ බදු මුදල්වලින් ගත්ත ඒවා , මානව හිමිකම් යනවා කියලත් දසුන් කිව්වා. පොලිසියට පැමිණිලි කළේ අපට වුණු අගතිය ඉවත් කර ගැනීමටයි. මේ ගැන සමථයකට පත්වන්න පුළුවන් නිවැරදි කරුණුත් සමඟ මුහුණුපොතේ යළිත් පළ කරන බවට එකඟවෙලා එය කළොත් විතරයි."

උප සභාපති නිලන්ත ප්‍රදීප් කුමාර මෙසේ සඳහන් කළේය.

"දසුන් මුලින්ම ප්‍රාදේශීය සභාවට ආවේ මා සමඟයි. ඔහු මගේ ඥාතියෙක්. දිරාපත් වන වාහන පිළිබඳ සභාවට යෝජනාවක් දාන්න කියලා ඔහු අපිට කියලා නැහැ. ඔහු සමඟ මගේ පෞද්ගලික අමනාපයක් නැහැ. "

මීගහතැන්න පොලිස් ස්ථානාධිපති ආරියරත්න මහතා පැවසුවේ ලබන 21 වැනි සඳුදා මේ සිද්ධිය පිළිබඳ විභාග වන බවයි. යම් ආයතනයක සිදු වන නාස්තියක්, දූෂණයක් පිළිබඳ හෙළිකිරීම නඩු පැවරීමට තරම් කාරණාවක් වන්නේ කෙසේදැයි බොහෝ දෙනකු ප්‍රශ්න කරති. රාජ්‍ය ආයතනයට අවසර නැතිව ඇතුළු වීමෙන්, එහි දේපළ ඡායාරූපගත කිරීමෙන් දසුන් කර ඇත්තේ වරදක් නම් එය අධිකරණය දක්වා යා හැකි වරදක්ද? මේ සියලු කරුණු කාරණා ගැන ජනතාව අවදියෙන් සිටිති.

බූස්ස බන්ධනාගාර රැඳවියන්ගේ වැරැදුණු සැලසුම

● **අමිල මලවිසූරිය**

මාන්ඩ් බන්ධනාගාරගතව සිටින මොහොමඩ් නජිබ් මොහොමඩ් ඉම්රාන් හෙවත් කංජිපාන ඉම්රාන් නමැති ප්‍රධාන පෙළේ මත් ජාවාරම්කරුගේ මෙහෙයවීමෙන් පසුගිය මැයි 31 වැනිදා මාලිගාවත්තෙ ලක්සෙත මහල් නිවාස සංකීර්ණයේ ඉහළ මහලකදී රවුෆ් නමැත්තකුට වෙඩි ප්‍රහාරයක් එල්ල කෙරිණි. ඉන් බරපතළ තුවාල ලත් රවුෆ් දින කිහිපයකට පසු කොළඹ ජාතික රෝහලේදී මියගියේය. එලෙස බන්ධනාගාරයේ සිටින අපරාධකාර රැඳවියන් පසුගිය කාලය පුරාවටම බොහෝ අපරාධ මෙන්ම මත් ජාවාරම් මෙහෙයවූයේ දූෂිත බන්ධනාගාර නිලධාරීන්ගෙන්ද ලැබුණු බොහොමයක් උපකාර මතයි. ඊට අපරාධකාරයන්ද දූෂිත බන්ධනාගාර නිලධාරීන්ට අතදිග හැර මුදල් වියදම් කර ඇති බවටද සැල වේ.

පොට්ට නවුෆර්

පොඩි ලැසී

කංජිපානි ඉම්රාන්

මේ තත්ත්වය මනා සේ වටහාගත් වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂයන් බන්ධනාගාර පද්ධතිය සෑම අතින්ම ඉහළ තත්ත්වයකට ඔසවා තැබීමට ක්ෂණික පියවර ගැනිණි. ඒ අනුව ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්නගේ ප්‍රධානත්වයෙන් නව බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයා ලෙස පත්වූ තුෂාර උපුල්දෙණිය ප්‍රමුඛ බලධාරීන් දින කිපයක් තුළදී බන්ධනාගාරවල මහත් 'වෙනසක්' ඇති කිරීමට සමත් වී ඇති බවක් පෙනේ.

එවැනි වටපිටාවක් බන්ධනාගාර පරිපාලනය පැත්තෙන් සිදුවෙද්දී රැඳවියන් ගැන ද දැඩි අවධානයක් යොමු වී තිබේ. විශේෂයෙන්ම වැලිකඩ, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරවල රැඳි සිටිමින් රිසි සේ ජංගම දුරකථන භාවිත කළ ප්‍රධාන අපරාධකාරයන් කිහිපදෙනෙක්ම මාරුකර යැවුණේ බූස්ස බන්ධනාගාරයටය. එසේ බූස්සට ගිය රැඳවියන් අතර මත් ජාවාරම් නිසාවෙන් මරණීය දණ්ඩනය ලබා සිටින සමන්ත කුමාර හෙවත් වෙලේ සුදා, භාරත ලක්ෂ්මන් ඝාතනයට මරණ දඬුවම් විඳින දෙමටගොඩ චමින්ද, මහාධිකරණ විනිසුරු සරත් අබේසිරිවිය ඝාතනයට මරණ දඬුවම් විඳින පොට්ට නවුෆර් වැන්නන්ද රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටි ඩුබාහියිදී මාකඳුරේ මධුෂ්ගේ සාදයට එක්ව සිටියදී අත්අඩංගුවට පත් මෑත කාලයේ ප්‍රබලම මත් ජාවාරම්කාරයකු ලෙස කරළියට පැමිණි කංජිපාන ඉම්රාන්, කොස්ගොඩ තාරක, පොඩි ලැසි, මාකිලංගමුවේ සංජීව, ආමි සම්පත්, කැලුම් ඉන්දික හෙවත් පිටිගල කැවුමා, ගිය වසරේදී ඉන්දියාවේදී අත්අඩංගුවට පත්ව මෙරටට පිටුවහල් කළ බ්ලූමැන්ඩල් සංඛ, ඌරු ජුවා වැන්නන් විය.

1999 වසරේදී ඇරැඹි බූස්ස බන්ධනාගාරය ඉකුත් කාලයේ ප්‍රසිද්ධව තිබුණේ අත්අඩංගුවට පත්ව බන්ධනාගාරගතව පුනරුත්ථාපනය වන හිටපු එල්ටීටීඊ රැඳවියන් රඳවා සිටි බන්ධනාගාරයක් ලෙසයි.

අධි ආරක්ෂිත බන්ධනාගාරයක් සේ සැලැකෙන විශේෂිත සිර කුටි 46කින් සමන්විත බූස්ස බන්ධනාගාරයේ රැඳවියන්ට කිසිසේත්ම ජංගම දුරකථන භාවිත කළ නොහැකි වන ලෙස දුරකථන සංඥා අවහිර කිරීමට ජැමර් පද්ධතියක්ද සක්‍රිය කෙරිණි.

බූස්ස සහ අඟුණකොළපැලැස්ස බන්ධනාගාරවලට පමණක් යොදවා සිටි පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරිහු පසුගියදා කොළඹ, බන්ධනාගාර පද්ධතියටද යෙදවීමට රජය තීන්දු කළහ.

මෙවැනි වටපිටාවක් බන්ධනාගාර පද්ධතිය තුළ සිදුවෙද්දී විශේෂ ගණයේ කුටි 46ක් පමණ තිබෙන බූස්ස බන්ධනාගාරය වෙත කොළඹ, වැලිකඩ, අඟුණකොළපැලැස්ස, දුම්බර ආදි බන්ධනාගාරවල සිටිමින් පිටත සමාජය සමඟ එක්ව මත් ජාවාරම්, කොල්ලකෑම්, මිනීමැරුම් මෙහෙයවූ සියලුම රැඳවියන් බූස්සට ගාල් කළේ මීට මාස කිහිපයකට පරිදියි.

ඔවුනට පසුගිය කොරෝනා සමයේදී නිවෙස්හි සමීපතම ඥාතින් සමඟ දුරකථන ඔස්සෙ විනාඩි තිහක පමණ කාලයක් කතාබහ කිරීමට ඉඩ හසර විවර කර දෙනු ලැබීය.

බන්ධනාගාර බලධාරින් විසින් ඉරිදා හෝ බදාදා දිනයක එම අවස්ථාව ලබා දුන්නෙ කොරෝනා වසංගතය නිසාවෙන් ඥාතින්ට රැඳවියන් බැලීමට බන්ධනාගාරයට පැමිණීමට අවස්ථාව නොලැබුණු හෙයිනි.

කොරෝනා තත්ත්වය පහව යාමත් සමඟ රැඳවියන්ට ඥාතින් සමඟ දුරකථන ඔස්සෙ කතාබහ නතර කෙරුණේ ඥාතින්ද බන්ධනාගාරයට පැමිණ රැඳවියන් දැකබලා ගැනීමට අවස්ථාව ලබාදීම නිසාවෙනි.

එහෙත් රැඳවියන් දිගින් දිගටම එලෙස දුරකථන ඔස්සෙ ඥාතින් හා කතාබහ කිරීමට ඉල්ලීම් කළහ. ඊට යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු හෙයින් එම කරුණ ඇතුළු රැඳවියන් හමුවීමට පැමිණෙන නීතිඥවරුන් පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් පරීක්ෂා කිරීම, ආපණ ශාලාවෙන් ආහාර ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට මසකට ලබාදෙන රුපියල් අට දහසේ මුදල ඉහළ නැංවීම, පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් බන්ධනාගාරය තුළ සිදුකරන පරීක්ෂණ නතර කරන ලෙසද තම දුවාදරුවන් හමුවීමට ලබාදෙන විනාඩි තිහක කාලය පැයක් දක්වා ඉහළ නංවන ලෙස ඉල්ලා විශේෂ කුටි 45ක් තුළ සිටි රැඳවියන්ගෙන් පිරිසක් පසුගිය 10 වැනිදා පෙරවරුවේ සිට ආහාර වර්ජනය කරමින් උපවාසයක් ආරම්භ කෙරිණි.

කංජිපාන ඉම්රාන් මෙහෙයවා ඇති එම ආහාර වර්ජන උපවාසයට පොඩි ලැසි, වෙලේ සුදා, දෙමටගොඩ චමින්ද වැනි 36 දෙනෙක් මුලින් එකතු විණි. ඊට පොට්ට නවුෆර්, ආමි සම්පත්, පිටිගල කැවුමා ආදි 9 දෙනෙක් එක්ව සිටියෙ නැත.

දින හතරක කාලයක් වර්ජනය සිදු වූවත් දිනෙන් දින වර්ජනය සිදුකළ පිරිස ක්‍රමයෙන් වර්ජනයෙන් ඉවත් විණි. ඒ අතර වර්ජනයේ ප්‍රධානියා වූ කංජිපාන ඉම්රාන් පසුගිය 11 වැනිදා පෙරවරුවේ අසනීප තත්ත්වයක්යැයි පවසා කරාපිටිය රෝහලට ඇතුළත් වීමට උත්සාහ ගත්තත්, බන්ධනාගාර බලධාරින් ඉම්රාන් ගාල්ල නාවික හමුදා රෝහලට ඇතුළත්කොට ඊසීජී ඇතුළු පරීක්ෂණ ද සිදුකරමින් ඔහුට අසනීප තත්ත්වයක් නොමැති බව තහවුරු කරගැනිණි.

එලෙස අසනීප තත්ත්වයක් පා කරාපිටිය රෝහලට ඇතුළුවීමට කංජිපාන තැත් කළේ කිසියම් සැලැසුමක් සඳහා වන්නට ඇති බවට සැකයක් පහළ වූ බව බන්ධනාගාර ප්‍රධානියෙක් කීවේය.

එම නිසා කංජිපාන ගාල්ල නාවික හමුදා රෝහලේ සිට නැවතත් අධි ආරක්ෂිත බන්ධනාගාරයක් වන බූස්ස බන්ධනාගාරයට ඇතුළු කිරීමේදී ගුද මාර්ගයේ හෝ කිසිවක් සඟවාගෙන ආවාද යන්න පරීක්ෂාවට ඔහුට ඉඳිආප්ප ආහාරයට දී ශරීර කෘත්‍යයද කරවා විශේෂ සිර කුටිවලට ඇතුළු කිරීමට බලධාරිහු පියවර ගත්හ.

අනතුරුව ඔහු නැවතත් වර්ජනයට එක්වූවත් බන්ධනාගාර බලධාරින් කිසිදු ඉල්ලීමකට කන් නොදුන්නේය. එසේ හෙයින් 36 දෙනෙක් පමණ එක්ව සිදුකළ වර්ජනය අවසන් වූයේ පසුගිය 14 වැනිදා දහවල් සියලු දෙනා ආහාර ගත් නිසාවෙනි.

මේ පිළිබඳව බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් තුෂාර උපුල්දෙණිය පවසන්නෙ ඔවුනගේ වර්ජනයට එරෙහිව දැඩිව විනය නීති ක්‍රියාමාර්ග ගන්නා බවත්, දරුවන් මුණගැස්වීමට කළ ඉල්ලීම පමණක් සලකා බලන බවයි.

මෙකී වර්ජනය පිළිබඳව ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න ද බන්ධනාගාර රැඳවියන්ට අවැසි ඉඩ පහසුකම් වැඩි කිරීමට බෝගම්බර බන්ධනාගාරයේ කොටසක් නැවතත් ලබා ගැනීම පිළිබඳව සොයා බැලීමට ගිය මොහොතේදී බූස්ස රැඳවියන්ගේ වර්ජනය ගැන කීවේ මෙවැන්නකි.

"ඒ රැඳවියන්ගේ ඉල්ලීම් අසාධාරණ ඉල්ලීම්... ආරක්ෂක ලේකම් ලෙස මාව ගියත් අද වන විට බූස්ස බන්ධනාගාරයෙ සිටින පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරින්ගේ පරීක්ෂාවට ලක් වෙනවා. ඒ නිසා අපරාධකාරයන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන් පරීක්ෂා නොකර සිටීමට කිසිදු හේතුවක් නෑ. උපවාසය දින හතරයි කළේ. බඩගින්න උත්සන්න වූ සැණින් නැගිට ආහාර ගත්තා. අපේ රටේ උපවාසයක් සිදුකොට මියගිය එකම කෙනා තිලීපන් පමණයි. (ප්‍රභාකරන්ගේ සමීපතම මිත්‍රයෙක් වූ තිලීපන් 1987 වසරේදී යාපනය නල්ලූර් කෝවිල අසල ආරම්භ කළ උපවාසයෙන් මරණයට පත් විය.)

සංවිධානාත්මක අපරාධකාරයන් හෙවත් පාතාල අපරාධකරුවන් ඇතුළු ප්‍රබල ගණයේ මත් ජාවාරම්කරුවන් වන කංජිපාන, වෙලේ සුදා වැන්නන් එක්ව බන්ධනාගාරය තුළ වර්ජන සිදුකළත් ඔවුහු නයි-මුගටි මෙන් තරහකාරයන්ය.

මාකඳුරේ මධුෂ් සමඟ කංජිපාන ඇතුළු කණ්ඩායම ඩුබායි පොලිසියට කොටුකර දීමේ සැලැස්මේ ප්‍රධානියා ද වන්නෙ වෙලේ සුදාය. ඒ, මධුෂ් විසින් වෙලේ සුදාගේ මත්ද්‍රව්‍ය කලාපය වූ දෙහිවල සිට ගාල්ල හම්බන්තොට දක්වා ප්‍රදේශයේ හෙරොයින් ජාවාරම අත්පත්කර ගැනීමට තැත් කිරීමත් සමඟ වූ බද්ධ වෛරය නිසායි. ඒ, හේතුවෙන් මධුෂ් සැලැසුම්කර ඇත්තෙ වෙලේ සුදා ද කළුතර, එතනමඩලදී බන්ධනාගාර බස්රථයට පහර දී සමයං ඝාතනය කළා සේ වෙලේ සුදා ද ඝාතනය කිරීමටයි. එහෙත් මධුෂ්ට පෙර වෙලේ සුදා ක්‍රියාත්මක විණි.

කෙසේ හෝ වත්මන් රජය සහ බන්ධනාගාර පාලනාධිකාරිය සිරකරුවන් ද මනුෂ්‍යයන් බව පසක් කරමින් ඔවුනට අවැසි පහසුකම් සැලැසීමට උත්සාහ ගනිද්දී ප්‍රබල ගණයේ අපරාධකාර රැඳවියන් මාන බලන්නෙ කෙසේ හෝ බන්ධනාගාර පාලකයන් බිය ගන්වා දූෂිත බන්ධනාගාර නිලධාරින් හා එක්ව දුරකථන ඔස්සේ රට තුළ අපරාධ සහ මත් ජාවාරම් ප්‍රචලිත කිරීමටයි.

ඊට පොඩි ලැසි, තාරක, කැවුමා වැන්නන් මීට පෙරද උත්සාහ කළේ බන්ධනාගාර නිලධාරීන්ට මරණ තර්ජන ද එල්ල කරමිනි. එම නිසා ඒ කිසිවකට යටත් නොවී වත්මන් බන්ධනාගාර පාලනාධිකාරිය ගෙන යන සාර්ථක වැඩපිළිවෙළ පිළිබඳව අපගේ පැසසුම් ද එක් කරන්නෙමු.

පුරන් කුඹුරු අක්කර දහසක් පුබුදන්නට වෙහෙසෙන

තිනිපිටිගම තරුණයෝ

වැව පිටියක් වීම

ශාක ඉවත් කිරීම

● ඊ.සී.ප්‍රනාන්දු
මුන්නේශ්වරම සමූහ

වත්මන් තරුණ පරපුර පිළිබඳ දැන් අසන්නට ලැබෙන්නේ එතරම් සුබදායක පුවත් නොවේ. එවැනි තත්ත්වයක් තුළ තරුණ පරපුරට ම ආදර්ශයක් වෙමින් රට වෙනුවෙන් විශාල සේවයක් ඉටු කරන තරුණ පිරිසක් පසුගියදා අපට හමු විය.

මාදම්පේ තිනිපිටිගම පදිංචි එම තරුණ පිරිස කුඹුරු අක්කර දහසකට ආසන්න කුඹුරු යායක් දෙකන්නයේම වගා කිරීමට අවශ්‍ය ජලය රඳවා තබා ගත හැකි මාදම්පේ තිනිපිටි වැවේ වසර ගණනාවක පටන් රැඳී ඇති සැල්විනියා ඇතුළු ජලජ ශාඛ මුළුමණින්ම ඉවත් කිරීමට පියවර ගෙන තිබේ.

ප්‍රදේශයේ ගොවි ජනතාව මෙන්ම විවිධ සංවිධාන ද විවිධ අවස්ථාවලදී අදාළ බලධාරීන්ගෙන් මෙම වැව ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා සිටිය ද ඔවුන්ගේ අවධානය මෙතෙක් ඒ සඳහා යොමු නොවූ බැවින් වැව සුද්ධ පවිත්‍ර කිරීමට පියවර ගත් බව එම තරුණ පිරිස පැවසූහ. මීට වසර ගණනාවකට පෙර වයඹ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය මෙම වැවේ සැල්විනියා ජපන් ජබර ඇතුළු ජලජ ශාක ඉවත් කිරීමට මුදලක් වෙන් කර එම කටයුතු ආරම්භ කළත් පසුව එම කටයුතු නතර වූ බවත් එයින් ඇතැමුන් ඔවුන්ගේ සාක්කු පුරවා ගත් බවත් ගම්වාසීහු පැවසූහ. එවැනි තත්ත්වයක් තුළ තරුණ පිරිස ඉටු කළ මෙම ප්‍රජා සත්කාරය ගම්වාසීන්ට මහමෙරක් තරම් අගනේ ය.

වැව පවිත්‍ර කිරීමේ කටයුත්තට පුරෝගාමී නායකත්වය දුන් මාදම්පේ තිනිපිටිගම පදිංචි ඩබ්ලිව්.එම්.ධනුෂ්ක සිල්වා තරුණයා ඒ ගැන මෙසේ පැවසුවේය.

"මාදම්පේ මහ වෙල් යායේ කුඹුරුවලින් සමහරුන්ට අක්කර පහ, දහය අයිතියි. ඒවා දෙකන්නය වගා කර ගන්න බැරිව පුරන් වුණේ අවශ්‍ය ජලය නොමැතිකමින්. ඊට හේතු වුණේ එම යායට ජලය ලබා ගන්නා තිනිපිටි වැව විවිධ ජලජ ශාකවලින් වැසී තිබීමෙන් වැව ගොඩවී තිබීම නිසයි. අපි වැව සුද්ධ පවිත්‍ර කිරීමට පියවර ගත් අවස්ථාවේදී සමහරු අපව අකර්මන්‍ය කිරීමට විවිධ කතා පැවසුවා. නමුත් අපි පසුබට වුණේ නැහැ. බුද්ධිමත් අය අප අගය කරමින් අපට මුදලින් ආධාර කළා. දිරිමත් කළා. එයින් ලැබුණු ශක්තිය සහ ධෛර්යය නිසා තමයි අපි මෙම කාර්යය සිදු කළේ. ගමේ ගොවි සංවිධානය අපට ලොකු ශක්තියක්. ඔවුන්ගේ සහයෝගය සහ අධීක්ෂණය මතයි අපි වැවේ ජලජ ශාඛ ඉවත් කිරීමේ කටයුතු කරගෙන යන්නේ. පුත්තලම කෘෂිකර්ම නිලධාරීන්ද අපට ලොකු ශක්තියක් වුණා. ඔවුන්වත් අප අගය කළ යුතුයි. අපේ අරමුණ වැවෙන් ඉවත් කරන ජලජ ශාක පොල් වතුවලට පෝර වශයෙන් යෙදීමට විකිණීමයි. එයින් ලැබෙන මුදල්වලින් තිනිපිටි වැවේ අමතර ජල රැඳවුම් වැවත් සුද්ධ පවිත්‍ර කරන්න බලපොරොත්තු වෙනවා. තරුණ තරුණියන් නිකම්ම කාලය ගතකරනවාට වඩා මෙවැනි දේක යෙදීමෙන් රටට සේවයක් සැලසෙනවා. දේශපාලඥයන් ගමට හැමදේම කරලා දෙයි කියලා බලාපොරොත්තු වීම තරුණකමට ගැළපෙන්නෙ නැහැ."

ඉවත් කළ ජලජ ශාඛ

ධනුෂ්ක සිල්වා

ඔහුගේ වදන් තුළ තරුණ පරපුරට ආදර්ශයක් ගැබ් වී ඇත. තිනිපිටිගම තරුණයන්ගේ ඒ උද්යෝගය සහ කැපවීම ගම්වැසියන්ද ප්‍රබෝධයට පත් කර තිබේ. තිනිපිටිගම තරුණයන් රටට ම ආදර්ශයක් බව ඔවුන්ගේ අදහසයි. පුත්තලම දිස්ත්‍රික් වාරි මාර්ග ඉංජිනේරු ඩී.සී.හෙට්ටිආරච්චි ඒ ගැන මෙසේ කීවේය.

"තිනිපිටි වැව ආශ්‍රිත ගොවි සංවිධානය කාලයක සිට මෙම වැවේ ඇති ජලජ ශාක ඉවත් කරන මෙන් ඉල්ලීම් ගණනාවක් ම ඉදිරිපත් කළා. නමුත් අපට තිබූ ප්‍රශ්ණය ඒ ඉල්ලීම ඉටු කිරීමට අවශ්‍ය මුදල් සොයා ගැනීමේ දුෂ්කරතාවයි. ඒ නිසා එම ඉල්ලීම් යටපත් වුණා. මුදල් ප්‍රශ්ණය නිසා අපි අසීරුතාවකට මුහුණ දුන්නා. මේ කාලයේ වැඩි දෙනෙකු වැව් පවිත්‍ර කරනවා කියලා කරන්නේ වැව් හාරලා වැලි කැණීම් කරණ එකයි. එවැනි තත්ත්වයක් තුළ තමයි තිනිපිටිගම පදිංචි ධනුෂ්ක සිල්වා කියන තරුණයා අපෙන් අවසර ඉල්ලුවේ මෙම වැවේ ජලජ ශාඛ ඉවත් කිරීමට. ඔහු කියා සිටියේ ගමෙන් මුදල් එකතු කරලා වැව පවිත්‍ර කරන බවයි. එම ඉල්ලීම සාධාරණ බව වැටහීම නිසා අප ඊට අවසර දුන්නා. හැබැයි වැවේ කැණීම් කරන්න අප තහනම් කළා. මේ බව මාදම්පේ පොලිසියටද දැනුම් දීලා අතින් ජලජ ශාක ඉවත් කරන්න ඉඩ දුන්නා. පසුව අතින් මෙම කාර්ය කරන්න බැරි නිසා යන්ත්‍රයක් දාලා එම කාර්යය සිදු කරන්න අවසර දුන්නා. අපි මෙම තරුණ පිරිසගේ ධෛර්යය ගැන ආඩම්බර විය යුතුයි.මේ වන විට ඔවුන් ගමේ ජනතාවගේ ආධාර එකතු කරලා ජලජ ශාක ඉවත් කරනවා. අපේ නිලධාරීන් විටින් විට ගොස් පරීක්ෂා කර බලනවා. එම කාර්යය අපි කවුරුත් අගය කරන ආකාරයට සිදු වෙමින් තිබෙනවා. මේ තරුණයන්ගේ උත්සාහය මුළු රටේම වත්මන් තරුණ පිරිසට ආදර්ශවත් එකක් වනවාට සැක නැහැ"

සෑම දෙයක්ම රජයෙන් කෙරෙන තෙක් බලා සිටින ජනතාවක් වාසය කරන රටක තිනිපිටිගම තරුණ කැල මෙම වැව පවිත්‍ර කිරීමේ වැඩසටහන තුළින් මහඟු ආදර්ශයක් ලබා දී ඇත. ඔවුන්ගේ මෙම ප්‍රයත්නය රටේ සියලු තරුණයන්ට ආදර්ශයක් වනු දැකීම අපගේ ද පැතුමයි.

දේශපාලඥයන් ගමට හැමදේම කරලා දෙයි කියලා බලාපොරොත්තු වීම තරුණකමට ගැළපෙන්නෙ නැහැ

මේ තරුණයන්ගේ උත්සාහය මුළු රටේම වත්මන් තරුණ පිරිසට ආදර්ශයක්

පුත්තලම දිස්ත්‍රික් වාරි මාර්ග ඉංජිනේරු ඩී. සී. හෙට්ටිආරච්චි

ජීවිත ඉනිම අවසන් කළ ටෝනි ඕපාත

● සුභාෂිණී ජයරත්න

1975 වසරේ එංගලන්තයේ පැවැති පළමුවැනි ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය නියෝජනය කිරීමට වාසනාව ලැබූ ඇන්ටනී රැල්ෆ් මැරිනන් ඕපාත , හිටපු ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයා පසුගියදා සිය දිවි සැරියෙන් සදහටම සමුගත්තේ ක්‍රීඩා ලෝලීන්ගේ නෙතට කඳුළක් එක් කරමිනි. 1947 අගෝස්තු 5 වැනි දිනකට කොළඹදී මෙලොව එළිය දුටු ටෝනි ඕපාත දකුණතින් මඳ වේග පන්දු යවන්නකු වශයෙන් ක්‍රිකට් ලෝලීන් අතර ජනප්‍රිය වූ අතර මෙරට වෙනුවෙන් එක්දින ජාත්‍යන්තර වරම් හිමිකරගත් 6 වැනි ක්‍රීඩකයා වශයෙන් ක්‍රිකට් ඉතිහාස කතාවට එක්වන්නේය.

1975 ලෝක කුසලාන ක්‍රිකට් කණ්ඩායම

1975 ලෝක කුසලාන ක්‍රිකට් කණ්ඩායම

ටෝනිගේ දිවි ගමනේ අමරණීය මතක සටහන් අතරට එක්වන්නේ 1975 වසරේ එංගලන්තයේ පැවැති පළමුවැනි ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියයි. එක්දින ලෝක කුසලාන තරඟාවලියක් පළමුවෙන්ම පැවැති ඒ වසරේ ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර එක්දින ක්‍රිකට් පිටියේ පළමු පන්දුව යැවීමට වරම් දිනා ගත්තේ ටෝනි ය. එම තරඟාවලියේ පකිස්තානය සමග පැවැති තරඟයේදි පන්දුවාර 12 ක් යවා ලකුණු 67 කට කඩුලු 2 ක් දවා ගනිමින් ටෝනි ක්‍රිකට් පිටියේදි එදා දැක්වූ හපන්කම් මෙරට ක්‍රිකට් ලෝලීන්ගේ නොමැකෙන සමරු සටහන්ය.

කොළඹ ශාන්ත පීතර විදුහලින් අධ්‍යාපනයට පිවිසි ටෝනි පාසල් අධ්‍යාපනයට අමතරව ක්‍රිකට් පිටියට පිවිසියේද කොළඹ ශාන්ත පීතර විදුහලෙන් ලැබූ පන්නරයෙනි. 1970 වසර වලදි මෙරට දක්ෂතම පන්දු යවන්නා වූ ටෝනිගේ ක්‍රිකට් ජීවිතයේ තවත් අමරණීය සන්ධිස්ථානයක් වූයේ 1982 වසරේදි දකුණු අප්‍රිකා සංචාරයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීමට ඔහුට හැකි වීමය. 1960- 1970 දශක අග භාගයේදි ශාන්ත පීතර විදුහල නියෝජනය කරමින් ඇන්තනි රැල්ෆ් තරඟයේදි සිය ක්‍රිකට් දිවියේ නොමැකෙන මතක සටහන් සනිටුහන් කරන්නට ටෝනිට හැකි විය. 1974 දී පී සාරා ක්‍රීඩාංගනයේදි පැවැති නිල නොවන ටෙස්ට් තරඟාවලියේදි ක්ලයිව් ලොයිඩ් ගේ නායකත්වයෙන් යුත් බටහිර ඉන්දීය කොදෙව් පිලට එරෙහිව ඔහු දැක්වූ හපන්කම් එදා ක්‍රිකට් ලෝලීන්ගේ නොමඳ පැසුමට හේතුවිය.

ටෝනිගේ පසුගියදා සිය දිවියෙන් සමුගත්තේ වයස අවුරුදු 73 දිය. ක්‍රිකට් ලෝලීන් පමණක් නොව ක්‍රිකට් විචාරකයන්ද අද ඔහුගේ වියෝවින් දුක් වන්නේය. ටෙස්ට් ක්‍රිකට් නායක මයිකල් තිසේරාද ටෝනිගේ වියෝවින් කම්පා වන එක් අයෙකි. " මගේ වෘත්තිය ජීවිතයේ අවසාන කාලය දක්වාම අපි ක්‍රිකට් කළා. අපි බටහිර ඉන්දීය කොදෙව්වන්ට එරෙහිව කොළඹදීත්, 1975 දී එංගලන්තයේදී පැවති ආරම්භක ලෝක කුසලාන තරගාවලියටත් ක්‍රීඩා කළා. වේග පන්දු යවන්නන් අතර ඔහු ඉදිරියෙන් සිටියා. ඔහු හැම විටම ආදර්ශයක් ගෙන දුන්නා..."මයිකල් තිසේරා පවසන්නේය.

ලෝක කුසලාන තරඟයකදී ශ්‍රී ලංකාවේ ප්‍රථම ජයග්‍රහණය සඳහා ටෝනි ඔපාත ද ඩී. එස්. ද සිල්වා සමග තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. එය 1979 දී ඔල්ඩ් ට්‍රැෆර්ඩහිදී ඉන්දියාවට එරෙහිව ය. එහිදි ටෝනි ඔපාතගේ විශිෂ්ට පන්දු යැවීම හමුවේ ප්‍රබල ඉන්දියානුවන්ට සිදු වූයේ ශ්‍රී ලංකාව හමුවේ දණ නැවීමටය. ඒ තරඟයේදි පන්දුවාර 60 ක් ඇතුළත කඩුලු 5 කට ලකුණු 238 ක් ලබා ගත් ශ්‍රී ලංකාව, ටෝනිගේ මෙන්ම අනිකුත් ලාංකික පන්දු යවන්නන්ගේ පන්දු යැවීම නිසා ඉන්දියානු ඉනිම ලකුණු 191 කට සීමා කරන්නට හැකි විය. එහිදි විශිෂ්ට පන්දු යැවීමක නිරත වූ ටෝනි පන්දු වාර 10 යි එක් පන්දුවක් යවා ලකුණු 31 කට ඉන්දීය ඉනිමේ කඩුලු 3 ක් බිඳ දැමූවේ ටෝනිගේ දිවියේ නොමැකෙන පන්දු යැවීමක් සනිටුහන් කරමිනි.

මේ සිදුවීම ජාත්‍යන්තර ක්‍රිකට් ලෝලීන්ගේ අවධානය යොමු කරන්නට හේතු වූ අතරම මේ හේතුවෙන් වසර 2 කට පසු ශ්‍රී ලංකාවට ටෙස්ට් වරම ද හිමි විය. එම තරඟාවලියෙන් අනතුරුව ටෝනි අයර්ලන්ත ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් සිටින අතරතුර ඕලන්ද කණ්ඩායමේ පුහුණු කරුවකු ලෙස සේවය කිරීමටද අවස්ථාව හිමිවීම සුවිශේෂිය.

ටෝනිගේ ක්‍රිකට් දිවියේ තවත් නොමැකෙන සමරු සටහනක් වන්නේ ඔවුන් ප්‍රථම වරට දකුණු අප්‍රිකාව සමග තරඟ වැදීමය. මේ වන විට දකුණු අප්‍රිකාවේ පැවැති කළු සුදු වර්ණ භේදවාදි අදහස් නිසා කිසිදු ක්‍රිකට් කණ්ඩායමත් ඔවුන් සමග තරඟ කරන්නට කැමැති වූයේ නැත. 1982 ජූලි මාසයේදී දකුණු අප්‍රිකානු ක්‍රිකට් සංගමයේ ප්‍රධාන විධායක හා සභාපති අලි බචර් සහ ජෙෆ් ඩකින්ස් විසින් ඒ වන විට ඉල්ලීමක් කළේ, යම් ක්‍රිකට් කණ්ඩායමක් තම රටට ක්‍රිකට් ක්‍රීඩාව සඳහා පැමිණෙන්නේ නම් ඒ සඳහා එක් ක්‍රීඩකයකුට ඩොලර් 30,000 ක් බැගින් ගෙවන බවයි. ඇත්තෙන්ම මෙය විශාල මුදලකි. මෙහිදි දකුණු අප්‍රිකාවට ඔවුන්ගේ ප්‍රතිවාදියා ගේ ගුණාත්මක බව පිළිබඳ ප්‍රශ්නයක් මතුවූයේ නැත. මෙහිදි ඔවුන්ට අවශ්‍ය වූයේ අවිහිංසාවාදී කණ්ඩායමක් සංචාරය කිරීම සහ අප්‍රිකානු ක්‍රිකට් ක්‍රීඩාවට නීත්‍යානුකූල භාවය ගෙන ඒමයි. මේ වන විට අපේ ක්‍රිකට් කණ්ඩායම ටෙස්ට් තරඟවලට පිවිසියා පමණි. වැඩි ජනප්‍රියත්වයක් ද නොවීය. අලි සහ ඩකින්ස් ජූලි මාසයේදී ඔපාත හමුවිය. සෑම ක්‍රිකට් ක්‍රීඩකයකුටම සංචාරය සඳහා ස්ටර්ලින් පවුම් 25,000 ක වැටුපක් ලබා දෙන බවට පොරොන්දු වී දකුණු අප්‍රිකාව සමග තරඟ කරන්නට ලංකාව පොරොන්දු කර ගත්තේය. මෙයින් එක් අයකුට ලැබෙන මුදල ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කළ මුළු කාලය තුළම කෙනෙක් උපයා නොගත් මුදලකි. දෙරට ගිවිසුම් අත්සන් කළේය. බන්දුල වර්ණපුර, ඕපාත සමග ලලින් කළුපෙරුම, අජිත් ඩී සිල්වා, මහේෂ ගුණතිලක සහ අනුර රණසිංහ ඇතුළු පිරිසක් මෙයට ඇතුළත් විය. මේ සියල්ල ඕපාත විසින් සංවිධානය කළේය. මේ නිසා AROSA Sri Lanka (After Opatha and South Africa)නමින් ඒ අවස්ථාව පට බැඳුණි. දකුණු අප්‍රිකාව සමග සටන් කළ මුල්ම රට ලෙස ලංකාවේ ක්‍රිකට් ඉතිහාසය වෙනස් කිරීමෙට මේ සිදුවීම තීරණාත්මක සාධකයක් විය.

ටෝනි ඕපාත

මේ නිසා සිය දිවියේ යම් අවාසනාවන්ත සිදුවීමක් සනිටුහන් කරමින් 1982 වසරේ කැලිකාර දකුණු අප්‍රිකානු සංචාරයක නිරත වීම හේතුවෙන් දකුණු අප්‍රිකාවට ගිය ටෝනි ඕපාත ඇතුළු සියලු ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩකයන්ට වසර 25ක තරඟ තහනමකට ලක්වීමටද සිදුවිය. පසුව ඒ තහනම වසර 9කදි ඉවත් කෙරිණි. කෙසේ වෙතත් මේ සිදුවීම කළු සුදු භේදයට ක්‍රිකට් ක්‍රීඩාව අදාළ නැති බවට ලෝකයට ම සුබාරංචියක් ගෙන දුන්නේය. ඉන් අනතුරුව ටෝනි ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හිදි පුහුණු පාඨමාලාවක් හැදෑරිය ටෝනි ගැන බොහෝ දෙනෙකුට වර්ණනා කිරීමට බොහෝ දේ ඇත. ශ්‍රී ලංකාව අන්තර් ජාතික ක්‍රිකට් කවුන්සලයේ පූර්ණ සාමාජිකයකු වීමට පෙර ක්‍රිකට් ක්‍රීඩාවට සුවිශාල දායකත්වයක් දැක්වූ 49 දෙනොගෙන් එක් අයකු වන්නේ ද ටෝනි ඕපාත ය. ඔහු සිය ක්ෂේත්‍රයේදි උදවු නොකළ කෙනෙක් නැත; අත් නුදුන් කෙනෙක් නැත. එදා අද මෙන් ක්‍රිකට් ලෝකයේ බොහෝ දෙනෙක් නොසිටියද සිටිය සියලු දෙනා සිටියේ එක පවුලක පිරිසක් සේය. එදා ටෝනි මේ සියල්ලන්ටම ශක්තියක් විය. අද මෙන් ක්‍රිකට් තරඟ නොතිබුණ එදා ටෝනි ඇතුළු ක්‍රීඩකයන්ට ලැබුණු සීමිත තරඟ වලින් උපරිම ප්‍රයෝජන ගත් අතර සිය උපරිම හැකියා පෙන්නන්නට ඔවුන්ට හැකිවිය. මේ නිසාවෙන් අද බොහෝ දෙනෙකුට ටෝනි නැති අඩුව හොඳින්ම දැනෙන්නේය.

හොඳම පොල්තෙල් ගැන කියන තරු පහේ ලාංඡනය

● චන්දිමා එදිරිමාන්න

ආසියානු රටවල කෑම පිසීමේ දී පොල්තෙල් සුලබව යොදා ගනී. එහෙත් මේ වන විට විවිධ විෂ සහිත දෑ කලවම් වූ හා කලවම් කරන ලද තත්ත්වයෙන් බාල පොල්තෙල් වෙළෙඳපොළ තුළ සුලබ ව අලෙවි වීම නිසා ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ බරපතළ ගැටලු මතු වෙමින් තිබේ.

මේ වන විට මෙරට වෙළෙඳපළේ අලෙවි කෙරෙන පොල්තෙල්වලින් සියයට හැත්තෑවක්ම නිසි ප්‍රමිතියෙන් තොර බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පවසයි. දැනට වෙළෙඳපොළේ අලෙවි කෙරෙන පොල්තෙල්වලින් සාම්පල එකසිය දාහතක් පරීක්ෂා කිරීමෙන් ඒ බව හෙළි වී ඇත. මෙම තත්ත්වය පාලනය කිරීමට පාරිභෝගික ජනතාවට ප්‍රමිතිගත ගුණාත්මක තත්ත්වයෙන් යුතු පොල්තෙල් ඉතා පහසුවෙන් හඳුනා ගැනීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සහයෝගය ඇතුව තරු පහකින් යුතු නව ලාංඡනයක් හඳුන්වා දීමට පොල් සංවර්ධන අධිකාරිය කටයුතු යොදා තිබේ. මෙම තරු පහ ලාංඡනය ලබා දීමේ දී පොල්තෙල් නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන ක්‍රමවේදය, නිෂ්පාදන පරිශ්‍රයේ තත්ත්වය ආදී කටයුතු පරීක්ෂාවට ලක් කෙරෙන අතර එකී ලාංඡනය සහිත පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් කිරීමෙන් පසුවද නිරතුරු පරීක්ෂාවට ලක් කෙරේ.

වෙළෙඳපොළේ ඇති බාල පොල්තෙල් භාවිතය නිසා ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාවට එල්ල වී ඇති තර්ජන හමුවේ ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් නිෂ්පාදන හඳුනා ගැනීමට එම තරු පහේ ලාංඡනය උපකාරී වන ආකාරය පිළිබඳ සොයා බැලීමට අප අදහස් කළෙමු.

හැම විටම භාවිත කළ යුත්තේ ප්‍රමිතියට අනුව නිෂ්පාදනය වන පිරිසුදු පොල්තෙල්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න
රසායන විද්‍යා අංශය- කැලණිය විශ්වවිද්‍යාලය

"හොඳ පොල්තෙල් එහෙමත් නැතිනම් ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් යුතු පිරිසුදු පොල්තෙල් ලෙස හඳුන්වන්නේ සෞඛ්‍යයට අහිතකර කිසිදු ද්‍රව්‍යයක් එකතු වීමට ඉඩ නොදෙමින් සෞඛ්‍යාරක්ෂිත තත්ත්ව යටතේ නිපදවන පොල්තෙල්. පොල්තෙල් මිලදී ගැනීමේදී ප්‍රමිතිය, ගුණාත්මක භාවය හා සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කරමින් විධිමත් ලෙස ලබා දෙන සහතිකයක් නිකුත් වී තිබේදැයි සොයා බලා මිලදී ගැනීමට උනන්දු වීම ඉතා වැදගත්. වෙළෙඳපොළ තුළ අලෙවි වන විවිධාකාර පොල් තෙල් වර්ග අතර කොප්පරා භාවිත කර නිපදවන අලුත් පොල්තෙල් වගේම පාවිච්චි කරන ලද පොල් තෙල් නැවත පිරිපහදු කර අලුත් තෙල් ලෙස විකුණන බවත් හෙළි වී තිබෙනවා.

කෝප්පරාවලින් නිපදවන පොල්තෙල් සෞඛ්‍යාරක්ෂිත ලෙස පිරිසුදුවට සකස් නොකළහොත් විවිධ රසායනික ද්‍රව්‍ය එකී පොල්තෙල්වලම නිෂ්පාදනය වී ඒවා ශරීරයට අහිතකර ප්‍රතිඵල ගෙන දෙන බවත් තහවුරු වී තිබෙනවා. හොඳ පිරිසුදු පොල්තෙල් කියන්නේ ශක්තිය ජනනය කළ හැකි මේද අම්ලයක්. එය අප ශරීරයේ අවශෝෂණ ක්‍රියාවලිය වැඩි දියුණු කරන්නත් උපකාරී වෙනවා. පොල් තෙල්වල ඇති මධ්‍යමදාම මේද අම්ල සෞඛ්‍යට හිතකරයි. ඒ වගේම පොල්තෙල් ඉතා ඉහළ උෂ්ණත්වයකට රත් කරද්දී පවා ගුණය වෙනස් නොවී පවතින අතර එළවළු තෙල් හා වෙනත් තෙල් වර්ග ඉහළ උෂ්ණත්වයේදී සෞඛ්‍යයට අහිතකර දේ නිෂ්පාදනය කරනවා. ඒ නිසා පොල්තෙල් ශරීරයට සුදුසුම ගුණාත්මක දෙයක් ලෙස හැඳින්විය හැකියි.

මේ නිසා හැම විටම ප්‍රමිතියෙන් හා ගුණාත්මකභාවයෙන් යුතු පිරිසුදු පොල්තෙල් නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයන් දිරි ගැන්විය යුතුයි. වෙළෙඳපොළෙන් පොල්තෙල් මිලදී ගන්නා පාරිභෝගිකයන් පොල් සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති තරු පහේ ලාංඡනය සහිත සහතිකය තිබේදැයි බලා මිලදී ගැනීමට කටයුතු කළ යුතුයි"

තරු පහේ ලාංඡනය සහිත පොල්තෙල් ම මිලදී ගන්න

පී. එදිරිමාන්න
අධ්‍යක්ෂක සැලසුම් හා සංවර්ධන
පොල් සංවර්ධන අධිකාරිය

"අපේ රටේ ආහාර සහ කර්මාන්ත සඳහා යොදා ගන්නා වාර්ෂික පොල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 1,80000ක් පමණ වෙනවා. මේ ප්‍රමාණයෙන් සියයට 50ක් පමණ තමයි තවමත් නිෂ්පාදනය කර ගන්න පුළුවන්කම තියෙන්නේ. ඉතිරි පොල් හා පොල්තෙල් අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට සිදුව ඇත්තේ ආනයනික නිෂ්පාදනවලින්. මේ වන විට විවිධ මිල ගණන් යටතේ ආදේශක තෙල් වර්ග ලංකාවට ඇවිත් තියෙනවා. කෙසේ වුවත් විදේශ රටවලින් ආනයනය කෙරෙන බොහොමයක් නිෂ්පාදන අපේ රටේ නිපදවෙන තරම් උසස් නිෂ්පාදන නොවන බව ඉතාම පැහැදිලියි. ඒ වගේම ඒවා මිලෙනුත් අධිකයි. ඇතැම් ජාවාරම්කාර දේශීය වෙළෙන්දොත් ලාභය පසුපස හඹා ගොස් විවිධ දේ මිශ්‍ර කර බාල තත්ත්වයේ පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් කරනවා. මේ නිසා පාරිභෝගිකයන් රෝගවලට ගොදුරු වනවා පමණක් නොවෙයි අවසානයේදී එවැනි ලෙඩරෝග නිසා මරණය පවා ළඟා කර ගන්නවා.

පොල් සංවර්ධන අධිකාරිය හැටියට අපි මෙම කටයුතු නිරන්තරයෙන් ගැඹුරින්ම නිරීක්ෂණය කළා. ඒ අනුව මේ ගැටලුවලට ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්නට අපි සකස් කළ සැලසුම්වල ප්‍රතිඵලයක් විදිහට තමයි ප්‍රමිතිය, තත්ත්වය, උසස් බව, ගුණාත්මකභාවය හා සෞඛ්‍යාරක්ෂිත බව යන සියලු සාධක තහවුරු කළ ප්‍රමිතියෙන් යුතු බව කියැවෙන තරු 05කින් සමන්විත සහතිකයක් ඇති ලාංඡනයක් හඳුන්වා දුන්නේ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනුමැතියද මෙම තරු පහේ සහතිකය සඳහා හිමිව තිබෙනවා. ශ්‍රී ලංකාවේ තිබෙන සෑම පොල්තෙල් නිෂ්පාදන ආයතනයක්ම පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි විය යුතුයි. මෙ වනවිටත් නිෂ්පාදකයන් 250 ක පමණ පිරිසක් අප අධිකාරිය තුළ ලියාපදිංචි වී තිබෙනවා. දේශීය පොල්තෙල් නිෂ්පාදනයේ නිරත වී සිටින සියලුම ආයතන ඉදිරියේදී මේ වැඩසටහන හරහා නියාමනය කිරීමත් අපගේ අරමුණක්. මෙරට පොල්තෙල් නිෂ්පාදනයේ ගුණාත්මක භාවය ඉහළ නංවන දිගුකාලීන වැඩපිළිවෙළක් ලෙස මෙම තරු පහ සහතිකය ලබා දීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා."

ප්‍රමිතිය නොමැතිනම් පාරිභෝගික අධිකාරිය නීතිමය පියවර ගන්නවා

තාරක විදානගමාච්චි
සහකාර අධ්‍යක්ෂක
පාරිභෝගික සේවා අධිකාරිය

"2017දී ගැසට් එකක් නිකුත් කර තිබෙනවා ආහාර සඳහා යොදා ගන්නා පොල්තෙල් නිෂ්පාදනය කළ යුතු ආකාරය හා එම පොල්තෙල් බෝතල් ලේබල් කරන්නේ කොහොමද යන කාරණා පැහැදිලි කරමින්. පොල් සංවර්ධන අධිකාරිය,පාරිභෝගික කටයුතු අධිකාරිය හා සෞඛ්‍ය අමාත්‍යාංශය යන ආයතන මෙරට නිෂ්පාදනය කෙරෙන පොල්තෙල්වල ප්‍රමිතිය සොයා බලන කණ්ඩායමට අයත්. එම ප්‍රමිතිය තහවුරු වූ පසු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිරිසුදු පොල්තෙල් තෝරා ඒවාට සහතිකයක් නිකුත් කරන්නට කටයුතු කරනවා. පාරිභෝගික සේවා අධිකාරිය හැටියට මේ කියන කාරණයේදී අපගේ ප්‍රමුඛතම වගකීම වී තිබෙන්නේ මෙලෙස සහතික කරන ලද නිෂ්පාදන වෙළෙඳපොළට ආවම ඒ පිළිබඳව පැමිණිල්ලක් ආවොත් ඒ ගැන සොයා බලා තියෙන ප්‍රමිතියට නොමැතිනම් ඒ සම්බන්ධව නීතිමය පියවර ගැනීමයි.

මෙම තරු පහේ ලාංඡනය පොල් සංවර්ධන අධිකාරියේ නිර්දේශයකින් තොරව ව්‍යාජව හදාගෙන ඇත්නම් ඒ සම්බන්ධව පියවර ගැනීමටත් අප කටයුතු කරනවා. දැනට වෙළෙඳපොළේ විකුණන්නට තිබෙන බෝතල් නොකර අලෙවි කරන (ලූස්) පොල්තෙල් ගැනත් අප ඉතා විමසිලිමත්. කොප්පරා භාවිත කර හදන පොල්තෙල්වල පුස් හැදෙන්න තියෙන සම්භාවිතාව ඉතාම වැඩියි. පොල්තෙල් නිෂ්පාදනයේදී කොප්පරා කියන්නේ යල් පැන ගිය ක්‍රමයක්. මේ වන විට අලුත් තාක්ෂණය භාවිත කර පොල්තෙල් නිපදවන ක්‍රම ඕනෑ තරම් තියෙනවා. මේ සියලු කරුණු පිළිබඳ විමසිලිමත්ව ප්‍රමිතියෙන් යුතු පොල්තෙල් නිෂ්පාදන සඳහා තරු පහේ ලාංඡනය සහිත පොල්තෙල් නිෂ්පාදන ම මිලදී ගන්නා ලෙස අප සියලු පාරිභෝගිකයන්ගෙන් ඉල්ලා සිටිනවා.

පිරිසුදු පොල් තෙල් කියන්නේ ඉතා හොඳ ඖෂධයක්

වෛද්‍ය ලසන්ත විජේසේකර
වෛද්‍ය නිලධාරී
සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

පොල්තෙල්වල මේදය අඩංගු නිසා ආහාර පිසීමේදී පොල්තෙල් හොඳ නැහැ කියා මතයක් තිබුණා.එහෙත් සැබෑවටම පොල් තෙල් හොඳයි කියන එක තමයි කියන්න තියෙන්නේ. විශේෂයෙන්ම පොල්තෙල්වල තාපයට ඔරොත්තු දීමේ හැකියාව වැඩියි. තාප ස්ථායීතාවය වැඩි නිසා බැඳුම් හා ඉවුම් පිහුම් සඳහා භාවිතයට හොඳයි. පොල්තෙල්වල සංතෘප්ත මේදය වැඩි හරියක් ඇවිත් තියෙන්නේ මාධ්‍යදාම මේද අම්ලවලින්. එය සෞඛ්‍යයට අහිතකර නැහැ. ශරීරයට හිතකර ලක්ෂණ පෙන්වනවා. සෞඛ්‍යයට අහිතකර කොලෙස්ට්‍රෝල් අඩු කරනවා වගේම හදවතට හොඳ කොලෙස්ට්‍රෝල් තියාගන්නත් පොල්තෙල් උදවු වෙනවා. විශේෂයෙන් ම මවුකිරිවල පවතින රෝග බෝ නොවන ගුණය පොල්තෙල්වලත් පවතිනවා. ඒ අනුව පොල්තෙල් යනු ඉතා හොඳ ඖෂධයක්.

පිටරටවල වෙනත් තෙල් වෙනුවට පොල්තෙල්වල සුවිශේෂ ගුණය පිළිබඳව පරීක්ෂා කර ඒවා භාවිත කිරීම සඳහා ජනතාව හුරුකර තිබෙනවා.ජනතාව බහුල වශයෙන් ගොදුරු වී සිටින කොලොස්ට්‍රෝල් තත්ත්වයට විසඳුමක් වශයෙන් දිනකට පොල් තෙල් හැන්දක් පානය කරන්නත් ඔවුන් අනුමත කරලා තියෙනවා. ඒ වගේම මහලු වියට පත්වීමේදී සිදුවන මතකය නැති වීමේ තත්ත්වය පොල්තෙල් භාවිතයෙන් වළක්වගන්න හැකියාව තිබෙන බවද මේ වන විට පරීක්ෂණවලින් තහවුරු වී තිබෙනවා. පිටරටවල එවැනි තත්ත්වයක් තිබියදී දේශීය දෙයක් ලෙස අපි පොල්තෙල්වලට මීට වඩා පිළිගැනීමක් ලබා දිය යුතු වගේම තවදුරටත් පිරිසුදු පොල්තෙල් භාවිතය මෙරට තුළ ජනප්‍රිය කරන්නත් කටයුතු කළ යුතුයි.

● ජාලිය වීරක්කොඩි

මිතුරාගේ ලිංගික ඊර්ෂ්‍යාවට ලක්ව ත්‍රස්තවාදියකු ලෙස හංවඩු ගැසුණු ලාංකික තරුණයා

කමර් නිසාම්ඩීන්

වර්ෂ 2018 අගෝස්තු මාසයේ අවසාන සතියය. මේ රටම කතා කළේ එම සිදුවීම ගැනය.

ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ තෝරාගත් වැදගත් ස්ථාන සහ පුද්ගලයන් ඉලක්ක කර ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කළේ යැයි සැකපිට මොහොමඩ් කමර් නිසාම්ඩීන් නැමැති ශ්‍රී ලාංකික ශිෂ්‍යයකු ඔස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් පොලිසිය විසින් වර්ෂ 2018 අගෝස්තු මස 30දා අත්අඩංගුවට ගත්තේය.

වාර්තා වූයේ මේ සැකකරු අයිඑස් පන්නයේ හුදකලා ප්‍රහාරයක් සැලසුම් කළ බවය. එම ප්‍රහාරවල ඉලක්කගත පුද්ගලයන් ලෙස හිටපු අගමැති මැල්කම් ටර්න්බුල්, හිටපු විදේශ ඇමති ජුලී බිෂොප් සහ ඔවුන්ගේ ලිබරල් පක්ෂ සගයකු වන බ්‍රොන්වින් බිෂොප්ද සිටි බව කියැවිණ. එමෙන්ම සිඩ්නි ඔපෙරා රංග ශාලාව, පොලිස් සහ දුම්රිය ස්ථාන එම ප්‍රහාර සැලැසුමේ වූ බව The Sydney Morning Herald පුවත්පත වාර්තා කළේය.

මේ තරුණයා අත්අඩංගුවට ගනිත්ම රට වඩාත් උණුසුම් වූයේ ලංකාවේ ප්‍රධාන පෙළේ ජනාධිපති නීතිඥයකු වූ ෆයිසර් මුස්තාපා මෙන්ම එවකට ආණ්ඩුවේ ප්‍රහලම ඇමති වරයකු වූ ෆයිසර් මුස්තාපා එම තරුණයාගේ සමීප ඥාතියකු බව හෙළි වීමත් සමඟය.

ඔස්ට්‍රේලියානු පොලිසිය වාර්තා කර තිබුණේ අයි.එස්.අයි.එස් අනුබද්ධ ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කළ තොරතුරු ඇතුළත් යැයි සැක කරන සටහන් සහිත පොතක් හමුවූ බව කියමින් නිසාම්ඩීන්ගේ මිතුරකු වූ අර්සලාන් කවාජා නැමැත්තෙකු පොලිසිය දැනුවත් කළ නිසා මේ අත්අඩංගුවට ගැනීම සිදු කළ බවය. අදාළ සටහන් පොත අර්සලාන් කවාජා විසින් පොලිසියට ලබා දී තිබිණි.

අර්සලාන් කවාජා යනු ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ ප්‍රකට ක්‍රීඩකයකු වූ උස්මාන් කවාජා ගේ සොයුරාය. සිද්ධිය යන අතරේ උස්මාන් කවාජා බ්‍රිස්බේන්හි සිට වීඩියෝ තාක්ෂණය ඇසුරින් අධිකරණයට විශේෂ ප්‍රකාශයක් කළේය. ඔහු කීවේ තමන්ගේ සොයුරා පරමාදර්ශ සහිත විශිෂ්ට පුරවැසියකු බවය. හෙතෙම ජනප්‍රිය චරිතයක් බවත් ඔස්ට්‍රේලියානු කණ්ඩායමේ ප්‍රකට පුද්ගලයකු බවත් කීවේය. ඔහු නොකියා කීවේ තමන්ගේ සොයුරා රට වෙනුවේ යුතුකමක් ඉටු කර ඇති බවය.

අයි.එස් ත්‍රස්ත චෝදනාව එල්ල වන විට කමර් නිසාම්ඩීන් සිටියේ ඔස්ට්‍රේලියාවේ පශ්චාත් උපාධි අපේක්ෂයකු ලෙස අධ්‍යාපනය ලබමිනි. ඒ අතර ඔහු එරට සරසවියකට අනුයුක්තව රැකියාව කරමින් සිටියේය.

ඔහු ලංකාවේ ධනවත් මුස්ලිම් පවුලක සමාජිකයෙකි. කොළඹ ආසියානු ජාත්‍යන්තර පාසලෙන් ද්විතියික අධ්‍යාපනය ලද තරුණයෙකි. ඔහු උසස් අධ්‍යාපනය ලබා ගැනීමට ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නේ වර්ෂ 2015 දීය. බෙහෙවින්ම ප්‍රියජනක පුද්ගලයකු වූ ඔහු සිඩ්නි නගරයේ අධ්‍යාපනයට අදාළව නිව් සවුත් වේල්ස් ප්‍රාන්ත රජය නිෂ්පාදනය කළ ප්‍රවර්ධන වීඩියෝවක් සඳහාද 2016 වසරේදී පෙනී සිට තිබිණි. අතිශයින්ම ප්‍රගතිගාමී නිදහස් චින්තනයක් සහිත මේ තරුණයාට එල්ල වූ චෝදනාව සම්බන්ධව ඔහුගේ සමීපතමයෝ අතිශයින්ම වික්ෂිප්තව සිටියහ.

අත්අඩංගුවට පත් නිසාම්ඩීන් රැගෙන ගොස් රඳවනු ලැබුවේ ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පිහිටි දැඩි ආරක්ෂිත බන්ධනාගාරයකය. බරපතළ ත්‍රස්තවාදී චෝදනාවකට ලක් වී සිටි ඔහු අනිකුත් සිරකරුවන්ගෙන් වෙන් කෙරුණේ දැඩි අවධානමක් සහිත සිරකරුවකු ලෙස නම් කරමිනි. අනතුරුව පොලිසිය එතැන් සිට ගෙවී ගිය වසර කීපය පුරා ඔහු ශ්‍රී ලංකාවට මුදල් යැවීමට අමතරව ඉන් ඔබ්බට වෙනත් ගනුදෙනුවල යෙදී ඇත්ද යන්න පිළිබඳ මූලික විමර්ශන ආරම්භ කළේය. පුරා පැය අටක් ඔහුගෙන් ප්‍රශ්න කළද කිසිම තොරතුරක් දැනගැනීමට නොවීය. අනතුරුව සටහන් තිබූ බව කී පොත අත් අකුරු විශේෂඥයන් වෙත යොමු කළේය. ඔවුන්ගේ අවසන් නිගමනය වී තිබුණේ මේ අත් අකුරු කිසිසේත් නිසාම්ඩීන්ගේ නොවන බව ය.

ඉන්පසු ඔහුගේ ජංගම දුරකථනය හා පරීක්ෂාවට ලක් විය. පරිගණකය පරීක්ෂාවට ලක් විය. අතිශය සියුම් පරීක්ෂණයකින් අනතුරුවත් මේ චෝදනාව සම්බන්ධව ඔහුට එල්ල කළ හැකි කිසිම සාධකයක් සොයා ගැනීමට පොලිසියට හැකි වූයේ නැත. මේ කාලය අතර කමර් නිසාම්ඩීන්ට සහාය පළ කරමින් ඔහුගේ ඥාතීන්, මිතුරන් හා සිවිල් ක්‍රියාකාරීන් සාමකාමී උද්ඝෝෂණවල නිරත වූහ. කමර් නිර්දෝෂී බව ඔවුහු සහතික කොට ප්‍රකාශ කළහ.

> **කවාජා අධිකරණය හමුවේ මෙසේ හඬා වැටුණත් ඔහු විසින් කාන්තාවක් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් යමෙකුට එරෙහිව දරුණු ත්‍රස්ත චෝදනා භාවිත කළ පළමු අවස්ථාව මෙය නොවන බව ඒ වනවිට අධිකරණය විසින්ම හෙළි කරගෙන තිබුණේය. මීට කලකට පෙර ඔහු සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නඟා ගත් කාන්තාවක් වෙනත් පුද්ගලයකු වෙත සමීප වීම වැළැක්වීමට ඔහු එම පුද්ගලයාට එරෙහිව මෙවැනි බිහිසුණු ව්‍යාජ චෝදනා එල්ල කර තිබිණ.**

කමර්ට සාධාරණය ඉල්ලමින් හිතවතුන් ඕස්ට්‍රේලියාවේ පැවැත්වූ උද්ඝෝෂණයක්

පුරා සති හතරක් අධි රක්ෂිත බන්ධනාගාරයක රඳවා තැබීමෙන් අනතුරුව කිසිම චෝදනාවක් ඔප්පු වීමේ සේයාවක්වත් නොවූ හෙයින් කමර් නිසාම්ඩීන්ට වර්ෂ 2018 සැප්තැම්බර් 28 දා ඇප ලබා දීමට අධිකරණය තීන්දු කළේය. ඇප ලබා දෙන්නට ප්‍රධානම සාධකය වූයේ ඔහුගේ අත් අකුරු සහන් පොතේ තිබූ අත් අකුරු හා සටහන්වලට මුළුමනින්ම පරස්පර වීමය. අනතුරුව වර්ෂ 2018 ඔක්තොම්බර් 19 දා අධිකරණය නිසාම්න්ට එල්ල කර තිබූ චෝදනා ඉවත් කර ගත්තේය. එහෙත් ඒ වනවිට නිසාම්ඩීන්ට සිදු විය යුතුව තිබූ ව්‍යසනය සිදු වී අවසන්ය. ඔස්ට්‍රේලියාව තුළ ඔහුගේ අනාගතය කුඩු පට්ටම් වූයේය.

මිතුරු වෙසින් සිටි සතුරා
අර්සලාන් කවාජා

පසුගිය 11 වැනිදා ඩවුනින් දිස්ත්‍රික් අධිකරණයේ දී මේ ත්‍රස්ත ප්‍රහාර කතාවේ සියල්ල හෙළි විය. ඒ මෙම සිද්ධිය ව්‍යාජ ලෙස නිර්මාණය කළ ආකාරයත් ඊට පදනම් වූ හේතුවත් එම සිද්ධියට සම්බන්ධව පැමිණිලි කළ පුද්ගලයා වන අර්සලාන් කවාජා විසින් අධිකරණය හමුවේ හඬා වැටෙමින් ප්‍රකාශ කිරීමෙන් පසුය.

නිසාම්ඩීන්ට මෙම ත්‍රස්ත චෝදනාව එල්ල කළ කවාජා අධිකරණය හමුවේ පැවසුවේ කාන්තාවක සමඟ නිසාම්ඩීන් පැවැත් වූ මිතුරු ඇසුරක් සම්බන්ධයෙන් තමන්ට ඇති වූ ඊර්ෂ්‍යාව මත මේ ව්‍යාජ අපරාධ චෝදනාව ඔහු වෙත එල්ල කළ බවය. තමන්ගේ පෞරුෂ විරහිත දීන හැසිරීම ගැන කම්පා වනවා මෙන්ම පෞරුෂ හීන වීම නිසා ඇති වූ මානසික ව්‍යාධියකින් තමන් පෙළුණු බවද ඔහු ප්‍රකාශ කළේය.

"මා ක්‍රියා කළේ නිවටයෙක් වගේ. ඇත්තටම මට අවශ්‍ය වුණේ නෑ ඔහු අත්අඩංගුවට පත් කරන්න. ඒත් මගේ බියගුළුකම නිසා ඔහුව අත්අඩංගුවට ගන්න කලින් මේ ඇත්ත කියන්න මට බැරි වුණා..."

කවාජා අධිකරණය හමුවේ මෙසේ හඬා වැටුණත් ඔහු විසින් කාන්තාවක් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් යමෙකුට එරෙහිව දරුණු ත්‍රස්ත චෝදනා භාවිත කළ පළමු අවස්ථාව මෙය නොවන බව ඒ වනවිට අධිකරණය විසින්ම හෙළි කරගෙන තිබුණේය. මීට කලකට පෙර ඔහු සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නඟා ගත් කාන්තාවක් වෙනත් පුද්ගලයකු වෙත සමීප වීම වැළැක්වීමට ඔහු එම පුද්ගලයාට එරෙහිව මෙවැනි බිහිසුණු ව්‍යාජ චෝදනා එල්ල කර තිබිණ.

කවාජාගේ ව්‍යාජ චෝදනාවට ලක් වූ තැනැත්තාගේ නම නීතිමය හේතුන් මත ප්‍රකාශයට පත් කළ නොහැකි බව ඔස්ට්‍රේලියානු පොලිසිය කීවේය. මුල් චෝදනාව සම්බන්ධව කවාජා පැහැදිලි කර තිබුණේ එම කාන්තාව අත්හැරීමට ඇති බිය නිසා තමන් මෙවැනි තත්ත්වයට පත් වූ බවය.

නිසාම්ඩීන් හා මිතුරුකම් පවත්වන වෙනත් යුවතිය සම්බන්ධ කවාජාගේ මැදිහත්වීම ඇති වන්නේ මේ කාන්තා හුටපටයෙන් පසුවය. කවාජා අතිශයින්ම උනන්දුවෙන් සිටි, එහෙත් නිසාම්ඩීන් සමඟ මිතුරුකමක් ඇති කරගෙන තිබුණු එම යුවතිය කවාජා වෙත එවූ කෙටි පණිවුඩයක් නිසා ඇය ඔහු සමඟ ඇති සබඳතා අත්හරිනු ඇතැයි තමා බිය වූ බව ඔහු අධිකරණයට කීවේය. පසුදා උදෑසන සිට ඔහුට අවශ්‍ය වූයේ නිසාම්ඩීන් විනාශ කිරීමට බවත් කවාජා අධිකරණය ඉදිරියේ පවසා තිබිණ. නිසාම්ඩීන් දුටු හැම මොහොතකම තමන් වේදනාවෙන් දැවී ගිය බව කවාජා කීවේ හඬා වැටෙමිනි.

"කමර් කියන්නේ උසස් මනුෂ්‍යයෙක්... මම හිතන්නෙ නෑ මම කරපු දේට ඔවුන් කවදාවත් මට සමාව දේවි කියලා. මට කියන්න තියෙන්නෙ මම ඔවුන්ට කළ දේ ගැන, විශේෂයෙන්ම කමර් ගැන මගේ පසුතැවීම පමණයි...

එහෙත් කවාජාගේ මේ පසුතැවීමට දැන් ප්‍රමාද වැඩිය.

මේ බලාපොරොත්තු නොවුණු ව්‍යසනය මේ අසරණ තරුණයාගේ අනාගත සැලසුම් සුන්බුන් කර දමා ඇත. කමර් නිසාම්ඩීන් මේ වනවිට ලංකාවට පැමිණි සිටින්නේය.

නරින් ගෙන් ගම ආරක්ෂා කරන ගම්මුන් පිරිසක්

කවිනිගේ නිවෙස පිහිටි නිව්චැටිල් වත්ත

මිය ගිය කවිනි දියණිය

ගමක් වනසන නරි රජදහනක්

● හර්ෂා සුගතදාස

රයිගම් කෝරලයට සේන්දු වූ අප දොඹගොඩ හමුදා කඳවුර අසලින් වැටී ඇති ගුරුපාර දිගේ නිව්චැටල්වත්තට යන විට මොනරුන්ගේ කේකාරාවය ඇසුණේ විලාපයක විලාසයෙනි. රබර් වතු මැද පවතින මඳ අඳුර කියාපාන්නේ දැඩි මූසල ස්වභාවයකි. එහෙත් එම මූසල නිහඬතාව බිඳ දමමින් නිව්චැටල්වත්තේ මිනිසුන් යුහුසුළුව තම ගවයන් ගස්වල කෙටි කර බැඳ දමා පෙරමඟ බලා සිටියේ පශු වෛද්‍යවරුන්ගේ පැමිණීමේ අපේක්ෂාවෙනි. එළු පැටවුන් වඩා ගත් කුඩා දරුවන් අප ගමන් කළ වාහනය සමීපයට දිව ආවේ පශු වෛද්‍යවරුන්ගේ වාහනය යැයි වරදවා වටහා ගනිමින් විය යුතුය.

නිව්චැටල්වත්තේ වැසියන් ඔවුන්ගේ ගවයන්ට, එළුවන්ට ජලභීතිකා එන්නත් ලබා දීම සඳහා පශු වෛද්‍යවරුන් පැමිණෙන තෙක් බලා සිටියේ නිව්චැටල්වත්තට ජලභීතිකා රෝග ව්‍යාප්තියේ අවදානමක් තිබෙන නිසාය. මෙම අවදානමට ඔවුන් මුහුණ දී සිටින්නේ ජලභීතිකා රෝගයට ගොදුරු වීමෙන් නිව්චැටල්වත්තේ සහ මුවපට්ටියගම පුද්ගලයන් දෙදෙනකු මිය යෑමත් සමඟිනි. ජලභීතිකාව හේතුවෙන් මෙසේ මිය ගියේ මුවපට්ටිය ගමේ පදිංචි 57 හැවිරිදි එන්. ආරියරත්න සහ නිව්චැටල්වත්තේ 8 හැවිරිදි කවිනි නෙත්සරා යන දෙදෙනාය.

ප්‍රථමයෙන් අප කවිනි නෙත්සරා දියණියගේ නිවසට යන විට දැරියගේ මවුපියන් ජලභීතිකා එන්නත් ලබා ගැනීම සඳහා හොරණ රජයේ රෝහලට ගොස් සිටි බැවින් මුවපට්ටිය ගමේ පිහිටි ආරියරත්නගේ නිවසට ගොඩවැදුණේ සුලමුල දැනගැනීමේ අටියෙනි.

හොරණ මුවපට්ටිය ගමම භීතියෙන්

"ආරියරත්න කියන්නේ මගේ මහත්තයාගේ අයියා. එයා උපතින්ම මන්ද මානසික කෙනෙක්. ඒ නිසා එක තැනක ඉන්නේ නැහැ. හැමතැනම ඇවිදිනවා. මේ අහල පහළ හැමෝටම උදව් කරනවා. රබර් වත්තට ගිහින් දර කඩලා ගෙනත් දෙනවා. පසුගිය ජූලි 28 වැනිදා දවල් බන්ට් එක ළඟදි නරියෙක් හපා කාලා තිබුණා. අයියා නරියාට ගහන්න ගලක් ගන්න නැමෙන විට ඌ මුහුණම හපා කාලා තිබුණා. අත් දෙකත් කකුලත් කාලා තිබුණ. අයියා ඉන්දු අක්කලාගේ කඩයට දුවගෙන ගිහිල්ලා. එතනින් කට්ටිය අයියාව ත්‍රීවිලරයක දාගෙන ගල්පාත ඉස්පිරිතාලේට ගෙනිහින් තිබුණා. ගල්පාත ඉස්පිරිතාලෙන් හොරණ ඉස්පිරිතාලේට යැව්වා. හොරණින් තුවාලවලට බේත් දාලා වාට්ටුවේ නවත්වාගෙන පිස්සු බලු රෝගයට බෙහෙත් විදලා ඊට පසුවදා ගෙදර එව්වා. බෙහෙත් විදින දවස් වගයක් ලියලා දීලා තිබුණා. ඒ නියමිත දවස්වලට ඉස්පිරිතාලෙට ගිහින් බේත් විද ගත්තා. අයියා හොඳට හිටියා. කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. එක බෙහෙතයි විදින්න ඉතිරි වෙලා තිබුණේ. එහෙම තියෙද්දි තමයි අයියා නැති වුණේ." යනුවෙන් බී.එස්. සුරංගනි පැවසුවාය.

සුරංගනිගේ සැමියාගේ සොයුරු ආරියරත්න හදිසියේ රෝගාතුර වී තිබෙන්නේ අගෝස්තු 16 වැනිදා රාත්‍රියේය. එනම් නරියා සපා කා දින 20ක් ගත වූ පසුවය. 16 වැනිදා සවස ඔහු උගුර රිදෙන බව පවසා සුරංගනිගෙන් සමහන් පැකට් ඉල්ලා තිබේ. ඈ පස් පංගුව බීමට දුන්නේ එම අවස්ථාවේ නිවසේ සමහන් නොතිබූ නිසාය. රාත්‍රි ආහාර ගැනීමට නොහැකි බව පැවසූ ආරියරත්න උණුසුම් ජලය ඉල්ලා ඇත්තේ උගුරේ වේදනාව හේතුවෙනි. එහෙත් 17 වැනිදා උදෑසන වන විට ආරියරත්නට ජලය කිසිවක් පානය කළ නොහැකි තත්ත්වයක් උද්ගත විය. පිට කොන්දේ හා උගුරේ වේදනාව සමඟ උදරය ද විශාල වී තිබේ. ඔහු වියරුවෙන් මෙන් කෑගසන්නටත් දඟලන්නටත් වූ බැවින් 1990 අමතා ගිලන් රථයක් ගෙන්වාගෙන ඔහුව හොරණ රෝහලට රැගෙන යෑමට කටයුතු කර තිබිණි. ඔහු කොතරම් දරුණු ආකාරයට දැඟලුවේ ද යත්, රෝහලේදී ඔහුට එන්නත් විද තිබෙන්නේ පිරිමින් පස්දෙනකු ඔහුව තදින් අල්ලා ගැනීමෙන් පසුවය. එහෙත් රෝහලට රැගෙන ගොස් පැය 2කට පසුව ආරියරත්න මිය ගියේය. හදිසි මරණ පරීක්ෂක සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් පරිදි අගෝස්තු 18 වැනිදා දහවල් 1.00ට මෘතදේහය නිවසට රැගෙන'විත් එදිනම සවස 4.00ට අවසන් කටයුතු සිදු කරන ලදී. දේහය සීල් තබා තිබූ අතර නිවස ඇතුළතට නොගෙන තිබුණේ සෞඛ්‍යාරක්ෂිත උපදෙස්වලට අනුකූලවය. ජලභීතිකාව වැලඳුණු නරියකු සපා කෑමෙන් ආරියරත්නට ජලභීතිකාව වැලඳෙන්නට ඇති බව වෛද්‍යවරුන්ගේ තීරණය විය.

ජලභීතිකාව වැලඳුණු මෙම පිස්සු නරියා බිලි ගත්තේ ආරියරත්නගේ ජීවිතය පමණක් නොවේ. නිව්චැටල්වත්තේ පදිංචි කවිනි නෙත්සරා දියණියව ද බිලි ගෙන තිබුණි. මෙම සිගිති දියණිය මරණයට පත් වූයේ සැප්තැම්බර් 09 වැනිදාය. එනම් නරියා සපා කා මාසයකුත් දින 12ක් ඉක්ම ගිය පසුවය. නෙත්සරා දියණියව නරියාගේ සපාකෑමට ලක් වූයේ ඉන්දු අක්කාගේ නිවස අසලය. එහෙත් අප යන විට ඉන්දු ද ජලභීතිකා එන්නත් විද ගැනීමට රෝහලට ගොස් සිටියේ ඈ ආරියරත්නගේ තුවාල පිරිසිදු කර ලේ වහනය නැවැත්වීමට අයිස් තබා ප්‍රථමාධාර දී තිබූ නිසාය.

මෙම අතරවාරයේදී කවිනි නෙත්සරා දියණියගේ මිත්තණිය සහ මාමා මුණගැසී කතා බහ කිරීමට අපට හැකි විය.

සපා කෑ දෙදෙනෙක් මරුට

උණ සමඟ කොන්දේ කැක්කුම හට ගැනීමෙනි. පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයකින් බෙහෙත් රැගෙන දුන් විට උණ අඩු වුවද කොන්දේ කැක්කුම සහ උගුරේ වේදනාව වැඩි වී තිබේ. ඉන්පසුව වතුර පානය කිරීමට නොහැකි බවත් උගුර හිරවන බවත් දියණිය මවට පවසා ඇති අතර 09 වැනිදා දවසට එළිවන ජාමයේ ඇයව හොරණ රජයේ රෝහලට රැගෙන ගියේ ඇගේ රෝගී තත්ත්වය උත්සන්න වූ නිසාය.

"ඉස්පිරිතාලෙට ගියාම දුවව 1 වැනි වාට්ටුවට දැම්මා. දුව හුළං වදිනකොට හයේ හිටියේ. හුස්ම ගන්නත් අමාරු වුණා. වෛද්‍යවරු අපෙන් ඇහුවා දරුවාව බල්ලෙක්, පූසෙක් හෝ නරියෙක් කෑවාද කියලා. මේ ලෙඩේට බෙහෙත් නැති බවත් දුවව බේරා ගැනීමට අමාරු බවත් කිව්වා. දුවට බෙහෙත් බොන්න බැරි වුණු නිසා බෙහෙතක් විද්දා. ඊට පස්සේ සෙම ගියා. ආයේ බෙහෙතක් විද්දා. ඒ පාර ලේ සමඟ වමනය ගියා. දිගටම සෙම ගියා. දුව කෑගහලා ඇඬුවා. උගුර ගැලවිලා යන්න තරම් රිදෙනවා කිව්වා. දුව දඟලන්න වුණා. ඒ දිහැ බලාගෙන ඉන්න බැරිව මම එළියට ආවා." යනුවෙන් අප සමඟ පැවසුවේ දියණියගේ පියා වන සමන් විජය කුමාරය.

අවසානයේදී සීල් තැබූ පෙට්ටියකින් නිව්චැටල්වත්තට රැගෙන ආ නෙත්සරා දියණියගේ මෘතදේහය පැය කීපයක් ඇතුළත භූමිදාන කළේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් පරිදිය.

ආරියරත්නව සපා කා, නෙත්සරා දියණියගේ ඇගේ හැපී දිව ගිය නරියා නිවෙස් තුළට ද රිංගා තිබේ. කුකුළකු ඩැහැගෙන සපන අතරවාරයේදි ගාමිණී සිල්වා මුගුරකින් පහර දී නරියාව මරා දමා ඇත. එහෙත් මෙම නරියාගේ හිස කපා වෛද්‍ය පර්යේෂණ ආයතනයට රැගෙන ගොස් නැත." අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට කතා කළා. ඒ අය අපිට හිස කපාගෙන එන්න කිව්වා. ඊට පස්සෙ අපේ අත්වල නරියාගේ ලේ, විෂබීජ ගෑවෙනවානේ. නිසි ක්‍රමවේදයකට කපන්න අපි දන්නෙ නැහැනේ." යනුවෙන් ගම්මු පැවසූහ. මරා දැමූ නරියා වළ දමා තිබෙන්නේ ඉන් අනතුරුවය.

අප යන විට ගාමිණී සතු එළදෙන කටුපොල් වගා කළ වතුයායක කඹ 3ක් දමා බැඳ සිටියේ ඌ සැරපරුෂ වී තණකොළ නොකන බව පවසමිනි. ගම්වාසින්ගේ අදහස එළදෙනට ලබාගෙන නිවසට පැමිණෙමින් සිටි නෙත්සරා දියණියගේ මව සහ පියා අතරමගදී සම්බන්ධ කර ගැනීමට අපට හැකි විය.

"දුව පාරේ වැටුණු වෙලාවේ මම කුස්සියේ උයලයා හිටියේ. කෑගහන සද්දෙට මම දුවගෙන ආවා. දුවගේ කකුල තුවාල වෙලා තිබුණා. දුව මට කිව්වා පාරේ වැටිලා තුවාල වුණේ, නරියා හැපුවෙ නැහැ කියලා. නරියා දුවගේ සායේ ගෑවුණ විතරයි කියලා කිව්වා. දුව කිව්වා, අම්මෙ මම මල්ලිව යට කරගෙන බේරා ගත්තා කියලා. දුව මල්ලිව බේර ගත්තා. ඒත් අනේ මගේ දුවට බේරෙන්න බැරි වුණා." කියමින් දියණියගේ මව වන සී. විජයකුමාරි පැවසුවේ හැඬූ කඳුළිනි.

එදා (ජූලි 28) තුවාල ලැබූ කවිනි නෙත්සරා දියණියව මව විසින් ගල්පාත රෝහලට රැගෙන ගොස් තිබුණි. එහිදී දැරිය වෛද්‍යවරයාට පවසා ඇත්තේ නරියා සපා නොකෑ බවය. එහෙත් තුවාලවලට බෙහෙත් දැමීමෙන් අනතුරුව ගිලන් රථයෙන් ඇයව හොරණ රජයේ රෝහලට යැවීමට කටයුතු කර තිබිණි. එම අවස්ථාවේ ගිලන් රථයෙන් යෑමට නොහැකි යැයි පවසමින් කවිනි නෙත්සරා දියණිය හඬා වැටුණු නිසා ඇයව හොරණ රෝහලට මව විසින් ගෙන ගියේ ත්‍රීවිලරයෙනි. හොරණ රෝහලේදී ද දියණිය වෛද්‍යවරුන්ට අවධාරණය කළේ නරියා ඇයව සපා නොකෑ බවය. සායේ වැදුණු බව පමණක් පවසා තිබේ. හොරණ රෝහලේ වෛද්‍යවරුන් තුවාල වේළෙන්නට ඖෂධ දීමෙන් පමණක් වෛද්‍ය ප්‍රතිකාරය අවසාන කර තිබෙන්නේ එබැවිනි.

අගෝස්තු 17 වැනි දින නරියා සපා කෑ ආරියරත්න මිය ගිය ද කවිනි නෙත්සරා දියණිය කෙරෙහි කිසිවකු විශේෂ අවධානයක් යොමු නොකළේ දියණිය ඉතා නිරෝගීව කෙළිදෙළෙන් කාලය ගත කළ නිසා බව ඇගේ මව වන විජය කුමාරි සඳහන් කළාය. කවිනි නෙත්සරා සිගිති දියණිය රෝගී වූයේ පසුගිය සැප්තැම්බර් 07 වැනිදාය. ඒ 5කින් හරියටම 1.20ට දුවගේ පණ ගියා. මගේ ඇස් ඉස්සරහ දුව නැති වුණ හැටි මට දරාගන්න බැහැ." නෙත්සරා දියණියගේ මාමා වන සී. ජීවන් පැවසුවේ දැඩි වේදනාවකිනි.

දිවා කාලයේ වුවද මොනරුන්ගේ කේකාරාවයත් නරියන්ගේ හූ හඬත් ඇසෙන නිව්චැටල්වත්තට වඳුරන්ගෙන් ද හිඟයක් නැති බව අපට වැටහුණේ නෙත්සරා දියණියගේ මිදුලේ ඇඹරැල්ලා කඩමින් වහලයෙන් වහලයට පැන යන වඳුරු රංචුව නිසාය.

ආරියරත්නගේ තුවාල පිස දමා රෝහලට යැවූ ඉන්දු, ජලභීතිකා එන්නත විදගෙන නිවසට පැමිණ සිටි බැවින් අප ඈ හමු වූයේ කවිනි නෙත්සරා දියණිය පසුපස නරියා ලුහුබැඳ ගිය අයුරු ඈ දුටු බැවිනි.

"ආරියරත්නව ත්‍රීවිලරයෙන් ඉස්පිරිතාලෙට පිටත් කරලා අපි එළියෙ කතා කර කර හිටියා. ඒ වෙලාවේ අහල පහළ ගෙවල්වල ළමයි පාරේ සෙල්ලම් කර කර හිටියා. එකපාරටම කොහෙන් ආවාද මන්දා නරියෙක් දුවගෙන ආවා. නෙත්සරා දුව එයාගේ මල්ලිව වඩාගෙන හිටියේ. ඒ නිසා දිව්වත් දුවගන්න බැරිව පාරේ වැටුණා. අපි නරියාව එළවන්න කෑගැහුවා. මම දැක්කෙ නෙත්සරා දුවයි එයාගේ මල්ලියි නරියයි එක පොදියක් වුණා විතරයි. හපා කනවා දැක්කේ නැහැ. අපි කෑගහද්දි බල්ලො බුරාගෙන ආවා. නරියා වේගයෙන් දිව්වා. නෙත්සරා දුවගේ කකුල දණහිසෙන් පහළ තුවාල වෙලා තිබුණා." යනුවෙන් ඉන්දු අක්කා යැයි කවුරුත් අමතන ඉන්ද්‍රාණි ගමගේ විස්තර කළාය.

මේ වන විට ජලභීතිකා එන්නත් විද්දා. ඒ පාර ලේ සමඟ වමනය ගියා. දිගටම සෙම ගියා. දුව කෑගහලා ඇඬුවා. උගුර ගැලවිලා යන්න තරම් රිදෙනවා කිව්වා. දුව දඟලන්න වුණා. ඒ දිහැ බලාගෙන ඉන්න බැරිව මම එළියට ආවා." යනුවෙන් අප සමඟ පැවසුවේ දියණියගේ පියා වන සමන් විජය කුමාරය.

අවසානයේදී සීල් තැබූ පෙට්ටියකින් නිව්චැටල්වත්තට රැගෙන ආ නෙත්සරා දියණියගේ මෘතදේහය පැය කීපයක් ඇතුළත භූමිදාන කළේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් පරිදිය.

ආරියරත්නව සපා කා, නෙත්සරා දියණියගේ ඇගේ හැපී දිව ගිය නරියා නිවෙස් තුළට ද රිංගා තිබේ. කුකුළකු ඩැහැගෙන සපන අතරවාරයේදි ගාමිණී සිල්වා මුගුරකින් පහර දී නරියාව මරා දමා ඇත. එහෙත් මෙම නරියාගේ හිස කපා වෛද්‍ය පර්යේෂණ ආයතනයට රැගෙන ගොස් නැත." අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට කතා කළා. ඒ අය අපිට හිස කපාගෙන එන්න කිව්වා. ඊට පස්සෙ අපේ අත්වල නරියාගේ ලේ, විෂබීජ ගෑවෙනවානේ. නිසි ක්‍රමවේදයකට කපන්න අපි දන්නෙ නැහැනේ." යනුවෙන් ගම්මු පැවසූහ. මරා දැමූ නරියා වළ දමා තිබෙන්නේ ඉන් අනතුරුවය.

අප යන විට ගාමිණී සතු එළදෙන කටුපොල් වගා කළ වතුයායක කඹ 3ක් දමා බැඳ සිටියේ ඌ සැරපරුෂ වී තණකොළ නොකන බව පවසමිනි. ගම්වාසින්ගේ අදහස එළදෙනට නරි මතු වෙනවාද කියලා කියන්න බැහැ. වැසිකිළියට යන්න වෙන්නේ පොලු මුගුරු අරං. ළඟදි දවසක් හරක් බඳින්න ගිය ගෑනු කෙනෙකුව නරියෙක් කාලා තියෙනවා. අපේ ගෙවල් ශක්තිමත් නැහැ. ඒ නිසා නරියකුට ගෙට පනින එක මහ දෙයක් නොවෙයි." යනුවෙන් සඳහන් කළේ නිව්චැටල්වත්තේ පදිංචිකරුවන්ය.

මේ වන විට මිල්ලනිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් මදුරාවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් අයත් ප්‍රදේශවලින් ජලභීතිකා රෝගයට ගොදුරු වූ ගවයන් 4ක් වාර්තා වී තිබේ. ඒ, ගවයන්ව නරි සපාකෑමට භාජනය වීමෙනි. මේ අතරින් මිය ගිය එක් නරියකුගේ හිසත් ගවයකුගේ හිසත් වෛද්‍ය පර්යේෂණ ආයතනයට යොමු කිරීමෙන් අනතුරුව මෙම සතුන් ජලභීතිකා රෝගයට ගොදුරු වී ඇති බවට වාර්තා වී ඇත.

"ජලභීතිකාවෙන් මිය ගිය අයගේ තොරතුරු පරීක්ෂා කරන විට නරි කාලා රෝගය හැදුණා කියලා තහවුරු වෙන්නේ අඩුවෙන්. ගිය අවුරුද්දේ රත්නපුරයෙන් එක් මරණයක් වාර්තා වුණා. ගිය අවුරුද්දේ ජලභීතිකාව හේතුවෙන් මිය ගිය 26න් 10 - 15 අතර ගණනක් ඉන්නවා රෝගය හැදුණු හේතුව දන්නේ නැති. සමහරවිට ඒ අයට නරියකු කාලා, එහෙම නැත්නම් නරියකු කාපු ගවයන්ගෙන් රෝගය හැදුණා වෙන්න පුළුවන්. ඒත් ඒ අයට නිශ්චිතව කියන්න මතක නැහැ. එක්කෙනෙක් කියලා තිබුණ රෑ නිදාගෙන සිටින විට දුඹුරුපාට බල්ලෙක් වගේ සතෙක් කාලා දිව්වා කියලා. කොහොම වුණත් නරියන්ගෙන් ජලභීතිකාව වැලඳීමේ අවදානමක් තිබෙනවා. ජලභීතිකාව හැදිලා මිය යන ගවයන් නම් සෑහෙන්න වාර්තා වෙනවා. කැලෑබද ප්‍රදේශවල නිදැල්ලේ යන ගවයන්ට ජලභීතිකාව හැදෙන්න පුළුවන්. ඒ මඟින් මිනිසුන්ට හැදෙන්න පුළුවන්." යනුවෙන් පැවසූ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අධ්‍යක්ෂ, වෛද්‍ය එල්.ඩී. කිත්සිරි, නරියන් වැනි කැලෑ සතුන් ජලභීතිකා රෝගයට ගොදුරු වීම වළක්වා ගැනීමට වන ජීවී දෙපාර්තමේන්තුව කඩිනමින් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව පෙන්වා දුන්නේය.

ඡායාරූප - සමන් ශ්‍රී වෙදගේ

දැන් නරි ගහනය අඩුයි

පරිසරවේදී පුබුදු වීරරත්න

නරියා ලංකාවට ආවේණික සතෙක් නොවෙයි. ලංකාවේ තෙත් කලාපයෙත් වියළි කලාපයෙත් දකින්න ලැබෙනවා. Golden jackal යන හිවල් විශේෂය පමණයි මෙහි සිටින්නේ. වර්තමානයේ නරි ගහනය අඩුවෙලා මොනර ගහනය වැඩිවෙලා තිබෙනවා. කැලෑවල ජීවත්වන හිවලුන් රාත්‍රියකට හොර රහසේ ගම් වැදුණත් දහවල් කාලයට ජනතාව මැදට එන්නෙ නැහැ. ඒ විදිහට මිනිසුන් මැද්දට නරියකු එන්නේ පිස්සු හැදුණොත් විතරයි.

කවිනිගේ මව්පියන් සහ සොහොයුරා

මුවපට්ටිය ගම් වැසියන් විසින් මරා දැමූ නරියා

වමේ සිට මුවපට්ටිය ගම්වැසියන් වන ගාමිණී, ඉන්ද්‍රානි, ජීවන්, මිය ගිය ආරියරත්න ගේ නෑනා සුරංගනී සහ මියගිය දැරියගේ මිත්තණිය

නරින් ගෙන් ගවයන්ටත් පීඩා

සර් ජෝන්ගේ කියුම් කෙරුම් මෙන්න 21 පිටුව

එල්ලුම් ගහෙන් ගැලවුණත් මරණයෙන් වන්දි ගෙවූ බචෝ 22 පිටුව

විදුදය සාහිත්‍ය සම්මාන උලෙළ නාගනී 29 පිටුව

ඇමසන් යළිත් දැවේ

බොල්සෙනාරෝ බොරු කියයි

පෘථිවියේ පෙනහලු බඳුව එහි වෙසෙන සුවහසක් ජීවීන්ගේ හුස්ම පොදට ජීවය දෙන බ්‍රසීලයේ ඇමසන් මහා වනය මේ වන විට යළිත් ගිනි ගෙන දැවෙමින් තිබේ. පසුගිය වසරේදී මෙලෙසම පැතිර ගිය ලැව් ගිනි මුළු ලෝකයම කැලඹීමට සමත් වූ අතර ඇමසන් වනයේ සිදුවන මහා විනාශය සම්බන්ධව ලොවපුරා විරෝධතා ද ඇති විය.දැන් යළිත් මේ වසරේදීද ඇමසන් වනය ගිනි තැබීමට සහ වනය එළි කරමින් ගොවිබිම් සකසාගැනීමට බ්‍රසීල ජනතාව පෙලඹී තිබේ. දත්ත වාර්තා අනුව මහා වන විනාශයක් සිදු වූ පසුගිය වසරටත් වඩා මේ වසරේ දැනට සිදුවී ඇති විනාශය වැඩි බව පෙනීයන්නේ යැයි මේ වන විටත් ප්‍රකාශ වී තිබේ.

බොල්සෙනාරෝ

බ්‍රසීල වන විනාශය සම්බන්ධව ආයතන තුනක් එක්ව සමීක්ෂණයක් සිදු කර ඇති අතර එම සමීක්ෂණ වාර්තාව පසුගිය අගෝස්තු 29වැනිදා ලෝකයට ප්‍රසිද්ධ කර තිබේ.

ඇමසන් පාරිසරික පර්යේෂණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය නීති හැදෑරීම පිළිබඳ මධ්‍යස්ථානය සහ හියුමන් රයිට්ස් වොච් යන ආයතන තුන එක්ව මෙකී පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කර තිබේ. එම වාර්තාවට අනුව පසුගිය වසරට වඩා සියයට විසි අටකින් මේ වන විට වන විනාශය සිදුවී තිබේ. එහෙත් පුදුමයට කරුණ වී ඇත්තේ බ්‍රසීල රජය මේ දත්ත ප්‍රතික්ෂේප කිරීමය.

පසුගිය වසරේ ඇමසන් මහ වනය දැවෙන විට මුළු ලෝකයේම අවධානය ඒ වෙත යොමු වූ නමුත් මේ වසරේ තවමත් පැතිර යන කොවිඩ් වසංගතය හමුවේ ඇමසන් වනය සම්බන්ධව ලෝකයේ සෙසු රටවලින් එල්ල වී ඇති අවධානය අවමය. බොහෝ රටවල් වයිරසය පැතිර යෑම වළක්වා ගැනීමට සටන් කරමින් සිටින අතර තවත් රටවල් බිඳ වැටී ඇති තම ආර්ථිකයන් යළි ශක්තිමත් කර ගැනීමට කැස කවමින් සිටිති.

එබැවින් පසුගිය වසරටත් වඩා හානියක් ඇමසන් කලාපයේ සිදුවුවද ඒ සම්බන්ධව බ්‍රසීල පාලනාධිකාරියට එල්ල වන චෝදනා අවම වී තිබේ. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් බ්‍රසීල ජනාධිපති ජාර් බොල්සෙනාරෝ ඇමසන් වනයේ ගිනි ගැනීම්වලට අදාළ දත්ත විශ්වසනීය ලෙස මාධ්‍ය වෙත ඉදිරිපත් නොකරන බවටද චෝදනා එල්ල වී තිබේ. අන්ත දක්ෂිණාංශික බොල්සෙනාරෝ පසුගිය වසරේදී ඇමසන් ගිනි ගැනීම සම්බන්ධව ඇති වෙන්නට ලෝකයෙන් බැණුම් අසා ගත්තේය. ඒ හේතුවෙන්ම ඔහු මෙවර නිශ්චිත තොරතුරු ප්‍රසිද්ධ නොකිරීමට වග බලා ගන්නට ඇතැයි සිතිය හැකිය.

පසුගිය මාස කිහිපයේදී ලෝකයේ දෙවැනියට වැඩිම කොවිඩ් රෝගීන් බ්‍රසීලයෙන් වාර්තා වීම ඇරඹීමත් සමඟ බ්‍රසීල ජනාධිපති බොල්සෙනාරෝ තම නිලධාරීන්ට නියෝග කර සිටියේ දෛනිකව කොවිඩ් ආසාදිතයන් පිළිබඳ දත්ත වාර්තා කිරීම අවශ්‍ය නොවන බවයි.

එහෙත් ජනාධිපතිගේ මෙම නියෝගයට විරුද්ධව එරට අධිකරණය තීන්දුවක් ලබා දුන්නේ දෛනිකව කොවිඩ් ආසාදියන් සම්බන්ධව නිශ්චිත තොරතුරු ප්‍රසිද්ධ කළ යුතු බවටය. මේ අනුව පොදු ජනතාවට, ජනමාධ්‍යයට මෙන්ම සෙසු රටවලටද දත්ත වසංකිරීම යනු බොල්සෙනාරෝට නුපුරුදු දෙයක් නොවන බව පෙනේ.

කෙසේ වුවද ඉහත කී පර්යේෂණය සිදුකළ සංවිධාන වැඩිදුරටත් පෙන්වා දී ඇත්තේ මුළු ලෝකයටම උරුම සම්පතක් වන ඇමසන් වන විනාශ කිරීම නවත්වා නොගැනීමෙන් ප්‍රථමයෙන්ම දුර්විපාකවලට මුහුණ දීමට සිදුවනු ඇත්තේ බ්‍රසීල ජනතාවටම බවය.

වසරක් පුරා වන ගහනය අඩු වීමෙන් ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමට අමතරව රට වසා පැතිර යන දුමාරය හේතුවෙන් එරට ජනතාවට ශ්වසන ආබාධවලට විශල ලෙස ගොදුරුවීමට සිදුවනු ඇති බවට ඇමසන් පාරිසරික පර්යේෂණ මධ්‍යස්ථානය අනතුරු අඟවා තිබේ.

එහෙත් මේ සඳහා පිළිතුරු ලෙස බ්‍රසීල රජය පවසා ඇත්තේ පසුගිය වසරේ එළිපෙහෙළි කළ බිම් පවා මේ වසරේදී ගිනි තැබීමෙන් මෙලෙස වැඩි හානියක් ලෙස වාර්තා වී ඇති නමුත් එය එසේ නොවන බවයි.

එහෙත් සිදුවෙමින් පවතින වන විනාශය ලෝකයෙන් සැඟවීම යනු තමන්ගේ මිනී වළ තමන්ම කපා ගැනීමක් බව බ්‍රසීලය තේරුම් ගන්නේ නම් එය සමස්ත පෘථිවි වාසීන්ට වැදගත් වනු ඇත.

දූෂිත අගමැති නෙතන්යාහුට ඉල්ලා අස්වන ලෙස බල කරමින් පැවති විරෝධතාවක්

නෙතන්යාහු දේශපාලන දියසුළියක් අබියස

සක්වළ ගල

● විරෝනි වෑවලගේ

බෙන්ජමින් නෙතන්යාහු යනු සුළු කොට තැකිය යුතු පුද්ගලයකු නොවේ. මේ සටහන ඇරඹීමට පෙර එසේ ලියා තැබිය යුතුය. එමෙන්ම ඊශ්‍රායල් යනුද සුළු පටු රටක් නොවන බවද කිව යුතුය. ඊශ්‍රායල් යනු ලෝක බලවතුන් විසින් බලහත්කාරයෙන් බිහි කරවනු ලැබූ රටකි. ඒ මැද පෙරදිග කලාපයේ ඉතා ශුෂ්ක භූමියකය. තමන්ට ලැබුණු ඒ ශුෂ්ක බිම් කොටස මත ලෝකයේ ධනවත්ම රටක් බිහි කිරීමට එරට වැසියෝ ඉතා කෙටි කලකින්ම සමත් වූහ. එපමණක්ද නොව තම භූමියේ මුල් හිමිකරුවන්ට මදි නොකියන්නට පීඩා ගෙනදීමටද ඊශ්‍රායලය පසුබට වූයේ නැත. බෙන්ජමින් නෙතන්යාහු දීර්ඝතම කාලයක් ඊශ්‍රායලය පාලනය කළ අගමැති වන්නේ එවන් වූ රටේය.

ඊශ්‍රායල් රාජ්‍යය ස්ථාපිත කළදා සිට පත් වූ පාලකයෝ කිසිසේත් අදක්ෂයන් වූයේ නැත. නෙතන්යාහුද අයත් වන්නේ එකී කුලකයටය. එහෙත් එරට මෙතෙක් සිටි කිසිදු පාලකයකු නෙතන්යාහු තරම් දක්ෂ නොවූ බවත්, සුක්ෂ්ම නොවූ බවත් කිව යුතුය.

මේ වන විට බෙන්ජමින් නෙතන්යාහු එරට අගමැති ලෙස ස්වකීය දෙවැනි ධූර කාලය දරමින් සිටින්නේය. ඒ අතරම ඔහුට විරුද්ධව එරට අධිකරණයේ නඩුවක්ද විභග වෙමින් පවතින්නේය. ඒ දූෂණ චෝදනා සම්බන්ධයෙනි. මේ අතර ගත වී යන මොහොත වන විටත් ඊශ්‍රායල් ජනතාව දහස් ගණනින් වීදි බසිමින් නෙතන්යාහුට විරුද්ධව විරෝධතා පවත්වන්නේය. එහෙත් ඔහු ඒ කිසිවක් තුටුටුවකට මායිම් නොකරමින් ඇමරිකාවේ සංචාරයක නිරත වන්නේ මැදපෙරදිග කලාපයට අදාළ ගිවිසුම් කිහිපයක් අත්සන් කිරීමේ මුවාවෙනි.

මේ සියල්ල මත අද වන විට ලෝක දේශපාලන විචාරකයන්ගේ ඇස් ඊශ්‍රායලය දෙසට යොමු වී පවතින්නේය.

2009දී ප්‍රථම වරට ඊශ්‍රායලයේ බලයට පත්වන නෙතන්යාහු දේශයට ස්ථාවරත්වය ලබා දෙන අතරම සෙසු පක්ෂවල ස්ථාවරත්වය නැති කර දැමීමටද වග බලා ගත්තේය. එහෙත් එසේ වූ පමණින් එරට ජනතාව නෙතන්යාහුට කැමති වූයේද නැත. වඩා බුද්ධිමත් ඊශ්‍රායෙල් ජනතාව දේශපාලනඥයන් කෙරෙහි විශ්වාසය තැබීමට කිසිදා හදිස්සි නොවූහ. 2009දී ද නෙතන්යාහු බලයට පැමිණියේ සන්ධානයක් සමගින් වීම ඒ සඳහා හොඳ උදාහරණයකි. 2013 සහ 2015 වසරවලදීද ඔහුගේ ලිකුද් පක්ෂය ජයග්‍රහණය කරා මෙහෙයවීමට නෙතන්යාහුට හැකියාව ලැබිණි. එහෙත් එසේ වූයේ ඉතා සුළු බහුතර ඡන්ද සංඛ්‍යාවකිනි. කෙසේ වුවද 2019 පැවති මැතිවරණයේදී නෙතන්යාහුට මුහුණ දෙන්නට සිදුවූයේ ඉතා අසීරු අභියෝගයකටය. එවර ඔහුට හෝ විරුද්ධ නිල් සුදු සෙන්ට්‍රිස්ට් පක්ෂයේ බෙනී ජෙන්ට්ස්ට ආණ්ඩුවක් පිහිටුවීමට හැකියාව ලැබුණේ නැත. එමගින් අදහස් වූයේ ඊශ්‍රායලයේ පවතින දේශපාලන රටාව මෙන්ම දේශපාලනඥයන්ද ජනතාව ප්‍රතික්ෂේප කර ඇති බව නොවේද? එහෙත් එම ඓතිහාසික අවස්ථාවේදී ජනතා ප්‍රතික්ෂේපයද තම වාසියට හරවා ගත් ඊශ්‍රායල් දේශපාලනඥයන් යළිත් සන්ධානයක් කරා ගියහ. එවර එකිනෙකා ප්‍රතිවිරුද්ධව ඡන්ද සටනේ නියැළුණු පක්ෂ දෙක එක්වූ අතර අගමැති ධූරය පක්ෂ නායකයන් දෙදෙනා අතර හුවමාරු කර ගැනීමේ අපූරු ගිවිසුමක්ද ඊට එක් විය. ඒ අනුව නෙතන්යාහු යළිත් තම අගමැති ධූර කාලය ඇරඹූ අතර එම ධූර කාලය 2021 නොවැම්බරයේදී බෙනී ජෙන්ට්ස්ට ලබා දීමට නියමිත විය.

එහෙත් යළිත් තම පාලන කාලය ඇරඹූ නෙතන්යාහුට සුවසේ ඉන්නට හැකියාව ලැබුනේ ඉතා කෙටි කලක් පමණක් විය. මීට පෙර ඔහු වෙත එල්ල වී තිබුණු දූෂණ චෝදනා සම්බන්ධ නඩු විභාගයද ආරම්භ කිරීමට එරට අධිකරණය කටයුතු කළ අතර ඒ සමගම ඊශ්‍රායලය පුරා අගමැති නෙතන්යාහුට විරුද්ධ මහා විරෝධතා රැල්ලක් ආරම්භ විය.

ලෝකය පුරා පසුගිය මාර්තුවේ සිට කොවිඩ් වසංගතය පැතිර යන අවස්ථාවේදී වයිරසය ඉතා සාර්ථකව පාලනය කළ රටක් ලෙස ඊශ්‍රායලය පැසසුම් ලැබීය. එම ලකුණු සියල්ලද නෙතන්යාහු තම ගිණුමට දමා ගත්තේ ඒ වන විට ඔහුට එල්ල වී තිබූ දූෂණ චෝදනා නඩුව ඇසීම ආරම්භ වී තිබුණු බැවිනි. 2016 වසර වන විට නෙතන්යාහුගේ දූෂණ චෝදනා සම්බන්ධව විමර්ෂණ ඇරඹී තිබූ අතර ඒ සම්බන්ධව තොරතුරු සහ සාක්ෂි එක්රැස් කිරීම සිදුවෙමින් පැවතිණි. එහෙත් 2019 නොවැම්බර් මාසයේදී,එනම් ඔහු යළිත් වරක් අගමැති ලෙස පත්වීම් ලැබ ඉතා කෙටි කලකින්ම ඔහුට විරුද්ධව නඩු විභාගය ආරම්භ කෙරිණි. දැන් ඊශ්‍රායල් ජනතාව වීථි බසිමින් උද්ඝෝෂණ සිදු කරන්නේ අගමැතිට විරුද්ධ නඩු විභාගය සාධාරණ ලෙස පවත්වා ගෙන යන ලෙසටත්, එමගින් ජනතාවට සාධාරණය ඉෂ්ට කරන ලෙසටත් පවසමිනි.

මේ විරෝධතා රැල්ල පසුගිය සැප්තැම්බර් 12වැනිදා ඉතා උච්ච අවස්ථාවකට පත් වූ අතර එවර 10,000කට අධික පිරිසක් අගමැති නෙතන්යාහුගේ නිවස වැටලූහ.

ඔවුහු නලා පිඹිමින්, විරෝධතා පුවරු ඔසවමින්, සටන් පාඨ කියමින් නෙතන්යාහුට ඉල්ලා අස්වන ලෙස බල කළහ. ඒ හා සමාන ජන සහභාගීත්වයෙන් යුතු විරෝධතා එරට සෑම ප්‍රධාන නුවරකම පාහේ පවත්වන්නට ඊශ්‍රායෙල් ජනතාව කටයුතු කර තිබිණි. එහෙත් නෙත්නයාහුට ඒ කිසිවක් ඇසුණු බවක් පෙනෙන්ට තිබුණේ නැත.

නෙතන්යාහුට එරෙහිව විරෝධතාවල නිරතවන ඊශ්‍රායල් ජනතාව

එරට ජනමාධ්‍ය වාර්තා කර තිබුණේ සෑම සතියකම විරෝධතාකරුවන් 10,000කට අධික පිරිසක් ජෙරුසෙලෙම් නුවර විරෝධතාවන්ට එක්වන බවයි. ජනතාව මේ විරෝධතාවලට එක්වන්නේ තවමත් කොවිඩ් වසංගතය පැතිර යමින් පවතින අවස්ථාවක බවද සිහිපත් කළ යුතුය.

ඊශ්‍රායලය කොවිඩ් වසංගතය පැතිර යෑම ආරම්භ වූ අවස්ථාවේදීම වසා දැමීමට නෙතන්යාහු කටයුතු කළ අතර මේ දක්වා එරටින් වාර්තා වී ඇති සම්පූර්ණ ආසාදිතයන් සංඛ්‍යාව 1,50,000කි. මරණ සංඛ්‍යාව 1000කට අධිකය. රට වසාදැමීමෙන් පසු ආර්ථිකයටද ප්‍රබල හානි සිදුවූ අතර මේ වන විට ඊශ්‍රායලයේ විරැකියාව සියයට 20 දක්වා ඉහළ ගොස් තිබේ. ජනතා විරෝධතා වැඩි දියුණු වීමට මේ සියල්ල හේතු වී ඇතැයි වාර්තා වේ.

ජනතාව නෙතන්යාහුට චෝදනා කරන්නේ අගමැති බලතල භාවිත කරමින් තම මඩිය තර කර ගන්නට ඔහු කටයුතු කළ බව කියමිනි. එහෙත් නෙතන්යාහු මේ චෝදනා සියල්ල ප්‍රතික්ෂේප කරමින් පවසන්නේ මේ සියල්ල වාමාංශික දේශපාලන එදිරිවාදීන් ගේ බොරු චෝදනා බවයි.

මේ අතර පසුගිය සතියේ නෙතන්යාහු සහ ඔහුගේ පවුලේ සාමාජිකයෝ පෞද්ගලික ජෙට් යානයකින් අමෙරිකාව බලා පියාසර කළේය.

එහිදී ඔහු ලෝකයට පවසා සිටියේ මැදපෙරදිග කලාපයට අදාළ ගිවිසුම් කිහිපයක් අත්සන් කිරීම තම සංචාරයේ අරමුණ බවයි. එහෙත් ඊශ්‍රායලය යනු අමෙරිකාවේ දරුවා බව ලොවට සැඟවීම විහිලුවකි. ඊශ්‍රායලය බිහි කිරීමේ සිට රට පවත්වාගෙන යෑම දක්වා සෑම අවස්ථාවකදීම ඇමරිකාවෙන් ලැබුණේ අප්‍රමාණ සහයකි. දැන් ඊශ්‍රායල දක්ෂිණාංශික පක්ෂවලට නොඅඩුව ලබා දෙන සහය මෙන්ම විශේෂයෙන්ම තමාට ලබා දෙන සහය අමෙරිකාවෙන් ලබා ගැනීමට නෙතන්යාහු මෙය අවස්ථාවක් කර ගන්නා බව නිසැකය.

වරක් ජනාධිපති බරැක් ඔබාමාගේ පාලන කාලයේදී ඇමරිකානු සෙනෙට් මණ්ඩලය අමතමින් අමෙරිකාවේ වැඩපිළිවෙළ තරයේ විවේචනය කිරීමටත්, එමගින් ඊශ්‍රායලය තවදුරටත් ඇමරිකාවේ සාක්කුවේ නැති බව ඇඟවීමටත් නෙතන්යාහු කටයුතු කළේය. එහෙත් පසුගියදා ඇමරිකාවට ගිය ඔහු ඩිමොක්‍රටික් පක්ෂ ජනාධිපති අපේක්ෂක ජෝ බයිඩන් හමුවීමට හෝ නොනැවතී යළි සිය රට බලා පැමිණියේ පවතින මොහොතේ තමාට සහය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් විය යුතුය.

කෙසේ වුවද ඇමරිකාවේදී එක්සත් අරාබි එමිරේට්ස් සහ බහරේන් යන රටවල් සමග ගිවිසුම් කිහිපයකට එළඹීමටද නෙතන්යාහු කටයුතු කර තිබේ. ඇමරිකාවට තමන්ට අවශ්‍ය අවස්ථාවේදී කතා කර ගැනීමට තරම් හිතවතුන් මැද පෙරදිග කලාපයේ හිඟපාඩුවක් නැත.

එහෙත් ලෝකයේ සෙසු රටවල් සම්බන්ධ කටයුතුවලදී ඇමරිකාවේ උදව්වෙන් ගොඩගියද තම රට අභ්‍යන්තරයේ ගැටලුවලට විරෝධතාවලට, ජනතා ප්‍රතික්ෂේපයන්ට ඇමරිකාවේ උදව් ලබා ගැනීමට නෙතන්යාහුට හැකි නොවනු ඇත. ඒ තම අගමැතිට 'දූෂිත අගමැති' යනුවෙන් අඛණ්ඩ චෝදනා එල්ල කරමින් පැතිර යන වසංගතය පවා සුළු කොට සලකමින් පාරට බැස සිටින ජනතාවක් යළි මුළා කිරීමට හැකි වනු ඇතැයි සිතිය නොහැකි බැවිනි.

කිසිදා නොනිමෙන අප්‍රිකාවේ සිවිල් යුද ගිනි

ලෝකයේ මහාද්වීප පහ අතරින් 'අඳුරු මහාද්වීපය' යන විරුදාවලිය ලබා සිටින්නේ අප්‍රිකා මහාද්වීපයයි. එසේ නම් ලැබීමට කරුණු කිහිපයක්ම හේතු විය. මහා කොංගෝ වනාන්තරයෙන් මහාද්වීපයෙන් අඩක් පමණ වැසී තිබීම හෝ සහරා කාන්තාරයෙන් ඊටත් වඩා වැඩි ප්‍රදේශයක් ජනශූන්‍යව පැවතීම ද එක් හේතුවක් වුවද වඩාත්ම ප්‍රබල හේතුව වූයේ අප්‍රිකා රටවල් බහුතරයක් දුහී බවින් දැඩි ලෙස පීඩා විඳීමයි. එමෙන්ම දුප්පත්කම තවත් වර්ධනය කරන අභ්‍යන්තර ගැටුම් සහ සිවිල් යුද්ධය අප්‍රිකානු රටවල ඉතාමත් සුලබය.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සොයා බැලූ විට පෙනී යන්නේ අප්‍රිකා මහාද්වීපයේ ඇති රටවල් 54න් රටවල් 49කම ගැටුම් හෝ සිවිල් යුද්ධ පවතින හෝ පැවති බවයි. ඇතැම් රටවල සිවිල් යුද ගිනි කාලානුරූපව නිවී ගියද ඇතැම් රටවල තවමත් අළුයට ගිනි පුපුරු පවතිනු දැකිය හැකිය.

දකුණු සුඩානය, ඇල්ජීරියාව, ඊජිප්තුව, සෝමාලියාව, කොංගෝ, චැඩ්, මධ්‍යම අප්‍රිකානු ජනරජය, කැමරූන්, උගන්ඩා, ලිබියාව, මොරොක්කෝ, සුඩානය, ටියුනීසියාව, මාලි, මුරිටානියා, නයිජර්, නයිජීරියා, බටහිර සහරා වැනි රටවල් මේ සඳහා උදාහරණ ලෙස ගත හැකිය. මේ රටවල පවතින අභ්‍යන්තර ගැටුම් ඇතැම්විට ජාතික වශයෙන් මෙන්ම ප්‍රාදේශීය මට්ටමින්ද ක්‍රියාත්මකය. බොහෝවිට මේ රටවල රජය සමඟ ගැටුම් ඇතිකර ගනිමින් සිටින්නේ ත්‍රස්තවාදී කල්ලි හෝ අන්තවාදී කණ්ඩායම්ය.

දකුණු සුඩානය සලකා බලන්නේ නම් එහි තැනින් තැන පවතින ගැටුම් රාශියක් දැක ගත හැකිය. ඇත්තෙන්ම දකුණු සුඩානය බිහිවූයේද ලේ විලක් මතිනි. සුඩාන රජය සමඟ දීර්ඝ කාලයක් තිස්සේ පැවති දරුණු ගැටුම් සහ ජීවිත හානි රාශියකින් පසුව දකුණු සුඩානයට වෙන් වීමට අවසර හිමිවිය.

එහෙත් දකුණු සුඩානය වෙනම රටක් ලෙස ක්‍රියාත්මක වීම ඇරඹීමෙන් පසුව වුවද එහි අභ්‍යන්තර ගැටුම් අවසන් වූයේ නැ. සිදුවූයේ පෙරදී සුඩාන රජය සමඟ පැවති ගැටුම වෙනුවට දකුණු සුඩානය පුරා තැනින් තැන කණ්ඩායම් කිහිපයක් සමග යුද වැදීමට දකුණු සුඩාන රජයට සිදුවීමය. 2009 සිට දකුණු සුඩානයේ පාරම්පරික එඩේරුන් රජය සමඟ ගැටුම් ආරම්භ කළ අතර සුඩානයෙන් වෙන්වීමේදී රුධිරයෙන් තෙත්වූ ඩාෆූර් භූමිය මේ වන විටත් මේ අර්බුද හේතුවෙන් මිනිස් රුධිරයෙන් පෙඟී යමින් තිබේ. මීට අමතරව 2011 සිට ක්‍රියාත්මක දකුණු සුඩාන වාර්ගික අර්බුදය සහ සුඩාන විප්ලවීය පෙරමුණ මෙන්ම සුඩාන පිබිදුණු විප්ලවීය පෙරමුණ සමඟ පවතින ගැටුම් අතරින් රට ඉදිරියට ගෙන යෑමට දකුණු සුඩාන රජයට සිදුවී තිබේ.

දකුනු සුඩානයේම ක්‍රියාත්මක වන තවත් අවිගත් කණ්ඩායමක් හේතුවෙන් දුක්විඳන රටකි උගන්ඩාව. දෙවියන්ගේ විරෝධතා හමුදාව නැතහොත් දෙවියන්ගේ විරෝධතා පෙරමුණ නම් වන මේ අවිගත් පිරිස දකුණු සුඩානයේ, උගන්ඩාවේ, මධ්‍යම අප්‍රිකානු ජනරජයේ මෙන්ම කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේද ක්‍රියාත්මකය. මේ අර්බුදයෙන් උගන්ඩාව දුක් විඳන්නේ මෑතක සිට නොව 1987 තරම් අතීතයේ සිටය.

මෙයට අමතරව මධ්‍යම අප්‍රිකාව මධ්‍යම අප්‍රිකානු සිවිල් යුද්ධයෙන් පීඩා විඳින්නේ 2012 වසරේ සිටය.

ඉහත කී ත්‍රස්තවාදී සංවිධානයට අමතරව කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආර්.ඩී.එෆ් නමින් හැඳින්වෙන මුස්ලිම් අන්තවාදී කණ්ඩායමක්ද ක්‍රියාත්මකව සිටී. ඒ 1996 වසරේ සිටය. එයට අමතරව කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ඉතුරි ප්‍රදේශයේ ජනවර්ග දෙකක් අතර 1999 සිට පවතින ගැටුම්කාරී වාතාවරණයද අතහැර දැමිය නොහැකිය. එමෙන්ම 2004 වසරේ සිට කොංගෝ ආරක්ෂක අංශ සහ හුටු ගෝත්‍රික ජනතාව අතර ඇවිළ යන සටන්ද නිතර කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සාමකාමී බව බිඳිමින් ආර්ථිකයටද තර්ජන එල්ල කරන්නේය. ශරීර ප්‍රමාණය හේතුවෙන් ලොව පුරා ප්‍රසිද්ධියක් උසුලන, කොංගෝ වනාන්තරය අශ්‍රිතව ජීවත් වන පිග්මී හට්වා ජනතාව සහ කොංගෝ රජය අතරද 2013 සිට සටන් ඇවිළෙමින් පවතී.

අප්‍රිකානු රටවල් රැසක පැතිරුණු තුවාලක් බඳු වූ බොකෝ හරාම් ත්‍රස්තවාදී මෙන්ම අන්තවාදී සංවිධානය හේතුවෙන් නොනවතින සටනක නියැළී සිටින රටක් ලෙස කැමරූන් රාජ්‍යය හඳුන්වා දිය හැකිය. කැමරූන් දේශයෙන් බෙදී වෙන්වීමට සටන් වදින බෙදුම්වාදීන් හේතුවෙන් ද කැමරූන් රාජ්‍යය තුළ දීර්ඝ කාලීන සටන් පවතී. මේ සටන් ඇම්බසෝනියා අර්බුදය නැතහොත් කැමරූන් සිවිල් යුද්ධය ලෙසින් හැඳින්වේ.

මධ්‍යම අප්‍රිකාවේ සුන්දර රටක් වන චැඩ් පීඩා විඳින්නේ එකිනෙක පැටළුණු අර්බුද රැසකිනි. ඒ අතර අල් කයීඩාව සහ තවත් මුස්ලිම් අන්තවාදී සංවිධාන කිහිපයක්ද, ඇල්ජීරියාවේ ක්‍රියාක්මක වන බෙදුම්වාදී සංවිධානයක්ද වේ. මේ සියලුම කණ්ඩායම් හේතුවෙන් චැඩ් හි වරින් වර ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ සටන් ඇවිළේ.

1991 සිට ඇවිළ යන තවමත් නිවෙන බවට ඉඟියක් හෝ නොමැති සෝමාලියානු සිවිල් යුද්ධය හේතුවෙන් සෝමාලියාව බොහෝ කටුක අත්දැකීම්වලට මුහුණ පා තිබේ. ඇල්ජීරියාවේ බටහිර සහාරා සටන් කලාපය ඇතුළු තවත් අභ්‍යන්තර අර්බුද රැසකි. ඊජිප්තුව පීඩා විඳින්නේ 2011 සිට තවමත් සටන් පවතින ඊජිප්තු විප්ලවය නම් වූ නොවිසඳෙන අර්බුදයෙනි.

2011 සිට ලිබියාවේ සිවිල් යුද්ධයක් පැතිර ගිය නමුත් ලිබියාව බිමටම ඇද වැටුණේ 2014 ඇරඹී, තවමත් කිසිඳු විසඳුමක් නොපෙනෙන දෙවැනි ලිබියානු සිවිල් යුද්ධයෙනි. මොරොක්කෝ, ටියුනීසියාව, එරිත්‍රියාව යන රටවලද නොවිසඳෙන සිවිල් ගැටුම් තැනින් තැන ඇවිළෙමින් තිබේ. 2012 සිට ඇවිළෙමින් තිබෙන උතුරු මාලි අර්බුදය හේතුවෙන් මාලි රාජ්‍යය පීඩා විඳිමින් සිටී.

මුරිටානියාව පීඩා විඳන්නේ 1970 තරම් ඈතක දී ඇරඹි එරට සිවිල් යුද්ධයෙනි. රටේ තැනින් තැන පැතිරෙමින් නොනැවතී ඇවිළෙන අභ්‍යන්තර අර්බුද රාශියක් හේතුවෙන් බිමටම හාන්සි වූ රටක් ලෙස නයිජීරියාව දැක්විය හැකිය.

බොකෝ හරාම් අන්තවාදීන්ට අමතරව නයිජීරියාව පුරා ආගමික ගැටුම් පැතිරෙමින් පවතින අතර, නයිජීරියානු සිවිල් යුද්ධයද තවමත් ක්‍රියාත්මකය. 1999 සිට මේ දක්වා නයිජීරියානු සහරා අර්බුදයද ක්‍රියාත්මකය.

මේ සටහන් කර ඇත්තේ අප්‍රිකා අඳුරු මහාද්වීපය පුරා රටවල් මුහුණ දෙමින් සිටින අභ්‍යන්තර අර්බුද සහ සිවිල් යුද්ධවලින් කොටසක් පිළිබඳවය. මේ වචන කිහිපයකින් දක්වා ඇති සටන් සහ අර්බුද හේතුවෙන් අහිමි වී ඇති ජීවිත සංඛ්‍යාව අති විශාලය. එපමණක් නොව මේ නොවිසඳෙන අර්බුද හේතුවෙන් මේ රට රටවල ආර්ථිකයන්ට සිදුවන පාඩුවද අති විශාලය. ඒ සියල්ලේ වක්‍ර ප්‍රතික්‍රියාව වන්නේ මේ රටවල් තවතවත් ණය කඳුවලට යටවීම සහ ණයබරින් පීඩා විඳීමය. ඒ සියල්ල යළි යළිත් අප්‍රිකාව අඳුරු මුල්ලටම තල්ලු කර දැමීමට සමත්ය. එබැවින් ප්‍රථමයෙන්ම ආගමික, වාර්ගික, ගෝත්‍රික අර්බුදවලින්, සිවිල් යුද්ධවලින් මිදීමට අප්‍රිකානු රටවල් කටයුතු කළ යුතුමය. එවැනි දිනක මේ සුන්දර මහාද්වීපයද තම ආලෝකය සෙසු ලෝකයට පෙන්වා දෙනු ඇත.

වැඩිදුර තොරතුරු සොයා බැලූ විට පෙනී යන්නේ අප්‍රිකා මහාද්වීපයේ ඇති රටවල් 54න් රටවල් 49කම ගැටුම් හෝ සිවිල් යුද්ධ පවතින හෝ පැවති බවයි. ඇතැම් රටවල සිවිල් යුද ගිනි කාලානුරූපව නිවී ගියද ඇතැම් රටවල තවමත් අළුයට ගිනි පුපුරු පවතිනු දැකිය හැකිය.

ඕස්ට්‍රේලියා - නවසීලන්ත ජනතාව කොවිඩ් නීතිවලට එරෙහිව පාරට බසිති

අමෙරිකාවෙන් ලද වැරදි ආදර්ශයක්ද?

වයිරසයේ ලෝක ව්‍යප්තිය ඇරඹී මාස හයක් ඉක්ම ගියද තවමත් වයිරසයේ පාලනය වීමක් හෝ ආසාදිතයන්ගේ අඩුවීමක් දක්නට නොලැබෙන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ අදහස වී තිබේ. මේ වන විට බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් සරසවියේ මෙන්ම රුසියාවේද කොවිඩ් සම්බන්ධව වඩා ආසන්නතම සාර්ථකත්වයන් පෙන්වූ එන්නත් අත්හදා බැලෙමින් පවතී. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ මේ වන විට වයිරසය ආසාදනය වීමෙන් සිදුවන මරණවල කිසියම් අඩුවක් දක්නට ලැබුණද වයිරසය ආසාදනය වීමේ නම් කිසිඳු අඩුවක් දක්නට නොලැබෙන බවයි. පසුගිය සතියේ සමස්ත ලෝකයේ දිනකට වාර්තා වූ කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ තුන ඉක්මවූ බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දී තිබේ. ඔවුන් පවසන්නේ මේ අනුව වයිරස ව්‍යප්තියේ දැවැන්ත වර්ධනයක් මිස කිසිඳු අඩුවක් දැක ගත නොහැකි බවයි.

අනුමාන කළ පරිද්දෙන්ම පසුගිය සතිය තුළ බ්‍රසීලය ඉක්මවමින් ඉන්දියාව ලෝක කෝවිඩ් සටහනේ දෙවැනි තැනට පැමිණි අතර මේ වන විටත් දිනකට ඉන්දීය ජාතිකයන් ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් වයිරසයට ගොදුරු වෙමින් තිබේ. මේ වන විට ඉන්දියාවෙන් වාර්තා වී ඇති කොවිඩ් මරණ සංඛ්‍යාවද ලක්ෂයට ඉතා ආසන්නය. ඉන්දියාවේ එසේ වන විට ඇමරිකාවෙන් සහ බ්‍රසීලයෙන් දිනකට ආසාදිතයන් පනස් අදහසට ආසන්න සංඛ්‍යාවක් වාර්තා වෙමින් තිබේ.

එහෙත් කොවිඩ් සටහනේ ඉදිරියෙන්ම සිටින අමෙරිකාව ලොව අන් කිසිඳු රටකට නොදෙවෙනි ආසාධිතයන් සංඛ්‍යාවක් වාර්තා කර තිබේ. මේ වන විට අමෙරිකාවෙන් වාර්තා වී ඇති සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 67 ඉක්මවා තිබේ. සමස්ත මරණ සංඛ්‍යාව ලක්ෂ දෙකකට ආසන්නය. ඉන්දියාවේ සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව ලක්ෂ 47 ඉක්මවා තිබේ.

මේ හැරුණු විට ලෝකයේ සෙසු සෑම රටකම වයිරසය ආසාදිතයන්ගේ වර්ධනයක් දක්නට ලැබේ. එහෙත් ලොව සියලුම රටවල් තම ආර්ථිකයන් පවත්වා ගනිමින් අභ්‍යන්තර කටයුතු ඉදිරියට ගෙන යමින් සිටිති. ලොව පුරා සංචාරක කර්මාන්තය ඉතා දරුණු ලෙස කඩා වැටී ඇති අතර ගුවන් ගමන්ද තවමත් පෙර පරිදි සිදු නොවේ. බොහෝ රටවල් තම ගුවන් තොටුපොළ විවෘත කර නොමැත. එහෙත් නෞකා මගින් භාණ්ඩ ප්‍රවාහනය අඛණ්ඩව සිදු වේ.

පෘථිවියේ දක්ෂිණ අර්ධ ගෝලයට වයිසරය සාපේක්ෂව සිදු කළ හානිය අවම යැයි පැවසිය හැකිය. විශේෂයෙන්ම දක්ෂිණ අර්ධ ගෝලයේ පිහිටා ඇති ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය යන රටවල කොවිඩ් ආසාදිතයන් වාර්තා වූයේ අවම වශයෙනි. එහෙත් වයිරසය පාලනය කර ගැනීමට ඔවුන්ටද හැකියාව ලැබුණේ නැත. වයිරසයේ ලෝක ව්‍යප්තියෙන් මාස හයක් ගිය තැන මේ වන විට ඔවුන්ට රටවල් වසා දමමින් වයිරසයේ පැතිරීම පාලනය කිරීමට උත්සාහ දැරීමට සිදුවී තිබේ. එහෙත් මේ සඳහා එම රටවල ජනතාවගෙන් සහය දැක්වීමක් වෙනුවට ප්‍රබල විරෝධතා මතුවෙමින් තිබේ. ඔස්ට්‍රේලියාවේ මෙන්ම නවසීලන්තයේ ද ජනතාව වීථි බැස විරෝධතා දක්වමින් පවසා සිටින්නේ තමන්ට සාමාන්‍ය ජනජීවිතය පවත්වා ගෙන යෑමට අවස්ථාව ලබා දෙන ලෙසයි. එහෙත් සැබවින්ම පැවසිය යුත්තේ ඔවුන් එසේ විරෝධතා දැක්වීමට වඩා වසංගතයකින් රටක ජන සමාජයට, ආර්ථිකයට සිදුවිය හැකි හානිය අවබෝධ කර ගනිමින් කටයුතු කරන්නේ නම් වඩා වැදගත් වන බවයි.

මේ ජනතා හැසිරීම සැබවින්ම සමාන කළ හැකි වන්නේ අමෙරිකානු පුරවැසිය වසංගතය හමුවේ දැක්වූ හැසිරීමටය. ඔවුන්ද මෙලෙස විරෝධතා දැක්වූ අතර මේ දක්වා අමෙරිකාව තුළ වයිරස ව්‍යප්තියේ පාලනයක් දක්නට ලැබී නැත.

ලක්වළලල

● ටිරෝනි වැවලගේ

ලොව විශාලතම මැමත් අස්ථි නිධිය මෙක්සිකෝවෙන් හමුවෙයි

මැමත් ඇතුන් යැයි කී විශාල සිහියට නැගෙන්නේ ලොව පුරා ප්‍රේක්ෂකයන්ගේ සිත් බැඳ ගත් අයිස් ඒජ් කාටූන් චිත්‍රපට මාලාව. එහිදී ප්‍රධාන චරිත වන මැමත් ඇතුන් දෙදෙනා ලෝකයේ අන්තිම මැමත් ඇතුන් බව වරෙක කියවෙනවා. ඒ කියන්නේ ඔවුන් ලෝකයෙන් වඳ වෙමින් සිටින බවයි. අයිස් ඒජ් කතා මාලාවේ යොදා ගෙන තිබෙන්නේ මෙලෙස ලෝකයෙන් සම්පූර්ණයෙන්ම වඳ වී ගිය දැනට ලෝකයේ සිටින සාමාන්‍ය අලින්ට වඩා ශරීරයෙන් විශාල, එමෙන්ම අති විශාල දළ යුගලයන්ද සහිත ඇතුන් විශේෂයක්. පෘථිවිය මත අයිස් යුගය නිමාවත් සමඟම මේ සතුන්ද මෙලොවින් තුරන්ව ගිය බව විද්‍යාඥයන්ගේ මතයයි.

කෙසේ වුවත් ලොව පුරා තැනින් තැන මේ මැමත් ඇතුන්ගෙ ඇටසැකිලි සහ අස්ථි කොටස් වරින් වර හමුවූවා. ඒත් පසුගියදා ලෝකයේ එකවර හමුවූ විශාලතම මැමත් අස්ථි සමූහය අහම්බෙන් සොයා ගැනීමට ඉඳිකිරීම් වැඩබිමක සේවකයන්ට හැකියාව ලැබුණා. ඒ මෙක්සිකෝවේ මෙක්සිකෝ සිටි අගනුවරින්. මේ අගනුවර උතුරු ප්‍රදේශයේ බිම් කැණීමක් සිදු කිරීම ආරම්භ කරණු ලැබුවේ නව ගුවන් තොටුපොළක් ඉඳි කිරීමේ අරමුණෙන්. එහෙත් කැණීම් සිදුකරමින් පවතින අතර ඓතිහාසික මිනිසුන් මැමත් ඇතුන් ඇල්ලීමට යොදා ගත් උගුල් දෙකක කොටස් සොයා ගැනීමට ඔවුන්ට හැකියාව ලැබුණා. එතැන් සිට වැඩ බිම පුරාවිද්‍යා කැණීම් බිමක් බවට පත්වූයේ උගුල් පවතී නම් මැමත් ඇටසැකිලිද පවතින බවට කෙරුණු අනුමානය නිසා. සැබවින්ම ඒ අනුමානය නිවැරදි වූයේ ක්‍රමක්‍රමයෙන් පොළොව අභ්‍යන්තරයට කැණීම් සිදුකරද්දී මැමත් ඇටසැකිලි හමුවීමට පටන් ගත් නිසයි.

මේ වන විට මෙකී භූමියෙන් මැමත් ඇටසැකිලි 200ක් පමණ හමුවී තිබෙන බව මෙක්සිකෝ බලධාරීන් මාධ්‍යට පවසා තිබෙන්නේ. එහෙත් තවදුරටත් කැණීම් සිදුකෙරෙන අතර තවත් ඇටසැකිලි හමුවිය හැකි බවට ඔවුන් විශ්වාසය පළ කරනවා.

දැනට ගොඩගෙන ඇති ඇටසැකිලි පරීක්ෂා කළ විද්‍යාඥයන් අනුමාන පළ කර ඇත්තේ මේ ඇටසැකිලි අදින් වසර 10,000 – 13,000ත් අතර ජීවත් වූ මැමත් ඇතුන්ට අයත්වූ ඒවා බවටයි. මේ වන විට ගුවන් තොටුපොළ ඉඳිකිරීමට තෝරා ගත් භූමියෙන් ඉවතටද කැණීම් සිදුකරමින් පවතින අතර ඒ ප්‍රදේශය මිදී ගිය විලක මතුපිටක් බවට අනුමාන පහළ වී තිබෙනවා. අදාළ ප්‍රදේශයේ කැණීම් බාරව කටයුතු කරන පුරාවිද්‍යාඥ පේද්රෝ සන්චේස් නාවා පවසා ඇත්තේ ඔවුන් භූමිය තුළට කණින එක් පියරවක් පාසා ඇටකැබලි මතුවෙමින් පවතින බවයි.

මෙක්සිකෝවෙන් මේ මහා මැමත් ඇටකැබලි සමූහය සොයා ගැනීමට පෙර එකම ස්ථානයකින් වැඩිම මැමත් ඇට කැබලි මතුවූ ස්ථානය වූයේ අමෙරිකාවේ උතුරු ඩකෝටා ප්‍රදේශයෙනි.

එම භූමියෙන් මැමත් ඇතුන් 60 දෙනෙකුගේ ඇටසැකිලි සොයා ගනු ලැබීය. දැන් මේ ස්ථානය මේ වන විටත් ඇතුන් 200 ඉක්මවා ඇටසැකිලි මතු කර ගනිමින් ලොව වැඩිම මැමත් ඇටසැකිලි හමුවූ ස්ථානය බවට පත්ව තිබේ.

මෙලෙස හමුවෙමින් තිබෙන ඇටසැකිලි කොලොම්බියන් වර්ගයට අයත් මැමත් ඇතුන්ගේ අස්ථි බවට විද්‍යාඥයන් මත පළ කර තිබේ.

මේ කොලොම්බියන් වර්ගයේ මැමත් ඇතුන් උතුරු ඇමරිකා මහාද්වීපයට පැමිණ ඇත්තේ අදින් වසර මිලියනයකට පමණ ඉහතදී බවයි විශ්වාස කෙරෙන්නේ. මේ ඇතුන් සාමාන්‍ය ලෙස සිවු පා පොළොව මත තබා සිටගත් විට අඩි 14ක් පමණ උස බව බවයි විද්‍යාඥයන් පවසා තිබෙන්නේ.

උතුරේ බෞද්ධ නටබුන් යටපත් කොට ඉදි වූ වවුනිකුළම් හා වල්ලිපුරම් කෝවිල්

වල්ලිපුරම් කෝවිල

සිවපුරම් ශ්‍රී මලේ කෝවිල හා කණු පාදමක්

වල්ලිපුරම් බුදු පිළිමය



වල්ලිපුරම් රන් සන්නස

● රුක්ෂිලා වෙත්තමුණි

උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක අතරින් යාපනය හා මුලතිව් යනු බෞද්ධ වෙහෙර විහාරයන්හි නටබුන් විශාල වශයෙන් විසිර ඇති භූමියන්ය. ඒ අනුව වල්ලිපුරම් හි බෞද්ධ උරුමය පිහිටි භූමිය යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන අතර මුලතිව් දිස්ත්‍රික්කයට වවුනිකුළම් සිවපුරම් ශ්‍රී මලේ කෝවිල් බිමෙහි පිහිටි නටබුන් අයත් වේ.

මුලතිව් දිස්ත්‍රික්කය උතුරු පළාතේ ඊසාන දිගින් පිහිටි වර්ග කිලෝමීටර් 2617 ක වියළි කලාපයට අයත් භූමි ප්‍රමාණයෙන් යුක්තය. මෙහි සිවිල් පරිපාලනය මාන්තායි, තුණුක්කායි, ඔඩ්ඩුසුඩාන්,වැලිඔය, පුදුකුඩුරිප්පු හා මුහුදුබඩපත්තුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හයක් යටතේ ග්‍රාම නිලධාරි වසම් 136 කට බෙදා සිදු කරනු ලබයි. 1979 වසර තෙක්ම මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්ක වන්නි දිස්ත්‍රික්කයට අයත්ව පැවති අතර 1979 දි මුලතිව් නමින් අලුතින් දිස්ත්‍රික්කයක් පිහිටවනු ලැබීය. අතීතයේ දී පැරණි ලාංකීය පරිපාලනයේ පළාත් හා මායිම් බෙදීමට අනුව මුලතිව් හෙවත් මුල්ලේදූව නමින් හැඳින් වූ මෙම පෙදෙස රජරටට අයත්විය. ජනප්‍රවාදයට අනුව මූලදීප යනුවෙන් අතීතයේ දී හඳුන්වා ඇති අතර මුලතිව් යන්න ඉන් බිඳී ආ නාමය යැයි විශ්වාස කෙරේ.

ආචාර්ය ශිරාන් දැරණියගලයන්ගෙ පර්යේෂණ අනුව තහවුරු වූයේ මුලතිව් දිස්ත්‍රික්කය ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාධක බහුලව ඇති ප්‍රදේශයක් බවය. එනම් ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිතා කරන්නට ඇතැයි සැලකෙන ශිලා මෙවලම් ඉරණමඩු, මුලතිව් සහ මාන්කුලම ආශ්‍රිතව ලැබී ඇත. ආචාර්ය දැරණියගලයන් ඉරණමඩු වැව හා ආශ්‍රිත පෙදෙසින් ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ ස්ථාන කිහිපයක් අනාවරණය කර ගැනීමට සමත් විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2011 සිට සිදු කළ ගවේෂණය අනුව ඉරණමඩු වැවට බටහිරින් කොකාවිල් ප්‍රදේශයෙන් ප්‍රාග් ඓතිහාසික ජනාවාස සාධක වලින් යුත් විශාල භූමියක් හඳුනා ගනු ලැබීය.

වවුනිකුලම් වැව අසල වූ සිවපුරම් ශ්‍රී මලේ කෝවිල් භූමිය, මල්ලාවී ප්‍රදේශය, පුංචි කිරිඉබ්බන්වැව, කුම්භකරණමලෙයි, ඇඟැටුගස්වැව, කුරුන්දාවශෝක විහාරය ඇතුළු මුලතිව් දිස්ත්‍රික්කයේ අනාරක්ෂිත ස්ථානයන්හි තිබූ පෞරාණික නටබුන් රැස්කොට ගෙනවිත් තබා ඇති වැලිඔය පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදී ස්ථාන කිහිපයකින්ම ශිලාලේඛන හමු වූ බව මුලතිව් දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන මූලික ගවේෂණ 1-4 අදියරයෙහි දක්වා ඇත.

මෙම ශිලා ලිපි මගින් බොහෝ තොරතුරු ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට හැකි වූ බවත් ඒ අනුව අනුරාධපුර රාජධානියෙහි අවසන් කාල වකවානුව දක්වාම මෙම ප්‍රදේශ අනුරාධපුර පාලකයාට යටත්ව පැවති බවත් සනාථ වන බව සඳහන්ය. මහාචාර්ය සෙනරත් පරණවිතාන පෙන්වා දෙන පරිදි පළමුවන පරාක්‍රමබාහු රජුගේ නාගදීප ශිලාලේඛනය අනුව යාපනයේ සමස්ත ප්‍රදේශයම පොළොන්නරු යුගයේ දී අග රජුගේ පාලනය යටතේ පැවති බවට සාධක ලැබේ. එම පුවරු ලිපිය පොළොන්නරුවේ රජ කළ මහා පරාක්‍රමබාහු රජු විසින් පිහිටුවන ලද්දක් බව ශිලා ලිපියේම සඳහන් කොට ඇත.

සිවපුරම් ශ්‍රී මලේ කෝවිල මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්ලාවි ග්‍රාමයේ පාලිනගර් අංක 35 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ස්ථානයයි. වවුනිකුලම් වැව් බැම්ම ආසන්නයේ පිහිටි මෙම භූමියට ළඟා වීමට A 9 මාර්ගයේ මාන්කුලම් හන්දියෙන් වමට හැරී මල්ලාවි තුණුක්කායි මාවතේ කිලෝමීටර් 6 ක් ගමන් කොට නැවතත් වමට හැරී අම්බල්පුරම් මාර්ගයේ කිලෝමීටර් 6 ක් ගමන් කළ යුතුය.

ජනප්‍රවාදය අනුව එළාර රජු විසින් මෙම වැව තනා ඇති බව කියැවේ. ප්‍රමාණයෙන් විශාල වැවක් වූ මෙහි වැව පාමුල භූමියෙහි අනුරාධපුර යුගයට අයත් පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් නටබුන් විසිර පවතී. අතීතයේ දී පැරණි දාගැබ් හා නටබුන්ව ගිය ගොඩනැගිලි කිහිපයක අවශේෂ පැවති බවට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකළ ගවේෂණයේ දී ගම්මුන් ප්‍රකාශ කළ බව පෞරාණික ස්ථාන හා ස්මාරක - මුලතිව් දිස්ත්‍රික්කය (එම්. වී.ජී. කල්ප අසංග, අයි.පී.එස්.නිශාන්ත) යන ග්‍රන්ථයේ සඳහන්ව ඇත.

1967-1968 වසර වල පුරාවිද්‍යා පාලන වාර්තාවන්හි සඳහන් වන්නේ මෙම ස්ථානයේ හින්දු භක්තියන් විසින් තාවකාලිකව පොල් අතු ගෙයක් තනවා එහි පැරණි ශිව ලිංගයක් තබා වැඳුම් පිදුම් කළ බවය. වර්තමානයේ දී මෙහි සැලකිය යුතු මට්ටමේ විශාල කෝවිලක් බෞද්ධ නටබුන් මත ඉදිකර තිබේ.

මන්නාරම් දිසාව යටතේ 1964-1965 පුරාවිද්‍යා පාලන වාර්තාවෙ වවුනිකුලම් ගැන මෙසේ සටහන් කර ඇත.

"වන්නිවිලන්කුළම් කොට්ඨාසයේ වවුනිකුලම්හි යෝගපුරම් ජනපදයේ 'යුනිට් එකේ' පැරණි ස්ථානයක් තිබෙනවා. මෙහි අඩි 6 ක් පමණ උස ගල් පිළිමයක් තිබුණා. පිළිමය තිබුණ තැන ගඩොල් හා උළුකැට කැලි තිබෙනවා. මෙය ප්‍රතිමාඝරයක අවශේෂයන් වෙන්නට ඇතැයි සිතෙනවා. මේ අසල අඩි 11 ක් පමණ දිග ආසනගලක් තිබෙනවා. ස්ථානයේ ඇති ගඩොලක ප්‍රමාණය දිග අඟල් 16 යි. පළල අඩි 9 යි. ඝනකම අඟල් 3 යි. මෙහි තිබුණ බුදුපිළිමය අනුරාධපුරයේ කෞතුකාගාරයට ගෙන ගියා.... "

සිවපුරම් ශ්‍රී මලේ නටබුන්

එමෙන්ම එම වාර්තාවේම 49 වන පිටුවේ වවුනිකුලම වැව අසල පැරණි ස්ථානය යනුවෙන් මෙසේ වාර්තා කර තිබේ.

"වන්නිවිලන්කුළම් කොට්ඨාසයේ වවුනිකුළම් වැව පාමුල ශිව දේවාලයක අවශේෂයන් තිබෙනවා. දේවාල ගොඩනැගිල්ල තනා තිබෙන්නේ ගඩොලින්ය. වවුනිකුළම් වැව කැඩී යෑමේ දී මේ ගොඩනැගිල්ලේ අඩිතාලම පවා තැනින් තැන ගැලවී ගොස්ය. මෙහි කළු ගලින් නෙළන ලද ශිව ලිංගයක් තිබේ. දේවාලය ඉදිරිපිට ගල්කුලුනු හතරකින් සැදුණ ගොඩනැගිල්ලක අවශේෂයන් තිබේ."

1967-1968 වර්ෂයේ පුරාවිද්‍යා පාලන වාර්තාවේ පිටු අංක 35 හි මෙම ස්ථානය පිළිබඳව වවුනිකුළම යන මාතෘකාව යටතේ දීර්ඝව සටහන් කර ඇත.

"තුනුක්කායි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාසයේ වවුනිකුළම් නමැති වැව පාමුල තිබෙන පැරණි ස්ථානය පරීක්ෂා කරන ලදී. මෙහි එකට එක ලංව බෞද්ධ හා හින්දු අවශේෂයන් ඇත. මෙහි දැන් ඇති තත්ත්වයෙන් අඩි 5 ක් හා අඟල් 5 ක් උස හිස පාද සහ අත් රහිත හිටි බුදුපිළිමයක් ස්ථානයේ පස් වලින් වැසී තිබී හමුවිය. වැළලී ඇති පිළිමයේ සිට අඩි 70 ක් නිරිත දෙසින් කිසියම් ගොඩනැගිල්ලක ගල් කණු දෙකක් වේ. ඒ කණු අවට අඩි 23X3 ක් වූ පැරණි ගඩොල් අඩිතාලමක් මතුවී ඇත. තවද, මෙහි කැඩුණු මල් ආසනයක් ද කැඩුණු සඳකඩපහණක් ද හා ගල් උළුවස්සක කැබැල්ලක් ද තිබේ. මල් ආසනයට හා සඳකඩපහණට අඩි 90 ක් පමණ බටහිරින් බිම පෙරලී ඇති ගල් කුලුනු කැබෙලි හතරක් මෙන්ම ටැම් ලිපියක කොටසක් ද දක්නට හැකිය. මධ්‍යකාලීන සිංහල භාෂාවෙන් යුක්ත වූ මෙම ලිපිය ක්‍රි.ව. 9-10 අතර කාලයට අයත් යැයි සැලකේ. කපුටු රුවක් හා බල්ලෙකුගේ රුවක් කොටා ඇති මෙහි අක්ෂර පේළි 10 කින් යුත් ශිලා ලේඛනයක් ඇත. එහි ඇතැම් අක්ෂර මැකී ගොස් ඇති බැවින් සම්පූර්ණ අදහස ලබා ගැනීමට අපහසු වී ඇත.

ශිලා ලිපියට අනුව මහාවිහාරයේ නිලධාරීන් වැව් මෙහෙය සඳහා ලබාදිය යුතුය. එම සේවයේ නොයෙදෙන්නන් බලු, කපුටු ආත්මයන් ලබා ගන්නා බවත් සඳහන්ය.

ගෙවී ගිය සිරිපතුලක් සහ පැරණි ගඩොල් ද කණු පාදම් ගලක් ද දක්නට ඇත. සඳකඩපහණෙන් අඩි 200 ක් පමණ එපිටින් ප්‍රදේශයේ හින්දු භක්තිකයන් විසින් තාවකාලිකව පොල් අතු ගෙයක් තනා එහි පැරණි ශිවලිංගයක් තබා වැඳුම් පිදුම් කරනු ලැබේ. එම ගෙය ඉදිරිපස පැරණි එළිපත් ගලක් හා බොහෝ ගෙවී ගිය පැරණි සිරිපතුල් ගලක් ඇත. ශිවලිංගයට උතුරින් පැරණි ගොඩනැගිලි ඇති තැන් දක්වන ගොඩැලි තුනක් දක්නට ඇත. මෙයින් එකක සිටුවන ලද ගල් කුලුනු කැබෙලි දෙකක් තවම දක්නට ඇත. මෙම ස්ථානය කිසිවෙකුට පවරා නොදී පුරාවිද්‍යා කටයුතු සඳහා වෙන්කර දෙන මෙන් යාපනයේ දිසාපතිතුමාට දන්වා ඇත."

කෝවිලට දකුණු පසින් පිහිටි ස්ථානයක වර්තමානයේ දී ශිලා ස්තම්භ විශාල ප්‍රමාණයක් ගොඩගසා ඇති අතර එහි ශිලා ස්තම්භ අතර පැරණි උඩලිපතක හා යටලිපතක සාධක බැමි කොටස් කෝවිල තුළ දැකිය හැකිය. එමෙන්ම කෝවිල් බැම්මට පිටතින් ඇති ඉඩම්වල පැරණි ගොඩනැගිලි අවශේෂ විසිර පවතී. වවුනිකුළම් වාරි ඇළ හා කෝවිල අතර පිහිටි පෙදෙසේ ඇතැම් ස්ථානවල කණු පාදම්, ගල් කණු කොටස්, පැරණි උළු හා වළං කැබලි මෙන්ම ගඩොල් ද දක්නට ලැබේ.

ක්‍රමක්‍රමයෙන් සිදුවන කෝවිලේ සංවර්ධන කටයුතු හේතුවෙන් බොහෝ නටබුන් විනාශයට පත්ව ඇත. එහෙත් තවමත් චතුරාස්‍රාකාරව ඉදිව තිබූ පැරණි ගොඩනැගිලි පාදමක ශේෂ වූ සාධක දක්නට ලැබෙන අතර එහි පොළොවේ සිටුවන ලද කණු පාදම් ගල් 9 කින් යුක්තය. අනුරාධපුර යුගයට අයත් ප්‍රධාන සංඝාරාම සංකීර්ණයක් මෙහි තිබෙන්නට ඇතැයි යන්න ශේෂව ඇති නටබුන් හා ශිලාලේඛන අනුව අදහසයි.

වර්ග කිලෝමීටර් 1025 ක් පුරා පැතිරුණු යාපනය දිස්ත්‍රික්කය උතුරු දෙසින් කරෙයිගනර් සිට වල්ලිපුරම් දක්වා විහිදේ. අතීතයේ දී සිංහල ගම්මානයක් ලෙස වල්ලිපුරම් පැවතුන බවත් 'වැලිපුර' යන වචනය දෙමළ ඌරුවට වල්ලිපුරම් ලෙස ව්‍යවහාර වූ බවත් එල්ලාවල මේධානන්ද හිමි සඳහන් කරයි. මෙහි බෞද්ධ නෂ්ටාවශේෂයන් මැදිව ගොඩනැංවූ විෂ්ණු දේවාලයක් දක්නට ලැබේ. විශාල ප්‍රාකාරයක ශේෂයන් දේවාලය අසල වයඹ දිගින් ආරම්භව ගිනිකොණ දක්වා විහිදේ. දිග සැතපුමක් ඉක්මවන ප්‍රාකාරය පුළුල්ය. 1916 දී සටහන් කළ වාර්තාවක ප්‍රාකාරය මැනවින් ආරක්ෂිතව තිබූ බව සඳහන් වුව ද වර්තමානය වන විට බොහෝ සෙයින් විනාශ වී ඇත. මෙම විෂ්ණු දේවාලයට ආසන්නව ඊසාන දෙසින් කළ කැණීමක දී ප්‍රතිමාවක් මතු වූ අතර එය දිගින් අඩි 8 ක් පමණ උස හිටි පිළිමයකි. 1900 දී මෙම පිළිමය සොයා ගත් බව කියැවේ. වම් අත විනාශ වී තිබිණි. එහෙත් ප්‍රතිමාවේ සෙසු කොටස් දර්ශනීය නිර්මාණයක් ලෙස හොඳින් ආරක්ෂිතව පැවතුණි. යාපනය පැරණි උද්‍යානයේ බෝධි වෘක්ෂයක් මුල හේත්තු කර තබා තිබූ වල්ලිපුරම් බුදු පිළිමයේ පෞරාණිකත්වය පිළිබඳව වටහා ගත් සියම් රජු 1906 දි මෙරටට පැමිණි අවස්ථාවේ දී එය සිත්ගත් බව පැවසූ හෙයින් එකල සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාර හෙන්රි බ්ලෙක් විසින් ඔහුට එම පිළිමය පරිත්‍යාග කරනු ලැබූ බව සඳහන්ය.

මහාචාර්ය සෙනරත් පරණවිතාන පෙන්වා දෙන පරිදි පළමුවන පරාක්‍රමබාහු රජුගේ නාගදීප ශිලාලේඛනය අනුව යාපනයේ සමස්ත ප්‍රදේශයම පොළොන්නරු යුගයේ දී අග රජුගේ පාලනය යටතේ පැවති බවට සාධක ලැබේ. එම පුවරු ලිපිය පොළොන්නරුවේ රජ කළ මහා පරාක්‍රමබාහු රජු විසින් පිහිටුවන ලද්දක් බව ශිලා ලිපියේම සඳහන් කොට ඇත.

සිවපුරම් ශ්‍රී මලේ සෙල්ලිපිය

විෂ්ණු දේවාලය ඉදි කිරීමේ දී පැරණි අත්තිවාරම විනාශ වූ බවත් බොහෝ පුරාවස්තු යට වූ බවත් කියැවේ. එමෙන්ම දේවාලය ඉදිකිරීමට අත්තිවාරම කැපීමේ දී ගඩොළු බැම්මක වැලියට තිබී රන් තහඩුවක් 1936 දී හමුවිය. එය මෙරට ඉතිහාසයේ අලුත් කථිකාවක් ගොඩ නැංවීමට ඉවහල් වූ වටිනා පුරාවිද්‍යා සාධකයක්ය. අඟල් 03 ක් දිගැති අඟල් 01 පළලැති එහි අක්ෂර පේළි 04 කි. බ්‍රාහ්මී අක්ෂර 40 ක් මෙහි අන්තර්ගතය. වසභ රජුගේ (ක්‍රි.ව.67-111) රාජ්‍ය පාලන කාලය තුළ දී ඉසිගිරිය ඇමතිවරයා නකදිව ආණ්ඩු කරවන කාලයේ දී පියගුක තිස නැමැත්තා බදකර අතනෙහි විහාරයක් කර වූ බව එහි අර්ථයයි.

වල්ලිපුරම් සහ එහි නටබුන් පිළිබඳව ජේ.සී. දුවිස් තම සටහන්හි යම් විස්තරයක් දක්වා ඇත. එහි සඳහන් පරිදි ඔහු එම ස්ථානයට යන විට වැලිගොඩ මත විශාල විෂ්ණු කෝවිලක් ඉදිවෙමින් පැවතුණ අතර එහි සිටි බ්‍රාහ්මණ පූජකවරයා උතුරට හා දකුණට මුහුද අතර ගඩොලින් බඳින ලද ප්‍රාකාරයක නටබුන් දැකිය හැකිය යන්න ඔහුට පැවසූ බවත් එමෙන්ම පූජකයා විසින් වැල්ල හාරා ගඩොල් කැබලි කිහිපයක් මතුකොට පෙන් වූ බවත් දුවිස් තම වාර්තාවේ සටහන් කරයි. 1890 දී සොයා ගත් රන් කාසියක් පොලිස් විදානෙ කෙනකු සතුව තිබී ඔහුගෙන් ලබාගෙන එවකට පුරාවිද්‍යා කොමසාරිස් වූ එච්.සී.පී. බෙල් වෙත තමා යොමු කළ බවත් එම කාසි කවලම් රත්තරං වලින් සෑදූ ඉරක හෝ දරක නම් සිංහල කාසියක් බව ඔහු සටහන් කර ඇත. එහෙත් එල්ලාවල මේධානන්ද හිමි සඳහන් කරන්නේ මෙම කාසිය අක යනුවෙනි.

උතුරේ සහ නැගෙනහිර පළාත්වල විසිරි ඇති බෞද්ධ පූජනීය ස්ථාන වර්තමානය වන විට ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී. ඒ පිළිබඳව නිසි ඇගයුමක් කොට ක්‍රියාකිරීමට බලධාරීන්ගේ අවධානය යොමුවීම අනාගතය වෙනුවෙන් උරුමයන් ආරක්ෂා කර ගැනීමට ඉවහල් වනු ඇත.

ශායාරූප පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙ අනුග්‍රහයෙනි

මේෂ - සතිය මැද ගැටලු

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 07,08,09,10 යන ස්ථානවල ගමන් කිරීම සතිය ආරම්භයේ මංගලයෝග උදාවීම සිතේ සතුට ඇතිවීම පෙන්වන සුලු වුව ද සතිය මැද භාගය වනවිට කිරි කළයට ගොම වැටුණා සේ තම පවිත්‍රත්වයට හානි සිදුවීම වළකාගනු නොහේ. කෙසේ වුව ද සතිය අවසානයේ ඒ සියලු දේ මගහැරී ගොස් බොරදියේ පෑදි දිය සේ තත්ත්වය පැහැදිලිව සමනය වනු ඇත.

වෘෂභ - වස විෂ ශරීරගත වෙයි

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 06,07,08,09 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භය හා සතිය මැද ගැටලුවලට මුහුණදිය හැකි වුව ද සතිය අවසානය සතුටුදායක වෙයි. විශේෂයෙන් යටි බඩ ආශ්‍රිත රෝග කෑම බීම අජීර්ණවීම මෙන් ම මුත්‍රාගත ආපදා පැමිණෙන සතියකි. වස විෂ ශරීරගත වීමට පුළුවන පිටස්තර අය දෙන ලද ආහාරපාන පිළිබඳ සැලකිලිමත් වන්න.

මිථුන - සොර සතුරු බිය

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 05.06,07,08 යන ස්ථානවල ගමන් කරන මෙම සතිය ඔබට සතුටුදායක හා අසතුටුදායක ආරංචි රැසක් ලැබෙන සතියකි. ඔබගේ දරුවකු පිළිබඳ සතුටුදායක ආරංචි පසුව අසතුටුදායක ලෙස අසන්නට ලැබේ. මුලදී ආර්ථික වාසියක් පෙන්නුවද සතිය මැද ඒ සියල්ල තමාට අහිමි වන බව පෙනේ. නරක ආරංචි අතර සොර බිය සතුරු බිය සඳහා මුහුණදීමට සිදුවේ.

කටක - ආර්ථික ප්‍රතිලාභ රැසක්

කටක ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 04,05,06,07 යන ස්ථානවල ගමන් කරමින් ඔබට ආර්ථික ප්‍රතිලාභ රැසක් අත්කර දෙනු ඇත. විශේෂයෙන් වාහන මිලදී ගැනීමකට සූදානම් වන ඔබට ඉතා සුබ සතියකි. පපුවේ සෙම අධික වීම, හෘදය පිළිබඳ හා ස්වසන ආපදා එළඹිය හැකි නමුත් ඒවා බිය විය යුතු ඒවා නොවේ. නිතර ආගමික සහජීවනය සිතේ තබාගත යුතු සතියකි.

සිංහ - ඉඩකඩම් ලාභ

සිංහ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 03,04,05,06 යන ස්ථානවල ගමන් කරමින් ඔබට සතිය ආරම්භයේදීම ඉඩකඩම් ලාභ හිමිකම් උරුම කම් උදාකරදෙනු ඇත. එහෙත් ඔබගේ උරහිසට විය හැකි කිසියම් ආපදාවක් හේතු කොටගෙන සතිය අවසානයේ පීඩා විඳීමට සිදුවේ. සිතේ අධිෂ්ඨානය යහපත් අරමුණ ඒ හැම දෙයටම පිළියම නිසා උනන්දු වන්න. තම උනන්දු සහගත කටයුතු සඳහා අන් අයගේ නොමද සහය ලැබෙන සතියකි.

කන්‍යා - ලාභ ප්‍රයෝජන රැසක්

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 02, 03, 04,05 යන ස්ථානවල ගමන් කරමින් මීට පෙර කිසිදු ආකාරයක නොවූ යහපත්කම් ලාභ ප්‍රයෝජන අත්පත් වන සතියකි. ධනය නිලය පදවි තානාන්තර ලැබෙන ඒවායෙන් බැබළෙන අන්දමේ ක්‍රියා රැසක් තුළින් ඔබ සමාජයේ කැපී පෙනෙන තත්ත්වයකට පත්වේ. සතිය මැද භාගයේ තම ශාරීරික වෙහෙසකාරී තත්ත්වය නිසා විවේකීව ගත කිරීමට සිදුවනු ඇත.

තුලා - ව්‍යාපාර ප්‍රතිලාභ

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 01,02,03,04 යන ස්ථානවල ගමන් කරමින් ඔබට සිතේ සතුට, අභිවෘද්ධිය ගෙනදෙනු ඇත. තම මවු පාර්ශ්වයෙන් ලැබෙන වාසනාවන්ත ලැබීමකට හේතුවේ. තවද තමා විසින් ආයෝජනය කළ ව්‍යාපාරයක ප්‍රතිලාභ ලැබෙන්නට පටන් ගනී. ඔබ කිසියම් අතරමැදියකු ලෙස එනම් ඉඩම් විකිණීමේ බ්‍රෝකර්වරයකු නම් ඉතා උසස් ප්‍රතිලාභ ලැබෙනු ඇත. උගුරේ කටු සිරවීම තෛරොයිඩ් ආසාදිත හට ගැනීමට පුළුවන.

වෘශ්චික - යහපත් ආර්ථිකයක්

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 12, 01,02,03 යන ස්ථානවල ගමන් කරමින් කිසියම් සිත්තැවුලකට පත්වන ලකුණු පෙනේ. තමා විසින් වෙනත් අයකුට කරන ලද උපකාරයක් සඳහා ලැබෙන අසතුටුදායක ප්‍රතිචාරය නිසා අපහාස විඳින්නට සිදුවේ. හැකිතාක් එබඳු ක්‍රියා මේ සතිය තුළ අත්හරින්න හොඳට සිටි හිතවතුන් තමා අත්හැර යන සතියකි. විවාහක අය ඉතා ප්‍රවේශම්කාරී වන්න. දෙදෙනා අතර නිකරුණේ ප්‍රශ්න ගැටලු එළඹිය හැක. ආර්ථික ලැබීම් අතින් නම් සුබයි.

ධනු - හිසේ අමාරුවක්

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 11, 12, 01,02 යන ස්ථානවල ගමන් කරමින් හදිසියේ හටගන්නා හිසේ අමාරුවක් නිසා පීඩා විඳීමට සිදුවේ. සෙම ගතිය වඩන ආහාර පානයෙන් වැළකෙන්න. පිට පළාත්වල ගමන් බිමන් අවම කරන්න. ඕනෑවට වඩා පුද්ගලයන් විශ්වාස කරන්න යාම තුළ රැවටිලිවලට භාජනය වේ. තම දූ දරුවන් වෙනුවෙන් වෙහෙසී කටයුතු කිරීමට සිදුවන සතියකි.

මකර - රැකියා උසස්වීම්

මකර ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 10,11,12,01 යන ස්ථානවල ගමන් කරමින් ඔබගේ රැකියාවේ උසස් වීමකට හේතුවෙයි. බොහෝ විට ඔබ නොසිතූ අන්දමේ තනතුරු ලාභ ලැබීමට ඉඩ ඇත. කෙසේ වුව ද සිතේ නිහතමානීකම රඳවා ගතයුතු සතියකි. නැතොත් අභූත චෝදනා අන් අයගේ ගැරහිල්ලට භාජනය වන සතියකි. දණහිස ආශ්‍රිත උවදුරු වැටීම් තැලීම් සීරීම් ඇතිවිය හැකි නිසා කල්පනාකාරීවන්න. බොහෝ විට ඔබ වෙසෙන පෙදෙසෙන් වෙන්ව දුර බැහැර ගමනකට ද ඉඩ ඇත.

කුම්භ - ගෙදර දොරේ ආගමික පසුබිමක්

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 09, 10, 11, 12 යන ස්ථානවල ගමන් කරන මේ සතියේ ඔබට පෙර පිං මහිමය මතු කෙරෙනු ඇත. විශේෂයෙන් ගෙදර දොරේ ආගමික කටයුතු සිදුකරන පසුබිමක් දක්නට ලැබේ. ඒ සඳහා ඔබට අන් අයගේ ද සහයෝගය ලැබේ. සතිය අවසානයේ පාදයේ වළලුකරට විය හැකි ආපදාවකින් වේදනා විඳීමට සිදුවන අතර කල්පනාකාරීව කටයුතු කළහොත් ඒ අපහසුතා මඟ හරවා ගැනීමට සිදු වේ. තම ක්‍රියා කලාපය බොහෝ දෙනාගේ පැසසුමට භාජනය වනු ඇත.

මීන - නඩුවකින් ජය

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා මෙම සතියේ 08,09,10,11 යන ස්ථානවල ගමන් කරමින් ඔබට සතිය ආරම්භයේ කිසියම් අනතුරුදායකතත්ත්වයක් උදාවිය හැකි නමුත් කල්පනාකාරී වුවහොත් එම තත්ත්වයෙන් අත්මිදීමට පුළුවන් වෙයි. විශේෂයෙන් සතිය මැද භාගයේ සහ අවසාන භාගයේ ඔබට ලැබිය යුතු සියලු ජයග්‍රහණ හිමි වේ. අන්සතුවී තිබූ උරුමයක් තමාට හිමි වන සතියකි. පැවති නඩුවක් ඔබට වාසි සහගත අන්දමින් තීන්දු තීරණය වන සතියකි.

මංතීරු නීතිය සාර්ථකද? අසාර්ථකද?

සංවාද සටහන - සුභද්‍රා දේශප්‍රිය

කොළඹ නගරයේ හා ආසන්න පිවිසුම් මාර්ගවල තදබදය අවම කිරීමේ අරමුණින් පොලිසිය විසින් බස් ප්‍රමුඛතා මංතීරු නීතිය යළිත් වරක් පසුගිය 14 වැනිදා සිට ආරම්භ කරන ලදී.

මේ මංතීරු නීතිය කඩකරන්නන් හට 21 වැනි සඳුදා සිට දඩය රුපියල් දෙදහසකි.

කොළඹ ප්‍රධාන මාර්ග හතරක් මුල් කරගනිමින් බස් ප්‍රමුඛතා මංතීරු නීතිය යළි ඇරඹුණි. නොයෙක් පාර්ශ්වයන් මේ සම්බන්ධයෙන් විවිධ අදහස් දක්වන අතර ඇතැමුන්ගේ අදහස වන්නේ මේ ක්‍රමවේදය දිගටම අනුගමනය කිරීමෙන් මාර්ග තදබදයට විසඳුම් ලැබෙන බවයි.

එහෙත් තවත් පිරිසත් මේ ක්‍රමවේදයට විරෝධය දක්වන අතර එමගින් අනවශ්‍ය මාර්ග තදබදයක් ඇතිවන බව ඔවුන්ගේ අදහසයි. කෙසේ නමුත් 16වැනිදායින් පසුව මංතීරු නීතිය කඩකරන රියැදුරන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන බව පොලිසිය පවසා ඇත. දිනකට කොළඹ නගරයට ඇතුළුවන වාහන සංඛ්‍යාව ලක්ෂ පහකට අධික වන අතර රථවාහන තදබදය හේතුවෙන් මෙරටට වාර්ෂිකව රුපියල් බිලියන තුන්සියයක් අහිමි වන බවක්ද පැවසේ. කෙසේ වෙතත් මංතීරු නීතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් විද්‍යාත්මක ආර්ථික පදනම්වල සිට ඒ සඳහා නිසි රථවාහන කළමනාකරණයක් තිබිය යුතු බව විශේෂඥයන්ගේ මතයයි.

කොළඹ වැනි අධික ජනඝනත්වයකින් යුත් නගරයක 50%ක පිරිසක්වත් පොදු ප්‍රවාහනය පාවිච්චි කළ යුතු වන්නා සේම, වාහන ධාවනය නිසි කලමනාකරණයක් නොමැති වීමෙන් අනවශ්‍ය පෞද්ගලික වාහන සංඛ්‍යාවක් වාහන කොළඹට පැමිණීමෙන් මේ තදබදය ඇතිවන බව ප්‍රවාහන විද්වතුන්ගේ අදහසයි. මේ සඳහා විසඳුම වන්නේ දෛනිකව කොළඹ නගරයට ඇතුළුවන පෞද්ගලික වාහන සංඛ්‍යාව සීමා කිරීම හා පොදු ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම බවද එම විශේෂඥයන්ගේ අදහසයි. එමෙන්ම ගුණාත්මක භාවයෙන් යුත් දුම්රිය බස් රථ සේවාවක් ඇති කරමින් ජනතාවට කොළඹ නගරයට ඒමට සැලැසුම් සකස් කළයුතු බවද ඇතැමුන්ගේ අදහසයි.

මාර්ග නීති කෙතරම් තිබුණද තරගකාරීව ධාවනය කෙරෙන බස් රථවලින් මෙන්ම සෙසු වාහනවලින් සිදුවන අනතුරුද දිනෙන් දින ඉහළ යනු ඇති බවට මත පළ කෙරේ. රටක් ලෙස අපි ඉදිරියට යා යුතු සේම විනය ගරුක සමාජයක් බිහි කළ යුතුය. විනය මහා මාර්ගයේදී අනිවාර්යය වේ.

'නැවත අරඹමු මහ මග විනය " තේමාව යටතේ මංතීරු නීතිය නැවත ක්‍රියාත්මක කරමින් මහ මග විනය ආරක්ෂා කිරීමට සියලු පුරවැසියන් සහාය දිය යුතු සේම එය අද දවසේත් හෙට දවසේත් අපි කාගේත් යුතුකම සහ වගකීමද වන්නේය.

තදබදය අවම කරන්න අත්හදා බැලීමක්

මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබුවේ දැනට පවත්නා මාර්ග තදබදය අවම කිරීමටයි. මෙය යළිත් සිදු කරන අත්හදා බැලීමක්.

ප්‍රවාහන ඇමැති
ගාමිණී ලොකුගේ

මම හිතනවා මෙය සාර්ථක වෙයි කියලා. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බොහෝ කාලයක් තිස්සේ පැවැති මාර්ග තදබදයට පිළියමක් ලෙස මෙය දින කිහිපයක් පුරා අත්හදා බැලුවා.

විශේෂයෙන්ම මේ මංතීරු නීතිය ක්‍රියාත්මක වන්නේ කොළඹට පැමිණෙන ප්‍රධාන මාර්ග හතරක් හරහායි. ශ්‍රී ජයවර්ධන පුර මාවතේ කාසල් පාර, හෝර්ටන් පාර ආනන්ද කුමාරස්වාමි මාවත ලිබර්ටි වටරවුම දක්වා වූ මාර්ගයත්, බේස්ලයින් පාරේ කැලණි පාලම සිට බේස්ලයින් හන්දිය දක්වා මාර්ගයත්, හයිලෙවල් මාර්ගයේ අනුලා විද්‍යාලය, බේස්ලයින් හන්දිය තුංමුල්ල වටරවුම පුස්තකාල හන්දිය ආනන්ද කුමාරස්වාමි මාවත මල්පාර හන්දිය පිත්තල හන්දිය දක්වා වූ මාර්ගයත් ගාලුපාරේ විළියම් හන්දිය, (දෙහිවල) සිට ගාලු මුවදොර වටරවුම, ගාලු මැද පාර, එන්. එස් ඒ. වට රවුම දක්වා මාර්ග මූලික කරගනිමින් මෙම නීතිය ක්‍රියාත්මක වනවා.

කොළඹ නගරයට අඩුකාලයක් තුළදී වාහන ඇතුළු කිරීම මේ නීතිය හරහා සිදු කිරීමට බලාපොරොත්තු වෙනවා. එමෙන්ම වැඩි මඟීන් ප්‍රමාණයක් කොළඹට පැමිණෙන කැලණි වැලිමාර්ගයට අපි කඩිනමින් නව කාර්යාල දුම්රියක් යෙදවීමටත් බලාපොරොත්තු වෙනවා.

බස් මංතිරුවේ වෙනත් වාහන යන ක්‍රමයක් කොහේවත් නැහැ

මංතීරු නීතිය සාර්ථකද අසාර්ථකද කියන කාරණාවට වඩා මේ අවස්ථාවේදී අපි විමසිය යුතු වන්නේ මේ රටට ගැලපෙන රථවාහන කළමනාකරණ ක්‍රමයක් තියෙනවාද? යන්න ගැනයි. දියුණු රටවල්වල නම් මේ වගේ කරුණු විද්‍යාත්මක ආර්ථික පදනම්වල සිටයි අත්හදා බැලීම් කරන්නේ. හොඳ නරක තීන්දු තීරණ කරන්නේ ඒ අනුවයි. එක දවසක බස් මංතීරුව හොඳයි කියනවා. පස්සෙ කියනවා ඒ මංතීරුවෙන්ම ත්‍රි රෝද රථ යතුරු පැදිත් යන්න ඕන කියලා.

මොරටුව විශ්වවිද්‍යාලයේ
ප්‍රවාහන සහ කාර්යය උපාය
දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ
මහාචාර්ය අමල් කුමාරගේ

අපේ රටේ ගැසට් කරන ලද නීති තියෙනවා. පොලිසිය නීතිය රකින ආයතනයක් ලෙස ඒ නීති අනුවයි කටයුතු කරන්නේ. දියුණු රටවල මේ දේවල්වලට සෘජු වැඩපිළිවෙළක් තියනවා. ඒ ක්‍රම ක්‍රියාත්මක කරන්නේ පොලිසියෙන් නෙමෙයි. එම රටවල එවැනි සැලැසුම් ඇති වන්නේ සහ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේ ප්‍රවාහන අමාත්‍යාංශයේ සංවර්ධනය සහ ප්‍රවාහනය ගැන විශේෂ දැනුමක් ඇති ආයතනවලින්.

කොළඹ වගේ අධික ජනඝනත්වයක් තියෙන නගරයක නිසි කලමනාකරණයක් නැති නිසා තමයි වැඩියෙන් පෞද්ගලික වාහන කොළඹට ඇවිත් මේ තදබදය ඇතිවෙන්නේ.

මේ ගැටලුවට විසඳුම විය යුත්තේ පෞද්ගලික වාහන කොළඹට ඒම සීමා කරමින් පොදු ප්‍රවාහනය වැඩිකිරීමයි. පොදු ප්‍රවාහන ගුණාත්මකභාවය වැඩි කිරීමයි. දුම්රිය බස් රථවලින් ජනතාවට නගරයට ඒමට සැලැසුම් කිරීමයි.

මෝටර් රථ ප්‍රමුඛතා මංතීරුත් සමහරු ඉල්ලනවා. මම ලෝකේ කොහේවත් දැකලා නැහැ මෝටර් රථ ප්‍රමුඛතා මංතීරු තියෙන බවක්. ලෝකෙ හැම නගරයකම තදබදය තියෙනවා.

ඒ වෙනුවට ඒ අය විකල්ප සොයන්නේ වැඩි දෙනා යන පොදු වාහන තදබදය අවම කිරීමට ප්‍රමුඛතාවය දීමෙන්.

අඩු පිරිසක් යන වාහන වලට අඩු ප්‍රමුඛතාවය ලබා දීමයි මෙහිදී සිදු කරන්නේ. නමුත් අපේ රටේ සිදු කර ඇත්තේ මෝටර් රථවලට මංතීරු දෙකක් දීලා පොදු ප්‍රවාහනයට මං තීරු එකක් ලබා දීමයි. 60%ක පිරිසක් යන පොදු ප්‍රවාහන සේවය ක්‍රියාත්මක කරන බස් රථ මංතීරු එකකට දාලා. ඉතුරු මං තීරුදෙකම ලබා දී ඇත්තේ සියයට හතලිහක් යන ප්‍රවාහනයටයි.

මම දන්න විදිහට මේ ක්‍රමවේදය කිසිම ප්‍රවාහන සිද්ධාන්තයකට ගැලපෙන එකක් නොවෙයි. මෙය කවුරු නිර්මාණය කලාද කියලා මම දන්නේ නැහැ.

මෝටර්රථවල යන අය තමන්ගේ ගමන ඉක්මන් වූ නිසා මෙය සාර්ථකයි කියලා කියනවා ඇති. යම් ප්‍රවාහන මාධ්‍යයක් ඉක්මනින් යන්න පුළුවන් කියලා හිතුණොත් ජනතාව ඒ ප්‍රවාහන මාධ්‍යයට යොමු වෙනවා.

යතුරුපැදියේ සහ ත්‍රිරෝද රථයේ යන මඟියාත් මෝටර් රථයක් ගත්තොත් මොකද වෙන්නේ. ලංකාවේ මේ තත්ත්වය ඇති වුණා ම පොලිසිය ගන්න ක්‍රියාමාර්ගය කුමක්ද? සාර්ථකද අසාර්ථකද කියන කාරණාවට වඩා මෙතැන අපි තේරුම් ගත යුතු වන්නේ පොදු ක්‍රමවේදයක් අනුව පොදු ප්‍රවාහනය ශක්තිමත් කළ යුතු වීමයි. ප්‍රවාහන සිද්ධාන්ත සම්බන්ධ ආචාර්යවරුන් ලෙස මේ ක්‍රමවේදය අපේ සිද්ධාන්තවලට වෙනස්.

ලෝකයේ අනෙක් තැන්වල මේ දේවල් හොඳින් කළමනාකරණය කරද්දි අපි ඇයි වෙන දෙයක් කරන්නේ. කාගෙන් ද මේ අය උපදෙස් ගන්නේ. කාගේ දේවල් බලලාද මේවා කරන්නේ. ඒ ගැන අපිට නම් පිළිතුරු නැහැ. ලෝකයේ නගර දෙසිය ගණනක බස් ප්‍රමුඛතා මංතීරු තියනවා.

මේ ක්‍රමයේ සාර්ථක අසාර්ථක භාවය අපිට ඉදිරියේදී දැක ගන්න පුළුවන් වෙයි.

හිතු හැටියේ එක දවසක් එක දෙයක් කරලා ඉන් පස්සේ ඒක පැත්තක දාලා වෙන දෙයක් කරන එක සාර්ථක රථවාහන කළමනාකරණයක් නොවෙයි.

ලංකාවට ගැළපෙන ක්‍රමයක් එනතුරු මේ ක්‍රමය හොඳයි

මේය ලෝකයේ දියුණු රටවල තියෙන හොඳ ක්‍රියාමාර්ගයක්. ලංකාවෙත් මෙවැනි අත්හදා බැලීමක් කිරීම ගැන සතුටු වෙනවා අලුතින් යමක් පටන් ගත් විට ගැටලු ඇතිවිය හැකියි. ඒ දේවල් නිරාකරණය කරගනිමින් ඉදිරියට යෑමයි කළ යුතු වන්නේ. වාහන තදබදය මෙමගින් අඩුවෙනවා.

ලංකා අනතුරු වැළැක්වීමේ
සංගමයේ අධ්‍යක්ෂ හා
ඔටෝ මොබයිල් සංගමයේ
සභාපති
සුදම්මික කේමින්ද ආටිගල

ඒ නිසා අපි හැමදාම එක තැන ඉන්නේ නැතුව එක් එක් අත්හදා බැලීම් කළ යුතුයි. මෙය අලුත් ක්‍රියාමාර්ගයක්.

රජයේ ඒ ක්‍රියාමාර්ගයත් එක්ක අපි ඉන්නවා. ලෝකයේ දියුණු රටවල නගරවලට ඇතුළු වීමට වෙනම මුදලක් පවා ගෙවිය යුතුයි. ඒවගේම තනියම යනවට වඩා දෙන්නෙක් තුන්දෙනෙක් පෞද්ගලික වාහනයක යනවා නම් එහි දී වැය වන පිරිවැය අඩුවෙනවා. ආරක්ෂාව වියදම දෙකම සලකා බලා මෙවැනි අත් හදාබැලීම් කළොත් ඉතා සාර්ථක වෙන්න පුළුවන්. ලංකාවේ තත්ත්වයට අනුව එක් එක් අත් හදාබැලීම් කරමින් සාර්ථක ක්‍රමය තෝරාගන්නවා හැර එය විවේචනය කිරීම සුදුසු නැහැ.

අප කළ යුතු වන්නේ ඉදිරියේදී වඩාත් සුදුසු ක්‍රමයක් පිළිබඳව අවධානය යොමු කිරීමයි.

අපි ධනාත්මකව සිතිය යුතුයි. හදිසි අනතුරුවලින් මිය යාම අවම කරගන්න පුළුවන් මේ ක්‍රමවේද හරහා.

ඒ වගේම ආසන බඳ පටි නීතිය තදින් ක්‍රියා කිරීමත් ඉතා වැදගත්.

දැනට තියන නීතියේ හැටියට තිය ආසන සඳහා පමණයි ඒ නීතිය ක්‍රියාත්මක වන්නේ. නමුත් සියලු ආසන සඳහා බඳ පටි නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. එය අනෙක් රටවල්වල පවතින නීතියක්.

(ඡායාරූපය - විමල් කරුණාතිලක)

නීතිය කැඩුවොත් දඬුවම් ලැබෙනවා

මංතීරු සම්බන්ධයෙන් යළිත් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර තියෙනවා. එය සතියක් පුරා ක්‍රියාත්මක වුණා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ රට හදන සෞභාග්‍යයේ දැක්ම නම් වැඩ පිළිවෙළ යටතේ ගුණ ගරුක විනය ගරුක නීතිගරුක සමාජයක් බිහිකිරීම යටතේ මංතීරු නීතිය නියමු ව්‍යාපෘති ලෙස එය ක්‍රියාත්මක කළා.

රථවාහන පාලන සහ මාර්ග
ආරක්ෂාව පිළිබඳ අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
ඉන්දික හපුගොඩ

එහි අඩුපාඩු සලකා බලා සාකච්ඡා කරමින් 16වැනිදා යතුරු පැදි සහ ත්‍රිරෝද රථත් ඒ මාර්ගයේ වම් පස තීරුවේ ගමන් කිරීමට ඉඩ සැලැස්සුවා. ත්‍රිරෝද රථ සහ යතුරු පැදි මාර්ගයේ වම් පස සිට දකුණු පසට ගමන් කිරීමත් දකුණු පස සිට වම් පසට ගමන් කිරීමත් සමඟ මාර්ගයේ තදබදයක් ඇති වෙනවා. ඒ ගැන සලකා බලා මේ ක්‍රමවේදයේ විවිධ වෙනස්කම් ඇති කළා. මේ සම්බන්ධයෙන් මාර්ගය භාවිත කරන රියදුරන් පැදිකරුවන්ගෙන් හා ත්‍රිරෝද රථ රියදුරන්ගෙන් පොලිසිය ලෙස අපි ඉල්ලා සිටින්නේ නියම මංතීරුව භාවිත කරමින් අනතුරු අවම කර ගැනීමට වග බලා ගන්නා ලෙසයි. ඒ වගේම නියමිත වෙලාවට කළින් ඒ අයගේ අවශ්‍යතා ඉටු කර ගැනීමටත් මාර්ග ආරක්ෂාව තහවුරු කරගැනීමටත් කටයුතු කරන්න කියලා. පසුගිය මාස තුනක කාලයක් රටේ පැවැති කෝවිඩ් -19 හෙවත් කොරෝනා හේතුවෙන් මාර්ගය භාවිත කරන රියදුරු මහත්වරුන්ට නීතිය නැවත සිහිපත් කිරීමට 'නැවත අරඹමු මහ මඟ විනය'තේමාව යටතේ අපි කටයුතු ඇරඹුවා. බස් ප්‍රමුඛතා මංතීරුව ක්‍රියාත්මක වන්නේ සලකුණු කර සංඥා නාම පුවරු සඳහන් කළ මාර්ගවල පමණයි. එසේම එය පවතින්නෙත් උදෑසන 6.00 සිට 9.00 කාලය තුළ සහ සවස 4.00 සිට 7.00 දක්වාත් පමණයි. මේ හරහා උදෑසන කොළඹින් පිටවන හා සවස කොළඹට පැමිණෙන වාහනවලට ගැටලුවක් නැහැ ඒ නිසා තදබදයක් ඇතිවෙන්නේ නැහැ. වාහන නියමාකාරයෙන් මංතීරු භාවිත නොකළහොත් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරනවා.

විශේෂයෙන්ම මංතීරු නීතිය කඩකරන්නන්ට එරෙහිව ඉදිරියේදී සිසිටීවි මගින් නිරීක්ෂණය කරමින් නීතිය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. 2015 වසරේ නොවැම්බර් 12 වැනිදා නිකුත් කරන ලද 1940/21 ගැසට් ගැසට් පත්‍රයේ සඳහන් වන අයුරින් යතුරු පැදිකරුවන්ට සහ ත්‍රිරෝද රථ රියදුරන්ට තමන්ට රිසිසේ මාර්ගයේ එහා මෙහා යමින් වාහන ඉස්සර කිරීමට ඉඩ ප්‍රස්ථාවක් නොලැබෙන අතර එලෙස කටයුතු කරන්නන්ට එරෙහි ව නීතිය ක්‍රියාත්මක කරනවා. මේ සම්බන්ධයෙන් 1951 දරන මෝටර් වාහන පනතේ 148 වැනි වගන්තියේ පැහැදිලිව දැක්වෙනවා.

බස් මංතීරුව බස්වලට පමණක් විය යුතුයි

මේ කාර්යය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ගැටලු ඇති වේවි. මං තීරු තුන තියන පාරකත් මං තීරු දෙකක් තියෙන පාරකත් එක ක්‍රමයක් තියෙන්නෙ. ඒකයි මේ තදබදය.

ලංකා පෞද්ගලික බස් රථ
හිමියන්ගේ සංගමයේ සභාපති
ගැමුණු විජේරත්න

ගැසට් කරලා තියෙන්නේ මං තීරු තුනක් තියන පාරවල්වල පොදු ප්‍රවාහන සේවාව සංවර්ධනය කරනවා හැර අනිත් වාහනවලට ප්‍රමුඛතාවය දෙනවා නම් රටක් විදිහට ඉදිරියට එන්න බැහැ.

ත්‍රිරෝද, යතුරු පැදි බස්රථ එක් මංතීරුවකට ගෙන ඇති පියවර අසාර්ථකයි .

මෙම තීරණය ඉවත් කරගැනීමට පොලිසිය කටයුතු නොකළොත් සියලුම පෞද්ගලික බස් රථ ධාවනයෙන් ඉවත් කරගැනීමට ඉදිරියේදී පියවර ගන්න වෙනවා.

බස් රථ මංතීරු ගැසට් කර තිබියදීත් එහි ත්‍රිරෝද රථ සහ යතුරුපැදි ගමන් කරවීම නීති විරෝධියි.

ඒ සම්බන්ධයෙන් නීතියෙන් පියවර ගන්න වෙනවා. මෙය ප්‍රායෝගික වැඩ පිළිවෙළක් නොවන්නේ ත්‍රිරෝද රථයේ උපරිම වේගය පැයට කිලෝමීටර් 40 වීමත් මඟීන් හැටක් හැත්තෑවක් ප්‍රමාණයක් ගෙනයන බස් රථයක් එය පිටුපසින් ධාවනය කිරීම ඉතාමත් අසිරු වීමයි.

මෙයින් අනතුරු බහුල විය හැකියි. ඒ නිසා බස් මංතීරුවට වෙනත් වාහන යොමු කිරීමට අප විරුද්ධයි.

බස් එක්ක ත්‍රිරෝද රථ - යතුරුපැදිත් ගිහින් අනතුරු වැඩිවේවි

මඟී බස්රථ ප්‍රමුඛතා කියලා මුලින් මෙය ආරම්භ කළේ. දැන් ත්‍රිරෝද රථ යතුරුපැදි සියල්ල ඒකට දාලා. දැන් අපිට යන්න බැහැ. හැමදාම දරුවන් පාසලට ගෙනිහින් බස්සන්න ප්‍රමාද වෙනවා. පෙර තිබුණ ක්‍රමයට අනුව නම් පාසල් බස්රථ මඟී ප්‍රවාහන බස් රථ පමණක් තිබුණා නම් මේ මංතීරු ක්‍රමය සාර්ථකයි.

සමස්ත ලංකා පාසල් සිසුන්
ප්‍රවාහන සංගමයේ ලේකම්
ලලිත් චන්ද්‍රසිරි ප්‍රනාන්දු

දැන් මේ ත්‍රිරෝද රථත් වම් තීරුවට දාලා ප්‍රමුඛතා මංතීරුවට ඇතුළත් කළාම ඒ අයට යන්නත් බැහැ.

අපිට යන්නත් බැහැ. අනික් කාරණාව හදිසි අනතුරු බහුල වෙන්න පුළුවන්. දැනටත් අපි පෞද්ගලික බස් රථ සමඟ යන්නෙත් හුගාක් අමාරුවෙන් අපි ඉතා ප්‍රවේශමෙන් පරික්ෂාකාරීව කළ යුතු කාර්යයක් කරන්නේ. අපි සමඟ යන්නේ දරුවො.

ආරම්භයේදී තිබුණු ක්‍රමය ඉතා හොඳයි. කලින් ගියා වගේ ගියා නම් අපිට මේ ගැටලු නැහැ.

මෙය හරිම වදයක් ත්‍රිරෝද රථ එක්වරම නතර කරනවා. අපි කියන්නේ වමෙන් ගමන් කරන්න මඟී ප්‍රවාහන බස් රථ පමණක් යොදවන්න කියලා. මංතීරු දෙකක් තියන ප්‍රදේශවලත් මංතීරු ක්‍රියාත්මක කරනවා. බස් නැවතුමේ බස් එක නවත්වනවා.

පසුපසින් පාසල් බස් රථත් යනවා. කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ ඒ කාලේ. දැන් මේ ගැටලුව නිසා අනවශ්‍ය වාහන තදබදයක් ඇති වෙලා.

ත්‍රිරෝද රථ යතුරු පැදි වැනි වාහන ලොකු වාහන අස්සේ යනකොට අනතුරු වගේම අවහිරතා වැඩියි. බස් මංතීරුව බස්වලට පමණක් විය යුතුමයි

නීතිය අනුව ත්‍රිරෝද රථය වමෙන් පැදවිය යුතුයි

මංතීරු නීතිය හොඳයි. ඒත් අපේ රටේ තියෙන ගැටලුව මංතීරු ක්‍රියාත්මක කිරීමට තරම් පැහැදිලි මාර්ග සහ දුර සකස් වන ආකාරයක් නැති වීමයි. ඒ වගේම මාර්ගවල ප්‍රමාණයේ ගැටලු තියෙනවා. වමට - දකුණට හැරෙන පාරවල් තියන අවස්ථාවල අවහිර වෙනවා වැඩියි. අපේ රටේ මාර්ග පළලින් අඩු නිසා ප්‍රායෝගික ගැටලු රාශියක් තියෙනවා.

සමස්ත ලංකා ත්‍රිරෝද රථ
රියදුරන්ගේ සහ හිමිකරුවන්ගේ
සංගමයේ සභාපති
සුදිල් ජයරුක්

මෙවැනි නීති ක්‍රියාත්මක කිරීමේදී මහජනතාව මඟියන් සහ පාසල් දරුවන් අවහිරතාවට පත්වෙන්ට පුළුවන්. ඒ කෙසේ වෙතත් ක්‍රමවත්භාවය ඇති කිරීම ඉතා හොඳයි. . මින් පෙරත් මෙය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන අවස්ථාවලදී ඒ ගැන බලධාරීන්ට පැහැදිලි කළා. ත්‍රිරෝද රථ වමෙන් ගමන් කිරීමේ නීතිය යටතේ තියෙන නිසා ත්‍රිරෝද රථයට වමෙන් ගමන් කිරීමට ඉඩ ලැබිය යුතුයි. අනිවාර්යෙන්ම වම් පස තීරුවෙන් ගමන් කිරීමට ත්‍රිරෝද රථයට හැකි විය යුතුයි.

ත්‍රිරෝද රථයෙන් මඟීන්ගේ අවශ්‍යතාවය ඉටු කරගැනීමට නම් එය වමෙන් ගමන් කළ යුතුයි. අපේ රටේ මංමාවත් විශාල ලෙස ඉදි කිරීමට ඉඩ පහසුකම් නැහැ. ත්‍රිරෝද රථ ගමන් කළා කියලා බස් රථයට අවහිරයක් වෙන්නේ නැහැ. නාගරික ප්‍රදේශවල රථයක් ධාවනය කළ හැකි උපරිම වේගයක් තියෙනවා. බස් රථ වුවත් පැයට කිලෝමීටර් 40කට වඩා වේගයෙන් ධාවනය කළ නොහැකියි. එය නීතියක්. ඒ නීතිය අනුව වේගය පාලනය කිරීමේදී ත්‍රිරෝද රථයක් ගමන් කිරීමේදී අවහිරතාවයක් ඇතිවෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් විරෝධතා මතු කරනවාට වඩා මාසයක් පමණ මේ තත්ත්වයෙන් ගමන් කිරීමට ඉඩ දීලා නිරීක්ෂණයකට ලක්කළ යුතුයි. එහිදි නීති සම්පාදනය කෙසේ වෙතත් ප්‍රායෝගික වශයෙන් මෙය ක්‍රියාත්මක කළ හැකි ආකාරයට ක්‍රියාත්මක කළ යුතු වෙනවා. මීටත් වඩා හොඳ ප්‍රායෝගික ක්‍රමවේදයන් අනුගමනය කරන්නේ නම් ඉතා වැදගත් බවයි මගේ ආකල්පය.

සර් ජෝන්ගේ කියුම් කෙරුම් මෙන්න

පසුකාලීනව සමීපව ඇසුරු කළ ප්‍රවීණ මාධ්‍යවේදියා කියන කතාව

● නන්දසේන සූරියආරච්චි

අදට වසර හතළිහකට එපිට 1980 වසරේ එක් දිනකදී 'සිළුමිණ' පුවත්පතේ සේවය කළ මම රත්මලානෙ කඳවල වලව්වේ පදිංචිව සිටි සර් ජෝන් කොතලාවල මහතා මුණ ගැසීමට ගියෙමි. එවකට ලේක්හවුසියේ කර්තෘ මාණ්ඩලිකයන්ට ගමන් බිමන් යාමට තිබුණේ තරමක පැරණි වෑන් රථ කිහිපයකි. මා සමඟ ගිය රියදුරු වෑන් රථය නතර කළේ කඳවල වලව්ව ඉදිරිපිට පෝටිකෝව යට ශබ්ද නගා තිරිංග පාගමිනි.

ආලින්දයේ සනීප පුටුවක හිඳගෙන පුවත් පතක් බලමින් සිටි සර් ජෝන් තරමක තැති ගැනීමකට ලක්වන අයුරු මම දැක ගතිමි. දෑසේ උපැස් යුවළක් පැලඳ සරමකින් හා කමිසයකින් සැරසී සිටි සර් ජෝන් හමුවට ගිය මම 'සිළුමිණ' පුවත්පතින් පැමිණි බව ප්‍රකාශ කළෙමි. අපගේ ඒ හමුවීම පුරා මාස හත අටක් එක දිගටම සතිපතාම පැවැත්විණි.

තමාගේ ළදරු වියේ සිට ඒ වනවිට අසූතුන් වන විය දක්වා මතකය යළි යළි සිහි කරමින් ඔහු කළ කථා බහ අතිශය විචිත්‍රවත්ය. ඔහු නිවසේ ගත කළේ තනිවම වුවත් කර්තේලිස්, මර්තේලිස් යන සේවකයන් දෙදෙනාත් බණ්ඩා නමින් හැඳින්වුණ රියදුරාත් වූහ. ආහාර පාන පිළියෙල කිරීමට වලව්ව පිටිපස පදිංචි කර සිටි නිවෙස් හයක් විය. ඒ සෑම නිවසකම වැඩිපුර සිටියේ කාන්තා පක්ෂයයි.

අපගේ කථා බහ කෙළවර වනවිට සර් ජෝන් මගේ හොඳම මිතුරෙක් බවට පත්වී තිබිණ. පළමු දිනම ඔහු කොතරම් හිතවත් වූවාද කිවහොත් තම සමීපයන්ට කථා කරන 'උඹ - බාන් - බොලං' යන වදන් වලින් මා ඇමතීය. පළමු දින කඳවල වලව්වෙන් පිටවන්ට සැරසෙත්ම ඔහු මට නියෝගයක් කළේ ය.

"අනික් දවසේ උඹ එනකොට එන්නෙ මොන වෙලාවටද කියල කලින් ටෙලිෆෝන් කරපන්. හැබැයි එකක්, අර මෙහාට ආපු අර ඩක්කුවෙන් නම් එන්න එපා. මම උඹ කියන තැනකට මගේ කාර් එක එවන්නම්."

පළමු දිනයේ ඔහු සමඟ කළ කථා බහ පුවත්පතේ පළවූ පසු ඔහු එවකට පාවිච්චි කළ 5 ශ්‍රී 1 වාහනයෙන් කඳවල වලව්වට ගියෙමි. ඒ වනවිටත් සිය නිවසේ ආලින්දයේ මා ලියූ ලිපිය රියදුරු විසින් මහ හඬින් සර් ජෝන් සමඟ කියවන අයුරු මම දැක ගතිමි. මෙහිදී සර් ජෝන් විසින් කියන ලද කතා පුවත් මෙන් ම ඔහු පිළිබඳ මා දුටු පුවත් කිහිපයක් ද ඉදිරිපත් කරන්නේ, ජීවත්ව සිටියදී ඔහු ගැන ලියූ කරුණුවලට අමතරවය.

සර් ජෝන් කොතලාවල මහතාගේ පියා ජෝන් කොතලාවල යයි නම් දරා සිටි මෙරට පහළවූ අද්විතීය ශ්‍රේෂ්ඨ පුරුෂයාය. සර් ජෝන්ගේ පියාගේ හදිසි මරණය නිසා ජෝන් ලයනල්, ජස්ටින්, ප්‍රීඩා යන දරුවන් තිදෙනාත් ඇලිස් කොතලාවල ළමාතැනියත් ඉතාම අසරණ අඩියකට වැටුණි.

මේ වනවිට නඩුහබ ආදියට සියලුම රැස් කළ ධනය හා වතුපිටි විනාශ වී තිබුණෙන් ජීවත්වීම මහා බැරෑරුම් ප්‍රශ්නයක් විය. ඇලිස් කොතලාවල ළමාතැනියගේ සොහොයුරියක විවාහ කර ගෙන සිටි එෆ්.ආර්. සේනානායක මහතා මේ පවුලට පිහිට විය. දරුවන් තිදෙනා පාසල් යැවීමටත් පවුලේ වියදම් දැරීමටත් ඔහු ඉදිරිපත් විය. අත්තම්මාගේ ගෙදර පිහිටි හෝර්ටන් ප්‍රදේශයේ පදිංචියට ආ කොතලාවල පවුලේ සාමාජිකයෝ එහි කල්ගත කළහ.

ජෝන් ලයනල් කොතලාවල රාජකීය විදුහලට ගියේ හෝර්ටන් ප්‍රදේශයේ නිවසේ සිටය. ඒ වනවිට රාජකීය විදුහල තිබුණේ, කොළඹ අලුත්කඩේ උසාවිය පිහිටි භූමි භාගය අසලය. රාජකීය විදුහලේ විදුහල්පතිව සිටියේ කාට්ලි නමැති සුද්දෙකි. දිනක් වැඩ කරමින් සිටි කම්කරුවන් පිරිසක් වෙත ගිය කාට්ලි ජෝන් ලයනල්ට කතා කළේය. තමා දෙන උපදෙස් සිංහලට නගා කථා කරන ලෙස නියම කළේ ය.

කාට්ලිගේ උපදෙස් අනුව අහිංසක කම්කරුවන් වැඩ කළොත් ඔවුන් පීඩාවටම පත්වෙන බව ඔහුට වැටහුණි. ටිකක් වේලා ඔහුගේ කියුම් පරිවර්තනය කළ ජෝන් ලයනල් ඔවුන්ට තව උපදෙසක් දුන්නේ ය.

"මහත්තය කියන දේවල් අහගනිල්ල. මම කියන විදියට වැඩ කරපල්ල."

මෙය තමා කී දේට වඩා සේවකයන්ට කාරුණික වූ දෙයක් බව කාට්ලි මහතාට තේරුම් ගියේය. ඔහු සිංහලෙන් කතා කළේ ය. "උඹ හිතුවෙ මට සිංහල තේරෙන්නෙ නැහැ කියල නේද, දුවපිය පැත්තකට" විදුහල්පතිතුමා ජෝන් ලයනල් එළවා ගත්තේ ය.

රෝයල් කොලීජියට ප්‍රථම වරට බොක්සිං ක්‍රීඩාව ආයේ සර් ජෝන් කොතලාවල කුඩා ශිෂ්‍යයකුව සිටියදීය. මේ වනවිට වෙනත් කිසිදු පාසලක බොක්සිං ක්‍රීඩාව හඳුන්වා දී නැත. ඒ සඳහා එංගලන්තයේ සිට මැක් රොබින්සන් නමැති විශේෂ ගුරුවරයකු එවා තිබිණ. අනෙක් ශිෂ්‍යයන් බොක්සිං ක්‍රීඩාවට අදිමදි කරද්දී මුලින් ම ජෝන් ලයනල් ඉදිරිපත් විය. ටික කලක් බොක්සිං පන්තිය පැවැත්විණි. ජයතිලකට හා කොතලාවලට ප්‍රදර්ශන බොක්සිං වටයක් පවත්වන්නැයි ගුරුවරයා නියම කළේය. ජයතිලකගේ බොක්සිං පහරක් රිදෙන්නට වැදුන නිසා ක්‍රීඩාවේ මූලධර්ම අමතක විය. බොක්සිං සෙල්ලම පසෙක තබා ජයතිලක සමඟ ගුටි ඇන ගන්නට විය. මැක් රොබින්සන් දුවගෙන ආයේ ය.

"ඔහොම නෙමෙයි බොක්සිං ගහන්නෙ මෙන්න මෙහෙමයි කියා, දෙදෙනාම බිත්තියට හේත්තු කර පහර කීපයක් ගැසීය. පසුව මැක්ස් රොබින්සන් දෙදෙනාටම අවවාද කළේ ය.

සෙල්ලම් කරන විට තරහ ගන්න හොඳ නෑ. ඒකයි මේ සෙල්ලමේ ප්‍රධාන නීතිය. කලක් ඉක්ම ගියේ ය. රාජකීය විදුහලේ සිටි දක්ෂතම බොක්සිං ක්‍රීඩකයා ලෙස කොතලාවල පත්විය. බොක්සිං ක්‍රීඩාවට සම්බන්ධ වීම කොතලාවල මහතාගේ චරිතය, විශේෂ ලක්ෂණවලින් යුක්ත වීමට ප්‍රධාන හේතුවක් විය. පසුකාලීන ඉතිහාසයේ සම්බන්ධ ප්‍රකට සිද්ධි රාශියකට බොක්සිං ක්‍රීඩාව තුළින් ලත් අත්දැකීම් හේතු විය.

රාජකීය විදුහල් කැඩෙට් භට හමුදාවට බැඳී, එහි ප්‍රමුඛ නමක් ගත් කොතලාවල මහතා අසුන් පිට යාමේ දක්ෂයකු බවට රාවයක් පැතිරී ගොස් තිබිණි. ගෙදරට හොරා හැම දිනකම අසුන් පිට යාම පුරුද්දක් කරගෙන තිබුණි. ඒ කාලයේ කොළඹ හතේ වයසක සල්ලිකාර මිනිසුන් එකතුව හදාගෙන තිබූ මවුන්ටඩ් සෙක්ෂන් ටවුන් ගාර්ඩ් නැමැති ඒකකයේ අසුන් පිට යාමට පුරුදු කිරීමට තෝරාගත් කොතලාවල තරුණයා ටික කලකින් ඒ අතර ජනප්‍රිය විය. අසුන් පිට යාමේ ප්‍රකට නමක් හිමිකරගෙන සිටි, ඩී.ඩී. ජේඩ්ක්, ඩී.එස්. සේනානායක යන අයත් එකල මෙම සංගමයේ සාමාජිකයෝ වූහ.



සර් ජෝන් යුද හමුදා නිල ඇඳුමෙන්

සර් ජෝන්ගේ කඳවල ඉඩම ගත්තේ රුපියල් 900ක් මුලින්ම දීලා

මේ වනවිට කොතලාවල, සේනානායක, ආටිගල යන පවුල්වල හැම දෙනකුම වාගේ ජාතික සටන් ව්‍යාපාරයට පැටලීම නිසා හිරගෙදර දුක් විඳීමට නියම විය. හිරේ සිටින නෑදෑයින් ගැන ගෙදරදී කරන කථා බහට කන්දුන් කොතලාවලට ද ජාතික සටනට එකතු වීමට සිතුණි.

පාසල් සගයන් සමඟ ද තම අදහස ප්‍රකාශ කළ කොතලාවල තම හිතවත්ම මිතුරන් දෙදෙනා වූ පී.එච්. පී. ජයතිලක සහ ආර්.පී. ද සිල්වාගේ අනුමැතිය ලැබිණ. සටන් කරන්ට නම් අවි ආයුධ අවශ්‍ය බව කතිකා කරගත් මේ තිදෙනා තුවක්කු තුනක් සොරකම් කර පැමිණ විද්‍යාලය පිටුපස වළක් තුළ සැඟවීය. මුළු පාසලේම සිසුන්ගේ කතාවට මේ තුවක්කු තුනේ සිද්ධිය පැතිර යන්නට වැඩි වේලාවක් ගියේ නැත. හදිසියේ විදුහල්පතිගෙන් මේ තිදෙනාට පණිවුඩයක් ලැබිණි. විදුහල්පතිගේ මුහුණ කේන්තියෙන් පිපිරෙමින් තිබිණ.

"මේක යුද්ධ නීතිය කාලෙ. උඹල තුන්දෙනා කරල තියෙන්නෙ බරපතළ වැරැද්දක්. පොලිසියට දන්වල නඩු යවන්නද? නැත්නම් උඹල තුන්දෙනා ගෙදර යනවද?" විදුහල්පතිගේ කථාව ඇසූ තිදෙනාටම කර කියාගත හැකි දෙයක් නොවූයෙන් ගෙදර යාමට තීරණ කළහ.

"මම ගෙදර ගිහින් හිරේ ඉන්න නෑයන්ට බත් ගෙනියනව" කොතලාවල කීවේය. අපි ගෙදර ගිහින් තාත්තලගෙ බිස්නස්වලට උදව් වෙනව.

"පී.එච්.පී. සහ ආර්.පී. කීහ. තුන්දෙනාගේම පාසල් ගමන් මෙලෙස කෙළවර විය. රාජකීය විද්‍යාල ගමන නතර වූ පසු ගෙදර දොරේ සුළු වැඩවලට සහාය වූ කොතලාවල තරුණයා කුමක් හෝ වැදගත් මෙහෙයකට යොමු කළ යුතු යැයි, එෆ්.ආර්. සේනානායක මහතාට සිතුණි. දිනක් ඔහු කොතලාවල තරුණයා තමා වෙතට කැඳවූයේ ය.

"උඹ කැමැති ද පිට රටකට ගිහින් ඉගෙන ගන්න" එෆ්.ආර්., කොතලාවලගෙන් ඇසීය.

"කැමැතියි, කැමැතියි"

"මේ යුද්ධ කාලෙ නිසා උඹට බයක් නැද්ද?"

"යුද්ධ කාලෙ නිසා තමයි මම කැමැති" එතකොට නියම විධියට යුද්ධය බලාගන්න පුළුවන්."

ලෝක යුද්ධය ඇවිළෙනැයි බියෙන් මුළු රටම තැතිගෙන සිටියදී යුද්ධ කරන රටකට යන්නට කොතලාවලගේ සිත ගියේය. පිටරට යනව නම්, "ඕස්ට්‍රේලියාවට යා යුතු" යයි නෑදෑයෝ කීහ. යුරෝපයේ යුද සටන් ඇවිළෙද්දී ඕස්ට්‍රේලියාවට යාම මහා බියගුලු වැඩක් යයි කොතාවලට සිතුණි.

මම යනව නම් යන්නෙ යුරෝපෙට. ඕස්ට්‍රේලියාවට මාව යවන්න එපා. කොතලාවලගේ තීරණය අවසාන තීරණයකි. කිසිවෙකුට මෙයට විරුද්ධ විය හැකි නොවීය. අන්තිමේදී යුරෝපයට යන්නට අවසර ලැබුණි. තනි නොතනියට නෑදෑයෙක් ද ලැබිණි. දෙදෙනා නැව් නැග්ගහ. ප්‍රංශය ඇතුළු රටවල් රැසක ගමන් ගත් සර් ජෝන් අධ්‍යාපන කටයුතු සඳහා එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයට ඇතුළු විය.

දැනට බම්බලපිටිය කොතලාවල පටුමගෙහි පිහිටා තිබූ මහ ගෙදරින් පසුව හෝර්ටන් පෙදෙසේ සිය ඥාති එෆ්.ආර්. සේනානායක ගේ නිවසට වී මෙතෙක් කල්ගත කළත් තමාටම උරුම කිව හැකි ගේ දොරක අවශ්‍යතාව තේරුම් ගත් කොතලාවල මහතා රත්මලානේ කඳවල ප්‍රදේශයේ විශාල භූමි භාගයක් වෙන්දේසියේ විකුණන බවට පුවත්පතක පළවූ දැන්වීමක් අනුව තමා සතු මුළු ධනය වූ රුපියල් නම දහසක් සහිත චෙක් පොතක් අතැතිව වෙන්දේසි පොළට ගිය ඔහු හා තරග කිරීමට සිටියේ මහ ධනවත්තු පිරිසකි. අක්කර අසූ පහක ඉඩම සඳහා වැඩිම ලන්සුව තැබූයේ අබ්දුල් කපූර් නමැති ධනවත් ව්‍යාපාරිකයෙකි. රුපියල් හතළිස් දහසින් ඇරඹුණු වෙන්දේසිය ක්‍රමයෙන් ඉහළ ගොස් අවසන් වරට රුපියල් හැට නම දහසකට ඉල්ලූ කොතලාවලට ඉඩම අයිති විය. වෙන්දේසියේදී සිදුවූ ඒකාධිකාරයට විරුද්ධව ඉදිරිපත් වුවත් වෙන්දේසි කරුවන් ඉදිරියේ අසරණයකු වී ලජ්ජාවට පත්වන්නට වූ හෙයින් ඔහු වටපිට බලා එතනින් පැන යාමට තැත් කළේ ය.

"ඒයි කොහේද පැනල යන්නෙ. එනව මෙහාට" එක්වරම මුරකරු ඔහුගේ දෑත තරයේ අල්ලාගෙන වෙන්දේසිකරු වෙත රැගෙන ගියේය.

"ඔය ළමය නේද වෙන්දේසියෙන් ඉඩම ගත්තෙ."

දිගින් දිගටම වෙන්දේසිකරු ප්‍රශ්න කරද්දී, කොතලාවලගෙන් කියවුණේ තමාගේ නම ජෝන් ලයනල් කොතලාවල බවත් තාත්තා ජෝන් කොතලාවල බවත් ය. මෙතෙක් වේලා නොදැක්වූ ගරු සරු බවක් ඇතිව වෙන්දේසිකරු, තමා ඉඳගෙන සිටි අසුන අසල වූ පුටුවක වාඩිකර සුහදව කරුණාවෙන් කථා කළේය.

"ජෝන් කොතලාවල මහත්තය මගේ හොඳ යාළුවෙක්. උන්නාන්සෙ මට ගොඩක් උපකාර කරල තියනව. සුළු ඇඩ්වාන්ස් එකක් දීල මේ ඉඩම ගන්න. මේක රත්තරන් වගේ වටිනව. මම තවත් ටිකක් අඩුකරල දෙන්නම්."

තමා සන්තකයේ තිබුණු රුපියල් නමදහස අත්තිකාරම් ලෙස ගෙවා ඉතිරි මුදල සොයාගන්නට ඔහු කෙළින් ම ගියේ ඩී.එස්. සේනානායක මුණ ගැසීමට ය. තමාට සිදුවූ සියල්ල ඩී.එස්. සමඟ කථා කිරීමෙන් අනතුරුව ඔහු සමඟ සර් ජෝන් කඳවල වත්ත බැලීමට ගියේ ය. ඔවුන් ආපසු පැමිණියේ ඉමහත් සතුටකිනි.

"ඇලිස් අක්කෙ, ලයනල් හොඳ ඉඩමක් අරගෙන නේ. මමත් ගියා ඉඩම බලන්න." ඩී.ඇස්., ඇලිස් කොතලාවල ළමාතැනීට සියලු තොරතුරු කීවේය. ඉතුරු මුදල් රුපියල් හැට දහස, එෆ්.ආර්. සේනානායක ඇපවී හෙට්ටියකුගෙන් ලබාගති. අද ගාලු පාරේ සිට ගුවන් තොට භූමියත් සමඟ ඇති ඉඩම් යාය සර් ජෝන් සතු වූයේ එපරිද්දෙනි.

සර් ජෝන් සිටි භූමි භාගයේ, ගාලු පාර අසල කොටස, බාටා සමාගමට බද්දට ලබාදීමේ ප්‍රතිඵලයක් වශයෙන් බාටා සමාගමින් නිපදවන අලුත් මෝස්තරයේ පාවහන් කට්ටල සර් ජෝන්ට පරිත්‍යාග කරන සිරිතක් විය. මෙතෙක් කලක් දියවැඩියා රෝගයෙන් පීඩා විඳි සර් ජෝන් අලුත් මෝස්තරයේ පාවහන් පැලඳ උජාරුවෙන් ගමන් ගත්තත් ටික කලකින් තම දෙකකුලේ මහපට ඇඟිලි දෙකම කැපිය යුතු යයි වෛද්‍යවරු නිර්දේශ කළේ එවකට මෙරට තිබූ එකම ගෙවන වාට්ටුව වූ කොළඹ මහ රෝහලේ මර්චන්ට්ස් වාට්ටුවට ඇතුළු කිරීමෙනි. ඔහුගේ ජීවන තොරතුරු ගැන කථා බස් කිරීමට මෙතෙක් කල් කඳවලට ගිය මට කොළඹ මහ රෝහලේ මර්චන්ට්ස් වාට්ටුවට යාමට සිදුවිය.

නිතරම ඔහු හමුවීමට දන්නා අඳුනන විශේෂ පුද්ගලයෝ පැමිණියහ. ඔවුන් හා පැරණි හපන්කම් කියමින් විනෝදවීම සර් ජෝන් පුරුදු කරගත තිබුණි. එක් දිනක් සර් ජෝන් බලන්නට පැමිණ සිටියේ මැදිවිය ඉක්මවූ කාන්තාවකි. ඇය කවුරුන් දැයි සර් ජෝන්ගේ ආරක්ෂකයාගෙන් ඇසූ විට දැනගන්නට ලැබුණේ ඇය සර් ජෝන්ගේ එකම දියණිය බවයි. එවිට සර් ජෝන්ගේ බිරිය කවුදැයි මම ඔහුගෙන් ඇසීමි. බිරිය තරුණ කාලයේදීම සර් ජෝන් හැර දමා ගිය බව ඔහු පැවසීය.

සැත්කමකට ගොදුරු වී සිටිය ද සර් ජෝන්ට එක තැනක විවේකීව සිටීම අපහසු කරුණක් වී තිබුණි. රෝද පුටුවෙන් තම මෝටර් රථය වෙත ගොස් එතනින් ගාලු මුවදොර පිට්ටනියට වී අවට බැලීම ඔහුගේ දෛනික පුරුද්දක් විය. ඒ යන අතරමඟ එවකට යුනියන් පෙදෙසෙහි පිහිටා තිබූ එලිෆන්ට් හවුස් වෙත ගොස් අයිස් ක්‍රීම් කෑම නොකඩවාම සිදුවූ සිද්ධියකි.

එක් දිනක් සර් ජෝන් මාලේවන හාමුදුරුවන් වැඩ වසන තිඹිරිගස්යායේ බෙහෙත් ශාලාව වෙත ගමන් ගත්තේ ය. හාමුදුරුවෝ ඉක්මන් ගමනින් ඇවිත් සර් ජෝන්ගේ මෝටර් රථයට ළඟා විය.

"හාමුදුරුවනේ මට උදව්වක් කරන්න ඕන. මේ මාත් එක්ක ඇවිත් ඉන්නෙ 'සිළුමිණ' ට මගේ කථාව ලියන මිනිහ තමයි. මේ කොල්ල එක්ක මම කරපු කියපු දේවල් ඔක්කොම කියන්න බැහැනේ. හෙට අනිද්ද මෙයා ඇවිත් විස්තර අහවි. අර නොම්මර හතරෙ අරිෂ්ටෙ ගැන කියන්න ඕන.

මම පසුදිනක මාලේවන හිමිගෙන් දැනගත්තේ නොම්මර හතරෙ අරිෂ්ටය උන් වහන්සේ සර් ජෝන්ට විශේෂයෙන් සැදුවේ තරුණ කාලේ පුරුෂ ශක්තිය වැඩිවන සුවිශේෂ අරිෂ්ටයක් ලෙසය.

එක් දිනක් සර් ජෝන් මර්චන්ට්ස් වාට්ටුවේ ප්‍රතිකාර ලබද්දී එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ ආරක්ෂක ලේකම්වරයා වූ කර්නල් සී.ඒ. ධර්මපාල සර් ජෝන් බලන්නට පැමිණියේ විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක් සහ හෙදියන් රැසක් ද සමඟ ය. ඒ අප දෙදෙනා කථා බහක යෙදෙන අතරතුරය. කර්නල් ධර්මපාල මඳ වේලාවක් සර් ජෝන් දෙස බලා සිට "අපොයි වෙච්ච දෙයක්, මේ සිංහයෙක් වගේ හිටිය මනුස්සයෙක් නෙ. අද ඇඳටම වැටිල කර කියාගන්න දෙයක් නැතිව" යයි කියත්ම මෙතෙක් වේලා හාන්සිව සිටි සර් ජෝන් ඇඳ මත වාඩි විය.

රෝහලට සර් ජෝන් එනවිට නිවසින් රැගෙන විත් තිබුණේ රුපියල් පහළොස් දහසකි. ඒවා සියල්ල තමා බලන්නට පැමිණි මිතුරියන් වෙත ලබාදීමෙන් පසු ඔහුට තවත් මුදල් අවශ්‍යව තිබිණ. දිනක් ඔහු බලන්නට පැමිණි තම ඥාති පුත්‍ර ලලිත් කොතලාවලට මෙසේ කීය.

"කඳවල මගේ ගෙදර යකඩ සේප්පුවේ තියෙන සල්ලිවලින් රුපියල් විසිපන් දාහක් අරගෙන වරෙන්. ඒක අරින හැටි මම මෙයාට කියල තියෙනව. හැබැයි උඩ තට්ටුවේ ඇති අර පොතට අත තියන්න එපා." මම ලලිත් කොතලාවල සමඟ කඳවල වලව්වට ගියෙමි. සර් ජෝන් කියා දී ඇති අංක අනුව සේප්පුව ඇර, ලලිත් සමඟ මුදල් ගෙන විත් සර් ජෝන්ට භාර දුනිමි. අත තියන්න එපා කියූ පොත කුමක්දැයි මම හෙමිහිට බලා ගතිමි. එය ඩඩ්ලි අගමැති කිරීමට විරුද්ධව සර් ජෝන් ලියූ 'අගමැති පොරය' යයි සඳහන්ව තිබිණ.

රන්සුනු

සුමුදු චතුරානි

අත්හදා බැලීම ඔබ සතුයි

හාතවාරිය වැල සුදු පැහැ සියුම් මලින් මුළුමනින් ම වැසී තිබේ. එතෙමින්, වරෙක මල් පිරි ලතා එල්ලා වැටෙමින් හාතවාරිය වැල, ජම්බු ගස හා සහයෝගීව පරිසරයට අමුතු ම සුන්දරත්වයක් නිර්මාණය කර තිබේ. කුඩා සුදු මල් අතරින් මලට ඉඩ දීමට මෙන් හාතවාරිය පත්‍ර පිහිටා ඇත්තේ තැනින් තැන ය. මල් පිරි වැල් සුළඟට ලතාවත් ව පැද්දෙන්නේ විටෙක පැණි බොන බඹරුන් ද සමඟ ය. සුදු මල් හා සරි සරි ව වරෙක රතට රතේ දිලුණු ජම්බු මැවූ චමත්කාරය තවමත් ම සිතෙන් නික්ම ගොස් නැත. එදා මීදුල පුරා පිපුණු නේක වර්ණිත මල් පරදමින් මුළු උයන ම අලංකාර කළ රතු ජම්බුත්, හාතවාරිය මලුත් බඹරුන් ට පවා පාර වැරැද්දුවේ ය.

හාතවාරිය මල් අතරින් ම මතු වූ කුඩා චලනයකින් ම සිත තිගැස්සුණි. විමසිලි දෑසින් බලන කල ඒ චලනයේ හිමිකරුවා වූ කටුස්සා දැක ගන්නට අපහසු වූයේ නැත. සිය කුඩා හිස වනමින්, පරිසරයේ වන කුඩා ම සෙලවීමට මෙන්ම ශබ්දයට කන් දෙමින් ඌ මල් කරා එන කෘමීන් ගැන ඇහැ ගහගෙන සිටියේය. සියුම් තීක්ෂණ හැසිරීම නිසා ම ඌ පරිසර සාධකයක් ම වූයේ වී විනා එයින් වියුක්ත වූයේ නැත.

ඇයි දන්නෙ නැද්ද, අලින්ගේ අපේ කැරුම් නොවැ?

මතකද ඔබට මේ ප්‍රකාශය. වරදවා වටහා නොගනු මැනවි. මේ වර්තමාන දේශපාලන කතන්දරයක් නම් නොවෙයි. පාසල් පෙළ පොත් දරුවන් අතර කෙතරම් ජනප්‍රිය ද; ඒ හා සමානව ම දරුවන් අතර එකල ජනප්‍රිය ව තිබූ පොතක එන කියුමකි ඒ. කුඩා කලට වඩා මෙකල කියවන සෑම වාරයක් ම පාසා නනරුත් සපයන මේ මාහැඟි ග්‍රන්ථය 'හීන්සැරය' යි. ළමයින් අරමුණු කර ගෙන ලියූවත් මෙහි වැඩි අරුත් ගන්නේ වැඩිහිටි පරපුර ය. එසේ කියා දරුවන් ට මෙහි අර්ථයක් නැතැයි කිව නොහැකි ය. මෙකල හැදෙන බොහෝ ළමා චිත්‍රපටවල මෙන් දරුවන්ට කුමන හෝ අරුතක් සම්පාදනය නොකළත් ළමයින් යොදා තැනූ හෙයින් ම ඒවා ළමා චිත්‍රපට වූවා සේ මේ පොත් නිකම්ම නිකන් ළමා පොත් වූයේ නැත. ඒවායේ හීන් සැරේ ම අඩංගු වූ මහ සැරයක් තිබිණි. කුමාරතුංගයන්ගේ හීන්සැරයත් ඒ වගේ ය. ඇත්තට ම එය මහ සැරයකි.

පෙර සඳහන් කළ වැකිය අසන්නේ ගෝණහාමි ය. පිළිතුරු දෙන්නේ කටුසුහාමි ය. මහා කුණාටුවකින් වනයේ දැවැන්ත ගස් ඇද වැටීම අලි රාලහාමිට පවා අදහාගත නොහැකි ය. අලි රාලහාමි තම මඟ පාදා ගන්නේ, ඉදිරි වැටුණු මහ ගස්වල අතු ඉති බිඳ දමමිනි. කටුස්සා, ගෝණකු ඇසූ පැනයට, අර වැනි ජේත්තුකාර උත්තරයක් දෙන්නේ, අලියා විසින් ම බිඳ දමන ලද අත්තක සිට ය. කටුස්සාගේ කටමැත දෙඩවීම ගැන අලියා පයිසයකටවත් ගණන් ගන්නේ නැත. එහෙත් සිය හාමිනේ ගැන කටුස්සා මතක් කළ විට අලියාට නොසෑහෙන්නට තරහ ගියේය.

හස හස හා දුටු කල්, ආයුබෝවන් රාලහාමි, කොහොමද හාමිනේගේ සැපසනීප?

මූ කියවන්නේ තමාගේ තරමට දැයි සිතා අලි රාලහාමිට කේන්ති යෑම අරුමයක් නොවේ ය.

හීන්සැරය, මහ සැරයකට වඩා දරුණු බැව් අලි රාලහාමි දැන නොසිටියේ මුත් හිවල් හාමි දැන සිටියේය. කපටිකම්, නොපනත්කම් එක තැනකට එක්වීම අරුමයක් නොවේ. ජනවහරේ මේ ගැන කියවෙන්නේ 'එක අත්තේ වහන්නේ එක ජාතියේ කුරුල්ලෝ ය' කියා ය. නරකට නරක ම එකතු වෙනවා විනා හොඳ එකතු වන්නේ කලාතුරකිනි.

"හිවල් හාමි මා එකක් කියනවා, ළඟදී දවසක අලි රාලහාමි මහ හඬ දීගෙන කැලෑව බිඳගෙන දිව්වෙ නැත්නම්, මුගේ නම කියන්නට එපා...මගේ හීන්සැරයත් ඔහුට ටිකක් පෙන්නා බලන්නට ඕනෑ."

හීන්සැරේ අනෙකාට රිද්දන, වත්මන් වහරට අනුව නම් "ගේම් දෙන" පිරිස් අද පමණක් නොව එදා ද සිටියේ ය. ඒ "ගේම්" වෙනුවෙන් බොහෝ කලෙක සිට හීන් සැරෙන් සූත්තර ගොතන්නෝ ද බොහෝ වූහ, වෙති.

කටුසුහාමි කී ආකාරයට ම කටයුතු සිද්ධ වී අවසානයේ අලි රාලහාමි මෙල්ල වුණේ ය. කටුස්සා විසින් මෙල්ල කළේ අලියා පමණක් ම නොවේ. කොටියාගේ ඇස දල කන දල කිහිල්ල ද සපා කා කොටියා මෙල්ල කළේ ද කටුස්සා විසිනි. හීන්සැරය ඒ තරම්ම බලවත් ය. උපාය දන්නෝ හීන්සැරේ බලය වියමන් කරන්නේ එබැවිනි.

හොඳ පොත් වල බොහෝ දෑ සඟවා තිබේ. ඒවායේ ඇත්තේ විස්මිත ලෝකයකි. ඒ ලෝකය අදට නොව සියවස් ගණනකට වුව ජීවත්වන්නට උගන්වන්නේ ය.

උම්මග්ග ජාතකය නැවත කියවා බලනු මැනවි. එහි කකණ්ටක ප්‍රශ්නය පිළිබඳ අවධානය යොමු කළහොත් එහි කියවෙන්නේ ද කටුස්සකු ගැන ය. එහි කටුස්සා හැඳින්වෙන්නේ 'බොහොඩා' නමින් ය. කකණ්ටක ප්‍රශ්නයේ එන මානය කරණ කොට ගෙන ක්‍රියා කළ කටුස්සා මෙන්ම හීන්සැරයට හීන් සැරේ රිංගා ගත් කටුස්සා ද දෙවිදියක පාඩම් සාහිත්‍ය ලෝකයට ගෙන එන්නේ ය.

වඩා සාර්ථක හීන්සැරය ද, එසේත් නැත්නම් මුහුණට මුහුණ සටන් කිරීම ද යන්න සෙවීම අප අරමුණ නොවේ. නිර්මාණකරණයේ රන්සුනු සොයන ඔබට, මට හීන්සැරය මතක් වීම අරුමයක් නොවෙයි. හැබැයි හීන්සැරය අත්හදා බැලීම නම් ඔබ සතු ය.

sumudu.chathurani@lakehouse.lk

සැමරුම් කිත් රැස

මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

දේහ ශක්තිය හා බැඳුණු දේශ භක්තිය

දහනව වන සියවසේ මෙරට සිදු වූ ශාස්ත්‍ර පුනරුද ව්‍යාපාරයේ ආනුභාවය හුදෙක් ආගමික, භාෂා ශාස්ත්‍ර කෙරෙහි පමණක් නොව පුළුල් අර්ථයෙන් ගත් කල සමාජීය විපරිවර්තන ක්‍රියාවලියක ආරම්භය දක්වා ව්‍යාප්ත විය. මේ පුනරුද ව්‍යාපාරය මිශනාරි ඉංග්‍රීසි යටත් විජිත අධ්‍යාපන ක්‍රමයට පමණක් නොව බටහිර වෛද්‍ය ක්‍රමයටද අභියෝගයක් වූ අයුරු අපට පෙන්වා දෙන හොඳම නිදසුන පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි චරිතයයි. යුරෝපීය ආක්‍රමණවලට පෙර මෙරට පැවතියේ භාරතීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් ව්‍යුත්පන්න වූ දේශීය වෛද්‍ය ක්‍රමයකි. දේශීය වෛද්‍ය ක්‍රමයේ ආනුභාවය බ්‍රිතාන්‍ය යටත් විජිත අවධියේදී අනුක්‍රමයෙන් පරිහාණිගත වීම ඇරඹිණ. ගෞරවාන්විත සමාජ මෙහෙයක් වූ වෙදකම ධනවාදයේ ව්‍යාප්තියත් සමඟ තියුණු අභියෝගයකට මුහුණ දුනි. ජී. පී. වික්‍රමාරච්චි මේ අභියෝගයට එඩිතරව මුහුණ දුන් ධීරයෙකි.

නොසැලෙන අධිෂ්ඨානයත් අරමුණ වෙනුවෙන් දීර්ඝ කාලයක් ඉවසීමෙන් කටයුතු කිරීමත් යන උසස් ගුණාංග මූර්තිමත් කරන එතුමන්ගේ චරිතය වත්මන් පරපුරට පූර්වාදර්ශයකි. ජී. පී. වික්‍රමාරච්චි හෙවත් ගේබ්‍රියෙල් පෙරේරා වික්‍රමාරච්චි 1889 සැප්තැම්බර් 28 වන දින ගම්පහ නැදුන්ගමුවේදී උපත ලැබීය. ඔහුගේ පියා වෙලුන් පෙරේරා වික්‍රමාරච්චි, පාරම්පරික දේශීය වෛද්‍යවරයෙකි. මව දෝන සාරනෝනා ධර්මවතී නම් වූවාය. ගේබ්‍රියෙල් පෙරේරා වික්‍රමාරච්චි සිය ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ හේනේගම රජයේ පාසලෙනි. ද්විතීයික අධ්‍යාපනය සඳහා විද්‍යෝදය පිරිවෙනේ ශාඛාවක් වූ නිවෙස ආසන්නයේ පිහිටි ගොඩගෙදර උත්තරමූල පිරිවෙනට ඇතුළත්ව ඒ පිරිවෙනේ දක්ෂතම ශිෂ්‍යයා බවට පත් වූ වික්‍රමාරච්චි වැඩි දුර අධ්‍යාපනය සඳහා 1909දී විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් කෙරුණ අතර එවක එහි පරිවේණාධිපති ධුරය ඉසිලුවෝ හික්කඩුවේ සුමංගල හිමිපාණෝ ය. මහගොඩ ශ්‍රී ඥානේශ්වර, කහවේ ශ්‍රී සුමංගල රතනසාර, බිහල්පොළ ශ්‍රී දේවරක්ෂිත යන මහ තෙරවරු එවක පිරිවෙනෙහි අධ්‍යාපනය ලබන සිසුන්ගේ නැණ නුවණ පෝෂණය කළහ. එවන් ගුරු ඇසුර ලද වික්‍රමාරච්චි විද්‍යාර්ථියා 1913 වර්ෂයේදී පණ්ඩිත උපාධිය ලබා ගත්තේය. අධ්‍යාපන කටයුතු සාර්ථක ලෙස නිම කළ වික්‍රමාරච්චි තරුණයා ඊ ළඟට උර දුන්නේ ප්‍රබල සමාජ මෙහෙවරකටය. බෞද්ධ පුනර්ජීවන නායක ශ්‍රීමත් අනගාරික ධර්මපාලගේ ඉල්ලීම පරිදි සිංහල බෞද්ධයා පුවත්පතෙහි කර්තෘ පදවිය දරමින් ජාතික විමුක්ති ව්‍යාපාරයට දායක වීම ඒ මෙහෙවරයි. පණ්ඩිත වික්‍රමාරච්චි ඉතා විනයගරුක භක්තිමත් බෞද්ධයෙකු වූ බැවින් ඔහුට මේ මෙහෙවර වඩාත් යෝග්‍ය වූ බව පෙනේ.

ජී. පී. වික්‍රමාරච්චි

පුවත්පත් කතුවරයකු ලෙස බැරෑරුම් සමාජ මෙහෙයක යෙදෙන අතරේ 1917 දී ඔහු නොතාරිස් විභාගයට පෙනී සිට ඉන් සමත්ව නොතාරිස්වරයෙකු බවට පත් විය. ඒ වර්ෂයේදීම ඔහු පෙරදිග වෛද්‍ය විද්‍යා අරමුදල මගින් පිරිනැමුණු ශිෂ්‍යත්වයක් ලැබ කල්කටාවේ ජාමිනි භූෂණ රෝයි අෂ්ටාංග ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට බැඳී වසර තුනක අධ්‍යාපනය ලැබීමෙන් පසු 1920 දී භිෂග්රත්න එල්. ඒ. එම්. එස්. (ගෞරව) උපාධියද, 1921දී කල්කටා ආයුර්වේද භවන් වෙතින් කාවිරන්ජන් උපාධියද ලබා ගත්තේය. ඉන්දියාවේ අධ්‍යාපන ලබමින් සිටි කාලයේ එරට දේශප්‍රේමී නායකයන් ස්වරාජ්‍යය සඳහා නිරත වූ අනවරත අරගලයෙන්ද නොමඳ අනුප්‍රාණයක් ලද වික්‍රමාරච්චි තරුණයා 1921 වර්ෂයේ නැවත ලංකාවට පැමිණෙන්නේ තමා උගත් ශාස්ත්‍රය පොදු ජන යහපත සඳහා යෙදවීමේ අටියෙන් යුත් පරමාර්ථගවේෂී පුද්ගලයකු ලෙසිනි.

කුඩා කල සිය නිවසේ පියාණන් වෛද්‍ය ශාස්ත්‍රය පරාර්ථ චර්යාව උදෙසා යොදවනු දැකීමෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වීමේ අදිටනෙන් ශිල්ප හැදෑරූ වික්‍රමාරච්චි තරුණයා ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයෙහි පාරප්‍රාප්තව මව් බිමට පැමිණ කෙටි කලක් නැදුන්ගමුව නිවසේ තම පියාණන් සමඟ වෛද්‍ය වෘත්තියේ නියැළිණ. පසුව වික්‍රමාරච්චි තරුණයා ගම්පහ බැණ්ඩියමුල්ලේ අභිනවයෙන් ඖෂධාලයක් ආරම්භ කෙළේය. ඒ ප්‍රයත්නය ඉතා කෙටි කලකින් කෙතරම් සාර්ථක වූයේද යත් එවක ලංකාවේ වඩාත්ම දක්ෂ ආයුර්වේද වෛද්‍යවරයා බවට වික්‍රමාරච්චි වෙද රාලහාමි පත්විය. තම වෛද්‍ය ශාස්ත්‍රය ඉමහත් ප්‍රසිද්ධියට පත් වීමත් සමගම වෛද්‍ය ශාස්ත්‍රයේ අභිවෘද්ධිය සහ චිරස්ථායිභාවය උදෙසා වෛද්‍යාචාර්ය වික්‍රමාරච්චි 1929දී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය පිහිටුවා සිය වියදමින් පවත්වා ගෙන ගිය අතර නවාතැන් සඳහා පවා සිසුන්ගෙන් කිසිදු ගාස්තුවක් අය කළේ නැත. එතුමා 1930 ගණන්වල මුල් භාගයේ ආයුර්වේද විද්‍යාලයට අනුබද්ධව ඖෂධ නිෂ්පාදනාගාරයක් ද ආරම්භ කළේය.

වෛද්‍යවරයකු ලෙස වික්‍රමාරච්චි වෙද රාලහාමිගේ අවධානය යොමු වූයේ රෝගාබාධවලට ප්‍රතිකාර කිරීම කෙරෙහි පමණක් නොවේ. වැදගත්ම කරුණ ලෙස එතුමන්ගේ අවධානය යොමු වූයේ රෝගාබාධවලට ගොදුරු නොවී නිරෝගී දිවියක් ගත කිරීමට ප්‍රජාව දිරිමත් කිරීම කෙරෙහිය. භෝජන සංග්‍රහය නමැති ග්‍රන්ථය රචනා කරමින් දේශීය ආහාරවර්ගවල වටිනාකම පහදා දුන් එතුමා තම සිසුන්ද දායක කර ගනිමින් කාබනික පොහොර යොදා දේශීය පෝෂ්‍යදායී ආහාර භෝග වගා කිරීමෙහි නියැළුණේය. එතුමා සිය දින චර්යාව ආරම්භ කළේ උදෑසනින්ම තමන්ගේ ආදර්ශ ගොවිපළේ කටයුතුවල යෙදීමෙනි.

සඟරා සහ පොතපත පළ කිරීමෙන් ජාතික පුනර්ජීවනය සඳහා එතුමන් දැක්වූ දායකත්වය අතිමහත්ය. නිවහල් දැයක් නිර්මාණය කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න පුරවැසි සමාජයක් ගොඩ නැගීම සඳහාය එතුමන් සඟරා සහ ග්‍රන්ථ සම්පාදනයෙහි නිමග්න වූයේ. පණ්ඩිත වික්‍රමාරච්චි වෛද්‍යවරයා ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ කෘති කිහිපයක් ම රචනා කර ඇති අතර අදටත් ඔහුගේ සමහර පොත් ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් අතර අතිශයින් සම්භාවනාවට පාත්‍රව පවතී.

පරමාදර්ශී ලංකා පුරවැසියකු වූ එතුමා දේශීය නිෂ්පාදන නගා සිටුවීමේ අරමුණෙන් කපු වගාව අරඹා, නූල් කැට, තම ඇඳුම් පවා නිර්මාණය කරගත් බව වාර්තා වෙයි. පණ්ඩිත වික්‍රමාරච්චි වෙද රාලහාමිගේ සේවය අගය කරමින් 1957දී ලංකා රජය එතුමන් සෙනෙට් සභාවේ සාමාජිකයෙකු ලෙස නම් කළේය. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට වික්‍රමාරච්චි වෙද රාලහාමිගෙන් ඉටු වූ අතිමහත් දායකත්වය හා කැපවීම සැලකිල්ලට ගනිමින්, විද්‍යෝදය විශ්වවිද්‍යාලය එතුමන්ට 1960දී ආයුර්වේද චක්‍රවර්ති ගෞරව සම්මාන උපාධිය සමර්පණය කෙළේය. රට දැය වෙනුවෙන් අමිල මෙහෙයක් කළ මේ උදාර ලංකා පුත්‍රයා 1975 මාර්තු 29 වන දින ගම්පහ පිහිටි සිය නිවසේදී මෙලොවෙන් සමුගත්තේය. එතුමන් විසින් අරඹන ලද ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය වර්තමානයේ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලය යනුවෙන් විශ්වවිද්‍යාල තත්ත්වයට පත්ව ඒ උදාර ලංකා පුත්‍රයාගේ ප්‍රාර්ථනය ජීවමාන කරමින් පවතියි.

එල්ලුම් ගහෙන් ගැලවුණත්

මරණයෙන් බේරෙන්න බැරි වුණ බචෝ

● ඒ. ඩී. රන්ජිත් කුමාර

දිනය 1954 සැප්තැම්බර් 06 වැනිදාය.රාජගිරියේ බබේසේකර ටවුමේ පදිංචි 24 හැවිරිදි එරික් වෝල්ටර් බචෝ Eric Walter Batcho **තම පෙම්වතිය වූ රාජගිරියේ 'හයිලන්ඩ්' නිවසේ පදිංචිව සිටි 19 හැවිරිදි මර්ලීන් ලුඩොවයික්ට** Marlene Ludowyke **දෙපැත්ත කැපෙන සිහින් නැමිම සහිත තුඩ තියුණු පිහියකින්** (Double - Edged Kris Knife) **ඇන මරණයට පත් කළේ ඇයට තුවාල 8 ක් සිදු කරමිනි.**

එරික් බචෝ

එරික් බචෝ තමා පණ මෙන් ආදරය කළ පෙම්වතිය දරුණු ලෙස තුවාල කොට මරා දැම්මේ ඇයි?

මේ කතාව එදා කවි කොළකාරයන්ට රසවත් තේමාවක් විය. ආදරයත් වෛරයත් අතර ඇත්තේ කෙස් ගසක වෙනසක් බව බටහිර කවියකු කියා තිබුණි.

එරික් බචෝ සහ මර්ලින්ගේ මේ මිනිමැරුම් කතාව තේමා කොට බයිලා චක්‍රවර්තී නමින් ප්‍රකට ගායක එම්.එස්. ප්‍රනාන්දු එකල ගැයූ බයිලා ගීතයක් ජනප්‍රියව තිබුණේලු. මෙහි ගායනය මෙන්ම ගීත රචනය ද සංගීත නිර්මාණයත් ඔහුගේ ය. ලංකාවේ දිගම බයිලා ගීතය ලෙස ද සැලකෙන්නේ මේ ගීතයයි. වොලී බැස්ටියන් විසින් ද තරමක දිග පදමාලාවක් ලියා ගැයූ බයිලාවකට බචෝගේ කතාව පාදක කොට තිබුණි. එම්. එස්. ප්‍රනාන්දු ගැයූ දිගම බයිලා ගීතය අපට ලබාදුන්නේ ඉංජිනේරුවකු හා චිත්‍රපට ගීත, සඟරා, පෝස්ටර් සංරක්ෂක සුදර්මන් ද කොස්තා සහ ප්‍රවීණ ගායක වර්නන් පෙරේරා විසිනි. ඇම්.ඇස්. ගේ බයිලා පදමාලාව මෙන් ම එම්.එස්. ගේ හා වොලීගේ සින්දු පොත් එවීමට කාරුණික විය.

මිනී මැරුමට වරදකරු වූ එරික් බචෝ 1955 ඔක්තෝබර් 04 වැනිදා එල්ලා මැරීමට නියම විය. බචෝ එල්ලා මැරීමට මසකට පෙර (1955 සැප්තැම්බර් 28 වැනිදා) වැලිකඩ සිරගෙදර නිරීක්ෂණ චාරිකාවකට එක්වූ එවකට කොළඹ නගර සභාවේ උප නගරාධිපති ආර්. ප්‍රේමදාස මහතාට (හිටපු ජනාධිපති) ඔහු හමු වී කතාබහ කිරීමට අවස්ථාව ලැබී ඇත. ප්‍රධාන ජේලර් මහතා ප්‍රේමදාස මහතා කැටුව එල්ලුම් ගහට නියමිතව සිටි සිරකරුවන් 28 දෙනෙකු රඳවා තිබූ සිරකරුවන්ගේ මැදිරි පසු කරමින් කුතුහලයෙන් ගමන් ගත්තේලු. මේ කතාව ප්‍රේමදාස මහතා 1955 ඔක්තෝබර් 02 වැනිදා 'සිළුමිණ' පුවත්පත ලියා තිබුණේ 'මාරයාගේ ප්‍රසිද්ධ වාස භවනට ගිය ගමනක්' සේ හඳුන්වමිනි.

"සර් අර සෙල් එකේ ඉන්නේ එරික් බචෝ..." ජේලර් කියන විට ප්‍රේමදාස මහතා එතෙක් දැක බලා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටි සිරකරුවාගේ මුහුණ දැකීමට යුනුසුළු විය.

"බචෝ ප්‍රිවි කවුන්සලේට ඇපිල් කළා. නමුත් ඒකෙන් පැරදුණා. එයාව එල්ලා මරන්න නියමිත දිනය ලබන ඔක්තෝබර් 4 වැනිදා. තව දින 6 ක් තියෙනවා" ජේලර් කොඳුරා කීවේය.

6

පෙම්වතියට පිහියෙන් ඇන මැරූ පෙම්වතෙකුගේ කතාව

ප්‍රේමදාස මහතා දුටු එරික් බචෝ "ගුඩ් ඊවිනින් සර්" යයි ඉංග්‍රීසි බසින් සුබ පැතුවේ ය. ඔහු සිය සිහින් කය තුවායකින් වසා සිටියේය. ප්‍රේමදාස මහතා කියා ඇති අන්දමට බචෝගේ කට හඬෙහි පැවැති අති තරුණ වියේ දෝංකාරය තමාගේ කන් සිදුරු තුළ රැව් දෙන්නාක් මෙන් දැනී ඇත.

"බචෝ, ඔබ පෙම්වතිය මැරීමට තරම් දාමරික වුණේ ඇයි? ඇත්ත වශයෙන් ම ඇයට පෙම් කළා නම් ඇගේ හැම වරදකටම සමාව දිය යුතුව තිබුණා නේද?"

"හදිසි කෝපය සර්, හදිසි කෝපය! මටත් ඒ වෙලාවේ මොනවා වුණාද කියලා හිතාගන්න බැහැ. පෙම්වතියකගේ මොන වරද ඉවසුවත් ඇය අනිකෙකු සමඟ එක්වීම ඉවසිය හැකි පෙම්වතකු ඇතැයි මම විශ්වාස කරන්නේ නැහැ."

මානුෂික හැඟීමක් කැටි වුණා දුක්බර වේගවත් හඬින් බචෝ පිළිතුරු දුන් අතර සිය දෙනෙතින් රූරා ගලා වැටුණු කඳුළු සහිත මුහුණින් ඔහු බිම බලාගෙන ඇත. බචෝ පොතපත කියවන බව ඉවෙන් මෙන් දැන ගත් ප්‍රේමදාස දැන ගත්තේය.

"බචෝ, පොත් කියවනවා පමණක් ද ලියන්නේ නැද්ද?"

"ඇයි, නැත්තේ රිමාන්ඩ් එකේ ඉන්නකොට මම පොතක් ලියන්න පටන් ගත්තා. ඒ පිටපත රිමාන්ඩ් එකේ මහත්තයෙක් ළඟ තියෙනවා."

"මොකක් ගැනද පොත? ආලය ගැනද?"

"නැහැ, නැහැ, ආලය ගැනම නොවෙයි, මගේ හිතට ආපු එක එක දේ ගැන."

1955 නොවැම්බර් 23 වැනිදාට එල්ලා මැරීමට නියමව සිටි එරික් බචෝ මරණීය දණ්ඩනයෙන් මුදාලීමේ ප්‍රශ්න සලකා බලන්නැයි දස අතින් සන්දේශ ලැබිණ. ස්වදේශ කටයුතු පිළිබඳ ඇමැති ඒ. රත්නායක මහතා 1955 නොවැම්බර් 04 වැනිදා වැඩ බලන අධිකරණ ඇමැති සර් උක්වත්තේ ජයසුන්දර මහතාගෙන් ඉල්ලා ඇති බව 1955 නොවැම්බර් 05 වැනිදා 'ජනතා' පත්‍රයේ මුල් පිටුවේ ප්‍රධාන පුවත ලෙස වාර්තා වී තිබුණි.

එම්. එස් ප්‍රනාන්දු

ආර්. ප්‍රේමදාස

වොලී බැස්ටියන්

ඒ. රත්නායක

මේ අතර පිළියන්දල තරුණ බෞද්ධ සමිතිය, ශාසනාරක්ෂක සමිතිය, ශ්‍රී වෛසාඛෝත්සව සමිතිය රන්ගිරි ක්‍රීඩා සමාජය, ශ්‍රී සද්ධර්මවර්ධන සමිතිය, තුම්බෝවිල බුද්ධ ජයන්ති කාරක සභාව, ඇතුළු තවත් සංගම් කිහිපයක මූලිකත්වයෙන් දහස් ගණනකගේ අත්සන් සහිත මහ සන්දේශයක් ඉදිරිපත් කර තිබුණි. ගම්පොල සමිති සමාගම් කිහිපයක නියෝජිත පිරිසක් අග්‍රාණ්ඩුකාර සර් ඔලිවර් ගුණතිලක මහතා හමුවූහ.

කොළඹ නගර සභාවේ උප නගරාධිපති ආර්. ප්‍රේමදාස මහතා වෙත ලිපියක් ලියූ එරික් බචෝ දැන් බෞද්ධාගම වැලඳගෙන ඇති බවත්, උදේ සවස මල් පූජා කරන බවත්, ගාථා කියන බවත් සඳහන් කර ඇත. මේ ලිපිය 'ජනතා' පුවත්පතේ (1955.11.15) පළ වී තිබුණි.

ගරු උප නගරාධිපතිතුමනි.

මා ජීවිත දානය ලදොත් බෞද්ධයෙකු වීමට තීරණය කර සිටින බව ඔබතුමා දන්නා බැව් මම විශ්වාස කරමි. ක්‍රිස්තියානි තරුණයකු වූ මම බොහෝ පොත්පත් කියවූවෙක්මි. සිද්ධ ස්ථානවලට ගිය ගමන් බිමන් බොහෝ ය. මෙහි ආවාට පසුව මට හැඳින ගන්නට ලැබුණ පිරිස අතර අහිංසක අය බොහෝ වෙති. උදේ පටන් සවස් වනතුරුම ඔවුන් කියා සිටින්නේ කර්මය ගැනමයි. මේ කරුමය ගැන මමත් කල්පනා කළා. එහි ඇත්තක් ඇති බව මටත් වැටහී ගියාය. එදා පටන් තමා බුද්ධාගම කෙරෙහි මගේ සිත පැහැදුණේ. මා මෙයින් බේරුණත් නැතත් බෞද්ධයකු වීමට තීරණය කර ගත්තේ මින් පසුවයි. මෙය නිදහස පතා බුද්ධාගම වැලඳ ගැනීම නොවේ. මගේ තීරණය ස්ථිරය. නියම වශයෙන් ම බුද්ධාගම වැලඳ ගත්තෙකු සේ මියයාමයි මගේ අදහස.

මා ඉතා කරුණාවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ කෙසේ හෝ මට නැවත වරක් ජීවත්වීමට අවසර සලසා දෙන ලෙසයි. මැරෙන්නට ඇති බිය නිසා මෙසේ මා කන්නලව් කරනවා නොවේ. මගේ ජීවිතයේ මෙතරම් ළාබාල කාලයේදීම මැරෙන්නට වීම ගැන මට දුකයි. මා මරා දැමීමෙන් මේ දිවයිනට මොන යහපතක් වේද, මගේ මරණීය දණ්ඩනය තව අවුරුදු කිහිපයකට කල් දැමුවොත් මගේ සහෝදර හිරකරුවනට හා නිලධාරීන්ට වැටහෙනු ඇත.

මා ස්ථිරවම ඔබතුමන්ට කියා සිටින්නේ ඉතාමත් වටිනා ජීවිතයක් ලෝකයා ඉදිරියේ සිටින්නේ මේ කරුණ උඩය. අවුරුදු කිහිපයකට පසුව වුවමනා නම් මා එල්ලා දැමීමට යළිත් භාරවීමට මම සතුටුයි. එවිට මට එක් සැනසිල්ලක් ලැබේ. බෞද්ධයකු වශයෙන් යහපත් ජීවිතයක් ගත කොට සහෝදර සිරකරුවන්ටත් ආදර්ශයක් දී මිය යාමට ලැබීම මගේ සැනසිල්ලට හේතුවේ.

ඔබ හැම දෙනාටම ඒ වෙනුවෙන් ස්තුති වන්නේ ඔබේ කීකරු සේවක

එරික් ඩබ්ලිව්. බචෝ

ප.ලි. නායක හිමියනට මෙහි පැමිණ අද මට පන්සිල් දෙන මෙන් මම ඉල්ලා යැවිවෙමි. දැන් මම මල් පහන් පුදමි. ගාථා කියමි.

බචෝ මල් පහන් පුදමින් මෙසේ ප්‍රාර්ථනා කර ඇති බව ද 'ජනතා' පත්‍රයේ පළවී තිබුණි.

මා මරණයෙන් බේරුණත් නැතත් බෞද්ධයකු වීමට මම අධිෂ්ඨාන කර ගත්තා. මරණයෙන් බේරීමට නෙවෙයි මා බෞද්ධයකු වන්නේ. මගේ තීරණය බෞද්ධයකු වී මිය යෑමයි. ඒ අවසාන තීරණයයි. මා සත්‍යවාදීව බෞද්ධ ආගම වැලඳ ගත්තෙකු සේ මිය යාම මගේ එකම ආශාවයි.

උප නගරාධිපති විසින් බචෝ එවන ලද ආයාචනය අග්‍රාණ්ඩුකාරයා වෙත යවා ඇත. ඒ අතර බචෝගේ රාජාධිකරණ ඇපෑල නිශ්ප්‍රභාවීමේ ප්‍රතිඵලයක් වූ අතර ඔහු එල්ලා මැරීම 1956 අප්‍රේල් 10 වැනිදාට කල් ගොස් ඇති බව 1956 මාර්තු 14 'ජනතා' පත්‍රයේ පළ වී තිබුණි.

1956 බුද්ධ ජයන්ති මහෝත්සවය අවසන් වනතුරු තමා එල්ලා නොමරණ ලෙස එරික් බචෝ ලංකා බෞද්ධ බල මණ්ඩලයෙන් ඉල්ලා සිටියේය. තමා බෞද්ධාගම වැලඳ ගත්තේ මෑතක දී බවත්, මේ ඓතිහාසික මහෝත්සවයට සහභාගි වීමට අවස්ථාවක් ලබාදෙන ලෙස ද බෞද්ධ මණ්ඩලයෙන් වැඩිදුරටත් ඉල්ලා ඇත. බචෝ තමා වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර සර් ඔලිවර් ගුණතිලක මහතාට කරුණු කියා එල්ලා මැරීම කල් දමන ලෙස ඔහු ඉල්ලා සිටිය ද උසස් තැන්වලින් නියමයක් නොලැබුණොත් නියමිත දිනයට බචෝ එල්ලා මරණ බව බන්ධනාගාර උප අධ්‍යක්ෂවරයා 'ජනතා' පත්‍රයේ වාර්තාකරුට ප්‍රකාශකර තිබුණි.

"මාරයා මෙදා බචෝ අත්හරී ද?

යන ශීර්ෂ පාඨයෙන් එරික් බචෝ ගැන ලියූ පුවතක බචෝ මරණීය දණ්ඩනයෙන් බේරා ගැනීමට ස්වදේශ කටයුතු ඇමැති ඒ.පී. ජයසූරිය මහතා අධිකරණ ඇමැති එච්.ඩබ්ලිව්.එච්. ද සිල්වා මහතා හමුවී ඇති බව වාර්තා වී ඇත. 1956 අප්‍රේල් 11 වැනිදා රැස්වූ ආණ්ඩු පක්ෂය එරික්ගේ මරණ දණ්ඩනය වසර තුනක් තෙක් තාවකාලිකව අවලංගු කිරීමට ඇමැති මණ්ඩලය තීරණය කර ඇති බව 'ජනතා' පත්‍රය (1956 අප්‍රේල් 12 වැනිදා) වාර්තා කර තිබිණි.

බචෝට මරණීය දණ්ඩනයෙන් නිදහස් කරන ලෙස මල්වතු, අස්ගිරි මහ නාහිමිවරු ද මහා සංඝරත්නයේ අත්සන් සහිත සංදේශයක් අග්‍රාණ්ඩුකාර සර් ඔලිවර් ගුණතිලක මහතාට භාරදුන් බව 1956 අප්‍රේල් 05 වැනිදා ජාතික පුවත්පත්වල පළ වී තිබූහ. මේ සංදේශයට වැලිවිට අසරණ සරණ සරණංකර මල්වතු මහනායක හිමියන් ද යටවත්තේ ශ්‍රී ධම්ම රතන අස්ගිරි පාර්ශ්වයේ මහානායක හිමියන් ද, ශ්‍රී ඉන්ද්‍රජෝති ආරියවංශ කෝට්ටේ මහානායක හිමියන් ද, මඩිහේ පඤ්ඤාසීහ අමරපුර ධර්ම රක්ඛිත නිකායේ මහනායක හිමියන් ද විද්‍යාලංකාර පරිවෙණාධිපති කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමියන් විද්‍යෝදය පිරිවෙනේ උප ප්‍රධාන කළුකොඳයාවේ ප්‍රඥාශේඛර නාහිමියන් ද වජිරාරාමාධිපති නාරද නාහිමියන් ද අත්සන් කොට තිබූහ.

එරික් බචෝට නිදහස ලැබිණි.

1933 උපත ලැබූ එරික් වෝල්ටර් බචෝ 1973 මාර්තු 21 වැනිදා වත්තල හැඳල කැනල් පාරේ නිවසේ දී මිය ගියේ වයස අවුරුදු 40 පසු කරමින් සිටියෙදී ය. එම මරණය 1973 මාර්තු 22 වැනිදා ඩේලිනිවුස් පත්‍රයේ මෙසේ සඳහන් කර තිබුණි.

Eric Batcho dead

Death by natural causes clatmed the life of 40 year -old Eric Batcho who escaped the hangman's noose for the murder of his fiance Miss Mertene Ludowyke about twenty years ago.

6

පෙම්වතිය මැරූ එරික් බචෝ නීතියෙන් ගැලවුණත් කර්මයෙන් ගැලවුණේ නැත

මර්ලින් ලුඩොවයික් මරණයට පත්වූ දින උදෑසන තම හිතවතියක වූ විසි හතර හැවිරිදි අවිවාහක Myrna klyn සමඟ බොරැල්ලේ සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයට ගියාය. මිනී මැරුම් නඩුවේ මුල්ම සාක්ෂිකාරිය ඇයයි. ළඟක දී සිට මර්ලින්, අයිවර් මාටිනස් නම් තරුණයා සමඟ පෙමින් වෙළී සිටින බැව් දැන සිටි බචෝ කුපිතව ඇයට තර්ජනය කළ බව ද සාක්කිකාරිය අධිකරණයට හෙළි කළාය.

"මම උඹවත් මරලා මමත් මැරෙනවා." උඹ සෙල්ලම් කරන්නේ ගින්දරත් එක්ක" යි බචෝ ඇයට තර්ජනය කොට බිය ගන්වා (Blackmal) ඇත.වරෙක බචෝ ඇයට ලියූ අවසන් ලිපියෙන් මෙසේ ලියා තිබුණි.

"නුඹේ අනිසි මානසික තත්ත්වය අනිත් පෙම්වතුන්ට හොඳ පාඩමක් වන ලෙස මම නුඹනේ පළිගනිමි.

මෙය නුඹේ ආදරවන්ත
එරික් බචෝ

ගබඩා පාලකවරයකු වූ තම බාල සොහොයුරා වූ අවිවාහක ඒ. බචෝ සමඟ වත්තල නිවසේ වසර 7 ½ ක් ජීවත්වූ එරික්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය කළ වෛද්‍ය නිලධාරි වෛද්‍ය වීරබන්සා නිගමන කළේ නොනවත්වා ලේ ගැලීම නිසා මරණය සිදු වූ බවය.

මරණීය දඬුවමෙන් නීතියෙන් බේරුණත් එරික් බචෝට කර්මයෙන් නම් ගැලවීමට ලැබුණේ නැත.

එරික් බචෝ හා මර්ලින්ගේ බේදවාචකය ගැන එකල තිබූ තවත් ජනප්‍රිය බයිලා ගායනයකින් මේ ලිපිය අවසන් කරමි. වොලී බැස්ටියන් විසින් රචනා කොට සංගීතවත් කොට ගැයූ මේ ගීතය ද සමාජ විද්‍යාත්මක වටිනාකම සලකා පළ කරමි.

ඇත්තයි පොදි ආලෙට මිනීමරයි සමහරු
සත්තයි ආලය අන්ධයි කීවේ පඬිවරු
වරක් ලව් කරපු කෙල්ල අමතක කර පැන්නේ
එරික් බචෝ ගැන කියනවා අසනු ළමයිනේ

එරික් බචෝ නඩුවේ රජය වෙනුවෙන් නීතිපති වෙනුවෙන් රාජනීතිඥ ආනන්ද පෙරේයිරා; රාජනීතිඥ ජේ.ආර්.එම්. පෙරේරා පෙනී සිටි අතර, බචෝ වෙනුවෙන් ඉග්රන්ටන් බී. වීරකෝන් ගේ උපදෙස් පරිදි සී.එස්.බාර් කුමාරකුලසිංහ, මෙරිල් සී.එච්. ද සිල්වා, ඩබ්ලිව්.එන්.එස්. විජේරත්න යන නීතිඥයන් පෙනී සිට ඇත. බචෝ මරණීය දණ්ඩනයෙන් බේරා ගැනීමට නීතිඥ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ද ගත් වෙහෙස සුළු පටු නොවන බව වාර්තාවේ.

(ඡායාරූප පිටපත් කිරීම - ලාල් සෙනරත්)

මහත්වරුන් සේ රඟපා සල්ලි පොදි බඳින යාචකයෝ

● **නිලංකා ජයසූරිය**

හිඟාකෑමේ අතීතය ගණිකා වෘත්තියෙහි අතීතය තරමටම ඈතට දිවයන්නක් බව ඉතිහාසය පිළිබඳ විමසුමේදී පෙනී යන කරුණකි. යාචකයන් එසේත් නැත්නම් හිඟන්නන් පිළිබඳ කුඩා කල අප තුළ වූ මතකය නම් ඉතා කිළිටි ඇඳුම්, ඉරුණු කඩමාල්ලකින් සැරසී, ටින් කබලක් අතින් ගෙන 'පිනට යමක් දෙන්නැයි', නැතහොත් "කෑමට යමක් දෙන්නැයි" යදින බයාදු, යටහත් චරිතයකි.

එහෙත් ඒ දශක පහකට පමණ ඉහතදීය. මේ වන විට සිඟමන් යැදීමේ කලාව පමණක් නොව 'යාචකයා' යන චරිතය ද බොහෝ වෙනස්වීම්වලට බඳුන්වී හමාරය.

හිඟන්නා, එසේත් නැත්නම් 'යාචකයා' යනු යම්කිසි මුදලක්, ආහාර වේලක්, වෙනත් ප්‍රතිලාභයක් සඳහා යමෙකු පොළඹවමින්, එසේම තමන් ලබන දේ සඳහා කිසිඳු අන්දමක ආපසු ගෙවීමක් නොකොට උපකාර ලබන්නෙකි.

'හිඟාකෑම' යන්න ලොව පුරා සෑම රටකම පාහේ ප්‍රධාන පෙළේ සමාජ ප්‍රශ්නයක් බවට පත්වී හමාරය. ඒ අනුව ඉන්දියාවේ පමණක් සිඟමන් යදින යාචකයන් සංඛ්‍යාව භාර ලක්ෂ දහතුන් දහස ඉක්මවා ගොස් ඇති බැව් සංඛ්‍යාලේඛන මඟින් පෙන්නුම් කරයි.

කෙසේ වුවත්, මේසෑම රටකම පාහේ හිඟාකෑමේ ක්‍රමෝපායන් නවීකරණයට ලක්වී ඇත්තේ සමාජ විපර්යාසයන් සමඟින් සාම්ප්‍රදායික හිඟන්නා ගේ සිඟමන් යැදීමේ උපක්‍රමයන් තවදුරටත් වලංගු නොමැති බැවින් වන්නට හැකිය.

යම් කිසිවෙකු මිය ගිය විට, මිය ගිය තැනැත්තා සිහිපත් කොට හිඟන්නන්ට දානයක් දීම ඇතැම් කතෝලික බැතිමතුන් අතර පුරුද්දක් ඇත. එහෙත් මෑතකදී තම මවගේ දානය සඳහා හිඟන්නන් සොයා ගිය මගේ මිතුරෙකුට අපූරු සිදුවීමකට මුහුණ පාන්නට සිදුවී තිබිණි. හරියටම එකොළහ හමාර වන විට කලින් පොරොන්දු වූ පරිදි කතාකොටගෙන තිබූ යාචකයන් තිදෙනෙකු කැඳවාගෙන ඒමට ගිය ඔහු පැය එකහමාරකට ආසන්න වේලාවක් බලාසිට රස්තියාදු වී; ආපසු හැරී එන්නට ඔන්න මෙන්න තිබියදී වේගයෙන් ආ ත්‍රිරෝද රථයකින් කඩිමුඩියේ බැස ගත් යාචකයන් දෙදෙනෙකු මිතුරා වෙත පැමිණි අතර; "කෑමට ප්‍රමාද වීමට නොහැකි බැවින් හැකිනම් පාර්සල් කොට දෙන ලෙස ඉල්ලා තිබුණේ මිතුරාගේ කේන්තිය අසූහාරදහසට උත්සන්න කරවමිනි.

පසුව කාරණාව සොයා බලන විට, එදින සිකුරාදා දිනයක් වූ බැවින් මුස්ලිම් පල්ලිය අසල සිඟමන් යැදීමෙන් කිසිඳු අපහසුවකින් තොරව රුපියල් දෙදහකට ආසන්න මුදලක් සොයා ගැනීමට ඇති ඉඩකඩ අහිමි විය හැකි බැවින් ඔවුන් විසින් එවැනි ඉල්ලීමක් කර තිබූ බැව් අනාවරණය වී තිබිණි.

හිඟා කෑමේ අලුත්ම ප්‍රවණතාවය නම් 'ඩීසන්ට් විදිහට' දුක හිතෙන අන්දමට කඳුළු කථා කීමය. මෑතකදී මීගමුරවේ සිට කොළඹ බලා යන බස් රථයකට අතරමඟදී හොඳින් හැඳ පැලඳ සිටි තරුණ යුවළක් ගොඩ වැදුණි.

"මම මීට කලින් කවදාවත් හිඟමන් ඉල්ලලා නැහැ. මගේ අම්මා පිළිකාවක් හැදිල මහරගම පිළිකා රෝහලේ. අම්මට දවසකට පැම්පර්ස් පැකට් හතරයි; ඉන්ජක්ෂන් එකටයි පලතුරුවලට රුපියල් තුන්දහකට වඩා යනව. අම්මව බලන්න දවසට තුන් වතාවක් මහරගම යන්න ඕනෙ".... අසන්නවුන්ගේ ඇස් කඳුළින් තෙමෙන තරමට, දුක හිතෙන කතාව කරගෙන යන අතර බස් රථයේ සිටි මගියෙක් ඇය දෙස බලා සිට "ඔහේ ඔය කරන්නෙ මහ බොරුවක්. මීට මාස තුනකට විතර කලින් කුරුණෑගල බස් එකක කෑගහගෙන ඔය කතාවම කිව්ව නේද?" යනුවෙන් කෑගසද්දී, සෙනඟ අතරින් ඉදිරියට ගොස් ඊළඟ නැවතුමෙන් දෙදෙනාම දඩි බිඩියේ බැස දුවන්නට වූයේ බසයේ සිටි මගියා හට කුණුහරුපවැල් පිටින් පවසා බැණ වදිමිනි.

සෙනඟ ගැවසෙන ස්ථාන විශේෂයෙන් බස්රථ, දුම්රිය මැදිරිවලට හොඳින් හැඳ පැලඳ ගෙනවිත්, ඉංග්‍රීසි බසින් බොහෝම ආචාරශීලී අන්දමින් කතා කරමින් 'ඉංග්‍රීසියෙන් සිඟා කෑම' තවත් උප්පරවැට්ටියකි. ඉංග්‍රීසියෙන් කතාබහ කරන්නේ හොඳ වැදගත් උදවිය යැයි සිතන්නට පුරුදුවූවන් සිටින සමාජයක, එම සමාජ මතය තම වාසියට හරවා ගත්තවුන් ඉංග්‍රීසියෙන් කතා කර හිඟා කෑම අද නිතර දක්නට ලැබෙන්නකි.

බස් රථයක් පන ගන්වන්නට ඔන්න, මෙන්න තිබියදී ගිටාරය වයමින් ගීතයක් ගයා තමන් වෙත බසයේ සිටින මගීන්ගේ අවධානය ඇද බැඳ ගන්නට වෙර දරන 'තරුණයෙකු' සින්දුව අවසානයේ තම කඳුළු කතාව දිගහරින්නේ අසාසිටින්නන්ගේ හදවත් කම්පනයට පත් කරවිමිනි.

"විශ්වවිද්‍යාල සිසුවෙකු වන තමන්ට අත්‍යවශ්‍ය පොත් කිහිපයක් මිලදී ගැන්මට නොහැකි වූයෙන් එම පොත් මිලදී ගැනීමට කුඩා 'රුපියල් විස්සකින් වත්' ආධාර කරන ලෙස අයදින මොහු තවත් සති කිහිපයකින් පසු දුම්රියක නැග මෙවැනිම 'රංගනයක' යෙදෙනුයේ, සමාජයෙහි 'හද ගැස්ම' තම මඩිය තර කර ගැන්මට අවස්ථාවක්ය යන්න අත්දැකීමෙන්ම දැන සිටි බැවින් වෙන්නට ඇත.

පාදයෙහි ඔඩු දුවමින් ගඳ ගහන තුවාලයක් ඇති බැව් පෙන්වීමට හකුරු තබා වෙළුම් පටියකින් බැඳ හෝ කරවල තබා බැඳ සෙනඟ අතරින් ඔබ මොබ යමින් හිඟමන් යදිද්දී, 'අප්‍රසන්න බව, පිළිකුල් හේතුවෙන්ම වහ වහා කාසියක් දී ඉවත බලා ගැන්මට බස් මගීන් පුරුදුව සිටියේ මෙයට දශක කිහිපයකට ඉහතදීය. අපස්මාරය හැදුනකු මෙන් හිටි හැටියේ සෙම පෙරමින් බිම වැටී දැඟලීම වැනි මෙවැනි 'යල් පැන ගිය' හිඟමන් යැදීමේ උපක්‍රම අප සමාජයෙන් පමණක් නොව, ආසියාවෙහි බොහෝ සමාජයන්ගෙන් ඉවත්වී හමාරය.

එදා සමාජයෙහි 'යාචකයා' යනු හැඳිවත හා කඩ මාළු කිහිපයකට පමණක් උරුමකම් කීවෙකු නොවේ. එහෙත් හිඟමන් යැදීම මුදල් උපයා ගැන්මේ පහසු මාර්ගයක් ලෙස තෝරාගැන්මට පෙළඹුණු 'හිඟන මුදලාලිලා හේතුවෙන්; යාචකයන් ලෙස පෙනී සිටිමින් හිඟමන් යදින ඇතැම්හු හට බැංකු ගිණුම්; ස්මාර්ට් ෆෝන්; හැඳුනුම්පත්; වට්ස් ඇප්, වයිබර් පමණක් නොව ෆේස් බුක් ගිණුම් පවා හිමි අතර හිඟා කෑමෙන් උපයාගත් මුදලින් යාන, වාහන, තට්ටු ගෙවල් පවා හිමියැයි පැවසුවහොත්, එය අතිශෝක්තියක් නොවේ.

මෙහි වඩාත්ම හාස්‍ය ජනක කරුණනම් කොච්චිකඩය වැනි ප්‍රදේශයන්හි 'මාසය අන්තිමට පඩි ගත් විට ගෙවීමේ පොරොන්දුව මත' මහත්වරුන්ට පොලියට මුදල් ලබා දෙන, රත්තරන් බඩු උකසට ගන්නා යාචකයන් ද වීමය.

යාචක වෘත්තියෙහි පවත්නා සංවිධානාත්මක රටාව තුළ අප රටේ හිඟන මුදලාලිලා සහ ඔවුනගේ අතකොළු බවට පත් මැරයන්ගෙන් අවසර නොගෙන අලුතින් හිඟමනට බැසීම ඉතාම අවදානම් කටයුත්තකි.

එහෙත් ස්විඩන් නගරයෙහි (Swidish Town) නම් යමෙකුට හිඟමන් යැදීමට අවශ්‍ය නම් ඔහු ඒ සඳහා පවුම් විසි එකක මිලක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතුය. මෙම බලපත්‍ර සඳහා අන්තර්ජාලය හරහා ඉල්ලුම් කළ හැකි අතර, එසේත් නොමැති නම් පොලිස් ස්ථානය වෙත ගොස් ලබා ගත හැකිය. ඒ සඳහා තම අනන්‍යතාවය තහවුරු කිරීමට හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වූවකි.

ඒ අනුව යම් පුද්ගලයෙකු බලපත්‍ර රහිතව හිඟමන් යැදීම වරදක් වන අතර; එවැනි වරදක් කොට හසුවුවහොත්; නිදහස් වීමට නම් පවුම් තුන්සිය හතළිස් දෙකක් ගෙවීමට සිදුවෙයි.

ඩිජිටල් තාක්ෂණය ලෝකය පුරා පැතිර යද්දී චීනය වැනි රටවල යාචකයන් හිඟමන් යැදීමට ඩිජිටල් තාක්ෂණය යොදා ගැන්ම අපූරු ක්‍රමවේදයක් බවට පත්වී හමාරය. මේ අනුව තමන් ඉදිරිපිට තබා ඇති බඳුනෙහි තම 'කිව් ආර් කෝඩ්' සඳහන් කරන ලද පත්‍රිකාවක් වෙයි.

මෙම යාචකයන්ට ඔවුන්ගේ ගිණුම් පවත්වාගෙන යාමට ජංගම දුරකථන අවශ්‍ය නැත. ඒ අනුව කිව් ආර් කෝඩ් හරහා තමනට එකතුවන මුදල, කෙළින්ම යාචකයාගේ 'ඩිජිටල් වොලට්ටුව' වෙත යවනු ලබන අතර හිඟා කෑම සඳහා භාවිතා කරන ලද 'කිව් ආර්' කෝඩ් සඳහන් පත්‍රිකාව අදාළ වෙළඳසැල වෙත ඉදිරිපත්කර, එය 'ස්කෑන්' කිරීම මඟින් මුදල් භාවිතයකින් තොරව අවශ්‍ය බඩු බාහිරාදිය මිලදී ගැන්මේ අවස්ථාව සැලසෙයි.

චීන ජාතිකයන් බොහොමයක් මුදල් පරිහරණය පසෙක තිබියදී කාඩ්පත් මඟින්; ජංගම දුරකථන හරහා ගෙවීම් සිදුකරන්නට හුරුවී සිටිනා බැවින් එවැනි තත්වයක් තුළ තවදුරටත් 'කාසි හෝ නෝට්ටු' අපේක්ෂා කිරීම ඵල රහිත බැව් දන්නා යාචකයන් ඩිජිටල් තාක්ෂණය හිඟමන් යැදීම සඳහා යොදා ගැන්මට හුරුවීම තුළ ඔවුන් කොතරම් සූක්ෂමද? යන්න මොනවට පැහැදිලි වෙයි.

හිඟාකෑම, නැතහොත් හිඟමන් යැදීම යන්නෙන් ගම්‍ය වන්නේ කිසිඳු සේවාවක් සැපයුමකින් තොරව; අනුකම්පාව, අවධානය දිනාගැන්ම තුළින් මුදලක් හෝ ආහාර පාන වැනි කිසිවක් හිමිකර ගැනීමය.

එහෙත් හිඟාකෑම එහි අරුතයේ පරිදි, ඒ ආකාරයෙන්ම 'සම්ප්‍රදායික' මට්ටමින් කරගෙන යාම තරමක් දුෂ්කර වීමත් සමඟ, මුදල් ලබා දීම සඳහා මුදල් ඇත්තවුන් පෙලඹවීම සඳහා විවිධ උපක්‍රම සොයන්නට වූ ඇතැමුන්, පොදු සමාජ සම්මතය මඟින් බැහැර කරන ක්‍රමවේදයන්ට පවා අනුගතව ඇති ආකාරය දක්නට හැකිය.

"පාවිච්චි කරන ලද කාන්තා යට ඇඳුම්, මේස්, කාන්තා සපත්තු පිළිබඳව අන්තර්ජාලය හරහා වෙබ් අඩවිවල පළකිරීම තුළින්, මෙවැනි දෑ සඳහා ආකර්ෂණය වූ පිරිස් ග්‍රහණය කොටගෙන, අන්තර්ජාලය ඔස්සේ ඒවා බෙදා හැරීම හා අදාළ ගෙවීම් තම ගිණුමට ගෙන්වා ගැනීම "හිඟා නොකා හිඟමන් යදින' ක්‍රමයක් බටහිර සමාජයන්ගෙන් අසන්නට ලැබෙයි.

මෙහි විශේෂත්වය නම්, මෙය කාන්තාවන්ට පමණක් වූවක් වන අතර; ඇයගේ පසුබිම, රූපය පවා එහි අලෙවිය උදෙසා බලපෑ හැකි බැවින් එය හැම පුද්ගලයෙකුටම අදාළ වන්නක් නොවීමය.

පාවිච්චි කරන ලද කාන්තා යට ඇඳුම් හැරුණු විට හිසකෙස්; සනීපාරක්ෂක තුවා වැනි දෑ මිලදී ගැන්මේ උන්මාදයෙන් පෙළෙනවුන් හට අන්තර්ජාලය ඔස්සේ එවැනි දෑ අලෙවි කිරීමෙන් තම පරිහරණයට අවශ්‍ය ආහාර පමණක් නොව සුඛෝපභෝගී නිවාඩු ගත කිරීමේ අවස්ථාවන් වෙනුවෙන් පවා 'අත දිග හැර ගෙවන්නට' ඇතැමුන් ත්‍යාගශීලී වන බැවින් දැන් දැන් බටහිර සමාජයෙහි තරුණියන් මේ සඳහා යොමුවීමේ ප්‍රවණතාවයක් දක්නට හැකිය.

සැකසුම: හර්ෂා සුගතදාස

පිළිතුරු සැපයීම - කායික රෝග විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක

දියවැඩියා රෝගීන්ට කම්පනය නුසුදුසුද?

ප්‍රශ්නය :- මම දියවැඩියාව රෝගයෙන් පෙළෙන 62 හැවිරිදි පිරිමියෙක්මි. මා දන්නා තරමින් අධි රුධිර පීඩනය හෝ කොලෙස්ටරෝල් නැත. සායනයට ගිය විට පරීක්ෂා කරනු ලැබූවද එවැන්නක් වාර්තා වී නැත. මෑතකදී නිවසේ ඇති කරන සුනඛ සුරතලා වාහනයක හැපී මිය ගියේ මගේ දෑස් ඉදිරිපිටමය. ඒ අවස්ථාවේ මගේ පපුවේ වේදනාවක් සමඟ හිස කරකැවිල්ල ඇති විය. පපුව හිර කරමින් ඇති වූ වේදනාව වචනයෙන් විස්තර කළ නොහැකිය. මා සිතුවේ මා මිය යන බවයි. ඉන්පසු දින තුනකින් පමණ සාමාන්‍ය තත්ත්වයට පත් විය. මගේ ගැටලුව වන්නේ දියවැඩියාව රෝගීන්ට හදිසි කම්පන තත්ත්වයන්ට මුහුණදීම නුසුදුසු ද යන්නයි. ඉදිරියේදීත් මා එවැනි තත්ත්වයකට පත් වේදැයි බියෙන් පසුවෙමි.

මිරිහාන - නිශ්ශංක ප්‍රනාන්දු

පිළිතුර :- අධි සංවේදී පුද්ගලයන්ට දරා ගැනීමේ හැකියාව අඩුය. එවැනි අවස්ථාවක කායික හා මානසික සුවයට යම් බලපෑමක් ඇති විය හැකිය. ඔබ පපුවේ දැඩි වේදනාවක් ගැන සඳහන් කර ඇත. ඇතැම් විට ඔබට හෘදයාබාධයක් ඇති වූවාදැයි අනුමාන කළ හැක්කේ ඔබ කාලයක සිට දියවැඩියාව රෝගයෙන් පෙළෙන නිසාය. දියවැඩියාවත් සමඟ අධි රුධිර පීඩනය සහ හෘදයාබාධ ඇතිවීමේ සම්භාවිතාව ඉතා ඉහළය. එබැවින් ඔබට එම සංවේදී අවස්ථාවේදි හෘදයාබාධ තත්ත්වයක් ඇති වූවා විය හැකිය. දැන් ඔබ යථා තත්ත්වයට පත් වී සිටියද කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමුවීම ඉතා වැදගත් වේ. කායික රෝග විශේෂඥ වෛද්‍යවරයාට සියලුම විස්තර පවසා වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

වෛද්‍ය පරීක්ෂණ වාර්තාවල වරදක් නැහැ

ප්‍රශ්නය :- මම 37 හැවිරිදි විවාහක මවක් වෙමි. මට මීට සති 3කට පමණ පෙර මුත්‍රා දැවිල්ලක් ඇති විය. පොල්පලා තම්බා පානය කළ අතර වැඩි වශයෙන් වතුර පානය කළ විට එය මඟ හැරී ගියේය. එහෙත් දින කීපයකින් නැවත මුත්‍රා දැවිල්ල ඇති විය. පවුලේ වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලැබූවද සුවයක් ලැබුණේ නැත. වෛද්‍යවරයා මුත්‍රා පරීක්ෂණයක් (UFR) කරන ලෙස දැනුම් දුන් අතර එහිදි අනාවරණය වූයේ මුත්‍රාවල රුධිර බිංදු අඩංගු වී ඇති බවයි. ඉන්පසුව urine culture, සී.ටී. ස්කෑන් ඇතුළු පරීක්ෂණ ගණනාවක් සිදු කරන ලදී. ඒ පරීක්ෂණ වාර්තාවල කිසිම වරදක් නොමැති බව තහවුරු විය. දැන් මුත්‍රා දැවිල්ල ද හොඳ වී තිබේ. මා තවදුරටත් වෛද්‍ය පරීක්ෂණවලට යොමු වීමට අවශ්‍යද?

ඉඹුල්ගොඩ - රුචිරා සංදීපනි දිසානායක

පිළිතුර :- ඔබ සඳහන් කරන තිබෙන තොරතුරු අනුව තවදුරටත් වෛද්‍ය පරීක්ෂණ කිරීමට අවශ්‍ය නැත. ඔබේ සී.ටී. ස්කෑන්, culture වාර්තා සියල්ල සාමාන්‍ය මට්ටමෙන් තිබෙන නිසා ඔබ බිය විය යුතු නැත. ඔබේ UFR පරීක්ෂණයේ රුධිරය අඩංගු වී තිබෙන්නේ කිනම් මට්ටමකදැයි සටහන් කර තිබුණේ නම් වඩාත් පහසුය. මන්ද අඩංගු විය යුතු රුධිර මට්ටමට වඩා කොපමණ වැඩිදැයි නිශ්චය කර ගත හැක්කේ එම අගය පරීක්ෂා කර බැලීමෙනි. කෙසේ නමුදු ඔබේ තත්ත්වයේ වෙනසක් නැති නම් වෛද්‍ය පරීක්ෂණ අවශ්‍ය නැත. නැවත රෝග ලක්ෂණයක් මතු වුවහොත් අනිවාර්යයෙන් වෛද්‍යවරයකු හමුවන්න.

බෙල්ලෙ අස්ථි ගෙවීමෙන් වේදනාව

ප්‍රශ්නය :- මම 57 හැවිරිදි පිරිමියෙක්මි. ඔර්ලෝසු කාර්මිකයකු ලෙස සේවය කරමි. මගේ බෙල්ල පිටුපස, උරහිස්, කන් පිටුපස විටින් විට ඇතිවන වේදනාව නිසා මම වෛද්‍යවරයකු හමුවීමට ගියෙමි. මා හොඳින් පරීක්ෂා කළ වෛද්‍යවරයා පැවසුවේ මගේ බෙල්ලේ පිටුපස අස්ථිය ගෙවී ඇති බවයි. හිස පහත් කරගෙන වැඩ නොකරන ලෙස උපදෙස් දුන්නේය. එහෙත් බෙල්ල නොනමා මගේ රැකියාව කළ නොහැකිය. මා කළ යුත්තේ කුමක්ද? බෙල්ලේ අස්ථි ගෙවීමට වෛද්‍ය ප්‍රතිකාර නැතිද?

කළුතර - උපුල් වසන්ත සේනාධීර

පිළිතුර :- ඔබේ වයසට අනුව අස්ථි ක්ෂයවීම් සිදු වීම සාමාන්‍ය දෙයකි. අස්ථි ක්ෂයවීම් සමඟ ස්නායු තෙරපුමක් පවා ඇති විය හැකිය. සමහරවිට බෙල්ල ආශ්‍රිත පේශීන් තද වීමේ තත්ත්වයක් ද ඇති විය හැකිය. වේදනාව සමනය කර ගැනීමට වේදනා නාශක පාවිච්චි කළ හැකිය. ඔබේ ආබාධයට වෛද්‍ය ප්‍රතිකාර තිබේ. එබැවින් ඔබ ප්‍රතිකාර ලබා ගත යුතුය. එහෙත් ඔබේ වැඩ කිරීමේ ඉරියව්වද වෙනස් කර ගත යුතුය. ඉරියව්ව වෙනස් නොකරන තාක් කල් සුවපත් වීමේ හැකියාව අඩු බව අවධාරණයෙන් කියමි.

ඔබේ රැකියාව අනුව නිතරම හිස පහත් කරගෙන සිටිය යුතු බව පිළිගනිමි. ඔබට රැකියාවෙන් ඉවත් වන ලෙස කිසිම විටෙක නොකියමි. එහෙත් ආනතියකින් යුතු පෘෂ්ඨයක් මත හෝ මේසය මතට ලැල්ලක් තබාගෙන බෙල්ල නැමීම වැනි සරල ක්‍රම මඟින් යම්තාක් දුරකට අඩු කර ගැනීමට උත්සාහ කරන්න. කෙසේ නමුදු ඔබ පුනරුත්ථාපන හා රක්තවේද විශේෂඥ වෛද්‍යවරයකුගෙන් හෝ භෞත චිකිත්සකවරයකු හමු වී උපදෙස් ගන්න.

දස හැවිරිදි මල්වර දියණියට ප්‍රශ්නයක්

ප්‍රශ්නය :- මගේ දියණියගේ වයස අවුරුදු 12කි. ඈ වයස අවු:10 දී වැඩිවියට පත් විය. එහෙත් තවමත් ඇයට මාසික ශුද්ධවීම සිදු නොවේ. ඈ කුඩා දැරියක නිසා ඒ ගැන අවධානය යොමු කළේ නැත. ඇයව වෛද්‍යවරයකුට පෙන්වා ප්‍රතිකාර ලබා ගත යුතුද?

හීනටියන - රංගි අනුරාධා ද සිල්වා

පිළිතුර :- මල්වර වූ මුල් කාලයේදී මාසික ශුද්ධවීමේ අක්‍රමවත් බවක් ඇති විය හැකිය. එමෙන්ම හෝමෝන වෙනස්කම් හෝ රක්ත හීනතාව වැනි හේතූන් නිසා ද මාසික ශුද්ධ වීම සිදු නොවී තිබිය හැකිය. හේතුව කුමක් වුවද ඔබේ ගැටලුව නිරාකරණය කර ගත යුතුය. එබැවින් කාන්තා හා ප්‍රසව විශේෂඥ වෛද්‍යවරයකු හමු වී උපදෙස් ලබා ගැනීම වැදගත් වේ.

තරංග

මිතුරු පවුර

● කමල් පෙරේරා

මාතලේ පන්හිඳ මලරන්බන්

මෙවර ගොඩගේ සාහිත්‍ය සම්මාන උළෙලේදී විශිෂ්ටතම දෙමළ නවකතාවට හිමි සම්මානය දිනාගත්තේ ආරුමුගම් මලරන්බන්ය. සම්මානයට පාත්‍ර වූ ඔහුගේ නවකතාව පාල්වනංගලිල් නම් විය. ලාංකික සාහිත්‍යයේ වැඩි අවධානයකට ලක් නොවූ ජන කොටසක් වන රබර් වතු කම්කරු ජනතාවගේ කටුක දිවි පෙවෙත මලරන්බන්ගේ මෙම නවකතාවට තේමා වී ඇත.

මලරන්බන්ද වතුකරයෙන් බිහි වූ ලේඛකයෙකි. ඔහුගේ මුතුන්මිත්තෝ වතු ආර්ථිකය ගොඩනැගීම පිණිස සුදු අධිරාජ්‍යවාදීන් විසින් මෙරටට රැගෙන ආවෝ වෙති. දුලන්දෙයි පෙරුමාල් හා පුලිති වීරම්මාල් වන ඔහුගේ මාපිය දෙපළ උතුරු මාතලේ වත්තේ පදිංචිව සිටියහ. පියා වත්තේ ක්ෂේත්‍ර නිලධාරියකි. පවුලේ සහෝදර සහොදරියෝ නවයක් වූහ. මලරන්බන් හතර වැන්නාය.

“මම මුලින්ම ගියේ වත්තෙ ඉස්කෝලෙට. මට මතක හැටියට අවුරුද්ද 1948. තුනේදි ඩබල් ප්‍රමෝෂන් එකකින් මාතලේ ක්‍රිස්තුදේවෙ පස් වෙනි පන්තියට යන්ඩ මට චාන්ස් එකක් ලැබුණා. ඒ ඉස්කෝලෙදි මට ලැබුණ වටිනාම දේ තමා බෞද්ධ හා කතෝලික මිතුරන් ඇසුරු කරන්න ලැබීම. ඒ වගේම මගේ ජීවිතේට ලොකු බලපෑමක් කරපු රාමලිංගම්,සාහිබ් හා පණ්ඩිත සෙල්ලදොරේ වගෙ ගුරුවරුන්ගෙ ඇසුර ලැබීම. මට තාම මතකයි ඒ ගුරුවරු රාමායනය හා තිරුක්කුරල් වැනි වටිනා පොත් අපට හඳුන්වා දීපු හැටි.”

මා හා දූරකථන සංවාදයකට එක්වෙමින් මලරන්බන් අතීතාවර්ජනයක යෙදුණේ එලෙසිනි. පන්තියේ පළවෙනියා වීමට අමතරව ක්‍රීඩා හා රඟපෑම ආදි ඉසව්වලද මලරන්බන් දස්කම් පෑවේය. පාසලේ හොකී කණ්ඩායමේ මෙන්ම නාට්‍ය වේදිකාවේද ඔහු කැපී පෙනුණේය. මාතලේ දිස්ත්‍රික්කයේ හොඳම පාසල් නාට්‍යය ලෙස සම්මානයට පාත්‍ර වූ සොක්‍රටිස්හි රඟපා හොඳම නළුවාට හිමි සම සම්මානය දිනාගැනීමටද ඔහු සමත් විය.

ආරුමුගම් මලරන්බන්

උසස් පෙළට ලියා විවේක සුවය විඳිමින් මිටි සමයේ මලරන්බන් අකරතැබ්බයකට මුහුණ පෑවේය. ගසකින් වැටී දණහිස බිඳී වසරකටත් වැඩි කලක් එක්තැන්ව සිටීමට ඔහුට සිදු විය. විපත වෙස්වලාගත් ආශිර්වාදයක් බවට පත් කරගත් ඔහු පොත් කියවන්න පටන් ගත්තේය. ලේඛන කලාවට ආශක්ත වීමට හේතු වූයේ මේ කියවීමයි.

“සිංහල කතා කරන්න පුළුවන් වුණාට ලියන්න කියවන්න හැකියාවක් ඉස්කෝලෙන් ලැබුණෙ නැහැ. රාජ් තංගයියා කියල යාළුවෙක් හිටිය. එයා තමා මට සිංහල ඉගැන්නුවෙ. පස්සෙ තනියම පත්තර කියවන්ඩ පුරුදු වුණා. මුලින්ම කියවපු සිංහල පොත තමා ජී.බී.සේනානායකගෙ පළිගැනීම. පස්සෙ කාලෙක මම පළිගැනීම කතාව දෙමළටත් නගල මල්ලිකෙ සගරාවෙ පළ කළා”.

එදා පළිගැනීම කියවා සිංහල සාහිත්‍යයට පෙම් බැන්ද මනරම්බන් අද සිංහල-දෙමළ දෙබසින්ම පොත් පරිවර්තනය කරන සම්මානනීය ලේඛකයෙකි. ඔහුගේ මුල්ම රැකියාව ගුරු වෘත්තියයි. 1977 දේශපාලන පළිගැනීමකින් එම රැකියාව අහිමි වූ පසු ඔහු වත්තක ලිපිකරුවකු ලෙස වැඩ කළේය. කෙටිකතාව පළවුණේ 1962දීය. ඉන්පසුව නැවතත් 1967දී දවස ආයතනයේ දෙමළ ප්‍රකාශනය දිනපති පත්තරයේ පළ වූ පාර්වතී නම් කෙටිකතාව දෙමළ සාහිත්‍ය සමාජයේ ককතාබහට ලක් විණ. මනරම්බන්ගේ ප්‍රථම කෘතිය බිහි වන්නේ 1989දීය. කොඩ්ඩිවිලෙයි නම් එම කතා සංග්‍රහය රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබීය. එසේම 2008දී පළ වූ “පිල්ලෙයාර් සුළි නම් ඒ කතා එකතුවට මධ්‍යම පළාත් හින්දු සංස්කෘතික අමාත්‍යාංශයේ සම්මානය හිමි විණ. මෙම පොත පෙරිය තම්බිගේ තිත් එළුවා නමින් උපාලි ලීලාරත්න සිංහලට නැගීය.

සාහිත්‍ය කලාව ඔස්සේ ජාතික සමගියේ පාලම තනන්න කැපවූ මේ මානවහිතවාදියාටද 83 කළු ජූලියෙන් මිදෙන්නට හැකි නොවිණ. ඔහු මහත් වෙර වෑයමෙන් රැස්කරගත් පොත් ගොන්නද ඇතුළු සබ්බ සේසතම ජාතිවාදයේ ගිනිදැල් වලින් දැවී ගියේය. දිඹුල්ගම නම් කැලෑවට වැදුණු මලරන්බන්ලා ඇතුළු වත්තේ ජනයා යාන්තමින් දිවි බේරා ගත්හ. මලරන්බන්ගේ දයාබර බිරිඳ වන ශාන්තිලතා පොඩි මැණිකේගේ සහෝදරයා ඇතුළු ගම්මුන් පිරිසක් පැමිණ රැකවරණය ලබා නොදෙන්නට ඔවුන්ගේ ඉරණම තවත් කුරිරු වන්නට ඉඩ තිබිණ.

මලරන්බන් ගේය පද හා ගුවන් විදුලි නාට්‍ය රචනයේද සමතෙකි. චිත්‍රපටවලට ඔහු ලියූ ගී ප්‍රමාණය 150ක් පමණ වෙයි. කලාවතී, නිරෝෂා විරාජිනී හා මුත්තලගේ වැනි ගායක ගායකවෝ රැසක් ඔහුගේ ගී ගයති. 2002 එළිදැක්වූ මහවැලියේ මහ නදියේ ගී සංග්‍රහයද සම්මානයෙන් පිදුම් ලැබුවේය.

දෙනගම සිරිවර්ධනගේ ඇමති මුහුණ පියදාස වැලිකන්නගේගේ එයා හරි අපූරු ළමයෙක් හා විමලා ආරියරත්නගේ මහතලා හටන මනරම්බන් දෙමළට නැගූ පොත් අතර වෙයි. මෙවර රජත පුස්තකයෙන් හා ගොඩගේ සම්මානයෙන් පිදුම් ලද සුජාතා අලහකෝන්ගේ ඒත් අපි පියාඹමු යොවුන් ප්‍රබන්ධයද මේ වන විට ඔහු දෙමළට නගමින් සිටී. මේ කාර්යයන්හිදි දයාබර බිරිඳ ශාන්තිලතා ඇතුළු දියණියන් තිදෙනාගෙන් ලැබෙන නොමද සහාය ඔහු ළෙන්ගතුව සිහිපත් කරයි.

දිවි චාරිකාවේ 8 වන දශකයට ළඟා වෙමින් සිටියද යොවුනකුගේ ජවයෙන් පන්හිඳට පණ පොවන මලරන්බන් සහෘදයාට මිතුරු පවුරෙන් සුභාශිංසන.

● අනුර බී. සෙනෙවිරත්න

වහල් සේවය අවසන් කරන්නට මඟ හෙළි කළ ඇමෙරිකානු නිදහස් අරගලය

1776 දී හමුදාවට එක් වූ ස්වේච්ඡා සෙබළු වේතන නොමැතිව සටන් කරන්නට නොහැකි බව පවසා නිවෙස් බලා ගිය හ. එයින් කලබලයට පත් කොංග්‍රසය වසර තුනක් හෝ යුද්ධය අවසන් වන තෙක් පමණක් සටන් කළ යුතු බව පවසමින් වහා ම ඔවුන් යළි සේවයට කැඳවී ය. 1777 මුල් කාලය වන විට රටේ ජනගහණයෙන් වැඩි පිරිසක් පිරිමින් වුව ද, බොහෝදෙනා හමුදාවට බැඳෙන්නට එතරම් කැමැත්තක් නොදැක්වූ හ.

ලොව බොහෝ රටවල විප්ලව එම රටවල සමාජ පෙරළියක් ඇති කරන්නට සමත් වූ අතර, තවත් සමහර විප්ලව අවසන් වූයේ නිදහස් අරගල හෝ දේශපාලන සටන් ලෙසින් පමණි. 1775 අප්‍රේල් 19 සිට 1783 සැප්තැම්බර් 3 දක්වා පැවති ඇමෙරිකානු නිදහස් අරගලය ද අවසන් වූයේ. කිසිදු සමාජ පෙරළියක් ඇති නොකළ නිදහස් අරගලයක් නොහොත්, දේශපාලන සටනක් ලෙසිනි. එහෙත් එම සටන ඇමෙරිකා එක්සත් ජනපදයෙන් වහල් සේවය සදහට ම අතුගා දමන්නට මඟ හෙළිකළ බව බොහෝ දෙනා නොදනිති.

ඇමෙරිකාව සහ මහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය අතර පැවති මෙම යුද්ධයේ දී ප්‍රංශය, නෙදර්ලන්තය සහ ස්පාඤ්ඤය ඇමෙරිකාවට සහාය දුන් අතර, එනිසා ම එම ඒකාබද්ධ හමුදාව හැඳින්වූයේ මහාද්වීපික හමුදාව ලෙස ය. තුන්වැනි ජෝර්ජ් රජ සමයේ ඇමෙරිකාවේ ප්‍රාන්ත 13ම පාලනය කරන ලද්දේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය විසිනි. එනිසා බ්‍රිතාන්‍යය ඔවුන්ට සිතැඟි පරිදි ඇමෙරිකානු ජනතාව වෙත බදු පනවන්නට පටන් ගත්තේ ය.

ඒ වකවානුව වනවිට තම ආරක්ෂාව සලසා ගැනීමට තරම්වත් යුදමය දැනුමක් ඇමෙරිකානුවන් සතු නොවී ය. බ්‍රිතාන්‍යයන් ඇමෙරිකාව පාලනය කළ ද, ඇමෙරිකානුවන්ගේ ආරක්ෂාවට මුදල් වැය කරන්නට ඔවුහු අකැමැති වූ හ. එසේ ම, ස්වදේශීය රතු ඉන්දියානුවන් වෙත බ්‍රිතාන්‍යයන්

දැක් වූ සැලකිලිවලට ද ඇමෙරිකානුවෝ එතරම් කැමැත්තක් නොදැක්වූ හ. ඇමෙරිකානුවන් අකැමැති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමට බ්‍රිතාන්‍යයට හමුදා බලය හා මුදල් අවශ්‍ය වී ය. එනිසා ආරක්ෂාව සඳහා ඇමෙරිකාව මුදල් වැය කළයුතු යැයි බ්‍රිතාන්‍යය කියා සිටියේ ය. තම කැමැත්තට ඉඩ නොලැබෙන්නේ නම්, ආරක්ෂාව සලසන නාමයෙන් ගෙනෙන අනෙකුත් බදු පිළිවෙත්වලට තමන් විරුද්ධවන්නේ යැයි ඇමෙරිකානුවෝ කියා සිටිය හ.

බ්‍රිතාන්‍යයන් යනු ලාංකිකයන් වූ අපට ද අතීතයේ දී නා නා ප්‍රකාර බදු ගැසූ ජාතියකි. නිවෙස්වල සිටි සුනඛයාට පවා ඔවුන්ගේ බදුවලින් නිදහස්වන්නට ඉඩක් නොලැබිණි. එවන් ජාතියක් වූ බ්‍රිතාන්‍යයන්, ඇමෙරිකානුවන්ගේ අප්‍රසාදයට පත්වීම ආරම්භවන්නේ, 1764 දී ඔවුන් විසින් පනවන ලද මුද්දර බද්දත් සමඟ ය. එසේ ම, ඉන් අනතුරුව පැනවූ අපනයන බද්ද සහ තේ බද්ද ද ඇමෙරිකානුවන්ගේ දැඩි නොරිස්සුමට ලක්වී ය.

1773 දී බොස්ටන් වරායේ දී ස්වදේශීය රතු ඉන්දියානුවන් මෙන් වෙස්වළාගෙන පැමිණි දේශප්‍රේමී ඇමෙරිකානුවන් පිරිසක් තේ සාදයක් පැවැත්වූ හ. ඔවුහු බ්‍රිතාන්‍යයට විරෝධය දැක්වීම සඳහා .නැගෙනහිර ඉන්දියානු සමාගම. විසින් අපනයනය කරන ලද තේ පෙට්ටි රැසක් නැව්වලින් ඇද මුහුදට හෙලූ හ. මෙම විරෝධතා මර්දනය කරන්නට කටයුතු කළ බ්‍රිතාන්‍ය හමුදාව 1775 අප්‍රේල් මාසය වනවිට එරට අවි ගබඩා ගැන සෙවීමටත් දේශප්‍රේමීන් අත්අඩංගුවට ගැනීමටත් පටන් ගත් හ. ඉන් අනතුරුව දෙපාර්ශ්වය අතර සටන් පැතිර යන්නට පටන් ගැනිණි.

1776 ජූලි මාසයේ දී ඇමෙරිකානුවෝ බ්‍රිතාන්‍යයට එරෙහිව නිදහස් ප්‍රකාශනය ලියා සම්මත කරගත් හ. එමනිසා රටේ නිදහස මත පදනම්ව ආරම්භ වූ යුද්ධය ඇමෙරිකාවේ ප්‍රාන්ත 13ක වැසියන් අතර ජනප්‍රියත්වයට පත් වී ය. එහෙත්, නිදහස් ප්‍රකාශනයෙන් කියූ දෑ සාක්ෂාත් කරගන්නට හැකි වේ යැයි යුද්ධය ආරම්භයේ දී බොහෝදෙනෙකු තුළ විශ්වාසයක් නොවී ය. බ්‍රිතාන්‍යය හා සටන් වැදීමෙන් ලැබෙන්නේ ජයග්‍රහණයක් නොව, අපකීර්තියක් යැයි සමහරු සැක පහළ කළ හ. එහෙත් පැරිස් සාම ගිවිසුම’ අත්සන් තබන විට ඒ සියලු අවිශ්වාසයන් ගිලිහී ගොස් තිබිණි.

ඇමෙරිකන් විප්ලවීය හමුදාවේ නායකයන් සතු යුද දැනුමේ මඳකම හා නිසි හමුදා පුහුණුවක් නොමැතිවීම ඇමෙරිකානුන්ට දැඩි අඩුපාඩුවක් වී ය. එහෙත්, 1775 ජූනි මාසයේ දී පත්කරන ලද පළමු හමුදා අණදෙන නිලධාරියා වූ ජෝර්ජ් වොෂින්ටන් සහ ඉන්පසුව එම ධූරය දැරූ හොරේෂියෝ ගේට්ස්ල චාල්ස් ලීල නැතානියෙල් ග්‍රීන්ල හෙන්රි නොක්ස් මෙන් ම, පසුකලෙක බ්‍රිතාන්‍යයට පක්ෂපාතී වූ බෙනඩික්ට් ආර්නෝල්ඩ් යන හමුදාපතිවරුන් හත් අවුරුදු යුද්ධයක් දිනාගෙන මහා අධිරාජ්‍යයක් සොලවන්නට සමත් වේ යැයි කිසිවෙකු සිතුවේ නැත.

1776 දී හමුදාවට එක් වූ ස්වේච්ඡා සෙබළු වේතන නොමැතිව සටන් කරන්නට නොහැකි බව පවසා නිවෙස් බලා ගිය හ. එයින් කලබලයට පත් කොංග්‍රසය වසර තුනක් හෝ යුද්ධය අවසන් වන තෙක් පමණක් සටන් කළ යුතු බව පවසමින් වහා ම ඔවුන් යළි සේවයට කැඳවී ය. 1777 මුල් කාලය වන විට රටේ ජනගහණයෙන් වැඩි පිරිසක් පිරිමින් වුව දල බොහෝදෙනා හමුදාවට බැඳෙන්නට එතරම් කැමැත්තක් නොදැක්වූ හ. එවිට කොංග්‍රසය කළේ මාස නමයක අනිවාර්ය සේවයක් නියම කිරීම ය. එහෙත් ඊට ද ජනතාව සවන් නොදුන් හ. හමුදාවට බැඳෙන අයට මුදල් හා ඉඩම් ලබාදෙන බව අනතුරුව කොංග්‍රසය ප්‍රකාශ කළේ ය. ජනතාව ඊට රැවටුණේ නැත. මන්ද රැ සොල්දාදුවෙකුගේ දවසේ වේතනයට වඩා තිස් ගුණයක් පමණ සිවිල් කම්කරුවෙකුට දිනක දී උපයා ගත හැකිවූ හෙයිනි. එනිසා ජෝර්ජ් වොෂින්ටන්ගේ හමුදාවේ තුනෙන් දෙකක ප්‍රමාණයක් සිටියේ සටන් වදින්නට නුසුදුසු පුද්ගලයන් ය.

එහෙත් මෙම මහාද්වීප හමුදාවට 1777 අගෝස්තුවේ දී ප්‍රංශයෙන් පැමිණි මාර්කි ඩී ලාෆායෙට් සහ 1778 පෙබරවාරියේ දී ජර්මනියෙන් පැමිණි ෆෙඩ්රික් වොන් ස්ටූබන් එක් වූවේ ය. ඒ අනුව එරට සිටි ගොවීන් සහ රන් රදී වැඩකරුවන් සාමාන්‍ය පුහුණු සොල්දාදුවන්ගේ තත්ත්වයකට ගෙන එන්නට ඔවුන් දෙදෙනා සමත් වූ හ. ස්වදේශීය රතු ඉන්දියානුවන් සහ කළු ඇමෙරිකානුවන් විශාල සංඛ්‍යාවක් ද යුද්ධයට එකතු වූ හ. දකුණු ප්‍රාන්තවල වහල් සේවයේ යෙදුණු කළු ජාතිකයන්ට මහාද්වීප හමුදාවට එකතු වීම තහනම් කර තිබූ හෙයින් ඔවුන්ගෙන් සමහරු බ්‍රිතාන්‍යයට පක්ෂව සටන් කළ හ. එහෙත් උතුරේ කළු ඇමෙරිකානුවන්ගෙන් වැඩි පිරිසක් මහාද්වීප හමුදාවට එකතු වී සටන් වැදුණේ, වහල් සේවය අහෝසි කරගන්නට මෙම යුද ජයග්‍රහණය හේතු වේ යැයි යන යටි බලාපොරොත්තුව ඇතිව ය.

නොයෙක් දක්ෂතාවලින් යුත් අය හමුදාවේ සිටිය ද, උසස්වීම් සඳහා නියමිත ක්‍රමවේදයක්නොවී ය. සියලු ජනරාල්වරු පත්වුණේ කොංග්‍රසයේ අනුමැතියෙනි. ප්‍රාන්ත ආණ්ඩුවලින් අනෙකුත් යුද නිලධාරීන් පත් කෙරිණි. එහෙත් වැඩියෙන් ම සිටියේ. පක්ෂපාතීත්වය හා ඥාති සංග්‍රහය නිසා තනතුරු හා උසස්වීම් ලද පිරිස් ය. හමුදා නිලධාරීහු ඔවුන්ගේ විශ්‍රාම වැටුප ලෙස වේතනයෙන් බාගයක් ජීවිතය තිබෙන තුරු ලබාදෙන මෙන් ඉල්ලා සිටිය හ. හමුදාපති වශයෙන් වේතනයක් නොලබා ස්වේච්ඡාවෙන් හමුදාවට බැඳී සිටි ජෝර්ජ් වොෂිංටන් තම නිලධාරීන්ගේ එම ඉල්ලීමට සහයෝගය දැක්වී ය. 1780 වන විට හමුදාවෙන් ඉල්ලා අස් වී යන සංඛ්‍යාව වැඩිවන්නට පටන් ගත් හෙයින් එම ඉල්ලීම අනුමත වී ය.

මාර්ටින් ලූතර් කිං



ජෝර්ජ් වොෂින්ටන්



ඒබ්‍රහම් ලින්කන්

එහෙත් නායකත්වය පුහුණුව හා වේතන පමණක් නොව බොහෝ අඩුපාඩු ඔවුනට තිබිණි. ඒ කෘෂිකාර්මික රටාවක් පැවති සමාජයකින් අවි ආයුධල යුද උපකරණ හා ආහාර පාන යනාදිය පහසුවෙන් ලබාගත නොහැකි වීම ය. කාර්මික නිෂ්පාදන බොහොමයක් ආවේ යුරෝපයෙනි. අවි ආයුධ හා වෙඩි බෙහෙත් ඇමෙරිකාවට ගෙන්වා ගැනීම තරමක් හෝ පහසු වන්නේ බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් තනාපතිවරයෙකු ලෙස ප්‍රංශයට ගිය පසුව ය. ප්‍රංශල ඕලන්ද අවි ආයුධ හා වෙඩි බෙහෙත් පුද්ගලික සමාගම් හරහා නැව් මගින් ගෙන්වා ගන්නට ඒ නිසා මඟ පෑදිණි.

ආහාර බෙහෙවින් තිබුණු කෘෂිකාර්මික සමාජයක් වුව ද මාර්ග හා ප්‍රවාහන පහසුකම් හරියාකාරව නොමැතිවීම බරපතළ ගැටලුවක් වී ය. මේ නිසා කලට වේලාවට ආහාරද්‍රව්‍ය නොලැබීමෙන් සොල්දාදුවන්ට හාමතේ සිටින්නට ද සිදුවීය. 1776 දී ප්‍රංශ භාණ්ඩාගාරයෙන් මිලියන ගණනක ණය ලබාගෙන තිබුණු ඇමෙරිකාව ප්‍රංශයෙන් තවත් ණය ඉල්ලා ගත්තේ ය. ලෝක ඉතිහාසයේ පළමුවරට ජාතික උත්සාහයකින් ගොඩනැගුණ ද මහාද්වීපික හමුදාව කිසිසේත් ම සූක්ෂම වූයේ නැත. දක්ෂ වූයේ ද නැත. එහෙත් කෙසේ හෝ යුද්ධය දිනූ ඔවුහු බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ඇමෙරිකා එක්සත් ජනපදය පිහිටුවා ගන්නට ද සමත් වූ හ.

ලෝක ඉතිහාසයේ වැදගත් ම ලේඛනයක් ලෙස සැලකෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ නිදහස පිළිබඳ ප්‍රකාශනය’ ඇමරිකානු කොන්ග්‍රස් මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද්දේ ඇමෙරිකානු නිදහස් සටනෙහි ආරම්භක සමයේ එනම් 1776 ජූලි 4 වන දා ය. 1783 දී ඇමරිකා එක්සත් ජනපදය ස්වෛරී රාජ්‍යයක් ලෙස පිළිගැනුණේ නිදහස් සටන අවසානයේ අත්සන් කෙරුණ පැරිස් ගිවිසුමෙනි. එහෙත් එරට නිදහස් දිනය ලෙස සැලකෙන්නේ නිදහස් ප්‍රකාශනය සම්මත කරගත් ජූලි 4 වන දින ය.

යුද්ධය ජයගැනීමේ දී ඇමරිකානුවන්ට බලපෑ වාසි මෙන් ම අවාසි ද රාශියක් තිබිණි. ඔවුන්ගේ ම භූමියක සටන් කිරීමට ඔවුන්ට හැකිවීමත් ප්‍රංශ සහ ඉන්දියානු යුද්ධවල අත්දැකීම් ඔවුන් සතුව පැවතීමත් ඔවුනට විශාල වාසියක් වී ය. එසේ ම මහාද්වීපික හමුදාවට නිසි පුහුණුවක් හා විනයක් නොමැති වීමත් වෙරළබඩ ප්‍රදේශ ආරක්ෂා කිරීමට ඔවුන්ට ප්‍රබල නාවික හමුදාවක් නොමැති වීමත් අවාසියක් වී ය.

හොඳින් පුහුණුව ලත් සහ හොඳින් සන්නද්ධ වූ හමුදාවක් බ්‍රිතාන්‍යයට සිටීමත්,

හොඳ ම නාවික හමුදාවක් ඔවුන් සතුව තිබීමත් සටනේ දී පක්ෂපාතී ඇමෙරිකානුවන්ගේ සහ ඉන්දියානුවන්ගේ සහයෝගය ලැබීමත්, විදේශීය හමුදා බඳවා ගැනීමට ජර්මනියෙන් මුදල් ලැබීමත් බ්‍රිතාන්‍යයට වාසිදායක වී ය.

තම රටින් බොහෝ දුරකට පැමිණ සටන් කරන්නට සිදුවීමත් එසේ නොකඩවා සටන් කරන්නට සිදුවීමෙන් අධික ලෙස වෙහෙසට පත්වන්නට සිදුවීමත් බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ ඵලදායීතාව අඩු වීමට හේතු වී ය. එනිසා ම, ඔවුහු ඔවුන්ගේ නියම සටන් විලාසයට අනුවර්තනය නොවූ හ. තමන්ට පක්ෂව සිටි ඇමෙරිකානුවන් ඵලදායී ලෙස භාවිත කරන්නට බ්‍රිතාන්‍යය කටයුතු නොකළේ ය. කිසිදු ගැටලුවක් නොමැතිව තමන්ට ඇමෙරිකානුවන් පරාජය කළ හැකි බව ඔවුහු තරයේ විශ්වාස කළහ. මෙම අධිතක්සේරු කිරීම් බ්‍රිතාන්‍යයේ අවාසියට හේතු වී ය.

අවුරුදු 8 යි. මාස 4 යි, දින 15ක් පැවති ඇමෙරිකානු නිදහස් අරගලයේ දී ඇමරිකානුවන් 6, 800 ක් ඝාතනයට ලක්වී ඇති අතරල 6,100 ක් තුවාල ලබා තිබේ. 20,000 කට වැඩි පිරිසක් සිරකරුවන් බවට පත්වූ හ. මෙහි දී යුද සිරකරුවන් අතර සිටිය දී මියගිය 8, 000–12, 000 ක ප්‍රමාණය ද ඇතුළුව තවත් මරණ 17, 000 ක් පමණ සිදුවන්නට ඇති බව ඉතිහාසඥයෝ විශ්වාස කරති.

එහෙත් ඊට වඩා මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් විනාශ වන්නේ 1861 සිට 1865 දක්වා පැවති සිවිල් යුද්ධයේ දී ය. ලොව පළමු වහල් කැරැල්ල ලෙස පිළිගැනෙන මෙම යුද්ධය ආරම්භ වන්නේ කළු ජාතිකයන් වහල්භාවයට පත්කිරීම පිළිබඳව දිගු කලක් පැවති මතභේදවල ප්‍රතිඵලය ලෙස ය. 1860 දී පළමු රිපබ්ලිකන් ජනාධිපතිවරයා ලෙස ඒබ්‍රහම් ලින්කන් මැතිවරණය ජයග්‍රහණය කරන්නේ යළි කිසි දිනක අමෙරිකානු භූමියේ වහල් සේවය ක්‍රියාත්මක නොකරන බවට වූ ප්‍රතිඥාවත් සමඟිනි. එහෙත් ඔහු බලයට පත් වී මාසයකට පමණ පසු ආරම්භ වූ මෙම සිවිල් යුද්ධයෙන් එක්සත් ජනපද හමුදාවේ 365,000 ක් පමණ ජීවිතක්ෂයට පත්වූ අතර, 828ල000ක් පමණ තුවාල ලැබූ හ. ජෙෆර්සන් ඩේවිස්ගේ නායකත්වයෙන් යුත් සතුරු හමුදාවේ 290, 000 ක් ජීවිතක්ෂයට පත්ව ඇති අතර, 864,000ක් පමණ තුවාල ලබා තිබේ.

මේ අතර අධිරාජ්‍යවාදී යුගය දක්වා දිවෙන ඇමෙරිකාවේ කළු-සුදු භේදය අර්බුද රැසක් නිර්මාණය කර ඇත්තේ දැවැන්ත සමාජ ගැටලුවත් බවට ද පත් වෙමිනි. අප්‍රිකානු-ඇමෙරිකානු ඇමැතිවරයකු හා ක්‍රියාකාරිකයෙකු වූ මාටින් ලූතර් කිං ඇතුළු සිවිල් ක්‍රියාකාරීන් කළු ජාතිකයින්ට අමෙරිකාව තුළ පුරවැසියන්ට හිමි විය යුතු මූලික අයිතිවාසිකම් සහ අවස්ථාවන් හිමිවිය යුතු බව පවසමින් සිය හඬ අවදි කරන්නේ මෙවැනි පසුබිමක දී ය. 1955 සිට 1968 දී ඔහු ඝාතනයට ලක්වන තෙක් ම සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ වඩාත් ම දෘෂ්‍යමාන ප්‍රකාශකයා සහ නායකයා බවට පත්වන්නේ මාටින් ලූතර් කිං ය.

ඉන් වසර ගණනාවකට පසු 2009 දී බැරක් ඔබාමා එක්සත් ජනපදයේ පළමු අප්‍රිකානු-අමෙරිකානු ජනාධිපතිවරයා ලෙස පත්වුව ද, සමහර සුදු ජාතිකයන් තුළ තවමත් වර්ණ භේදවාදයේ ගිනිපුපුරු නොනිමී පවතින බව එක්සත් ජනපද පොලිස් නිලධාරියෙකු විසින් පසුගිය දා ඝාතනය කරන ලද කළු ජාතික ජෝර්ඩ් ෆ්ලොයිඩ්ගේ මරණයෙන් සනාත වේග එසේ ම, එය ලෝකයට ම මානව හිමිකම් ගැන කියාදෙමින් ඒ මුවාවෙන් ලෝකයේ අනෙක් රටවල් සූරාකමින් සිටින ඇමෙරිකා එක්සත් ජනපදයේ නිරුවත ප්‍රසිද්ධියේ හෙළිදරව් වීමක් ද වේ.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි. ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ජායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි. සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ. සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261

දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351

විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

ජෝන් කීල්ස් පදනමෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක්

ජෝන් කීල්ස් සමූහයේ සමාජ වගකීම් අංශය වන ජෝන් කීල්ස් පදනම විසින් මන්ද්‍රව්‍ය අවභාවිතාව වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ඉකුත්දා හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී සමාරම්භ කරන ලදී.

මෙම සමාරම්භක සැසිවාරය හික්කඩුවාවේ ග්‍රාම නිලධාරි වසම් පහක පෙර පාසල් ගුරුවරුන් සහ හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, අදාළ ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාම නිලධාරීන්, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් සහ හික්කඩුව පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත 39 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම වැඩසටහන ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති - හික්කඩුව ව්‍යාපෘතියේ කොටසක් ලෙස සහ හික්කා ට්‍රාන්ස් බයි සිනමන් (Hikka Tranz by Cinnamon) සහ තාක්ෂණික හවුල්කරු වන හ්‍යුමෙඩිකා ලංකා (Humedica Lanka) සමඟ හවුල්කාරත්වයෙන් පවත්වන ලදී.

ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පීඑල්සී (JKH) යනු ශ්‍රී ලංකාවේ විශාලතම විවිධාංගීකරණය වූ සමාගම් සමූහය වන අතර විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර 7 ක් තුළ සමාගම් 70 කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරයි. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් ලෝක ආර්ථික සංසදයේ පූර්ණ සාමාජිකයෙකු වන අතර, එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්තයේ සහභාගී සාමාජිකයෙකි.

අධ්‍යාපනය, සෞඛ්‍ය, පරිසරය, ජීවනෝපාය සංවර්ධනය, කලාව සහ සංස්කෘතිය සහ ආපදා සහන යන ක්ෂේත්‍ර හයක් යටතේ ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස්, තම සමාජ වගකීම් අංශය වන ජෝන් කීල්ස් පදනම තුළින් "බලගන්වමු දේශය හෙට දිනට" යන දැක්ම ක්‍රියාත්මක කරයි.

ASUS නවතම ZenBook 13 (UX325) සහ ZenBook 14 (UX425) දැන් ශ්‍රී ලංකාවේ...

full I/O ports සහිත **10th Gen Intel Core CPU** මගින් බලගැන්වෙන, **edge-to-edge keyboards** සහ **four-sided NanoEdge displays** සහිත අඟල් 13.3 සහ 14 ප්‍රමාණයේ ලොව සිහින්ම ලැප් ටොප් පරිගණක සැප්තැම්බර් 13, ශ්‍රී ලංකාව, කොළඹ, **ASUS** වෙතින් **ZenBook Classic** මාදිලියේ අතට ඉතාමත් පහසු අඟල් 13.3 සහ 14 ප්‍රමාණයේ නවතම **ZenBook 13 (UX325)** සහ **ZenBook 14 (UX425)** ලැප්ටොප් පරිගණක දෙකක් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේය.

මේ ලැප් ටොප් මාදිලි දෙකම අතිශයින්ම සැහැල්ලු වන අතර **ZenBook** 13 හි බර 1.07 kg පමණ වේ. ලොව සිහින්ම මේ ලැප් ටොප් පරිගණකයන් විශාල I/O හැකියාවන් ඇතුළු **full-size HDMI** සහ **USB Type-A ports** විශේෂාංග වලින් සමන්විතය. ඊට අමතරව **Thunderbolt™** 3 USB-C® සහ **microSD card reader** සඳහා **versatile connectivity** පහසුකම් වලින් ද සමන්විත වේ.

10th Generation Intel Core processors මගින් **ZenBook 13** සහ **ZenBook 14** ලැප් ටොප් පරිගණක බල

ගැන්වෙන අතර මීට ඉහත නිකුත් කෙරුණු **generation** වලට වැඩි වේගවත්, සුමට හා ප්‍රතිචාරාත්මක කාර්ය සාධනයක් **Core i7 series** මගින් ලබා දෙයි. එහිදී එදිනෙදා ජීවිතයේ විවිධ අවශ්‍යතාවයන් සහ විනෝදාස්වාදය සඳහා පරිශීලකයන්ට උසස් අන්දමින් සහය ලබා දීමට **32 GB, high-speed RAM** ප්‍රමාණයක් මෙහි අන්තර්ගතව ඇත.

දේශීය ගොවියන් සහ ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා ඔවුන් විසින් නිෂ්පාදන කරන ලද විවිධ රසකැවිලි,කොළ කැද,කිරි පැණි,කජු,ඇසුරුම් කරණ ලද එළවළු ,අතිරස හා කුළුබඩු වර්ග වලින් පිරුණු වෙළඳ කුටි රාශියක් පැලවත්ත කාගිල්ස් ෆුඩ්සිටි වාහන අංගනයේදී පසුගියදා දක්නට ලැබිණි.දේශීය නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් වශයෙන් දේශීය ගොවියන්ට හා ව්‍යසහයකවින්ට දිරිගැන්වීම අරමුණින් කාගිල්ස් ආයතනය විසින් සෑම සති අන්තයකම ඔවුන්ගේ නිෂ්පාදන පරිභෝගිකයා වෙත ලබාදීම කටයුතු සුදානම් කර ඇති බව කාගිල්ස් ෆුඩ්සිටි ආයතනයේ සමූහ කළමනාකරු කෘෂි ව්‍යපරනිෂ්පදන හරිදාස් ප්‍රනාන්දු පැවසීය. ජායාරූපය හිරන්ත ගුණතිලක

ත්‍රිකුණාමලයේ දිය යට කෞතුකාගාරයට

ටෝකියෝ සිමෙන්ති සමාගමේ අතහිත

ටෝකියෝ සිමෙන්ති සමාගමේ දෙවන දිය යට කෞතුකාගාරය, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හිටපු හමුදාධිපති අද්මිරාල් පියල් ද සිල්වා විසින් ත්‍රිකුණාමලයේ සැන්ඩ් බේ මුහුදු තීරයේ දී විවෘත කෙරිණි.

ශ්‍රී ලංකා නාවික හමුදාවේ දක්ෂ නිර්මාණ ශිල්පීන් අතින් නිමැවුණු මූර්ති වලින් අලංකාරවත් කරන ලද මේ කෞතුකාගාරය ස්ථාපිත කිරීමේ කර්තව්‍යයට ටෝකියෝ සිමෙන්ති සමූහය විසින් සිය දායකත්වය සැපයීය. මෑතකදී විවෘත කරන ලද ගාල්ලෙ පිහිටි සමුද්‍ර ජීව අභයභූමිය මෙන්ම, දේශීය හා විදේශීය සංචාරකයන්ට සහ සමුද්‍රීය ජෛව විවිධත්වය පිළිබඳ උනන්දුවක් දක්වන්නන්ට අසමසම කිමිදුම් අත්දැකීමක් ලබාදීමේ අරමුණ ඇතිව ඉදි කරන ලද මෙය, ශ්‍රී ලංකාවේ දෙවැනි දිය යට කෞතුකාගාරයයි.

උද්‍යානය අලංකාරවත් කරන මූර්ති නිර්මාණ සඳහා ලවණතාවට ඔරොත්තු දෙන දියයට ඉදිකිරීම්වලට වඩාත් යෝග්‍ය ටෝකියෝ සුපර් සංයෝග කරන ලද ද්‍රාව්‍ය සිමෙන්ති යොදාගෙන ඇත. වගුරුබිම් ආශ්‍රිතව ඉදිකිරීම් සඳහා නිර්දේශිත **TOKYO SUPER BHC** සිමෙන්තිය සල්ෆේට සහ ක්ලෝරීන් බාදනය වළක්වාලමින් ඕනෑම ඉදිකිරීමක දිගුකාලීන පැවැත්ම සහතික කරයි. ශ්‍රී ලංකාවේ අඩුම කාබන් දර්ශකය හිමි සිමෙන්තිය ලෙස සිලෝන් ඉන්ස්ටිටියුට් ඔෆ් බිල්ඩර්ස් සහ ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය යන ආයතන ද්විත්වයෙන්ම හරිත සම්මාන හිමිකරගෙන ඇති **TOKYO SUPER BHC** භාවිතයෙන් මුහුදු ජලයට කිසිදු අහිතකර රසායනිකද්‍රව්‍ය එක් වීමද වැළකේ. මෙමගින් මත්ස්‍යයින් සහ කොරල් ඇතුළු මුහුදුජීවීන්ගේ පැවැත්මට වඩාත් උචිත පරිසරයක් මෙම සාගර උද්‍යානය තුළ සකස්වනු ඇත.

තම සමාගමේ කොරල්පර ප්‍රතිස්ථාපන වැඩසටහනේ දිගුකාලීන සහකරුවෙකු වන ශ්‍රී ලංකා නාවික හමුදාවේ මෙම දූරදර්ශී උත්සාහයට දායකවීමට හැකිවීම ටෝකියෝ සිමෙන්ති සමාගම ලද අතිමහත් ගෞරවයක් ලෙස සැලකේ.

පළමු වරට ලංකාගම ග්‍රාමයට

අධිවේගී අන්තර්ජාල හා ඇමතුම් පහසුකම්

මොබිටෙල් නිලධාරීන් සමඟ සිටින ලංකාගම ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති එම්. ඒ. සුමිත් ලාල් (මැද) සහ සිසු සිසුවියන් පිරිස.

4G Broadband/LTE දේශයේ සන්නිවේදන පෙරගමන් කරුවන් වන SLT සහ මොබිටෙල් පසුගිය සැප්තැම්බර් 4දා ලංකාගම ග්‍රාමයට අධිවේගී අන්තර්ජාල **4G/LTE** බ්‍රොඩ්බෑන්ඩ් සේවා සහ ඇමතුම් සේවා පහසුකම් ලබාදීමේ ක්‍රියාවලිය සාර්ථකව අවසන් කළේය. මෙම සන්නිවේදන සේවා සැපයුම් ව්‍යාපෘතිය හරහා ලංකාගම ග්‍රාමය අධිවේගී **4G Broadband/LTE** සහ සුපැහැදිලි ඇමතුම් සේවා මගින් බලගන්වා ඇත.

භූමියේ අති දුෂ්කර පිහිටීම සහ ප්‍රවාහන දුෂ්කරතා නොතකමින් **SLT** සහ මොබිටෙල් සේවක මණ්ඩලය එම ප්‍රදේශයට සුපිරි සබඳතාවක් සහ අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීම වෙනුවෙන් සන්නිවේදන කුලුනක් ස්ථාපිත කළ අතර එම සන්නිවේදන කුලුන ස්ථාපිත කිරීමේ දී කිසිදු පරිසර හානියක් සිදු නොවීමට ඔවුන් වගබලා ගනු ලැබීය.

දංකොටුව පෝසිලේන් වාෂ්ප ආශ්වාසක

නිෂ්පාදනය ප්‍රදර්ශනාගාර වෙත

දංකොටුව පෝසිලේන් පීඑල්සී මෙරට පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය යහපැවැත්ම උදෙසා පසුගියදා හඳුන්වාදෙනු ලැබූ නවතම පෝසිලේන් වාෂ්ප ආශ්වාසක නිෂ්පාදන (Customized Steam Inhaler) පාරිභෝගිකයන් හට පහසුවෙන් මිලදී ගත හැකි වන ලෙස ඔවුන්ගේ ගිල්ෆර්ඩ් ක්‍රෙසන්ට්, වන් ගෝල්ෆෙස් මෝල්, යුනියන් පෙදෙස, කිරුළපන සහ දංකොටුව යන ස්ථාන වල පිහිටි ප්‍රදර්ශනාගාර වලට එක් කර තිබේ.

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහලේ ස්නායු ශල්‍ය විශේෂඥ දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය වෛද්‍ය චරිත් නානායක්කාරගේ සැලසුම් සහ මඟ පෙන්වීම යටතේ නිපදවන ලද මේ පෝසිලේන් වාෂ්ප ආශ්වාසකය මීට ප්‍රථම කොරෝනා වයිරස් රෝගයෙන් පීඩාවට පත් රෝගීන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන රෝහල් නිරෝධායන මධ්‍යස්ථාන සහ රජයේ ප්‍රධාන සෞඛ්‍යායතනවල භාවිතය උදෙසා නිකුත් කරන ලදී.

60 රස මිහිරු

Uswatte

සිළුමිණ

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 74

ගුරු චිත්‍රය

ගෝල චිත්‍රය

චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මගින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. ජයග්‍රාහකයන්ට වටිනා මුදල් තෑග පිරිනැමේ. තැපැල්පත් සැප්තැම්බර් මස 29 වැනිදාට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. ගුරුගෝල වෙනස, 'සිළුමිණ', ලේක්හවුස්, කොළඹ 10 මෙතෙක් පැවැති තෑග රටාව වෙනුවට ජයග්‍රාහකයන්ට රුපියල් 2500 බැගින් තෑග 09 ක් පිරිනැමේ. උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් ලිමිටඩ් අනුග්‍රහයෙනි.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරු මාධ්‍ය සේවා)

රුපියල් විසිපන්දහසක තෑගි

පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කරන්න.

IDH රෝහලට උපකරණ ලබා දීමට HNB සේවකයන් සිය දිනක වැටුප පිරිනමයි

HNB හි විධායක අධ්‍යක්ෂක සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, දිල්ශාන් රොඩ්‍රිගෝ මහතා ජාතික බෝවන රෝග විද්‍යායතනයේ, අධ්‍යක්ෂ, වෛද්‍ය හසිත අත්තනායක මහතා (මැද) සමඟ අවබෝධතා ගිවිසුම හුවමාරු කර ගනිමින්. ජාතික බෝවන රෝග විද්‍යායතනය සහ හැටන් නැෂනල් බැංකුව නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගී වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ද ඡායාරූපයේ වෙයි.

ජාතික බෝවන රෝග විද්‍යායතනයේ (IDH) වෛද්‍යවරුන් සහ හෙද කාර්ය මණ්ඩලය සඳහා වන නවීනතම පුහුණු මධ්‍යස්ථානයට අත්‍යාවශ්‍ය ගෘහ භාණ්ඩ ඇතුළු උපකරණ ලබා දීමට හැටන් නැෂනල් බැංකුවේ සේවකයන් සිය දිනක වැටුප පරිත්‍යාග කර ඇත.

''අපගේ සෞඛ්‍ය සේවා වෘත්තිකයින්ගේ, විශේෂයෙන්ම කොවිඩ් අභියෝගයේ දී පෙරමුණ ගෙන ක්‍රියා කළ IDH හි වෛද්‍යවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයේ ධෛර්යසම්පන්න හා විශිෂ්ට කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස කොවිඩ්-19 වසංගතයට එරෙහි සටනේ දී ශ්‍රී ලංකාව මෙතරම් අද්විතීය ප්‍රගතියක් ලබා ගෙන තිබෙනවා,'' යනුවෙන් HNB හි විධායක අධ්‍යක්ෂක සහ ප්‍රධාන මෙහෙයුම් නිළධාරී, දිල්ශාන් රොඩ්‍රිගෝ මහතා පැවසුවේය. කොවිඩ්-19 වසංගතයේ උච්චතම අවස්ථාවේ දී HNB කණ්ඩායම විසින් ස්වේච්ඡාවෙන් එක් රැස් කරන ලද මෙම අරමුදල අදාළ පුහුණු මධ්‍යස්ථානය සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා යොදා ගනු ඇත.

''IDH හි වෛද්‍යවරුන්ගේ පුහුණු වීම් කටයුතු වැඩි දියුණු කිරීමට හා නිපුණතා සංවර්ධන වැවඩසටහන් සඳහා අපගේ සහයෝගය ලබා දීම පිළිබඳව HNB වන අප ආඩම්බර වන අතර මෙවැනි තීරණාත්මක මොහොතක දී මෙම උතුම් කර්තව්‍ය වෙනුවෙන් ස්වේච්ඡාවෙන් දායකත්වය ලබා දීමට ඉදිරියට පැමිණි අපගේ හැටනා පවුලේ සාමාජිකයින්ට අප ස්තුතිවන්න වනවා. ඒවගේම, මෙවැනි අවස්ථාවක දී ඉදිරියෙන්ම සිටින සෞඛ්‍ය සේවකයන්ට සහයෝගය දක්වමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට අපට හැකියි. මෙම වසංගතය මැඩපැවැත්වීමට සෞඛ්‍ය බලධාරීන්ට සහාය ලබා දීම සඳහා ඉදිරියේ දී, අප අඛණ්ඩව තවදුරටත් අවස්ථාවන් සොයා බලනවා,'' යනුවෙන් HNB Chief Transformation Officer/තිරසාර පදනමේ භාරකරු, චිරන්ති කුරේ මහත්මිය පැවසුවාය.

HNB සේවකයන්ගේ දායකත්වය තුළින් පළමු අදියරේ දී, අත්‍යාවශ්‍ය ගෘහ භාණ්ඩ හා ශ්‍රවණාගාර උපකරණ සපයාදීමට HNB බලාපොරොත්තු වේ. HNB හි කැපවුණු ඉංජිනේරුවන් කණ්ඩායමක් හා එහි ව්‍යාපාර ඒකකය ජාතික බෝවන රෝග විද්‍යායතනයේ (IDH) ඉදිවෙමින් පවතින විශාල ව්‍යාපෘතියක කොටසක් වන අදාළ පහසුකම නැරඹීමෙන් පසු මෙම ව්‍යාපෘතිය සිදු කිරීම බැංකුවට නිර්දේශ කෙරිණි.

මීට පෙර, IDH රෝහලේ වෛද්‍ය කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ තැන්පත් කරන ගබඩාවන් ආරක්ෂා කිරීමට ගිනි නිවන උපකරණ කට්ටල 64ක් HNB පරිත්‍යාග කළ අතර වාට්ටුවලට ජලය බෙදා හැරීමේ අතිරේක පද්ධතියක් සමඟ ජල ටැංකි ස්ථාපිත කිරීමට ද සහාය විය. තවද, වසංගතයේ උච්චතම කාලවකවානුවේ දී කුරුණෑගල හා කරාපිටිය ශික්ෂණ රෝහල්වලට හදිසි අවශ්‍යතාවන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල (PPE) ද HNB ලබා දුන්නේය.

කොවිඩ් -19 SLS සම්මානය ලිට්‍රෝ ගෑස් වෙත

ශ්‍රී ලංකාවේ ගෘහස්ත ගෑස් සැපයුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය වන ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්) සමාගම කොවිඩ්- 19 වසංගත තත්ත්වය තුළ දිවයින පුරා සිය පාරිභෝගිකයන් හට සුවිශේෂී මෙහෙවරක් ඉටු කර ඇත.

ඇඳිරි නීතිය සහ වෙනත් සෞඛ්‍යමය නීති තුළ ගෑස් සැපයීම අභියෝගාත්මක කාර්යයක් වුවත් සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ගෝලීය ප්‍රමිතීන්ට අදාළ වන ක්‍රමවේද අනුගමනය කරමින් මිලියන 4 කට අධික පාරිභෝගිකයන් පිරිසකට අඛණ්ඩ ව ගෘහස්ථ ගෑස් සැපයීමට ඒ සමාගම කටයුතු කර ඇත.

ලිට්‍රෝ ගෑස් මෙලෙස අනුගමනය කළ ආරක්ෂිත ක්‍රමවේද SLS COVID-19 සෞඛ්‍ය ආරක්ෂක කළමනාකරණ පද්ධතින්ට අනුකූල වූ බැවින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ලිට්‍රෝ ගෑස් සඳහා SLS 1672: 2020 සහතිකය ප්‍රදානය කර ඇත.

වෙළඳපොළ කොටස සහ උපයන ආදායම අනුව ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ ප්‍රමුඛ ස්ථානයක් දරන ලිට්‍රෝ ගෑස් රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයක් වන අතර රුපියල් බිලියන 45 කට අධික ආදායමක් වාර්තා කරමින් රාජ්‍ය ආයතනයක් ලෙස සුවිශේෂී කාර්යයභාරයක නියැළී සිටියි.

ලිට්‍රෝ ගෑස් සමාගම පැවතුණ ඇඳිරි නීතිය තත්ත්වය තුළ ද ගෑස් මිලදී ගැනීමට ආසන්නතම ලිට්‍රෝ ගෑස් නියෝජිතයා සමඟ සම්බන්ධ වීම සඳහා 1311 ඇමතුම් අංකය හඳුන්වා දුන් අතර ගෘහස්ථ ජංගම දුරකථන යෙදුමක් (APP) දියත් කර එමඟින් දිවයින පුරා විසිරි සිටින අළෙවිකරුවන්ගේ ජාලය හරහා පාරිභෝගිකයන්ගේ දොරකඩ ම පහසුවෙන් හා කඩිනමින් ගෑස් ලබා ගැනීමටද කටයුතු කර ඇත.

වාණිජ මණ්ඩලී

සියැටි යතුරු පැදි ටයර් නිෂ්පාදනය 85% කින් වර්ධනය වේ

සියැටි කැළණි හෝල්ඩින්ග්ස් සමාගම විසින් මෙරට යතුරු පැදි ටයර් නිෂ්පාදනය මාස තුනක කාලයක් ඇතුළත 85% කින් වර්ධනය වී තිබේ.

සමාගමේ කැළණිය සහ කළුතර කර්මාන්ත ශාලාවල නිෂ්පාදන ධාරිතාව වර්ධනය කරමින් සමාගම විසින් මෙතෙක් මාසයකට නිෂ්පාදනය කළ යතුරු පැදි හා ස්කූටර් ටයර් 27,000 ක් ජූලි සහ අගෝස්තු මාස වලදී 41,000 දක්වා වර්ධනය කර ඇත. මෙය 52% ක වර්ධනයක් වන අතර සැප්තැම්බර් මාසය තුළ යතුරුපැදි ටයර් 50,000 ක් නිපදවමින් තවත් 22% ක වර්ධනයක් අත්කර ගන්නා බව සමාගම සඳහන් කරයි.

සමාගම විසින් මෙසේ යතුරු පැදි ටයර් නිෂ්පාදන ධාරිතාවය විශාල වශයෙන් වර්ධනය කර තිබෙන්නේ දේශීය අවශ්‍යතාවය වෙනුවෙන් ට්‍රක් සහ බස්රථ ටයර් මෙන්ම මගී මෝටර් රථ රේඩියල් ටයර් නිෂ්පාදනයද වර්ධනය කරන අතරතුර වීම කැපී පෙනේ.

සෙලාන් බැංකුව සමඟ අයිඩියල් මෝටර්ස් එක් වේ

මහින්ද්‍රා රථ මිලදී ගන්නා පාරිභෝගිකයන් හට පහසු ලීසිං විසඳුම් පිරිනැමීම සඳහා සෙලාන් බැංකුව, අයිඩියල් සමූහයේ පූර්ණ අනුබද්ධිත සමාගමක් මෙන්ම මහින්ද්‍රා රථ හා යතුරුපැදි මෙරටට ගෙන්වා බෙදාහැරීමේ එකම බලයලත් නියෝජිතයා ද වන අයිඩියල් මෝටර්ස් සමාගම සමඟ අත්වැල් බැඳ ගනී.

සේයා රූ සටහන: වමේ සිට දකුණට:
සෙලාන් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර, නිෂ්පාදන සහ යොමු සංවර්ධන ඒ.එච්. එම් අසීස්, එම බැංකුවේ ලීසිං අංශයේ ප්‍රධානී දිලුම් අමරසිංහ, එම බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී රමේෂ් ජයසේකර, එම බැංකුවේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී කපිල ආරියරත්න, අයිඩියල් සමූහයේ සභාපති නලින් වෙල්ගම, අයිඩියල් මෝටර්ස් සමාගමේ රථ වාහන අංශයේ අධ්‍යක්ෂ චමින්ද වනිගරත්න, අයිඩියල් සමූහයේ නීති සහ ආයතනික කටයුතු අංශයේ අධ්‍යක්ෂිකා නිමිෂා වැලිගම, අයිඩියල් මෝටර්ස් සමාගමේ විකුණුම් ප්‍රධානී ඩිල්ශාන් තෙන්නකෝන්

මෙම සබඳතාව හේතුවෙන් මෝටර් රථ, සැහැල්ලු ට්‍රක් රථ, වෙළඳ කටයුතු සඳහා භාවිතාකරන බර වාහන සහ මගී වාහන සඳහා සෙලාන් ලීසිං හරහා විශේෂිත පොළී අනුපාත, නොමිලේ වාහන ලියාපදිංචිය, වසරක් දක්වා හෝ කිලෝ මීටර 50,000 දක්වා වගකීම, රු. 10,000 සිට රු. 50,000 දක්වා විශේෂ ගැනුම් වට්ටම්, තෝරාගත් රක්ෂණ හවුල්කරුවන්ගෙන් විශේෂ රක්ෂණ වාරික, Apollo ටයර් සඳහා 20% ක වට්ටම් සහ පූර්ව අනුමත සෙලාන් ක්‍රෙඩිට් කාඩ්පත් ඇතුළු ප්‍රතිලාභ රැසක් පාරිභෝගිකයන් හට හිමිවේ. ඉහත ප්‍රතිලාභවලට අමතරව, පාරිභෝගිකයන්ගේ ගෙවීම් හැකියාවට ඔබින පරිදි ලීසිං සැලසුම් අවම ලියකියවිලි සමඟින් ලබාදීමට සෙලාන් කණ්ඩායම කටයුතු කරයි.

රෝස්වුඩ් නව වාට්ටු සංකීර්ණය සහ රූපලාවන්‍යාගාරය විවෘත වේ

දන්ත ශල්‍ය වෛද්‍ය අසේල විජේසුන්දර කළමනාකරණ අධ්‍යක්ෂ ධුරය දරන කඩවත රෝස්වුඩ් ඩෙන්ටල් ඇන්ඩ් මෙඩිකල් පෞද්ගලික රෝහලේ නව වාට්ටු සංකීර්ණය ශල්‍යාගාරය, දැඩි සත්කාර ඒකකය සහ රසායනාගාරය විවෘත කිරීම කොළඹ ගංගාරාමවාසී ආචාර්ය කිරින්දේ අස්සජි හිමියන්ගේ ආශිර්වාදය පෙරදැරිව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා අතින් පසුගියදා සිදුකෙරුණි.

කොරෝනා ව්‍යවසනය පැවැති කාලයේ සැලසුම් කරමින් ඉදි කළ මෙම වාට්ටු සංකීර්ණය, ශල්‍යාගාරය, දැඩි සත්කාර ඒකකය සහ රූපලාවන්‍යාගාරය ඇතුළු ව්‍යාපාර සැලසුම අගමැතිවරයාගේ දැඩි ප්‍රශංසාවට ලක්වූ අතර ගීත රචකයකු, ගීත විචාරකයකු හා ග්‍රන්ථ කතුවරයකු වශයෙන් තමන් මුලදී හඳුනාගත් දන්ත ශල්‍ය වෛද්‍ය අසේල විජේසුන්දර යන කලාකරුවා තුළ දැක්මක් සහිත හොඳ ව්‍යාපාරිකයකු සිටින බවද අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් සහ ප්‍රවීණ කලාකරුවන් රැසක් මේ අවස්ථාවට සහභාගී වී සිටියහ. රෝස්වුඩ් Beauty clinic රූපලාවන්‍යාගාරය ද එදිනම රෝහල් පරිශ්‍රයේදී විවෘත කෙරුණු අතර අමරසිරි පීරිස් යුවළ, සුනිල් එදිරිසිංහ යුවළ, ආශ්චර්යා පීරිස් මහත්මිය, නිලන්ති ඩයස්, රජිත හිරාන් ඇතුළු ප්‍රවීණ කලාකරුවන් ඉටිපන්දම් දල්වා ආශිර්වාදය පිරිනමමින් ඒ අවස්ථාවට එක්වූහ.

අම්බලන්ගොඩ ජී. එම්. ඒ ද සිල්වා ජුවලර්ස් සියවස සපුරයි

ජී. එම්. ඒ ද සිල්වා සමාගමේ නිර්මාතෘ ජී. එම්. ඒ ද සිල්වා

දෙවන පරම්පරාවේ හිටපු කළමනාකාර ජී. එම්. එස් ද සිල්වා

තෙවන පරම්පරාවේ වත්මන් කළමනාකාර චවිංක සුමනතිලක

දකුණු ලක පාරිභෝගිකයන්ගේ වඩාත් විශ්වසනීය ස්වර්ණාභරණ ආයතනයක් වන ජී. එම්. ඒ ද සිල්වා ජුවලර්ස්, මෙම වසරේ සිය ව්‍යාපාර ගමන් මගේ ස්වකීය අභිමානවත් 100 වැනි සංවත්සරය සමරයි.

ජී. එම්. ඒ ද සිල්වා පුද්ගලික සමාගම 1920 වසරේදී, අම්බන්ගොඩ ප්‍රදේශයේ රන් භාණ්ඩ උකස් ගැනීමෙහි ලා විශ්වාසවන්ත නාමයක් රඳවා ගැනීමෙහි ප්‍රකට ජී. එම්. ඒ ද සිල්වාගේ නිර්මාතෘත්වයෙන් පිහිටුවා ගැණිනි.

1950 වසර වන විට, ඔහුගේ පුත් ජී. එම්. එස් ද සිල්වා රන් භාණ්ඩ නිෂ්පාදනය හා වෙළෙඳාම ඊට ඇතුළත් කරමින් එය, ජී. එම්. ඒ ද සිල්වා ජුවලර්ස් බවට පරිවර්තනය කළේය. එතැන් පටන්, ජී. එම්. ඒ. ද සිල්වා ජුවලර්ස් සන්නාමය, 1983 හා 2006 වසරවල අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති හා සාමාජිකයකු ලෙසින් කටයුතු කරමින් ප්‍රදේශයේ ප්‍රකට පුද්ගලයකු ව සිටි අභාවප්‍රාප්ත ජී. එම්. එස් ද සිල්වා දිනා ගත් සමාජ ගෞරවයට සමගාමීව පැවතිණි. සාම්ප්‍රදායික ස්වර්ණාභරණ නිෂ්පාදන තවදුරටත් නිපදවන අතරතුර ඉකුත් වසරෙහි, නව ස්වරණාභරණ සැලසුම් ශිල්පීන් සමඟින් සමාගම නවීනතම වෙනසක් කරා ද පියවර තබා තිබුණි. 2018 වසරේ ඔක්තෝබර් මාසයේ, සිය දෙවැනි ශාඛාව දකුණු ලක අග නගරය වන ගාල්ලේ විවෘත කරමින් ජී. එම්. ඒ ද සිල්වා ජුවලර්ස්, ස්වකීය පාරිභෝගිකයන් වෙත තවදුරටත් සමීප විණි.

DFCC බැංකුව මුදල් භාවිතයෙන් තොර නව යුගයකට

DFCC බැංකුව DFCC Virtual Wallet තවදුරටත් වැඩිදියුණු කර හඳුන්වා දීමට පසුගියදා කටයුතු කළේ ය. සම්පූර්ණයෙන්ම මුදල් භාවිතයෙන් තොරව ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ගනුදෙනු කිරීමේ හැකියාව සහිත 'You don't need to touch cash to do your financial transactions' යන තේමාව ඔස්සේ වැඩිදියුණු කළ DFCC Virtual Wallet සේවාව, ප්‍රධාන භාෂා ත්‍රිත්වයෙන්ම සේවා සපයයි.

මීට පෙර හඳුන්වා දෙන ලද DFCC Virtual Wallet යෙදවුම තවදුරටත් වැඩිදියුණු කරමින්, වඩාත් පහසුවෙන් භාවිත කළ හැකි අතුරු මුහුණතක්ද සමගින් නව DFCC Virtual Wallet යෙදවුම හඳුන්වා දී ඇත.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මෙය භාවිත කළ හැකි අතර, ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ පහසුව සලකා බලා නවතම විශේෂාංග 15 කට අධික සංඛ්‍යාවක්ද මීට ඇතුළත් කර තිබේ.

DFCC Virtual Wallet මගින් ගනුදෙනුකරුවන්ට තම ගිණුම් සහ වෙනත් ගිණුම් අතර මුදල් හුවමාරුව සහ Common Electronic Fund Transfer Switch (CEFTS) තාක්ෂණය භාවිතයෙන් වෙනත් බැංකු මගින් නිකුත් කර ඇති ක්‍රෙඩිට් කාඩ්වල බිල්පත් ගෙවීම ආදිය සිදුකළ හැකි අතර, මෙම ගනුදෙනු ක්ෂණිකව සිදුවන නිසා එසැණින් එම ගෙවීම් යාවත්කාලීන වේ.

එමෙන්ම බිල්පත් ගෙවීම් සහ රක්ෂණ වාරික ගෙවීම් ආදිය සඳහා ද DFCC Virtual Wallet භාවිත කළ හැකිය.

එලිෆන්ට් හවුස් වොන්ඩර් අයිස්ක්‍රීම් Voice Teens Sri Lanka සමඟ අත්වැල් බැඳගනී

බොහෝදෙනාගේ ආදරය දිනාගත් එලිෆන්ට් හවුස් වොන්ඩර් අයිස්ක්‍රීම්, ශ්‍රී ලංකාවේ නවතම රියැලිටි රූපවාහිනී වැඩසටහන වන Voice Teens Sri Lanka තරගාවලිය සමඟ පසුගියදා අත්වැල් බැඳගත්තේය. ගෝලීය වශයෙන් මහත් ජනප්‍රියත්වයක් අත්කරගත් 'The Voice Teens' රියැලිටි තරග අත්දැකීමේ දේශීය තරගාවලිය වන මෙම වැඩසටහන විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාර දිනාගෙන තිබේ.

මේ සහයෝගීතාව යටතේ තරුණ පරපුරට සුවිශේෂී අවස්ථාවක් හිමි කරදීමට මෙන්ම ඔවුන් හා සක්‍රියව සම්බන්ධ වීමටත් එලිෆන්ට් හවුස් වොන්ඩර් අයිස්ක්‍රීම් පියවර ගෙන ඇත.

'ෆන් එකේ නෙක්ස්ට් ලෙවල් එක' යන තේමාව යටතේ ඉදිරිපත් කෙරෙන වොන්ඩර් අයිස්ක්‍රීම් රසිකයන්ට මේ අනුව Voice Teens Sri Lanka තරගාවලියට එක්වූ සුපිරි තරගකරුවන් මුණගැසීමටත් ඔවුන්ට සතුට පළකිරීමටත් අවස්ථාව හිමි විය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සංවිධානය කෙරුණු Voice Teens Sri Lanka තරගාවලිය ආරම්භයේ සිටම අවසාන මහා තරගය දක්වා ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන්ගේ නෙත් සිත් ඇද බැඳ ගැනීමටත් සමත් විය. සුපිරි සංගීතමය අත්දැකීමක් මෙරට රසිකයන්ට දායාද කළ මෙම රියැලිටි වැඩසටහන විවිධ ජන කොටස් නියෝජනය කරන පුළුල් ප්‍රේක්ෂක පිරිසකගේ අවධානය දිනා ගත්තේය.

එලිෆන්ට් හවුස් වොන්ඩර් අයිස්ක්‍රීම් සන්නාමය මේ වනවිට සමාජ මාධ්‍ය හරහා තරුණයේ ජනප්‍රියම අයිස්ක්‍රීම් සන්නාමය ලෙස පිළිගැනීමට ලක්වී තිබේ. ශක්තිමත් සන්නාම පිළිබිඹුවක් රැගත් වොන්ඩර් අයිස්ක්‍රීම් විශේෂයෙන්ම 'The Voice Teens' තරගාවලිය තුළ ස්ථාවර සන්නාම පිළිගැනීමක් හිමිකර ගැනීමට සමත් විය.

ප්‍රහේලිකා අංක 115

ල 1	ක් 2	ෂ	පා 3	න 4	■	අ 5	පා 6
■	ෂි	■	න 7	ව	රු	ව	න්
ප 8	ති	ද	මි	■	■	පැ 9	ද
ර 10	ජ	■	ප 11	ර	වා	හැ	ර
ණ 12	ය	ප 13	ත්	■	■	ය	■
වි	■	ර 14	තු	ග	ල 15	■	අ 16
තා 17	ර	කා	ව	■	සි 18	ලි 19	ඳු
න	■	සෙ	■	ත 20	ත්	ප	ර

නිවැරදි විසඳුම සහ ජයග්‍රාහකයෝ

රුපියල් 5000 හිමිකරගත් ජයග්‍රාහකයෝ

1. කේ.වී. සමන්ති කුමාරි කිරින්ද, ගම්පොල.
2. ආර්.ඩී. සාගරිකා නවරත්න රුවන්වැල්ල.
3. කේ.ඒ. රංජිත් හීන්පැන්දල පාර, ගාල්ල.
4. එච්.එම්. අනුලා දිසානායක ලෙනදොර, මාතලේ.
5. ඩී. ගයනා මහවත්ත පයාගල.
6. ජේ.ඒ. ඩිංගිරි මැණිකේ පාතකඩ, පැල්මඩුල්ල.
7. ඩබ්ලිව්.පී. ජයවර්ධන ලැවල, බුලත්කොහුපිටිය.
8. එන්.ඒ.ඩී. ලක්විදු යසිත නිශ්ශංක අඹන්විට, ගම්පහ.
9. ජී.වී.එස්. විජේසිංහ වැකඩ, පානදුර.
10. සනෝජාදේවි ගුලවිට ධර්මාරාම පාර, කොළඹ 6.

ශ්‍රී ලංකා වොලිබෝල් ක්‍රීඩාවේ මෞලි මංගල්‍යය
25 සහ 26 දෙදින මහරගමදී

ගම්පහ සියනෑතරු කණ්ඩායම

දෙබෑගම රන්තරු කණ්ඩායම

මහඋස්වැව රතනපාල ක්‍රීඩා සමාජය

රදාවාන ගෝල්ඩන් බර්ඩ්ස් ක්‍රීඩා සමාජය

ශ්‍රී ලාංකේය වොලිබෝල් ක්‍රීඩාවේ මෞලි මංගල්‍යය ලෙස සැලකෙන ජනාධිපති රන් කුසලාන වොලිබෝල් තරගාවලියේ අවසාන මහා තරග 25 සහ26 දෙදින මහරගම තරුණ සේවා සභා ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්වෙයි.තරගාවලියේ අවසන් දිනයේ එනම් 26දා ප්‍රධාන ආරාධිතයා වශයෙන් තරුණ සහ ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ සහභාගිවීමට නියමිතය.

මෙවර තරගාවලියේ විශේෂත්වය වන්නේ ජනාධිපති රන් කුසලාන වොලිබෝල් තරගාවලියට අමතරව ජනාධිපති අභියෝග කුසලාන තරගාවලිය ලෙස නව තරගාවලියක් හඳුන්වාදීමය. මෙහිදී දිස්ත්‍රික්ක මට්ටමින් පැවැති තරගාවලියේ පළමු අදියර ජය ගත් කණ්ඩායම් 100 ක් දෙවැනි අදියර සඳහා ගමන් කළ අතර, එහිදී ජය හිමිකරගත් කණ්ඩායම් 50 ජනාධිපති රන් කුසලානය සඳහා සුදුසුකම් ලබාගත් අතර පරාජිත කණ්ඩායම් 50 ජනාධිපති අභියෝග කුසලානය සඳහා සුදුසුකම් ලබා ගැනීමට සමත් විය. 2019 ජනාධිපති රන් කුසලාන වොලිබෝල් තරගාවලියේ ජාතික මට්ටමේ තරග ජනවාරි මාසයේ රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩාංගණයේ පැවැති අතර එහිදී දිස්ත්‍රික්ක මට්ටමින් ජයගත් කණ්ඩායම් අතර පැවැති තරගවලින් ජයගන්නා ලද කණ්ඩායම් අට ජනාධිපති රන් කුසලාන සහ අභියෝග කුසලාන අවසන් මහා තරගවලට සුදුසුකම් ලබා ගැනීමට සමත්විය.

ක්‍රීඩා

බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk

මෙහිදී ජනාධිපති රන් කුසලාන පිරිමි අවසන් මහා තරගය සඳහා දෙබෑගම රන්තරු කණ්ඩායම සහ ගම්පහ සියනෑතරු කණ්ඩායම සුදුසුකම් ලබා ගනිද්දී, ජනාධිපති රන් කුසලාන කාන්තා අවසන් මහා තරගය සඳහා මහඋස්වැව රතනපාල ක්‍රීඩා සමාජය සහ රදාවාන ගෝල්ඩන් බර්ඩ්ස් ක්‍රීඩා සමාජය සුදුසුකම් ලබා ගැනීමට සමත් විය.

ජනාධිපති අභියෝග කුසලාන පිරිමි අවසන් තරගය සඳහා නාත්තන්ඩිය යුනයිටඩ් ක්‍රීඩා සමාජය සහ පොතුපිටිය ලකී සික්ස් ක්‍රීඩා සමාජය සුදුසුකම් ලබාගනිද්දී අභියෝග කුසලාන කාන්තා අවසන් මහා තරගය සඳහා කෑගල්ල හයිඩ්‍රාමනි ක්‍රීඩා සමාජය සහ කොස්වාඩිය විජය ක්‍රීඩා සමාජය සුදුසුකම් ලබා ගැනීමට සමත් විය.

ජනාධිපති රන් කුසලාන කනිෂ්ඨ කාන්තා අවසන් තරගය සඳහා මහඋස්වැව රතනපාල ක්‍රීඩා සමාජය සහ කෑගල්ල හයිඩ්‍රාමනි ක්‍රීඩා සමාජය තරග කරන අතර පිරිමි අවසන් තරගය සඳහා නාත්තන්ඩිය යුනයිටඩ් ක්‍රීඩා සමාජය සහ වෙන්නප්පුව ජෝශප් වාස් කණ්ඩායම තරග කරයි.

ජනාධිපති රන් කුසලාන සහ මීට පෙර පැවැති වයස අවුරුදු 22 න් පහළ කාන්තා - පිරිමි තරගාවලි හරහා ග්‍රාමසේවා මට්ටමින් ඉදිවෙන මෙකී වේදිකාවට ගොඩ වදින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාතික තලය හරහා අන්තර් ජාතික මට්ටම දක්වාම සිය හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට හැකිවීම විශේෂත්වයකි. කුසලතා පිරි තරුණ ජවය ක්‍රීඩා පිටි හරහා ජනගත කිරීමට ජනාධිපති රන් කුසලාන සහ අභියෝග කුසලාන තරගාවලියකදීම තෝතැන්නක් බව නොරහසකි. ජනාධිපති රන් කුසලාන වොලිබෝල් තරගාවලිය ගත්ත ද, අභියෝග කුසලාන තරගාවලිය ගත්තද මෙකී භූමි භාගයේ මොන වැටකඩුළු බිඳගෙන ඉදිරියට ගිය ද ලාංකේය භූමි භාගයෙන් එළියේ මෙරට වොලිබෝල් ක්‍රීඩාව අත්පත් කරගන්නා වූ ඉරණම් සහගත තත්ත්වය පිළිබඳ බලධාරීන් මීට වඩා අවධානයක් යොමු කළ යුතු ය. ලාංකේය සමස්ත ක්‍රීඩාවම බිඳ වැටී ඇති මොහොතක වොලිබෝල් ක්‍රීඩාවට පමණක් එයින් මිදීමට නොහැකි බව අමුතුවෙන් පැවසිය යුතු නොවේ. ජනාධිපති රන් කුසලාන සහ අභියෝග කුසලාන තරගාවලිය වසරක් පාසා පැවැත්වීමෙන් ඔබ්බට ගොස් මෙකී තරගාවලිය ලාංකේය වොලිබෝල් ක්‍රීඩාවේ පෙර ගමන්කරු විය යුතු ය. සුපුරුදු පරිදි ඩයලොග් ආයතනය මෙවරත් මෙකී තරගාවලියට අනුග්‍රාහකත්වය දක්වයි.

එංගලන්ත පාපන්දු පිටියේ ලාංකේය තාරකාව

ඕස්ට්‍රේලියානු ඉදිරි පෙළ දක්ෂ පාපන්දු තාරකාවක් වන ලාංකේය සම්භවයක් හිමි ජසින්තා ගලබඩආරච්චි ඉදිරි තරගවාරයේදී එංගලන්තයේ වෙස්ට් හැම් යුනයිටඩ් කාන්තා පාපන්දු සමාජය සමඟ ගිවිසුම් අත්සන් තබා තිබේ.

"මට වයස අවුරුදු අටේ ඉඳලා එංගලන්තයේ ක්‍රීඩා කිරීමට අවශ්‍ය වූණා. වෙස්ට් හැම් යුනයිටඩ් සමග එක්වීමේදී මගේ සිහිනය සැබෑ වී තිබේ" යැයි ඇ පවසයි "වෙස්ට් හැම් පාපන්දු ක්‍රීඩා සමාජය ක්‍රීඩා කරන ආකාරය සහ එම සමාජය සතු වටිනාකම් වලට මම ඇත්තෙන්ම කැමතියි. මෙම පියවර මට සිහිනයක්, මේ සිහිනය යථාර්ථයක් බවට පත්වේවි"

මැන්චෙස්ටර් සිටි අය සමග පුහුණුවීමෙන් පසු මීට පෙර එංගලන්තයට යාමට ගලබඩආරච්චි හට අවස්ථාව ලබා දෙන ලදී. කෙසේ වෙතත් එවකට 15 හැවිරිදි ජසින්තා මෙල්බර්න් සිටි සමග ගිවිසුමක් අත්සන් කළාය. ජසින්තා මීට පෙර මැටිල්ඩාස් පුහුණු කඳවුරකටද එක්ව තිබේ.

"ඇයට වයස අවුරුදු 18 දී විශාල හැකියාවක් තිබුණා යමක් කරන්න , ඇය ඉදිරිපත් කරන දෙයින් මම අතිශයින් සතුටට පත්වෙනවා," පුහුණුකරු මැට් බියර්ඩ් පසුව පැවසීය.

"මම බොහෝ තරුණ ක්‍රීඩකයන් දැකලා තියෙනවා, මම තරුණ ක්‍රීඩකයන් සමග වැඩ කිරීමට හා ඔවුන් ඉදිරියට ගැනිමට කැමතියි. ඇයගේ හැකියාවන් අනුව මා දැක ඇති හොඳම ක්‍රීඩිකාවකි."

ජසින්තා ඇගේ සහෝදරයාගේ ක්‍රීඩාව නැරඹීමෙන් පසු වයස අවුරුදු පහේදී පාපන්දු ක්‍රීඩා කිරීමට පටන් ගත්තාය. වයස අවුරුදු 9 දී, මැන්චෙස්ටර් යුනයිටඩ් ඇකඩමියට පැමිණියාය. පසුව ඇය මැන්චෙස්ටර් සිටි ඩබ්ලිව්.එෆ්.සී. ඇකඩමිය සහ කණ්ඩායම සමග සති අටක පුහුණු කාලයක් ගත කළේය. වයස අවුරුදු 14 දී, 15න් පහළ පිරිමි ප්‍රිමියර් ලීග් කණ්ඩායමක් සඳහා ක්‍රීඩා කිරීමට ඇය කළ ඉල්ලීම වික්ටෝරියා පාපන්දු සම්මේලනය ප්‍රතික්ෂේප කරන ලදී.

සිංහ-බංගලි ටෙස්ට් තරගාවලිය වැට උඩ

බංග්ලාදේශ කණ්ඩායමේ එළඹෙන ශ්‍රී ලංකා තරග සංචාරය ද පැවැත්වීම සම්බන්ධයෙන් මේ වන විට අර්බුදකාරී තත්ත්වයක් මතුව ඇති බව වාර්තාවේ.

මෙම තරගාවලියට එක්වන බංග්ලාදේශ ක්‍රීඩකයන් දින 14ක කාලයක් කිසිදු පුහුණුවීම් කටයුත්තක නොයෙදෙමින් නිරෝධායනයට ලක් විය යුතු බවට මෙරට සෞඛ්‍ය සහ ආරක්ෂක බලධාරීන් විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට උපදෙස් ලබා දී ඇතැයි සඳහන්වේ.

බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය දින හතකට යෝජනා කරන නිරෝධායන ක්‍රියාවලිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූල නොවන හෙයින් එරට ක්‍රිකට් කළමනාකාරීත්වය අපේක්ෂා කරන පිළිතුර ලබාදීමට නොහැකි වනු ඇතැයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආරංචි මාර්ග සඳහන් කරයි.

බංග්ලාදේශ කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණෙනවා නම් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීම අනිවාර්යයි. ක්‍රිකට් කියලා අපට, රටට අවධානමක් ගන්න බෑ. අප මේ තත්ත්වය බංග්ලාදේශ ක්‍රිකට් ආයතනයට දන්වා තිබෙනවා. ඒ අය මේ තත්ත්වය හොඳින් අවබෝධ කර ගන්න ඕනෑ. ඔවුන් අපේ රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූල විය යුතුයි. නමුත් දැන් තියෙන තත්ත්වය අනුව බංග්ලාදේශ ක්‍රිකට් පිලේ පැමිණීම පිළිබඳ විශ්වාස කරන්න අපහසුයි

ඒ අනුව බංග්ලාදේශ ක්‍රීඩකයන් ලබන 27 වැනිදා දිවයිනට පැමිණීමෙන් අනතුරුව දින 14ක කාලයක් නවාතැන් ගන්නා හෝටලයේම රැඳී සිටිය යුතුය.

දෙරට අතර පැවැත්වීමට නියමිත තරග 3කින් යුත් ටෙස්ට් ක්‍රිකට් තරගාවලිය ඔක්තෝම්බර් 24 වැනිදා මහනුවර දී ආරම්භ කිරීමට නියමිතව ඇති නමුත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් මෙතෙක් බංග්ලාදේශ ක්‍රිකට් ආයතනයට තරගාවලියේ කාලසටහන සහ ජෛව ආරක්ෂක සැලසුම නිල වශයෙන් ඉදිරිපත් කිරීමට සමත් වී නැතැයි වාර්තාවෙයි.

බංග්ලාදේශය මේ වන විට සූදානමින් සිටින්නේ නිරෝධායන කාලසීමාව තුළ දී පුහුණුවීම් සහ සංචිතයේම ක්‍රීඩකයන් අතර පුහුණු තරග ක්‍රීඩා කිරීමටය.

"ඔව්. ක්‍රීඩකයන් පුහුණුවීම් සිදු නොකර දින 14ක කාලයක් නිරෝධායනයට ලක්විය යුතු බවට එරට ආරක්ෂක අංශ දැනුම් දී ඇතැයි අපට තොරතුරු වාර්තා වුණා. තවත් බොහෝ දේ විවිධ පාර්ශ්වයන්ගෙන් අපට දැනගන්නට ලැබුණා. නමුත් ඔවුන් මෙය නිල ජෛව ආරක්ෂක සැලසුම සහ කාලසටහන පැහැදිලි කරන්නේ නැහැ. අපි තරග සංචාරය ගැන අවසන් තීරණයක් ගන්නේ ඔවුන්ගේ සැලසුම් සහ තරග කාලසටහන ලැබුණට පස්සේ. අපි ඒක ඉදිරි දින කිහිපයේ දී බලාපොරොත්තුවෙනවා."යනුවෙන් බංග්ලාදේශ ක්‍රිකට් ආයතනයේ ක්‍රිකට් මෙහෙයුම් ප්‍රධානී විදෙස් ක්‍රීඩා මාධ්‍යකට සඳහන් කර තිබුණි. මේ අතර මූලික සූදානමකින් තොරව ටෙස්ට් ශූරතාවලියට තරග කිරීමට බංග්ලාදේශයට නොහැකි බව එරට මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට දැනුම් දෙන බව බංග්ලාදේශ ක්‍රිකට් සභාපති ප්‍රකාශ කරයි. "අපි අවසන් වරට කතා කළ විට, බංග්ලාදේශයේ කොවිඩ්19 තත්ත්වය අනුව ශ්‍රී ලංකාව සාපේක්ෂව ආරක්ෂිත යැයි අපට හැඟුණා. රෝගීන් සංඛ්‍යාව ඉතා අඩුයි . ඔවුන් සිය දේශීය ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ කරලා තියෙන්නේ. එය පාලනය කර ගත හැකි යැයි අපි හිතනවා.

පිටියේ රවුමක්

නාස්තියෙන් තොර ජාතික ක්‍රීඩා උලෙළක්

ලාංකේය ජාතික ක්‍රීඩා උලෙළ ඉතිහාසයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා කෙසේ වෙතත් දැවැන්ත සැරසිලි හා උත්සවාකාරයන්ට මුල් තැන ලබා දෙමින් තනිකරම සුදු අලියෙක්වූ ජාතික මහා ක්‍රීඩා උලෙළ මෙවර පුනු ආටෝපයන් ගෙන් තොරව සුගතදාස ක්‍රීඩාංගණයේ පැවැත්වීමට ක්‍රීඩා අමාත්‍යාංශය කටයුතු යොදා තිබේ. එමගින් ඉතිරි වන මුදල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමට සහ දක්ෂතා දක්වන විශිෂ්ටයන්ට වැඩිදුර පුහුණුවක් ලබාදීමටද සැලසුම් කර තිබේ.

ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මේ ක්‍රමවේදය යටතේ රුපියල් මිලියන 5ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වනු ඇතැයි විශ්වාසය පළ කරයි "සෑම වසරකම සිදුව තියෙන්නේ ජාතික මහා ක්‍රීඩා උලෙළට වෙන් වන සියලු මුදල් වැය කිරීමයි. නමුත් මෙවර අප යම් මුදලක් ඉතිරි කර ගෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනමනවා. අනවශ්‍ය සන්දර්ශන සැරසිලිවලට වැය වන මුදල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දියුණුව වෙනුවෙන් යොදවන ලෙස ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂයන් නිලධාරීන්ට උපදෙස් දී ඇතැයි වාර්තා වෙයි.

ජාත්‍යන්තරය ජය ගත හැකි ඉහළ දක්ෂතා ප්‍රදර්ශනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන, එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විශිෂ්ට පුහුණුව උදෙසා ජාත්‍යන්තර ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව මේ ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක වේ. කොවිඩ්19 වසංගත තත්ත්වය හමුවේ මෙවර ජාතික මහා ක්‍රීඩා උලෙළ සහ එයට සමගාමීව පැවැත්වෙන සියලු ක්‍රීඩා තරග සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව පැවැත්වීමටත්, ක්‍රීඩා ඉසව්වල ගුණාත්මක භාවයට මුල් තැනක් දෙමින්, ජාත්‍යන්තර තාක්ෂණ ක්‍රමවේදයන්ට අනුව තරග පැවැත්වීමටත් තීරණය කර තිබේ.

ක්‍රීඩාවෙන් ඩොලර් බිලියනයක ඉලක්කයක්

ඉදිරි වසර 5ක කාලය ඇතුළත දේශීය ආර්ථිකයට ක්‍රීඩාවෙන් ඩොලර් බිලියනයක ආදායමක් එක් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම තම ඉලක්කය බව ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ ප්‍රකාශ කරයි. මෙරට ආර්ථිකය මෙන්ම ජන ජීවිතය ද ගොඩනගමින් ක්‍රීඩාව ප්‍රතිසංවිධාන කිරීමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීම සඳහා කැපවීම සිය අරමුණ බවද සඳහන් කළේ ශ්‍රී ලංකා රළ මත ලිස්සා යෑමේ සංගමයේ සහ ලංකා ස්පෝර්ට්රයිසින් ආයතනයේ මෙහෙයවීමෙන් මේ මස 26 සහ 27 දෙදින ආරුගම්බේ මුහුදු තීරයේ දී පැවැත්වෙන 'රළ මත ලිස්සා යෑමේ' (සර්ෆින්) ජාතික හා විවෘත තරගමාලාව පිළිබඳ පැවැති මාධ්‍ය හමුවට එක් වෙමින්ය.

කොවිඩ්19 වසංගතයෙන් පසු මෙරට පැවැත්වෙන පළමු ජාතික ශූරතාවලිය බවට පත් වන රළ මත ලිස්සා යෑමේ තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයත්, සංචාරක අමාත්‍යාංශයත් අත්වැල් බැඳගනිමින් ක්‍රීඩාවත්, සංචාරක ක්ෂේත්‍රයත් යළි නඟා සිටුවීමේ ජාතික මෙහෙයුමට උරදී සිටියි. මේ මස 27 වැනිදාට යෙදී ඇති ලෝක සංචාරක දිනයට සමගාමීව පැවැත්වෙන මේ තරගාවලිය තුළින් නැගෙනහිර පළාතේ බිඳ වැටුණු සංචාරක ව්‍යාපාරය යළි ඉහළට ඔසවා තැබීමට විශාල දායකත්වයක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙයි.

ජාතික මහා ක්‍රීඩා උලළේ තරග කතරගමටත්

ජාතික මහා ක්‍රීඩා උලෙළට සමගාමීව පැවැත්වෙන මැරතන්, පාපැදි සහ තරග ඇවිදීම ලබන ඔක්තෝබර් මස 10 සහ 11 යන දිනයන්හිදී කතරගම නගරය කේන්ද්‍ර කර ගනිමින් පැවැත්වෙන අතර, එයට සෑම පළාතක්ම නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වේ.ජාතික මහා ක්‍රීඩා උලළේ දිස්ත්‍රික් තරග හා පළාත් ක්‍රීඩා තරග දැන් ක්‍රියාත්මකව පවතින අතර, පළාත් මට්ටමේ තරග ඔක්තෝබර් 31 වැනි දිනට පෙර අවසන් කිරීමට උපදෙස්දී ඇත. ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකිනෙකා ස්පර්ශ නොවන කැරම්, බැඩ්මින්ටන්, ක්‍රිකට්, ටෙනිස්, කායවර්ධන හා බර ඉසිලීම වැනි තරග කොවිඩ්19 වසංගතය තිබියදීම ආරම්භ කිරීමට දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා ප්‍රධානීහු එකඟත්වය පළ කිරීමෙන් එම ක්‍රීඩා තරග අවසන් අදියරේ පවතී.

එෆ්. ඒ. පාපන්දු කුසලානයට කණ්ඩායම් දහසකට ආසන්න ප්‍රමාණයක්

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මෙහෙයවන අන්තර් ක්‍රීඩා සමාජ එෆ්. ඒ. කුසලාන පාපන්දු තරගාවලිය මේ වසර අවසානයේ ආරම්භ කිරීමට සූදානම් බව පාපන්දු සම්මේලනයේ ප්‍රකාශකයකු පැවැසීය. දැනටමත් මෙකී තරගාවලිය සඳහා ක්‍රීඩා සමාජ 961ක් මෙම තරගාවලියට ඇතුළත්ව සිටින අතර රට පුරා ක්‍රීඩාංගණවලදී මූලික වටයේ තරග පැවැත්වීමට කටයුතු යොදා ඇත.

පසුගිය වසරේදී එෆ්. ඒ. කුසලාන පාපන්දු තරගාවලියට පාපන්දු ලීග් 63කින් ක්‍රීඩා සමාජ 825කට වැඩි ප්‍රමාණයක් එක්වූ අතර මෙවර කණ්ඩායම් 100කට වඩා වැඩි ප්‍රමාණයක් තරගාවලියට ඉල්ලුම් කර තිබේ. පිළිමලුන් පිටුදැකීමේ ක්‍රමයට පැවැත්වෙන මෙම තරගාවලියේ දිස්ත්‍රික් තරග වටය, කලාපීය තරග වටය ,වශයෙන් පැවැත්වේ. ජයග්‍රහණය ලබන ක්‍රීඩා සමාජ 32 අතර වටය ලබන වසරේ මුල් සතියේ සිට හා අවසන් වටය පෙබරවාරි මාසයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එෆ්.ඒ. කුසලාන පාපන්දු තරගාවලියේ ජයග්‍රාහකයන්ට රුපියල් ලක්ෂ 7.5ක් හා අනු ශූරයන්ට රුපියල් ලක්ෂ 5ක මුදලක් පිරිනැමීමට පාපන්දු සම්මේලනය කටයුතු යොදා ඇත. එයට අමතරව වැඩිම ගෝල් වාර්තා කරන ක්‍රීඩකයා, දක්ෂතම ගෝල්රකින්නා ඇතුළු විවිධ අංශවලින් දක්ෂතා දක්වන ක්‍රීඩකයන්ට තෑගි හා සම්මාන ප්‍රදානය කිරීමටද කටයුතු යොදා තිබේ. පසුගිය වසරේ එෆ්. ඒ කුසලාන පාපන්දු තරගාවලියේ ශූරතාව වසර 12කට පසු පොලිස් පිල දිනා ගත් අතර අනු ශූරතාව සෝන්ඩර්ස් පිලට හිමි විය. සෝන්ඩර්ස් පිල එෆ්.ඒ. කුසලාන පාපන්දු ඉතිහාසයේ අවස්ථා 15කදී කුසලානය රැගෙන ගියද පසුගිය වසර දෙකකදීම අඛණ්ඩව යුද හමුදාව සහ පොලිස් කණ්ඩායම් ඉදිරියේ අනුශූරයන් විය.

දීපනි

කලා කීර්ති පණ්ඩිත විමල් අභයසුන්දර මහා කිවියාණෝ

● අරුමාදුර පුලස්ති සරෝජිනි ද සිල්වා

සැප්තැම්බර් 17 දිනට යෙදුණු විමල් අභයසුන්දර කවියාගේ 99 වැනි ජන්ම දිනය වෙනුවෙනි

"වාච්‍යානාං වාචකානං ච
යදෞචිත්‍යෙන යොජ නමී
රසාදිවිෂයෙණෛතත් කම්
මුඛ්‍යං මහාකවෙඃ"

ආනන්ද වර්ධනයන්ගේ මෙම කියමන පණ්ඩිත විමල් අභයසුන්දර මහා කිවියාණන්ගේ කවි සහ ගේය කෘති කෙරෙහි බෙහෙවින්ම ගැළපෙන්නකි. වාච්‍ය වාචකයන් යෝග්‍ය පරිද්දෙන් රස භාව ආදිය පැහැදිලි වීමට අනුකූල වන පරිද්දෙන් කවියේ යෙදීම මහා කවියකුගේ ප්‍රධානතම කටයුත්තයි. ආනන්ද වර්ධනයන් මෙසේ කියා ඇත්තේ මහා කවීත්වයෙන් හෙබි කවීන් ලෝකයෙහි දුර්ලභ වන බැවිනි.

දකුණු රෝහණ ජනපදයට අයත් දකුණු සිරිලක බෙන්තර වලල්ලාවිට කෝරලයේ වැලිතොට වැල්ලබඩ සුන්දර ගම්මානයේ 1921 දී උපන් විමල් අභයසුන්දර දිවයින පුරා ප්‍රකට වෙමින් රසිකයන්ගේ හදවත් මත සොඳුරු මතක සටහන් රඳවා තබන ජනප්‍රිය කවියකු වෙතැයි කිසිවෙකු නොසිතන්නට ඇත. ගම්බද පරිසරය ඔහුගේ කවීත්වය දැනුමෙන් දියුණු කරවන්නට තරම් පොහොසත් නොවූවකි. එහෙත් කළ පින් ඇති සහජයෙන් ලැබුණු කවීත්වය ප්‍රබුද්ධ කරවා ගැනීමේ වාසනා මහිමයත් ඊට අවශ්‍ය පසුබිමත් නිරායාසයෙන්ම ඔහු වෙනුවෙන් සැකසී තිබිණ. වැලිතර පිරිමි පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඔහු සොළොස් හැවිරිදි පමණ වද්දී වැලිතොට සුගත ශාසනෝදය පිරිවෙනේදී රාජකීය පණ්ඩිත අහුන්ගල්ලේ විමල කිත්ති තිස්ස මහා නායක හිමියන් සෙවණෙ වැඩෙමින් පිරිවෙන් අධ්‍යාපනය ලබන්නට පටන් ගත්තේය. එහිදී පාලි සිංහල භාෂා සාහිත්‍යය, ව්‍යාකරණ වඤ්ජලංකාර සහිතව හැදෑරුවේය. අභයසුන්දර නැඟී එන කවියකු වශයෙන් ජනප්‍රිය වන්නට වූයේ තිහේ දශකයේ මැද භාගයේදී ඔහු 'පොසොන් සඳ', 'දුක්මුසු'හා 'සුදු නංගී' යන කාව්‍ය ග්‍රන්ථ පළ කරමිනි.

වැලිතොට සුදුවැලි තලාවේ සුන්දර ගම් පියස ඔස්සේ කොළඹ මාලිගාකන්දට සංක්‍රමණය වීම විමල් අභයසුන්දර ගේ පූර්වකෘත පුණ්‍ය ඵලයක් පලදීමක් බඳු ය. වර්ෂ 1936 පමණ වන විට විමල් අභයසුන්දර කවියා බැබළෙන්නට පටන් ගත්තේ දීප්තිමත් ශිෂ්‍යයකු වශයෙන් පමණක් ම නොවේ. ජනප්‍රිය කවියකු වශයෙන්ද ඔහුගේ නම තුඩ තුඩ රැව් දෙන්නට විය. කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙන් ඔහු අධ්‍යාපනය අවසන් කළේ ඒ ඒ වර්ෂවලදී විශිෂ්ට ත්‍යාග රැසක්

දිනාගනිමින් විශිෂ්ට කුසලතා දක්වමිනි. ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රාචීන විභාගවලදීද ඔහු සාමාර්ථය ලැබූයේ සිංහල පාලි සංස්කෘත යන භාෂා තුනෙන්ම ගෞරව පන්තියෙන්ය. එපමණක් නොව හින්දි භාෂාවද හදාලේය.

අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු විමල් අභයසුන්දර පුවත්පත් කලාවේදියකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඩී. ඩබ්ලිව්. වික්‍රමාරච්චි සූරීන් යටතේ සරසවි සඳරැස පුවත්පතේ උප කර්තෘවරයා ලෙස 1946දී පත්වූ ඔහු 1950දී ලංකාදීප කර්තෘ මණ්ඩලයට එක් විය. 1953දී දිනමිණ පුවත්පතේ කර්තෘ මණ්ඩලයට බැඳුණු විමල් අභයසුන්දර එවකට දිනමිණ ප්‍රධාන කර්තෘ පියසේන නිශ්ශංකයන් යටතේ වසර දෙකක් පමණ සේවය කළේය.

විමල් අභයසුන්දරයන් වාසය කළ නාවල හතරවැනි පටුමගේ සුභ නිවස එකල තරුණ කිවියන්, සහෘදයන්, සංගීතඥයන් සහ මාධ්‍යවේදීන් නිතර නිතර ගැවසෙන තැනක් බවට පත්ව තිබිණ.

බලපිටිය වැල්ලබඩ උපන් නිවස ඉදිරිපිට

විවාහ වූ දා

එවක නැඟී ආ සියලුම කවීහු ඔහුගේ හිතමිතුරන් වූහ. සෝමවීර චන්ද්‍රසිරි, විමලේන්ද්‍ර වතුරේගම, සාගර පලන්සූරිය, පී.බී. අල්විස් පෙරේරා, විමලරත්න කුමාරගම, මීමන ප්‍රේමතිලක, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, බඹරකොටුවේ සුධර්ම සෙනවිරත්න, කරුණාරත්න අබේසේකර, විමලසිරි පෙරේරා, කපිල ඊ. සෙනවිරත්න වැනි සමවයස් කවීන් මෙන්ම තිහාරියේ පීටර් පෙරේරා, ආනන්ද රාජකරුණා, බැන්ටිස් රණවීර, ජයන්ත වීරසේකර, එච්.එම්. කුඩලිගම, පී. මලල්ගොඩ, යූ.ඒ.එස්. පෙරේරා, විල්සන් හැගොඩ වැනි වැඩිහිටි කවීන්ද විමල් අභයසුන්දර කිවියාණන්ගේ ආශ්‍රය ප්‍රිය කළ බව පැහැදිලිව පෙනෙන්නට තිබිණ. දැනට ජීවතුන් අතර නැති ඒ විශිෂ්ට කවීන් මෙන්ම දැනට ජීවතුන් අතර සිටින කවීන් සියලු දෙනාම පාහේ ඔහුගේ ප්‍රාණසම යාවජීව මිත්‍රයන්ව සිටි සැටි නොරහසකි.

කලාකීර්ති පණ්ඩිත විමල් අභයසුන්දර කිවියාණන්ගේ රචනා ව්‍යක්තය. රසාලිප්තය, ප්‍රසාදාවහය, ළඟන්නා සුලුය. ගැඹුරු වූ සියුම් වූ අරුතින් පිරී සිටියේය. පුන පුනා මතු කරගනිමින් විඳිය යුතු රසයෙන් මනහරය. එහෙත්, ඔහුගේ පද ඝටනය සරලය. නිවැරදිය. දොසින් මිදුණේය. උචිත තැනට උචිත වචනය තෝරා ගැනීම පිළිබඳව ඔහු තුළ වූයේ සහජ කුසල බලයෙකි. තරුණ කවීන් සිංහල කාව්‍ය ක්ෂේත්‍රයෙහි කළ මහ පෙරළියේදී පණ්ඩිත විමල් අභයසුන්දර එහි පෙරකඩ ගමන් ගත්තේ ප්‍රතාපවත් සේනාධි නායකයන් කෙනෙකු හැටියටය. කවිය, කවීපය, කාවයෝක්ති , කාව්‍ය මාර්ගය, කවි සංකල්පය, කාව්‍ය ආකෘතිය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි කරුණු අත්හදා බැලීම්වලදී ඔහු කටයුතු කළේ උචිත දෑ ගනිමින් අනුචිත දෑ බැහැර කරමිනි. තැන්පත් විවේක බුද්ධියෙන් යුතු චින්තකයකු පරිද්දෙනි. ඔහුගේ කවි ජීවිතයේ අනන්‍ය සාධාරණ ලක්ෂණය වනුයේ එයයි.

විදුත් මුද්‍රණ මාධ්‍යවේදියකු, ග්‍රන්ථ කතුවරයකු පරිසරකාමියකු, රාජ්‍ය සම්මාන දිනූ ලේඛකයකු, උගතකු, වියතකු, ලේඛකයෙකු, ආචාර්යවරයකු හා සමාජ සේවකයකු වශයෙන් මෙරට සාහිත්‍යයටත් සමාජයටත් උදාර සේවයක් කළ පණ්ඩිත විමල් අභයසුන්දර කිවියාණන් මෙලොව හැර ගියේ 2008 ජුනි 08 වැනිදා ය.

වෙනසක් ගැන චීස් මෙන් රස කතාවක් 'දිවි මඟ දිනන මඟ'

● සුමුදු චතුරාණි ජයවර්ධන

රූපකයක් රසවත් වූ විට නිර්මාණය ප්‍රියජනක වීම නො වැළැක්විය හැක්කකි. ඒ රූපකය රසවත් කෑමක් වූ විට ඒ අත්දැකීම අපට වෙනස්ම දෙයකි. රසවත් කෑමක්, ඒ කෑම ම රසවත් රූපකයක් වූ විට අත්දැකීම ළගන්නා සුලු වීම අරුමයක් නොවේ. එහෙත් විචිත්‍රවත් භාෂාවක්, ඒ භාෂා හරඹයේ දවටනය සිත්ගන්නා සුළු නිමාවකින් යුතු වීමක්; මේ සියල්ල ම එකට කැටි වීම යනාදිය නම් ආශ්චර්යවත් ය; වෙනත් ලෙසකින් කියන්නේ නම් මේ සියල්ල එක්තැන් වීම ම වෙනසකි. පුරුදු පාඨකත්වයෙන් වෙහෙසට පත් අප දෑස් වලට මුලින්ම රසාංජනයක් වී, සිතට තෘප්තියක් දී වෙනසට බිය අපට වෙනස් වීමට ආරාධනා කරන මේ කෘතිය වෙනස් ම රසයකින් යුතු යැයි කියන්නට මැළි විය නො විය යුතුව ඇත.



අජන්ත සෙනෙවිරත්න

චීස්... බොහෝ දෙනා බොහෝ ප්‍රිය කරන කෑමකි. චීස් කැල්ලක් අහිමි වීම; වෙන කෙනකු විසින් එය කෑමට ගැනීම, රසය වෙනස් වීම මේ සියල්ල දැන් මම අත්විඳිමින් සිටින්නෙමි. ඒ 'දිවි මඟ දිනන මඟ' කියවමින් සිටින නිසා ය; කියැවීමෙන් ඔබ්බට විඳිමින් සිටින නිසා ය. විනෝදකාමී, හාස්‍යජනක චරිත හතරක් ඇසුරෙන් සම්බන්ධතා පරිධියක් සොයන මේ වියමන හුදෙක් පාඨක අත්දැකීම පමණක් තිළිණ කරන්නක් නොවේ; එහි අන්තර්ගත පරිකල්පන අත්දැකීම මීට පෙර අත් නො වින්දකි. අහිමි වීම; වෙනස් වීම කෙතරම් වික්ෂිප්තයට පත් කරන්නේ ද යත්; රසට තලුමරන චීස් කැබැල්ලක් එකවර උදුරා ගැනීමක් වැනි ය.

ජීවිතය ගෙවන්නට අපි සැම තාවකාලික වාසස්ථානවල නතර වී නානාප්‍රකාර දෑ කරමින්, කියමින් සිටින්නෙමු. නිවෙසේ එක් ලෙසකටත්, රැකියා ස්ථානයේ තව ලෙසකටත්, වෙන කොයියම්ම ස්ථානයක හෝ තවත් ලෙසකටත් ද්වි රූපී, බහු රූපී ජීවිත ගෙවමින් සිටිමු. මේවායේ විවිධ, විවිධ අවස්ථාවන්හිදී විවිධ ගැටුම් ඇති වීම සාමාන්‍යය ය. ඒවා ගැටුම් කියනවාට වඩා වෙනස්කම් යැයි කියන්නට වඩාත් කැමැත්තෙමි. මේ වෙනස්කම් දරා ගැනීම ජීවිතය යැයි ද; ඒ ජීවිතය පිනවීමට අප නිරන්තරයෙන් බොහෝ දෑ කරමින් සිටින බව ද සත්‍යයකි. එහෙත් ඒ පිනවීම කොතෙක් කාලයකට ද; කවුරුන් වෙනුවෙන් ද යන්න ගැටලුවකි.

මේ කෘතිය ලොව පුරා මිලියන 28 කට වැඩි පිරිසක් විසින් කියවන ලද්දකි. කියැවීමෙන් ඔබ්බට වෙනස්කම් ජීර්ණය කරගත් පිරිස කොතෙක්දැයි ගණනය කළ නො හැක්කකි. කොටස් තුනකින් සමන්විත මෙහි නිරන්තරයෙන් වන වෙනස්වීමට පාසල් මිතුරු කැලක් මුහුණ දෙමින් සිටින අයුරු නිරූපිත ය. මගේ චීස් ගත්තේ කවුද යන කතාව ගොඩනැඟෙන්නේ කතාවේ දෙවන අදියරේ ය. මීයන් හා මිනිසුන් යන්න සංසන්ධනාත්මක විග්‍රහයක් වුව ද; මේවා සරල හා සංකීර්ණ අර්ථ හමුවේ අපේම සංවේදනා, හැසිරීම් ප්‍රකට කරන බව පෙනේ. සරල වීම යන්නට බොහෝ අරුත් මෙහි සම්පාදනය වේ. වෙනස ඉදිරියේ සරල වීම යනු ගැටලු අවම කරන්නකි. වෙනසට මුහුණ දෙන සරල ම විධික්‍රමය පිළිබඳ තෙවැනි කොටසින් ඉගි කෙරේ. එය පුද්ගලික, වෘත්තීය හා වෙනත් ඕනෑම එළැඹීමකින් භාවිතයට ගන්නේ කෙසේද යන්න මෙහිදී සාකච්ඡාවට ලක් වේ. මේ එළැඹුම සියලු පාඨක කණ්ඩායම් නියෝජනය කරන්නකි; ඔවුහු ප්‍රායෝගිකව අත් විඳින්නක් වෙති. මේවා සියල්ල තම ජීවිතයේදී කෙතරම් වාරයක් අත්විඳින්නට ඇත්දැයි තීරණය කිරීම පාඨක ඔබ සතුය. වෙනසට බිය නොවීම යන්න බෙහෙවින් කතාබහට ලක් වෙන්නේ මේ ඇසුරේ ය. වෙනස්වීම් සුබදායක හෝ අසුබදායක වන්නේ අප ඊට මුහුණ දෙන ආකාරය අනුවය. මේ කෘතිය ලොව පුරා මිලියන 28 කගේ ගෞරවයට පාත්‍ර වන්නේ ඒ පසුබිම මත ය.

අවසන් වශයෙන් WHO MOVED MY CHEESE නම් මෙකී කෘතියේ 'දිවි මඟ දිනන මඟ' නම් මේ පරිවර්තන කාර්යය ගැන විශේෂ යමක් කිව යුතුව තිබේ. අජන්ත සෙනෙවිරත්න ලේඛකයා ඉංජිනේරුවෙකි; පරිපාලන නිලධාරියෙකි. හේ සම්මත වදන් බොරු කළ කෙනෙකි. ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත කියා හිසේ කෙස් ගණනට අසා ඇති අපට අජන්තයන් ඊට හාත්පසින් ම වෙනස් සිතුවමකි. ඔහු විටෙක ආයතනික පරිශ්‍රයේ වගකීම් විසින් පරිපාලනමය භූමිකාවකින් අප ඉදිරියට එන්නෙකි; තවත් විටෙක නවකතාකරුවෙක් වශයෙන් නන්විධ පෙදෙස් ස්පර්ශ කළ නවකතා 7ක් රචනා කෙරුවෙකි; බොහෝ දෑ සියුම් ව විග්‍රහ කෙරෙන කෙටිකතා සංග්‍රහ ද්විත්වයක් තිළිණ කෙරුවෙකි; ඉසුසුම් ම දෑ ග්‍රහණය වෙන කාව්‍ය සංග්‍රහයක් අප හමුවේ තැබූවෙකි; ඉනුත් ඔබ්බට යන ඔහු සිත හා මනස ගැන පර්යේෂණාත්මක ග්‍රන්ථයක් ලියූවෙකි; ගිනිය නොහැකි තරම් කාව්‍ය නිර්මාණ සයිබර් අවකාශයේ සටහන් කෙරුවෙකි; ගේය පද රචනා කිහිපයක් ම සංගීත ක්ෂේත්‍රය වෙනුවෙන් නිර්මාණය කෙරුවෙකි. සරස්වතිය විසින් තිළිණ කරන සුන්දරම කලා අත්දැකීම වන සිතුවම්කරණය ද ඔහුට ආගන්තුක නැත. කාර්යබහුල ජීවිතය විසින් මඟ හැරෙන බොහෝ දෑ ගැන හේ බෙහෙවින් සවිඥානික ය. මනුෂ්‍යත්වය යනු කුමක්දැයි ප්‍රශ්න කෙරෙන විටෙක ඔහු දරන ආස්ථානය මනුසත්බවට ආහරණයකි.

විටෙක මනුෂ්‍යත්වය ගැන වූ කතා බහකදී ඔහු පැවසූ වදනක් මට නැවත සිතන්නට කළ ඇරයුම අමතක නොවේ. මිදුලේ කෑම ලෑල්ලක් සාදා ලෙහෙනුන්ට කෑම තබා, උන් කෙරෙහි වන ආදරයෙන් සෙනෙහසින් කටයුතු කරන අප ඒ වැනි ම වන මීයන්ට අගුල් අටවන්නේ දෙවරක් නොසිතා ය. 'විජිත පටුමගේ අපි' කෙටිකතා සංග්‍රහයේ වූ කතාවක් ගැන ඇතිවූ ඒ කතාබහ මට වෙනසකට මඟ පෑදුවේය. එහෙයින් නිරන්තරයෙන් වෙනස ගැන සවිඥානික ඔහු අතින් කෙරුණු මේ පළමු පරිවර්තන කාර්යය සාකල්‍යයෙන් ම නිවැරදි තෝරා ගැනීමක් බව නොකියා බැරිය. පරිවර්තනයක් නොවන තරම් සමීප සරල, සුගම භාෂාව විසින් ඊට එල්ල කරන ලද ආලෝකය අතිමහත් ය.

වෙනස, රසවත්ව අත්විඳින්නට කෙරෙන ඇරයුම පිළි නොගෙන සිටින්නට නොහැකි තරම් ආකර්ෂණීය කෘතියක් පාඨක අපට තිළිණ කිරීම සම්බන්ධයෙන් කතුවරයාට සහෘදය කෘතවේදීත්වය හිමි වනු ඇත.

ආර්ථිකය පණ ගන්වන හැටි කියන 21 එළිදකින ශ්‍යාම් නුවන් ගේ අලුත් පොත

● සුරේකා නිල්මිණි ඉලංගකෝන්

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ලෝකයේ සෑම රටකටම පාහේ අඩු වැඩි වශයෙන් බලවත් ආර්ථික විපාකයන්ට මුහුණ දීමට සිදුව තිබේ. එම ආර්ථික විපාකයන් ජය ගැනීම සඳහා ශ්‍රී ලංකාවටද කටයුතු කිරීමට සිදුව ඇත්තේ දේශීය සහ ජාත්‍යන්තර ආර්ථික බලපෑම් සහිත වාතාවරණයට මුහුණ දෙමිනි.

ශ්‍යාම් නුවන් ගනේවත්ත

එවැනි පසුබිමක් තුළ කොවිඩ් - 19 හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය පණ ගැන්වීමේ උපායමාර්ග ගැන ජන සමාජය තුළ කතිකාවක් ඇති කිරීම සහ ඒ සම්බන්ධයෙන් ජනයා දැනුවත් කිරීම සැබෑ මාධ්‍යවේදියකුගේ යුතුකමක් යැයි හැඟේ. ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ශ්‍යාම් නුවන් ගනේවත්ත 'කොවිඩ් 19 හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පණ ගැන්වීම'නම් සිය නවතම කෘතිය පළ කරන්නේ ඒ යුතුකම ඉටු කරමිනි. එම කෘතිය පිළිබඳ මාධ්‍යවේදී ශ්‍යාම් නුවන් ගනේවත්ත මෙසේ කීවේය.

"කොවිඩ් වසංගතයෙන් අකර්මණ්‍ය වූ අපේ රටේ ආර්ථිකය නැවත පණගැන්වීම ගැන බොහෝ සාකච්ඡා සිදුවෙමින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ හැකි විවිධ උපායමාර්ග ගැන අදහස් බොහොමයක්ද ඉදිරිපත් වී තිබෙනවා. බොහෝ දෙනා පශ්චාත් කොවිඩ් යුගයක් ගැන කතා කරනවා. නමුත් අපි කවුරුත් දන්නවා ලෝකයේ බොහෝ රටවල්වල වගේම අපේ රටෙත් තවම කොවිඩ් වසංගතය සම්පූර්ණයෙන් අවසන් වී නැහැ. රටේ ආර්ථිකය ගොඩ නැඟීමට කොවිඩ් වසංගතය අවසන් වන තුරු බලා සිටීමට හැකියාවක් නැහැ. ඒ නිසා කළ යුත්තේ සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම වේද අනුගමන කරමින් රටේ ආර්ථිකය පණ ගැන්වීමට අවශ්‍ය උපායමාර්ග ක්‍රියාවට නැංවීමයි."

කොවිඩ් 19 සම්බන්ධ මෙම කෘතිය මාධ්‍යවේදී ශ්‍යාම් නුවන් ගනේවත්ත විසින් රචිත 19 වැනි කෘතිය වීමද විශේෂත්වයකි. කොරෝනා වසංගතය හමුවේ ශ්‍රී ලංකාවට ආර්ථික බලපෑම් සහ ශ්‍රී ලංකා ආර්ථිකය පණ ගැන්වීම සම්බන්ධයෙන් කතුවරයා විසින් ම ලියන ලද පරිච්ඡේදවලට අමතරව ඒ සම්බන්ධයෙන් විවිධ විද්වතුන් දැක්වූ අදහස්වලින් සමන්විත පරිච්ඡේද කිහිපයක්ද මෙම කෘතියට ඇතුළත්ය. ඒ අනුව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමති අජිත් නිවාඩ් කබ්රාල්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර, මහාචාර්ය නලින් අබේසේකර සහ ආචාර්ය දිනේෂ් සමරසිංහ යන විද්වතුන්ගේ අදහස් මෙම කෘතියේ වේ.

කොළඹ නාලන්ද විද්‍යාලයේ ආදි සිසුවකු වන මාධ්‍යවේදී ශ්‍යාම් නුවන් ගනේවත්ත ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ වාණිජවේදී විශේෂ උපාධිධාරියෙකි. රජයේ මාධ්‍ය පුහුණු ආයතනයේ ජනමාධ්‍ය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි. 2003 වසරේදී දිවයින පුවත්පතේ මාණ්ඩලික මාධ්‍යවේදියකු ලෙස සේවයට බැඳුණු ඔහු දැන් එහි ජ්‍යෙෂ්ඨ මාධ්‍ය වේදියෙකි. බැදුම්කර මගඩිය, කවුද හොරා, යහපාලන රජයේ ආර්ථික ශේෂ පත්‍රය, කොටස් වෙළෙඳපොළ ඉතා සරලව, සංචාරක ආර්ථිකයට රට සූදානම් කිරීම, බුදු දහමේ ආර්ථික විද්‍යාව, අපේ ආර්ථිකයේ හෙට දවස, ශ්‍රී ලංකා ආර්ථිකයට ප්‍රවේශයක්, ආර්ථික යුද්ධය ජය ගැනීම ඇතුළු ව ඔහු විසින් මේ දක්වා ලියන ලද සහ සංස්කරණය කරන ලද කෘති සංඛ්‍යාව 18කි.

ඔහුගේ නවතම කෘතිය 'කොවිඩ් 19 හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පණ ගැන්වීම' ජනගත කිරීම 21 වැනි සඳුදා පස්වරු 3.00- 5.30 දක්වා කොළඹ පුස්තාල හා ප්‍ර ලේඛන මණ්ඩල ශ්‍රවනාගාරයේදී මුදල් රාජ්‍ය ඇමති අජිත් නිවාඩ් කබ්රාල් ඇතුළු ආර්ථික හා මූල්‍ය අංශවල සම්භාවනීය ආරාධිතන් රැසකගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ.



සේනාරත්න වීරසිංහගේ මුහුණු පොත ගැන පළමු විචාර පොත 21දා ජනගත වේ

මුහුණු පොත නමැති සන්නිවේදන මාධ්‍ය ඔස්සේ සාහිත්‍ය කලා පරිශීලනය හා වින්දනය පිළිබඳව ප්‍රවීණ සාහිත්‍යවේදියකු වන සේනාරත්න වීරසිංහ විසින් ලියන ලද 'මුහුණුපොත සහ විශ්ව සාහිත්‍යකලා ප්‍රවේශය' නමැති විචාරාත්මක කෘතිය 21 වැනි සඳුදා පෙරවරු 10ට කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ D 158 ප්‍රදර්ශන කුටියේදී ජනගත වේ. එහිදී කතුවරයා විසින් කෘතියේ මුල් පිටපත ජනාධිපති මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂ ප්‍රවීණ මාධ්‍යවේදී මෝහන් සමරනායක මහතා පිළිගැන්වීමට නියමිතය.

සරත්චන්ද්‍ර ජයවර්ධන ගේ 'ඉතිහාසය සිතියම් පොත' නිකුත් වේ

4 ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා දක්වා ඉගෙනුම ලබන පාසල් සිසුන් වෙනුවෙන් ම නිර්මාණය කරන ලද මෙම කෘතිය මෙතෙක් ඉතිහාසය විෂයය සඳහා ම නිර්මාණය කළ සිතියම් පොතක් නොමැති වීමේ අඩුව පුරවන්නකි. ඉතිහාසය විෂයයට අදාළ විශාල කාල පරාසයක විහිදුණු ඓතිහාසික තොරතුරු ළමා මනසට උචිත පරිදි, වර්ණ පිංතූර, සිතියම් හා රූපසටහන් ආධාරයෙන් සංක්ෂිප්තව, පහසුවෙන් හා සැහැල්ලුවෙන් ඉගැන් වීමට මේ තුළින් කතුවරයා උත්සාහ දරා ඇත. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරියකු ලෙස මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයට මහඟු මෙහෙයක් සිදු කළ සරත්චන්ද්‍ර ජයවර්ධන මහතා තවත් අගනා පොත් කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අතර "ඉතිහාසය ඉගෙනීමට හා ඉගැන්වීමට කෞතුකාගාර උපයෝගීකරණය" කෘතිය කෞතුකාගාර අධ්‍යාපනය සඳහා මෙරට පාසල් සිසුන් සඳහා ලියවී ඇති එකම සිංහල කෘතියයි.

ජාතික යෞවන සම්මාන තරගාවලියට අයැදුම්පත් කැඳවයි

ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරන 42 වැනි යෞවන සම්මාන තරගාවලිය සඳහා දැන් අයදුම්පත් භාර ගැනේ. නාට්‍ය, නර්තන, සංගීත, සාහිත්‍යය, චිත්‍ර, ඡායාරූප, නිවේදක, කටීක,කැටයම් ආදී තරග අංශ ගණනාවක් යටතේ පැවැත්වෙන මෙම තරගාවලියට වයස අවුරුදු 15ත් 29ත් අතර තරුණ තරුණියන්ට අයැදුම් කළ හැකිය. නාට්‍ය තරග හා සාහිත්‍ය මුද්‍රණ කෘති තරග සඳහා පමණක් වයස අවුරුදු 15ත් 35ත් අතර තරුණ තරුණියන්ට සහභාගි විය හැකිය. සිංහල, දමිළ සහ ඉංග්‍රීසි බසින් තරග පැවැත්වෙන අතර ආබාධිත තරුණ තරුණියන් සඳහා වෙනම තරගාවලියක් පැවැත්වීමටද නියමිතය. දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටම ලෙස අදියර තුනකින් පැවැත්වෙන අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනය සැප්තැම්බර් 30 වැනිදා අතර www.nysc.lk වෙබ් අඩවියට පිවිසීමෙන් වැඩි විස්තර ලබාගත හැකිය. අයැදුම්පත් ජාතික තරුණ සේවා සභාවේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවලින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තරුණ සේවා නිලධාරී වෙතින් ලබාගත හැකිය.

කවි පොත් සල්පිල ලබන 27 වැනිදා දක්වා

ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමයේ පූර්ණ අනුග්‍රහයෙන් පැවැත්වෙන වාර්ෂික කවි පොත් සල්පිල කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී ලබන 27 වැනිදා දක්වා පැවැත්වේ.

පසුගිය 18 වැනිදා ආරම්භ වූ මෙම කවි පොත්සල්පිල ඔස්සේ සමස්ත සිංහල කවිය ආවරණය වන අතර පැරණි සහ නූතන කාව්‍ය කෘති, කාව්‍ය විචාර, පරිවර්තන කාව්‍ය කෘති මෙන්ම දෙමළ සහ ඉංග්‍රීසි කවි කෘති ද ලබාගත හැකිය. විවිධ කාව්‍ය කෘති රචනා කළ කවි කිවිඳියන්ට සිය කෘති අලෙවියට සහ ප්‍රදර්ශනයටද එහිදී අවස්ථාව ලැබෙන අතර ඒ පිළිබඳ වැඩි විස්තර 0714877380 (චන්දන), පියන්කාරගේ (0714991168) ඇමතීමෙන් ලබාගත හැකිය.

කාශ්‍යප සත්‍යප්‍රිය ද සිල්වාගේ ප්‍රථම ගේය පදසරණිය 'නුඹ මාලතී' දොරට වඩී

1980 දශකයේ කාව්‍යකරණයට පිවිස, එකල විවිධ පුවත්පත්, සඟරා සහ කවිකොළ හරහා කාව්‍ය රසිකයන් දැනහඳුනාගත් කාශ්‍යප සත්‍යප්‍රිය ද සිල්වා ගේ ප්‍රථම ගේය පදසරණිය 'නුඹ මාලතී' පසුගියදා එළිදැක්විණ. දිවයිනේ ප්‍රවීණ සංගීතඥයන් ගේ මිහිරිතම තනුවලට ගැයුණු ගී පද රචනා මෙන්ම තවමත් ස, රි, ග, ම ස්වර මුසු නොවූ නැවුම් සුගායනීය පදමාලා රැසක් මෙම කෘතියේ අඩංගු වේ. එය සයුරි ප්‍රකාශනයකි.



ගොඩගේ සම්මාන උලෙළ සහ පුළුල් සමාජ සංස්කෘතික කතිකාවක අවශ්‍යතාව

සිරිසුමන ගොඩගේ මහතාගේත් පිළිගත් සාහිත්‍යධරයන්ගේත් මුලිකත්වයෙන් ආරම්භ වුණ ගොඩගේ සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය 2020 වර්ෂයේ විනිශ්චය කර්තව්‍යය පසුගිය දා අවසන් විය.

සාහිත්‍යය සම්මාන ප්‍රදානෝත්සවයක් වශයෙන් ආරම්භයේ දී එය, සිය විනිශ්චයික කටයුත්ත පැවැත්වූයේ තමන්ගේ කෘති එසේත් නැත්නම් ගොඩගේ ප්‍රකාශන සඳහා පමණි. පසුව ඊට දායකත්වය සපයන සාහිත්‍යවේදි ටෙනිසන් පෙරේරා හා කමල් පෙරේරා ගේ යෝජනා ප්‍රකාරව භේදයකින් තොරව සියලු ප්‍රකාශකයන්ගේ කෘති සලකා බැලෙන එමෙන්ම සම්මාන පිදෙන ජාතික සාහිත්‍යය සම්මාන ප්‍රදානෝත්සවයක් බවට පත් වී තිබේ. ඒත් සමගම ඉංග්‍රීසි දෙමළ භාෂා මාධ්‍යයෙන් ලියවෙන කෘතීන් ද ඊට ඇතුළත් කරගනිමින් අර කියන්නට යදුණ ජාතික තලය සම්පූර්ණ කරගන්නා ආකාරයක් ද දැකිය හැකි විය.

මෙවර ගොඩගේ සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්
පයකින්ම පවත්වන්නට යෙදිණි. මෙසේ වට කිහිපයකින් කෘති තෝරා ගැනීම පිළිබඳව විවේචනාත්මක මත පහළ වන පසුබිමක ගොඩගේ සම්මාන ප්‍රදානෝත්සවයේ මුල් කාලීන සාමාජිකයෙකු ඊට අදාළව පැහැදිලි නිරීක්ෂණයක් ද ඇති සාහිත්‍යවේදී කමල් පෙරේරාගෙන් අපි ඒ ගැන විමසුවෙමු. ඔහු පැවසුවේ කටයුත්තක් හැටියට එහි වරදක් දැකිය නොහැකි නමුත් ඊට අදාළව ප්‍රාමාණික උගත්කමකින් තොරව එතැනදී කටයුතු කළොත් ගැටලුකාරී තත්ව මතුවිය හැකි බවයි. විශේෂයෙන්ම එවැනි උගත්කමක් ඇති දායකත්වයක් අවශ්‍ය වන්නේ මුල් වටයේ දීමය. මක්නිසාදයත් බොහෝ පොත් ප්‍රතික්ෂේප වන්නේ ද එම වටයේ දි බැවිනි. ඉදින් එවැනි පසුබිමක එවැනි ප්‍රතික්ෂේපවීම් හේතු යුක්ති සහගතව සිදුවිය යුතුව තිබේ. දෙවැනි තෙවැනි වට වල දී එම පොත් තමන්ට පැමිණියේ නැතැයි පවසමින් නිදහසට කරුණු කියන්නට අවස්ථාව ලබා දෙන්නේ මුල් වටයේ තෝරා ගැනීම් මෙන්ම ප්‍රතික්ෂේප වීම් ප්‍රශ්නකාරී වන අවස්ථා වලදී ය. ඒ අනුව මුල් වටයේ එම තේරීම ප්‍රාමාණික උගත්කමකින් කළ යුතු කටයුත්තක්ම වන්නේ ය.

මෙවර ගොඩගේ සම්මාන උළෙල සඳහා නවකතා පොත් 143 ක් ද, කෙටිකතා පොත් 70 ක් ද, ශාස්ත්‍රීය පොත් 87 ක් ද, පුවත්පත් තීරු ලිපි පොත් 24 ක් ද දෙමළ බසින් පළ වූ නවකතා පොත් 3 ක් ද කෙටිකතා පොත් 8 ක් හා පද්‍ය කෘති 15 ක් ලැබී තිබුණි. ඉංග්‍රීසි භාෂාවෙන් නවකතා 14 ක්, කෙටිකතා 3 ක් හා පද්‍ය කෘති 10 ක් ලැබී තිබුණි.

හොඳම නවකතාව සඳහා සම්මානය මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු අතින් ප්‍රවීණ ලේඛක එරික් ඉලයප්පආරච්චි ලබා ගනිමින්

හොඳම කාව්‍ය සංග්‍රහයට හිමි සම්මානය ප්‍රවීණ කිවියර කුමාර හෙට්ටිආරච්චි මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු ගෙන් සම්මාන ලබමින්

සිංහල බසින් ලියවුණ, අවසාන වටයට තේරුණ නවකතා 12න් සුනේත්‍රා රාජකරුණායකගේ නිෂ්ටාන්තය හොඳම නවකතාව වශයෙන් සම්මානයට පත් වන්නේ, කීර්ති වැලිසරගේ රුදු රොන් සුනු, ලියනගේ අමරකීර්තිගේ ලියූ රතු ඉරි අඳින අත, ප්‍රියන්ත ලියනගේ ලියූ කොට තුවක්කු වැනි කෘති අබිබවමිනි. කෙසේ වුණත් සැලකිය යුතු අවධානයක් දිනාගත් කෘතියක් වූ කෞශල්‍ය කුමාරසිංහගේ 'නිම්නාගේ ඉතිහාසය' පළමු වටයේදී ම ගිලහී යාම සම්බන්ධයෙන් විවේචනාත්මක මත පවතී. සාහිත්‍යවේදී කමල් පෙරේරා එය දකින අන්දමට පළමු වටයේ දීම කිසිම සැලකිල්ලක නොලබා එසේ එය ගිලිහී ගියේ ඇයි කියන එක ප්‍රශ්නයක් බවයි. වෙසෙස් අවධානයට ලක්වන සෑම කෘතියක්ම සම්මානනීය විය නොහැකි නමුත් එවැනි ගිලිහී යාමක් බොහෝ විට අපට පෙන්වා දෙන්නේ සමස්තයක් වශයෙන් තුලනාත්මක විවරණයක් නොමැති වීමක් වේ. මෙහිදී අවධානයට ලක් විය යුතු තවත් කාරණයක් ද තිබේ. ඒ අනුව බොහෝ අය සිතා සිටින අන්දමට සාහිත්‍ය විනිශ්චයක් යනු ලේඛකයන් සම්බන්ධයෙන් පමණක් බලපවත්වන තත්ත්වයකට පමණක් සීමා නොවේ. එය පාඨකයාට ද බලපාන තත්වයක් වේ. ඒ අනුව යමින් අපට කීමට සිදු වන්නේ සාහිත්‍ය විනිශ්චයක් යනු හුදෙක් ලේඛකයා සහ විනිශ්චයකරුවා අතර පෞද්ගලික ප්‍රශ්නයක් නොවන බවයි.

අවසන් වටයට තේරුණ කෙටිකතා අතර සුමුදු සෙනෙවිරත්නගේ සිතුවමින් නෙරපු කිඳුරිය, පී. බී. ජයසේකරගේ ද්වේශයාගේ බිරිඳ, සමන් වික්‍රමාරච්චිගේ දෙදෙනෙක් නොවේ එක්කෙනෙක් වැනි තරගකාරී කෙටිකතා සංග්‍රහ අතරින් එරික් ඉලියප්ආරච්චිගේ විශ්‍රාමික පෙම්වතිය සම්මානයට පාත්‍ර වී තිබේ. ඒ අනුව එය තරගකාරි ජයග්‍රහණයක් යැයි සැලකිය හැකි වේ.

කාව්‍ය සම්මානය ද සුනන්දා රණසිංහ ප්‍රවීණ කාව්‍ය රචකයන් පිරිසක් අතරිනි. ඇත්ත වශයෙන්ම ඕනෑම සාහිත්‍ය තරග ඉසව්වක් ජයග්‍රාහී වන්නේ එය තරගකාරි ඉසව්වක් වන තරමටය. එමෙන්ම ජයග්‍රාහී කෘතිය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන හේතු සාධකයන්හි සාධනීයත්වය ද මත ය.

සාහිත්‍යවේදි කමල් පෙරේරාට අනුව සාහිත්‍ය විනිශ්චයක පිළිගත හැකි බව ජාතික තලයේ පුළුල් නිර්ණායකයන් මත තීරණය වන්නක් වේ. විශ්වවිද්‍යාලවල සිංහල අධ්‍යයන අංශයන්හි කාර්යභාරය ද මීට අදාළ විය යුතුය. එය ශාස්ත්‍රීය මෙහෙවරක් ලෙසින් සලකා සම්පාදනය කිරීමේ අවශ්‍යතාවක් ද පවතී. ඒ අනුව යමින් මෙරට නිර්මාණ සාහිත්‍යය සම්බන්ධයෙන් පුළුල් සමාජ කතිකාවතක් ඇති වීම ද අවශ්‍ය වේ. අඩුම තරමින් සම්මානලාභි කෘතිවත් ත්‍රෛභාෂාවෙන් පළ කිරීමට කටයුතු කොට සිංහල නිර්මාණ සාහිත්‍යය පත්ව ඇති කොදෙව් සීමාව ඉක්මවන්නට කටයුතු කළ යුතුව තිබේ. සාහිත්‍ය සම්මාන ප්‍රදානය නිර්මාණ සාහිත්‍යයේ ප්‍රබෝධයට යොමු කරනවා නම් සම්මාන උන්මාදය පරාජය කළ යුතුව තිබේ. ඒ වෙනුවට ඉදිරියට ගත යුතුව ඇත්තේ සාහිත්‍ය ප්‍රබෝධයයි. ඒ වෙනුවෙන් අර කියන්නට යෙදුණ පුළුල් සමාජ සාහිත්‍ය කතිකාවත යන්න අවශ්‍යම කොන්දේසියක් වේ.

ඒත් සමගම කිව යුතු තවත් කරුණක් වන්නේ ඉංග්‍රීසි දෙමළ කෘති සඳහා ගොඩගේ සම්මාන පිදීම ජාතික ප්‍රගතිශීලිත්වයක් වශයෙන් සැලකිය හැකි නමුත් පසුගිය කාල චක්‍රවානුවල සිට මේ දක්වාම ඔවුන් ඒ සඳහා ගෙන ඇති උත්සාහය පිළිබඳව ඔවුන්ගේ සංවිධායක මණ්ඩලය සෑහීමකට පත් වන්නේ ද යන්නයි. මක් නිසාදයත් හුදෙක් ප්‍රචාරන කටයුත්තක් වශයෙන් පමණක් එය පවත්වාගෙන යෑමෙන් සමාජ සංස්කෘතික වශයෙන් පැවැත්විය යුතු ඒ සාමූහික සංවාදයට එමගින් ප්‍රතිඵලයක් අත් නොවන හෙයිනි.

> අවසන් වටයට තේරුණ කෙටිකතා අතර සුමුදු සෙනෙවිරත්නගේ 'සිතුවමින් නෙරපු කිඳුරිය', පී. බී. ජයසේකරගේ 'ද්වේශයාගේ බිරිඳ', සමන් වික්‍රමාරච්චිගේ 'දෙදෙනෙක් නොවේ එක්කෙනෙක්' වැනි තරගකාරී කෙටිකතා සංග්‍රහ අතරින් එරික් ඉලියප්ආරච්චිගේ 'විශ්‍රාමික පෙම්වතිය' සම්මානයට පාත්‍ර වී තිබේ. ඒ අනුව එය තරගකාරි ජයග්‍රහණයක් යැයි සැලකිය හැකි වේ.

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

සම්මානයෙන් පසු මානව හිමිකම් ගිය එකම සාහිත්‍ය සම්මාන උලෙළ

සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවයක් අවසානයේ දී මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරන තැනකින් අවසන් වේ, නම් එය පුදුම සහගත තත්වයකි. විශේෂයෙන්ම මෙරට සාහිත්‍යය ඉතිහාසය තුළ එවැනි තත්වයක් ඇසු නොවිරූ තරම් ය. නමුත් පසුගිය දිනවල දී අවසන් වූ විද්‍යෝදය සම්මාන උලෙළ ඒ (අව)සම්මානය ද රටට ලබා දුන්නේ ය.

මුලින්ම එය පත්තු වුණේ ගීත සාහිත්‍යය සම්බන්ධයෙන් සම්මාන විනිශ්චයට අදාළව ය. ඒ පිළබඳව විනිශ්චය කටයුත්ත බාරව සිටියේ විශ්වවිද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්ය සුනේත්‍රා කංකානම්ගේ ය. අවසන් වටයට තේරුණ කෘති වූයේ රත්න ශ්‍රී විජේසිංහගේ සුවඳ මුවරද මහාචාර්ය සුනිල් ආරියරත්නගේ ඇහිපිල්ලමක් අතර, යමුනා මාලනිගේ සඳ පහන් දැල් වී, අසංක රුවන් සාගරගේ පරසතු සහ එඩ්මන්ඩ් තිලකරත්න පියතුමාගේ ගීත සමුච්චය යන ඒවායි. සම්මානයට පාත්‍ර වූයේ රත්න ශ්‍රී ගේ සුවඳ මුවරද ය. ගින්න ඇවිළුණේ එතැනින් ය. එම කෘතිය සම්මාන උළෙලින් නෙරපා හැරීමට කටයුතු කරමින් එඩ්මන්ඩ් තිලකරත්න පියතුමාගේ ගීත සමුච්චය කෘතිය අවසන් වටයට තේරීම සම්බන්ධයෙන් ද දැඩි චෝදනා එල්ල වූයේ යැයි ද වාර්තා වේ.

අනිත් අතට එකී විනිශ්චයික පසුබිමේ මහාචාර්ය සුනිල් ආරියරත්න සිය කෘතිය තරග ඉසව්වෙන් ඉවත් කර ගැනීමක් ගැන ද අසන්නට ලැබේ. සම්මාන ප්‍රදානෝත්සවයේ සංවිධායක ධුරය දරන්නේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොල ය. ප්‍රස්තුත සම්මානය වෙනුවෙන් පීඨාධිපති ද මුල් කොටගත් රැස්වීමක් කැඳවන්නට කටයුතු කොට ඇත්තේ ද ඇයම ය. ගීත සමුච්චය කෘතිය අවසන් වටයට තේරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වන්නේ එහිදී ය. වඩාත් ජුගුප්සාජනක සිද්ධිය වී ඇත්තේ සිංහල හා ජන සන්නිවේදන අංශයේ සේවය කොට විශ්‍රාම ගිය මහාචාර්යවරයකු දුරකථනයෙන් සම්බන්ධ කරගනිමින් ඔහුගේ ප්‍රකාශය රැස්වීමට අසන්න සැලස් වූයේය යනුවෙන් ද සඳහන් වී තිබීම ය. ප්‍රතිඵලය වූයේ ගීත රචනා සම්මානය අවලංගු කිරීමයි. එක් මොහොතකට සම්මානය හිමි වී පසුව එය අහිමි වූ රත්න ශ්‍රී විජේසිංහ පවසා ඇත්තේ ඒ පිළිබඳව තමන් කනගාටු වෙනවා යන්න පමණි. ඒ සා අවමානයක් ප්‍රවීණ ගීත රචකයකුට සිදු වීම සම්බන්ධයෙන් විද්‍යෝදය සම්මාන ප්‍රදානෝත්සවයේ සංවිධායකයන්ට කියන්නට ඇත්තේ කුමක් ද? අප සිතන අන්දමට නම් කිසිදු සදාචාරයකින් තොරව උගත් විනිශ්චයික පැහැදිලි කිරීමක් ද නැතිව හිටිවනම සාහිත්‍යය සම්මානයක් අත්හිටුවීම පැහැදිලිවම, පැහැදිලි කළ යුතු තත්ත්වයක් වේ. එපමණක් නොව එවැනි අවමානයක් සමාජගත කිරීම සම්බන්යෙන් ඊට අදාළව ද මෙම සංවිධායකයන්ට වගකීමක් තිබේ.

විද්‍යෝදය සම්මාන ප්‍රදානය සිදු කෙරෙන්නේ පොදු විශ්වවිද්‍යාලයිය පසුබිමක වන නිසා මෙන්ම එය කාගෙවත් පුද්ගල බලධාරීත්වයකට යටත් නොවිය යුතු නිසාත් ඒ වගකීම පැහැර හැරීමට සංවිධායකවරුන්ට පුළුවන්කමක් නැත.

ලංකාවේ තීරු ලිපි රචනය, සම්මාන දිය යුතු සාහිත්‍යයක් හැටියට සලකා කටයුතු කිරීමේ හා එය එසේ හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ විද්‍යෝදය සම්මාන ප්‍රදාන සංවිධායකයන්ට ය. ඒ අනුව මෙවර යසවර්ධන රොදිගු ගේ "යසාගේ වාක්කිය" කෘතියට එකී සම්මානය හිමිවන මුත් අවසාන මොහොතේ දී "කොළඹ කතා" නමින් ඉදිරිපත් කොට තිබූ අනුරසිරි හෙට්ටිගේ ගේ කෘතිය ද ඊට ඇතුළත් කරමින් එකම සම්මානය දෙදෙනාම අතරේ බෙදා දීමට කටයුතු කොට ඇත. ප්‍රශ්නය තියෙන්නේ එය එසේ සිදුවීම තුළ නොවේ. එය ද දැනුම් දීමකින් තොව හිටිවනම සිදු වීම තුළ ය.

ඒ නිසාම ඊට අදාළව සම්මානලාභියා යන්නට අමතරව තීරු ලිපි සාහිත්‍යය නම් විෂය සීමාවන් හඳුනා ගැනීමේ අර්බුදයක් ද නිර්මාණය විය. තත්ත්වයේ සංකීර්ණත්වය නිසාම ඒ සම්බන්ධයෙන්, එහි විවාදාත්මක චරිතය බවට පත් වන අනුරසිරි හෙට්ටිගේගෙන්ම ඒ ගැන විමසීමට අපි කටයුතු කළෙමු.

අනුරසිරි එය හැඳින්වූයේ "අතරමගදී මේසය මතට ආ සම්මානයක්" වශයෙනි. ඒ පිළිබඳව අදහස් දක්වමින් ඔහු කියා සිටියේ කොළඹ කතා නම් තමන්ගේ කෘතියේ ලා අන්තර්ගත වන්නේ උසාවියේ ගෙවුණ සිය ළමා විය මෙන්ම තමන්ගේ ජීවිතයේ බොහෝ අත්දැකීම් බව ය. ඒ අනුව මෙය ඉතා පැහැදිලිවම ජීවන පදාසයක් පිළිබඳව සිදු කළා වූ ලිවීමක් වේ. එවැනි පසුබිමක සිටිමින් අනුරසිරි පවසන්නේ තමන්ට ඒ වෙනුවෙන් සම්මානයක් ලබා දීම සිදු කොට ඇත්තේ අවංක සිතින් නම්, එමගින් තීරු ලිපි සාහිත්‍යයේ නව නිර්ණායකයක් වෙතට දොරටු විවර වන බවයි. ඉදින් එය එසේ නොවන්නේ නම්, තමාට එවැනි අතරමග සම්මානයක් ලබා දීම ගැන කනගාටු වන බවයි.

> කෙටි කතාවට අදාළ සම්මානය සම්බන්ධයෙන් ද පටලැවිල්ලක් හට ගත්තේ යැයි ඊට ගොදුරු වූ අනුරසිරි හෙට්ටිගේ පවසයි. ඒ අනුව මුලදී නිර්දේශ වී තිබුණේ අනුරසිරි හෙට්ටිගේ ලියූ "මැරයින් ඩ්‍රයිව්" නම් කෘතිය වුණත් පසුව එය එරික් ඉලියප්ආරච්චිගේ "විශ්‍රාමික පෙම්වතිය" ට ලබාදීමට කටයුතු කොට ඇතැයි පැවසේ

උක්ත පටලැවිලි තුළින් ඉස්මතුවන්නේ මෙම සම්මාන උත්සවයේ දී අදාළ විෂය කරණු පිළිබඳව විද්වත් මට්ටමින් සැලකිලිමත් වීමක් නැති බව ද? එසේ නැත්නම් ඒ විෂය කාරණා පසෙක තබා පුද්ගල බලධාරීත්වයන් මත කටයුතු කිරීම නිසා ඒවා එසේ සිදු වූ බව ද? එවැනි කුකුසක් හමුවේ මෙවැනි විශ්ව විද්‍යාලයිය සම්මාන උත්සවයක් නිසි විමර්ශනයකට ලක් කිරීම ද ගැටලුකාරීය.

කෙටි කතාවට අදාළ සම්මානය සම්බන්ධයෙන් ද පටලැවිල්ලක් හට ගත්තේ යැයි ඊට ගොදුරු වූ අනුරසිරි හෙට්ටිගේ පවසයි. ඒ අනුව මුලදී නිර්දේශ වී තිබුණේ අනුරසිරි හෙට්ටිගේ ලියූ "මැරයින් ඩ්‍රයිව්" නම් කෘතිය වුණත් පසුව එය එරික් ඉලියප්ආරච්චිගේ "විශ්‍රාමික පෙම්වතිය" ට ලබා දීමට කටයුතු කොට ඇතැයි පැවසේ. කෙසේ වෙතත් කෙටි කතා 15 කින් සමන්විත විශ්‍රාමික පෙම්වතිය අවධානයට ලක් විය යුතු කතා කිහිපයක්ම අන්තර්ගත කෙටි කතා සංග්‍රහයක්ය යන්න අපේ අදහසයි. විශේෂයෙන්ම මෙරට සමාජ ඉතිහාසයට අදාළ නිර්මාණාත්මක ප්‍රකාශයන් බඳු සිළිඳුගේ දියණිය, කමලනාත් නම් වහලා, නාට්‍ය අනුවර්තනය යන කෙටි කතා ද අපූර්ව මානව සම්බන්ධතා නිරූපණ ලෙසින් ගත හැකි අවාරිස්ගේ යතුරු පැදිය, විශ්‍රාමික පෙම්වතිය නම් කතා පිළිබඳව අවධානයක් යොමු වී නම් එය අසාධාරණ නොවේ. නමුත් ප්‍රශ්නකාරී තත්වය වන්නේ විනිශ්චයක් සිදු කිරීමෙන් අනතුරුව ය. ඒ නිසා එය ද විනිශ්චය සම්බන්ධ අර්බුදයකට වඩා සංවිධායකයන් ඇති කරන්නට යෙදුණ ගැටලුවක් යැයි සිතෙයි. විශේෂයෙන්ම අන්තර්ජාලයේ ප්‍රකාශිත වාර්තා පවා මකා දමන්නට කටයුතු කිරීම තුළ එය එසේ යැයි සිතන්නට ඇති ඉඩ අවකාශ වැඩි වේ. එමෙන්ම එසේ අහිමි වූ සම්මානය වෙනුවෙන් සැනසිලි ත්‍යාගයක් විදිහට තීරු ලිපි සඳහා සම්මාන දෙකක් ඇති කොට ඉන් එකක් අනුරසිරි හෙට්ටිගේට ලබා දීමට කටයුතු කළේදැයි සැකයක් ද ඒත් සමගම ඇති වේ. ඇත්ත වශයෙන්ම සිදු වී ඇත්තේ එවැන්නක් නම් එය බරපතළ කරුණක් වේ. එනිසා අදාළ සංවිධායක කමිටුව මෙහිලා කළ යුතු සුදුසුම කාරණය වන්නේ ඒ සම්බන්ධයෙන් නිසි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමයි.

ඊට සමානම උදාහරණයක් අජිත් තිලකසේනගේ "මොන තරම් අවුලක් ද" යන කෘතියට ලැබුණ සම්මානය සම්බන්ධයෙන් ද මතු වී තිබේ. අජිත් තිලකසේන වැනි කාර්යභාරයක් සහිත නිර්මාණකරුවකු එසේ සම්මානයෙන් පිදුම් ලැබීම විවේචනයට ලක් විය යුත්තක් නොවේ. ඒ සම්බන්ධයෙන් අමනාපයක් ඇති කර ගැනීම ද අහව්‍ය තත්වයක්ම ය.

නමුත් ප්‍රශ්නය නිර්මාණය වන්නේ අදාළ සම්මානය වෙනුවෙන් කැඳවීම් ලබන අනුරාධා නිල්මිණි අවසාන මොහොත දක්වාම එය නොදැන සිටීම තුළ ය.

ඇයව එතැනට කැඳවීම හා පැමිණෙන බව තහවුරු කරගැනීම මතු නොව ඔවුන්ගේ නිල ප්‍රකාශන හරහා ඇගේ සම්මානය තහවුරු කොට තිබීම යන මේ සියල්ල පසෙක තබා අවසානයේදී ඇයව හිස් අතින් ගෙදර යැවීමෙන් අදාළ සංවිධායකයන් ඇගේ මානව හිමිකම් කඩ කිරීමක් හා සමාන තත්ත්වයක්ම සිදු කොට ඇත්තේ යැයි සිතන්නට බැරිකමක් නැත. එනිසාම තමන්ට සම්මානය නිර්දේශ වුණේ කුමන පදනමකින් ද යන්න සම්බන්ධයෙන් මෙන්ම තමාට එය නොලැබුණේ කුමන හේතුවක් නිසා ද යන්න සම්බන්ධයෙන් ද ඇය දැනුවත් කිරීමේ වගකීමක් සංවිධායක කිමිටුවට ඇතැයි සිතමි.

ඒ අනුව මෙතැනදී පැහැදිලිව සැකයට පාත්‍රවන කරුණක් තිබේ. එනම් සම්මාන විනිශ්චය හා සංවිධායකයන් අතර ගැටුමක් තිබුණේද යන්නයි. ඉදින් එසේ වී නම් ඒ වෙනුවෙන් ආත්ම ගරුත්වයක් ඇති නිර්මාණවේදීන්ට සම්මානනීය අවමානයෙන් එසේ සැලකීම ලැජ්ජාවට කරුණක් වේ.

සම්මාන ලබා දීම වෙනුවෙන් සංවිධානය වන කමිටුවක් සම්මාන දීම හෝ නොදීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නේ නම් එහි වගකීම ද ඔවුන්ට හිමි වේ.

කෙසේ වෙතත් එය තමන්ටම ලැබිය යුතුය යන පදනමින් සම්මාන ලැබීම නොලැබීම වෙනුවෙන් විවේචනය කිරීමේ හෝ අවලාද නැගීමේ අයිතියක් ලේඛකයන්ට ද තිබිය නොහැකිය. මන්ද ඒ වෙනුවෙන් සැදී පැහැදී කටයුතු කිරීම සැබෑ ලේඛකත්වය නොවන හෙයිනි. නමුත් ඊට අදාළව වුව විද්‍යෝදය සම්මාන උත්සවයේ මෙවර හැසිරීම තුළ අප දකින්නේ වෙනස්ම ආකාරයේ ගැටලුවකි. එය අභ්‍යන්තර ගැටලුවක් යැයි සිතීමට කරුණු තිබේ. ඉදින් එය එසේ නොවේ නම් මේ ගැටුම මානව හිමිකම් කොමිසම දක්වා යන තත්ත්වයක් ඇති නොවීමට ද ඉඩ තිබුණි.

දීපානි

තුරු විපත්

ගත පණ සිඳුණු දා ඇති වුණ පිපාසෙට
නැවතී ගිමන් හළ මහ බුරුතයේ යට
යන එන කවුරු කවුරුත් රෑ දවාලට
මතකය උන්නු සැටි දවසේ බොහෝවිට..

හිස රැඳි පත් තිබුණි එහි තැන තැන විසිර
අත පය කැබළි කළ සලකුණු විය පැතිර
විස නැහැයට දැනුණි කියතක දැති අතර
ඇසුනේ ලැගුම්ගත් සියොතුන හඬ විතර..

බේරී මිදෙන්නට ගන දැඩි හිරුගෙ රැසින්
ආගිය කතා දෙඩුවෙමු හදපිරුණු තොසින්
සිහිපත් කළ යුතුය කඳුළක් නැගුණ ඇසින්
විමසා බලන විට මිතුරා මොරටු ගොසින්

දඹේගොඩ ජිනදාස

දිවමන් දසුන

දම්සක් සුතුරු සර මුසු සැන්දෑ පවන
මූලගන්ධකුටි මහ වෙහෙරින් පැමිණ
සම්බුදු මහිමි දෙසු මුල් බණ පද වරුණ
පිළිරැවූ නඟත දම්පල් මාහිමි එතැන

සාදු නාද පිරිතිර ගුවනත පැතිර
සාරානාතය ම හොබවන කල නිතොර
පූජා වන සහසක් මල් රොන් පතර
පීරා එන සුවඳ මැද සමිඳු ය පවර

සපු නා නුග ඇසතු සල් ඇ තුරු පිරිස
සුළඟේ මතුර මතුරා පවසන රහස
අහසේ නැගී අට දෙස පැතිරෙත නොලස
දිගතේ දකිමි දම්පල් බුදු පුත් සිරස

මුල්ගඳකුටි වෙහෙරැ සිවු මුදුන් කුලුවල
නැංවෙන කේතුමාලා ප්‍රභා රැ කල
නිමවනු පිණිස මේ බුදු මැඳුර නිකසළ
හිමි බට දුකඳුරට පුද පහන් වනු බල

ගයා හිස පිපී ගිය කුසුම් රස පිස
හමා එන නලින් අතු අත් නො වී ලස
ලෙළේ සඳකැනේ වුව දකිමි සොම්නස
දැනේ ප්‍රීති සිත සමිඳුගෙ දසනු දෙස

නන්දන වීරසිංහ
(දම්පල් හිමි අනුස්මරණය නිමිත්තෙනි)

මම කියවමි

මම කියවමි
නුඹේ හිතම
දිවා රෑ ගැන
කිසිත් නොතකා...

කියවා ගන්නට
අපහසු තැනකදි
නුඹ තනි කරන්ටත්
සිත් නොම වීලා...

කොහෙන්වත් මට
නොම ලැබුණේය
පියාපත් ඔය සිත
අත්හැර පියඹන්ටා...

ඒත්...

නුඹේ සිතේ
මට රැකවල්
ඇතිද බැව්
තාම නුඹ නොකියූ
රහසක් වෙලා...

ශාමිනී නටාෂා

හිත මිතුරේ

"දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ"
නියත ලෙසට සැසැඳෙයි කා බුන් පසුද
ඇසෙත අහය සුන්දර නම හා සබඳ

වතුරේ ගම - අහය සුන්දර දෙ දෙන එදා
සසරේ බැම්ම පෙන්නා කවි කැකුළු විදා
පැතිරේ ඔවුන්ගේ නම් දකුණු දෙස සදා
මිතුරේ ඔබට ගුරුකම් දෙනු ඇත හැම දා

ඉරු ඉළු අනුස්වාරය හෙළ බසේ නැති
දොඩමලු හෙළ මුවට නුහුරුයි සිතා ඇති
තැබූ වලු පසෙක සකු බස ඇතැමෙක් පෙරැති
දොරගුළු කළේ විමලුයි පබඳින් රසැති

විදුලකරේ සරසවියෙදි බැඳුණු සෙනේ
අප අතරේ වැඩුණා දලු ලමින් අනේ
ගිය අතරේ අප හැර දා නො පැතු දිනේ
හිත මිතුරේ මා හද තැවෙයි වියොවිනේ

පණ්ඩිත උපාධිය ඔබ අප ලියා සමත්
දැන් අත අත යැවෙන මෙවලමකි සිඳි අරුත්
ඉන් හිත රිදෙන මුත් කළ හැකි දෙයක් නැතත්
වින් දිත යන් නො වෙමු අප නොවැ බස අත පත්

පැළපත නිසා මවු ගස එළිය වන වගක්
ඇත අප අසා සැනසෙත හැකි පියෙකි ඔබත්
ලැබ ඇතිමෙසා බුහුමන් කරමින් සිහිපත්
සැවැ තව්තිසා වෙන් ඔබ මෙහි එන්න යළිත්

පණ්ඩිත අශෝක කරුණාරත්න

(දිවංගත පණ්ඩිත විමල් අභයසුන්දර කවියාගේ අනූ නව වැනි ජන්ම සමරුව නිමිත්තෙනි)

කවි සිළුමිණ

සැකසුම්කාරක - ශ්‍රීනාත්තා කුමාරසිංහ

විදෙස් කවිය

සුපර්මාර්කට් ලෝකය

විශ්වය අද සූපිරි වෙළෙඳ සැලකි
සාරය අහිමි දීමනා සමඟින්
බලාපොරොත්තු
භාණ්ඩ ලෙස අලෙවි කෙරෙන
එනමුත්
ගණනින් ඉහළ යන රාක්ක මතින්
ආදරය තුරන්වන.....

රිචර්ඩ් ක්නෙක්ට් ස්විස්

වසර ගණනාවක සිට ඔහු අන්තර්ජාලයෙන් ඇත්ව ඊමේල් නොමැතිව, ඉලෙක්ට්‍රොනික් භාවිතා නොකරන, යතුරු ලියනයෙන් කවි ලියන රිචර්ඩ් ක්නෙක්ට් ස්විස් මේ යුගයේ කවියෙකි. මේ ඔහු විසින් ජර්මන් බසින් ලියූ ස්විස් කවියකි.

පරිවර්තනය.
සුනේත්‍රා ඇතුගල්පුර

ගසකට හිතෙනවා

හිමිදිරි පාන්දර ජාමේ නැගිටගෙන
බට අඹ ගස වටේ රවුමට ඇවිදගෙන
උඩ බලා අතුපතරත් විමිසමින
ගස බය කරන්නට වාගේ බැණ වදින

අල්ලපු ඉඩම් වල අඹ ගස් පුරවාලා
හරි ලස්සනට හැම ගහකම මල් පිපිලා
බට ගස් නිසා යුතුකම් අමතක කරලා
ඒ හින්දාද කල් මරමින් ඉන්නෙ බලා

මිනිසුන් සතා සිවුපාවුන් හැම අයම
හිතා ඉන්නෙ කවදත් එහෙම තමයි
ඔවුන් හැමට අප සතු පරම යුතුකම්
කල් යල් බලා මල් පල බර දරන එකයි

ගහකොළ කියන්නෙත් ජීවින් කොටසක්මයි
අපටත් උරුම ඇවතුම් පැවතුම් බොහොමයි
අලුතින් සිතන්නට අප කවුරුත් කැමතියි

සරත් කෝදාගොඩ

කඳුළ

හද ගැබෙන් මෝරන
දලුලමින් දින දින වැඩෙන
ළෙන්ගතුව ආදරය
පිදුවේ නුඹට මම...

නේකවිද අංගනාවන්
සිත්ලමින් නුඹ සිත
සිනහ වඩවයි
මසිත උපදින...

මධුමති බද්දේවිතාන
විමුක්තිය ද?
පිනි වැටෙන මහ රැක
දුරුකතර ගෙවාගෙන
මම ආවේ සිහිනෙක
විමුක්තිය සොයා ගෙන...

සුවඳ මල් මකරන් ද
මලට මල වෙන වෙනම
සිපගත් මා ද මේ
විමුක්තිය සොයන්නේ...

කන්දෙන් කන්ද, ලන්දෙන් ලන්ද
තැනිතලා හෙල් මතින්
ගල් බොරලු කටුකොහොල්
විමුක්තිය සොයා යන...

කිසිවෙකුගේ පය නොගැටුණු
මිහිකතගේ ගීරාව පමණක් ම
සන්සුන් මොහොතක දැහැන
විමුක්තිය ද මේ මා සොයන...

මේදනී මැණික්කුඹුර

සඳ රෑ මල්

වැට කඩොලු බැදන්
කුමුදිනිය ලෙසින්
රෑ තුන්යම පෙති
විදහන යන්තම්
එළි වෙන පැයකින්
හැන්ගෙන රෑ මල්
නෑ දකින්නෙ
ඉර අවරට යනකම්
හිත කිළිටි කරන්
දිව එන බබරැන්
රෑ කුමුදු කොදින්
සැනසෙන්නට නම්
උන් උගත යුතුයි
සැඩ හිරු රස්නෙන්
වෙන් කර හඳුනන්නට
සඳ කැල්මන්....

සියුමැලි තටුවෙන්
පිරිමදින ලෙසින්
විස කටු පහරක
වේදනා දෙමින්
මත් උනු බැල්මක්
ඇස් අග රන්දන්
උන් ඒවි වරින් වර
මැදියමටත්....

අනේ ඉතින්
විස බඹර තුඩින්
හැකිලෙන්නට වී නම්
මුදු කුමුදු කොදත්
පෙම් සුසුම් පොදක්
සිප ඇහැරනකම්
ඇස් අරිනු එපා
තුන්යමකටවත්...

අවිනි නිසංසලා

දයාබර දඬුවම

මම කිසි දිනකවත් නොදුටු
ළයෙහි තබා
හිස සතපවා
නොමැති...

පෙකෙණි වැලෙන්
වෙන් කෙරුවේ
සසර යළිදු
සැරි සරන්නට
නොදී...

කඳුළු අතහැර
යනෙන මඟතොට
සොයන
ඇ රුව
ගුණ... සුවඳ
දයාබර දඬුවමකි

නන්දන පලුකන්දෑව

මල්...

පිපුණු මල්
හැලෙන මල්
සියල්ලම
එක ඉත්තෙ

කේ.ඩබ්ලිව්. සිරිසේන

සමාවෙනු මැන

ගෙදර එන්නට ඉසිඹු නැති බව
කියමි මුලදීම හද සොවින්
සල්ලි එවනවා බේත් ගන්නට
තාත්තේ නුවරට ගිහින්...

ගිනියමේ පස පෙරළුවා නුඹ
එතෙර කරනට අප දුකෙන්
ලෙඩට මුල වෙහෙසීම දිගටම
අහර නැතිවුණ හිස් කුසින්....

ගම්දොරේ පැතිරෙන කතා හැම
බොරුම බව පවසමි සොවින්
මෙතැන සුව අරණකි නම් ලද
බොහෝ අය සුවවෙයි සැණින්...

රැය දිවා නිසි වෙනස නොමදැන
වැඩකරමි සන්සුන් සිතින්
ඉඩ ලැබුණු විට ගෙදර එන්නම්
සමාවෙනු මැන මට ඉතින්...

රඹුක්කන රුවන් සුදස්සන

නොනිමෙන අලුත් ඇඳුම්

ගිනි දහවල මැදත්
රෑ තුන් යාමෙදිත්
මා දරාගත් වෙහෙස
එක පයින් කාසි කොට
නිවාලන්නෙ ද
ඔබෙන් ලැබූ අතෘප්තිය....

එකවර ම ඔබේ සැනසුම
පැමිණේ ද මා අසල
නොනිමවෙන "අලුත්"
ගත පැලඳි නමුදු'ගෙන
ඔබ තවත් දේ කියනු
ඇත නිසැක...

නාස්තිය කුමට මට
බැර කරන් නුඹෙ වදන්

බිනූ දිලාරා ගමගේ

කුරවි කිරිල්ලියේ

කුරවි කිරිල්ලිය
තටු නොගසා ම නික්ම ගිය
සැඬසුළං දහරට
ස්ව කැමැත්තෙන් ම එක්වුණ...

පන්ති කාමර
ඉබියතුරු කඩා දා දිවගිය
අඩිපාර දිගට ම
වැටුණු කඳුළුයි බොහොම
ගුරු ඇසේ විමසුමට
නොහසුව
හොරෙන් මල්සර හා දොඩමලුව
ඒ මල් සිහින
ඇස් ඉදිරිපිට දී ම පිපුරුණ
සුදුගවුම් රැලි බිඳී
මංජරියේ මල් විසිරී
නපුරු උල් කටු ඇනී
කිම වුණේ බාල බොළඳී....
සිප් හලේ දොරකඩ
තාමත් නුඹේ උණුහුම
තැනින් තැන තාමත්
නුඹ ගැන ම දොඩවන
කියන් දියණි නුඹ
සුළං දොරකඩ
හෙළ උඩක
කැදැල්ලක් සැදුවේ කිම.....?

කිත්සිරි කොතලාවල

මුතුණු පොතෙන් කවියක්

විශාඛාව වෙමි

දරාගෙන දුක් සුසුම් කඩතොළු
බලාගෙන හිඳ විලස අරුණලු
විසිරිලා කාලයේ දිගු බැම්මේ
හදකි වියපත්, දැමුණු සිත් ඇති
සමිඳ, ඇවිදිමි සසර තෝතැන්නේ.....

වාන් දමනා සොරොව් ඇස් ඇති
ගෙයක් ගානේ අබ සොයා නොයමි
දෝර ගලමින් වහිනවිට දුක්
විශාඛාවක වෙමින් දුක නිවමි....

පසක් වූ දා සැපෙහි අනියත
සක්සුදක් සේ මටද මා අහිමි
දුක ද සරසන සිතක රජයන
සමිඳු වදහළ බණ පදක නිවෙමි.....

තුෂාරි බොඹුවල

වැසුණු දොරටු

උස් ප්‍රාකාරයෙන් ඔබ
මට වැසුණු දොරටුවැති
බිම් කඩෙකි.
ඇතැයි එහි පාරාදීසයක්
ඇතැමෙක් පවසති.
දිය කඳුරු, මල් ගොමු
තුරු ලතා පිරි උයන තැන තැන
අතින් අතගා බැලියැකි
කිරි ගරුඬ පිළිරු
ඇතිලු එහි
ගොස් පැමිණියෙක් පවසති.

නැතැයි ඔය තරමට සොඳුරු මනරම්
කටු කොහොල් රළු පරළු මුඩු බිමක්
නෙක් සපුන් මුරුගයන් ගැවසෙන තැනක්
කියා පවසයි ගොස් පැමිණි තව අයෙක්
බලා එන්නට ඇත්නම්
මගෙම දැසින් එකම එක් වරක් ---?

වැසුණු දොරටුව අබියස
තැවෙමි ළතැවෙමි මම
"රළු පරළු මුඩු බිම
වන වඳුලු පිරි තැනි බිම
දකින දැසට අනුව ය.
ඇවිද යන දුර අනුව ය. "
ප්‍රාකාර බැම්මෙහි හිඳ
නටව නටවා පෙඳ
මට ඇසෙන්නට ගී ගයන්නී
පැණි කිරිල්ලිය ඇ.

පද්මිණී ශ්‍රියාලතා

සතියේ කවි පෙතක්

ග්‍රන්ථය - කෝමළනි කාව්‍ය සංග්‍රහය
කර්තෘ - ලාල් හැගොඩ
විදර්ශන ප්‍රකාශනයකි

ඩිජිටල් කැමරා තාක්ෂණය මෙරට ප්‍රචලිත නොවූ යුගයක, එනම් මෙයින් වසර විස්සකට පමණ පෙර ඡායාරූප කලාව හැදෑරීම සඳහා එක්තරා පන්තියකට ගියෙමි. පන්තිය තිබුණේ බම්බලපිටියේ ය. විවිධ වයස් සීමාවල, විවිධ ප්‍රදේශ වලින් පැමිණි කාන්තා පිරිමි දෙපාර්ශ්වයේම අය මෙහි ඉගෙනුම ලැබූහ. එය අරුම පුදුම පන්තියකි.

කැමරා තාක්ෂණය, නිර්මාණශීලි ඡායාරූප කලාව පමණක් නොව එහි කාව්‍ය කරණයද ඉගැන්වුයේය. එක් අතකින් කවි ඉගැන්වීම කළා යැයි කීම වැරදිය. හරියටම කිව්වොත් එහිදි සිදු වුයේ කාව්‍ය රසවින්දනයයි.

ඡායාරූප කලාව ඉගෙන ගැනීමට පැමිණි අප අතර සිටි බොහෝ දෙනා ඡායාරූ කලාවට පමණක් නොව කවි රසවින්දයට ද ආශා කළෙමු. එකම පන්තියේ මේ දෙකම කළේ එක් අයෙකි. ඔහු නම් ප්‍රකට ඡායාරූප ශිල්පියෙකු මෙන්ම කවියකු ලේඛකයකු වන ලාල් හැගොඩයන්ය. මා මිනිසෙක් ඔබ ගඟක් නිසා (1994), පසළොස්වක සඳ මගේය (1995) , සඳුන් අරටුව දැල්වූයේ ඔබයි (1998) ගඟ වක්වී ගලන තැන(1998) මෙ' කවි මෙතැනින් නවතිමි (2010), ලෝකය එකම යායක් (2013) ආදි වූ කවි පොත් රැසක් රචනා කළ හැගෝඩයන්ගේ ඇතැම් කාව්‍ය සංග්‍රහ සඳහා රාජ්‍ය සම්මානද හිමි වී ඇත.

ලාල් හැගොඩ

පසු කාලීනව කවි පොත් කිරීම අත්හැර දැමූ ඔහු තමන්ට ලියැවෙන කවි අනෙක් අය හා බෙදා ගෙන රස විඳීම සඳහා තම මිත්‍රයන්ට තැපැල් කර හැරියේය. පසු කාලීනව අන්තර්ජාලයට කවි ලියූ ඔහු පසුකාලීන මඳක් නිහඬව සිටියා යැයි කීවොත් නිවැරදිය. යළිත් ඒ නිහඬ බව බිඳිමින් ඔහු විසින් අන්තර්ජාලයට මුදා හැරිය කාව්‍ය සංග්‍රහය වන්නේ කෝමළනි ය.

කෝමළනි කාව්‍ය සංග්‍රහය ඉකුත්දා විදර්ශන ප්‍රකාශකයන් විසින් පොතක් ලෙසින් ප්‍රකාශයට පත් කළේය.

විවිධ මාතෘකා ඔස්සේ ඔහු කවි ලියයි. ඔහුගේ බොහෝ කවි අතර ඇත්තේ ගහ කොළ පරිසරය සමඟ බැඳුණු නිර්මාණය.

මේ සියල්ලම එක් මොහොතකින් වෙනස් වේ. එය බුදු දහමේ ද ඉගැන්නේ. මොහොතින් මොහොත සියල්ල වෙනස් වේ. මිනිස් සිතුවිලි ද මොහොතින් වෙනස් වේ. එනිසා මේ මොහොතේ දකින කෙනා ඊළඟ මොහොතේදී දැකිය නොහැකිය. ඔහු වෙනස් වී ඇත. කවියා මේ කියන්නට උත්සාහ දරන්නේද එයම වේ යැයි සිතේ. මාතෘකාව "පැවැතීම" (එකම ගඟකින් දෙවරක් ස්නානය කළ නොහැකිය)

"එන්න මිතුරනි,
බරසාර හිස් වැසුම් ගලවා
බලන්න මිතුරනි
මින් රැළ සැනසෙන මා හා...

වරකැයි දෙවරකැයි නොසලකා
කිමිදෙනා මින්
කිතියක් ද ගෙනයි මට...

ඉඳහිට ඉහළට පනින උන්
වැටෙයි මා ඇකයට නැවතත්
වැටුණේ පහළට
පැන්න එකාමඳැයි ඉහළට
ඇසුවේ නැත කවුරුන්....

දෙවරක් සැනසිය නොහැකි බස්
පවසන්නේ ඔබයි
දෙවරක් පැවතිය නොහැකි ඔබයි..

මිතුර දයාබර
නොව දෙවරක්
වරක්වත් ස්නානය කර
ඉවුරට ගොඩ විය නොහැක ඔබට...

එක්කෝ ඇය පරණ පෙම්වතියක් වන්නට ඇත. එහෙමත් නැත්නම් ඇයත් ඔහුත් අතර යම් බැඳීමක් තිබෙන්නට ඇත. යෞවන වියේ තිබූ බැඳීමක් යළි යළිත් සිහි ගන්වමින් ඔහුට ඇය හමුවෙයි. ඒ නුවරදීය පදික වේදිකාවේ ලොතරැයි විකුණන්නියක් ලෙසිනි. ඔහු සමඟ බිරිඳ ද සිටි. නමුදු සන්ධ්‍යා ඔහු හඳුනා ගත්තද ඔහු දෙස බලා වැරදීමක් වූ බව කියයි. නමුදු සුපුරුදු ලෙස ඔසරිය හැඳ සිටින සන්ධ්‍යා වියපත්ය. ඔහුට බොහෝ දේ සිතෙයි ඇ ගැන. ඒ සියල්ල අතීතයක් පමණක් කරමින් ඔහු සැනසේ; එහෙත් අතීතයක් සමඟ හිතට සැනසිල්ලක් නැත. මාතෘකාව සන්ධ්‍යා

"මතක නැද්ද , මම සන්ධ්‍යා"

බිරිඳ ද එතැනට ළඟාවෙන බව හැඟේ විසිර තිබූ මතක බිඳු එක්වී ඒ රූව සෑදිණි.

"මේ ඒ සන්ධ්‍යා ද?"

රැසිරු නටබුන් අතරේ නිරුත්තර වීමි. හරි හරියට ම කිලුටු වී , තැනින් තැන දිය වී ඇතත්, තවමත් ඔසරියමයි අදින්නේ. සන්ධ්‍යා නේද මේ?.

එකල සන්ධ්‍යා ලොතරැයියක් වීය අප සැමට."

"සන්ධ්‍යා"ටත් වඩා "මාන්නක්කාරි" බොහෝ දිගුය. එහෙත් ඔහු ලියයි. සිතේ ඇති දේ වචන වලට පෙරළයි

මේ කවි ඇතැම් විට කතා වැනිය. විවිධ ආකෘති අත්හදා බැලීම මේ කවියාගේ පුරුද්දය. කෙටි කවි මෙන්ම දිගු කවි ඇති කෝමළනි පාඨකයාට අලුත් අත්දැකීමක් වනු ඇත.

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.
සිළුමිණ, කවි පිටුව,
ලේක්හවුස්, කොළඹ 10.
edmediaunit@gmail.com

වැසුණ සිනමාහල් අරින්නට හොඳ චිත්‍රපට අවශ්‍යව තිබේ!

කොවිඩ් වසංගතයත් සමඟ මෙම වසරේ මාර්තු 13 වෙනිදා සිට වසා දමනු ලැබූ ශ්‍රී ලංකාවේ සියලු සිනමා හල් යළි විවෘත කරනු ලැබුවේ මාස 04 කට පසුවය. නමුත් සිනමාහල් කරා ප්‍රේක්ෂකයන් තවමත් ආකර්ෂණය වෙමින් සිටින්නේ ඉතා මන්දගාමී ස්වභාවයකින් බව පෙනෙන්නට ඇති දෙයකි.

සෙලවෙමින් තිබූ වරිච්චි බිත්තියකට අලියෙකු හේත්තු වුණා සේ කොරෝනා පැමිණීම හේතු කොටගෙන එතෙක් ආවාට ගියාට පවත්වාගෙන ගිය සිනමා ශාලා සදහටම බිම ඇදවැටී ගිය බවක් මේ වන විට දකින්නට ලැබේ.

අප විසින් කළ සොයා බැලීමකදී පෙනී ගියේ ගම්පහ නගරයේ සුප්‍රකට සිනමා ශාලාවක් වූ "පබ්ලික් හෝල්" මෙන්ම ඊට බොහෝ කලෙකට පසු ආරම්භ කරන ලද " නයෝමි" සහ "මේකලා'' යන සිනමා ශාලාද වසා දමා ඇති බවය. ගම්පහ නගරයේ තිබූ පබ්ලික් හෝල් තරම්ම පැරණි සිනමා හලක් වූ "ජයන්තා" සිනමා හල වැසී ගියේ ඊටද කාලයකට පෙරය. දැන් එතන ඇත්තේ දැවැන්ත සුපිරි වෙළඳ සැලකි.

මීගමුව නගරයේ පිහිටා තිබූ සිලෝන් තියටර්ස් සමාගමට අයත් "රීගල්" සිනමා ශාලාව මෙන්ම "කිංග්ස්" සහ "මීපුර" ද අද දක්නට නැත. "රාජ්" සිනමා හල ගිනි තබා විනාශ කරනු ලැබුවේ 83 දී එළියට ආ ඊනියා ජාතිවාදීන් විසිනි.

මිනුවන්ගොඩ සිට දිවුලපිටිය දක්වා මාර්ගයේ පිහිටි ඉතා පැරණි සිනමා හලක් මෙන්ම ඒ මාර්ගයේම දිවුලපිටිය හන්දිය ආසන්නයේ පසු කලෙක ඉදි කරනු ලැබූ "හෙළදිව" සිනමා හලද අද දක්නට නැත. මීගමුව හලාවත මාර්ගයේ කොච්චිකඩේ හන්දියට මෙහායින් තිබූ "එලයිට්"ද අද වල් බිහි වූ ගොඩනැගිල්ලක් පමණි.

මේ කතාව බොහෝ දිග එකකි.

මෙම සිනමා හල් වලින් සමහරක් වැසී ගියේ කොරෝනා පැමිණීමට බොහෝ කලෙකට පෙරය. නමුත් එනිසාම ලෙඩේ ඇත්තේ කොරෝනා වෛරසය තුළ පමණක්ම නොවන බව තේරුම් ගැනීමට ද මෙය අවස්ථාවක් කර ගත යුතුය.

මේ පිළිබඳව අප සමඟ කතා කළ "ශ්‍රී ලංකා චිත්‍රපට ප්‍රදර්ශකයන්ගේ සංගමයේ සභාපති අනුරාධ බී. රැකව මහතා පවසන්නේ කොරෝනා නිසා වැසී ගිය චිත්‍රපට ශාලා පණස් ගණනින් 15 ක් වැනි ප්‍රමාණයක් හැරෙන්නට අනෙක්වා වැසී ඇත්තේ තාවකාලිකව බවය. මේ ගැන කතා බහේදී ඔහු පෙන්වා දුන් විශේෂ කරුණ වූයේ කොරෝනා නිසා ලොකුම අර්බුදයට මුහුණ පා ඇත්තේ ද්‍රවිඩ චිත්‍රපට පමණක් ප්‍රදර්ශනය කරන උතුරු නැනෙහිර දෙපළාතේ සිනමා ශාලා හිමියන් බවය. ඉන්දියානු සහ හොලිවුඩ් සිනමා නිර්මාණ මෙරටට ගෙන්වීම නැවතී ඇති හෙයින් එම සිනමා ශාලා තාවකාලිකව වසා දැමීම හැර වෙන විකල්පයක් නැතිවී තිබේ.

මෙම අර්බුදය අරබයා කටයුතු කළ කරන ආකාරය සහ එම තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පැන නැගී ඇති ගැටලු පිළිබඳව කතා කරන රැකව මහතා ගේ අදහස වී ඇත්තේ තම සංගමය විසින් කොතරම් ඉල්ලීම් කරනු ලැබූවත් බෙදා හැරීමේ මණ්ඩල හෝ චිත්‍රපට සංස්ථාව ඒ කිසිවක් සඳහා අනුග්‍රහ නොදැක්වූ බවය. "වසර 20ක් මුළුල්ලේ සියයට 10 ක කොමිස් මුදලකින් විශාල ලාභයක් ලැබූ බෙදා හැරීමේ මණ්ඩල පවා මේ අර්බුදකාරී තත්වයේදී සිනමා ශාලා අමතක කර දැමීම කනගාටුවට කරුණක්. නමුත් චිත්‍රපට ප්‍රදර්ශකයන්ගේ සංගමය දිගින් දිගටම රජයෙන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කළ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් පසුගිය ජූනි 27 වෙනිදා සිට සියයට 50 ක ධාරිතාවයකින් යුතුව සිනමා ශාලා පවත්වාගෙන යාමට අවසර ලබා ගැනීම අප සංගමය ලබා ගත් ජයග්‍රහණයක් ''

හෙතෙම පවසයි.

ඔහුගේ අදහස වන්නේ මේ පවතින පසුබෑම ගෝලීය අර්බුදයක ප්‍රතිඵලයක් ලෙස අප තේරුම් ගත යුතු බවයි. ඇමෙරිකාවේ ප්‍රාන්ත ගණනාවක සිනමා ශාලා විශාල ප්‍රමාණයක් දින නියමයකින් තොරව වැසී ඇති අතර නිව් ජර්සි ප්‍රාන්තයේ කුඩා සිනමාශාලා හිමියන් තමන්ගේ සිනමා ශාලා විවෘත කිරීමට අවසර දෙන ලෙස ඉල්ලමින් නඩු මගට බැසීමට පවා සූදානමින් සිටන බව රැකව මහතා කියයි. ඉන්දියාවේ බොලිවුඩ් මෙන්ම කොලිවුඩ් සිනමා කරුවන්ද එක හඬින් ඉල්ලා සිටින්නේ කවර නීති රීති යටතේ හෝ සිනමා ශාලා විවෘත කිරීමට අවසර දෙන ලෙසය. නමුත් මේ වන විට කොවිඩ් අවධානම අඩුවෙමින් පවතින ප්‍රංශය, චීනය, දකුණු කොරියාව, සහ ජර්මනිය යන රටවල් සිනමා හල් විවෘත කිරීමෙහි ලා ප්‍රගතියක් පෙන්වන බව දක්නට ලැබේ.

රැකව මහතාගේ අදහස වන්නේ සිනමාව ජනතාවට විවෘත කර එහි ප්‍රගමනය ගැන උනන්දු වෙනවා මිස සෘණාත්මකව ඒ ගැන කතා කිරීම හිතකර නොවන බවය.

කොවිඩ් වසංතය හමුවේ අප රටේ සිනමා ශාලා හිමියා මුහුණ දෙන චිත්‍රපට නැතිකම බව රැකව මහතා පෙන්වා දෙයි.

හොලිවුඩ්, බොලිවුඩ් සහ කොලිවුඩ් චිත්‍රපටකරුවන්ද තමන්ගේ නිර්මාණ මුදා හැරීම ලබන වසර තෙක් පමා කිරීමට තීරණය කර තිබේ.

නමුත් අප රට තුළ දේශීය සිනමාවක් පවතින බැවින් පවතින තත්ත්වයට සාපේක්ෂව අපට සතුටු විය හැකි බව අනුරාධ බී රැකව මහතාගේ අදහසයි.

ඒ නිසා මේ අවස්ථාවේ අප කළ යුතුව ඇත්තේ දේශීය සිනමා කර්මාන්තය නඟා සිටුවීමට මෙම තත්ත්වය පාදක කොට ගැනීම ය. ඒ සඳහා දේශීය චිත්‍රපට නිෂ්පාදකයින් දිරිමත් කොට, ඔවුනට ලබා දිය හැකි ප්‍රතිලාභ වැඩි දියුණු කර ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගන්නා චිත්‍රපට වැඩි වශයෙන් මුදා හැරීමට අවස්ථාව සලසා දිය යුතු ය.

මෙසේ පවසන ඔහු මේ සඳහා දිය හැකි හොඳම උදාහරණය වශයෙන් පෙන්වා දෙන්නේ මේ දිනවල තිරගත වන විසාකේස චන්ද්‍රසේකරම්ගේ "පාංශු" ය. පාංශු ඉතා හොඳ ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලබමින් තිරගත වන බව ඔහුගේ නිරීක්ෂණය වී තිබේ.

මේ සියල්ලටම අමතරව වසර 20 ක කාලයක් මුළුල්ලේ සිංහල සිනමාව විනාශ මුඛයට ඇද දැමූ අතර මැදි බෙදා හැරීමේ මණ්ඩලය අහෝසි කර දමා ප්‍රදර්ශකයා, නිෂ්පාදකයා සහ ප්‍රේක්ෂකයා පමණක් සම්බන්ධ වන ක්‍රමවේදයක් සැකසීම ද සිංහල සිනමාවේ ප්‍රගතියට මහත් රුකුලක් වන බවද ප්‍රදර්ශකයන්ගේ සංගමයේ සභාපතිවරයාගේ අදහස වී තිබේ.

සිනමාව ගැන නිරන්තර අවධානයකින් පසුවන්නකු වන මීපුර සිනමා සහෘද සංගමයේ සභාපතිවරයා වන සුදත් සේරසිංහ මහතා ද මෙහිදී අපට සම්බන්ධ කරගත හැකි විය.

ඔහුගේ අදහස වන්නේ සමහර සිනමා ශාලා පවත්වාගෙන යන පිළිවෙළ දකින විට ඒවා වැසී ගිය එක සිනමාවට සිදුවූ යහපතක් බවය. සිනමා සංස්කෘතියක් ගොඩනැගිය යුතු යයි කතා කරන යුගයක මිනිසකුට චිත්‍රපටයක් රස විඳීමට ආශාවක් ඇති කරන තත්ත්වයේ පරිසරයක් සහිත සිනමා ශාලා තිබිය යුතු බව ඔහුගේ අදහසයි. ඒ නිසා සිනමා කෘතිය කොතෙක් හොඳ නිර්මාණයක් වුවත් එය ජනතාවට සමීප නොවීමට මේ කාරණයද බලපා ඇති බව ඔහුගේ අදහස වී තිබේ.

සරල චිත්‍රපට

තිස්ස ප්‍රේමසිරි
tissa.siyana@gmail.com

ලෝකයේ හොඳම චිත්‍රපටය සාදන්නට පදනම සැපයූ "ස්ටේජ්කෝච්"

මෙම වසරේදී ලෝක සිනමාවට වසර 125 ක් සපිරෙයි. 1895 න් ඇරඹී එම සිනමා ඉතිහාසයට 1941 මැයි 01 දා ඉතා වටිනා මං සලකුණක් හිමි වූයේය.

ඒ ඔසන් වෙල්ස් නැමැති ප්‍රතිභා පූර්ණ සිනමාකරුවා විසින් නිර්මාණය කරන ලද "සිටිසන් කේන්" ය.

"සිටිසන් කේන්" තිරගතවී මේ මොහොත වන විට වසර 79 කි. ඒ අනුව දශක අටකට ආසන්න මේ කාලය මුළුල්ලේ මෙන්ම සමස්ත චිත්‍රපට ඉතිහාසය තුළද ලෝකයේ හොඳම චිත්‍රපටය ලෙස කිරුළ දරා සිටින්නේ "කේන් නැමැති පුරවැසියා" අරුතින් යුත් මෙම "සිටිසන් කෙන්"ය. ඇමෙරිකාවේ විසූ මහා ධන කුවේරයකු වන චාල්ස් ෆෝස්ටර් කේන් නැමැත්තකුගේ චරිතය ප්‍රධාන කොට ගනිමින් තනා ඇති ඇති මෙම චිත්‍රපටය සඳහා අතිශයින්ම නිර්මාණාත්මක සිනමා භාවිතාවක යෙදීමට අධ්‍යක්ෂවරයා ඇප කැප වී තිබේ. එය කොතෙක් සියුම්ව සිදු කෙරී ඇත්ද යත් මෙම සිනමා කෘතිය අරබයා වූ සිනමාත්මක සහ දෘෂ්ටිවාදී කියවීම් හැම එකක්ම පාහේ සිදුවී ඇත්තේ අංශුමාත්‍ර වශයෙනැයි පිළිගැනීමක් තිබේ. මක්නිසාද යත් යළි යළිත් නැරඹීම තුළ එය ජීවිතය හා ලෝකය අරබයා නව අරුත් සපයන්නක් බවට පත්ව ඇති හෙයිනි.

චිත්‍රපටයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය තිර රචනය , අධ්‍යක්ෂණය , කැමරාකරණය, සංස්කරණය, කලා අධ්‍යක්ෂණය, වේෂ නිරූපණය , සංගීතය මෙන්ම විශේෂ ප්‍රයෝග ආදී සෑම අංශයකින්ම මෙය පරිසමාප්තියට පත්ව තිබීම ඒ විශිෂ්ටත්වයට පදනම වී තිබේ.

රූපය මුල් කර ගත් සිනමාව නැමැති මාධ්‍යයට අදාළ මූලික වියරණය මනාව සුරකිමින් නිමවී ඇති "සිටිසන් කේන්"හි භාෂාව වී ඇත්තේ රූපයයි. දෙබස් උච්ඡාරණය . සංගීතය මෙන්ම වෙනත් හඬවල් ඉදිරිපත් කර ඇත්තේ රූපමය භාෂාවට උදව්වක් වශයෙන් පමණි. මේ හේතුකොටගෙන "සිටිසන් කෙන්" අද වන විට චිත්‍රපට කරුවන්ගේ අත් පොතක් බවට පත්ව තිබේ.

මෙය තුළ චාර්ල්ස් ෆෝස්ටර් කේන් නැමැති ධනපතියාගේ ආධ්‍යාත්මික බේදවාචකය තරමටම ඔහුගේ දේශපාලන සහ සමාජීය සම්බන්ධතාවන් පිළිබඳවද විවරණය කෙරෙන්නේ සිනමාත්මකව සහ දෘෂ්ටිවාදීව මෙය කියවන විචාරකයන් දෙපක්ෂයටම අභියෝගයක් එල්ල කරමිනි.

මෙම චිත්‍රපටය අධ්‍යක්ෂණය කළ ඔසන් වේල්ස් මීට පෙර චිත්‍රපට අධ්‍යක්ෂණයෙහි ලා අත් දැකීම් නැති අයෙකු වීම යන කාරණයද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. ඔහු ඊට පෙර ප්‍රකට නාට්‍ය නිෂ්පාදකයෙකි. එමෙන්ම ප්‍රවීණ වේදිකා නළුවෙකි. සුප්‍රකට බ්‍රෝඩ්වේ තියටර් වෙනුවෙන් මැක්බත්, ජූලියස් සීසර් වැනි නාට්‍ය ඔහු විසින් නිෂ්පාදනය කළේය. මේ හැර මර්කරි සමාගම වෙනුවෙන්ද ඔහු විශාල නාට්‍ය ප්‍රමාණයක් නිෂ්පාදනය කළේය. චිත්‍රපට අධ්‍යක්ෂණය සඳහා මූලික සුදුසුකමක් ලබා ගත්තා නම් ඒ මේ තුළින් ලැබූ පරිචයෙන් පමණි.

නමුත් මෙම විශිෂ්ට නිර්මාණය බිහි කරනු සඳහා ඔහු එක් වැදගත් අභ්‍යාසයක යෙදුණේය. එය නම් 1939 දී තිරගත කරනු ලැබූ "ස්ටේජ්කෝච්" නැමැති චිත්‍රපටය 40 වතාවක් නැරඹීමය. ජෝන් ෆෝඩ් නැමැති විශිෂ්ට චිත්‍රපටකරුවා විසින් නිර්මාණය කරන ලද මෙහි ප්‍රධාන චරිත නිරූපණය කරනු ලැබුවේ ක්ලෙයාර් ටෝරවර් සහ ජෝන් වේන් විසිනි.

1937 දී අර්නස්ට් හේකොක්ස් නැමැති සාහිත්‍ය කරුවා විසින් ලියන ලද "ද ස්ටේජ් ටු ලෝඩ්ස්බර්ග් "නම් කෙටි කතාවේ අනුවර්තනයක් ඇසුරින් මෙහි තිර රචනය කරන ලද්දේ ඩඩ්ලි නික්ලස් විසිනි.

මෙය ඇමෙරිකාවේ ඉතා භයානක ප්‍රදේශයක් වන "අපාචේ" හරහා අශ්ව කෝච්චියකින් ගමන් ගන්නා පිරිසක් මුහුණ දෙන විවිධාකාර ගැටලු පිළිබඳව විවරණය කෙරෙන්නකි. "ස්ටේජ්කෝච්" චිත්‍රපටය වෙනුවෙන් නිව්යෝර්ක් චිත්‍රපට විචාරක කවය විසින් හොඳම අධ්‍යක්වරයාට හිමි සම්මානය ජෝන් ෆෝඩ් හට පුද කරනු ලැබීය. ඒ හැරුණු කල ඒ වසරේ හොඳම චිත්‍රපටය, හොඳම අධ්‍යක්ෂණය, හොඳම කලා අධ්‍යක්ෂණය, හොඳම නළුවා, සහ හොඳම සංස්කරණය සඳහා මෙම චිත්‍රපටය ඇකඩමි සම්මාන සඳහාද නිර්දේශ වූයේය. එහිදී සංගීතය සහ හොඳම සහාය නළුවා සඳහා වූ ඇකඩමි සම්මානය දිනා ගැනීමට එයට හැකිවිය.

මේ ආකාරයට "සිටිසන් කේන්"සඳහා අත් පොතක් වූ "ස්ටේජ්කෝච්" පවා අබිබවමින් "සිටිසන් කේන්" ලෝක සිනමාවේ ඉහළම තැන වැජඹීම කලාවේ අපූරු ආශ්චර්යයක් නොවන්නේද?

සුගතපාල ද සිල්වා සහ තිස්ස අබේසේකර

පවත්පත් කලාවේදියෙකු ලෙස කටයුතු කිරීමේදී මෙන්ම නාට්‍ය ශාලාවන්හිදී ද සුගතපාලද සිල්වා නම් විශිෂ්ට කලාකරුවා සමඟ කතාබහ කර තිබුණද, ඔහුගෙන් අසන්නට සිතා සිටි, එහෙත් අසන්නට බැරි වූ ප්‍රශ්නයක් මා තුළ බොහෝ කාලයක් ඉතිරිව තිබණේය.

ඔහු නම් වේදිකා නාට්‍යකරුවෙකු, ගුවන් විදුලි නාට්‍ය නිෂ්පාදකයෙකු, පරිවර්තකයෙකු, කවියෙකු සහ නවකතා කරුවෙකු වශයෙන් හැකියාවන් රැසක් පෙන්වා සිටි මේ විශිෂ්ටයා චිත්‍රපට කරණයට නොපැමිණියේ මන්දැයි යන්නය.

එයට පිළිතුරක් ලැබුණේ බොහෝ කලෙකට පසුවය. එයද ප්‍රවීණ සිනමාවේදියෙකු වූ තිස්ස අබේසේකරගෙන් මිස සුගතපාල ද සිල්වාගෙන් නොවේ. ඒ ජෝන්ද සිල්වා සමරු රඟහලේ පැවති සුගතපාල ද සිල්වා උපහාර උළෙලකදීය. නාට්‍ය ශිල්පීන් ගණනාවකගේ එකතුවකිවකින් සංවිධානය කරන ලද මෙම උත්සවය පිළිබඳව මට දැනුම් දුන්නේ නාට්‍ය කරුවෙකු වූ ඊ.එම්.ඩී. උපාලිය.

එවකට අංශභාගයට ගොදුරුව ඇවිදීමට මෙන්ම හරි හැටි කතාකර ගැනීමටද නොහැකිව සිටි සුගතපාල ද සිල්වා වේදිකාව ඉදිරියට කැඳවා ගෙන එන ලද්දේ රෝද පුටුවකිනි.

තිස්ස අබේසේකර සිය කතාවට අවතීර්ණ වූයේ තරමක් පැරණි ග්‍රන්ථයක්ද තමා අසල තබා ගනිමිනි. ඔහුගේ කතාවෙන් කියවුණේ සුගතපාල ද සිල්වා සහ තමා ඇතුළු පිරිසක් ලෙස්ටර් පේම්ස් පීරිස්ද ඇතුළුව පටන් ගත් "අපේ කට්ටිය" පිළිබඳවය. මෙම පිරිසට ටෝනි රණසිංහ, ජී. ඩබ්ලිව්. සුරේන්ද්‍ර, ධර්මසිරි වික්‍රමරත්න, ප්‍රේමා ගණේගොඩ, නීතිඥ හේමන්ත වර්ණකුල ආදී පිරිසක්ද එයට සම්බන්ධ වූහ. මොවුන්ගේ මුල්ම අරමුණ වී තිබුණේ සිනමා කෘතියක් නිර්මාණය කිරීමය.

මේ ගමනේ එක් අවස්ථාවකදී තිස්ස අබේසේකර ඇතුළු පිරිසක් සිනමාවට ඇදී ගිය අතර සුගතපාල ද සිල්වා ඇතුළු පිරිසක් වේදිකා නාට්‍ය කලාව දෙසට අවතීර්ණ වූහ. තිස්ස අබේසේකරගේ අදහසට අනුව මෙම දෙකඩ වීම නිශ්චිතවම සිදුවූයේ එක්තරා වසරකදීය.

ඉන් පසු "ගම්පෙරලිය " චිත්‍රපටයේ සහාය අධ්‍යක්ෂණයට සහ එහි දෙබස් රචනයටද සම්බන්ධ වෙමින් සිනමා ගමන් මඟට පිළිපන් තිස්ස අබේසේකර ගේ වැඩි උනන්දුවක් යොමු වූයේ සිනමා තිර රචනය කෙරෙහිය. ඒ පිළිබඳව ලියවුණු බොහෝ විදෙස් පත පොත කියවූ තිස්ස අබේසේකර මුහුණ දුන් එක් ප්‍රශ්නයක් වූයේ ඒ සඳහා වූ එක්තරා විශිෂ්ට ග්‍රන්ථයක් සොයා ගැනීමට තිබූ අපහසුවය. මෙය ශ්‍රී ලංකාවේ කිසිදු පොත්හලක නොවූ අතර එංගලන්තයේ වූ අදාළ ප්‍රකාශන සමාගමද ඒ වන විට වසා දමා තිබුණි. පසු කලෙක ජර්මනිය, එංගලන්තය සහ අමෙරිකාව යන රටවල සංචාරය කිරීමට ලැබුණු අවස්ථාවල බොහෝ පොත් සාප්පු සිසාරා ඇවිද ගිය නමුත් ඔහුට ඉන් එක් පිටපතක් හෝ දක්නට නොලැබුණේය.

කාලය දශක කීපයක් ගෙවී ගියේය.

නමුත් ඉතා අහම්බයෙන් මෑත දවසක ඔහුට ඒ පොත සොයා ගත හැකි වූයේය.

ඒ මහනුවර පදික වේදිකාවක සිටි පොත් වෙළෙන්දෙකුගෙනි.

ඒ අනුව තමා කාලයක් බලාපොරොත්තුව සිටි ඒ මහානර්ඝ ග්‍රන්ථය ඔහුට කියවන්නට ලැබුණේ වසර තිහකට පසුවය. මේ ආකාරයට ලොව කොතනකවත් නොමැති කෘතියක් මහනුවර පදික වේදිකාවකින් සොයා ගන්නට ලැබීම හැරුණ කොට එහි තවත් විශේෂත්වයක්ද වූයේය. එනම් පොත අයිතිකරුගේ අත්සනද, එය මිලදී ගත් දිනයද එහි සඳහන්ව තිබීමය.

ඒ අනුව පොතේ අයිතිකරුවා වූයේ එදවස චිත්‍රපට තැනීමෙන් බැහැරව නාට්‍ය වේදිකාවට වූ කැපවීම හේතු කොට ගෙන මෙදවස සම්මානයට පාත්‍ර වී සිටින සුගතපාල ද සිල්වාය.

(සුගතපාල ද සිල්වාගෙන් ඒ පොත ඉල්ලා ගත් පොත් ගල් කරන්නෙකු විසින් ඉල්ලා ගනු ලැබ අනතුරුව පදික වේදිකාව වෙත පැමිණිම සිද්ධියේ පසු කතාවකි)

නමුත් මෙම කෘතිය මුල් කර ගනිමින් තිස්ස අබේසේකර අපට අවධාරණය කරන්නට බලාපොරොත්තු වුණේ කිසි සේත්ම එම කතාව නොවේ.

ඔහුට අවශ්‍ය වූයේ සුගතපාල ද සිල්වා මෙම පොත කියවා තිබූ කාල වකවානුව අපට මතක් කර දීමයි. ඔහු පෙන්වා දුන්නේ පොතෙහි සඳහන් දාතමෙහි ආකාරයට සුගතපාල ද සිල්වා මෙම පොත මිලදී ගෙන ඇත්තේ අපේ කට්ටය සිනමාව හා වේදිකාව තෝරා ගන්නට පෙර දවසකය. තවත් විදියකින් කියනවා නම් තිස්ස අබේසේකර සිනමාවේ බොහෝ දුරක් පැමිණි පසු කියවූ ඒ පොත සුගතපාල ද සිල්වා කියවා ඇත්තේ ඔහු සිනමාව වෙනුවට වේදිකාව තෝරා ගැනීමටත් පෙර සිට බවය.

සිනමාව අරබයා මේ සා දැනුවත් භාවයක් තිබූ මිනිසකු සිනමාව අතහැර බොහෝ දුෂ්කර මාවතක් ඔස්සේ පිය නගමින් නාට්‍ය වේදිකාවට ගොඩවීම සුගතපාල ද සිල්වාගේ මෙන්ම නාට්‍ය වේදිකාවේද ශ්‍රේෂ්ඨත්වය පිළිබිඹු කරන්නක් බව පැවසූ තිස්ස අබේසේකර අතීතයේ සුගත්ට හිමිව තිබූ ඒ දුර්ලභ ග්‍රන්ථය යළි ඔහු අතටම පත් කළේය.

මෙය අපගේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති මිනිසෙකුගේ නිශ්චල ගාම්භීරත්වයත්, එය කොතෙක් ශ්‍රේෂ්ඨදැයි පෙන්වා දුන් තවත් ප්‍රාමාණිකයකුගේ නිහතමානී ගුණයත් ප්‍රකට කළ දුර්ලභ අවස්ථාවකි.

පොත් පත් පුවත්

● සුරේකා නිල්මිණි ඉලංගකෝන්

සාහිත්‍යය වෙනුවෙන් ම වෙන් වූ සැප්තැම්බර් මාසය තුළ නවතම කෘති රාශියක් ජනගත වේ. පොත් කතුවරුන් සහ ප්‍රකාශයන් විසින් මෙම වසර ඇතුළත පළ කළ නවතම කෘති පිළිබඳ පාඨකයන් දැනුම්වත් කිරීමට මෙම පිටුව වෙන් වේ. ඒ සඳහා ඔබගේ නවතම කෘතිවල මුද්‍රිත පිටපතක් 'පොත් පත් පුවත්', සිළුමිණ, ලේක්හවුස්, කොළඹ යන ලිපිනයට යොමු කළ හැකිය.



කෘතිය - ගස් හිටවූ මිනිසා

පරිවර්තනය - මණ්ඩාවල පඤ්ඤාවංස හිමි
ප්‍රකාශක - සේරී ප්‍රකාශන
පිටු ගණන - 64 මිල - රුපියල් 300
විමසීම් - *pannawansam@gmail.com*

මණ්ඩාවල පඤ්ඤාවංස හිමියන් විසින් ප්‍රංශ බසින් සිංහලයට පරිවර්තනය කර ඇති මෙම කෘතියේ මුල් රචකයා ප්‍රංශ ජාතික ෂොං ෂිඕනෝ ය. ළමා කතා, යොවුන් කතා හෝ නවකතා ආදී වශයෙන් කිසිදු වර්ගීකරණයකට හසුකර ගත නොහැකි අමුතු මාදිලියේ අපූරු කෘතියක් ලෙස මෙම කෘතිය හැඳින්විය හැකිය. ඕනෑම වයස් කාණ්ඩයකට අයත් ඕනෑම අයකුට කියවා රසවිඳිය හැකි පාරිසරික පූර්වාදර්ශයක් සපයන මෙම කෘතිය ශුෂ්ක බිමක් අසිරිමත් උයනක් බවට පත්කළ පරහිතකාමී දිරිය මිනිසකු පිළිබඳ කතාවකි. දකුණු ප්‍රංශයේ ජීවත් වන මණ්ඩාවල පඤ්ඤාවංස හිමියන් කෘති රැසක කතුවරයෙකි.

කෘතිය - ආදරයට පාසලක් ඕනෑද?

පරිවර්තනය - කැත්ලීන් ජයවර්ධන
ප්‍රකාශක - සේරී ප්‍රකාශන
පිටු ගණන - 288 මිල - රුපියල් 500
විමසීම් - 0112889381

මෙම කෘතිය විශිෂ්ට ප්‍රබන්ධ හා තෝරාගත් නිර්ප්‍රබන්ධ කිහිපයක් සංවාදය සඳහා විවර කරමින් ප්‍රවීණ ලේඛිකා කැත්ලීන් ජයවර්ධන විසින් සම්පාදනය කරන ජීවිතය වෙනස් කරන සාහිත්‍යය පොත් පෙළේ තුන් වැන්නයි. සාරවත් ජීවිතයට පෝෂණ පදාර්ථ සපයන, ජීවිතයක තෝන් ලණුව අල්ලාගැනීමට සමත් පරිණත භාවයක් පාඨකයා තුළ ජීවමාන කිරීමට සමත් මෙම කෘතිය හොඳ පොත් කියැවීමේ පිපාසයෙන් පෙළෙන පාඨකයන්ට අපූරු මාර්ගෝපදේශයකි.

කෘතිය- මුස්ලිම් සිංහල

කර්තෘ - පද්මකුමා පී. මෙත්තසේන
ප්‍රකාශක - ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු ගණන - 286 මිල - රුපියල් 500
විමසීම් - 070 2086184

දෙටු ප්‍රවීණ ඡායාරූප ශිල්පී පද්මකුමා පී. මෙත්තසේන 2014 වසරේදී ඉන්දියාවේ සහ තායිලන්තයේ ගත කළ කාලයේ ලැබූ අත්දැකීම් ඇසුරින් මැවූ මන:කල්පිත වෘත්තාන්තයක් මෙම නවකතාවට පාදක වී ඇත. රාගය, කුතුහලය, ත්‍රාසය සපිරි දේශපාලනික ප්‍රස්තුතයක්ද මෙම කෘතියේ අන්තර්ගතය. කතුවරයා විසින් මීට පෙර කෘති කිහිපයක්ම රචනා කර ඇති අතර මෙය ඔහුගේ පළමු නවකතාවයි.

කෘතිය- ආදරය නාමයෙන්

කර්තෘ - සේනාරත්න වීරසිංහ
ප්‍රකාශක - ප්‍රභා ප්‍රකාශකයෝ
පිටු ගණන - 176 මිල - රුපියල් 450
විමසීම් - 071 8294739

මෙම කෘතිය ඉංග්‍රීසි ලේඛක ඉග්නාසියෝ සිලෝනි විසින් රචිත The Secret of Luca නවකතාවේ සම්පූර්ණ, අසංක්ෂිප්ත පරිවර්තනයකි.යුරෝපයේ එකල පැවති වාමවාදී අදහස් සමග බැඳුණු නාස්තිකබව හා මනෝරාජික සිතුම් පැතුම් ගොනුකර ඇති මෙම නවකතාවට පාදක වී ඇත්තේ සංවේදී, විචිත්‍ර ප්‍රේම කතාවකි. මෙම කතුවරයාගේ 81 වැනි කෘතියයි.

කෘතිය- චිකී සහ ගංගාව

කර්තෘ - අජිත් නිශාන්ත
ප්‍රකාශක - කලාව ප්‍රකාශන
විමසීම් - 077 7483874

මෙම කෘතිය ප්‍රකට අප්‍රිකානු ලේඛක චිනුවා අචෙබෙ රචනා කළ යොවුන් නවකතාවක සිංහල පරිවර්තනයකි. කවියකු, පරිවර්තකයකු, ළමා කෘති රචකයකු සහ මාධ්‍යවේදියකු වන අජිත් නිශාන්ත විසින් රචිත එම කෘතිය සමග තවත් නවතම කෘති 2ක් පසුගියදා එළිදැක්විණි. ඒ, විදෙස් ලේඛකලේඛිකාවන් සමග පවත්වන ලද පුවත්පත් සම්මුඛ සාකච්ඡා එකතුවක් වන'දෙබසින් දෙබස'කෘතිය සහ 'එකමුතු ළමා කව් ගී සංග්‍රහය' කෘතියයි.

කෘතිය- අතු

කර්තෘ - අතුකෝරාළගේ නිල් ක්‍රිෂාන්ත
ප්‍රකාශක - කර්තෘ ප්‍රකාශනයකි
පිටු ගණන - 50 මිල- රුපියල් 250
විමසීම් - 076 7972499

කාව්‍ය එකතුවක් වන මෙය කතුවරයාගේ පළමු කෘතියයි. නොයෙක් වස්තු විෂයන් යටතේ ලියැවුණු කවි 41ක් මෙහි අන්තර්ගත වන අතර ඒවා සෘජු ප්‍රකාශන සහ ව්‍යංග්‍යාර්ථ ලෙස ඉදිරිපත් කර තිබේ. නාට්‍යකරුවකු මෙන්ම තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාධාරියකු වන කතුවරයා 2019 වසරේදී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ජාතික මට්ටමේ කලාකරුවකු ලෙසද ඇගයීමට ලක්විය.

කෘතිය- ඉස්සර කාලේ

කර්තෘ - ජයසේකර මලවිආරච්චි
ප්‍රකාශක - සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
පිටු ගණන - 56 මිල- රුපියල් 250
විමසීම් - 011 2757420

ඈත අතීතයේ සිට පැවත එන, මෑත අතීතයේ සිට අභාවයට යමින් තිබෙන ගැමි සිරිත්විරිත්, සාරධර්ම, ගොවි ජීවිතයට ආවේණික ඇවතුම්පැවතුම්, කර්මාන්ත, කලා ශිල්ප, ආගමික ඇදහිලි, යානවාහන, ගමන්බිමන්, කෙළි සෙල්ලම් ආදිය ගැන ලියැවුණු රචනා දහසයක මෙම කෘතියේ අන්තර්ගතය. මෙය කතුවරයාගේ 13 වැනි කෘතියයි.

කෘතිය - ඉගෙන ගමු වයන හැටි තබ්ලාව

කර්තෘ - විශාරද මනෝජ් පීරිස්
ප්‍රකාශක - එම්.ඩී. ගුණසේන සමාගම
මිල - රුපියල් 250
විමසීම් - 0715700925

විශාරද මනෝජ් පීරිස් විසින් රචිත මෙම කෘතිය තබ්ලා වාදනය පිළිබඳ මාර්ගෝපදේශකයක් වැනිය. ආධුනික වාදන ශිල්පීන්ට අත්වැලක් ලෙස පරිශීලනය කළ හැකි කෘතියකි. මෙය විශාරද මනෝජ් පීරිස්ගේ පළමු කෘතිය වන අතර මීට පෙර ඔහු විසින් දේශීය සංගීත භාණ්ඩ වාදනය පිළිබඳ සංයුක්ත තැටියක් නිකුත් කළේය.

කෘතිය- දික්කන්ද වලව්ව

කර්තෘ - ජයශංඛ කරුණාරත්න
ප්‍රකාශක - දයාවංශ ජයකොඩි සහ සමාගම
මිල - රුපියල් 500

ත්‍රාසය, කුතුහලය මුසු වූ මෙම නවකතාව මුල සිට අවසානය දක්වා පාඨකයා ඇදබැඳ තබාගැනීමට සමත් භාෂා විලාසයකින් යුක්තය.



කෘතිය- ලොකු නැන්දා පබසරට ගෙනා සරස්වතී තෙල්

කර්තෘ - රංජිත් මල්ලියාවඩු
ප්‍රකාශක - ග්‍රැෆිකෙයා ප්‍රකාශනයක්
පිටු ගණන - 40 මිල - රුපියල් 280
විමසීම් - 0718407181

ළමා මනසට ප්‍රිය සෞම්‍ය වර්ණ ගැළපීමකින් සහ ආකර්ෂණීය චිත්‍රවලින් සමන්විත මෙම ළමා කතාව සම්මානනීය ළමා සාහිත්‍ය වේදී රංජිත් මල්ලියාවඩු ගේ 9 වැනි ළමා කෘතියයි. පබසර නම් කුඩා දරුවාගේ චරිතය ඔස්සේ මවුබිමේ සුන්දරත්වය සහ වටිනාකම සිත්ගන්නාසුලු අයුරින් ළමා මනසට දැනවීමට උත්සාහ දරා ඇත.

කෘතිය- ගිගිරුම් නාදය

කර්තෘ - ප්‍රභාත් මිරිහාගල්ල
ප්‍රකාශක - දයාවංශ ජයකොඩි සහ සමාගම
මිල - රුපියල් 480

මෙය A Sound of Thunder කෘතියේ පරිවර්තනයයි. මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් ස්වාභාව ධර්මයට බලපාන අයුරු, කෘත්‍රිම බුද්ධියෙන් සමන්විත යන්ත්‍ර මිනිසාට දක්වන සහාය සහ යුධ සංග්‍රාම හමුවේ මිනිසාගේ අනාගතය කෙබඳුද යනාදී විවිධාකාර ප්‍රශ්නවලට විද්‍යාත්මක සහ දාර්ශනික පිළිතුරු සපයමින් ලොව කීර්තිමත් ලේඛකයන් සත් දෙනකු විසින් ලියන ලද විශිෂ්ට කතා එකතුවක් වන මෙය පාඨකයාගේ පරිකල්පනය නව මානයකට ගෙන යෑමට සමත් කෘතියකි.

කෘතිය - නෝරයනා සහ වසන්ත

කර්තෘ - අතුල විතානගේ
ප්‍රකාශක - දයාවංශ ජයකොඩි සහ සමාගම
මිල - රුපියල් 200

සුන්දර අයර්ලන්තයේදී ප්‍රේමයෙන් බැඳෙන නෝරයානා සහ වසන්ත නම් ආදරවන්තයන්ගේ ජීවන පුවත රැගත් මෙම නවකතාව සරල සුන්දර බස්වහරකින් ලියැවී තිබේ.

කෘතිය - සඳ පළුවයි නිල් අහසයි

කර්තෘ - දිලූ සඳමාලි රසාංගිකා මාපා
ප්‍රකාශක - සිතැඟි ක්‍රියේෂන්ස්
පිටු ගණන - 208 මිල - රුපියල් 620
විමසීම් - 071 9511868

සම ආශ්‍රිත රෝගයකින් ශාරීරිකව සහ මානසිකව පීඩා විඳින යුවතියකගේ මනෝ භාවයන් සහ ඇයගේ ජීවිතයට ආශිර්වාදයක් වන ප්‍රේමයක් ගැන කියැවෙන මෙම නවකතාව කතුවරියගේ 21 වැනි නවකතාවයි. කතුවරියට ආවේණික සෞන්දර්යාත්මක බස්වහර මෙම කෘතියේද අන්තර්ගත වේ. මෙය ජනප්‍රිය ලේඛිකා දිලූ මාපා විසින් රචිත 53 වැනි කෘතියයි.

කෘතිය - සුසුමක සුවඳ මිස

කර්තෘ - සමීරා තරංගනී ගල්හේන
ප්‍රකාශක - තාරා ප්‍රකාශන
මිල - රුපියල් 500
විමසීම් - 071 1088137

ආබාධිත බව හමුවේ මුහුණ දෙන කායික මානසික පීඩාවන් හා ඒ සියල්ලට දැඩි ආත්ම ශක්තියෙන් මුහුණ දෙමින් ජීවිතය සාර්ථක කරගත් තරුණයකුගේ සැබෑ ජීවිත කතාව ඇසුරින් මෙම නවකතාව රචනා කර තිබේ. ශාරීරික දුර්වලතා ජීවිතයෙන් පැන යෑමට හේතුවක් නොවන බව එම කෘතිය තුළින් සපයන ජීවිත ආදර්ශයයි. මෙය කතුවරියගේ 10 වැනි නවකතාවයි.

කෘතිය - මන්දාර සුළඟ

කර්තෘ - දිනූෂා වීරරත්න
ප්‍රකාශක - දෙව්මිණි ප්‍රකාශන
පිටු ගණන - පිටු 200 මිල - රුපියල් 550
විමසීම් - 071 2070275

වද බන්ධනයක් වූ විවාහ ජීවිතයක් ගතකරමින් සිටියදී හදිසියේ සිදු වන සැමියාගේ අකල් වියෝව නිසා සිඟිති දරුවකු සමග හුදෙකලා වන තරුණ බිරියකගේ ශෝකාන්තය මෙම නවකතාවට පාදක වී ඇත. එහෙත් ඒ ශෝකාන්තය කරුමයක් හෝ උරුමයක් කර නොගෙන තම දෛවයට අභියෝග කරමින් ඇය නුවණින් යුතුව තම ජීවිතයේ සැනසුම සොයා ගන්නා අයුරු කතුවරිය සුන්දරව අකුරු කර ඇත. මෙය ඇයගේ හය වැනි නවකතාවයි.

කෘතිය - ඊවා

කර්තෘ - හර්ෂණී වීරරත්න
ප්‍රකාශක - මිහිර ප්‍රකාශන
පිටු ගණන - 400 මිල - රුපියල් 850

මෙය මාධ්‍යවේදිනී හර්ෂණී වීරරත්න විසින් රචිත පස් වැනි නවකතාවයි. කුඩා කල සිට ලිංගික අපයෝජනයට ලක්වූ පාසල් සිසුවියකගේ සත්‍ය කතාවක් ඇසුරින් මෙම නවකතාව නිර්මාණය වී තිබේ. අගස්ති, අග්‍ර, ශේෂ සහ දුවිලි කතුවරිය විසින් මීට පෙර ප්‍රකාශයට පත් කළ නවකතා ය.

කෘතිය - මායාවී

කර්තෘ - නිශී බොතේජු
ප්‍රකාශක - සිලිකා ප්‍රකාශන
පිටු ගණන - 400 මිල - රුපියල් 790
විමසීම් - 0755 361436

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පෙමින් බැඳී හිටි හැටියේම අතුරුදහන් වූ තම පෙම්වතිය සොයා යන හිතුවක්කාර ආදරවන්තයකු වටා ගෙතී ඇති මෙම නවකතාව, අභියෝග දිනන්නට ශක්තියක් වන සැබෑ ප්‍රේමයේ අපූර්වත්වය පෙන්වා දෙයි. මෙම නවකතාව නවක ලේඛිකා නිශී බොතේජු ගේ දෙවැනි කෘතිය වන අතර ඇය විසින් රචිත පළමු නවකතාව 'පතිනියක වී' පසුගිය ජූලි මාසයේදී නිකුත් විය.

කෘතිය - නුහුරු නුපුරුදු හීනයක්

කර්තෘ - දිල්රුක්ෂි ගමගේ
ප්‍රකාශක - සිතුවිලි ප්‍රකාශනයක්
මිල - රුපියල් 550
විමසීම් - 071 9164747

කතුවරියගේ තිස් දෙවැනි නවකතාව වන මෙහි සමාජයෙන් ලද ආභාසය නිසා නීති විරෝධී ක්‍රියාකාරකම්වල යෙදෙන තරුණයෙක්, දික්කසාදයෙන් තනිවූ තරුණ දෙදරු මවක් හා පිය සෙනෙහස සොයන දරුවන් දෙදෙනෙකු වටා ගෙතුණු අතිශය සංවේදී කතා පුවතක් ඇතුළත් ය. මෙම කෘතිය සමග 'එදා මල් වරුසාවමයි'නවකතාවද නිකුත් වූ අතර එය කතුවරියගේ තිස්තුන් වැනි නවකතාවයි.

කෘතිය - තරු ඇසක් හැඬුවා

කර්තෘ - ඉෂංකා ජීවමාලි රණසිංහ
ප්‍රකාශක - පහන් ප්‍රකාශන
මිල - රුපියල් 590
විමසීම් - 0712278700

මවුපියන්ගේ අකමැත්ත හමුවේ තම ප්‍රේමය දිනා ගැනීමට දැඩි උත්සාහයක යෙදෙන යුවතියකගේ කතාවක් රැගත් මෙම නවකතාව යොවුන් කතුවරියගේ හය වැනි කෘතියයි. එම නවකතාව සමග මෙවර පොත් ප්‍රදර්ශනයේදී කතුවරිය විසින් රචිත 'පිනි කඳුළ මම වෙමි ' සහ සත්‍ය කතාවක් ඇසුරින් නිර්මාණය කළ 'යළි එන්න වස්සානේ' නවකතා ද්විත්වයද නිකුත් විය.

කෘතිය - විමුක්තිය සොයා

කර්තෘ - කුසුමා එපිටවල
ප්‍රකාශක - සූරිය ප්‍රකාශකයෝ
පිටු ගණන -124 මිල- රුපියල් 380
විමසීම් - 071 4481171

'චන්ද්‍රසිරි දොඩන්ගොඩ අනුස්මරණ සාහිත ප්‍රණාම' සමස්ත ලංකා සාහිත්‍ය තරගාවලිය-2019 නවකතා අත්පිටපත් තරගයේ ප්‍රථම ස්ථානය දිනූ මෙම නවකතාව සිදුහත්- යශෝදරා කතාවේ නව අර්ථකථනයක් ලෙස හැඳින්විය හැකිය. ආගමික පසුබිමක් මත දිවෙන කතාවක් වුවත් සිත්ගන්නාසුලු උසස් භාෂා විලාසය නිසා පාඨකයා කෘතිය වෙත ඇදබැඳ තබාගැනීමට කතුවරිය සමත් වී ඇත.

වෂී 2020ක් වූ සැප්තැම්බර් මස 20 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Tel: 2429351
Mobile: 071 7829018
Email:
Silumina.advt@lakehouse.lk

අධ්‍යාපන
Education

කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් සෘජුවම පිරිනමන උසස් ඩිප්ලෝමා පාඨමාලා දැන් ICBT Campus වෙතින්

මෙරට පෞද්ගලික උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයකු වන ICBT Campus ආයතනය ක්ෂේත්‍රයට තවත් නවතම හඳුන්වාදීමක් සිදු කරමින් එක්සත් රාජධානියේ කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් (Cardiff Metropolitan University) සෘජුවම ලබාදෙන උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් ශ්‍රී ලාංකික සිසුන් වෙනුවෙන් හඳුන්වා දුන්නේය.

මේ අනුව ශ්‍රී ලාංකික සිසුන්ට කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තරව පිළිගත් උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් මෙරට සිට හැදෑරීමට අවස්ථාව හිමි වේ. මෙම නව උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් බ්‍රිතාන්‍ය 5 වැනි මට්ටමේ පාඨමාලාවන් වන අතර, කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය විසින් ශාස්ත්‍රීය වශයෙන් පාලනය කරන ලද එක්සත් රාජධානියේ අභ්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ගුණාත්මකබව තහවුරු කර පවත්වා ගෙනයන පාඨමාලා වේ.

කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය 2021 ගාර්ඩියන් විශ්වවිද්‍යාල ලීගයේ 72 වැනි ස්ථානයේ ශ්‍රේණිගත කෙරී ඇති විශ්වවිද්‍යාලයයි.

ශ්‍රී ලාංකික සිසුන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඊට ගැළපෙන පාඨමාලාවන් ලබා දීම සම්බන්ධයෙන්

වමේ සිට දකුණට - අනුර ගමගේ (අලෙවි අධ්‍යක්ෂක), ජගත් අල්විස්, (සභාපති) ආචාර්ය සම්පත් කන්නන්ගර, (විධායක පීඨාධිපති/ප්‍රධාන විධායක නිලධාරී) සහ සම්පත් පෙරේරා (සාමාන්‍යාධිකාරී) මහත්වරු

ICBT Campus ආයතනය කීර්තියක් උසුලන අතර, මෙම නව පාඨමාලාවන්ද ඉල්ලුම හඳුනාගෙන ඉදිරිපත් කරන ලද කාලීන පාඨමාලාවන් ලෙස හැඳින්විය හැකිය.

මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් එක්සත් රාජධානියෙන් සෘජුවම ලැබෙන සුදුසුකමක් නිසා ශ්‍රී ලාංකික සිසුන් හට ඩිප්ලෝමාවෙන් ඉදිරියට උසස් අධ්‍යාපනය මෙරට සිට හෝ එක්සත් රාජධානියේ සිට හැදෑරීමේ අවස්ථාව නිසැකව හිමි වේ. ශ්‍රී ලාංකික සිසුන් හට එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව මෙම නව පාඨමාලාවන් හරහා උදා වේ.

සියලුම විශ්වවිද්‍යාල දැනුම් ගබඩාවන් සඳහා ප්‍රවේශය, කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාල හැඳුනුම්පත සහ විශ්වවිද්‍යාලය විසින් ලබාදෙන පිරිනැමීමේ ලිපිය යන සියල්ල මෙම පාඨමාලාවන් හදාරන සිසුන් හට හිමි වේ. එමෙන්ම ICBT Campus හි පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන්ට හට එක්සත් රාජධානිය වෙත ගොස් උපාධි ප්‍රදානෝත්සවය සඳහා සහභාගී විය හැකි වීම සුවිශේෂීත්වයකි.

කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ව්‍යාපාර කළමනාකරණය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, ජාලකරණය, මනෝවිද්‍යාව සහ ජෛව වෛද්‍ය විද්‍යාව යන විෂයන්වල උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් ICBT Campus ආයතනය හරහා ලබා ගත හැකිය. කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සිසුන්ගේ පහසුව වෙනුවෙන් කැප වී සිටින අතර ඉහළ ගුණාත්මක බවින් යුත් උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් සිසුන්ට අපේක්ෂා කළ හැකිය. වැඩි විස්තර www.icbt.lk වෙබ් අඩවියට පිවිස ලබාගත හැකිය.

Mercmarine Training වෙතින් ලොවම පිළිගත් වෙළෙඳ නාවික පුහුණු අවස්ථා

Mercmarine Group වලට අයත් වෙළෙඳ නාවික පුහුණුව Marine Training & ලබාදෙන Mercmarine Training ආයතනය ශ්‍රී ලංකාව තුළ ලොව පිළිගත් වෙළෙඳ නාවික පුහුණුව (නාවික වෘත්තීය) අපේක්ෂා කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන්ගේ ඊළඟ අධ්‍යාපනික වර්ෂය සඳහා ඇතුළත්වීමට ආරාධනා කරයි. මෙම ක්ෂේත්‍ර ය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පුළුල් පරාසයක පැතුරුණු පාඨමාලා සඳහා දැන් අයදුම් කිරීමේ අවස්ථාව විවෘත වී තිබේ.

Mercmarine Training ඇති පාඨමාලා අතර නාවික කැඩෙට් නිලධාරී (Navigation Officer Cadet) සහ ඉංජිනේරු කැඩෙට් නිලධාරී (Engineering Officer Cadet) ලෙස නිලධාරී පුහුණු පාඨමාලා (Officer Training) දෙකක් ද "Rating Training"පාඨමාලාවට අයත් Deck Rating, Engine Rating සහ Catering Rating training ආදී වූ පාඨමාලා තුනක් ද හැදෑරීමේ අවස්ථාව තිබේ. එසේම Mercmarine Training ආයතනය තුළ STCW (Standards of Training, Certification and Watchkeeping for Seafarers) සහ non-STCW ආදී වන විවිධ කාණ්ඩ ගණනාවකට අයත් කෙටි කාලීන පාඨමාලා රැසක් ද හැදෑරීමේ අවස්ථාව ලබාදී ඇත. එමෙන්ම Engine Simulators සහ Navigation Simulatorsආදී වූ Simulator පාඨමාලා සහ අදාළ පුද්ගලයාගේ හා ආයතනයේ අවශ්‍ය තාවයට ගැළපෙන ලෙස නිර්මාණය කළ වෙනත් නාවික පාඨමාලාද මෙහි දී හැදෑරීමට අවස්ථාව උදාකර දී තිබේ.

Mercmarine Training සතු අති නවීන පුහුණු පහසුකම් මගින් සිසුන්ට සිය නාවික වෘත්තීය ජීවිතය සාර්ථකව ගොඩනගා ගැනීමට නිවැරදි මූලාම්භරයක් ලබාදෙයි. ඔවුන් විසින් deck, engine සහ catering අංශයන්ගේ සෑම තලයකටම අයත් සහ සෑම යෝග්‍යතා මට්ටමකටම අයත් හොඳම පාඨමාලා රැසක් ශ්‍රී ලංකාවට හඳුන්වා දී තිබේ.

1986 වර්ෂයේ දී ආරම්භ වූ Mercmarine Training ආයතනය එදා සිට අද දක්වා ඉහළ වෘත්තීය තත්ත්වයට ළඟාවිය හැකි සුදුසුකම්ලත් උසස් වෙළෙඳ නාවික වෘත්තිකයන් නිර්මාණය කිරීමට කැප වන අතරම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් වෙළෙඳ නාවික ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය කරගැනීමට වැඩි දායකත්වයක් දක්වන ආයතනයක් ලෙස කැපී පෙනෙයි. මෙම පුහුණු ආයතනයේ සියලුම පාඨමාලා උසස් නාවිකයකු ලෙස වැදගත් වෘත්තීය ප්‍රවේශයක් වෙනුවෙන් අවශ්‍යය මනා සක්‍යතාවය ගොඩනැංවීම උදෙසා නිර්මාණය කර තිබේ. එසේම කාන්තා කැඩෙට් නිලධාරීන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ආදී වූ ක්ෂේත්‍රයේ සුවිශේෂී සමාජ සුබසාධන මූලිකත්ව වැඩසටහන් ඇරඹීමේ පුරෝගාමියකු ලෙස ප්‍රකට මෙම ආයතනය නාවික වෘත්තීය ක්ෂේත්‍රයට විශාල සේවාවක් සිදුකර තිබේ.

එහිදී නාවික ක්ෂේත්‍රයේ කාන්තා නායකත්වය බලගැන්වීම කැපී පෙනෙන අතර තෝරාගත් කාන්තා නිලධාරිනියන් දෙදෙනකුට තමන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා මිලයන දෙකකට අධික මුදලක් වෙන්කිරීමට මේ ආයතනය පියවර ගෙන තිබේ. තවද මෙම ශිෂ්‍යත්ව ප්‍රධාන එළඹෙන අධ්‍යාපනික වසර සඳහා ද ලබාදීමට ඔවුන් බලාපොරොත්තුවේ.

Mercmarine Group හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී කපිතාන් රොහාන් කොඩිප්පිලි මහතා මෙහිදී සිය අදහස් දැක්වීය,

"Mercmarine අපට මෙම කර්මාන්තය අපේ ව්‍යාපාරය වනවා වගේම නැව් හිමිකාරීත්වය, නැව් කළමනාකාරීත්වය සහ වෙළෙඳ නාවික පුහුණුව ආදී වූ නාවික ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු කාර්යයන් වලදී විශේෂඥ සේවා සපයන්නෙකු බවත් අපි ලෝකයට ඔප්පු කර තිබෙනවා. Mercmarine Training හරහා වෙළෙඳ නාවික පුහුණුව ලබාදීමේ දී අපි කරන මෙහෙයුම් අංශ දෙකකට බෙදෙනවා. පළමුව නාවිකයකු ලෙස වෘත්තීයභාවය ගොඩනගා ගැනීමට අවශ්‍ය නිවැරදි අධ්‍යාපනික දැනුම ලබාදීම සහ දෙවනුව වෘත්තීය නාවිකයකු ලෙස මුහුදේ දී ලබාගත යුතු අත්දැකීම් සහ දක්ෂතාවයන් ඇතිකර ගැනීම වෙනුවෙන් සිදුකරන ප්‍රායෝගික පුහුණුව ලබාදීමයි. අතීතයේ දී වගේ නෙමෙයි දැන් තියෙන නැව් එකිනෙකට වෙනස් විශේෂතාවලින් පිරිලා, එයට අවශ්‍ය නාවිකයන් සංඛ්‍යාව අල්පයි. ඒ වගේම එම නැව්වල මුහුදු ගමන් කෙටියි. මේ හේතුවෙන් නාවික ක්ෂේත්‍රයට අලුතෙන් පැමිණෙන අය හොඳින් පුහුණුව ලැබූ සහ ආරම්භ දිනයේ සිටම අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකියාව ඇති අය විය යුතුයි. මේ නිසා අපේ පුහුණු පාඨමාලා උදාවී ඇති අලුත් අවශ්‍යතාවයන් හඳුනාගනිමින් ඒවාට නිවැරදිව මුහුණදීමට හැකිවන ලෙස නිර්මාණය කරලා තියෙනවා. Mercmarine ආයතනයේ අපි පසුගිය තිස් හතර අවුරුද්ද පුරාම ඉතා සාර්ථක නාවික වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කර තිබෙනවා. ඒවගේම ඉදිරියටත් ගෝලීය නාවික ක්ෂේත්‍රයේ උසස් වෘත්තිකයන් ලෙස සේවා අවස්ථාවන් උදාකර ගැනීමේ හැකියාව ඇති තරුණ තරුණියන් ශ්‍රී ලංකාව තුලින් නිර්මාණය කිරීමට කැපවෙලා වැඩකරනවා"

Mercmarine Group හි ක්ෂේත්‍ර හතරක් යටතේ විවිධ ආයතන ක්‍රියාත්මක වේ – නැව් හිමිකාරීත්වය, නැව් පාලනය, නාවික පිරිස් පාලනය සහ වෙළෙඳ නාවික පුහුණුව මේ ක්ෂේත්‍ර හතරයි. නාවික ක්ෂේත්‍රයේ මෙම කාණ්ඩයට අයත් සියලු අවශ්‍යතාවයන් වෙනුවෙන් විවිධ වූ විශේෂඥ සේවා රැසක් එකම සන්තාමයක් යටතේ ලබාදීමට මෙම ආයතනය කටයුතු කරයි.

පාසල් බිමට පිය නැගූ දා සිට පාසල් බිමෙන් සමුගන්නා තෙක් බබට අත්වැලක් ...
මාස්ටර් ගයිඩ් ප්‍රකාශකයෝ වෙතින්
● අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර
● 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා වැඩ පොත්
● නවතම ප්‍රකාශන රැසක්...
සැප්තැම්බර් 18-27 දක්වා BMICHහි දී
ශාලාවේ දී
අංක: 80, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, බොරැල්ල, කොළඹ - 08.
ෆැක්ස්: 2675364, ඊ - මේල්: masterg@sltnet.lk
දු: ක: 011-2691412, 2672257, 2675834, 2673004, 0773-629017

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය
ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2020 / 2021

පාසල් අධ්‍යාපනය අවසන්වූවන්, පොලිස්, බන්ධනාගාර, අධිකරණ, පරිවාස, ත්‍රිවිධ හමුද, සුරාබදු හා ඊට සමාන ක්ෂේත්‍රයන්හි නිලධාරීන් මෙන්ම අපරාධවිද්‍යාව පිළිබඳව උනන්දුව දක්වන ඔබට අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය මගින් පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා සිසුන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **අපරාධ පාලනය හා නිවාරණය සඳහා නීති අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**
Diploma in Legal Education for Crime Prevention and Control **(ඉරිදා : පෙ.ව. 9.00 - ප.ව. 4.00)**

02. **අපරාධ මනෝවිද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**
Diploma in Criminal Psychology and Offender Counseling **(ඉරිදා : පෙ.ව. 9.00 - ප.ව. 4.00)**

03. **මව්බිමේ ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**
Diploma in Homeland Security **(ඉරිදා : පෙ.ව. 9.00 - ප.ව. 4.00)**

04. **අපරාධ විමර්ශනය හා නූතන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**
Diploma in Criminal Investigation and Modern Technology **(සෙනසුරාදා : පෙ.ව. 9.00 - ප.ව. 4.00)**

අධ්‍යයන කාලය : එක් අවුරුද්දකි	**අධ්‍යයන මාධ්‍ය :** සිංහල	**පාඨමාලා ගාස්තුව :** රු. 65,000/-

පාඨමාලාවේ ප්‍රතිලාභ

- අපරාධවිද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ රැකියාවන්ගෙන් තියුතු නිලධාරීන්ට උසස්වීම් ලබා ගැනීම සඳහා
- අපරාධවිද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ රැකියාවන් කිරීමට බලාපොරොත්තු වන අය සඳහා
- අ.පො.ස. උසස් පෙළ විභාගය අසමත්වූවන් සඳහා බාහිර උපාධි හැදෑරීමට මූලික සුදුසුකමක් වීම

අවශ්‍ය සුදුසුකම්

අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ඕනෑම විෂය දෙකකින් සමත් වීම හෝ

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 03 ක් ඇතුළුව විෂය හයකින් සමත් වීම සහ

පොලිස්, බන්ධනාගාර, අධිකරණ, පරිවාස, ත්‍රිවිධ හමුද, සුරාබදු හෝ ඊට සමාන ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය

අයදුම් කිරීම සඳහා ඔබ විසින් අපේක්ෂිත ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ අයදුම්පත් www.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස බාගත (Download) කරගන්න.

අයදුම්පත් ගාස්තුව රු. 2,500/- වන අතර, ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ ගිණුම් අංකයටම මුදල් ගෙවීම අනිවාර්ය වේ. මුදල් තැන්පත් කර අදාළ රිසිට්පත අයදුම්පත සමග අමුණා පහත සඳහන් ලිපිනයට 2020.09.30 වන දිනට පෙර යොමු කරන්න. (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ.)

පාඨමාලා සමායෝජක,
අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

සැ.යු - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන ඩිප්ලෝමා පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

ඩිප්ලෝමා පාඨමාලාව	ගිණුම් අංකය
අපරාධ පාලනය හා නිවාරණය සඳහා නීති අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	013010001553
අපරාධ මනෝවිද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	013010001546
මව්බිමේ ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	013010001561
අපරාධ විමර්ෂණය හා තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	013010001538

ආචාර්ය සුනිල් රාජනෙත්ති අධ්‍යයනාංශ ප්‍රධාන **අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය** **Tel : 011-2758261**	ආචාර්ය බී.වී.එන්. විජේවර්ධන පාඨමාලා සමායෝජක **අපරාධ මනෝවිද්‍යාව හා වරදකරුවන් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** **අපරාධ පාලන හා නිවාරණය සඳහා නීති අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** **Tel : 071-4463977**	කථ්.එච්.පී.කේ.එන්. හේවාවසම් පාඨමාලා සමායෝජක **මව්බිමේ ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** **Mobile : 077-2518429**	කථ්.කේ.ජී.එන්.යූ. රණවීර පාඨමාලා සමායෝජක **අපරාධ විමර්ෂණය හා තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව** **Mobile : 071-6721466**

ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට කීල්ස් සුපිරි වෙළෙඳසල් නව්‍ය ලෙස අනුගත වේ

කීල්ස් සැමවිටම පාරිභෝගිකයින්ට සවන් දීමට ප්‍රමුඛතාවය දී ඇති අතර, දුෂ්කර කාලවලදී ආරක්ෂාව, පහසුව සහ මුදල් ඉතිකිරීමේ හැකියාව යන කරුණුවල වැදගත්කම ඔවුන් දැන් නව සාමාන්‍ය තත්ත්වයයේදී වටහාගෙන ඇත. එබැවින් පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවන්ට නිවැරැදි විසඳුම් ලබා දීම සහතික කිරීම සඳහා කීල්ස් විසින් විවිධ ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කර ඇත.

"අපගේ පාරිභෝගිකයන්ගේ ජීවන රටාවන් සහ ප්‍රමුඛතා මූලික වශයෙන් වෙනස් වී ඇති බව පාරිභෝගික ප්‍රතිපෝෂණය මත පදනම්ව අපි තේරුම් ගෙන ඇති අතර, වෙන කවරදාකටත් වඩා මෙය අපට වැදගත් වන හෙයින් අපගේ පාරිභෝගිකයන්ට පමණක් නොව, අපගේ ප්‍රජාවන්ට ද නිවැරැදි ආකාරයේ සහයක් හා සේවාවක් ලබා දීමට අප වගබලා ගන්නෙමු." යනුවෙන් ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සිල්ලර වෙළෙඳ අංශයේ සභාපති චරිත සුබසිංහ මහතා පැවසීය.

වඩාත් පහසුව සලසන ඉක්මන් සේවාවක් ලෙස නව්කරණය කරන ලද Online සාප්පු සවාරි අත්දැකීමක් - මෙම වසංගත කාලය තුළ "ආරක්ෂාව" පාරිභෝගිකයින් විසින් සලකා බලන ප්‍රධාන සාධකයක් ලෙස පෙනී ගොස් ඇති අතර, මෙතෙක් ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 ආරක්ෂක කළමනාකරණ සහතිකය ලබාගත් පළමු ලාංකික සුපිරි වෙළෙඳසල් දාමය සහ මෙරට සිල්ලර වෙළෙඳපොළ ප්‍රමුඛයා බවට කීල්ස් පත්විය.

ඒ අනුව දැනට කීල්ස් සුපිරි වෙළෙඳසල් 15ක් සහතික කර ඇති අතර, අනෙක් කීල්ස් සුපිරි වෙළෙඳසල්ද එම සහතිකය ලබා ගැනීමේ අපේක්ෂාව ඇතිව ඒ හා සමාන පිළිවෙත් අනුගමනය කරයි. නව්කරණය කරන ලද කීල්ස් වෙබ් අඩවිය (www.keellssuper.wRRw) දැන් පාරිභෝගිකයන්ට පූර්ණ පරාසයක, ඉක්මන් හා ලාභදායි බෙදාහැරීමක් මෙන්ම ඇණවුමක් ලබා දීමටත්, විවිධාකාර අවශ්‍යතා සපුරාලීම සහතික කරමින් "තම භාණ්ඩ වෙබ් අඩවිය ඔස්සේ ඇණවුම් කර කීල්ස් ශාඛාවකට ගොස් ලබා ගැනීමේ" විශේෂාංගය හරහා පාරිභෝගිකයන්ට ඉතා පහසු Online සාප්පු සවාරි අත්දැකීමක් ලබා දෙයි.

නැවුම් බව සහතික කිරීම - කීල්ස්හි නැවුම් එළවළු, පළතුරු නිෂ්පාදන ඔවුන්ගේම ගොවිපලවලින් පැය 24 ක් ඇතුළත සෘජුව ලබා ගනී. දැඩි තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීමත් සමගම, පාරිභෝගිකයා වෙත ළඟා වන්නේ ඒ අතරින් නවතම නිෂ්පාදන පමණි.

ඔබ කීල්ස් සුපිරි වෙළෙඳ සල්වලින් මිලදී ගන්නා කිසියම් නිෂ්පාදනයක් නැවුම් නොවේ නම් "ඔබේ මුදල් දෙගුණයක්" යම් කොන්දේසිවලට යටත්ව ආපසු ලබා දීමට කීල්ස් තවදුරටත් කටයුතු කරනු ඇත. නැවුම් එළවළු, පලතුරු, මුහුදු ආහාර, මස් වර්ග, පලතුරු යුෂ, ජීසා සහ උණුසුම් ආහාර පරාසය ආදී නැවුම් නිෂ්පාදන සඳහා මෙය අදාළ වේ.

තෝරාගත් කීල්ස් වෙළෙඳ සල්වලට අලුතින් හඳුන්වා දුන් සැකසූ සිසිල් ජීසා පරාසය කල් තබා ගන්නා ද්‍රව්‍ය නොමැතිව නැවුම් ලෙස සකසා ඇති අතර, එය දැරිය හැකි මිලකට ලබාගත හැක. තෝරාගත් කීල්ස් වෙළෙඳ සල්වලට අතුරුපස සහ කේක් මෙන්ම ස්වභාවික මල්ද හඳුන්වා දී ඇති නිසා පාරිභෝගිකයින්ට වඩා හොඳ භාණ්ඩ පරාසයකට ප්‍රවේශය ලබා දී ඇත.

දැරිය හැකි කීල්ස් නිෂ්පාදන සහ ප්‍රවර්ධන හේතුවෙන් වැඩි ඉතුරුම් - ප්‍රවර්ධනයන් ඔස්සේ ඉතිරි කිරීමේ හැකියාවේ වැදගත් බව වටහා ගත් කීල්ස්, "අත්‍යවශ්‍ය භාණ්ඩ අඩු මිලට" නමින් සංකල්පයක් හඳුන්වා දී ඇති අතර, එමගින් තෝරාගත් එදිනෙදා පාරිභෝජනය සඳහා අත්‍යවශ්‍ය වන දෑ අඩු මිලකට ලබා දෙයි. අත්‍යවශ්‍ය භාණ්ඩ කූඩය සතියක් සඳහා පවුලකට සැහෙයි. කීල්ස් සතුව ඔවුන්ගේම නිෂ්පාදන 350 කට වඩා ප්‍රමාණයක් ඇති අතර එම නිෂ්පාදන සාමාන්‍ය වෙළෙඳ නාමවලට වඩා 10% ක් හෝ ඊට අඩු මිලකට ලබා ගැනීමේ අවස්ථාව සලසාලයි. ඒ ඔස්සේ කීල්ස් විසින් පාරිභෝගිකයින්ට අඩු මිලට හොඳ තත්ත්වයේ නිෂ්පාදන සඳහා ප්‍රවේශය ලබා දේ. කීල්ස් නිෂ්පාදන පරාසය ගෘහ අවශ්‍යතා බොහොමයක් ආවරණය කරන බැවින් මෙයා එදිනෙදා සාප්පු සවාරිවලදී පවුලට විශාල ඉතිරියක් ද ලබා දෙයි.

The Flemington සුඛෝපභෝගී නිවාස ව්‍යාපෘතිය 5 වැනි සංවත්සරය සමරයි

මෙරට දේපළ ඉදිකිරීම් ක්ෂේත්‍රයට එක්වූ නවතම ව්‍යාපෘති අතරින් එකක් වන The Flemington පසුගියදා සිය 5 වැනි සංවත්සරය සැමරීය.පසුගිය වසර 5 ක කාලය තුළ The Flemington ව්‍යාපෘතිය මෙරට දේපළ සංවර්ධන ක්ෂේත්‍රයේ කැපීපෙනෙන ඉදිරි ගමනක නිරත විය. 2015 වසරේදී ආරම්භ වීමෙන් අනතුරුව, සිය සේවාදායකයන් වෙනුවෙන් කැපවෙමින් හා ඔවුන්ගේ විශ්වාසය දිනාගනිමින්, අඛණ්ඩව සිය දේපළ එකතුව, සේවාදායකයන් සංඛ්‍යාව මෙන්ම සිය කීර්තිනාමයද වැඩිදියුණු කරගනිමින් ඉදිරියට යාමට එම ව්‍යාපෘතිය සමත් විය.

The Flemington ගැනුම්කරුවන්ට සම්මාන දිනූ ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් සැලසුම් කරන ලද අලංකාර මහල් නිවාස අතරින් තම රුචිකත්වය අනුව නිවාස සැලසුම් තෝරාගත හැකි වේ. මෙම සෑම ව්‍යාපෘතියක්ම ඉදිකරනු ලබන්නේ කොළඹ හා රාජගිරිය යන ප්‍රදේශවල, සුපිරි වෙළෙඳ සල්, රෝහල්, පාසල් සහ ආපනශාලා ආදියට නුදුරුන් සියලු පහසුකම්වලින් සමන්විත ස්ථානවල ය. The Flemington ව්‍යාපෘතියේ නිර්මාතෘ වන්නේ එහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන ශමිත ගනේගොඩ මහතා ය. වසර 18 ක කාලයක් ඕස්ට්‍රේලියාවේ ජීවත් වූ ගනේගොඩ මහතා, එරට දේපළ වෙළෙඳම් ක්ෂේත්‍රය තුළ ලද අත්දැකීම් සම්භාරයද සමගින් The Flemington ව්‍යාපෘතිය ආරම්භ කළේ ය. ඕස්ට්‍රේලියාවේ දේපළ සංවර්ධන සමාගම් කිහිපයක මූල්‍ය පාලකවරයකු ලෙස සේවය කළ ඒ මහතා ක්‍රමක්‍රමයෙන්, නාගරික ජීවිතයක පහසුව නොඅඩුව ලබාදෙන අතරම පෞද්ගලිකත්වය සුරැකෙන ආකාරයේ, මනා ඉඩකඩකින් යුත් නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ ජනප්‍රිය වී ඇති ගෘහ නිර්මාණ සංකල්පවලින් ආභාශය ලැබී ය. එම අභාසය ඔස්සේ ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර සහ ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ ක්‍රියාත්මක වන Elish Development (පුද්.) සමාගම ආරම්භ කිරීමට ශමිත ගනේගොඩ මහතා කටයුතු කළේ ය.

රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුම්වත්කිරීම් රක්ෂණ මාසය පුරා අඛණ්ඩව

වර්ෂ 2017 සැප්තැම්බර් මස 01 වැනිදා "ජාතික රක්ෂණ දිනය" ලෙස නම් කිරීමත් එදින සිට අඛණ්ඩව සෑම වසරකම සැප්තැම්බර් මාසය "රක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීමේ මාසය" ලෙස සලකා කටයුතු කරමින් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත වෙත රක්ෂණයෙන් ලැබෙන ප්‍රතිලාභ හා රටක් වශයෙන් ළඟා කරගත හැකි ජයග්‍රහණ පිළිබඳ රට තුළ පුළුල් කතිකාවතක් ගොඩනංවන්නට, ශ්‍රී ලාංකීය රක්ෂණ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා මෙරට ක්‍රියාත්මකවන රක්ෂණ සමාගම් එකමුතු කළ ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL) සමත්ව සිටියි. ජනතාව දැනුම්වත් කිරීමෙහිලා ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ අලෙවි සහ විකුණුම් සංසදය (MSF) විසින් වසර 4 ක් තුළ අඛණ්ඩව දීප ව්‍යාප්තව මහජන සහභාගීත්වයෙන් සංවිධානය කළ ප්‍රවර්ධන වැඩසටහන් COVID-19 තත්වය හමුවේ මහජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ සලකා බලා මේ වසරේදී නොපවත්වන්නට තම සංගමයේ සාමාජික රක්ෂණ සමාගම් එක්ව ඒකමතිකව තීරණය කර ඇති බව ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සභාපති, අමානා තකාපුල් පීඑල්ස් සමාගමේ ජීවිත රක්ෂණ අංශයේ ප්‍රධාන විධායක නිලධාරී ගෙහාන් රාජපක්ෂ මහතා පවසයි. මේ වසරේදීද "රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාසය" අඛණ්ඩව පැවැත්වීමේ ඇති වැදගත්කම පිළිබඳ සලකා මෙවර මහජනතාව දැනුවත්කිරීමේ කටයුතු සමාජ දුරස්ථ භාවය ආරක්ෂක්ෂා වන ආකාරයෙන් ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය කේන්ද්‍ර කරගනිමින් සිදුකෙරෙන බව ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

COVID-19 සමග පසුගිය කාලයේ මෙරට ආර්ථිකයේ සිදුවූ පසුගාමීත්වය රක්ෂණ ක්ෂේත්‍රයේද පැහැදිලිව දැකගත හැකිවන බව ඔහු පවසයි. රටේ ආර්ථික තත්ත්වය දුර්වල වන විට රක්ෂණාවරණ හිමියන්ට නිසි පරිදි වාරික ගෙවීමට නොහැකිවීමත්, නව රක්ෂාවරණ මිලදී නොගැනීමත් සිදුවීම දැකගත හැකි යැයි IASL සභාපතිවරයා පවසයි. ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) සහයෝගීතාව මත රක්ෂණ හිමියන්ට අතපසු වූ රක්ෂණ වාරික ගෙවීම සඳහා මාස 3 ක සහන කාල සීමාවක් ලබාදී ඇති බව තුනී පූර්වකව සිහිපත් කළ ඒ මහතා, "COVID-19 සමග ශ්‍රී ලාංකික ජන සමාජයේ ඇතිවූ කම්පනය හේතුවෙන් ජනතාව දැන් යම් මිලදී ගැනීමේ තීරණයක් ගැනීමේදී යම් අදිමදි කිරීමේ ස්වභාවයක්, හැම දෙයක්ම කල් දැමීමේ ස්වභාවයක් පැහැදිලිව දැකගන්නට පුළුවන්. මේ තත්ත්වය විශේෂයෙන්ම ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයට තදින්ම බලපානවා. මේ තත්ත්වය ඉතා ඉක්මනින් යථා තත්වයට පත්වනු ඇතැයි අප විශ්වාස කරනවා." යැයි පැවසීය.

AIA ඉන්ෂුවරන්ස්, දුරස්ථ සුරක්ෂිත ඩිජිටල් අස්සන භාවිතය ලාංකේය රක්ෂණ ක්ෂේත්‍රය වෙත ප්‍රථම වරට හඳුන්වා දෙයි

ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රය වෙත නැවත වතාවක් නැවුම් වූ අත්දැකීම් එක්කරමින්, AIA ඉන්ෂුවරන්ස් සමාගම සිය සේවාලාභීන් වෙත ව්‍යවසාය ශ්‍රේණියේ විසඳුමක් වන දුරස්ථ සුරක්ෂිත ඩිජිටල් අත්සන භාවිතය නොබෝදා හඳුන්වා දෙන ලදී. මෙමගින් අපගේ වටිනා සේවාලාභීන්හට ඔවුන්ගේ නිවෙස් තුළ සිටම සිය රක්ෂණ ඔප්පුවට අදාළ ලියකියවිලි අත්සන් කිරීමේ පහසුව සැලසේ.

"මෙම පුරෝගාමී විසඳුම AIA වෙතින් හඳුන්වා දෙනු ලබන්නේ සේවාලාභීන්හට අප සමාගම සමගින් කරන ගනුදෙනු වඩාත් පහසු කිරීමටයි." යනුවෙන් AIA ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන විධායක නිලධාරී නිකිල් අද්වානි විස්තර කළේය. අප නොබෝදා මුහුණ දුන් COVID-19 වසංගත තත්ත්වය හමුවේ සේවාලාභියාගේ සුරක්ෂිතබව වඩාත් වැදගත් බව අපට වැඩි දුරටත් අවබෝධ වූ කරුණක්. එබැවින් තවදුරටත් නව රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේදී සේවාලාභීන් සහ අපගේ අලෙවි බලකා සාමාජිකයින් අතර, මුහුණට මුහුණ සිදුවන හමුවීම් අවම කිරීම තහවුරු කිරීමට අපට ක්‍රමවේදයක් අවශ්‍ය බව හැඟී ගියා. ඒ අනුව මෙම දුරස්ථ සුරක්ෂිත ඩිජිටල් අත්සන් කිරීමේ වඩාත් ආරක්ෂිත, කාර්යක්ෂම මෙන්ම පහසු ක්‍රමය හඳුන්වා දීමට අප කටයුතු කළා"

AIA ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන තාක්ෂණ නිලධාරී උමේෂ් ද ෆොන්සේකා කථා කරමින්, "අපගේ දුරස්ථ ඩිජිටල් අත්සන් කිරීමේ ක්‍රියාවලිය, සේවාලාභීන්ගේ පහසුව මෙන්ම අලෙවි බලකා සාමාජිකයින්ගේ කාර්යභාරය ද වඩාත් පහසුවෙන් සහ ඉක්මනින් කරගැනීමේ හැකියාව අත්පත් කර දෙන ජාත්‍යන්තර තත්ත්වයේ ක්‍රමවේදයක්. මෙම ක්‍රියාවලිය ඔස්සේ ලියකියවිලි කිහිප වරක් අත්සන් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. එමෙන්ම අත්සන් කරන ලද ලියකියවිලි සේවාලාභියා වෙත සහ සමාගම වෙත එසැණින් ක්ෂණිකව ලැබෙන අතර, මෙය රක්ෂණ ඔප්පුවක් නිකුත් කිරීමේ දී කිසිම ගැටලුවකින් තොරව අඩු කාලයකින් ඉතා පහසුවෙන් අදාළ කටයුතු සිදු කිරීමේ හැකියාව සහිත ක්‍රියාදාමයකි."

ඔහු තවදුරටත් කථා කරමින් කියා සිටියේ "AIA හි අපි ඩිජිටල් තාක්ෂණය ඔස්සේ අපගේ ව්‍යාපාර කටයුතු සිදු කිරීමට නිරතුරුව වෙහෙසෙන්නේ සමාගම සමගින් සේවාලාභීන්ගේ අත්දැකීම් වැඩිදුරටත් පහසු කිරීමටයි. සෑම දෙනාගේම ජීවිත කෙතරම් කාර්යයබහුල දැයි අපි හොඳින් අවබෝධ කරගෙන සිටින අතර, සේවාලාභීන්ගේ කාලය සහ ශ්‍රමය අපි වඩාත් අගය කරන බවද ඔවුනට සැලකර සිටීමට කැමතියි. මෙවන් අර්බුදකාරී කාල වකවානුවක දී ඔවුන් මුහුණට මුහුණ හමුවීම්වලින් වැලකී සිටීමට වඩාත් කැමැත්තක් දක්වන බව අප දන්නා අතර, ඔවුනට වඩාත් කාර්යක්ෂම මෙන්ම සුරක්ෂිත සේවාවක් ලබාදීම සඳහා නිරතුරුව ඩිජිටල් තාක්ෂණය ඔස්සේ වැඩි දියුණු කරන ලද සේවාවන් සොයා යාමට අපි යුහුසුළු වෙමු."

HS Fabrics නවතම ප්‍රදර්ශනාගාරය HS Select නාවල දී විවෘත වේ

ඉහළම තත්ත්වයේ සෝෆා රෙදි සහ තිර රෙදි ගෙන්වා බෙදා හරින, මෙරට ප්‍රමුඛතම ආයතනයක් වන HS Fabrics ආයතනයේ නවතම ශාඛාව පසුගියදා, යුද හමුදාපති ලූතිනන් කර්නල් ශවේන්ද්‍ර සිල්වා මහතා අතින් නාවල, නොම්මර 61 ස්ථානයේ සුබ මොහොතින් විවෘත විය. පූජ්‍ය පක්ෂය ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් සහභාගී වූ මෙම උත්සවයට, සිය ගැනුම්කාර ව්‍යාපාරික ආයතන රැසක් ද සහභාගී වී සිටීම විශාල ධෛර්යයක් බව, HS Fabrics කළමනාකාර අධ්‍යක්ෂ, ළහිරු ගමගේ මහතා පැවසීය.

" අප කවදත් පාරිභෝගිකයා වෙත ලබා දෙන්නේ, ලොව ඉස්තරම්ම සෝෆා සහ තිර රෙදි අත්දැකීම්. වසර විසි නවයක් පුරා, එසේ ලොව ඉස්තරම්ම සෝෆා රෙදි ගෙන්වන්නේ ඉන්දුනීසියාවෙන්. තිර රෙදි ඉන්දියාවෙන්. මෙරට ලී බඩු කර්මාන්තයේ යෙදෙන ප්‍රකට නිෂ්පාදකයින් සහ තරු හෝටල් ජාලය අපගේ ප්‍රධාන ගැනුම්කරුවන්. ඒ වගේම,මෙරට තරු පහේ හෝටල් බොහෝමයක ඇති, අති නවීන සෝෆා නිර්මාණවල කුෂන් රෙදි සැපයුම්කරුවා වන්නේ, HS Fabrics. ඒ වගේම, වසර 29ක් තිස්සේ, මේ රටේ නිවාස... සුපිරි මහල් නිවාස බහුතරයක් අපගේ කුෂන් සහ තිර රෙදිවලින් හැඩවී තිබෙනවා. ඉතින් දැන් ඔවුන්ටත් මෙම නවතම ප්‍රදර්ශනාගාරය ඔස්සේ, අති උසස් සෝෆා සහ තිර රෙදි එකතුවක අත්දැකීම විඳගන්නට අවස්ථාව උදා වී තිබෙනවා. මෙතෙක් HS Fabrics. හා ගනුදෙනු කළ සියලුම පාරිභෝගිකයන්ට අප ආරාධනා කර සිටිනවා, නාවල අංක 61 පිහිටි, මෙම දැවැන්ත ප්‍රදර්ශනාගාරය වෙත පැමිණෙන්නට කියා.

